වාර්ෂික වාර්තාව 2024

සීමා අභිබවා ජාතිය නංවමු

PEOPLE'S BANK

Pride of the Nation





සීමා අභිබවා ජාතිය නංවමු

ප්‍රතාපවත් සහ බලවත්, රාජාලියා දිගුකාලීන දැක්ම – එහි තියුණු දෘෂ්ටිය මූර්තිමත් කරන අතර, අති විශාල සීමාවන් පරිලේඛණය කරමින් අවස්ථාවන් හඳුනාගෙන, ඉහළම අනුග්‍රහය සමඟ ඉක්මණින් ඉහළට පියාසර කරයි. කඩිසර අනුවර්ත්‍යතාව සහ බැරෑරුම් ශක්තිය සමඟ, රාජාලියා සම්පූර්ණයෙන් නිවැරදිව සිය අරමුණු අත්කර ගනී.

රාජාලියෙක් මෙන්, වෙළෙඳපොල ප්‍රවනතාවන්, උපායමාර්ගය තුළ කඩිසරවීම සහ ආපදා අවස්ථාවක් තුළ ඔරොත්තුදීම සඳහා ඉක්මණින් අනුවර්තනයවීමට – අපි අවදිව සිටිමු. අභියෝග අනුව සකස්වෙමින් සහ වාසිඅවාසිවලට මුහුණ දෙමින් සියලුම ප්‍රදේශයන් හරහා ශක්තිමත් වීමේ අපගේ හැකියාව සීමාවන් තවදුරටත් ඉහළ දමයි. එසේ කරමින්, අපි ජාතිය ඔසවා වඩාත් සෞභාග්‍යවත් හෙටක් සඳහා සෑම පුරවැසියෙකුගේම අපේක්ෂාවන් හඹායාමට ඔවුන් සවිබල ගන්වමු.

පටුන

4
අපගේ ඒකාබද්ධ වාර්තාව හඳුන්වාදීම

7
බැංකුව පිළිබඳව

8 අපගේ බැංකුව

9 අපගේ සමූහය

10 සන්ධිස්ථාන

12 සම්මාන

14 ශේෂ අවස්ථා

17
විධායක සමාලෝචනය

18 සභාපතිවරයාගේ ලිපිය

22 සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය

26 අධ්‍යක්ෂ මණ්ඩලය

30 ආයතනික කළමනාකරණය

38 විධායක කළමනාකරණය

41 ප්‍රධාන කළමනාකරුවන්

46
වටිනාකම් නිර්මාණය මෙහෙයවීම

47 මෙහෙයුම් පරිසරය

50 පාර්ශ්වකාර සහභාගීත්වය

55 ප්‍රමාණාත්මතාව

64 උපාය මාර්ගය

70 අපගේ වටිනාකම් නිර්මාණ ආදර්ශය

72 තිරසාරභාවයට අපගේ කැපවීම

80 එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන (UN SDGs) අරමුණුවලට අපගේ බැඳීම

84
කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

85 ව්‍යාපාර සමාලෝචනය

86 පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණය

89 ව්‍යවසාය බැංකුකරණය

94 ආයතනික බැංකුකරණය

96 භාණ්ඩාගාර

98 විදේශීය ගණුදෙනුකාර සේවා

101 ජාත්‍යන්තර බැංකුකරණය

104 තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් බැංකුකරණය

109 කාඩ් සේවා

112 අලෙවිකරණය

115 මූල්‍ය ප්‍රාග්ධනය

121 නිෂ්පාදිත ප්‍රාග්ධනය

127 බුද්ධිමය ප්‍රාග්ධනය

133 මානව ප්‍රාග්ධනය

145 සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

145 ගනුදෙනුකාර ප්‍රාග්ධනය

151 ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය

157 ආයෝජක ප්‍රාග්ධනය

161 ප්‍රජා ප්‍රාග්ධනය

169 ස්වභාවික ප්‍රාග්ධනය

177
පාලනය

178 අවදානම් කළමනාකරණ වාර්තාව

213 ආයතනික පාලනය

243 අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා

244 අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ වැටුප් කමිටු වාර්තාව

245 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

246 අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු වාර්තාව

247 අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

248 අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු වාර්තාව

249 තොරතුරු තාක්ෂණ කමිටු වාර්තාව

250 අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ගික සැලසුම් සමාලෝචන කමිටු වාර්තාව

251 මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

253 අභ්‍යන්තර පාලන පිළිබඳ විගණකාධිපතිගේ සහතික කිරීමේ වාර්තාව

255
මූල්‍ය වාර්තා

256 මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

257 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

260 ආදායම් ප්‍රකාශනය

261 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

262 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

264 ස්කන්ධයෙහි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය – බැංකුව

266 ස්කන්ධයෙහි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය – සමූහය

268 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

269 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

395
අතිරේක තොරතුරු

396 ආදායම් ප්‍රකාශය (එක්සත් ජනපද ඩොලර්)

397 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (එක්සත් ජනපද ඩොලර්)

398 දස වසරක සාරාංශය – බැංකුව

399 දස වසරක සාරාංශය – සමූහය

400 බාසල් III – ස්ථර III යටතේ වෙලඳපොල විනය හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය I

419 තිරසාර වාර්තාව පිළිබඳ බාහිර සහතිකවීම

421 GRI අන්තර්ගත දර්ශකය

427 ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්

431 ශාඛා කළමනාකරුවන්

437 මූල්‍ය/බැංකු පිළිබඳ ශබ්දකෝෂය

444 ආයතනික තොරතුරු

අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව හඳුන්වාදීම

2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව තුළින් අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය විස්තර කරන අතර ඉන් මහජන බැංකුව සිය මූල්‍ය පාසටහන, හුවමාරු සම්පත්, සහ සේවක ප්‍රජනත්වය පාර්ශ්වකරුවන්ට වටිනාකම ලබාදීමට සහ ජාතියට සිය ප්‍රතිසාධන ගමන්මඟ තුළ සහය වන ආකාරය පිළිබඳ පැහැදිළි කරයි. මෙම වාර්තාවෙන් අපගේ මෙහෙයුම් පරිසරය, උපායමාර්ගය, අවදානම සහ පාලනය, මූල්‍ය සහ ආර්ථික, සමාජීය හා පාරිසරික කාර්යසාධනය සහ අපගේ අනාගත දැක්ම පිළිබඳ විදහත් තොරතුරු ඒකාබද්ධ කරනු ලබයි.

වාර්තාකරණය සඳහා අපගේ ප්‍රවේශය

අපගේ ඒකාබද්ධ වාර්තාව හොඳින් ව්‍යුහගත ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වන අතර, ඉන් ඒකාබද්ධ චින්තනය, සහයෝගිතාව සහ විනිවිදභාවය අවධාරණය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණ කමිටුව විසින් මෙහෙයවන පාලන රාමුවක් තුළින් නිවැරදි හා ශක්තිමත් වාර්තාකරණය අපි සහතික කරමු. අදාළ කාර්යයන්ගේ යෙදවුම් පරීක්ෂාකාරීව ඇතුළත් කරන අතර, විස්වාසී සහ විස්තරාත්මක තොරතුරු අපගේ වටිනා පාර්ශ්වකරුවන්ට ලබාදෙමින් ඒකාබද්ධ සහතික කිරීමේ ආදර්ශයක් තුළින් වාර්තාව සහතික කෙරේ.

ලාභදායිතාව, සමාජීය වටිනාකම් නිර්මාණය සහ පාරිසරික කාර්යසාධනය අතර සම්බන්ධතාවය කාර්යසාධන ධාවක මඟින් සම්බන්ධ කර වටිනාකම නිර්මාණය කරා ඒකාබද්ධ ප්‍රවේශයක් ලබාදේ. එහි විස්තර 84 සිට 176 දක්වා පිටුවල කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණවල දක්වා ඇත.

වාර්තාකරණ චක්‍රය සහ ආයතන

GRI 2-2, 3

2024 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා ආවරණය කරන මෙම වාර්තාව සමඟ බැංකුව වාර්ෂික වාර්තාකරන චක්‍රයක් අනුගමනය කරයි. 2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රකාශනවල බැංකුව සහ එහි පරිපාලිත සමාගම් - පිපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සහ පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - සාමූහිකව ලෙස හඳුන්වන "සමූහය" ඇතුළත්ය. මහජන බැංකුව සමූහයේ අවසාන මව් සමාගම ලෙස කටයුතු කරයි. මූල්‍ය නොවන, අවදානම් කළමනාකරණ සහ ආයතනික පාලන තොරතුරු විශේෂයෙන් දක්වා ඇත්නම් මිස මහජන බැංකුවට පමණක් අදාළ වේ.

තොරතුරු නැවත ප්‍රකාශකිරීම

GRI 2-4

අපගේ පෙර වාර්ෂික වාර්තාවේ කිසිදු තොරතුරක් නැවත ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

වාර්තාකරණ රාමුව

ඒකාබද්ධ වාර්තාකරණය

- ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත පදනමේ (IFRS) ඒකාබද්ධ වාර්තාකරණ රාමුව.

මූල්‍ය, නියාමන හා ආයතනික පාලනය

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
- 1961 අංක 29 දරන මහජන බැංකු පනත එයට එහි සංශෝධන
- 1988 අංක 30 දරන බැංකු පනත එහි යම් සංශෝධන
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ උපදෙස්
- 1953 අංක 24 දරන විනිමය පාලන පනත
- 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත
- 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
- බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකු පනත් නියෝගය සහ එහි යම් සංශෝධන
- 2017 දෙසැම්බර් මස ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන් විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන් සංග්‍රහය.

ESG සහ තිරසාරතා වාර්තාකරණය

- ගෝලීය වාර්තාකරණ ප්‍රවේශ (GRI) ප්‍රමිති – "ගෝලීය තිරසාර ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කළ GRI ප්‍රමිති" අනුකූලව
- එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs)
- බලපත්‍රලාභී වාණිජ බැංකුවල තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ 2022 අංක 05 දරන බැංකු පනත් නියෝගය

දේශගුණය ආශ්‍රිත අනාවරණ

- හරිතාගාර වායු (GHG) විමෝචන හා ඉවත් කිරීම් පිළිබඳ ප්‍රමාණය සහ වාර්තාකරණය සඳහා ISO 14064-1:2018 ආයතනික මට්ටම

බාහිර සහතිකය

GRI 2-5

ශ්‍රී ලංකා විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශන අන්තර්ගතය සඳහා සහතික කිරීම මෙම වාර්තාවේ පිටු අංක 257 සිට 259 දක්වා පිටුවල දක්වා ඇත.

මෙම වාර්තාවේ තිරසාරමය වාර්තාකරණ සංරචකය පිළිබඳ අර්නස්ට් ඇන්ඩ් යන්ග් විසින් බාහිර සහතික කිරීම ලැබී අතර එය මෙම වාර්තාවේ පිටු අංක 419 සිට 420 දක්වා ඇතුළත් වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය ආයතන විගණනය කිරීම සඳහා නීත්‍යානුකූලව බලය පවරා ඇති අතර, බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව විගණකාධිපති හෝ විගණකාධිපති විසින් පත් කරන ලද විගණන ආයතනයක් විසින් විගණනය කරනු ලැබේ.

තිරසාර වාර්තාකරණය පිළිබඳ සහතික සපයන්නා සමඟ ඇති සම්බන්ධය, සහතික කිරීමේ සහභාගිත්වයන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය විසින් නිර්වචනය කර ඇති පරිදි ස්වාධීන සහතික කිරීමක් ලෙස ඉදිරිපත් කර තිබේ.

වටිනාකම් නිර්මාණය

GRI 2-6

ශ්‍රී ලංකාව වර්ධන ආර්ථිකයක් කරා ගමන්මඟක සිටින අතර, වසර කිහිපයකට පෙර සිදු වූ සාර්ව ආර්ථිකයේ මහ විනාශයෙන් ක්‍රමයෙන් යථාතත්ත්වයට පත්වෙමින් සිටී. මහජන බැංකුව සමාජය තුළ විශාල කොටසකට මූල්‍ය සේවා ලබාදීමට වඩාත් ව්‍යාප්ත ලඟාවීමත් සමඟ ප්‍රමුඛ මූල්‍ය ආයතනයක් ලෙස අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කළේය. සිය නිෂ්පාදන සහ සේවා සම්භාරය නවීකරණය කරමින්, බැංකුව සිය ප්‍රේෂණ නිෂ්පාදන පිරිනැමීම් තුළින් වඩාත් අවශ්‍ය විදේශ විනිමය ලබාගැනීමට සැලකියයුතු ලෙස දායක වූ අතර, එය විශ්වාස කළ නොහැකි සාර්ථකත්වයක් විය. ගලපන ලද මූල්‍ය විසඳුම් ආර්ථික දුෂ්කරතා ජය ගැනීමට මහත් පරිශ්‍රමයක් දරමින් විවිධ ව්‍යාපාරවල වර්ධනය ගොඩ නැගීමට, පෝෂණය කිරීමට හා ආර්ථික කටයුතු උත්තේජනය කිරීමට උපකාර විය.

බැංකුව සියලුම පාර්ශ්වකරුවන්ට සුවිශේෂී වැඩිකල වටිනාකම් නිර්මාණය සහිත ප්‍රසංශනීය සටහනක් සමඟ සහ ශ්‍රී ලංකා රජයට ඉහළම සහය දිගුකරමින් මූල්‍ය වර්ෂය අවසාන කර ඇත. එහිදී ප්‍රතිසාධනය කරා ඇතිකළ සිය මූලිකාරම්භයන් කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, ශක්තිමත් මූල්‍ය සහ තිරසාර සාර්ව ආර්ථික මූලධර්මවල මුල් බැසගෙන ඇත. වටිනාකම නිර්මාණ ආදර්ශය 70 සිට 71 දක්වා පිටුවල දක්වා ඇත.

ප්‍රමාණාත්මතාව

අපි මෙම ඒකාබද්ධ වාර්තාව නිර්මාණය කිරීමේදී, කෙටි, මධ්‍යම සහ දිගුකාලීන වටිනාකම නිර්මාණය සඳහා අපට ඇති හැකියාව කෙරෙහි ප්‍රමාණාත්මකව බලපෑ හැකි කරුණු හඳුනාගෙන, කොටස් කර වාර්තා කරන ලදී. මේවා ක්ෂේත්‍රයට විශේෂිත වන අතර, වඩා පුළුල් මෙහෙයුම් පරිසරයක් තුළ ස්ථානගත පාර්ශ්වකරුවන් කෙරෙහි ඒවායේ සමස්ත බලපෑම සලකා බලන ලදී.

නිවැරදිව විශ්වාසදායීව වාර්තාකරණය අපගේ සියලුම වාර්තාවල ප්‍රමුඛ ලකුණක් වන්නේ ගුණාත්මය, අදාළත්වය සහ කියවීමේ හැකියාව වැඩි කිරීමට අපි කැපවී සිටින බැවිනි. මෙම වාර්තාව පුරාම මෙම ගුණාංග පෙන්වීම අපි තවදුරටත් සිදුකර ඇති අතර, එය ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම අපට ආඩම්බරයකි.

මෙහෙයවීමේ මූලධර්ම

අපගේ කාර්යසාධනය පිළිබඳ විශ්වාසනීය සමාලෝචනයක් ඉදිරිපත් කරන බව සහතික කිරීම සඳහා මෙම වාර්තාව පිළියෙල කිරීමේදී බැංකුව පහත මෙහෙයුම් මූලධර්ම යොදා ගෙන ඇත.

තොරතුරුවල සම්බන්ධතාව

මෙම වාර්තාව තුළ උපායමාර්ගය, වැදගත් තේමා සහ පාර්ශ්වකරුවන් සම්බන්ධ කිරීමට අයිකන භාවිතා කර ඇත.

නිවැරදි නියෝජනය

ධනාත්මක, උදාසීන සහ සෘණාත්මක අංගයන් ඇතුළුව අපගේ කාර්යසාධනය පිළිබඳ තුළනාත්මක දැක්මක් අපි ඉදිරිපත් කර ඇත.

කෙටි බව

මෙම වාර්තාවේ පරිශීලකයින් වෙත තීරණාත්මක කරුණු ගෙන ඒමේදී සංක්ෂිප්ත ආකාරයෙන් වාර්තාකරණය ප්‍රධාන පරමාර්ථයක් වී ඇත. කෙසේවෙතත්, අවශ්‍ය තැන්වලදී, නිරවද්‍යතාව සහ විනිවිදභාවය සඳහා අපි විස්තර ඇතුළත් කර ඇත.

අනුරූපතාව සහ තුළනාත්මකභාවය

තුළනාත්මකභාවය ඇතිකළ හැකි සෑම අවස්ථාවකදීම මැනීම සඳහා දර්ශක වාර්තාකරණ රාමුවට සහ ක්ෂේත්‍රයේ ප්‍රමිතිවලට ගලපන ලදී.

විශ්වාසනීයත්වය

මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරුවල විශ්වාසනීයත්වය සහතික කිරීමට අභ්‍යන්තර ක්‍රියාවලි සහ පාලනයන් ක්‍රියාවට නංවා ඇත.

පූර්ව ආරක්ෂණ මූලධර්මය

GRI 2-23

අපගේ සමාජීය සහ පාරිසරික තිරසාරභාවය තීරණය කිරීමේ මැනීමක් ලෙස පූර්වාරක්ෂාව පිළිබඳ මූලධර්මය අපි අදාළ කර ගනිමු. අපගේ මෙහෙයුම් සමාජයට සහ පරිසරයට සමස්ත ධනාත්මක බලපෑමක් ඇති කරන බව දන්නා අතරම, සෘණාත්මක බලපෑමක ඕනෑම අවදානමක් අවම කිරීම සහතික කිරීමට අපි අවශ්‍ය පියවර ගෙන ඇත්තෙමු. මේවා 79 පිටුවේ විස්තර කර ඇත.

මෙම වාර්තාව සහ ප්‍රතිපෝෂණ වෙත ප්‍රවේශ වීම

GRI 2-3

මෙම වාර්තාව අපගේ වෙබ් අඩවියෙන් බාගත හැකිය:
www.peoplesbank.lk/last financial-result/

කරුණාකර මෙම වාර්තාව පිළිබඳ ඔබේ ප්‍රතිපෝෂණයන් අප වෙත එවන්න.

අසාමි ඒ අහමට්
මූල්‍ය ප්‍රධානී,
මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණ දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 2

+94 11 248 1481 (ex. 498)
azzam@peoplesbank.lk
info@peoplesbank.lk www.peoplesbank.lk



බැංකුව පිළිබඳව

8 අපගේ බැංකුව
9 අපගේ සමූහය
10 සන්ධිස්ථාන
12 සම්මාන
14 විශේෂ අවස්ථා

අපගේ බැංකුව

දැක්ම පරිවර්තනීය වර්ධනයක් කරා ජාතිය පෙලඹවීම

මෙහෙවර

ජීවන තත්ත්වයට සහ දැරිය හැකි, ප්‍රවේශ විය හැකි කාර්යක්ෂමව සැපයෙන විසඳුම් තුළ ව්‍යාපාර ප්‍රවර්ධනයට දායක වන මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරයක අපි නිරත වේ.

අපි අපගේ මානව සම්පත සවිබල ගන්වා සංවර්ධනය කරන අතර, එවිට ඔවුන් අපගේ ගනුදෙනුකරුවන් රැකබලාගෙන අරක්ෂා කරනු ලැබේ.

අපි තරඟකාරී ලෙස ලාභ ලබන අතරම ජාතික ආර්ථික සංවර්ධනයට දායක වන්නෙමු.

අපගේ ව්‍යාපාරය තුළ තිරසාර වෙමින්ම,අප ක්‍රියාත්මක වන සමාජයට අගය ප්‍රතිදානය කිරීම පිළිබඳව අපි විශ්වාස කරමු.

වටිනාකම් ප්‍රකාශනය

ජාතියේ අභිමානය වීම

ගනුදෙනු අවධානම සහ කඩිසරකම

අවංකකම සහ වගවීම

අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතිය සහ කණ්ඩායම් හැඟීම

බලගැන්වීම සහ විවිධත්වය

උපායමාර්ගික ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා බැංකුවේ ඉලක්කයන් (BHAG)

ක්ෂේත්‍රයේ විශිෂ්ඨතම සේවක තෘප්තිමත් මට්ටම සමගින් වැඩි ගණුදෙනුකරුවන් අපේක්ෂා කරන බැංකුවක් වීම

මහජන බැංකුව 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් ස්ථාපිත කරන ලද අතර, දේශීය වශයෙන් ක්‍රමානුකූලව වැදගත් බැංකුවක් (D-SIB) ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව නම් කර ඇත. දිවයින පුරා මිලියන 15.1ක් වන ගනුදෙනුකරුවන්ට සේවය කරන විශාලතම ශාඛා ජාලයක් බැංකුව සතුය. ශාඛා 751 ක ජාලයක් හරහා පැතිරුණු බැංකුවේ කාර්ය මණ්ඩල ශක්තිය 7,633 ක් වේ. මෙම බැංකුව ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකාව තුළ පමණි.

මහජන ඔහසාධනය අපගේ ප්‍රධාන රාජකාරියක් ලෙස, 2024 ද වැඩි කාර්යසාධනයක් ලබාදෙන පුද්ගලික අංශය ඇතුළත් කිරීම සඳහා වන අපගේ ව්‍යාප්තිය සාර්ථකව පුළුල් කරන ලදී.

ජනතාවගේ සෑම කොටසකම මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රමඛතාවක් වන බැවින්, ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ පුරා විහිදුනු අපගේ විස්තීර්ණ ශාඛා ජාලය තුළින් ජාතියේ මූල්‍ය අංශයේ ස්ථායිතාව වෙත අපි සැලකියයුතු දායකත්වයක් ලබාදෙන්නෙමු. සමාජයේ ආර්ථිකමය වශයෙන් වරප්‍රසාද නොලත් කොටස්වල තිරසාර සංවර්ධනය තුළ සහ ලාභදායීතාව සහ ජනතා ඔහසාධනය පහසුවෙන් සම්බන්ධකිරීම තුළ ශ්‍රී ලංකා රජයේ උත්සාහයන්ට අපි සහය වෙමු.

බැංකු ක්ෂේත්‍රයේ ඉහළම මට්ටමේ ඩිජිටල් සේවා සපයන්නෙක් ලෙස පිළිගැනීම සඳහා 2024 දී අපි අපගේ ඩිජිටල් හැකියාවන් සැලකියයුතු ලෙස වැඩි කර ඇත්තෙමු.

අපගේ සමූහය

PEOPLE'S BANK
Pride of the Nation

	PEOPLE'S LEASING		PEOPLE'S BANK		PEOPLE'S TRAVELS
සංස්ථාපිත වර්ෂය	1995		1961		1993
	75% හිමිකාරිත්වය				99% හිමිකාරිත්වය
ගනුදෙනුකාර අංශ	පුද්ගලයින් ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්		පුද්ගලයින් ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ආයතනික, රජයට සහ රජයට අයත් ව්‍යවසාය		පුද්ගලයින් ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්
ප්‍රධාන නිෂ්පාදන හා සේවා	කල්බදු හා කුලීපිට මිලදී ගැණුම් ක්ෂුද්‍ර මූල්‍ය තැන්පතු ණය		පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය ව්‍යවසාය බැංකුකරණය ආයතනික බැංකුකරණය ජාත්‍යන්තර බැංකුකරණය භාණ්ඩාගාර හා ආයෝජන බැංකුකරණය		අභ්‍යන්තර සංචාරය පිටතට සංචාරය ගමනාන්ත කළමනාකරණය
කාර්යසාධන සුවිශේෂී අවස්ථා	වත්කම්: රු. බිලියන 160.5 බදු පසු ලාභය: රු. බිලියන 3.7		වත්කම්: රු. බිලියන 3,297.8 බදු පසු ලාභය: රු. බිලියන 25.1		වත්කම්: රු. මිලියන 149.0 බදු පසු ලාභය: රු. මිලියන 5.9
ශාඛා ගණන	109		751		2
කාර්ය මණ්ඩල ශක්තිය	3,342		7,633		19

සන්ධිස්ථාන

1970 to 1979

- අවිධිමත් අංශයේ ආර්ථික කටයුතු වලට මුදල් ලබා දීම සඳහා "අතමාරු" ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.
- 100 වැනි ශාඛාව මරඳගහමුලදී විවෘත කරන ලදී.
- සේවක සංඛ්‍යාව 5,000ට ලඟාවීම
- පළමු ධීවර බැංකුව කොරළවැල්ලේදී විවෘත කරන ලදී.

1980 to 1989

- විස්තිර්ණ බාල වයස්කරුවන්ගේ ඉතුරුම් යෝජනා ක්‍රමය දියත් කරන ලදී
- 300 වැනි ශාඛාව ඉංගිරියේදී විවෘත කරන ලදී.
- මුළු සේවක සංඛ්‍යාව 10,000ට ළඟා වීම.
- පීපල්ස් මර්චන්ට් බැංකුව බැංකුවේ පාර්පාලිත සමාගමක් ලෙස ස්ථාපිත කරන ලදී
- පරිඝනකකරණ ක්‍රියාවලිය අපගේ ප්‍රධාන කාර්යාලයේ සහ තෝරාගත් නගර ශාඛා වලින් ආරම්භ වූ අතර පාරිභෝගිකයන් ආපසු හැරවීමේ කාලය සැලකිය යුතු ලෙස අඩු කරමින් බිලැක් ලයිට් පද්ධතියක් හඳුන්වා දෙන ලදී.

1990 to 1999

- පළමු ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රය ප්‍රධාන කාර්යාල ශාඛාවේදි ස්ථාපිත කිරීම
- රජයේ ඇඟලුම් කම්හල් 200ක වැඩසටහන සඳහා බැංකුව සහාය විය.
- ශාඛා 160ක් පරිගණක ගත කරන ලදී.
- "වනිතා වාසනා", සහ "ඉසුරු උදාන" ඉතුරුම් යෝජනා ක්‍රම, "සුරතුර" ණය යෝජනා ක්‍රමය, "විදේශිකා" තැන්පතු යෝජනා ක්‍රමය ආදිය දියත් කරන ලදී.

2000 to 2009

- "ජන ජය", ඉතුරුම් සහ ණය යෝජනා ක්‍රමය දියත් කරන ලදී.
- මධ්‍යම ATM ස්විචය හඳුන්වා දෙන ලදී.
- ATM යන්ත්‍රවල මුළු ගණන 90 දක්වා වර්ධනය විය.
- මහජන ස්වයංක්‍රීය බැංකු පද්ධතිය (PABS) සහිත ශාඛා සංඛ්‍යාව 218 දක්වා වැඩි වූ අතර ශාඛා 119 ක් මධ්‍යම ATM ස්විචය සම්බන්ධ කර ඇත. භාණ්ඩාගාර ස්වයංක්‍රියකරණ පැකේජයක් ක්‍රියාත්මක කරන ලදී.
- බැංකුව නවීනතම මධ්‍ය බැංකුකරණ පැකේජයක් සහ වෙළෙඳ සේවා විසඳුම්
- ස්ථාපනය කිරීමට මැලේසියාවේ Silver Lake System SDV BUD සමඟ ගිවිසුම්ගත වීම.
- බැංකුව ෆිට්ච් රේටින්ග්ස් ලංකා වෙතින් BBB+ හි පළමු මහජන ශ්‍රේණිගත කිරීම ලබා ගත්තේය.
- මධ්‍ය බැංකුකරණ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී
- රජය,අසියානු සංවර්ධන බැංකුව සහ මහජන බැංකුව අතර අත්සන් කළ ස්කන්ධ ප්‍රාග්ධන අයොජන ලෙස පළමු ප්‍රාග්ධන වාර්කය රුපියල් බිලියන 2න් වන අතර, දෙවන ප්‍රාග්ධන වාර්කය රුපියල් බිලියනයක් සහ තුන්වන ප්‍රාග්ධන කොටස රුපියල් බිලියන 1.5 ක් බැංකුව වෙත ලබා ගැනීම
- පළමු වරට, 2008 වාර්ෂික වාර්තාව සඳහා SAFA (ගණකාධිවරුන්ගේ දකුණු ආසියානු සංගමය) සම්මානය හිමි විය.

1961 to 1969

- 1961 ජූලි 1 දින ආරම්භ කරන ලදී
- කොළඹ ඩියුක් වීදියෙහි මෙහි පළමු ශාඛාව විවෘත කිරීම
- උකස් ණය සේවා අරම්භ කිරීම
- සමූපකාර ග්‍රාමීය බැංකු යෝජනා ක්‍රමය සහ කුඩා ගොවිපල අංශයේ පුරෝගාමී ණය දෙන්නා බවට පත්වෙමින් නව කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී.

2010 to 2019

- බැංකුව 2012 වර්ෂයේ ජාත්‍යන්තර ARC සම්මාන උළෙලේදී ජාතික වර්ගීකරණය තුළ විශිෂ්ඨ සම්මානයක් සහ රන් සම්මාන තුනක් දිනා ගන්නා ලදී. ඒ 2011 වාර්ෂික වාර්තාව සඳහාය.
- දිවයින පුරා කුඩා හා මධ්‍ය පරිමාණ මධ්‍යස්ථාන 23ක් ස්ථාපිත කරන ලදී.

  ජාතික පොදු ATM ස්විචය හා සම්බන්ධ වූ පළමු බැංකුව බවට මහජන බැංකුව පත්වීම.
- බැංකුවේ වත්කම් පදනම රුපියල් ට්‍රිලියනය ඉක්මවා ගිය අතර මෙම කර්මාන්තය තුළ දෙවන විශාලතම බැංකුව බවට පත්විය.
- 2014 වර්ෂයේදී European Global Banking and Finance Award හිදී —Bank of the Year 2014 සම්මානය මෙන්ම උදරකා Finance Banking Awards 2014 සම්මාන උළෙලේදී "ශ්‍රී ලංකාවේ හොඳම බැංකු සමූහය" සහ "ශ්‍රී ලංකාවේ වඩාත් තිරසාර බැංකුව" යන ත්‍රිත්ව සම්මාන දිනා ගත්තේය.

  බැංකුව සිය තිරසාර බැදීම් පෙන්නුම් කරමින් හරිත

  බැංකුකරණ සංකල්පයක් දියත් කරන ලදී
- ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය වූ ශාඛාව කොළඹ දී විවෘත කළ අතර ජාතියේ රාජ්‍ය බැංකුවක් සඳහා ප්‍රථමයෙන් තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා කීර්තිමත් ISO/IEC 27001:2013 තත්ත්ව සහතිකය ලබා ගන්නා ලදී.
- People's Wave ශ්‍රී ලංකාවේ වැඩිපුරම බාගත කළ මුල්‍ය යෙදුම බවට පත් විය.
- පාර්ලිමේන්තුව විසින් සම්මත කල මහජන බැංකු (සංශෝධිත) පනතින් පසු ණයකර නිකුතුව මගින් රු. බිලියන 10ක් බැංකුවට රැස් කිරීම SBUS 2390 ලඟා වූ අතර වසර තුනක් තුළ එය සුවිශේෂී ජයග්‍රාහනයකි.
- මේ දක්වා ශ්‍රී ලංකාවේ ඕනෑම වාණිජ බැංකුවක් විසින් සුරක්ෂිත කර ඇති විශාලතම සහ දීර්ඝතම ද්විපාර්ශ්වික අරමුදල් පහසුකම සඳහා බැංකුව අත්සන් තැබීය.

2020

- කොවිඩ්-19 කාලය තුළ බැංකුව ජාතියට, ගනුදෙනුකරුවන්ට සහ සාමාන්‍ය ජනතාවට අසමසම සහයෝගයක් ලබා දුන්නේය.

  මහජන බැංකුව මෙතෙක් රැස්කරගත් ඉහළම මට්ටම වන, රු. බිලියන 20ක් වටිනා ස්ථර II ණයකර ලබාගෙන ඇත.
- සන්නාම වටිනාකම් තුළ ධනාත්මක නැගුමක් සහිත ඉහලම ආයතන 3 සහ රජයට අයත් එකම බැංකුව වීම.

2021

- බැංකුව සිය 60 වැනි සංවත්සරය සමරනු ලැබුවේ "ජාතියේ අභිමානය" යන තේමාවෙනි.
- People's Wave මිලියනයකට අධික සක්‍රීය පරිශීලකයින් සමඟ රටේ වැඩිපුරම බාගත කළ ජංගම යෙදුම බවට පත් වූ අතර ඉන් පසු People's Pay Wallet දියත් කළේය.

2022

- අධිමිල වෙළඳපොල අංශයට සේවය සැලසීම නව සන්නාම දෙකක් එනම් ජයෙන් ජයට උදාරත්වය දියත් කිරීම.
- අපගේ ආයතනික සමජ වගකීම් සහගත වැඩසටහන් යටතේ මහජන මෙහෙවර හඳුන්වා දීම.
- 2022-2024 වර්ෂවල උපායමාර්ගික සැලසුම් සාර්ථකව දියත් කරන ලදී.
- ජයග්‍රහණය කළ සම්මාන
  - බෑන්කර් සඟරාව විසින් ලොව හොඳම බැංකු 1000 අතරට මහජන බැංකුව නම් කරන ලදී
  - ආසියානු බැංකු සඟරාව ආසියානු බැංකුකරුවන්ගේ හොඳම බැංකු 500 අතරට බැංකුව ඇතුළත් කළේය.
  - 2022 ජාත්‍යන්තර ARC සම්මාන උළෙලෙහි රන් සම්මාන දෙකක් 2021 ඇතුළුව සම්මාන හතරක් ලබා ගන්නා ලදී
  - Integrated Reporting Awards 2022 හීදී 2021 වාර්ෂික වාර්තාව CMA විශිෂ්ටත්වයේ හොඳම ඒකාබද්ධ වාර්ෂික වාර්තා 10 අතරට ඇතුළත් විය
  - දකුණු ආසියනු ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සම්මාන උළෙලේදී රාජ්‍ය අංශයේ බැංකු කාණ්ඩය සඳහා හවුල් ලෝකඩ සම්මානය දිනා ගන්නා ලදී.
  - TAGS සම්මාන උළෙලේදී රාජ්‍ය අංශය සඳහා ලෝකඩ සම්මානය දිනා ගන්නා ලදී
  - 2022 WFW සම්මාන උළෙලේහි කාන්තාවන් සඳහා ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම සේවා ස්ථානය බවට පත්විය.

2023

- බැංකු සේවාව වැඩි දියුණුකර ලබාදීමට මහජන බැංකුව ඉන්දීය HDFC බැංකුව සමඟ අත්වැල් බැඳගනී.
- දේශීය බැංකු ඒකකවල වෙළෙඳ මූල්‍ය ව්‍යාපාර ශක්තිමත් කිරීමේ අරමුණින් 2023 ජූලි මාසයේ සිට කලාප හතක අපනයන අංශයට විශේෂිත වූ SME මධ්‍යස්ථාන (අපනයන මධ්‍යස්ථාන) ස්ථාපිත කෙරේ.
- People's FX Future Plus විදේශ මුදල් ස්ථාවර තැන්පතු ගිණුම 2023 ජුනි මාසයේදී හඳුන්වා දෙන ලදී.
- 2023 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට සහය දැක්වීමට සහ නඟා සිටුවීම සඳහා බැංකුව විසින් People's Power ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.
- බැංකුව 2023 සැප්තැම්බර් මාසයේදී නව කාර්ය මණ්ඩල සාමාජිකයින් 500ක කණ්ඩායමක් බඳවා ගන්නා ලදී.

2024

- රුපියල් බිලියන 25.1ක ඉහළ බදු පසු ලාභයක් සමඟ වාර්තාගත කාර්යසාධනය.
- රජයට අයත් ආයතන සඳහා සැලකියයුතු අඩු නිරාවරණය සහ පුද්ගලික අංශ ණයදීමට ප්‍රසාරණය විය.
- ආයතනික බැංකුකරණයට නව සාමාජිකයින් 100ක් බඳවා ගන්නා ලදී.
- ඩිජිටල් විසඳුම් ලියාපදිංචිවීම් මිලියන 4.4ට ලඟා විය.
- තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති සඳහා නවතම ISO 27001:2022 ප්‍රමිතිය යටතේ පළමු දේශීයව ක්‍රමානුකූලව වැදගත් බැංකුව බවට පත්වීම.

සම්මාන

ලංකා පේ තාක්ෂණ සම්මාන

- රන් සම්මානය – වඩාත් ජනප්‍රියතම ඩිජිටල් ගෙවීම් නිෂ්පාදනය (රාජ්‍ය බැංකු වර්ගීකරණය – අන්තර්ජාල සහ ජංගම බැංකුකරණය)
- කුසලතා සම්මානය – වසරේ විශිෂ්ඨතම පොදු ATM සක්‍රීය කරන්නා – වර්ගීකරණය A
- කුසලතා සම්මානය – ගනුදෙනුකාර පහසුව තුළ විශිෂ්ඨත්වය සඳහා වසරේ බැංකුව – වර්ගීකරණය A
- කුසලතා සම්මානය – මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වසරේ බැංකුව වර්ගීකරණය A

Slim Digis 2.4 – 2024

- ලෝකඩ සම්මානය – ඩිජිටල් නිර්මාණශීලී අන්තර්ගත විශිෂ්ටතම භාවිතය
- කුසලතා සම්මානය – CSR, අරමුණ පදනම් ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන

කාන්ත හිතකාමී සේවා ස්ථාන සම්මාන

- CIMA Satynmag කාන්තා හිතකාමී සේවා ස්ථාන සම්මාන

TAGS සම්මාන 2024

- ලෝකඩ සම්මානය – රාජ්‍ය බැංකු අංශය

CPM මනා කළමනාකරණ පිළිවෙත් සමාගම් සම්මාන

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ අධිකාරී කාණ්ඩයේ ජයග්‍රාහකයා
- රාජ්‍ය බැංකු අංශයේ බැංකු කාණ්ඩයේ ජයග්‍රාහකයා

ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන 2024

- ජයග්‍රාහකයා – බැංකු අංශය
- ජයග්‍රාහකයා – කාර්යසාධන කළමනාකරණයේ විශිෂ්ටත්වය
- අනුශූරතාවය – පාරිසරික තිරසාරතාමය තුළ විශිෂ්ටත්වය
- අනුශූරතාවය – දේශීය වෙළෙඳපොල ලඟාවීම තුළ විශිෂ්ටත්වය
- කුසලතා – අති විශාල වර්ගය
- කුසලතා – ආයතනික සමාජීය වගකීම තුළ විශිෂ්ටත්වය

AICPA සහ CIMA ඉහළම සේවායෝජක සම්මානය 2024

- මහජන බැංකුව ඉහළම සේවායෝජකයින් 20 අතර නම්කරන ලදී

ඒකාබද්ධ වාර්තාකරණය තුළ CMA විශිෂ්ටතා සම්මාන – 2024

- පළමු අනුශූරතාවය – මහජන බැංකුව වෙත විශිෂ්ට ඒකාබද්ධ වාර්තාකරණය සම්මානය පිරිනමන ලදී (රාජ්‍ය බැංකු අංශය)
- කුසලතා සම්මානය

සුමති සම්මාන 2024

- විශිෂ්ටතම රූපවාහිනී වෙළෙඳ දැන්වීම – 2වැනි අනුශූරතාව

BestWeb සම්මාන 2024

- හොඳම බැංකු සහ මූල්‍ය වෙබ් අඩවිය සඳහා වන ලෝකඩ සම්මානය

ගෝලීය ව්‍යාපාර සමාලෝචන සඟරා සම්මාන – 2024

- Banking Chairman of The Year Sri Lanka 2024 – Mr Sujeewa Rajapakse
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ බැංකු සේවා සපයන්නා
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ විශිෂ්ට පාරිභෝගික ඩිජිටල් බැංකුව
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ විශිෂ්ට ණයකාඩ් පිරිනැමීම්
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ විශිෂ්ට ඩිජිටල් බැංකු විසඳුම් සපයන්නා
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ විශිෂ්ට ඩිජිටල් වොලට් යෙදුම – People's Pay
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ විශිෂ්ට මූල්‍ය අන්තර්ගතකරණ වැඩසටහන
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ විශිෂ්ට ජංගම බැංකුකරණ යෙදුම 2024 – People's Wave
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ වඩාත් නව්‍යකරණ ණය කාඩ්පත් සේවා
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ වඩාත් කැපීපෙනෙන කාන්තා හිතකාමී සේවා ස්ථානය
- ශ්‍රී ලංකාවේ වඩාත් ප්‍රතිචාරාත්මක බැංකුව 2024
- 2024 වසරේ ශ්‍රී ලංකාවේ වඩාත්ම තිරසාර බැංකුව

මූල්‍යමය සුවිශේෂී අවස්ථා

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	බැංකුව			සමූහය		
	2024	2023	වෙනස %	2024	2023	වෙනස %
මෙහෙයුම් කාර්ය සාධනය (රු.බි.)						
පොළී ආදායම	349.3	394.8	-11.5	377.0	424.5	-11.2
ශුද්ධ පොළී ආදායම	107.2	54.3	97.4	122.9	67.8	81.3
දළ ආදායම	368.0	422.2	-12.9	400.0	454.5	-12.0
මූල්‍ය සේවා මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය	56.8	22.7	150.5	65.0	28.5	127.8
බදු පෙර ලාභය	41.6	15.3	171.0	47.6	19.3	147.1
ආදායම් බදු	16.5	5.3	213.5	18.8	7.9	138.9
බදු පසු ලාභය	25.1	10.1	148.8	28.8	11.4	152.8
මූල්‍ය තත්ත්වය (රු.බි.)						
මුළු වත්කම්	3,297.8	3,038.2	8.5	3,471.7	3,208.2	8.2
දළ ණය සහ ලැබීයුතු දේ	1,671.2	1,846.4	-9.5	1,824.1	1,971.8	-7.5
මුළු තැන්පතු	2,854.7	2,653.1	7.6	2,947.9	2,745.2	7.4
කොටස් හිමියන්ගේ අරමුදල්	182.0	160.1	13.7	230.0	205.0	12.2
කාර්ය සාධන අනුපාත (%)						
වත්කම් මත ඉපයීම් (බදු වලට පෙර)	1.3	0.5		1.4	0.6	
ස්කන්ධ මත ඉපයීම් (බදු පසු)	14.7	6.6		13.2	5.8	
ශුද්ධ පොළී ආන්තිකය	3.4	1.8		3.7	2.1	
ආදායමට පිරිවැය අනුපාතය	50.3	62.8		52.2	64.3	
වත්කම් ගුණාත්මකභාව අනුපාත (%)						
හානිකළ ණය (අදියර 3) අනුපාතය	10.3	8.8		9.7	8.8	
අදියර 3 ණය අනුපතයට හානිකරණය	41.5	41.0		42.4	41.5	
ද්‍රවශීලතා වත්කම් අනුපාතය (%) (අවම අවශ්‍යතාවය - 100%)						
ද්‍රවශීලතා ආවරණ අනුපාතය - රුපියල්	353.9	256.7				
ද්‍රවශීලතා ආවරණ අනුපාතය - සියලු ව්‍යවහාර මුදල්	279.5	207.9				
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය	178.9	164.3				
නියාමන ප්‍රාග්ධන අනුපාතය (%)						
පොදු ස්කන්ධ ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය - 8.0%)	10.4	11.9		12.2	13.3	
පළමු පෙළ ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය - 9.5%)	10.9	12.4		12.6	13.7	
මුළු ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය - 13.5%)	16.5	17.4		17.7	18.2	
කොටස් හිමිකාර අනුපාත (රු.)						
කොටසක ඉපැයීම්	25,088	10,083	148.8	27,559	10,513	162.1
කොටසක ශුද්ධ වත්කම් අගය	181,998	160,059	13.7	229,952	204,984	12.2

බදු පෙර ලාභය

රු.බි.



2024	41.6	වෙනස	171%

මුළු වත්කම්

රු.බි.



2024	3,297.8	වෙනස	8.5%

මුළු තැන්පතු

රු.බි.



2024	2,854.7	වෙනස	7.6%

මුළු ස්කන්ධය

රු.බි.



2024	182.0	වෙනස	13.7%

ශුද්ධ ගාස්තු ආදායම

රු.බි.



2024	107,242	වෙනස	97%

ශුද්ධ ගාස්තු හා කොමිස්

රු.බි.



2024	14,166	වෙනස	10%

වෙළෙඳපොල සහ පාරිභෝගිකයා

මිලියන 4.4
ඩිජිටල් විසඳුම් ලියාපදිංචිය

640,220
නව පාරිභෝගිකයින් ඇතුළත් විය

51% ට වඩා
සේවය කරන පාරිභෝගිකයින්ගෙන් කාන්තාවන් වේ

91% ට වඩා
පැමිණිලි විසඳන ලදී

සේවකයින්

මුළු සේවකයන්
7,633

96%
රඳවාගැනීමේ අනුපාතය

කාන්තා සේවිකාවන්
4,736

ස්ථිර සේවකයෙකු සඳහා සාමාන්‍ය පුහුණු කාලය:
පැය 26

ESG

ගෙවා ඇති ජාතික වශයෙන් දායකත්වය - මුළු බදු, විශේෂ බදු සහ ලාභාංශ
රු. බිලියන 33.4

ව්‍යාපාර හවුල්කරුවන් -
e-GP
හරහා සැපයුම්කරුවන් ලියාපදිංචිය

ප්‍රජාව - ප්‍රජාවට දායකත්වය
රු. බිලියන 36.0

පරිසරය - **මිලියන 1.04**
ගිණුම් ඩිජිටල් ලෙස විවෘත කර ඇත

දේශීය සැපයුම්කරුවන් සඳහා නිර්මාණය කරන ලද අගය
රු. බිලියන 20.9

මුළු ඩිජිටල් පුහුණු පැය
35,287

සූර්ය බලයෙන් ක්‍රියාත්මක හරිත ශාඛා ගණන
73

සම්බන්ධීකරණ බැංකු
42

වොස්ට්‍රෝ නියෝජිතයින්
88

සම්පූර්ණ පුහුණු පිරිවැය
රු. මිලියන 121.5

විධායක සමාලෝචනය

18
සභාපතිවරයාගේ ලිපිය

22
සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය

26
අධ්‍යක්ෂ මණ්ඩලය

30
ආයතනික කළමනාකරණය

38
විධායක කළමනාකරණය

41
ප්‍රධාන කළමනාකරුවන්

සභාපතිවරයාගේ ලිපිය

GRI 2-22

2024 සඳහා, 148.8%ක වාර්ෂික වර්ධනයක් පිළිබිඹු කරමින් රු. බිලියන 25.1ක පශ්චාත් බදු ලාභයක් අපි වාර්තා කළෙමු. ස්කන්ධය මත ඉපයීම (ROE) 14.7%ක් වූ අතර, වත්කම් මත ඉපයීම 1.3%ක් විය. අපගේ ප්‍රාග්ධන අවශ්‍යතාව 16.5%ට ලඟාවූ අතර එය නියාමන අවශ්‍යතාවන්ට ඉහළ අගයකි.

මිලියන තුනකට වැඩි ඩිජිටල් පාරිභෝගික පදනමක් සමඟ, බැංකුව සිය මෙහෙයුම් පා සටහන කාර්යාල තුළ මෙහෙයුම්වල සිට ඩිජිටල්කරණයක් භාවිතයෙන් ඉතුරුම් සුරක්ෂිත කරන මාර්ගයකට පරිනාමනය වන බැවින්, බැංකුව ඩිජිටල් බැංකුකරණයේ සියලුම ක්ෂේත්‍රවල බලකායක්වීමේදී සිය ඩිජිටල් නායකත්වය පුළුල් කර ඇත.

2024 දෙසැම්බර් 31 ක් අවසන් වූ වසර සඳහා මහජන බැංකුවේ ("බැංකුව") වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මට සතුටක් වන අතර, ඉන් වෙනත් කරුණු අතර – අඛණ්ඩ ආර්ථික දුෂ්කරතා මැඩ පැවැත්වීමේදී සහ 2024 දී වඩා ඉහළ කාර්යසාධනය සාක්ෂාත් කර ගැනීමට අභියෝග ජයගනිමින් බැංකුව විසින් පෙන්වා ඇති සැලකියයුතු ඔරොත්තුදීම සහ අනුවර්ත්‍යතාව ඉස්මතු කරයි. අපගේ ගමන්මඟ තුළින්, අපගේ ග්‍රාමීය පසුබිම මත අවධාරණය සහිතව ශ්‍රී ලංකා රජයේ සිට ආයතනික අංශය සහ වඩාත් පුළුල්ව ශ්‍රී ලංකාවේ පොදු ජනතාව දක්වා විහිදෙන අපගේ විවිධ පාර්ශ්වකාර කණ්ඩායම වෙත අපගේ පොරොන්දුව මත සේවය කිරීමට අපි තවදුරටත් දැඩිව කැපවී සිටිමු. ඉතා ගැඹුරු ආර්ථික අර්බූදයකින් පසු වසංගතයක් විසින් විනාශ කළ දේශපාලන, සමාජීය සහ සාර්ව ආර්ථික වාතාවරණයට තුඩුදුන් සහ අපගේ පාර්ශ්වකරුවන් මත මූල්‍යමය දුෂ්කරතා දැඩි කළ අවිනිශ්චිතතා අපි තවදුරටත් යාන්ත්‍රණය කරමු.

2024 දෙසැම්බර් 31 ක් අවසන් වූ වසර තුළ, – සමාන පදනමක් මත වසර අවසානයේදී සිය ඒකාබද්ධ වත්කම්, තැන්පතු සහ ශුද්ධ ණය පිළිවෙලින් රු. ට්‍රිලියන 3.5ක් රු. ට්‍රිලියන 2.9ක් සහ රු. ට්‍රිලියන 1.7ක් සමඟ බැංකුව රු. බිලියන 400.0ක ඒකාබද්ධ දළ ආදායමක් සහ රු. බිලියන 28.8ක බදු පසු ලාභයක් වාර්තා කළේය. එහි ද්‍රවශීලතා මට්ටම් බැංකුව තනි පදනමක් මත 16.5%ක් සහ ඒකාබද්ධ පදනමක් මත 17.7ක් වන අතර එහි නුඹුන්වත් මට්ටම් සමඟ සෑම අවස්ථාවකම ඉහළ අගයක් ගෙන ඇත. ඒවා යම් අනාගත කම්පනයන්ට ඔරොත්තුදීමට ශක්තිමත් ස්වාරක්ෂක සමඟ නියාමන අවමයට වඩා ඉහළින් පැවතුනි. බැංකුවේ ඩිජිටල් පාරිභෝගික පදනම අඛණ්ඩව ප්‍රසාරණය වූ අතර, ක්‍රියාත්මක කළ ගනුදෙනු වටිනාකම් තුළ රු. ට්‍රිලියන 1.3ට ආසන්නව 2024 අගදී රු. ට්‍රිලියන 3.3ක ලඟා විය. මේ දෙකම රටතුළ ඕනෑම මූල්‍ය සේවා සපයන්නෙක් සඳහා විශාල අගයක් ගනී. සැබැවින්ම, ව්‍යාපාර මෙහෙයුම්වල බොහෝ අංග හරහා බැංකුව සහ සමූහය සඳහා එය ශක්තිමත් වසරක් විය.

ජයග්‍රාහී සංයුතියක්

දේශීය ක්‍රමානුකූල වැදගත් බැංකුවක් ලෙස වර්ගීකරණය කළ, බැංකුවක් ලෙස අපගේ කාර්යය වන්නේ රජයට අයත් ව්‍යවසාය, ග්‍රාමීය සහ ගොවි ප්‍රජාවට සහයවීම කෙරෙහි අවධාරණය සහිතව රාජ්‍ය ශුභසාධන බැංකුවක් ලෙස ක්‍රියාත්මක වීමයි. 1961 හි එහි ආරම්භයේ සිට බැංකුව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ප්‍රගතියෙහි හවුල්කරුවෙක ලෙස කැපවීමෙන් සහ උනන්දුවෙන් සිය රාජකාරී මුදාහැර ඇති බව වාර්තා කිරීමට ලැබීම අපට ගෞරවයකි. මෙම සහයෝගී ප්‍රවේශය මත ගොඩ නැගෙමින්, අපි මනාව දක්ෂ අයුරින්, 2024 දී පුද්ගලික අංශය ඇතුළත් කර ගැනීමට අපගේ ව්‍යාපාරය අපි විවිධාංගීකරණය කළෙමු, ඒ තුළින් ආර්ථික විනාශයෙන් ගොඩවීමින් නැවත වර්ධනය පිළිබඳ සංඥා පෙන්නුම් කරමින් පසුගිය වසරවලට සාපේක්ෂව රජයට අයත් ආයතනවල රඳාපැවැත්ම අඩුකර ඇත. මෙම විතැන්වීම බැංකු ක්ෂේත්‍රය තුළ අප දකින තියුණු තරඟය සමඟ සමව තරඟකිරීමට සහ ග්‍රාමීය ආර්ථියන් හී ප්‍රධානියා ලෙස සැලකෙන පුද්ගලික අංශයේ ව්‍යාප්තිය ශක්තිමත් කිරීමට බැංකුවට උපකාරී වී ඇත.

SMEs සහ MSMEs සංවර්ධනය

සංචාරක ක්ෂේත්‍රය ඉහළින් පවත්වා ගැනීමට ආශ්‍රිත කර්මාන්ත සඳහා මාවත සකස් කරන තියුණු වර්ධනයකට මුහුණ දුන් බැවින්, පරීක්ෂාකාරී ණය සහ අවදානම් තක්සේරු කිරීම් හමුවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) වෙත අරමුදල්කරණය අපි ශක්තිමත්ව අඛණ්ඩව කරගෙන ගියෙමු. මෙම අංශ පෙරමුණු ගණනාවක් මත ලබාගත් ණය මඟින් නිරන්තරයෙන් වේගයෙන් වර්ධනය වෙන අතර, තරඟකාරී පොළී අනුපාත සමඟ බෙදාහරින ප්‍රාග්ධනය ඇතුළුව ග්‍රාමීය ව්‍යවසායකයින්ට මූල්‍ය අන්තර්ගතභාවය සහතික කරයි.

අපි අපගේ අවදානම් රුචිය සහ ඔරොත්තුදීම තුළ අපගේ අක්‍රීය ණය අපි කළමනාකරණය කළ අතර, පූර්වගාමී වසරවල සම්මතයක්ව පැවති අක්‍රීය ණයවල පෙර නොවූ විරූ වැඩිවීම මෙම වසරේ නොමැති බව වාර්තා කිරීමට ලැබීම මට සතුටකි. මෙම අංශය 2023 දී පැවති බිලියන 29.2 සිට 2024 දී බිලියන 37.2 දක්වා වර්ධනය වූ අතර, ඒ තුළින් රටේ ආර්ථික කටයුතුවල පුනරුත්ථාපනය සහ මහජන ශුභසාධනය සඳහා බැංකුවේ කීර්තිනාමය පිළිබිඹු කරයි. ව්‍යාපාර ප්‍රතිසාධන ඒකකය කාර්යසාධනය අඩු ව්‍යාපාරවලට නැවත ගොඩ ගැනීමට සහය වූ අතර, ඔවුන්ට ග්‍රාමීය ප්‍රජාවන්ගේ අවශ්‍යතා මත ප්‍රාග්ධනනීයකරණය කරමින් මූලික සමාජයන් හී සිය මෙහෙයුම් දරාගැනීමට හැකි බව සහතික කළේය.

අපගේ ඩිජිටල් පරිනාමනය

මිලියන තුනකට වැඩි ඩිජිටල් පාරිභෝගික පදනමක් සමඟ, බැංකුව සිය මෙහෙයුම් පා සටහන කාර්යල තුළ මෙහෙයුම්වල සිට ඩිජිටල්කරණය භාවිතයෙන් ඉතුරුම් සුරක්ෂිත කරන මාර්ගයකට පරිනාමනය කරන බැවින්, බැංකුව ඩිජිටල් බැංකුකරණයේ සියලුම ක්ෂේත්‍රවල බලකායක් වීමට සිය ඩිජිටල් නායකත්වය පුළුල් කර ඇත. අපි අපගේ ආක්‍රමණය ඩිජිටල්කරණය දක්වා ප්‍රසාරණය කරන අතර, තොරතුරුවල ආරක්ෂාව පිළිබඳ ශක්තිමත් රාමුවක් සහිත නවීන තාක්ෂණය සයිබර් ආරක්ෂාව පිළිබඳ ශක්තිමත් අවධාරණයක් ස්ථාන ගත කරයි. බැංකුවේ ඩිජිටල් මායිම අතික්‍රමණය කරමින් සිටින අතර, එහි ප්‍රතිඵලය වන්නේ අපගේ විවිධ මට්ටමේ ගනුදෙනුකරුවන්ට පහසුව, තාක්ෂණය සහ ආරක්ෂාව ලබා දීමයි. මෙය ජීවනෝපායන් නඟා සිටුවමින් බැංකුව විසින් නම්කළ ක්ෂේත්‍රයක් වන කෘෂිකර්ම ක්ෂේත්‍රය වෙත ව්‍යාපාර ගෙනයාමට බැංකුවට ඉඩකඩ සලසයි.

මහජනතාව වෙනුවෙන් මහජනතාවගේ බැංකුවක්

සමාලෝචිත වර්ෂය බැංකුවේ අප ව්‍යාපාර සිදුකළ ආකාරයෙහි පරමාදර්ශී විතැන්වීමක් දක්නට ලැබුණි. කෙසේවෙතත්, මහජන ශුභසාධන බැංකුවක් වීමේ අපගේ ප්‍රධාන පරමාර්ථය මෙහෙයුම් වාතාවරණය සමඟ වෙනස් නොවී පැවති අතර, බැංකු අඩු හෝ බැංකු රහිත පසුබිම් සහිත මායිම්වල පවා වඩාත් ග්‍රාමීය ප්‍රජාවන්ට සේවය කිරීමේ අපේක්ෂාව සමඟ ඉදිරියට ගියේය. බැංකුව ශාඛා 751ක් ක්‍රියාත්මක කළ අතර, ඒවායින් වී මිලදී ගැනීම, පොල් කර්මාන්තය, ඉඩම් අත්කරගැනීම් සඳහා සංවර්ධන ණය සහ ග්‍රාමීය ආර්ථිකය පෝෂණය කරන වෙනත් බොහෝ ග්‍රාමීය පදනම් ණය යෝජනාක්‍රම ලබා දේ. රජය සමඟ හවුල්වීම අපගේ මෙහෙයුමේ වැදගත් අංගයක් වන අතර, එය ජනතාවට සේවයක් ලෙස ඉටු කිරීමට ලැබීම පිළිබඳ අපි ආඩම්බර වෙමු.

අපගේ පාර්ශ්වකරුවන්

ගනුදෙනුකරුවන්, සේවකයින්, නියාමකයින් සහ ප්‍රජාව ඇතුළත්වන අපගේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ විනිවිද සන්නිවේදනය තුළින් විශ්වාසය පෝෂණය කිරීම අපගේ උපායමාර්ගික වැඩසටහනේ ප්‍රමුඛතාවයකි. පැහැදිලිකම සහ විවෘතබව සමඟ, අපගේ ගමන පරිස්සම්න්, උනන්දුවෙන් සහ අනෝන්‍ය ගෞරවයෙන් ඉදිරියට ගෙන යමින්, අනෝන්‍ය වශයෙන් ප්‍රතිලාභී වටිනාකමක් නිර්මාණය කිරීමට කල්පනාකාරී සහ අර්ථවත් ආකාරයකින් අපි ඔවුන් සමඟ කටයුතු කරමු. බැඳියාවන් ඡේදනය වන අවස්ථාවල, තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ විභවතා අපි ඇගයීමට ලක්කරන අතර, දිගු කාලයක් සඳහා සුහදත්වය සමඟ මෙවැනි වටිනා සම්බන්ධතා ගොඩ නගා පෝෂණය කරමු.

අපගේ නියාමන වාතාවරණය

දේශීය ආර්ථික සාධක සහ ගෝලීය මූල්‍ය ප්‍රවනතා, සංකීර්ණ නියාමන වාතාවරණයන් තවදුරටත් වෙනස් කරන අතර, එහිදී මූදල් සහ මූල්‍ය ප්‍රතිපත්ති අනුල්ලංඝනීය මාර්ගයක පැවතීම අවශ්‍යය. ඒකාබද්ධ චින්තනය, වත්කම්වල තත්ත්වය සහතික කිරීමට ණය දීම සහ අඩු කළමනාකරණයක් දක්වා සකස් කිරීම අතර පරීක්ෂාකාරී තුළනය දුෂ්කර ආර්ථිකයක් තුළ තරඟකාරී සහ ස්ථාවර බැංකුවක් ලෙස අපගේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අත්‍යවශ්‍යය. ශ්‍රී ලංකාව වර්ධනය සහ අරක්ෂාව සැලසීම මත ඉදිරි පියවර තබන බැවින් නියාමන අභියෝග නව මූල්‍ය වර්ෂයන්හී නොවෙනස්ව පවතිනු ඇති බවත් ප්‍රතිසාධන උත්සාහයන් හි රජය වෙත සහයවීමට බැංකුවට ශක්තිමත් කළමනාකරණ ශිල්ප යොදා ගැනීමට අවශ්‍ය වන බවත් අපි දනිමු. අපි නව මූල්‍ය වසරකට පියවර තබන බැවින්, අපගේ අතිරික්ත ද්‍රවශීලතාව පිළිබඳ විචක්ෂණ ආයෝජනය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව පවත්වා ගැනීම, අක්‍රීය ණය කළමනාකරණය, අවදානම් රුචිය සහ ඉවසුම් මට්ටම්වල සීමාවන් තුළ කල්පනාකාරී ණය දීම, අපගේ ඩිජිටල් හැකියාවන් හී ආයෝජනය කිරීම සහ පුළුල්කිරීම, සහ විනිමය උච්චාවචන තුළ විදේශ විනිමය අවදානම් ඵලදායීව විසඳීම ඕනෑකමින් සලකා බැලිම සහ කළමනාකරණය කිරීම තීරණාත්මක කරුණු වේ. ශක්තිමත් පාලන ව්‍යුහයක් තුළ ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් පූර්ව අවශ්‍යතාවක් වන අතර, 2025 වසර සඳහා අප සකස් කර ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමට විශ්වාසය සහ නොසැලෙන අවධානයක් සමඟ අපි පෙරටම යමු.

උච්ඡාවචන වසර අවසානය දක්වා පැවති නමුත් 10.7%කට ආසන්නව ඇ. ඩොලරයට සාපෙක්ෂව ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් කිරීම වැදගත් සංවර්ධනයක් විය. කෙසේවෙතත්, උද්ධමන ප්‍රවනතා අඩුකළ බැවින් සහ දේශීය ආර්ථිකය ස්ථාවර කර ඇති බැවින්, ජාත්‍යන්තර වෙළෙඳපොල තුළ අඩුකළ තරඟකාරීත්ව මට්ටම් අත්විඳින ලදී. බෙදාහැරියහැකි ආදායමක් නොමැති මට්ටම දක්වා අඛණ්ඩව පැවතියද, ණය සේවාකරණය ඇති කරමින් අපගේ ප්‍රධාන ගනුදෙනුකරුවන් විසින් අඩුකළ සහන මට්ටමකට මුහුණ දුන්හ.

අපගේ මානව සම්පත

අත්හල නොහැකි වත්කමක් වන අපගේ සේවකයින් රඳවා ගැනීමට අපි තවදුරටත් නිපුනතාව වැඩි කරමින්, නැවත ඇති කරමින්, ආදර්ශවත් ක්‍රියාමාර්ග අපි අරගනිමු, ජනතා සංක්‍රමණය තවදුරටත් සිදුවන බැවින්, අපි වෙළෙඳපොලෙන් විශිෂ්ටතම දක්ෂයින් කණ්ඩායමක් බඳවාගතිමු. අපගේ බැංකු සංස්කෘතියට ඔවුන් නුරුපුරුදු කළ අතර, ඩිජිටල් සාක්ෂරතාව, ශිල්ප සහ ගනුදෙනුකාර සේවය තුළින් ඔවුන් සවිබලගන්වා ඇත. අපි අපගේ ශාඛා ප්‍රදේශවලින් බඳවා ගන්නා අතර, ජාතියට අවශ්‍යම අවස්ථාවේදී විරැකියාව අඩු කිරීමට සහ තරුණ සංවර්ධනයට දායකවීමට ලැබීම පිළිබඳ අපි ආඩම්බර වෙමු. අපගේ ප්‍රවේශය වන්නේ අපගේ සේවකයින් සඳහා සාකල්‍ය භෞතික හා මානසික සුවතාවය වන අතර, අපි යහපත් වැඩ-ජීවිත සමබරතාව සාක්ෂාත් කර ගන්නා බව සහතික කිරීමට පියවර ගණනාවක් ක්‍රියාත්මක කළෙමු.

අපගේ තිරසාරභාවය

වගවීම සහ තිරසාරභාවය යම් ව්‍යාපාරයක කල්පැවැත්මට ප්‍රධාන වේ. මෙම පෙරමුණ මත අපගේ ජයග්‍රහනයන් ශක්තිමත් සහ සදාචාර පාලන ව්‍යුහය, ත්‍රිවිධාකාර ආරක්ෂක මාර්ග මත පදනම් වූ ශක්තිමත් අවදානම් කළමනාකරණය, ස්වාධීන විගණන සහ සහතික කිරීමේ ක්‍රියාවලිය, සහ බැංකුවට අදාළ වන්නා වූ නියාමන සහ නීතිමය යෙදවුම්වලට සමපාතව තබා ගන්නා අනුකූලතාව සහ නෛතික කාර්යයන් මත පදනම් වේ. මතුවන අවදානම් සක්‍රීය ක්‍රියාමාර්ග සඳහා ඇගයීමට ලක් කරන අතර, අභ්‍යන්තර පාලන රාමුව ව්‍යාපාර මට්ටමේදී අවදානම අවම කිරීම සහතික කරයි. විස්තීර්ණ ආර්ථික, සමාජීය හා පාලන (ESG) ප්‍රතිපත්තිය මගින් අපගේ ප්‍රජාවගේ යෙදවුම් සහ අපගේ ව්‍යාපාර හවුල්කරුවන් සහ ගනුදෙනුකරුවන් සමඟ මැදිහත්වීමේ විනිවිදභාවය නියම කරයි. නිෂ්පාදන සහ සේවා හෝ බැංකුවට අවශ්‍ය බෙදාහැරීම් පිළිබඳ කාලීන සහ නිවැරදි තොරතුරු අපගේ සියලුම මෙහෙයුම්වල ඉහළ මට්ටමේ විශිෂ්ටත්වය සහතික කිරීමට පැහැදිලිව සන්නිවේදනය කෙරේ.

මගේ අගයකිරීම

මුදල් අමාත්‍යවරයා වන අතිගරු ජනාධිපති, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ගරු මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය සහ ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය වෙත ඔවුන්ගේ දූරදර්ශිභාවය සහ නායකත්වය වෙනුවෙන් මගේ අවංක කෘතඥතාව පුදකර සිටිමි. එමෙන්ම වසර තුළදී ලබාදුන් සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම් සහ මුදල් අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ද අපගේ ප්‍රණාමය පුදකර සිටිමි.

අධිපතිවරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත නියාමන ස්වභාවයේ සියලු කරුණු යොදා ගැනීම කෙරෙහි ඔවුන්ගේ බුද්ධිමත් උපදේශකත්වය සහ මඟපෙන්වීම වෙනුවෙන් මම ස්තූතිය පුදකර සිටිමි. හිටපු සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මගේ සගයන් බැංකුවේ සාර්ථකත්වය සඳහා වෙහෙස නොබලා කටයුතු කර ඇති අතර, ඔවුන්ගේ දායකත්වය වෙනුවෙන් මම ඔවුන්ට ස්තූතිවන්ත වෙමි, 2024 දී මෙම අපූර්ව සාර්ථකත්වය සාක්ෂාත් කර ගැනීමට සිය දායකත්වය වෙනුවෙන් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, ආයතනික හා විධායක කළමනාකාරිත්වය සහ සෑම තරාතිරමකම සිටින කාර්ය මණ්ඩලය වෙත ස්තූතිය පුද කිරීමට මම කැමැත්තෙමි. වැදගත්ම දෙය නම්, අපගේ වටිනා ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අපගේ සාර්ථකත්වයේ මුල්ගල වන අතර, අපගේ උපරිම හැකියාවෙන් ඔබට සේවය කිරීමට අපි සූදානම්ව සිටිමු.

අපේ රට සිය ප්‍රතිසාධන ගමන් මඟේ ඉදිරියට යන බැවින්, අපගේ අනාගත පරම්පාරාවන් සඳහා ඔරොත්තුදෙන සහ ශක්තිමත් ජාතියක් ගොඩ නැගීමට අපට එක්ව හැකි බවට දැනුවත් වෙමින් මෙම තීරණාත්මක අවස්ථාවේදී පද්ධතිමය ස්ථාවරත්වය සහතික කිරීමට මුදල් අමාත්‍යංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළුව විවිධ පාර්ශ්වකරුවන් සමඟ සහභාගිවීම අපි තවදුරටත් සිදු කරන්නෙමු.

මහාචාර්ය නාරද ප්‍රනාන්දු
සභාපති

28 පෙබරවාරි 2025

සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරිතුමන්ගේ සමාලෝචනය

මෙම වසරේ ද අපගේ ව්‍යාපාර ආදර්ශයේ සැලකියයුතු ලෙස මනාව ක්‍රියාත්මක පරිනාමනයක් සනිටුහන් කළ අතර, රජයට අයත් ව්‍යවසාය සඳහා විස්වාසදායක බැංකුවක් ලෙස සේවය කිරීම සහ පුද්ගලික අංශය සක්‍රීයව ආකර්ෂණය කර සහයවන ඩිජිටල් දැනුවත්, නවීන මූල්‍ය ආයතනයක් කරා පරිනාමනයවීම අතර තුලනයක් ඉන් සකස් කර ඇත.

බැංකුව මූර්තිමත් කරන ගනුදෙනුකාර සේවය පිළිබඳ සන්නාමය, ශක්තිමත් ගනුදෙනුකාර කේන්ද්‍රීය සම්මත පවත්වා ගන්නා අතර, මූල්‍ය සාක්ෂරතාව, බඳවාගැනීම හා නිවැරදි මූල්‍ය නිෂ්පාදන තෝරාගැනීමේ අවශ්‍යතාවය අභිරුචිගතකිරීම උසස්/දියුණු කරන, ත්‍රිභාෂා ගනුදෙනුකාර සේවාවක් ලබාදීම මගින් එය පෙන්වා දී ඇත.

2024 සඳහා සැලකියයුතු ජයග්‍රහනවල සන්ධිස්ථානයක් වාර්තා කිරීම පිළිබඳ මම සතුටු වෙමි. සංකීර්ණ සහ ගතික ආර්ථික බාධකයන් හමුවේ ඉදිරියට යමින්, මහජන සුභසාධනය, ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව, ඩිජිටල්කරණය, තිරසාරභාවය හා අපගේ පාර්ශ්වකරුවන්ට වටිනාකම ලබාදීම වෙත අපගේ මූලික අගයන් හා වගකීම් වලට විශ්වාසවන්ත ලෙස රැඳී සිටිමු.

1961 දී ආරම්භයේ සිට විශිෂ්ට ප්‍රතිඵල ලබාදෙමින් මහජන බැංකුව සඳහා චෛතිහාසිකව වර්ධන වසරක් ලෙස 2024 වසර පෙනී සිටී. නියාමන සීමාවන්ට ඉහළින් පැවති 16.5%ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සමඟ බදු පසු ලාභයෙහි 150%ට ආසන්න වැඩිවීමක් අපි සාක්ෂාත් කර ගත්තෙමු.

දේශීයව ක්‍රමානුකූලව වැදගත් බැංකුවක් ලෙස වර්ගීකරණය කරන සහ ජාතිය සංවර්ධනය තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන බැංකුවක් ලෙස, ග්‍රාමීය ප්‍රජාවන් වෙත ලඟා වූ සහ සිය ගනුදෙනුකාර කළඹ තුළ පුද්ගලික අංශයේ බිලූ චිප් සමාගම් හා දැනට සම්බන්ධ ගනුදෙනුකාර පදනමකට සේවය කිරීමට ලැබීම පිළිබඳව අපි ආඩම්බර වෙමු. මෙය වසර දෙකකට පෙර බැංකුව පැවති ස්ථානගතවීමේ සිට දුෂ්කර ගමනකි. එහි සිට අඛණ්ඩතාවයක් සහ ප්‍රගතියක් නිර්මාණය කර ගැනීමට එයට අවශ්‍ය උපායමාර්ගික ගමන්මඟ මායිම් නියම කර ගැනීමට දිරිමත් තීරණ ගැනීම අවශ්‍ය වී ඇත.

නව්‍යකරණය සහ ඔරොත්තුදීම සහිත මාර්ගයක අප සිටින බැවින්, රට තුළ ආර්ථික වර්ධනය සහ ස්ථායිතාව පෝෂණය කිරීමේදී නායකයෙක් ලෙස බැංකුව ස්ථානගත කරන ලද බව කණ්ඩායම් වැඩවලින් සනාථ කර ඇත. මහජන බැංකුව විසින් මේ දක්වා විශාල ප්‍රමාණයෙන් භාවිතා නොකළ වෙළෙඳපොලේ ආයතනික අංශ වෙත ලඟාවීමට ව්‍යාපාර බැංකුකරණයේ නවීනත්වය සමඟ ජාතියේ ආර්ථික සංවර්ධනය කරා අපගේ වගකීම අපි සාර්ථකව ඉටුකර ඇත.

නව ව්‍යාපාර ආදර්ශයක්

මෙම වසර ද අපගේ ව්‍යාපාර ආදර්ශයේ සැලකියයුතු ලෙස මනාව ක්‍රියාත්මක පරිනාමනයක් සනිටුහන් කළ අතර, රජයට අයත් ව්‍යාපාර සඳහා විශ්වාසදායක බැංකුවක් ලෙස සේවය කිරීම සහ පුද්ගලික අංශය සක්‍රීයව ආකර්ෂණය කර සහයවන ඩිජිටල් දැනුවත්, නවීන මූල්‍ය ආයතනයක් කරා පරිනාමනයවීම අතර තුලනයක් ඉන් සකස් කර ඇත. මුළු ණය සහ අත්තිකාරම්වලින් රජයට අයත් ව්‍යවසාය නිරාවරණය ව්‍යූහගත ආකාරයකින් සැලකියයුතු ලෙස අඩුවී ඇති අතර, එය ග්‍රාමීය ප්‍රජාවන් සංවර්ධනයේදී ශ්‍රී ලංකා රජයට ලබාදෙන සහය පිළිබඳ අපගේ ජනතා සුභසාධනය පිළිබඳ සාක්ෂියකි. එයට අනුගතව යමින්, අපි පුද්ගලික අංශය සහ අපනයන වෙළෙඳාම සමඟ සහභාගිත්වය තුළ අවස්ථාවන් ප්‍රබල ආකාරයෙන් හඹා ගියෙමු.

අපි පුද්ගලික අංශයේ ගනුදෙනුකරුවන් ඇතුළත් කරගැනීම සුවිශේෂී ආකාරයෙන් පුළුල් කළෙමු. උපායමාර්ගික අවධානයක් ශක්තිමත් අවදානම් කළමනාකරණයක්, නිපුනතා වර්ධනයක්, සහ ශක්තිමත් පාලන ව්‍යූහයක් තුළ වැඩ කිරීම සමඟින්, අපි මෙම නව ව්‍යාපාර ආදර්ශය ක්‍රියාත්මක කරන ලද අතර, එය ආයතනික බැංකුකරණය, වාණිජ ණය, සහතික කළ රජයට අයත් ව්‍යවසාය කළමනාකරණය ශක්තිමත් කර ඇති අතර, අපගේ ශේෂ පත්‍රයෙහි ඔබ දකින ඉහළම කාර්යසාධනය ලබාදීමට තරුණ ව්‍යවසායකයින් සහ කාන්තා නවෝත්පාදකයින්ගේ මතුවන වෙළෙඳපොල ග්‍රහනය කර ගත් ඩිජිටල් නිෂ්පාදන නැවත දියත් කරන ලදී.

ඩිජිටල් සුපිරි බලය

භෞතික නිලධාරීන් ප්‍රධාන වන ග්‍රාමීය ප්‍රදේශවල පාරිභෝගික හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුකරණයෙහි ප්‍රබලම බලවේගයක් වෙමින්, බැංකුව ඩිජිටල් වේදිකාවන් මත ශක්තිමත් වන ජනවිකාශන ආකර්ෂණය, රඳවාගැනීම සහ වර්ධනය කිරීම සඳහා ඉමහත් අපේක්ෂාවන් සහිත ඩිජිටල් වැඩසටහනක් මත කටයුතු කරන අතර, සිය සම්ප්‍රදායික ගනුදෙනුකරුවන්ට සේවය කිරීමේ වාර්ත්‍රානුකූල මට්ටමට පුළුල් කරමින් සිටී. මිලියන 15 ට වැඩි අපගේ ගනුදෙනුකාර පදනම සඳහා ඩිජිටල් පහසුව සඳහා තෝරාගන්නා බැංකුව බවට අප පත් කරමින් ඩිජිටල් ගනුදෙනු 2022 දී මිලියන 80 සිට 2024 දී මිලියන 165ට වඩා ඉහළ ගොස් ඇති බව වාර්තා කිරීමට ලැබීම අපට සතුටකි. වර්තමාන බැංකු වාතාවරණය තුළ බලවේගයක් වීම සඳහා, මහජන බැංකුව ගනුදෙනුකාර කේන්ද්‍රීය යොදාගත යුතු වන අතර, වෙනස්වන ගනුදෙනුකාර අවශ්‍යතා පිළිබඳ මනාව දැනුවත් විය යුතුය. අපගේ ඩිජිටල් පරිවර්තනීය මූලපිරීම් සේවා අනර්ඝත්වය සහ බෙදාහැරීම වැඩි කර, මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කර, අපගේ ගනුදෙනුකරුවන් වෙත පිවිසීම පුළුල් කර, සහ අපගේ ලාභය කෙරෙහි ධනාත්මකව බලපාන ලද දත්ත පදනම් උපායමාර්ගික තීරණ ගැනීමට ඉඩදී ඇත.

විශිෂ්ටත්වය සඳහා කීර්තිමත් යුරොමනි සම්මානවලදී අපව ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ඩිජිටල් බැංකුව ලෙස නම්කිරීම, වඩාත් ජනප්‍රිය ඩිජිටල් ගෙවීම් නිෂ්පාදන සඳහා රන් සම්මානය පිරිනැමීම, ලංකා පේ ටෙක්නොවේෂන් සම්මාන විසින් වසරේ වඩාත් පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සක්‍රීය කරන්නා ලෙස නම් කිරීම සම්බන්ධයෙන් පුදුම විය යුතු නැත. රාජ්‍ය අංශයේ කළමනාකරණය තුළ අපගේ නායකත්වය විදහා දක්වමින් රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ අධිකාරී යන වර්ගීකරණයන් හී සම්මාන අපි රැකගෙන ඇත.

මහජන සුභසාධනය

ග්‍රාමීය වාතාවරණයන් සවිබලගන්වන ග්‍රාමීය ජීවනෝපායන්ගේ උපකාරකයෙක් ලෙස, ග්‍රාමීය ආර්ථිකයින් හී ප්‍රධාන වීමට සහ ආර්ථික නඩත්තුවෙහි හවුල්කරුවෙක් වීමට බැංකුව හුදෙක් ලාභලැබීමේ අරමුනින් ඔබ්බට ගමන් කරයි. මහජන බැංකුව මහජනතාව සඳහා බැංකුවක් වන අතර, දිවයින පුරා විහිදුණු ශාඛා සේවා මධ්‍යස්ථාන සමඟ සිය ඩිජිටල් නායකත්වය සම්බන්ධ කරයි. මේ මගින් ජීවනෝපායන්ට සහයවීම, SME සහ MSME සහ කාන්තා ව්‍යවසායිකාවන් සවිබලගැන්වීම සිදුකරන අතර, නව වෙළෙඳපොල කොටස ග්‍රහනය කර ගැනීමට අපගේ සන්නාම කළඹ පුළුල් කරයි. එසේ කරමින්, බැංකුව සියලුම දෙනා සඳහා තිරසාර බැංකුකරණය සහතික කරයි. එය මූල්‍ය දැනුම සවිමත් කරමින් ග්‍රාමීය බැංකුකරණය ශක්තිමත් කරන මූල්‍ය සාක්ෂරතාව සමඟ බලය ඇතුළත් කිරීමට හෘදසාක්ෂියට එකඟව ගත් තීරණයකි. අපගේ ශාඛා ග්‍රාමීය ගනුදෙනුකාර පදනමේ විශාල කොටසකට පිවිසිය හැකි පිවිසුම් ස්ථානයක් ලෙස කටයුතු කරන අතර, ඒවායේ මෙහෙයුම් තනිකරම ලාභදායිතාව මත පදනම් නොවේ. අපි අපගේ විශාල ශාඛා ජාලය දුරස්ථ ප්‍රදේශ ඇතුළුව ක්‍රියාත්මක කරන බැවින්, බොහෝ දුර පැතිර ගිය වාහන දුෂ්කරතාවන්ට මුහුණ දිය හැකි ග්‍රාමීය ජනතාවගේ පහසුව අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ නොවෙනස්ව බරතබනු ලබයි.

මානව ප්‍රාග්ධනය

සම්ප්‍රදායික බැංකුකරණය තුළ ස්ථිර බලවේගයක් වෙමින්, මහජන බැංකුව වේගයෙන් වෙනස්වන වෙළෙඳපොලක් තුළ කටයුතු කරයි. එහිදී බැංකුව අත්‍යවශ්‍ය භාණ්ඩ ගැලපීම සඳහා සිය කළඹ යාවත් කිරීම පමණක් නොව මතු බලාපොරොත්තු සහිත අනාගතයක් දරා ගැනීමට සුදුසු වෙළෙඳපොල පරිමානය පුළුල් කිරීම ද අවශ්‍ය වේ, මෙම පෙරමුණ මත, අපි අපගේ මානව සම්පත් කුසලතා නැවත වැඩි කර ඉහළ දමන අතර, අපි නවීන වෙළෙඳපොල සාරාංශ කොට දක්වන ගලපන ලද නිපුනතාව හැඩ ගස්වමින් අපගේ නව ව්‍යාපාර ආදර්ශයට අපි හුරු පුරුදු වෙමු. බැංකුකරණය සහ ලාභදායිතාවයෙන් ඔබ්බට, අපගේ සේවකයින්ට වැඩ-ජීවිත සමබරතාව නැවත ලබාගැනීමට සහ මානසික සුවතා සේවා නොමිලේ පිරිනැමීමට අපගේ සේවකයින් සඳහා ආරක්ෂිත කලාපයක් අපි නිර්මාණය කළෙමු.

තරුණ ව්‍යවසායකයින්

තරුණයින් ව්‍යාපාරවල යෙදවීම සඳහා වසර 7ක කාලසීමාවක් සඳහා සහන පොළී අනුපාතයකට ණය යෝජනා ක්‍රමයක් තරුණ ව්‍යවසායකයින්ට ලබාදෙන අතර, කාන්තා ව්‍යවසායකයින් වටිනාකමින් රු. මිලියන 100 දක්වා පිරිනමන ණය යෝජනා ක්‍රමයක් යන වනිතා සවිය මගින් ශක්තිමත් කරනු ලබයි. මෙය ස්ත්‍රී පුරුෂ සමානතාව සම්මුතියට පත් කරන ශක්තිමත් මෙවලමක් වන අතර, කාන්තාවන්ගේ ජීවිත ඉහළ දමමින් යැපෙන්නන්ගේ මෙන්ම වඩා පුළුල් ප්‍රජාවක යහපැවැත්ම සහතික කරයි.

ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව

බැංකුව මූර්තිමත් කරන ගනුදෙනුකාර සේවය පිළිබඳ සන්නාමය ශක්තිමත් ගනුදෙනුකාර කේන්ද්‍රීය සම්මත පවත්වා ගන්නා අතර, නිවැරදි මූල්‍ය නිෂ්පාදන ලබාදෙමින් ගනුදෙනුකරුගේ අවශ්‍යතා ගලපමින් මූල්‍ය සාක්ෂරතාව, බඳවාගැනීම උසස් කරන ත්‍රිභාෂාත්මක ගනුදෙනුකරු මගින් විය පෙන්වා දී ඇත. බැංකුව සඳහා සිය මූල්‍ය ජයග්‍රහනයන්ගෙන් ඔබ්බට වඩාත් සැලකියයුතු ජයග්‍රහනය වන්නේ නාගරික ප්‍රදේශ සහ වැසියන්ගේ සිට ග්‍රාමීය ප්‍රදේශ දක්වා, ආයතනික සිට ගොවි ප්‍රජාව දක්වා සමාජයේ විවිධ කොටස් වෙත කිසිදු වෙනස්කමක් නොමැතිව සමාන මට්ටමේ සේවා විශිෂ්ටත්වය පිරිනැමීමට එයට ඇති හැකියාවයි.

තිරසාරභාවය

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු හා බැඳුණු තිරසාරභාවය සහ පෙළගැසීම අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කර ඇති අතර. ඒ තුළින් ආර්ථික, සමාජීය හා පාලන මූලධර්ම වෙත අපගේ බැඳීම පෙන්නුම් කරයි. හරිත මූල්‍යකරණය සහ හරිත බැංකුකරණය තුළ අපගේ අරමුණු හඹායමින් පාරිසරික ආර්ථික හා සමාජීය තිරසාරභාවය අපි ක්‍රියාවට නංවන අතර, අපගේ ආයතනික සමාජීය සත්කාර ව්‍යාපෘති තුළින් ප්‍රජාවට වටිනාකම එකතු කරමු. අපගේ කෘතිම බුද්ධිය පදනම් 2024 දින දර්ශනයේ තේමාව වන "අපගේ සමුදුය – අපගේ අභිමානය" පාරිසරික සංරක්ෂණය කරා අපගේ ඩිජිටල් හැකියාව සහ අපගේ දැනුවත්කම පිළිබඳ රාමුව පෙන්නුම් කරයි.

අනාගත දැක්ම

ඩිජිටල්මය දැනුවත් ශ්‍රමබලකායක් වීම සඳහා අපගේ මානව සම්පත තුළ ඉහළ නිපුනතාවක් ඇති කිරීම අපි තවදුරටත් සිදු කරමු. මෙය අනාගතය වන අතර, බැංකුකරණය පිළිබඳ අපගේ සම්ප්‍රදායික රටාවන් එයට හුරුවී ඇති ජනතාව සමඟ ඉදිරියට ගෙන යන අතරම, අපගේ සේවකයින් පුද්ගලික බැංකුවල මට්ටමට සමානව හෝ ඉන් ඔබ්බට සුපිරි ගනුදෙනුකාර සේවාවක් ලබාදීමට හැකි වීම අවශ්‍යය.

ගනුදෙනුකාර සහභාගිත්වය සහ සන්නාම දෘශ්‍යතාව වැඩි කිරීම් සම්බන්ධ අපගේ උපායමාර්ගික අවධානයට අනුකූලව, මහජන බැංකුව සමාජ මාධ්‍ය අලෙවිකරණයේ බලයේ වාසිය ලබාගනී. පුළුල්ව පැතිරුණු ජනප්‍රියතාව සහ සමාජ මාධ්‍ය වේදිකාවන් කරා ලඟාවීම ගලපන ලද පණිවිඩ සමඟ විවිධ ගනුදෙනුකාර අංශ ඵලදායීව ඉලක්ක කිරීමට අපට හැකියාව ලබා දී ඇත. තවද, මෙවැනි වේදිකාවන් මගින් ඇතිකරන ද්විත්ව මාර්ග සන්නිවේදනය තත්‍ය කාලීන මැදිහත්වීම් සඳහා ඉඩකඩ සලසමින් අපගේ ගනුදෙනුකරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා පෝෂණය කරයි. මෙවැනි ගතික හැකියාවන් බැංකුවේ ස්ථානගතවීම ශක්තිමත් කිරීමට, අපගේ දෘශ්‍යතාව විශාල කිරීමට, වඩාත් සහභාගී සහ ප්‍රතිචාරාත්මක ආකාරයෙන් අපගේ විවිධ නිෂ්පාදන හා සේවා පරාසය ප්‍රවර්ධනය කිරීමට සුදුසු මෙවලමක් ලෙස සමාජ මාධ්‍ය ස්ථානගත කර ඇත.

අපි තිරසාර ව්‍යවහාර ප්‍රමුඛ කරමින් වර්ධන අවස්ථාවන් කෙරෙහි අවධානය යොමු කරන අතර, ප්‍රජාවන් සමඟ අපගේ සහභාගිත්වය වැඩි කරන්නෙමු. ඔරොත්තුදීම සහ අනුවර්ත්‍යතාව සමඟ, රටේ බැංකු වාතාවරණයෙහි බලකායක් ලෙස මතුවීමට අපි අභියෝග මැඩ පවත්වන්නෙමු.

අගය කිරීම

අප කණ්ඩායමේ කැපවීම සහ බැඳීම මම අගය කර සිටින අතර, ඔවුන්ගේ උත්සාහයන් 2024 දී බැංකුව වෙනුවෙන් අතිවිශාල සාර්ථකත්වයක් සහතික කර ඇත. උපරිම අභියෝග හමුවේ ඔවුන්ගේ ඔරොත්තුදීම සුවිශේෂී වන අතර, රටේ සෞඛ්‍ය, අධ්‍යාපනය, යටිතලපහසුකම්, සහ ව්‍යාපෘති සංවර්ධන අංශවලට ලාභය නැවත ආයෝජනය කළ බැවින්, ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක්, ශක්තිමත් පාලන ව්‍යවහාර, සහතික කරමින් ජාතික ආර්ථිකයට සෘජුව දායක විය.

අපගේ සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, හිටපු සභාපති, පෙර අධ්‍යක්ෂ මණ්ඩලය, භාණ්ඩාගාර ලේකම් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්, මහ බැංකුවේ අධිපති සහ නිලධාරීන්, ආයතනික සහ විධායක කළමනාකාරිත්වයේ මගේ සහෝදර සාමාජිකයින්, කාර්ය මණ්ඩල සාමාජිකයින්, අපගේ වෘත්තීය සමිති සහ විශේෂයෙන්ම ඔවුන්ගේ අනුග්‍රහය සහ පක්ෂපාතිත්වය සමඟින් අපව දිරිමත් කරන අපගේ පාර්භෝගිකයන් වෙත මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.

එක්ව, අපගේ ඉලක්කය කරා වැඩකරමින් මහජන බැංකුව ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම බැංකුව බවට පත් කළ හැක.

ක්ලයිව් ෆොන්සේකා
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

2025 පෙබරාවරි 28

අධ්‍යක්ෂ මණ්ඩලය

GRI 2-9

1

මහාචාර්ය නාරද ප්‍රනාන්දු

සභාපති

මහාචාර්ය නාරද ප්‍රනාන්දු මහතා මූල්‍ය, බැංකුකරණ, සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල වසර 25කට වැඩි කාලයක විස්තීර්ණ වෘත්තියක් සහිත පළපුරුදු ශාස්ත්‍රීය සහ මූල්‍ය ප්‍රවීනයෙකි. නායකත්වය, උපායමාර්ගික සැලසුම්කරණය, සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ හසළ පළපුරුද්දක් ගෙන එමින් 2024 නොවැම්බර් මහජන බැංකුවේ සභාපති ලෙස ඔහු පත්කරන ලදී.

මහාචාර්ය ප්‍රනාන්දු මධ්‍යම චීන සාමාන්‍ය විශ්වවිද්‍යාලයෙන් රජයේ ආර්ථික විද්‍යාව පිළිබඳ පී.එච්.ඩී. (PHD) උපාධිය දරන අතර, එහිදී ඔහුගේ පර්යේෂණවලින් වෙළෙඳපොල කාර්යක්ෂමතාව සහ නැගී එන ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොලේ තාක්ෂණික වෙළෙඳ උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඔහු කීර්තිමත් කොළඹ සැලැස්ම ශිෂ්‍යත්වයක් තුළින් තාක්ෂණය පිළිබඳ බටහිර බෙන්ගාල විශ්ව විද්‍යාලයෙන් ඔහුගේ MBA උපාධිය ලබාගත් අතර, කැලණිය විශ්ව විද්‍යාලයේදී ව්‍යාපාර කළමනාකරණය (ගණකාධිකරණය) පිළිබඳ ඔහුගේ උපාධි අපේක්ෂක අධ්‍යයන සම්පූර්ණ කරන ලදී.

අධ්‍යාපනිකයෙක් ලෙස, මහාචාර්ය ප්‍රනාන්දු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික වාතාවරණය මත ගැඹුරු බලපෑමක් සිදුකර ඇත. වසර 27ක ඉගැන්වීමේ පළපුරුද්ද සමඟ, ඔහු ප්‍රධාන තනතුරු ගණනාවක් දරා ඇත. ඒවාට මූල්‍ය දෙපාර්තමේන්තුවේ මහාචාර්ය සහ ප්‍රධානී ඇතුළත්වන අතර, කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨයේ පීඨාධිපති ලෙස සේවය කළේය. ඔහුගේ නායකත්වය යටතේ, එම පීඨය සැලකියයුතු සන්ධිස්ථාන සාක්ෂාත් කර ගත් අතර, ඒවාට ලෝක බැංකුවේ AHEAD ප්‍රදාන, MBA වැඩසටහන සඳහා ISO 21001 සහතික කිරීම සුරක්ෂිත කර ගැනීම සහ මධ්‍යම ව්‍යාපාර (Incubator - ඉදිරි ප්‍රවර්ධන මධ්‍යස්ථානය) වැනි නව්‍යකරණ වැඩසටහන් ස්ථාපිත කිරීම ඇතුළත්ය.

මහාචාර්ය ප්‍රනාන්දු කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වැනි ජාතික මූල්‍ය ආයතන සඳහා උපදේශකයෙක්, ඇගයුම්කරුවෙක් සහ සම්පත් දායකයෙක් ලෙස අත්‍යවශ්‍ය කාර්යභාරයක් ද ඉටු කර ඇත. ඔහුගේ අධ්‍යාපනික දායකත්වයන්ට වෙළෙඳපොල හැසිරීම සහ ආයෝජන උපායමාර්ග කෙරෙහි අවධානයක් සහිත පිළිගත් සඟරාවල පර්යේෂණ ප්‍රකාශන ගණනාවක් ඇතුළත්ය.

2

ජයන්ත තිලකරත්න මයා

අධ්‍යක්ෂ

ජයන්ත තිලකරත්න මහතා ජාතික සහ බහුජාතික සංවිධානවල වසර 25කට වැඩි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පළපුරුද්දක් සහිත ඉහළින් ප්‍රවීන නීති සහ මානව සම්පත් වෘත්තිකයෙකි. ඔහුගේ පළපුරුද්ද උපායමාර්ගික මානව සම්පත් කළමනාකරණය, නීති උපදේශනය, වෙනස කළමනාකරණය, ආයතනික සංස්කෘති සංවර්ධනය, සහ මූල්‍ය සැලසුම් කිරීම දක්වා විහිදේ.

තිලකරත්න මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ LLB සහ LLM සහිත නීති වේදියෙක් වන අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඒ උපාධිය ලබාගෙන ඇත. ඔහු පිරිස් කළමනාකරණ ආයතනයේ (CIPM) වරලත් සාමාජිකයෙක් ද වන අතර, රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක්ද රැගෙන ඇත.

ඔහුගේ කීර්තිමත් වෘත්තිය පුරාම, තිලකරත්න මහතා නායකත්ව තනතුරු කිහිපයක් දරා ඇති අතර එයට ටාප් හොටෙල්ස් හී මානව සම්පත් අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ටෙලිකෙම් හී ප්‍රධාන මානව සම්පත් නිලධාරී, මැලිබන් බිස්කට් නිෂ්පාදන සමාගමේ සමූහ සාමාන්‍යාධිකාරී, යන තනතුරු ඇතුළත් වේ. ඔහුගේ කාල්පනික නායකත්වය "වැඩ කිරීමට සුදුසුම ස්ථානය" සම්මාන ලබාගැනීම සහ ප්‍රධාන සංවිධානවල නව්‍යකරණ මානව සම්පත් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම වැනි සන්ධිස්ථාන සාක්ෂාත් කර ගැනීමේදී අත්‍යවශ්‍ය වී ඇත.

ඔහුගේ ආයතනික ජයග්‍රහනයන්ට අමතරව, තිලකරත්න මහතා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ විශ්ව විද්‍යාලවල බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කරමින් සහ CIPM සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමය වැනි වෘත්තීමය ආයතනවල සක්‍රියව සහභාගිවෙමින් අධ්‍යාපනයට සැලකියයුතු ලෙස දායක වී ඇත.

3

බ්‍රැඩ්ලි එමර්සන් මහතා

අධ්‍යක්ෂ

බ්‍රැඩ්ලි එමර්සන් මහතා බැංකුකරණ, අධ්‍යාපනය සහ උපායමාර්ගික නායකනත්වය පිළිබඳ දශක හතරකට වැඩි පළපුරුදු වෘත්තිකයෙකි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් MBA උපාධිය ලබාගෙන ඇති අතර, බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකි, එමෙන්ම ඔහුට වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේන් (UK) කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් ඇත. ඔහු දැනට ව්‍යාපාර පරිපාලන ආචාර්ය (DBA) උපාධිය හදාරමින් සිටී.

එමර්සන් මහතාගේ බැංකු වෘත්තියට කොමර්ෂල් බැංකුව, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කළ පෑන් ඒෂියා බැංකුවේ අත්‍යවශ්‍ය කාර්යභාරයන් ඇතුළත්ය. විශේෂයෙන්, පෑන් ඒෂියා බැංකුවේ ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිසන්නාමකරණය තුළ පරිවර්තනීය කාර්යභාරයක් ඔහු ඉටු කළේය. එමෙන්ම ඔහු මධ්‍යම සහ ශාඛා මෙහෙයුම් අධීක්ෂණය කරමින් ඕමාන, බහරේන් සහ කුවෙයිට් බැංකුවල ජ්‍යෙෂ්ඨ තනතුරු දරා ඇත.

2007 දී, එමර්සන් මහතා දකුණු ආසියාව සහ මැදපෙරදිග සඳහා ප්‍රාදේශීය අධ්‍යක්ෂ ලෙස CIMA-UK හා හවුල් වූ අතර, ශ්‍රී ලංකාව සහ ඉන් ඔබ්බට CIMA සන්නාමය තුළ විශාල වර්ධනයක් ඇති කරන ලදී. ඔහුගේ නායකත්වය උසස් අධ්‍යාපනය පිළිබඳ ඉම්පීරියල් ආයතනයේ විධායක අධ්‍යක්ෂ ලෙස අධ්‍යාපනික ක්ෂේත්‍රයට දායක වූ අතර, එහිදී ඔහු නව්‍යකරණ MBA සහ DBA වැඩසටහන් හඳුන්වා දුන්නේය.

නිපුන අධ්‍යාපනිකයෙක් ලෙස, එමර්සන් මහතා උපායමාර්ගික කළමනාකරණය සහ ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ දේශන පවත්වන අතර, ඔහු දකුණු ආසියාව හරහා පිළිගත් ආයතනවල බාහිර පීඨ සමාජිකයෙක් වෙති. එමෙන්ම ඔහු සහතික ලත් ක්‍රමානුකූල කණ්ඩායම් පුහුණු කරුවෙක් සහ බිස්නස් ඇත්ලෙටිස් ප්‍රයිවට් ලිමිටඩ් හි පුරෝගාමියා ද වේ.

එමර්සන් මහතා විවිධ පිළිගැනීම් ලබාගෙන ඇති අතර, ඒවාට ජීවකාල ජයග්‍රහාක සම්මාන (2020) සහ වසරේ විධායක පුහුණුකරු (2023) ඇතුළත්ය.

4

ආචාර්ය අහිලන් කදිර්ගාමර්

අධ්‍යක්ෂ

ආචාර්ය අහිලන් කදිර්ගාමර් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉංජිනේරු, පර්යේෂණ හා ශාස්ත්‍රීය විෂය තුළ විශේෂඥතා සම්භාරයක් රැගෙන එයි 2024 නොවැම්බර් පත්කරන ලද ඔහු විවිධ විෂයයන් සහ ගෝලීය අත්දැකීම් විහිදා යන සුවිශේෂී පසුබිමක් සමඟ බැංකුවට එක් වේ.

ආචාර්ය අහිලන් කදිර්ගාමර් මහතා නිව්යෝර්ක් හී සිටි විශ්ව විද්‍යාලයේ උපාධි මධ්‍යස්ථානයෙන් මානව විද්‍යාව පිළිබඳ පී.එච්.ඩී. (PHD) උපාධිය, සමාජ පර්යේෂණ සඳහා නව පාසලෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ඒ උපාධිය, සහ තාක්ෂණය පිළිබඳ පෝර්ජියා ආයතනයෙන් ඉලෙක්ට්‍රිකල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ BSc උපාධිය ලබාගෙන ඇත. ඔහුගේ වෘත්තිය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර 12ක පළපුරුද්ද සමඟ ආරම්භ කළ අතර, එම කාලසීමාව තුළ තාක්ෂණික නව්‍යකරණය සහ ගැටළු විසඳීම පිළිබඳ ඔහුගේ කුසලතා මුවහත් කරගනිමින් ටෝකියෝ සහ නිව්යෝර්ක් හි සේවය කර ඇත.

පර්යේෂණ හා ශාස්ත්‍රීය කටයුතු වෙත සංක්‍රාන්තවෙමින්, ආචාර්ය කදිර්ගාමර් විස්තීර්ණ ජාත්‍යන්තර ව්‍යාපෘතිවල මැදිහත් වී ඇති අතර, ඔහු ධීවර, ගොවිජන වෙනස්වීම, සමූපාකාර, ණය ප්‍රතිව්‍යුහගතකරණය. සහ ආර්ථික විකල්ප වැනි තීරණාත්මක මාතෘකා සම්බන්ධව පුළුල්ව ප්‍රකාශයට පත් කර ඇත. ඔහුගේ ආර්ථික පද්ධති සහ සංවර්ධනය කෙරෙහි වූ අවබෝධය සමාජ-ආර්ථික අභියෝග විසඳීමේදී චින්තන නායකයෙක් ලෙස ඔහුව ස්ථානගත කර ඇත.

2018 දී, ඔහු යාපනය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්යවරයෙක් ලෙස එක් වූ අතර, එහිදී ඔහු තීරණාත්මක චින්තනය සහ අන්තර් ක්ෂේත්‍ර ශිෂ්‍යත්වය තුළ වැදගත් වී ඇත.

5

කේ ඒ විමලේන්තිරරාජා

අධ්‍යක්ෂ

කේ ඒ විමලෙන්තිරරාජා මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු වන අතර රාජ්‍ය සේවයේ වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහු මේ වන විට වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපාකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ලෙස කටයුතු කරයි. ඔහු නීතිඥවරයෙකි.

විමලෙන්තිරරාජා මහතා යාපනය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක්, පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය, මොරටුව විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය සහ ශ්‍රී ලංකාවේ විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ලබා ඇත. ඔහු සංවර්ධන අධ්‍යයන හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, E-government පිළිබඳ ඩිප්ලෝමාව සහ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව ලබා ඇත. ඔහු ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ චිකි ව්‍යාපාර පාසලේ ඔක්ස්ෆර්ඩ් ෆින්ටෙක් වැඩසටහන, හාවර්ඩ් කෙනඩි රජයේ පාසලේ වෙළෙඳ ප්‍රතිපත්තිය: විධායක අධ්‍යාපන වැඩසටහන සහ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකය සම්පූර්ණ කර ඇත.

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපාකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ලෙස ඔහුගේ පත්වීමට පෙර, ඔහු රාජ්‍ය සේවයේ විවිධ තනතුරු දරා ඇති අතර ඒවාට මහා භාණ්ඩාගාරයේ වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, පරිපාලන ප්‍රතිසංස්කරණ හා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන තොරතුරු නිලධාරී, චීනයේ බීජිං හි පිහිටි ශ්‍රී ලාංකික තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශක යන ඒවා ඇතුළත්ය.

විමලේන්තිරරාජා මහතා මහපොල ශිෂ්‍යත්ව හාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ද වේ.

ඔහු අපනයන සංවර්ධන මණ්ඩලයේ, ඩිලාරෝ ලංකා කරන්සි ඇන්ඩ් සිකියුරිටි ප්‍රින්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයෙක්, කොළඹ වාරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ කොමසාරිස්, ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂකයෙක්, ද විය. එමෙන්ම ඔහු ලංකා බැංකුව, මහජන බැංකුව, ශ්‍රී ලංකා ටෙලිකොම්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සහ කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් වැඩිදියුණු කිරීමේ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් ද සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති/අධ්‍යක්ෂ ද විය. සාර්ක් සංවර්ධන අරමුදලේ ශ්‍රී ලංකාවේ අධ්‍යක්ෂවරයා සහ පොදු රාජ්‍ය මණ්ඩලයේ කුඩා රාජ්‍ය වෙළෙඳ මුලය පහසුකම සඳහා අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක් ද විය.

විමලෙන්තිරරාජා මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ සහ උපාධි අධ්‍යයන පීඨයේ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා බාහිර කතිකාචාර්යවරයෙක් ද වේ.

විධායක කළමනාකරණය

13
15
17
19
1
3
5
7
9
11

1

ක්ලයිව් ෆොන්සේකා මහතා

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

පළපුරුදු බැංකුකරුවෙකු වන ෆොන්සේකා මහතාට භාණ්ඩාගාර කළමනාකරණය තුළ වසර 29කට වැඩි පළපුරුද්ද ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් MBA උපාධියක් ලබා ඇත. ඔහු ACI ගනුදෙනු සහතිකය සඳහා විශිෂ්ටත්වයක් ලබා ඇති අතර ඕස්ට්‍රේලියාවේ සහතික කළ කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CMA) සහතික ලත් සාමාජිකයෙක් වේ.

ඔහුගේ වෘත්තිය තුළ ෆොන්සේකා මහතා ශ්‍රී ලංකාවේ මූල්‍ය වාතාවරණය හැඩ ගැස්වීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කර ඇත. 2018 සිට 2020 දක්වා, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමයේ සභාපතිවරයා ලෙස ඔහු සේවය කර ඇති අතර ජාතික ගෙවීම් කවුන්සිලය, මූල්‍ය පදධති ස්ථායිතා උපදේශක කමිටුව, සහ විකල්ප මිණුම් ලකුණු පොළි අනුපාත පිළිබඳ කාර්යය බලකායේ සක්‍රියව සහභාගි විය. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මූල්‍ය වෙළෙඳපොල යටිතලපහසුකම් සංවර්ධනය පිළිබඳ වෙළෙඳපොල ක්‍රියාකාරී සමූහයේ කොටසකි.

වර්තමානයේ ෆොන්සේකා මහතා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීවිල්සී, පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්, සහ ලංකා පේ (ප්‍රයිවට්) ලිමිටඩ් හි ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කරයි. ඊට අමතරව, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය හා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන්, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ ලංකා මූල්‍ය සේවා කාර්යාංශයේ අධ්‍යක්ෂ තනතුරු දරයි. මෙයට පෙර ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ IABF/DABF විභාග සඳහා ප්‍රධාන පරීක්ෂකවරයෙකු ලෙස ද බැංකු අධ්‍යාපන අංශයට දායක වී ඇත.

ෆොන්සේකා මහතා 2002 වසරේ මහජන බැංකුව හා එක් වූ අතර, 2011 නොවැම්බර් මාසයේ සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ලෙස ආයතනික කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. මෙම තනතුර තුළ, ඔහු විදේශ විනිමය මෙහෙයුම්, ප්‍රාථමික අලෙවි නියෝජිත අංශය, ආයෝජන බැංකුකරණ ඒකකය, සහ ඇමරිකනු ඩොලර් සහ රුපියල් වෙළෙඳපොළ මෙහෙයුම්, මෙහෙය වූ අතර දේශීය හා විදේශීය වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමඟ සබඳතා කළමනාකරණය කිරීම සිදුකර ඇත. ඔහුගේ විස්තීර්ණ පළපුරුද්දට ඇමෙරිකන් එක්ස්ප්‍රස් බැංකුව සහ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව තුළ ජ්‍යෙෂ්ඨ කාර්යභාරයන් ඇතුළත් වේ.

2023 ජනවාරි 1 දින ෆොන්සේකා මහතා මහජන බැංකුවේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරිවරයා ලෙස පත් කරන ලදී. ඔහු විධිමත්ව 2023 අගෝස්තු 1 දින ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී තනතුර භාරගන්නා ලද අතර, බැංකුවේ උපායමාර්ගික වර්ධනය සහ මූල්‍ය විශිෂ්ටත්වය ඉදිරියට ගෙන යාමට දායක විය.

2

අසාමි ඒ අහමට් මහතා

මූල්‍ය ප්‍රධාන

උපාය මාර්ගික මූල්‍ය කළමනාකරණය, ආයෝජන සහ අවදානම් ව්‍යවසාය පිළිබඳ වසර 30කට වැඩි අත්දැකීම් සම්භාරයක් රැගෙන 2017 ජනවාරි 3 වන දින මූල්‍ය ප්‍රධානී ලෙස අහමට් මහතා මහජන බැංකුවට සම්බන්ධ විය. ඔහුගේ වෘත්තිය තුළ, ඔහු විශාලතම බහුජාතික වෘත්තීය සේවා සමාගම් කිහිපයක් සහ විවිධ ක්ෂේත්‍ර හරහා පළමු පෙළ සේවා සපයනන් ඇතුළුව දේශීයව සහ ජාත්‍යන්තරව කීර්තිමත් ආයතනවල සැලකියයුතු කාර්යභාරයන් දරා ඇත.

වයස අවුරුදු 36 දී බැංකුවේ වගකීම් භාරගන්නා අවස්ථාවේදී, අහමට් මහතා ශ්‍රී ලංකාවේ දේශීයව ක්‍රමානුකූලව වැදගත් බැංකුවක මෙතෙක් තරුණම ප්‍රධාන මූල්‍ය නිලධාරී බවට පත්විය. මේ දක්වා ආයතනික සාමාජිකයෙක් ලෙස වසර 8කට වැඩි පළපුරුද්ද සමඟ, බැංකුවේ සියලුම කළමනාකරණ මට්ටමේ අනු කමිටු සියල්ලේම පාහේ ප්‍රධාන සාමාජිකයෙක් වී ඇත. ඒ සෑම අවස්ථාවකදීම ඔහු ආයතනික වටිනාකම් සුරැකීමට සහ වැඩි දියුණු කිරීමට දායක වූ අතර වසර ගණනාවක් පුරා ආයතනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනයන් සිදුකර ඇත. විශේෂයෙන්, ඔහු බැංකුවේ විධායක මෙහෙයුම් කමිටුවේ දීර්ඝ කළක් සේවය කරන සාමාජිකයා ද වේ.

අහමට් මහතා වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ (UK) සාමාජිකත්වය, වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය (UK) ශ්‍රී ලංකා සහතික කළ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය ඇතුළු ඉහළ පෙළේ වෘත්තීය සාමාජිකත්වයන් කිහිපයක් දරයි. එමෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය සහ සහතික කළ ගණකාධිකාරිවරයෙකි (AUST) ඊට අමතරව, අහමට් මහතා ලන්ඩනයේ අවදානම් කළමනාකරණ ආයතනයේ තාක්ෂණික විශේෂඥයෙක්, ලන්ඩන් වරලත් ණය කළමනාකරණ ආයතනයේ සහතිකලත් සාමාජිකයෙක් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි අයතනයේ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ සහ අර්ථකථන කමිටුවේ සාමාජිකයෙකි.

මහජන බැංකුවේ ඔහුගේ කාර්යභාරයට අමතරව, අහමට් මහතා, පිපල්ස් ඉන්ෂුවරන්ස් පීවිල්සි සහ පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි. එමෙන්ම ඔහු පිපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීවිල්සී සහ ලංකා අලියන්ස් ෆිනෑන්ස් සමාගම (බංගලාදේශය) අධ්‍යක්ෂ තනතුරු දරා ඇත.

3

ප්‍රීති කටුලන්ද මහත්මිය

ප්‍රධාන නීති නිලධාරී

ප්‍රීති කටුලන්ද මහත්මිය නීතීඥවරියක් වන අතර, ඇය නීති වෘත්තියේ ක්‍රියාකාරීව සේවයේ වසර 30ක් සහිත ප්‍රවීන නීති වෘත්තිකයෙකි. ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය විද්‍යාපති (MBA-HRM) පිළිබඳ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර පීරිස් කළමනාකරණ ආයතනයෙන් (IPM) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් ද සාර්ථකව සම්පූර්ණ කර ඇත.

තවද ඇය සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් (KDU) ව්‍යාපාර නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. ඇයගේ අධ්‍යාපනික විශිෂ්ටත්වය හඳුනාගනිමින් ව්‍යාපාර නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය(LLM) හි විශිෂ්ට කාර්යසාධනය වෙනුවෙන් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කීර්තිමත් උප කුලපති සම්මානය ඇය වෙත පිරිනමන ලදී.

ප්‍රීති කටුලන්ද මහත්මිය නීති වෘත්තියේ සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේ මහජන බැංකුවෙන් නීතිමය සීමාවාසිකවරියක් ලෙසින් වන අතර පසුව ඇය 2021 වසරේ දෙසැම්බර් 1 දින මහජන බැංකුවට සම්බන්ධ විය. ඇය ස්වාධීන නීති වෘත්තිකයෙකු මෙන්ම ආයතනික නීති වෘත්තිකයෙක ලෙස දශක දෙකකට ආසන්න සේවා පළපුරුද්දක් ඇත. විශේෂයෙන් ඇය වසර 17ක් ආයතනික අංශයට කැපවී ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්

නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල නීති අංශවලට ඇයගේ ප්‍රවීනත්වය දායක කර ඇත. ඇයගේ වෘත්තිය තුළ ඇය ප්‍රධාන නායකත්ව තනතුරු කිහිපයක් දරා ඇත.

ඇයගේ වෘත්තිමය ජයග්‍රහනයන්ට අමතරව, කටුලන්ද මහත්මිය ප්‍රජා සේවා සහ නායකත්වය සඳහා ඇයගේ කැපවීම පෙන්නුම් කරමින් Lionism හි සක්‍රිය සාමාජිකාවකි, එමෙන්ම ඇය නීති සහ ආයතනික අංශය සමඟ ඇයගේ සහභාගිත්වය තවදුරටත් වැඩි කරමින් ප්‍රධාන වෘත්තීමය ආයතනවල ද සමාජිකාවකි,

ශක්තිමත් අධ්‍යාපනික පසුබිම හා බැඳුණු ඇයගේ විස්තීර්ණ පළපුරුද්ද උපායමාර්ගික නීතිමය මඟපෙන්වීම සහ මූල්‍ය අංශයේ නායකත්වය ලබාදීමට ඇයට හැකියාව ලබා දී ඇත.

4

ටී ඩී එස් දසා මහතා

ප්‍රධාන තොරතුරු නිලධාරී

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 27 ක පළපුරුද්ද ගණනය කරමින්, ධම්මික දසා මහතා මහජන බැංකුවේ ප්‍රධාන තොරතුරු නිලධාරී (CIO) ලෙස සේවය කරයි. උපායමාර්ගික කළමනාකරණය, වැඩසටහන් කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, ඨටිතල පහසුකම් තාක්ෂණ කළමනාකරණය, මෘදුකාංග සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීමේ නිරාවරණය ඇතුළු විවිධ විෂය ක්ෂේත්‍රයන්හි සැලකිය යුතු නිරාවරණයක් සහ ප්‍රවීණත්වයක් ඔහුට ඇත, වසර ගණනාවක් පුරා, ඔහු ශ්‍රී ලංකාව, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය තුළ මූල්‍ය, රක්ෂණ, බැංකු, නිෂ්පාදන, සැපයුම් සහ විවේකය වැනි පරාසයන් ගණනාවක් හරහා ඔහුගේ කුසලතා ඔප් නංවා ඇත. මීට අමතරව, ඔහුට තොරතුරු ආරක්ෂණ ක්‍රියාත්මක කිරීම් පිළිබඳ පුළුල් අවබෝධයක් ඇත.

දසා මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් ගණිතය හා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ගත්තේය. බැංකුවේ ඔහුගේ වත්මන් තනතුර භාර ගැනීමට පෙර ඔහු එයිටිකන් ස්පෙන්ස් සමූහය කේ.පී.එම්.ජී. ශ්‍රී ලංකා සහ ෆිස්රෙව් වැනි ප්‍රමුඛ ආයතනවල විවිධ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව තනතුරු කිහිපයක් හොබවා ඇත.

5

ඊ ඒ එම් දිසානායක මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක

ශාඛා බැංකුකරණය සහ අභ්‍යන්තර විගණනය පිළිබඳ වසර 34කට වැඩි පළපුරුද්දක් ඇති මහින්ද දිසානායක මහතා දැනට මහජන බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ලෙස කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (FCA) සාමාජිකයෙක්, වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (UK) සාමාජිකයෙක් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (AIB) සහකාර සාමාජිකයෙක් ද වේ. ඊට අමතරව ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක් ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය (පොදු) පිළිබඳ විද්‍යාවේදී උපාධියක්ද ලබා ඇත. තවද, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් තොරතුරු පද්ධති, ආරක්ෂක පාලනය සහ විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇති අතර, ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ තාක්ෂණික සහයෝගීතාවයෙන් ප්‍රදානය කර ඇත

6

වික්‍රම නාරායන මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ව්‍යවසාය බැංකුකරණය

1994 වසරේදී මහජන බැංකුවට කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස සම්බන්ධ වූ වික්‍රම නාරායන මහතා ශාඛා බැංකුකරණය, ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය, මෙන්ම උපාය මාර්ගික සැලසුම් වැනි බැංකුකරණයේ විවිධ අංශවල වසර 30කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. කුඩා ව්‍යාපාර ණය දීම, ව්‍යාපෘති මූල්‍යකරණය, ව්‍යවසායකත්ව සංවර්ධනය, ව්‍යාපාර පුනර්ජීවනය සහ පුනරුත්ථාපනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් SME ණය ලබා දීම පිළිබඳ ඔහුගේ විශේෂඥතාව වසර 20ක් පුරා විහිදේ. වර්තමානයේ, ඔහු මහජන බැංකුවේ ව්‍යවසාය බැංකුකරණ දෙපාර්තමේන්තුව මෙහෙයවන අතර, ඔහු කොමර්ෂල් ක්‍රෙඩිට්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, සංවර්ධන මූල්‍ය, ක්ෂුද්‍ර මූල්‍ය, ව්‍යාපෘති මූල්‍ය සහ පුනරුත්ථාපනය හරහා ඔහුගේ විශේෂඥතාව යොදවයි.

නාරායන මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක්ද, ශ්‍රී ජයවර්ධනපුර කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් බැංකු හා මූල්‍ය පිළිබඳ MBA උපාධියක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ MSc උපාධියක්ද ලබාගෙන ඇත. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි. ව්‍යාපෘති ඇගයීම් සහ අවදානම් විශ්ලේෂණය පිළිබඳ හාවර්ඩ් ඉන්ටර්නැෂනල් වෙතින් කීර්තිමත් පුහුණුවක් ඇතුළුව දේශීය සහ විදේශීය පුහුණු කිහිපයක් ඔහු ලබාගෙන ඇත.

බැංකුවේ සේවය කිරීමට පෙර නාරායන මහතා පෞද්ගලික අංශයේ විවිධ නිෂ්පාදන සමාගම්වල සේවය කළේය. ඔහු දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බැංකු අධ්‍යයන මධ්‍යස්ථානයේ දේශන පවත්වයි. වර්තමානයේ ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙක් ද වන අතර පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හී අධ්‍යක්ෂවරයෙක් ද වේ.

7

නිල්මිණී ප්‍රේමලාල් මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ගෙවීම්, ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව සහතිකය

ප්‍රේමලාල් මහත්මිය දැනට මහජන බැංකුවේ ගෙවීම්, ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව සහතිකය පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරිය ලෙස කටයුතු කරයි. 2002 වසරේදී කළමනාකරණ අභ්‍යාසලාභිනියක ලෙස මහජන බැංකුවට සම්බන්ධ වූ ඇය බැංකුව තුළ වසර 23ක පමණ පළපුරුද්දක් ඇති අතර, වසර 18කට වැඩි කාලයක් මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහ වසර දෙකක කාලයක් උපාය මාර්ගික සැලසුම්, කාර්ය සාධන කළමනාකරණ සහ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පළපුරුද්ද එයට ඇතුළත්ය.

මූල්‍ය දෙපාර්තමේන්තුවේ ඇයගේ පැවැත්ම තුළ, ඇය නියෝජ්‍ය මූල්‍ය ප්‍රධානියා ලෙස සේවය කරමින් සිටියදී බැංකුවේ සමස්ත කාර්ය සාධනය සඳහා විශේෂිත දායකත්වයක් ලබා දුන්නාය. සහකාර සාමාන්‍යාධිකාරිවරිය ලෙස, ඇය උපාය මාර්ගික සැලසුම්කරණය, කාර්ය සාධන කළමනාකරණය සහ පර්යේෂණ දෙපාර්තමේන්තුව යන ක්ෂේත්‍ර ආවරණය කරමින් බැංකුවේ උපාය මාර්ගික සැලැස්ම නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ඵලදායීව කටයුතු කළාය

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සමඟ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධියක් ද, කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (MBA) උපාධියක් ද ලබා ඇත. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකාවක් වන අතර (FCMA), ශ්‍රී ලංකාවේ සහතික කළ කළමනාකරණ ගණකාධිකාරිවරියක (CMA) සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) අශ්‍රිත සාමාජිකාවක් වන අතර 2009 සිට සහ මෑතදී ජ්‍යෙෂ්ඨ සහය සාමාජිකයෙක් ලෙස ඇය පිළිගන්නා ලදී. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බාහිර දේශන තුළින් දැනුම ලබාදෙමින් බැංකුකරුවන්ට ඇය සේවය කර ඇත. ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකාවකි. ඇය CIMA (UK) සම්පූර්ණ කර ඇත.

ඇය පීපල්ස් මර්චන්ට් බැංකුවේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වන අතර, ඊට සමගාමීව පීපල්ස් මර්චන්ට් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විගණන කමිටුවේ සභාපති ධුරය ද හෙබවූවාය. ඇය දැනට පීපල්ස් මයික්‍රෝ – කොමර්ස් ලිමිටඩ් හී, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ විකල්ප අධ්‍යක්ෂවරියක් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවකි.

8

ටී එම් ඩබ්ලිව් චන්ද්‍රකුමාර මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය

චන්ද්‍රකුමාර මහතා 1994 වසරේ මහජන බැංකුවේ කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කල අතර බැංකු ක්ෂේත්‍රයේ වසර 30කට වැඩි පළපුරුද්දක් අත්කරගෙන ඇත. ඔහු දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුද්ගල කේන්ද්‍රීය කළමනාකරණය) ලෙස සේවය කරයි. ඔහු සිය වෘත්තීය ජීවිතය තුළ දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් විවිධ නිරාවරණ වැඩසටහන් සඳහා සහභාගී වී ඇති අතර, 2018 සිට 2020 අවසානය දක්වා විවිධ ව්‍යාපාර බැංකු කළමනාකරණ පිළිවෙත් පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගනිමින්, චන්ද්‍රකුමාර මහතා (බැංකු සහය සේවා) සහකාර සාමාන්‍යාධිකාරී තනතුර දැරිය එමෙන්ම සැපයුම්, ප්‍රවාහන, ආරක්ෂාව, නඩත්තු ඉංජිනේරු, ගොඩනැගිලි ඉංජිනේරු, සහ ඩෙස්ක්ටොප් ප්‍රකාශන වැනි දෙපාර්තමේන්තු හයක් අධීක්ෂණය කරනු ලැබීය. මෙම කාලසීමාව තුළ, ඔහු ප්‍රවාහන හා ආරක්ෂක ක්‍රියා පටිපාටිවලට අමතරව ප්‍රසම්පාදන, ඉදිකිරීම් සහ නඩත්තු, ගබඩා සහ ඉන්වෙන්ටරි පාලනය පිළිබඳ මිල කළ නොහැකි අත්දැකීම් ලබා ගත්තේය. 2020 සිට 2023 දක්වා ඔහු සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ පරිපාලන සහ ව්‍යාපාර සහාය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (මාර්ග කළමනාකරණ දෙපාර්තමේන්තුව) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ශාඛා කටයුතු කළමනාකරණ දෙපාර්තමේන්තුව) ලෙස ක්‍රියා කළ අතර එහිදී ඔහු ශාඛා ජාලය සහ CEFT මෙහෙයුම් සඳහා 5S ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු දැනුමක් ලබා ගත්තේය.

චන්ද්‍රකුමාර මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) දෙවන පන්තියේ ඉහළ අංශයේ උපාධියක් සහ සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමාවක් (ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය/WTO (UNCTAD) ජිනීවා, ස්විට්සර්ලන්තය) ලබා ඇත. ඔහු ඕස්ට්‍රේලියාවේ සහතික කළ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (CMA) ආශ්‍රිත සාමාජිකයෙකි, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (LICA) ආවසරික සහතිකලාභියෙකි, ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ශිල්පීන්ගේ (MAAT), සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) ආශ්‍රිත සාමාජිකයෙකි. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ (MISMM) ආයතනික සාමාජිකයෙකි.

9

සමන්ති සේනානායක මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අනුකූලතාව

සමන්ති සේනානායක මහත්මියට නීතීඥවරියක ලෙස වසර 30ක පළපුරුද්දක් ඇත. ඇය ඉන්දියාවේ දිල්ලි විශ්වවිද්‍යාලයෙන් නීතිපති උපාධියක් ද (LLM) ලබා ඇත. ඊට අමතරව, අනුකූලතා අංශයන්හි වෘත්තීය සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කර ඇති ඇයට මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය සහයෝගයෙන් ජාත්‍යන්තර අනුකූලතා සංගමය විසින් අනුකූලතාව පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමාව පිරිනමා ඇත.

සේනානායක මහත්මිය මහජන බැංකුවේ නීති අභ්‍යාසලාභී සීමාවාසිකවරියක් ලෙස සිය නීති වෘත්තිය ආරම්භ කළ අතර එතැන් සිට තනි පුද්ගල වෘත්තිකයෙකු ලෙස සහ ආයතනික අංශයේ සාමාජිකාවක් ලෙස සේවය කරමින් දශක තුනකට වැඩි පළපුරුද්දක් ලබා ඇත. 2001 වසරේ සහකාර නීති නිලධාරිනියක ලෙස මහජන බැංකුවට බැඳුණු ඇය වසර නවයක් නීති නිලධාරිනියක ලෙස සිය රාජකාරිය ඉටු කළාය.2009 මාර්තු 03 දින, සේනානායක මහත්මිය බැංකුවේ අනුකූලතා නිලධාරී තනතුර භාරගත් අතර පසුව ඇය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අනුකූලතා ලෙස 2023 අප්‍රේල් 28 දින උසස් කරන ලදී.

ඇය ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ බැංකුවේ (CRIB) මූල්‍ය අනුකූලතා නිලධාරී තනතුරු දරන අතර තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ පිහිටුවා ඇති තොරතුරු කමිටුවේ සාමාජිකාවක් ද වේ. ඇය CRIB හි සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ විකල්ප අධ්‍යක්ෂවරිය ලෙස තවදුරටත් කටයුතු කරන අතර CRIB හි උපදේශක කමිටුවේ සභාපතිනිය ලෙස කටයුතු කරයි.

10

ශමීලා ලොකු කළුගේ මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – භාණ්ඩාගාරය, ආයෝජන බැංකු සහ මූල්‍ය ආයතන

ශමීලා ලොකු කළුගේ මහත්මිය 2002 වසරේ බැංකුවේ කළමනාකරණ අභ්‍යාසලාභිනියක ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කල අතර බැංකුවේ භාණ්ඩාගාර ඒකකයේ වසර 23කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම්, මුදල් වෙළෙඳපොළ මෙහෙයුම්, ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය (PDU) සහ ආයෝජන බැංකුකරණ ඒකකය මෙහෙයවමින් සහ දේශීය හා විදේශීය මූල්‍ය ආයතන සමඟ බැංකුවේ සබඳතා කළමනාකරණය කරමින් 2023 දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාරය, ආයෝජන බැංකු සහ මූල්‍ය ආයතන ලෙස ද ඇය රාජකාරී භාර ගෙන ඇත. 2011 සිට 2022 දක්වා කාලය තුළ, ඇය 2017 සිට භාණ්ඩාගාරයේ සහ PDU හි සමස්ත කාර්යයන් අධීක්ෂණය කිරීම ඇතුළුව භාණ්ඩාගාරයේ ක්ෂේත්‍ර කිහිපයක සේවය කර ඇත.

ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙන් දෙවන ශ්‍රේණියේ ඉහළ සාමාර්ථ සමඟ ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් ද, එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය) පිළිබඳ විද්‍යාපති උපාධියක් විශිෂ්ඨ සාමාර්ථයක් සහිතව ලබා ඇත. ඊට අමතරව, ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් (IBSL) භාණ්ඩාගාර, ආයෝජන සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. ඇය ACI ගනුදෙනු සහතිකය පිළිබඳ විශිෂ්ටත්වයක් සාක්ෂාත් කර ගෙන ඇති අතර ACI Online FX Global Code සහතිකය ලබාගෙන ඇත. මෙම සහතික දෙකම ප්‍රංශයේ ACI මූල්‍ය වෙළෙඳපොළ සංගමය විසින් පිරිනමා ඇත.

ලොකු කළුගේ මහත්මිය 2017 වසරේ ප්‍රාථමික වෙළෙඳුන්ගේ සංගමයේ (APD) අධ්‍යක්ෂවරියක් ලෙස පත් කරන ලදී. 2020 සිට 2023 දක්වා APD හි ලේකම්වරිය ලෙස කටයුතු කිරීමෙන් පසු ඇය දැනට APD හි උප සභාපති ලෙස සේවය කරයි. එමෙන්ම ඇය ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකාවක් ලෙසද කටයුතු කරයි. වර්තමානයේ ඇය පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරයි. තවද, 2024 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලසීමාව තුළ පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කලාය.

11

නාලක විජයවර්ධන මහතා

අලෙවිකරණ ප්‍රධානී

නාලක විජයවර්ධන මහතා දේශීය සහ ජාත්‍යන්තර බැංකු ක්ෂේත්‍රයන්හී වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇති පළපුරුදු මූල්‍ය සේවා අලෙවිකරණ විශේෂඥයෙකි.

මහජන බැංකුව තුළ, විජයවර්ධන මහතා විස්තීර්ණ අලෙවිකරණ උපායමාර්ග සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම තුළ ප්‍රධාන වූ අතර, බලපෑම් සහගත ආයතනික නැවත ස්ථානගත කිරීමේ වැඩසටහන් හඳුන්වා දී, බැංකුවේ ඩිජිටල් හා PR පාසටහන ශක්තිමත් කිරීම අධීක්ෂණය කරන ලදී. එමෙන්ම ඔහු බහුවිධ මූලපිරීම් මෙහෙයවූ අතර ඒ තුළින් ගනුදෙනුකාර සහභාගිත්වය, ස්පර්ෂක ස්ථාන හරහා ප්‍රමිතිගත සන්නාමකරණය, සැලකියයුතු ලෙස වැඩි කළ අතර, දත්ත පදනම් ගනුදෙනුකාර අත්දැකීම මැනීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී.

මහජන බැංකුවට සම්බන්ධවීමට පෙර ඔහු පෑන් ඒෂියා බැංකුවේ ජ්‍යෙෂ්ඨ නායකත්ව කාර්යභාරයන් කිහිපයක් දරා ඇති අතර එහිදී ඔහු ණයකාඩ් කළඹ තුළ සුවිශේෂී වර්ධනයක් ඇති කර, නව්‍යකරණ පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණ නිෂ්පාදන සඳහා පෙරමුණ ගෙන ඇති අතර, මධ්‍යම විකුණුම්, ඇමතුම් මධ්‍යස්ථාන, සහ පුද්ගල ණය මෙහෙයුම් මෙහෙයවන ලදී. තවද කැනඩාවේ කැනේඩියානු ඉම්පීරියල් වාණිජ බැංකුවේ (CIBC) ජාත්‍යන්තර තනතුරු දැරූ අතර ඒ තුළින් නිෂ්පාදන කළමනාකරණය සහ මුදල් කළඹ තුළ ඔහුගේ ප්‍රවීනත්වය තවදුරටත් ශක්තිමත් කරගෙන ඇත.

අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයේ (FCIM) සාමාජිකයෙක් වන විජයවර්ධන මහතා අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (UK), කැනේඩියානු සුරැකුම්පත් පාඨමාලාව (ගෞරව) සහ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ සහය ඩිප්ලෝමාවද රැගෙන ඇත.

12

එන් ඩී පතිරණගේ මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ශාඛා කටයුතු කළමනාකරණ

නලීන් පතිරණගේ මහතා වර්තමානයේ මහජන බැංකුවේ මාර්ග කළමනාකරණයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ලෙස කටයුතු කරයි. මාර්ග කළමනාකරණයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ලෙස ඔහුගේ පත්වීමට පෙර, ඔහු පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ලෙස සේවය කර ඇත. එහිදී ඔහු විවිධ තැන්පතු බලමුළු ගැන්වීමේ වැඩසටහන් තුළින් බැංකුවේ සමස්ත තැන්පතු කළඹ හැඩගස්වාගෙන යාමේදී විශේෂයෙන් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කළේය. විශේෂයෙන් බැංකුවේ තැන්පතුවල අවදානම් තත්ත්වය තුළින් එය ඉදිරියට ගෙන යාමට සහය විය.

වර්තමානයේ ඔහුට සමස්ත රට පුරා පැතිරී ඇති බැංකු ක්ෂේත්‍රයේ ප්‍රධාන ශාඛා ජාලයේ උපායමාර්ගික අධීක්ෂණය හා කළමනාකරණය පවරා ඇත. ඔහුගේ අධීක්ෂණයට ATMs 1000, CDMs, සහ CRMs, මෙන්ම ස්වයං බැංකුකරණ ඒකක 300ක් ඇතුළත් වන බැංකුවේ විස්තීර්ණ අනුග්‍රහක ගනුදෙනුකාර කේන්ද්‍රීය යටිතලපහසුකම් පාලනය සමඟ ශාඛා 748ක මෙහෙයුම් කාර්යය පිළිබඳ සම්පූර්ණ පරිපාලනය ඇතුළත්ය.

පතිරණගේ මහතා රාජ්‍ය හා පෞද්ගලික වාණිජ බැංකු දෙකෙහිම සේවය කර ඇති බැංකු මෙහෙයුම් පිළිබඳ වසර 24කට වැඩි පළපුරුද්දක් සහ සුවිශාල දැනුමක් ඇති අතර ඉන් 2022 දී කළමනාකරණ අභ්‍යාසලාභිනියක ලෙස මහජන බැංකුව හා එක්වීමේ සිට බැංකුවේ ඔහුගේ සේවා කාලය වසර 23ක් පුරා විහිදේ.

මහජන බැංකුවේ, ඔහු විවිධ ක්‍රියාකාරී ක්ෂේත්‍රවල සහ ශාඛා බැංකුකරණය සහ නිෂ්පාදන/කළඹ කළමණාකරනය ආවරණය වන පරිදි විවිධ ක්ෂේත්‍ර වල සේවය කර ඇත. මාතලේ සහ ගම්පහ ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකරු ලෙස වසර පහකට වැඩි පළපුරුද්දක් ඇති ඔහු බැංකුවේ නව්‍ය සහ ඵලදායී ව්‍යාපාරික ප්‍රවලිත කිරීමට ඉමහත් දායකත්වයක් ලබාදී ඇත.

පතිරණගේ මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් දෙවන පන්තියේ ඉහළ සාමාර්ථක් සමඟ විද්‍යාවේදී ගෞරව උපාධියක් ද, එක්සත් රාජධානියේ බෙඩ්ෆොඩ්ෂයර් විශ්වවිද්‍යාලයෙන් අලෙවිකරණය පිලිබඳ MBA උපාධියක් ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

පතිරණගේ මහතා තම විශේෂත්වයේ විෂය කරුණු පිළිබඳ ලබාගත් විස්තීර්ණ පුහුණුව/නිරාවරණය සමඟ, ඔහු බැංකුව සඳහා සක්‍රීය සහ ගතික ව්‍යාපාර ප්‍රවර්ධන ශුම බලකායක් සැකසීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් වලදී බැංකුවේ පුහුණුකරුවකු සහ අභිප්‍රේරක/සම්පත් දායකයෙකු ලෙස විශේෂ දායකත්වයක් ලබා දේ.

13

තුෂාරි හේවාවසම් මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ජාත්‍යන්තර බැංකුකරණය

තුෂාරි හේවාවසම් මහත්මිය දැනට මහජන බැංකුවේ ජාත්‍යන්තර බැංකු අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. 2002 වසරේ බැංකුවේ කළමනාකරණ අභ්‍යාසලාභිනියක ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය, ණය, ශාඛා බැංකුකරණය, ආයතනික බැංකුකරණය සහ ජාත්‍යන්තර බැංකුකරණය ඇතුළු විවිධ බැංකුකරණ ක්ෂේත්‍ර හරහා වසර 21කට වැඩි පළපුරුද්දක් ලබාගෙන ඇත. ආයතනික සහ ව්‍යාපාර ණය දීම පිළිබඳ ඇයගේ විශේෂ ප්‍රවීණතාවය දශක දෙකක කාලයක් පුරා විහිදේ.

තුෂාරි හේවාවසම් මහත්මිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් දෙවන ඉහළ පන්තියේ ගෞරව සාමාර්ථක් සහිතව කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක් ලබා ඇත. මීට අමතරව, ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් ලෙස පිළිගැනේ. අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා ඇයගේ කැපවීම පෙන්නුම් කරමින්, ඇය වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ (CIMA) (UK) ආශ්‍රිත සාමාජිකාවක් සහ වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ (CGMA) (UK) ආශ්‍රිත සාමාජිකත්වයද දරයි.

හේවාවසම් මහත්මිය කීර්තිමත් වෘත්තීය සංගම් කිහිපයක ප්‍රධාන තනතුරු දරයි. ඇය වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ කවුන්සිලයේ සාමාජිකාවක් ලෙස සේවය කරන අතර ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වන අතර ඇය එහි බැංකුකරණ කමිටුවේ සාමාජිකයෙක් ලෙස දායක වේ. ඊට අමතරව, ඇය පීපල්ස් ලීසිං ප්ලීට් කළමනාකරණ ලිමිටඩ් හි අධ්‍යක්ෂ ධුරයක් දරයි.

14

අනුර පෙරේරා මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් කළමනාකරණය

අනුර පෙරේරා මහතා දැනට බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් කළමනාකරණය ලෙස කටයුතු කරයි. ඔහුගේ වෘත්තීය ජීවිතය 1991 දී ආරම්භ වූ අතර ශාඛා බැංකුකරණය (Branch Banking), ප්‍රාදේශීය කළමනාකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, අවදානම් කළමනාකරණය සහ ණය පාලනය පිළිබඳ විස්තීර්ණ නිරාවරණය සහ පළපුරුද්ද ලබාගෙන ඇත.

පෙරේරා මහතාට කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණ උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ඇත. වෘත්තීය වශයෙන්, ඔහු පැරිස් මූල්‍ය වෙළෙඳ සංගමයේ මූල්‍ය වෙළෙඳපොළ සංගමයේ FX Global Code හි ACI සමඟ විශිෂ්ඨ සාමාර්ථයක් සහිත ACI- මෙහෙයුම් සහතිකයක් ඇති අතර, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අශ්‍රිත සාමාජිකයෙකි

ඔහු නායකත්ව සංවර්ධනය, අවදානම් කළමනාකරණය, භාණ්ඩාගාර මෙහෙයුම් සහ ණය කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රවලට අදාළව දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සහ වැඩමුළු ගණනාවකට සහභාගි වී ඇත. 2024 දී පෙරේරා මහතා සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලය විසින් මෙහෙයවන නායකත්ව සංවර්ධන වැඩසටහන් සාර්ථකව නිම කර ඇත.

තවද, අනුර පෙරේරා මහතා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීවිල්ස් හි අධ්‍යක්ෂවරයෙක් ලෙස සහ, පීපල්ස් ලීසිං ප්ලීට් මැනේජ්මන්ට් හි සභාපති ලෙස දැනට සේවය කරන අතර, ඔහු බැංකු අංශයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමයේ සාමාජිකයෙකු ලෙසත් ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකයෙකුද වේ.

15

ඒ යූ ඒ අන්සාර් මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අයකිරිම්

අහමඩ් අන්සාර් මහතා 1993 දී මාණ්ඩලික සහකාරවරයෙකු ලෙස බැංකුව සමඟ සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලද අතර, ශාඛා බැංකුකරණය, ප්‍රාදේශීය කළමනාකරණය, අලෙවිකරණය, ශාඛා කටයුතු කළමනාකරණය, ණය සමාලෝචනය සහ අයකිරිම් ක්ෂේත්‍රයේ වසර 30කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. ඔහු ශාඛා කටයුතු කළමනාකරණය සහ අලෙවිකරණයේ ද ප්‍රශංසනීය කුසලතා ප්‍රදර්ශනය කර ඇත.

අන්සාර් මහතා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයෙන් පළමු පන්තියේ (ගෞරව) භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අශ්‍රිත සාමාජිකයෙකි. තවද ඔහු බැංකුවට බැඳීමට පෙර කැලණිය විශ්වවිද්‍යාලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහකාර කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කළේය. ඔහු ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ බැංකු හා මූල්‍ය කටයුතු පිළිබඳ අවසන් වසර සිසුන් සඳහා ආරාධිත කථිකාචාර්යවරයා ලෙස ද කටයුතු කරයි. ඉහත කරුණු වලට අමතරව ඔහු ඉන්දියාව, ජපානය, මැලේසියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වල විදේශීය පුහුණු වැඩසටහන් වලට සහභාගී වී ඇත.

16

ඩී එම් එම් දිසානායක මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත්

දිසානායක මහතා බැංකු මෙහෙයුම් ක්ෂේත්‍රය තුළ විස්තීර්ණ පළපුරුද්ද සහ ගැඹුරු දැනුමක් සහිත වසර 34 ක පළපුරුද්ද ගෙන එමින් දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් ලෙස කටයුතු කරයි.

1990 දී බැංකුව හා එක්වීමේ සිට, ඔහු විවිධ කාර්ය ක්ෂේත්‍රවල සේවය කර ඇති අතර, එයට ශාඛා කළමනාකරණය, තොරතුරු තාක්ෂණ හා මානව සම්පත් ඇතුළත්ය. මහජන බැංකුවේ ශාඛා ජාලයේ ඔහුගේ වෘත්තීය ගමන්මඟ තුළින් ශාඛා කළමනාකරු සිට ප්‍රාදේශීය කළමනාකරු දක්වා ප්‍රගතිගාමී කාර්යභාරයන් පෙන්වන අතර ඉන්පසුව ප්‍රධාන කාර්යාල මට්ටමින් සහකාර සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී යන විධායක තනතුරු දක්වා පත්ව ඇත. දිසානායක මහතා ආයතනය තුළ විස්තීර්ණ මානව සම්පත් පරිපාලන කාර්යයන් පෙන්වන ලද සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ලෙස ඔහු ධුරයෙන් පසුව 2024 මැයි මස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මානව සම්පත් ලෙස රාජකාරී භාර ගත්තේය.

ඔහුගේ වෘත්තීය පසුබිම සැලකියයුතු සුදුසුකම්වලින් සකස් වී ඇති අතර, එයට නොදර්ම්ප්ටන් විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය (MAHRM), බෙඩ්ෆොඩ්ෂයර් විශ්ව විද්‍යාලයේ අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය (MBA), සහ කොළඹ විශ්ව විද්‍යාලයේ සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (MSc) ඇතුළත්ය. ඊට අමතරව, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

17

ඩබ් ඩී ඒ බී ලියනගුණවර්ධන මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අක්වෙරළ ගනුදෙනුකාර සේවා

අරුණි ලියනණවර්ධන මහත්මිය මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අක්වෙරළ ගනුදෙනුකාර සේවා ලෙස කටයුතු කරයි. 2002 වසරේ බැංකුවේ කළමනාකරණ අභ්‍යාසලාභිනියක ලෙස බැංකුව හා එක්වූ ඇයට විදේශීය ප්‍රේෂණ, වෙස්ට්‍රෝ අනුරූප සම්බන්ධතා, ශාඛා කටයුතු කළමනාකරණය/ශාඛා මෙහෙයුම්, සහ තොරතුරු තාක්ෂණ පරිපාලනය ඇතුළුව බැංකු ක්ෂේත්‍රයේ වසර 23කට ආසන්න පළපුරුද්ද ඇත. ජාත්‍යන්තර ප්‍රේෂණ ව්‍යාපාරය සහ ප්‍රේෂණ පද්ධති මෙන්ම ප්‍රධාන බැංකුකරණ පද්ධති තුළ දශක දෙකකට වැඩි විශේෂඥතාව සමඟ, ඇය බැංකුවේ අක්වෙරළ ගනුදෙනුකාර අංශයට සේවය කිරීමේදී අත්‍යවශ්‍ය වී ඇත.

ලියනගුණවර්ධන මහත්මිය ඉන්දියාවේ ඔස්මේනියා විශ්ව විද්‍යාලයෙන් පළමු පෙළ සමාර්ථයක් සහිත විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇති අතර, ශ්‍රී ලංකාවේ කැලණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධිය සහ UK හි නොදර්ම්ප්ටන් විශ්ව විද්‍යාලයේ විශිෂ්ට සමාර්ථයක් සහිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. එමෙන්ම ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

වෘත්තීමය වගකීම්වලින් ඔබ්බට, ලියනණවර්ධන මහත්මිය ශ්‍රී ලංකා වෘත්තිකයින්ගේ සංගම් සංවිධානය (OPA) සහ වෘත්තීමය බැංකුකරුවන්ගේ සංගමය (APB) ඇතුළුව විවිධ මෙහෙයුම් කමිටු සහ වෘත්තීමය සංවිධානවල ඇයගේ සහභාගිත්වය තුළින් බැංකුව සහ බැංකු ක්ෂේත්‍රයට සක්‍රියව දායක වේ.

18

ටී ජී එස් පී කුමාරසිරි මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – බැංකු සහය සේවා

ටී ජී එස් පී කුමාරසිරි මහතා දැනට බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - බැංකු සහය සේවා ලෙස කටයුතු කරයි. මෙම කාර්යභාරයට පෙර, 2017 සිට අලෙවිකරණය, ක්‍රියාවලි කළමනාකරණය, සහ තත්ත්ව සහතිකය, කාඩ් මධ්‍යස්ථානය, සහ අයකිරීම් වැනි ක්ෂේත්‍ර අධීක්ෂණය කරමින් 2017 සිට සහකාර සාමාන්‍යාධිකාරිවරයෙක් ලෙස සේවය කර ඇත. ඔහු 2020 සිට සහකාර සාමාන්‍යාධිකාරී - බැංකු සහය සේවා ලෙස නඩත්තු ඉංජිනේරුකරණය, සැපයීම්, ආරක්ෂාව, ප්‍රවාහනය, සහ මුද්‍රණ සේවා දෙපාර්තමේන්තුව කළමනාකරණය කරන ලදී.

ටී ජී එස් පී කුමාරසිරි මහතා 1994 වසරේ බැංකුවේ කළමනාකරණ අභ්‍යාසලාභියෙක් ලෙස ඔහුගේ වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, සහකාර සාමාන්‍යාධිකාරී ලෙස ඔහුගේ පත්වීමට පෙර, ඔහුට ශාඛා කළමනාකරු, සහකාර ප්‍රාදේශීය කළමනාකරු, සහ ප්‍රාදේශීය කළමනාකරු, ඇතුළුව විවිධ කළමනාකාරිත්ව කාර්යභාරයන් දරමින් වසර 30කට වැඩි පළපුරුද්ද ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් BSc (පළමු පෙළ) සාමාර්ථයක් සහිතව උපාධිය ලබාගෙන ඇති අතර, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයෙන් MBA උපාධිය ලබාගෙන ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

19

සධානා පෙරේරා මහත්මිය

වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ආයතනික බැංකුකරණය

සධානා පෙරේරා මහත්මිය මහජන බැංකුවේ වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ආයතනික බැංකුකරණ ලෙස කටයුතු කරයි. වසර 23කට වැඩි වෘත්තීය පළපුරුද්දෙ ඇය සතුය. 2002 වසරේ බැංකුවේ කළමනාකරණ අභ්‍යාසලාභිනියක ලෙස බැංකුව හා එක්වූ ඇය ශාඛා මෙහෙයුම්, ජාත්‍යන්තර වෙළෙඳාම, අක්වෙරළ බැංකුකරණය, සහ ප්‍රධාන ආයතනික සේවාදායකයින් සහ රජයට අයත් ව්‍යවසායවල කළමනාකරණ සම්බන්ධතා ඇතුළුව ප්‍රධාන බැංකු ක්ෂේත්‍රයේ විස්තීර්ණ පළපුරුද්ද සංවර්ධනය කරගෙන ඇත.

ඇයගේ වෘත්තීමය ජීවිතය තුළ, පෙරේරා මහත්මිය විශේෂයෙන් ආයතනික සහ ජාත්‍යන්තර බැංකු අංශයන් හී බැංකුවේ සාර්ථකත්වයට ඇය ඉවහල් වී ඇත. ආයතනික බැංකුකරණය, වාණිජ බැංකුකරණය, සහ අක්වෙරළ බැංකුකරණය ඇතුළුව විවිධ ව්‍යාපාර අංශ හරහා ආයතනික සේවාදායකයින් 60කට වැඩි කළඹක් ඇය කළමනාකරණය කර ඇත.

මහජන බැංකුව හ එක්වීමට පෙර, පෙරේරා මහත්මිය ඇඟලුම්, නිෂ්පාදනය, විනෝදය, සහ තොරතුරු තාක්ෂණය ඇතුළුව විවිධ ව්‍යාපාර අංශයන්හී වටිනා පළපුරුද්ද ලබාගෙන ඇති අතර, එහි දී ඇය විධායක තනතුරු දරා ඇත. මෙම විවිධාකර වූ පසුබිම ඇයගේ සම්පූර්ණ හා ගැලපෙන නිපුනත්වන්ට දායක වී ඇති අතර, සංකීර්ණ බැංකුකරණ මෙහෙයුම් කළමනාකරණය කිරීමට ඇයගේ හැකියාව වැඩි කිරීමට සහ ආයතනික සේවාදායකයින් සමඟ ශක්තිමත් සම්බන්ධතා පෝෂණය කිරීමට දායක වී ඇත.

පෙරේරා මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇති අතර, එහිදී ඇය දෙවන පන්තියේ ඉහළ පෙළ සමාර්ථයන් සමඟ උපාධිය ලබාගෙන ඇත. ඇය එක්සත් රාජධානියේ කාර්ඩිප් මෙට්ට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් කුසලතා සමාර්ථයක් සමඟ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබාගෙන ඇත. ඊට අමතරව, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත යාවජීව සාමාජිකාවක් මෙන්ම වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ ද සාමාජිකාවකි.

වර්තමානයේ මූල්‍ය අංශය තුළ ඇයගේ නායකත්ව ආභාෂය තවදුරටත් පුළුල් කරමින් පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ ලෙස ඇය සේවය කරයි.

විධායක කළමනාකරණය

17
19
21
23
25
27
29
31
1
3
5
7
9
11
13
15

01
ජේ ඒ ඩයස් මයා
කාඩ්පත් ප්‍රධානි

02
කේ ජී පී එම් කාරියවසම් මයා
ප්‍රධාන ඩිජිටල් නිලධාරි

03
ආර් රවිකරන් මයා
සහකාර සාමාන්‍යාධිකාරී – ශාඛා කටයුතු කළමනාකරණය

04
එල් යූ එල් කේ අල්විස් මයා
සහකාර සාමාන්‍යාධිකාරී –
ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව සහතිකය

05
එන් ඒ වී මුණසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරී – වාණිජ බැංකුකරණය

06
ඩබ් එන් ටී පෙරේරා මයා
සහකාර සාමාන්‍යාධිකාරී – පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය
(වත්කම් නිෂ්පාදන)

07
වයි කේ රාජපක්ෂ මයා
ගොඩනැගිලි ඉංජිනේරු සේවා ප්‍රධානී

08
ටී එන් රූබසිංහ මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරි

09
එස් ඩී එන් ප්‍රේමදාස මිය
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරි

10
ඒ එස් කේ ගඟබඩගේ මයා
සහකාර සාමාන්‍යාධිකාරී – අභ්‍යන්තර විගණන

11
අයි කේ ජී සී කේ බී ඉහළකෝරාල මයා
සහකාර සාමාන්‍යාධිකාරී – සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය

12
අයි කේ ඉන්දික මයා
සහකාර සාමාන්‍යාධිකාරී – ශාඛා කටයුතු කළමනාකරණය

13
අයි රත්නායක මිය
සහකාර සාමාන්‍යාධිකාරී – උපායමාර්ගික සැලසුම්කරණය,
කාර්යසාධන කළමනාකරණය සහ පර්යේෂණ

14
ඒ ජී ජයසේන මිය
සහකාර සාමාන්‍යාධිකාරී – මූල්‍ය

15
සී වී එබනිසර් මිය
සහකාර සාමාන්‍යාධිකාරී – භාණ්ඩාගාර

16
ඩබ් ඩබ් ටී ආර් ප්‍රනාන්දු මිය
සහකාර සාමාන්‍යාධිකාරී – ආයෝජන බැංකුකරණය

17
ජී එච් යූ එස් ගුණරත්න මයා
සහකාර සාමාන්‍යාධිකාරී – මානව සම්පත් සංවර්ධනය

18
ඩී එම් ඩී දිසානායක මයා
සහකාර සාමාන්‍යාධිකාරී – විමසීම් හා විමර්ශණ

19
ජී ඒ පී ආර් එස් පෙරේරා මයා
සහකාර සාමාන්‍යාධිකාරී –
ආයතනික බැංකුකරණ සම්බන්ධතා – I

20
එල් එන් තේනුවර මයා
ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරි

21
ඊ ජී ඒ සිසිර කුමාර මයා
සහකාර සාමාන්‍යාධිකාරී –
මාර්ග කළමනාකරණ දෙපාර්තමේන්තුව

22
එස් එච් විජේකෝන් මිය
සහකාර සාමාන්‍යාධිකාරී – අධ්‍යක්ෂ මණ්ඩලයට ලේකම්

23
එම් ජී අයි ලක්මාල් මයා
ව්‍යාපාති කළමනාකරණ කාර්යාලයේ ප්‍රධානී

24
බී එස් රණතුංගගේ මයා
සහකාර සාමාන්‍යාධිකාරී – අක්වෙරළ ගනුදෙනුකාර සේවා

25
ජී ඒ ඒ රණසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරී – මානව සම්පත්

26
ඒ එම් වී ඩී එල් අදිකාරි මිය
සහකාර සාමාන්‍යාධිකාරී – ආයතනික බැංකුකරණය –
සම්බන්ධතා – II

27
එම් එස් කනකහේවගේ මයා
සහකාර සාමාන්‍යාධිකාරී – බැංකු සහය සේවා

28
එල් එන් ඒ එන් කේ නිශ්ශංක මෙනවිය
සහකාර සාමාන්‍යාධිකාරී – සංවර්ධනය හා ක්ෂුද්‍ර මූල්‍ය

29
එන් කේ විමලසිරි මයා
සහකාර සාමාන්‍යාධිකාරී – කලාප ණය 2

30
එස් එල් එම් ඒ එස් සමරතුංග මයා
සහකාර සාමාන්‍යාධිකාරී – අයකිරීම්

31
ඩී එම් කපිල මයා
සහකාර සාමාන්‍යාධිකාරී –
ව්‍යාපාර ප්‍රතිසාධන හා පුනරුත්ථාපනය

32
ඩබ් ඩී පී ඩී බුද්ධිකා මිය
සහකාර සාමාන්‍යාධිකාරී – කලාප ණය 1

ප්‍රධාන කළමනාකරුවන්

කේ සුහසිංහ මිය

ප්‍රධාන කළමනාකරු
ආයතන සහ ආයතනික
බැංකු අංශය

ඒ ජයාසිත් මයා

ප්‍රාදේශීය කළමනාකරු
ත්‍රිකුණාමාලය ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

එම් එස් සි පී ටී මාරසිංහ මයා

ප්‍රධාන කළමනාකරු
පුද්ගලික බැංකුකරණ
දෙපාර්තමේන්තුව

වයි කේ අතාවුද මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

පී ආර් කේ එන් ප්‍රනාන්දු මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
නීති දෙපාර්තමේන්තුව

එස් එම් ඩී කුමාරි මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
අනුරාධපුරය ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

වී පී අබේරත්න මිය

ප්‍රධාන කළමනාකරු
ආයතනික සහ
ආයතනික බැංකු අංශය

එච් සී කේ ගුණවර්ධන මයා

ප්‍රධාන නඩත්තු ඉංජිනේරු සේවා
නඩත්තු දෙපාර්තමේන්තුව

ජී ආර් එස් කෝදාගොඩ මයා

ප්‍රාදේශීය කළමනාකරු
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

වී ජී කනගසබෙයි මෙනවිය

ප්‍රාදේශීය කළමනාකරු
වන්නි ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

එන් ශ්‍රීස්කාන්ත මයා

ප්‍රධාන කළමනාකරු
මධ්‍යගත පසුපෙල කාර්යාල
දෙපාර්තමේන්තුව

ආර් එල් පේ පීරිස් මයා

ප්‍රාදේශීය කළමනාකරු
කුරුණෑගල ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

කේ කොඩිස්වරන් මයා

ප්‍රාදේශීය කළමනාකරු
මඩකලපුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

එච් එම් යූ එච් හේරත් මයා

ප්‍රාදේශීය කළමනාකරු
රත්නපුර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

ඩී ඊ එච් විරසූරිය මිය

ප්‍රධාන වෙළෙඳ
භාණ්ඩාගාර ඒකකය

ඒ ඩී ආර් මෙන්ඩිස් මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
ආයතන හා ආයතනික බැංකු අංශය

ඩී එස් ලෝරන්ස් මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
කොළඹ උතුර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

ජේ ජයවර්ධන මයා

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
කොළඹ බටහිර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

වී කේ සුභසිංහ මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
නීති දෙපාර්තමේන්තුව

කේ ඒ ඒ එස් පීරිස් මිය

ප්‍රාදේශීය කළමනාකරු
පොලොන්නරුව ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

එල් පී එන් ගුණවර්ධන මිය

ප්‍රාදේශීය කළමනාකරු
මාතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

ඩී එස් පී එන් රත්නායක මයා

ප්‍රධාන කළමනාකරු
මාර්ග කළමනාකරණ
දෙපාර්තමේන්තුව

පී ජී එන් පී ලියනගේ මිය

ප්‍රාදේශීය කළමනාකරු කොළඹ
නැගෙනහිර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

ඒ එම් එම් එස් එම් රුවයිස් මයා

ප්‍රධාන කළමනාකරු සේවක
සුභසාධන හා සේවක ණය
දෙපාර්තමේන්තුව

එම් වී පී පීරිස් මිය

ප්‍රධාන කළමනාකරු
පිපල්ස් කාඩ් මධ්‍යස්ථානය

ජී ඩී එන් එල් පොත්හේවෙල මයා

ප්‍රාදේශීය කළමනාකරු
මහනුවර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

ඒ ධනවලවිතාන මයා

ප්‍රාදේශීය කළමනාකරු
අනුරාධපුර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

එස් එම් ඒ ආර් සේනානායක මයා

ප්‍රධාන කළමනාකරු
සේවක සුභසාධන හා
සේවක ණය දෙපාර්තමේන්තුව

ආර් එම් එන් පී ගුණතිලක මයා

ප්‍රධාන කළමනාකරු
ක්‍රියාවලි කළමනාකරණය හා
තත්ත්ව සහතික දෙපාර්තමේන්තුව

එච් ජී එන් ආරෝහන මයා

ප්‍රාදේශීය කළමනාකරු කොළඹ
බටහිර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

එම් එම් ඒ අමරසිරි මිය

ප්‍රාදේශීය කළමනාකරු
මොනරාගල ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

එම් වී ඩී පෙරේරා මිය

ප්‍රධාන කළමනාකරු
අවදානම් කළමනාකරණය සහ
ණය පාලන දෙපාර්තමේන්තුව

කේ චන්ද්‍රකුමාර් මයා

ප්‍රාදේශීය කළමනාකරු
මාතලේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

එස් එම් ඩී නන්දනී මිය

ප්‍රධාන කළමනාකරු
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

එම් ජී සී කේ සිරිවිර මිය

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

එස් ඒ එම් ඒ සූරියප්පෙරුම මිය

ප්‍රාදේශීය කළමනාකරු
කලුතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

යූ පී ඒ ඩී ආර් කරුණානායක මයා

දෙපාර්තමේන්තුව
පුත්තලම ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

ඩබ් ඒ පී එස් රත්නසිරි මිය

ප්‍රාදේශීය කළමනාකරු
බදුල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

යූ ජී ටී එස් බී තෙන්නකෝන් මයා

ප්‍රධාන කළමනාකරු
අවදානම් කළමනාකරණය සහ
ණය පාලන දෙපාර්තමේන්තුව

එන් අරුද්දසෙල්වන් මයා

ප්‍රධාන කළමනාකරු
අක්වෙරළ ගනුදෙනුකාර සේවා

ඒ ඒ එස් සෙනෙවිරත්න මයා

ප්‍රධාන කළමනාකරු
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

ඩී එම් ටී එස් දිසානායක මිය

ප්‍රධාන කළමනාකරු
ආයතන සහ ආයතනික බැංකු අංශය

ආර් එච් සමරවික්‍රම මිය

ප්‍රධාන කළමනාකරු
G.M.'s දෙපාර්තමේන්තුව

ඩබ් එම් ඒ සංජීවනී මිය

ප්‍රාදේශීය කළමනාකරු
කොළඹ නැගෙනහිර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලයග

ඩී සී ඉඳුරුවෙ මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
කොළඹ දකුණ ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

ආර් ඒ එස් දසනායක මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
නීති දෙපාර්තමේන්තුව

එස් ඒ ඩබ් සමරවීර මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
අනුකූලතා දෙපාර්තමේන්තුව

එන් වයි ප්‍රනාන්දු මිය

සහකාර ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

එස් ඩී ජයසිංහ මයා

නියෝජ්‍ය ප්‍රධාන මූල්‍ය නිලධාරී
මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණ
දෙපාර්තමේන්තුව

එච් පී කේ එස් ගුණවර්ධන මිය

නියෝජ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්,
සභාපතිගේ කාර්යාලය සහ
ලේකම් දෙපාර්තමේන්තුව

ටී සුදාගර් මයා

ප්‍රධාන කළමනාකරු
ආයතනික සහ
ආයතනික බැංකු අංශය

එම් එම් ඒ පී රත්නායක මයා

ප්‍රධාන කළමනාකරු
සේවක සුභසාධන හා
සේවක ණය දෙපාර්තමේන්තුව

පේ ඩී ආර් ගුණතිලක මයා

ප්‍රාදේශීය කළමනාකරු
කෑගල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

ඩී ඩී කේ හෙට්ටිආරච්චි මිය

ප්‍රධාන කළමනාකරු
මානව සම්පත් දෙපාර්තමේන්තුව

ඩබ් කේ එස් කුමාරසිංහ මයා

ප්‍රාදේශීය කළමනාකරු
ගාල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

කේ ඒ එම් එන් පෙරේරා මිය

ප්‍රාදේශීය කළමනාකරු
නුවරඑළිය ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

එස් ඩී ඩබ් රාජපක්ෂ මිය

ප්‍රධාන කළමනාකරු
අවදානම් කළමනාකරණය සහ ණය
පාලන දෙපාර්තමේන්තුව

සී සිවනන්දවෙල් මිය

ප්‍රධාන කළමනාකරු
විමර්ෂණ සහ
විමසීම් දෙපාර්තමේන්තුව

එම් මතියලගන් මයා

ප්‍රාදේශීය කළමනාකරු
යාපනය ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

එච් අබේවික්‍රම මිය

ප්‍රාදේශීය කළමනාකරු
කොළඹ දකුණ ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය

කේ සී එස් පෙරේරා මිය

ප්‍රධාන කළමනාකරු
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය
දෙපාර්තමේන්තුව

ඩබ් එම් ඩී ගංගා මිය

ප්‍රධාන කළමනාකරු
වැටුප් හා විශ්‍රාම වැටුප්
දෙපාර්තමේන්තුව

එම් ඒ එන් එන් ප්‍රීතිකුමාරි මිය

ප්‍රධාන කළමනාකරු
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

ඩබ් ජී අයි පී සී කොස්ගොල්ලවත්ත මයා

ප්‍රධාන කළමනාකරු
භාණ්ඩාගාර ඒකකය

යූ එම් ද සිල්වා මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

ඒ ඩී ආර් ප්‍රියන්ත මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

ඊ ඒ වී වර්ණකුල මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

එස් ඊ වික්‍රමරත්න මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

කේ එස් පේ කොඩිප්පිලි මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

එස් කාරියවසම් මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

වටිනාකම් නිර්මාණය මෙහෙයවීම

47
මෙහෙයුම් පරිසරය

50
පාර්ශ්වකාර සහභාගීත්වය

55
ප්‍රමාණාත්මතාව

64
උපාය මාර්ගය

70
අපගේ වටිනාකම් නිර්මාණ ආදර්ශය

72
තිරසාරභාවය කෙරෙහි අපගේ බැඳීම

80
එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන (UN SDGs) අරමුණුවලට අපගේ බැඳීම

මෙහෙයුම් පරිසරය

ගෝලීය ආර්ථිකය - අභියෝගවලට මුහුණ දීමේදී ඔරොත්තුදීම

කොවිඩ්-19 වසංගතය, වැඩිවන භූදේශපාලනික අර්බුද සහ වෙළෙඳාමට බාධාකළ අතීශය සහ අහිතකර කාලගුණ විපර්යාස සිදුවීම් මගින් ඇති කළ පෙර නොවූ විරූ බාධාකිරීම් මගින් ගෝලීය ආර්ථිකයට පහර වැදුන අතර, උද්ධමනය දැඩි ලෙස ඉහළයාමට මඟ පාදන ලදී. ලෝක ආර්ථික සංසදයේ සංඛ්‍ය ලේඛණ අනුව, ගෝලීය සහයෝගීතාවයෙන් 91% ක් භූ දේශපාලනික ආතතීන්ගෙන් සහ 83% ක් දේශීය දේශපාලන ආතතීන්ගෙන් පීඩාවට පත්ව ඇත. අභියෝග හමුවේ, ගෝලීය ආර්ථිකය 2024 සඳහා 3.2%ක වර්ධනයක් සහ 2025 සඳහා 3.3% වර්ධනයක් පුරෝකතනය කරමින් ස්ථීරව සහ ප්‍රත්‍යස්ථව පැවතුණි. වසර හතරක අඛණ්ඩ ඉහළ ගිය උද්ධමනයකින් පසු ශීර්ෂ උද්ධමනය 2024 දී 4.2% දක්වා පහත වැටෙනු ඇති බවට පුරෝකථනය කෙරේ. මෙය මහ බැංකුවලට ලොව පුරා ආර්ථික වතාවරණය තුළ මූල්‍ය පාලනය දැඩි කිරීමට හේතු වූ අතර, සැපයුම් දාම බිඳවැටීම්වල ඉක්මන් නොවූ සැහැල්ලුවීමක් දක්නට විය. OECD රටවල උද්ධමනය 2024 දී 5.4%කින් හා 2025 දී 3.8%කින් ලිහිල් කිරීමට අපේක්ෂා කිරීමත් සමඟ ගෝලීය ආර්ථිකය සඳහා පරීක්ෂාකාරී සහගත සර්වශුභවාදී ආකල්පයක් පවති.

ඉන්දියාව 2024 දී දළ දේශීය නිෂ්පාදිතයේ පුරෝකතනය කළ 6.5%ක ප්‍රසාරණය ආරක්ෂා කර ගනිමින් ආර්ථික වර්ධනය සඳහා ප්‍රාවරණය දරන අතර, එය 2025 දී තවදුරටත් 0.3%කින් වර්ධනය කිරීමට පුරෝකතනය කෙරේ. ඉන්දියාවට පසුව ඉන්දුනීසියාව, චීනය සහ තුර්කිය සිටින අතර, දියුණු ආර්ථිකයන් 2024 දී අඩු වර්ධනයක් පමණක් අපේක්ෂා කලහැකි තත්වයක් පෙන්නුම් කරයි. උසස් ආර්ථිකයන් සමස්ත වශයෙන් 1.7%කින් වර්ධනය වූ අතර ඇමෙරිකාව ආර්ථිකයේ ශක්තිමත්ම ප්‍රසාරණය පෙන්වූ අතර 2024 දී, යුරෝපයේ ආර්ථික වර්ධනය ඉහළ යාම සීමිත/මන්දගාමී වුවද ඊට ප්‍රතිවිරුද්ධව ජපානයේ ආර්ථික වර්ධනය සාමාන්‍ය/මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. වැටුප් නැවත ඉහළ යාමේ සංඥා පෙන්වුවද, ජපානය ස්වයං නිෂ්පාදන පිරියත වසාදැමීම, පරිභෝජනයේ ආර්ථික ප්‍රතිසාධනය, අඩු පාරිභෝගික විශ්වාස නිසා ආර්ථිකය අවහිරයට ලක් විය. 2024 දී චීනය 4.9%ක වර්ධනයක් පෙන්නුම් කළේය. ඇමෙරිකන් ආර්ථිකය පළමු කාර්තු දෙකෙහි ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කළ අතර වසර අවසානය වන විට එහි වේගය අඩු විය.



ලෝක ආර්ථික දැක්ම - IMF ජනවාරි 2025

අහාර පිරිවැය, අත්‍යවශ්‍ය අයිතම සහ සේවා ක්ෂේත්‍රයේ බදු ඉතා අධිකව පවත්නා බැවින් වර්තමාන ආර්ථික වාතාවරණයට ආක්‍රමණශීලී නියාමනය අවශ්‍ය වේ, කෙසේවෙතත්, මූල්‍ය වෙළෙඳපොල උච්ඡාවචනය, වෙළෙඳ භාණ්ඩ මිල ඉහළයාම් සහ උසස් ආර්ථිකයන් අතර වෙළෙඳ යුද්ධවල සියුම් නමුත් ස්පන්දන තරඟය පුරෝකතනය කළ පහසුව පිළිබඳ ප්‍රක්ෂේපනයන්ගෙන් ගෝලීය ආර්ථිකය අස්ථාවර කිරීමට විභවතාව ඇත. සංකීර්ණ සහ බහුවිධ සාධක මගින් අන්තර් සම්බන්ධිත සහ බලපෑමට ලක් වූ ගෝලීය ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ජාතීන් අතර මහ බැංකු විසින් ක්‍රියාත්මක කරන මුදල්වල සහ මූල්‍ය ප්‍රතිපත්තිවල ශක්තිය මත ප්‍රධාන වශයෙන් රඳා පවතී.

හරිත ආර්ථිකය කරා විතැන්වීම ඩිජිටල්කරණයේ සම්පූර්ණ හැකියාව භාවිතා කිරීම සහ උද්ධමනය මැඩ පැවැත්වීමට පොලී අනුපාත ගැලපීම ආර්ථික ස්ථායිතාව සහතික කිරීමට ජාතීන් විසින් දැනට සංවර්ධනය කළ උපායමාර්ග කිහිපයකි.



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකා ආර්ථිකය - වර්ධන ගමන්මඟක

තීරණාත්මක ව්‍යුහමය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවලින් පසු 2023 අවසාන කාර්තුවේ සිට 2024 වසර අවසානය දක්වා, ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයක් දක්නට ලැබුණි. කෙසේවෙතත් මෙය සාර්ථකණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව තිරසාර ව්‍යුහගත ප්‍රතිසංස්කරණ බිඳෙනසුළු සම්බන්ධයක් මත පවතී. සමස්ථයක් වශයෙන්, 2024 දී වසර පුරා නිරුද්ධමනය පෙන්වීමත් සමඟ 5%ක ආර්ථික වර්ධනයක් පෙන්නුම් කළේය. සංචාරකයින් ලඟාවීමේ තියුණු වැඩිවීම, ආහාරපාන නිෂ්පාදනය රඳා පැවැත්ම, සහ ඉදිකිරීම ක්ෂේත්‍රයේ උදාසීන නමුත් සහතික ප්‍රතිසාධනය තුළින් සමාන වර්ධනයන් 2025 වසරේදී යෝජනා කෙරේ.

2024 දෙවැනි කාර්තුවේදී, අංශයට විශේෂිත වර්ධන අනුපාත දිරිමත් මට්ටමක විය. කර්මාන්ත 10.9%කින්, කෘෂිකර්මය 1.7%කින්, සහ සේවා අංශය 2.5%කින් වර්ධනය වාර්තා කළ අතර ශ්‍රී ලංකා මහ බැංකුව 2024 සහ 2025 සඳහා 5%ක වාර්ෂික ද.දේ.නි. වර්ධනයක් යෝජනා කර ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා රේගුව

ගෙවුම් ශේෂය

ගෙවුම් ශේෂ තත්ත්වය ශක්තිමත් වූ අතර, ජංගම ගිණුම 2024 දී අතිරික්තයක් වාර්තා කළේය. දළ නිල සංචිත 2023 අවසානයේදී පැවති ඇ.ඩොලර් බිලියන 4.4 සිට 2024 අවසානයට ඇ.ඩොලර් බිලියන 6.1ට ආසන්නව වැඩි වී ඇත. විදේශ විනිමය ගලාඒම වැඩිවීම මගින් ඇ.ඩොලරයට සාපේක්ෂව රුපියල ශක්තිමත් විය. ආර්ථික අර්බුදයේ බලපෑම් තවදුරටත් පැතිරව පවත්නා බැවින් මූල්‍ය පද්ධතිය ඔරොත්තු දෙන පරිදි පැවතුණි.

ආනයන අපනයන ආදායම් ඉක්මවන බැවින්, ශ්‍රී ලංකාවේ වෙළෙඳ හිඟය 2023 දී ඇ.ඩොලර් බිලියන 4.9 සිට 2024 දී ඇ.ඩොලර් බිලියන 6.01 දක්වා වැඩි විය. මෙය මූලික වශයෙන් 2023 සිට 53.2% ක වැඩිවීමක් වූ ඇ.ඩොලර් 3.2 දක්වා ඉහළගිය ශක්තිමත් සංචාරක කර්මාන්තයේ ඉපයීම් මගින් අර්ධ වශයෙන් හිලව් කරන ලදී.

උද්ධමනය

ඔරොත්තු දෙන බැංකු කර්මාන්තයක් ණය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ ද්‍රවශීලතාව තුළ වර්ධනයකට මුහුණපාන ලදි. වෙළෙඳපොල තුළ ඉල්ලුම වැඩිවීමේ සහ පොළී අනුපාත අඩුවීමේ වාතාවරණයක් තුළ මෙය වඩාත් පෙනෙන්නට තිබුණි. පුද්ගලිකව අයත් බැංකු උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් ආරම්භ කළ අතර, එය රුපියලේ දැඩිකළ ධ්‍රවශීලතාවයට බලපාන ලදී. ශුද්ධ පොළී අනුපාතය (NII) කොටස් වශයෙන් ඉහළ ගිය අතර එයට තැන්පතුවල අඩු පොළී අනුපාත සහ ණයදීම තුළ ඉහළ පොළී අනුපාත හේතු විය.

වසර තුළ පොළී වියදම් ක්ෂය වී ඇති බැවින් මූලික 1 වන ස්ථරයේ ප්‍රාග්ධන ලාභ නව මාවතක් විවර කර ඇති අතර, ආර්ථිකමය බිඳවැටීමක සංඥා නොමැතිවම යහපත් මූල්‍ය තත්ත්වයක් සහ වත්කම් වර්ධනය තුළ ශක්තිමත් ලාභ පෙන්නුම් කළේය,

ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය (අවදානම බර තබනලද වත්කම්වලින් 2.5%ට ඇණ හිටි) සහ දේශීයව ක්‍රමානුකූලව වැදගත් බැංකු වෙත අතිරික්ත නිකුතුව වැනි මූල්‍ය ස්වාරක්ෂක ශක්තිමත් වීම ආර්ථිකයේ ඔරොත්තුදීමක් ශක්තිමත් කිරීමට දායක විය. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සහ ආකූල ආර්ථිකය මහ බැංකු විසින් මනාව සංයුක්ත කර ඇති බැවින් බැංකු අංශය තුළ නැවුම් ප්‍රාග්ධනය රජයේ සුරැකුම්පත් අත්කර ගැනීමෙන් ඇතුළත් කරන ලද අතර, වත්කම් ප්‍රතිසාධනය සඳහා ණය තහවුරු කරමින් සහ ස්වාරක්ෂක ලබාදෙමින් අතිරේක ස්ථර 2 ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමට ණයකර හඳුන්වා දෙන ලදී.

මහ බැංකුව විසින් ක්‍රියාත්මක 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනතින් බැංකු ක්ෂේත්‍රයේ ඔරොත්තුදීම සහ අඛණ්ඩතාව වර්ධනය කරනු ලැබීය වී සඳහා ආරක්ෂාව පිළිබඳ අමතර ස්ථරයක්, යෝග්‍යතා පසුබිම මත මිණුම් ලකුණු සංවර්ධන, බලපත්‍රදීම, හිමිකාරත්වය, අධීක්ෂණය, විධිවිධාන, යෝග්‍යතාව සහ රෙගුලාසිය, අංශයට ඇතුළත්වීම සඳහා උසස් අවශ්‍යතා නිකුත් කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂ බැංකු සඳහා නෛතික සහ නියාමන රාමු ශක්තිමත් කිරීම, විදේශීය බැංකුවල පරිපාලිතකරණය ප්‍රවර්ධනය, සහ විගණන සහ බැංකු ප්‍රකාශනවල ප්‍රමිතිගතකරණ වර්ධනයන් තහවුරු කරන ලදී.

සමස්තයක් වශයෙන්, ණය ප්‍රසාරණය වාර්ෂිකව 4.7% දක්වා ලඟාවිමත් සමඟ බැංකුවේ යහපත් දර්ශකය 2024 හි 3 කාර්තුව තුළ වර්ධනය පෙන්වා ඇත. මේ සමඟම, මුළු ණය හා අත්තිකාරම්වල ප්‍රතිශතයක් ලෙස අදියර 3 ණය 12.6%ට අඩු වූ අතර, අදියර 3 වෙන්කිරීම ආවරණය අනුපාතය 52.3% දක්වා ඉහළ ගියේය. 2024 හි 3 කාර්තුව අවසානය වන විට, ක්ෂේත්‍රය සාමුහිකව රු. බිලියන 180.3ක බදු පසු ලාභයක් (PAT) සහ රු. බිලියන 616.4ක ශුද්ධ පොළී ආදායමක් වාර්තා කළේය. 2023ට සාපේක්ෂව, 2024 හි 3 කාර්තුව ස්කන්ධය මත ඉපයීම් (ROE) 12.5% දක්වාද, වත්කම් මත ඉපයීම් (ROA) 1.9% දක්වාද සහ ශුද්ධ පොළී ආන්තිකය (NIM) 4.0% දක්වාද වැඩිවීමක් පෙන්නුම් කළේය. (https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/fssr/fsr_2024e.pdf - page 19 pictogram)

සාරාංශ වශයෙන්, ක්ෂේත්‍රයට නව බැංකු ඇතුළත්වීම පාලනය කරන ශක්තිමත් ක්‍රියාමාර්ග පරිසරයක් තුළ අළුත්කළ විශ්වාසය සහ අපේක්ෂිත යාන්ත්‍රණය සමඟ බැංකු ක්ෂේත්‍රය සීමාවන් කරා ඉදිරියට ගොස් ඇත.

පාර්ශ්වකාර සහභාගිත්වය

අපි ප්‍රජාව කේන්ද්‍රීය කටයුතු රාශියක සහභාගිවන වාණිජ ආයතනයක් වන බැවින්, රජයට අයත් බැංකුවක් ලෙස, අපගේ පාර්ශ්වකාර සහභාගිත්ව ක්‍රියාවලිය, මහජන සුභසාධනය සහතික කිරීම කෙරෙහි මූලිකවම පදනම් වේ.

මෙම අන්තයෙන්, අපි පාර්ශ්වකාර අනුරූපන අභ්‍යාසයක් පවත්වන අතර, පාර්ශ්වකරුවන් එකිනෙකාගේ වෙනස්වන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි අපගේ මැදිහත්වීමේ උපායමාර්ග අපි සකස් කරමු.

කළමනාකරණ ප්‍රවේශය

නිර්ණායකයක් ලෙස අපගේ සේවකයින් කේන්ද්‍රීය විධානය සමඟ, ප්‍රධාන කුළුණු තුනක් මත පදනම් වී අපි අපගේ පාර්ශ්වකරුවන් හඳුනා ගනිමු.

බැංකුවේ අයිතිය, අරමුණු සහ ක්‍රියාකාරකම් විෂය පථය නියම කරනු ලබන මහජන බැංකු පනත	අඛණ්ඩ මෙහෙයුම් බලපත්‍ර සහතික කිරීම සඳහා නියාමන සහ අනුකූලතා අවශ්‍යතා	රාජ්‍ය බැංකුවක් ලෙස ශ්‍රී ලංකාවේ මහජනතාව වෙත බැංකුව යොදවන උපායමාර්ගික ව්‍යාපාරික අරමුණු

රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස, රු. ට්‍රිලියන 3.298ක මුළු වත්කම් පදනමක් සහ ශ්‍රී ලංකාවේ බොහෝ පළාත්වල ක්‍රියාත්මක වන ශාඛා 751ක් සමඟ, ජාතිය සහ සිය සේවකයින්ට වෙත බැංකුවේ අග්‍රගණ්‍ය සේවය වසර 63ක් දක්වා විහිදෙ යයි.

එමනිසාම, අපගේ ජාතියට වඩා යහපත් හෙට දවසක් සඳහා අප අඛණ්ඩව සිදුකරන සේවයට පාර්ශ්වකාර සහභාගිත්වය අත්‍යාවශ්‍ය වේ.

පාර්ශ්වකරුවන්ට ප්‍රමුඛත්වය දීම

GRI 2-29

පාර්ශ්වකරුවන්ගේ අභිමතය සහ ඔවුන්ගේ විවිධ අවශ්‍යතාවන් මත පදනම් වී, අපගේ බහු-ස්ථර පාර්ශ්වකාර කණ්ඩායම් සමඟ සහභාගි වීම සඳහා වඩාත් හොඳම සන්නිවේදන ආදර්ශය අපි සකස් කරමු. කෙසේවෙතත්, වියට පාදකවන මූලධර්මය වන්නේ ශක්තිමත් නියාමන අනුකූලතා රාමුවක් තුළ ඔවුන්ට කෙටි, මධ්‍ය සහ දිගුකාලීන වටිනාකම ලබාදීමයි.

යම් වාතාවරණයක් පරිකල්පනය කරන ක්‍රියාපටිපාටිමය සක්‍රිය මෙවලම් රාශියක් මගින් පාර්ශ්වකරුවන්ට ප්‍රමුඛත්වය දීම ක්‍රියාත්මක කෙරේ. එහිදී තිරසාර වටිනාකම් නිර්මාණය මත පාර්ශ්වකරුවන්ට ඇති අපේක්ෂාවන් ධනය නිර්මාණය කරන විකල්ප පුද්ගලගතකරණය මගින් මෙහෙයවනු ලබයි.

අප විවිධ තරාතිරමේ ගනුදෙනුකරුවන් සවිබලගන්වන අතර, එහිදී අත්සන සහිත ධනය නිර්මාණය කිරීමේ අවස්ථාවක් ලබා දීමෙන් සෑම පාර්ශ්වකරුවෙකුම උද්යෝගිමත් කර, පාර්ශ්වකරුවන්ගේ බලපෑමේ මට්ටම මත පදනම්ව මූල්‍ය භාරකාරත්වයේ මට්ටම් සහ ප්‍රමිතීන් සැකසනු ලබයි

බැංකුව පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීම සංවාදශීලී, සදාචාර සහ විනිවිදවීමට, දැවැන්ත බැංකුවලින් අපේක්ෂිත ව්‍යාපාර නිපුනතාව අලුත්කර ගැනීමට දිරිමත් කරයි. දේශීයව ක්‍රමානුකූල වැදගත් බැංකුවක් ලෙස අවසරයත් සමඟ වර්ධිත මූල්‍ය යහපත පිළිබිඹු කරන සහ අපගේ සන්නාම වටිනාකම ශක්තිමත් කරන තිරසාර සහ සදාචාර ව්‍යවහාර මත අපගේ ව්‍යාපාර සම්මත මත පදනම් වී අපි අවංකකමේ ඉහළම ප්‍රමිතිය ක්‍රියාවේ යොදවමු.



පාර්ශ්වකරුවන්ගේ කාණ්ඩ	ප්‍රමුඛතාව	සහභාගීත්වයේ අරමුණ	වාරගණන	අර්ථවත්ව සහභාගිවීමේ ක්‍රම	උපායමාර්ගික ප්‍රතිඵල/ලබාදුන් වටිනාකම
රජය, ප්‍රාථමික කොටස් හිමියාට (මුදල් අමාත්‍යාංශය) නිකුත්කළ කොටස්, ප්‍රාග්ධනයෙන් කොටස් වලින් 92.27% ක් හිමිවේ GRI 207-3	ඉහළ	රජයේ සංවර්ධන සහ දරිද්‍රතාවය පිටුදැකීමේ ප්‍රතිපත්තිවලට සහාය වීම සඳහා බැංකු උපාය මාර්ග/ ක්‍රියාකාරකම් පෙළගැසීම. බැංකුවේ ප්‍රගතිය/තත්ත්වය මුදල් අමාත්‍යාංශයට සන්නිවේදනය කිරීම. බදු සහ අයකිරීම් කාලීන හා නිවැරදි ආකාරයෙන් ගෙවන බව සහතික කිරීම. රජය/බැංකුව තුළ පොදු ආයෝජන සුරක්ෂිත කිරීම.	අවශ්‍ය විට හා පරිදි මුදල් අමාත්‍යාංශය හමුවීම සහ සන්නිවේදනය	මාධ්‍යයක් ලෙස ක්‍රියා කරමින් රජයේ දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන්වලට සහාය වීම: - ක්ෂුද්‍ර සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා රජයෙන් සහනදායී ණය ලබා දීම - විශ්‍රාම වැටුප් සහ රජයේ සේවක වැටුප් ලබා දීම - රජයට සහ රජයට අයත් ආයතනවලට ණය පහසුකම් බැංකුවේ ව්‍යාපාරවල සමාලෝචන සහ ප්‍රගති නියාමනය සඳහා විගණනය කරන ලද මූල්‍ය සහ වාර්ෂික වාර්තාවේ පිටපත් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.	**නියාමන දණ්ඩන නොමැත** **බදු පසු ලාභය –** රු. බිලියන 25.1 **රජයට මුළු දායකත්වය (බදු සහ වෙනත් අයකිරීම්) –** රු. බිලියන 33.4 **ස්කන්ධය මත ඉපයීම්** 14.67% **කොටසක ඉපයීම් –** රු. 25,088 **ශුද්ධ වත්කම් වටිනාකම –** රු. 181,998 **සේවා නියුක්තිය –** 7,633
වෙනත් පාර්ශ්වකාර සමුපකාර සංගම්වලට නිකුත්කළ කොටස් ප්‍රාග්ධනයෙන් කොටස් වලින් 7.73%ක් හිමිවේ	ඉහළ	මහජන බැංකු පනතට අනුව බැංකුව සමුපකාර අංශයේ දියුණුවට සහාය විය යුතුය. එමනිසා, බැංකුව සිය බැඳීම් ඉටුකිරීමට සහ සමුපාකාර අංශය අතර බැංකුවේ වෙළෙඳපොල කොටස ආරක්ෂා කර ගැනීමට මෙම අංශය සමඟ සහභාගි වේ.	සමුපකාර නියෝජිතයන් සමග අවශ්‍ය පරිදි	අවශ්‍ය අවස්ථාවල මූල්‍යකරණ ක්ෂේත්‍ර සහ උපදෙස් ලබාදීම තුළ බැංකුවේ SME සහ මයික්‍රෝ මූල්‍ය සංවර්ධනයන් හරහා සමුපාකාර අංශයට සහයවීම. අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජිත සමඟ සන්නිවේදනය සහ බැංකුවේ සියලුම අංග සහ මෙම අංශයට සහයවීම තුළ සිය කාර්යභාරය යාවත් කිරීම.	
නියාමක: ශ්‍රී ලංකා මහ බැංකුව	ඉහළ	සියලුම රෙගුලාසි සහ විධාන සමඟ පූර්ණ අනුකූල වීම සහතිකවීම්. SMEs සහ MSMEs සහන අරමුදල් ලබාදීම. සන්නාම වටිනාකම සුරක්ෂිත කිරීම සහ කීර්තිනාම අවදානම කළමනාකරණය කිරීම.	කලින්කල සහ අවශ්‍ය පරිදි	සියලුම ව්‍යවස්ථාපිත වාර්තා නියමිත වේලාවට ඉදිරිපත් කිරීමෙන් සහ අඛණ්ඩ සංවාද පැවැත්වීමෙන් බැංකුව, මහ බැංකුව සහ අනෙකුත් නියාමකයින් සමඟ සම්බන්ධ විය. වාර්ෂික මහ බැංකු විගණනය. සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට සිදු කරන ලදී. තිරසාර කාර්ය සාධනය සහතික කිරීම.	මහ බැංකුව විසින් දණ්ඩන පනවා නොමැත. මහ බැංකුව විසින් නිකුත් කළ නව උපදෙස් සහ රෙගුලාසි ඵලදායීව ක්‍රියාත්මක කිරීම.

පාර්ශ්වකරුවන්ගේ කාණ්ඩ	ප්‍රමුඛතාව	සහභාගිත්වයේ අරමුණ	වාරගණන	අර්ථවත්ව සහභාගිවීමේ ක්‍රම	උපායමාර්ගික ප්‍රතිඵල/ලබාදුන් වටිනාකම
ගනුදෙනුකරුවන්: රාජ්‍ය ආයතන සමූපාකාර SMEs ව්‍යවසායකයින් පුද්ගලයින් සහ සංක්‍රමණික කම්කරුවන්	ඉහළ	විවිධ වර්ගයේ ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධවීමේ මූලික අරමුණ වන්නේ බැංකුවේ වෙළෙඳපොල කොටස පුළුල් කිරීම, තැන්පතු පුළුල් කිරීම සහ තිරසාර ආකාරයෙන් ලාභදායිතාව වැඩි කිරීම. කෙසේ වෙතත්, රජයේ බැංකුවක් ලෙස, මුදල් අවශ්‍ය දේශීය ව්‍යාපාර, ව්‍යවසායකයින්, පවුල් සහ පුද්ගලයන්ගේ සංවර්ධනයට සහාය වීමේ අමතර වගකීම මහජන බැංකුවට ඇත.	අඛණ්ඩව	විවිධ පාරිභෝගික කණ්ඩායම් සමඟ සම්බන්ධවීමට බැංකුවට වෙනම උපාය මාර්ග ඇත. බැංකුව ආයතනික ගනුදෙනුකාර පදනම වැඩි කිරීම ඉලක්ක කරමින් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළේය. පුද්ගලිකත්වය සහ සයිබර් ආරක්ෂාව සහතික කිරීම. පහසුව සහ ප්‍රවේශ්‍යතාව පවත්වා ගනිමින් උසස් සේවා ප්‍රමිතියක් තබාගනිමින් අර්ථවත් සබඳතා සහතික කිරීම. මූල්‍ය ස්ථාවරත්වය සහ අනුකූලතාවය සහතික කිරීම. පාරිභෝගික සෞඛ්‍ය සහ ආරක්ෂාව සහතික කිරීම.	බහු ස්ථර ගනුදෙනුකාර පදනමක විශාල වටිනාකම කොටස ග්‍රහනය කරමින් ඔවුන්ගේ මූල්‍ය සෞභාග්‍ය සහතික කිරීම හා ඒ තුළින් ජාතියේ ශක්තිමත් හා දිගුකාලීන සාර්ව ආර්ථික සංවර්ධනය සහතික කිරීම. **මුළු ගනුදෙනුකරුවන් ගණන –** මිලියන15.1 **සේවය කළ ගනුදෙනුකරුවන්** 51% ට වැඩි කාන්තාවන්ය **ඇතුළත් කළ නව ගනුදෙනුකරුවන් –** 640,220
සේවකයින්	ඉහළ	බැංකුවට සියලුම ජනවාර්ගික කණ්ඩායම් වලින් සමන්විත දිවයින පුරා විහිදුනු විශාල ශ්‍රම බලකායක් ඇත. මෙහි නියැලීමේ මූලික අරමුණ වන්නේ මෙම පුළුල්ව පැතිරී ඇති සහ විවිධ වූ ශ්‍රම බලකාය බැංකුවේ උපාය මාර්ගික දිශානතිය සමඟ පෙළ ගැසීමයි. සහභාගිත්වයේ වෙනත් අරමුණුවලට පහත දෑ ඇතුළත් වේ: සේවා ප්‍රමිතීන් පවත්වා ගැනීමෙන් කීර්තිනාම අවදානම් කළමනාකරණය කිරීම. ප්‍රතිපත්ති සහ සීමාවන් නිතිපතා සන්නිවේදනය කිරීම හරහා ණය සහ ද්‍රවශීලතා අවදානම ඇතුළු අනෙකුත් අවදානම් කළමනාකරණය කිරීම.	අඛණ්ඩව	අපගේ සේවකයින්ගේ කුසලතා වැඩි කිරීමේ පුනුණු වැඩසටහන් පැවැත්වීම, රැස්වීම් වෙනත් විවිධ සංසද පැවැත්වීම, ඇගයීම් පැවැත්වීම සහ විධිමත් මට්ටමේ සන්නිවේදන සඳහා ස්ථාන නිර්මාණය කිරීම, අපගේ පරිශ්‍රය තුළ ආරක්ෂක සහ යහපත් පියවර ගැනීම සහ සදාචාර කළමනාකරණ මූලධර්ම සහ පාලනය පිළිපදිමින් ආකාර කිහිපයකින් ඔවුන්ගේ යහපැවැත්ම අපි සහතික කරමු. දිරිගැන්වීම් සහ ප්‍රතිලාභ ලබා දීම, විනිවිද පෙනෙන, සාධාරණ සහ ආකර්ශනීය වේතනයක්,ලබාදීම කුසලතා මාර්ගය හඳුනා ගැනීම. අපි කොන් නොකරන සේවා යෝජකයෙක් වන අතර, සියල්ල ඇතුළත් ශ්‍රමබලකාය සංස්කෘතියක් ප්‍රවර්ධනය කරමින් තිරසාර වර්ධනය සඳහා මෙවලමක් ලෙස විවිධත්වය සහ අන්තර්ගතයන් සහතිකකිරීම.	වර්ධනය සහ දායකත්වය සඳහා අනාගතයට සූදානම් ඉහළින් අභිප්‍රේරිත සහ සහභාගී ශ්‍රමබලකාය. **සේවක ප්‍රතිලාභ –** රු. බිලියන 35.83 **පුහුණු පිරිවැය –** රු. මිලියන 128.05 **ප්‍රවර්ධන –** 1,194 **සේවක රැඳවාගැනීම්** අනුපාතය – 96% **කාන්තා ශ්‍රමබලකාය –** 4,736

පාර්ශ්වකරුවන්ගේ කාණ්ඩ	ප්‍රමුඛතාව	සහභාගීත්වයේ අරමුණ	වාරගණන	අර්ථවත්ව සහභාගිවීමේ ක්‍රම	උපායමාර්ගික ප්‍රතිඵල/ලබාදුන් වටිනාකම
වෘත්තීය සමිති – වෘත්තීය සමිති 6ක් බැංකුව සතුව පවතී –	ඉහළ	මෙහි මූලික අරමුණ වන්නේ කාර්මික ආරවුල් සහ බැංකුවේ මෙහෙයුම් බිඳදමන කාර්මික ආරවුල් සහ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග වැළැක්වීම සහ සාකච්ඡා සහ සම්මුතිය තුළින් සහයෝගී ආකාරයෙන් ගැටළු විසඳීම.	අවශ්‍ය විට සහ පරිදි	සියලු දෙනාගේ අනෝන්‍ය ප්‍රතිලාභ සඳහා සුහද සම්බන්ධතා සහතික කිරීමට සහයෝගී සාකච්ඡා ආකාරයෙන් අපි අඛණ්ඩව සිදු කරමු.	අපගේ සියලු පාර්ශ්වකරුවන්ට අඛණ්ඩ වටිනාකම ලබාදීම සහතික කරමින් තිරසාර මෙහෙයුම් සඳහා සහයෝගී සාකච්ඡා සහ ගැටළු විසඳුම් යෙදවුම් තිරසාර සම්බන්ධතා සඳහා ප්‍රතිලාභී ප්‍රතිඵල ඇති කරයි.
සැපයුම්කරුවන්	මධ්‍යම	මෙම සහභාගිත්වයේ පරමාර්ථය වන්නේ අපගේ අනෙක් පාර්ශ්වකරුවන්ට අනුරූප මට්ටමේ සේවා ලබාදීමට අවශ්‍ය වන නිෂ්පාදන සහ සේවා නිතිපතා සැපයීම සහතික කිරීමයි.	අඛණ්ඩව	අපි අපගේ සැපයුම් පදනම් සමඟ සක්‍රීයව සහභාගි වූ අතර කාලීන ගෙවීම් සහතික කර, අපි අපගේ අවශ්‍යතා සපුරාලන බැවින් ඔවුන්ගේ මූල්‍ය යහපත සහතික කිරීම.	අපගේ පාර්ශ්වකරුවන්ට සංවර්ධනාත්මක වර්ධනයන්ට සහයවීමේ බැංකුවේ පරමාර්ථ සහතික කිරීමට දිගුකාලය සඳහා අඛණ්ඩ වැඩ ප්‍රවාහ, අනෝන්‍ය ප්‍රතිලාභ සම්බන්ධතා, සහ හවුල්කාරත්වයන් අඛණ්ඩව පවතී. **සැපයුම්කරුවන්ට ගෙවීම –** රු. බිලියන 22.3 e-Gp හරහා සැපයුම්කාර ලියාපදිංචිය
ප්‍රජාව/මහජනතාව	මධ්‍යම	රජයේ බැංකුවක් ලෙස මහජන බැංකුවට ශ්‍රී ලංකාවේ මහජනතාවට බැඳීමක් ඇත. මෙහි මූලික අරමුණ වන්නේ මහජනතාවගේ වත්කමක් ලෙස බැංකුවේ ප්‍රතිරූපය සහ කීර්තිනාමය පවත්වා ගැනීම සහ උපායමාර්ගික CSR ව්‍යාපෘති හා වැඩසටහන් තුළින් ප්‍රජාව තුළ ආයෝජනය කිරීමයි.	අඛණ්ඩව	උපගේ “මහජන මෙහෙවර”, තේමාව මත පදනම් වී, අපි ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, ඒවා ප්‍රජාවට ප්‍රයෝජනවත් විය. මේ පිළිබඳ 161 සිට 168 දක්වා පිටුවල ප්‍රජා කොටස් තුළ ලේඛණගත කර ඇත.	අපගේ සන්නාම වටිනාකමවල ඉහළ දෘශ්‍යතාව **CSR හි ආයෝජන –** රු. මිලියන 36.0 **ගෙවන ලද විශ්‍රාම වැටුප් වටනාකම –** රු. බිලියන 1.08

ප්‍රමාණාත්මතාව

අඛණ්ඩව වෙනස්වන සහ ගතික පරිසරයක් තුළ, විස්තීර්ණ ප්‍රමාණාත්මතා ඇගයීමක් නොසලකා හැරිය නොහැකි විධානයකි. අපගේ ව්‍යාපාරය, එහි පාර්ශ්වකරුවන් සහ ජාතියට බොහෝ වැදගත් එවැනි කරුණු හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම අපගේ වාර්ෂික වැඩසටහනේ තීරණාත්මක කාර්යයකි.

වැදගත් මාතෘකා ලාභදායිතාවය මත පදනම් වීම පමණක් නොව අඛණ්ඩ පාරිසරික තිරසාරභාවය සහ වඩා පුළුල් සමාජීය ප්‍රතිලාභ සඳහා වැදගත් යෙදුමක් ද වේ. සමාජීය, පාරිසරික සහ ආර්ථික පෙරමුණු මත අපගේ අනාගත තිරසාරභාවය අනුරූපනය කිරීමේදී අපි සෑම වැදගත් මාතෘකාවක්ම සලකා බලන බැවින්, පුළුල්ව පැතිරුණු පාර්ශ්වකාර පදනමක් කරා අපගේ වගකීමෙන් අපි වට වී සිටිමු.

කළමනාකරණ ප්‍රවේශය

කෙටි, මධ්‍ය සහ දිගුකාලීනව ආර්ථික සමාජීය හා පාරිසරික වාතාවරණ කෙරෙහි ඇති බලපෑම මත පදනම් වී අපි අපගේ වැදගත් මාතෘකා ප්‍රමාණනය කරමු. බැංකුවේ ව්‍යාපාර ආදර්ශය. උපායමාර්ග හා තිරසාරභාවය, ජාතික සංවර්ධනයට දායකත්වය, පාර්ශ්වකාර ප්‍රතිපෝෂණ සහ මතුවන අවදානම් සහ අවස්ථා මත පදනම් වී වියහැකි වැදගත් තේමා ලැයිස්තුවක් සාකච්ඡාව සහ ඇගයීම සඳහා තෝරා ගනී.

වැදගත් මාතෘකා තීරණය කිරීමේ ක්‍රියාවලිය

GRI 3-1

1961 අංක 29 දරන පනතින් බලපතලාභී වාණිජ බැංකුවක් ලෙස සංස්ථාපිත වූ අපගේ මූලික අරමුණ වූයේ ග්‍රාමීය බැංකුකරණය සහ කෘෂිකාර්මික ණය ලබාදීමයි. එතැන් සිට විවිධ මූල්‍ය විසඳුම් රාශියක් ඇතුළත් කිරීමට සහ ජාතික ආර්ථිකය සංවර්ධනයේදී ශ්‍රී ලංකා රජයට හවුල්වීමට අපගේ ව්‍යාපාර සැලකියයුතු ලෙස වෙනස් වී ඇත. අධික අවධානිත අභ්‍යාශය මගින් ආර්ථිකය, පරිසරය, සහ සමාජයට බලපෑම් කරන වර්තමාන සහ අනාගත වැදගත් මාතෘකා ඇගයීමට ලක් කරයි. කෙසේවෙතත්, බැංකුවේ ප්‍රධාන කොටස්හිමියාවන ශ්‍රී ලංකා රජයේ අපේක්ෂාවන් මෙම ක්‍රියාවලියට මධ්‍යගත වන අතර, අපගේ වඩා පුළුල් පාර්ශ්වකාර කණ්ඩායම්වල අපේක්ෂාවන් කෙරෙහි අපි සූක්ෂමව අවධානය යොමු කරමු.

වඩා පුළුල් පාර්ශ්වකාර කණ්ඩායම්

ශ්‍රී ලංකා රජය

සමුපකාර සමිති

පවතින සහ අනාගත ගනුදෙනුකරුවන්

දේශීය සහ විදේශීය ව්‍යාපාරික හවුල්කරුවන්

සේවකයින්

වෘත්තීය සමිති

වැදගත් මාතෘකා තීරණය කිරීමේ ක්‍රියාවලිය

හඳුනාගැනීම:
වෙළෙඳපොල විශ්ලේෂණ PETSEL, SWOT, පාර්ශ්වකාර සහභාගිත්වය සහ අභ්‍යන්තර සාකච්ඡා ප්‍රමාණාත්මක වැදගත්කමක් වන ගැටළු හඳුනා ගැනීමට උපකාරී වේ.

උපායමාර්ගික අදාළත්වය ඇගයීම:
උපායමාර්ගයට ඒවායේ අදාළත්වය අනුව හඳුනාගත් ගැටළු තුළනය.

ප්‍රමුඛකරණය:
බලපෑමේ බරපතලකම මත පදනම් වී, ඉහළ හා සමීප සියුම් පරීක්ෂාව සහ කළමනාකරණය අවශ්‍ය ගැටළු ව්‍යූහගතකරණය.

ප්‍රමාණාත්මතාව පිළිබඳ පදනම් වාර්තාකරණය:
දිගුකාලීන තිරසාරභාවය සහතික කිරීමට අනාවරණ, අවදානම් අවම කිරීම, සහ නිවැරදි වාර්තාකරණය.

වැදගත් ගැටළු හඳුනාගැනීම සඳහා උපායමාර්ගික කුළුණු

මහජන බැංකුවේ නෛතික විධානය සහ ජාතික බැඳීම	පාර්ලිමේන්තු පනතක ආකාරයෙන් බැංකුව මත පවරන මූලික පරමාර්ථය මහජන සුභසාධනය කෙරෙහි බැංකුවේ වගකීම් වන අතර, උපායමාර්ගික තීරණ යනු එම මැදිහත්වීමේ සහ ලාභදායිතාවයේ සංයෝජනයකි.
ශ්‍රී ලංකා රජයේ ආර්ථික හා සමාජීය ප්‍රතිපත්ති	ආර්ථික හා සමාජ සුභසාධනය සහ දිළිඳුකම පිටු දැකීම ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතා වන අතර, වඩා පුළුල් ලඟාවීම සහ වඩා ශක්තිමත් සමාජීය බලපෑමක් නිර්මාණය කිරීම හමුවේ වඩා ඉහළ පිරිවැය දැරීමට බැංකුවට සිදුවී ඇත.
උපායමාර්ගික ප්‍රමුඛතා	බැංකුව තිරසාර වර්ධනය සඳහා ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීමට පැහැදිලි නිශ්චිත උපායමාර්ගික සැලැස්මක් මත ක්‍රියාත්මක වේ.
මෙහෙයුම් සන්දර්භය	බැංකුවේ මූලික අරමුණ ජනතා සුභසාධනය වන බැවින් ජාතික ආර්ථිකයේ ප්‍රතිසාධනය කරා සැලකියයුතු දායකත්වය බැංකුව සඳහා ප්‍රමුඛ වේ.
පාර්ශ්වකාර ප්‍රතිපෝෂණ හා අපේක්ෂාවන්	බැඳීමක් ලෙස මහජන සුභසාධනය සමඟ තිරසාර ව්‍යාපාරයක් මෙහෙයවන අතරම, තරඟකාරී බැංකු වාතාවරණයක් තුළ මූල්‍ය විසඳුම් කරා පිවිසීමේදී සේවා විශිෂ්ටත්වය සහ ඩිජිටල් පහසුව ඉල්ලා සිටින වෙනත් පාර්ශ්වකරුවන් කරා සිය වගකීමට බැංකුව අනුරූප වේ.
තිරසාරභාවය	බැංකුවේ තිරසාරභාවය ජාතියේ ආර්ථික ස්ථාවරත්වයේ සහ දිවයින පුරා ශ්‍රී ලංකා රජයේ මහජන සුභසාධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී අත්‍යවශ්‍යය.

කාල රාමු සංවිධානය

කෙටිකාලය	මධ්‍යකාලය	දිගුකාලය
වත්කම්වල ගුණාත්මකභාවයට උපායශීලී ගැලපීම් පිරිවැය ගැලපීම් සහ ආයෝජන සිදුකිරීම සමීපව නියාමනය කරමින්, ලාභදායිතාව, ද්‍රවශීලතාව සහ නුබුන්වත්බව පවත්වාගෙන යාම අපි සහතික කරමු.	ඩිජිටල්කරණය සහ ක්‍රියාවලි වර්ධනය තුළින් විවිධත්වය ආදායම් මාර්ග පදනම් ගාස්තුවලට මාරු කිරීම.	ඉහළම මට්ටමේ බැංකුව සහ බොහෝ දෙනාට ප්‍රිය සේවායෝජකයා බවට පත්වීම.

බැංකුකරණය ගතික ක්ෂේත්‍රයක් වන බැවින් සහ ගනුදෙනුකාර ඉල්ලුම, තාක්ෂණය, නියාමන අවශ්‍යතා සහ වෙළෙඳපොලට පළමුව එන නිෂ්පාදන සමඟ වෙනස් වන බැවින්, වැදගත් මාතෘකා කාල සීමාගත ක්‍රමයක් මත ඇගයීමට ලක් කෙරේ. මෙවැනි සියලුම දෑ අපගේ ස්ථර කෙරෙහි බලාපන අතර, අපගේ ව්‍යාපාරයට වඩාත් බලපෑම් කරන ඒවා අපි තෝරාගෙන ඇත.

වැදගත් මාතෘකා

GRI 3-2, 3

අනු අංකය	මාතෘකාව	ප්‍රමුඛතා පරිමිතිය	බැංකුවට වැදගත්කම	පාර්ශ්වකරුවන්ට වැදගත්කම
1.	සේවක මානසික යහපැවැත්ම	වැඩ ජීවිත තුලනය ප්‍රමුඛ කිරීම. ආරක්ෂාව සහ ඔවුන්ගේ යහපැවැත්ම සහතික කිරීමේ අවස්ථා ලබාදීම. ඉහළ රැඳවාගැනීමේ අනුපාතයක් සහතික කිරීම.	ඉහළ	මධ්‍යම
2.	කුසලතා කළමනාකරණය	ඉහළ මට්ටමේ මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් සඳහා දක්ෂයින් රැඳවා ගැනීම. වෘත්තීමය ප්‍රගතිය අරමුණු කළ වර්ධන අවස්ථා නිර්මාණය කරමින් බුද්ධිගලනය අවම කිරීම. අනාගතයට සුදුසු ශ්‍රමබලකායක් සඳහා ඩිජිටල් කුසලතා ගොඩනැගීම. සේවා විශිෂ්ටත්වය තුළින් ව්‍යාපාර ප්‍රසාරණය ඇති කිරීම.	ඉහළ	මධ්‍යම
3.	පුහුණුව හා සංවර්ධනය	සුවිශේෂී ගනුදෙනුකාර සේවාවක් සහතික කිරීමට බැංකුවේ උපායමාර්ගික පරමාර්ථ බෙදාහැරීම සහ ඒ තුළින් වටිනාකම නිර්මාණය සහ වටිනාකම් ලබාදීම වැඩි කිරීම.	මධ්‍යම	මධ්‍යම
4.	කුසලතා මට්ටම් උසස් කිරීම කුසලතාව නැවත ඇති කිරීම	සම්ප්‍රදායික ගනුදෙනුකාර පදනමේ නෛසර්ගික හා මතුවන අවශ්‍යතා සපුරාලීම. පහසුව සහ ගාස්තු රහිත බැංකු සේවා සඳහා ස්ථාන වැඩියෙක් ගවේෂණය කරන Zපරම්පරාවේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම.	මධ්‍යම	මධ්‍යම
5.	සේවක ඵලදායිතාව	මූලික කාර්යසාධන දර්ශකවලට (KPI) අනුව මනින ලද බැංකුවේ පර්මාර්ථ හා බැඳුණු සේවක ඵලදායිතාව බැංකුවේ ප්‍රදර්ශනය වන තිරසාරභාවය සඳහා අත්‍යවශ්‍යය.	ඉහළ	ඉහළ

	කළමනාකරණ ප්‍රවේශය	ප්‍රාග්ධන විභවතා	යොමුකළ අංශය	GRI යොමුව
	සේවකයින්ට මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ ලබාදීම සහ අවශ්‍ය අවස්ථාවලදී ප්‍රවීන උපදේශ ලබාගැනීමට අවස්ථා ඇතිකිරීම.	සාකල්‍ය ආකාරයෙන් සේවක යහපැවැත්ව තුළ ආයෝජනය කිරීම ප්‍රශස්ථ මට්ටම්වල ක්‍රියාකරමින් ඉහළ සහභාගිත්වය සමඟ අභීප්‍රේරිත කණ්ඩායමක් සහතික කරන අතර, තවදුරටත් බුද්ධිමය ප්‍රාග්ධනයේ බැංකුවේ සැලකියයුතු තැන්පතු ගොඩ නගයි.		GRI 401: සේවා නියුක්තිය GRI 404: පුහුණුව සහ අධ්‍යාපනය GRI 406: වෙනස් ලෙස නොසැලකීම
	තිරසාර ව්‍යාපාර වර්ධනයක් සඳහා බැංකුවේ විධායක උපායමාර්ගික ප්‍රමුඛතාවන්ට ප්‍රශස්ථ මට්ටමෙන් ක්‍රියාත්මක වෙන සේවක කණ්ඩායමක් ආකර්ෂණය, සංවර්ධනය, සහ රඳවා ගැනීම.	බැංකුව වෙනුවෙන් ඉහළම දක්ෂයින් බඳවාගැනීම සහ දිගුකාලීනව ඔවුන් රඳවාගැනීම සහතික කිරීම සඳහා කුසලතා කළමනාකරණය තුළ ආයෝජනය අත්‍යවශ්‍යය.		GRI 401: සේවා නියුක්තිය GRI 402: ශ්‍රම කළමනාකරණ සම්බන්ධතා GRI 404: පුහුණුව සහ අධ්‍යාපනය GRI 405: විවිධත්වය සහ සමාන අවස්ථාව GRI 406: වෙනස් ලෙස නොසැලකීම GRI 408: ළමා ශ්‍රමය GRI 409: බලකරනලද සහ අනිවාර්ය ශ්‍රමය
	සිය ක්‍රියාකාරිත්වය සඳහා සහයවන අවශ්‍ය යටිතලපහසුකම් සමඟ විස්තීර්ණ පුහුණුව සහ සංවර්ධන වැඩසටහන් තුළ ආයෝජනය තුළින් ක්ෂේත්‍රයේ කැපිපෙනෙන හැකියාවන් සංවර්ධනය සහ අපගේ සේවකයින්ගේ උපරිම හැකියාවන් කරා ඔවුන්ට ලඟාවීමට ඔවුන් සවිබල ගැන්වීම.	අපගේ හැකියා සංචිත සංවර්ධනය තුළ ආයෝජනය තිරසාරභාවය සහ ප්‍රගතිය සහතික කිරීමට දක්ෂයින් රඳවා ගැනීමේ අත්‍යාවශ්‍ය සංරචකයකි.	පිටු අංක 133 සිට 144 දක්වා මානව ප්‍රාග්ධනය	GRI 404: පුහුණුව සහ අධ්‍යාපනය
	වර්තමානයේ ඉල්ලා සිටින තාක්ෂණික සහ ඩිජිටල් හැකියාවන් සමඟ අපගේ සේවකයින්ගේ කුසලතා උසස් කිරීම. ඊට අමතරව, කෘතිම බුද්ධියේ වාසිය ලබාගැනීමට ඔවුන් සූදානම් කිරීම.	අපගේ ඩිජිටල් වත්කම් අත්කරගැනීම/ උසස්කිරීම සඳහා ආයෝජනය මෙන්ම පුහුණු සහ කුසලතා වර්ධන අවස්ථාවන් ලබාදීම අනාගතයේ වර්ධනය කිරීමට අපේක්ෂා කරන වර්තමාන අවශ්‍යතාවක් විසඳනු ඇත.		GRI 404: පුහුණුව සහ අධ්‍යාපනය
	සේවක පුහුණුව, සංවර්ධනය ප්‍රදාන, සහ පිළිගැනීම සඳහා සම්පත් වෙන්කිරීම අඛණ්ඩ ඵලදායිතාව සඳහා ඉහළින් සහභාගී ශ්‍රමබලකායක් පෝෂණය කරයි.	මානව ප්‍රාග්ධනය බැංකුවේ අඛණ්ඩ සාර්ථකත්වයේ කේන්ද්‍රයේ පවතින අතර, ඒ තුළින් ජාතික සංවර්ධන සැලසුම්වලට අර්ථවත් සහභාගිත්වය සහතික කරයි. එබැවින්, අපගේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමට ආයෝජනය අපගේ බැංකුවේ තීරණාත්මක සංරචකයක්ව පවතිනු ඇත.		GRI 401: සේවා නියුක්තිය

අනු අංකය	මාතෘකාව	ප්‍රමුඛතා පරිමිතිය	බැංකුවට වැදගත්කම	පාර්ශ්වකරුවන්ට වැදගත්කම
6.	ගනුදෙනුකාර අත්දැකීම	සේවා විශිෂ්ටත්වය සමඟ බැඳුණු ගනුදෙනුකරුවන්ට තරඟකාරී වටිනාකම් කොටසක් අබණ්ඩව ලබාදීම. උසස් ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදෙන ඩිජිටල් මාර්ග කරා පහසු සංක්‍රාන්තියක් ඇති කිරීමට නවීන ඩිජිටල් මාර්ග පිරිනැමීම.	ඉහළ	ඉහළ
7.	වගකීම්සහගත ණයදීම	යහපත් තත්ත්වයේ ණයදීම් සහතික කිරීම සහ අදියර 3 මාරුකිරීම්වල අවදානම අවම කිරීම.	ඉහළ	ඉහළ
8.	සැපයුම් දාම නිර්මාණය	සැපයුම් දාමය තුළ කඩාවැටීම් හේතුවෙන් ව්‍යාපාර බිඳවැටීමේ අවදානම අවම කිරීම.	මධ්‍යම	පහළ
9.	අවදානම් හා පාලනය	බැංකුවේ අවංකකම, විශ්වාසය, කීර්තිනාමය සහ ස්ථාවරත්වය සහතික කිරීම.	ඉහළ	ඉහළ
10.	පාරිසරික බලපෑම	පරිසර හිතකාමී සහ තිරසාර ව්‍යාපාර පරිචයන් තුළින් තිරසාර හරිත පරිසරය.	ඉහළ	මධ්‍යම
11.	සමාජ ආර්ථික බලපෑම	ජාතික ප්‍රමුඛතා ගැටළු සමඟ පෙළ ගැසීම.	මධ්‍යම	මධ්‍යම

	කළමනාකරණ ප්‍රවේශය	ප්‍රාග්ධන විභවතා	යොමුකළ අංශය	GRI යොමුව
	අපගේ පුළුල්ව පැතිරුණු ශාඛා ජාලය සහ ඩිජිටල් මාර්ග තුළින් තරඟකාරී වටිනාකම් කොටස පිරිනමමින් ගනුදෙනුකාර කේන්ද්‍රීය ප්‍රවේශයක් යොදා ගැනීම.	පුළුල් භෞතික ශාඛා ජාලය තුළ බැංකුවේ ආයෝජනය සහ එහි තාක්ෂණික සහ ඩිජිටල් හැකියාවන් වැඩි කිරීම රටතුළ ගනුදෙනුකරුවන්ගේ වඩාත් පුළුල් ලඟාවීම සඳහා මූල්‍ය විසඳුම් කරා පිවිසීමට අසමසම සංයෝගයක් ලබාදේ.	පිටු අංක 121 සිට 126 දක්වා නිෂ්පාදිත ප්‍රාග්ධනය පිටු අංක 127 සිට 132 දක්වා බුද්ධිමය ප්‍රාග්ධනය පිටු අංක 145 සිට 150 දක්වා ගනුදෙනුකාර ප්‍රාග්ධනය	GRI 418: ගනුදෙනුකාර රහස්‍යතාව GRI 417: අලෙවිකරණය හා ලේබල්කරණය GRI 411: දේශීය ජනතාවගේ අයිතිවාසිකම්
	අපගේ සමස්ත රාජකාරිය ලෙස මහජන සුභසාධනයට අනුගත වෙමින්, පරීක්ෂාකාරී ණයදීම අඩු වෙන් උවදුරට පත්වියහැකි අංශ කරා ක්‍රියාවට නංවනු ලබයි.	උපායමාර්ගික පරමාර්ථ සහතික කිරීමට බැංකුකරණය තුළ ආවේණික අවදානමක් වන ණයදීම දිගුකාලීනව සාක්ෂාත් කර ගනී. ණයදීමේ අභ්‍යාසයන්හි දී දැඩි පරිස්සම ක්‍රියාවට නංවනු ලබයි.	පිටු අංක 145 සිට 150 දක්වා ගනුදෙනුකාර ප්‍රාග්ධනය	–
	දිගුකාලීන අන්‍යෝන්‍ය ප්‍රතිලාභී ව්‍යාපාර හවුල්කාර සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ නුවමාරු වටිනාකම නිර්මාණය.	ශක්තිමත් ව්‍යාපාර සම්බන්ධතා නිර්මාණය, පවත්වාගැනීම සහ පෝෂණය කිරීම තුළ ආයෝජනය බැංකුවේ වෙනත් පාර්ශ්වකරුවන්ට බාධාරහිත සේවා ලබාදීමේදී බැංකුවට ප්‍රතිලාභ ඇති කරයි.	පිටු අංක 151 සිට 156 දක්වා ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය	GRI 204: ප්‍රසම්පාදන ව්‍යවහාර GRI 308: සැපයුම්කාර පාරිසරික ඇගයීම GRI 408: ළමා ශ්‍රමය GRI 409: බලාත්කාර සහ අනිවාර්ය ශ්‍රමය GRI 414: සැපයුම්කාර සමාජ ඇගයීම
	ඉහළ අවංක බව සමඟ සදාචාර පාලනය සහ අවදානම අවම කිරීමේ ශක්තිමත් රාමුව අංශමය සහතික කිරීමේ මට්ටම්වල ක්‍රියාවට නංවා ඇති අතර, ශක්තීන් පරීක්ෂාව විගණනය කර අවශ්‍ය අවස්ථාවලදී වැඩිදුර පාලනයන් ක්‍රියාත්මක කරයි.	තිරසාර ව්‍යාපාරයක් ගොඩ නැඟීම ශක්තිමත් පාලන සහ අවදානම් රාමුවක් ඉල්ලා සිටී. එබැවින් ක්ෂේත්‍රයේ දක්ෂයින් බඳවාගැනීම, පුහුණුව සහ රඳවාගැනීම තුළ ආයෝජනය අනාගතයට වටිනාකම් එකතු කිරීමකි.	පිටු අංක 178 සිට 212 දක්වා අවදානම් කළමනාකරණ වාර්තාව පිටු අංක 213 සිට 250 දක්වා ආයතනික පාලන වාර්තාව	GRI 201: ආර්ථික කාර්යසාධනය GRI 205: දූෂණ විරෝධය GRI 206: තරඟකාරී හැසිරීම් විරෝධය GRI 207: බදු
	පරිසර හිතකාමී යටිතලපහසුකම් සහ පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවල ආයෝජනය මඟින් අපගේ කාබන් පාසටහන් අවම කිරීම සහ මුල්‍යකරණ සහ ආයෝජන තෝරා ගැනීමේදී පාරිසරිකමය ප්‍රතිඵලවන් හි සාධ්‍යකරණය.	පරිසර හිතකාමී යටිතලපහසුකම්වල ආයෝජනය තිරසාර ව්‍යාපාරයක් සහ සංරක්ෂිත පරිසරයක් වන අතර අපගේ සන්නාමයට වටිනාකම එකතුකරයි.	පිටු අංක 169 සිට 176 දක්වා ස්වභාවික ප්‍රාග්ධනය	GRI 303: බලශක්තිය GRI 303: ජලය සහ අපජලය GRI 305: විමෝචන
	ශ්‍රී ලංකා රජයට එහි දිළිඳුකම පිටුදැකීමේ උත්සාහයන්ට සහයවීම සහ දේශීය ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය කරා දායකත්වය තුළින් සමාජ විෂමතා විසඳීම.	ජාතික ප්‍රතිසාධනයේ අතිවිශාලතම කාර්යය අපගේ මෙහෙයුම්වල වෙනත් ප්‍රදේශවල උත්සාහයන්ට අසමසම වේ. එබැවින් දියුණුවන ආර්ථිකයක් නිර්මාණය තුළ අපගේ දායකත්වය අපගේ උපායමාර්ගික වැඩසටහනේ ප්‍රමුඛතාවයකි.	පිටු අංක 161 සිට 168 දක්වා ප්‍රජා ප්‍රාග්ධනය පිටු අංක 85 සිට 114 දක්වා ව්‍යාපාර සමාලෝචන	GRI 202: වෙළෙඳපොල පැවැත්ම GRI 203: වක්‍ර ආර්ථික බලපෑම GRI 207: දේශීය ප්‍රජාවන්

අනු අංකය	මාතෘකාව	ප්‍රමුඛතා පරිමිතිය	බැංකුවට වැදගත්කම	පාර්ශ්වකරුවන්ට වැදගත්කම
12.	සෞඛ්‍ය හා ආරක්ෂාව	ආරක්ෂිත, අභිප්‍රේරිත සහ සහභාගි ආරක්ෂක සහ යහපත් බැංකු පරිසරයක් සහතික කිරීම සහ එය බැංකු ගනුදෙනු සහ මැදිහත්වීම් පවත්වා ගැනීමට යහපත්ය.	ඉහළ	ඉහළ
13.	ඩිජිටල් නායකත්වය	ගනුදෙනුකාර අපේක්ෂාවන් වෙළෙඳපොල තුළ ඇති පරිවර්තනීය තාක්ෂණය සහ ඩිජිටල් හැකියාවන් සමඟ වෙනස් වෙමින් පවතී.	මධ්‍යම	ඉහළ

කළමනාකරණ ප්‍රවේශය	ප්‍රාග්ධන විභවතා	යොමුකළ අංශය	GRI යොමුව
ආරක්ෂිත ව්‍යාපාර පරිශ්‍ර පවත්වා ගනිමින් සහ යහපත් හා ආරක්ෂක ප්‍රමිති දැඩිව සපුරාලන නිෂ්පාදන හා සේවා ලබාදෙමින් අපගේ පාර්ශ්වකරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීම.	අපගේ සියලුම පාර්ශ්වකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ආයෝජනය කිරීම අතිශය වැදගත්වන අතර, එය ප්‍රසන්න වාතාවරණයක් මෙන්ම උවදුරු රහිත කලාපයක් ගොඩනගා ගැනීමට උපකාරී වේ.	පිටු අංක 133 සිට 144 දක්වා මානව ප්‍රාග්ධනය (ගනුදෙනුකරුවන්, ව්‍යාපාර හවුල්කරුවන්, සහ වෙනත් පාර්ශ්වකරුවන් සහ පරිශ්‍රයට පැමිණෙන ආගන්තුකයින් ඇතුළුව)	GRI 403: වෘත්තීමය සෞඛ්‍ය සහ ආරක්ෂාව GRI 416: ගනදෙනුකාර සෞඛ්‍ය සහ ආරක්ෂාව
නවීන ඩිජිටල් තාක්ෂණය උසස් කිරීම සහ අත්කර ගැනීම තුළ ආයෝජනය.	ඩිජිටල් හැකියාවන් තුළ ආයෝජනය තරඟකාරී සහ පිරිවැය ඵලදායී වීමට අපට ඉඩ ලබා දේ.	පිටු අංක 104 සිට 108 දක්වා තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් ගමන්මඟ	අදාළ නැත



උපායමාර්ගය

අපගේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අපගේ නොසැලෙන බැඳීම සමඟ, මෙහෙයුම් ප්‍රශස්ත කිරීමට උපායමාර්ග මනාව ක්‍රියාත්මක කිරීම දක්ෂයින් සවිබලගන්වීම, ඔරොත්තුදීම සහ අදාළත්වය සඳහා ඩිජිටල් නව්‍යකරණය උසස් කිරීම, ජාතික ප්‍රතිපත්ති සමඟ පෙළ ගැසීම 2024 වසර සඳහා අපගේ උපායමාර්ගයේ ප්‍රධාන මූලධර්ම විය.

අපගේ ප්‍රවේශය

2023 දී, වෙනස්වන ආර්ථික සහ වෙළෙඳපොල තත්ත්වයන්, බාහිර සාධක, රජයේ ප්‍රතිපත්ති සහ අභ්‍යන්තර ගතිකතාවලට ප්‍රතිචාරාත්මකව බැංකුව එහි පවත්නා උපායමාර්ගික සැලැස්ම (2022-2024) සම්පූර්ණ සමාලෝචනයක් සිදු කරන ලදී. මෙවැනි සාධකවල සැලකියයුතු බලපෑම සලකමින්, එහි අඛණ්ඩ අදාළත්වය සහ ඵලදායිත්වය සහතික කිරීමට උපායමාර්ගය සැලකියයුතු ලෙස වෙනස් කිරීමට තීරණය කරන ලදී.

තාර්කිකත්වය

2022-2024 සැලැස්මේ අපගේ අරමුණු සහ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට, අඛණ්ඩතාව සහ අනුවර්ත්‍යතාව එකතු කරමින් අපගේ උපායමාර්ගික රාමුව අපි නැවත සකස් කළ අතර, අපගේ පාර්ශ්වකරුවන්ට අවසාන වටිනාකමක් නිර්මාණය කිරීමට අපගේ මෙහෙයුම් වාතාවරණය තුළට විය අතුළත් කරන ලදී. මෙය අපගේ වෙළෙඳපොල නායකත්වය නැවත සවිමත්කළ අතර, වැඩිවන සංකීර්ණ දේශීය හා ගෝලීය ආර්ථිකයක් තුළ පරිවර්තනීය නිමැවුමක් මෙහෙයවීමට හැකියාව ඇති කරන ලදී.

පාර්ශ්වකරුවන් සඳහා ක්ෂේත්‍රයේ කැපී පෙනෙන කාර්යක්ෂමතාව සහ තිරසාර වටිනාකම් නිර්මාණය නොනැවත කරගෙන යාම **ක්‍රියාත්මත කළ හැකිබව** – විශිෂ්ටත්වය මෙහෙවීම	අඛණ්ඩ වර්ධනය සාක්ෂාත් කර ගැනීමට, අපි මෙහෙයුම් ප්‍රතිසාධනය, පිරිවැය විනය සකස් කිරීම, ස්වයංක්‍රීයකරණය, සහ දක්ෂතා උසස් කිරීම කෙරෙහි අවධානය යොමු කරමු.
පුද්ගලගත ගනුදෙනුකාර අත්දැකීම ලබාදීමට මානව ප්‍රවීනත්වය සහ ඩිජිටල් නව්‍යකරණය ඒකාබද්ධ කිරීම තුළින් නෛසර්ගික සහ වෙනස්වන ගනුදෙනුකාර ඉල්ලීම් නොනැවත කරගෙන යාම **ක්‍රියාත්මත කළ හැකිබව** – ගනුදෙනුකරු ගොඩනැගීම	ගනුදෙනුකරුවන් කේන්ද්‍රීය නව්‍යකරණය තුළ නොබැඳි පරමාදර්ශවල වෙනස්වීමක් ගතික මූල්‍ය පරිසර පද්ධතියක් තුළ වෙනස්ම වටිනාකම් ලබාදෙමින් සහභාගිත්වය ඉහළ දැමීමට පුරෝකතනය කළ විශ්ලේෂණ, සහ සර්ව මාර්ග ඒකාබද්ධ කිරීම තියුණු කරයි.
නියාමනය, තාක්ෂණය සහ වෙළෙඳපොල ප්‍රවනතාවල විතැන්වීමට අනුවර්තනය වීම නොනැවත කරගෙන යන අතරම අනාගතයට සූදානම් විශිෂ්ට දක්ෂයන් බඳවා ගැනීම. **ක්‍රියාත්මත කළ හැකිබව** – අනාගතයට සූදානම් වීම	බැංකු කෂේත්‍රයේ වෙනස්වන ප්‍රවනතාවන්ට වේගයෙන් අනුවර්තනය වීම සහ ඉහළම දක්ෂයින් ආකර්ෂණය, පුහුණුව සහ රඳවාගැනීම සමඟ වෙළෙඳපොල නායකත්වය රඳවා තබා ගැනීමට අපගේ ඩිජිටල් බලතල සැලකියයුතු අයුරින් වැඩි කිරීම.

අපගේ මූලික අරමුණ

අපගේ මූලික අරමුණ වන්නේ ක්ෂේත්‍රයේ උපරිම සේවක තෘප්තිය සහිත බොහෝ ගනුදෙනුකරුවන් සොයන බැංකුවක් වීමයි. මෙම ඒකායන අරමුණ සාක්ෂාත් කර ගැනීමට, අපගේ උපායමාර්ගික පරමාර්ථ සහ සක්‍රීයකරුවන් අපි අර්ථ දක්වා ඇත.

අපගේ උපායමාර්ගය

අපි උපායමාර්ග නවයක් අර්ථ දක්වා ඇති අතර, ඉන්පසුව ඒවා 2024 සිට ඉදිරියට බලාත්මක වීම සඳහා උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කර ඇත. මෙවැනි උපායමාර්ග බැංකුවේ දිගුකාලීන වර්ධනය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය ඇති කිරීමට සැලසුම් කෙරේ.

උපායමාර්ගික මානයන්

උපායමාර්ගික පරමාර්ථ සක්‍රීයකරුවන්



උපායමාර්ගික පරමාර්ථ සහ සක්‍රීයකරුවන්

අපගේ උපායමාර්ගික පරමාර්ථ සහ සක්‍රියකරුවන් ක්‍රමානුකූලව අර්ථ දක්වමින්, අපගේ සුවිශේෂී අරමුණු සාක්ෂාත් කර ගැනීමට (විනීත ආකාරයෙන්) අපගේ මූලපිරිම්වල අපි වරණීයතාව ක්‍රියාවට නංවමු. මෙම අවධානිත ප්‍රවේශය සංසක්ති සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සමඟ අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට පහසුකම් සපයා ඇත.

උපායමාර්ගික පරමාර්ථ

විශිෂ්ටත්වය මෙහෙයවීම	ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව ගොඩනැගීම	අනාගතයට සූදානම් වීම

උපායමාර්ගික සක්‍රීයකරුවන්

ලීන් කඩිසර මනස	දත්ත පදනම් මනස	වර්ධන මනස

ව්‍යාපාර වර්ධනය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය	**ගනුදෙනුකාර වර්ධනය සහ රඳවාගැනීම**	**සහයෝගීතාව සහ තිරසාර මූල්‍ය තුළින් වර්ධනය මෙහෙයවීම**
➔ ව්‍යාපාර සංවර්ධන වර්ධනය ➔ මෙහෙයුම් ක්‍රියාවලි වර්ධනයන් ➔ මෙහෙයුම්වල ඩිජිටල් පරිවර්තනය ➔ TAT වර්ධනයන් ➔ වර්ධිත ගනුදෙනුකාර තෘප්තිය ➔ ගනුදෙනුකාර මුදල් කොටස සහ රඳවාගැනීම වැඩි කිරීමට ශාඛාවල කාලය භාවිතා කිරීම	➔ ගනුදෙනුකාර වර්ධනය සහ රඳවාගැනීම ➔ ඉහළ විභව ගනුදෙනුකරුවන් අත්කර ගැනීම ➔ ගනුදෙනුකාර වර්ධනය මත ශුද්ධ පොළී ආන්තිකය ➔ ගනුදෙනුකාර ගැටළු නිරාකරණය TAT ප්‍රවර්ධන ➔ අපනයන ආදායමේ වර්ධනය	➔ උපායමාර්ගික හවුල්කාරත්වය ➔ ප්‍රේෂණ වටිනාකම/පරිමාව තුළ වර්ධනය ➔ කාලගුණ වෙනස්වීමේ මුල්පියවර සහ හරිත ණය සඳහා ණය මාර්ග

කළඹ තත්ත්වය	**කාර්යසාධනය පදනම් සංස්කෘති මනස**	**වඩා යහපත් ඉලක්කගතකරණය සහ වටිනාකම් කොටස**	**වර්ධනය පදනම් මනසක් සමඟ කණ්ඩායම ගොඩ නැගීම**
➔ වත්කම්වල තත්ත්වය වර්ධනය ➔ අක්‍රීය ණය අඩු කිරීම	➔ සේවක සහභාගිත්වය ➔ සේවකයෙකුට ආදායම/වියදම ➔ සේවක කුසලතා වැඩි කිරීම ➔ අර්ථවත් රඳවාගැනීම සහ බැංකුවට දායකත්වය ➔ ද්විත්ව කාර්යසාධන ඇගයීම	➔ ඉහළින් ප්‍රමුඛ අංශ වර්ධනය ➔ භාණ්ඩාගාර පරිමාව වර්ධනය ➔ විදේශ විනිමය තැන්පතු වර්ධනය මෙහෙයවීම ➔ ගනුදෙනුකරුවන්ගේ සාමාන්‍ය මුදල් ප්‍රමාණය ➔ ගනුදෙනුකාර තෘප්තිය වර්ධනය කිරීමට ගලපනලද ණය විසඳුම් ➔ අපනයන ගනුදෙනුකාර වර්ධනය ➔ ව්‍යවසායකත්වය හරහා කාන්තා සවිබලගැන්වීම කිරීම ➔ ණය කාඩ් වර්ධනය	➔ අනුප්‍රාප්තික සැලසුම් උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීම ➔ වෘත්තීය සංවර්ධනය සහ ශ්‍රම බලකාය ගැලපීම සිදු කිරීමේ (HR) මානව සම්පත් ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම ➔ කාර්යසාධන කළමනාකරණය ප්‍රශස්ථ කිරීම සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සඳහා උසස් HR තාක්ෂණය ඒකාබද්ධ කිරීම ➔ සේවක වර්ධනය සහ ආයතනික විශිෂ්ටත්වය පෝෂණය කිරීම සඳහා දක්ෂතා පදනම් පුහුණුව දියුණු/වර්ධනය කිරීම.

2023 දී, උපායමාර්ගික අධීක්ෂණය හා ප්‍රගතිය ඇගයීමේදී දෙවන මට්ටමේ කළමනාකරණය අපි සංස්ථාපිත කළෙමු. ඒවායේ දිගුකාලීන ප්‍රවීනත්වය භාවිතා කරමින්, සමුච්චිත බුද්ධිමය ප්‍රාග්ධනය තියුණු කරමින්, සහ සවිබලගැන්වූ තීරණ ගැනීම තුළින්, අපි අපේක්ෂිත ආදායම ලබාගතිමු. මෙම ප්‍රවේශය සාර්ථකත්වය අත්කර දුන් අතර, එය 2024 සඳහා අපගේ සාර්ථක ගමන්මඟ පිළිබිඹු කරයි.

පාරිසරික, සමාජීය සහ පාලනය (ESG)

පාරිසරික, සමාජීය හා පාලනය කෙරෙහි සංකේන්ද්‍රණය අපගේ සමස්ත උපායමාර්ගයේ තීරණාත්මක අංගයකි. අපගේ සන්නාම දෘශ්‍යතාව, පුළුල් වෙළෙඳපොල පිහිටීම, ජාත්‍යන්තර හවුල්කාරත්වයන්, සහ රටතුළ විවිධ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී රජයට හවුල්වීම තුළ, අපගේ සාර්ථකත්වය ශක්තිමත් පාලන ව්‍යුහයක් මත ඇති අතර, එය ජාත්‍යන්තර සහ සමාජීය ප්‍රතිෂ්ඨාව සමඟ එකට සම්මිශ්‍රණය වේ.

වර්ගය	කාර්යයන්	නිමැවුම	UN SDG ගැලපීම
පාරිසරික	අපි හරිත ගොඩනැගිලි ප්‍රශස්ථකරණය, පුනර්ජනනීය බලශක්තිය, ස්වභාවික සම්පත් වගකීම්සහගත භාවිතය, තුළ අපගේ උත්සාහයන් අපි දිගටම කරගෙන යන අතර, ඩිජිටල් බැංකු ක්‍රියාත්මක කිරීම වේගවත් කරමින් කඩදාසි රහිත කාර්යාලයක් සඳහා අපගේ ගමන්මඟ ඉදිරියටම යන්නෙමු.	කරුණාකර පිටු අංක 169 සිට 176 දක්වා ස්වභාවික ප්‍රාග්ධනය සහ පිටු අංක 121 සිට 126 දක්වා නිෂ්පාදිත ප්‍රාග්ධනය සහ පිටු අංක 145 සිට 150 දක්වා ගනුදෙනුකාර ප්‍රාග්ධනය කොටස බලන්න.	7 AFFORDABLE AND CLEAN ENERGY, 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE, 11 SUSTAINABLE CITIES AND COMMUNITIES, 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION, 13 CLIMATE ACTION, 15 LIFE ON LAND
සමාජය	අපගේ ප්‍රජාව සහ CSR තුළ අපගේ ආයෝජනය වැදගත් වේ. කාන්තාවන් මෙහෙයවන ව්‍යාපාරවලට ණයදීම සහ බැංකුව තුළ රැකියා අවස්ථා නිර්මාණය කිරීම තුළින් කාන්තා සවිබලගැන්වීම් අවධානය යොමු වූ කරුණක් විය.	කරුණාකර පිටු අංක 161 සිට 168 දක්වා සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය, ප්‍රජාව සහ CSR සහ පිටු අංක 133 සිට 144 දක්වා මානව ප්‍රාග්ධනය කොටස බලන්න.	1 NO POVERTY, 4 QUALITY EDUCATION, 5 GENDER EQUALITY
පාලනය	අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ නායකත්වය 2024 ප්‍රතිඵලය සඳහා කැපීපෙනෙන ප්‍රතිඵලයක් අත්කර දීම සඳහා දිශානතිය සකස් කර ඵලදායි ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. බැංකුවට ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් ඇති අතර, එය ශක්තිමත් සහ සදාචාර පාලනය සහ අවදානම් කළමනාකරණය සහතික කරන නියාමන අවශ්‍යතා, දේශීය නීති හා අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මත පදනම් වේ. තිරසාර වාර්තාකරණ රාමුවක් ස්ථාපිත කර ඇත. (මධ්‍යම තිරසාරතා කමිටුව, ප්‍රාදේශීය තිරසාරතා නිලධාරීන්, ශාඛා/දෙපාර්තමේන්තු තිරසාරතා නිලධාරීන් ඇතුළුව) මෙම රාමුවට ප්‍රධාන තොරතුරු රැස්කිරීමේ ක්‍රියාවලියක් ඇතුළත්ය.	කරුණාකර පිටු අංක 18 සිට 21 දක්වා සභාපතිවරයාගේ සමාලෝචනය සහ පිටු අංක 22 සිට 25 දක්වා ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය, පිටු අංක 115 සිට 120 දක්වා මූල්‍ය ප්‍රාග්ධනය, පිටු අංක 213 සිට 250 දක්වා ආයතනික පාලනය, පිටු අංක 178 සිට 212 දක්වා අවදානම් කළමනාකරණය සහ පිටු අංක 72 සිට 79 දක්වා අපගේ කැපවීම් කොටස බලන්න.	16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS
ආර්ථික තිරසාරභාවය	බැංකුව මෙතෙක් භාවිතා නොකළ ගනුදෙනුකාර අංශ භාවිතය තුළ ශක්තිමත්ව සහභාගි වූ අතර, එහිදී හරිත ණය ලබාදීම, SMEs සහ MSMEs ට සහයවීම, ආනයන/අපනයන අංශවලට සහයවීම, සිදුකර ඇත. එමෙන්ම අතිරික්ත ද්‍රවශීලතාවයේ වාසිය ගැනීමට කෙටිකාලීනව ආයෝජනය කිරීම් සිදුකළ අතර, විදේශ විනිමය සංචිත සංවර්ධනය හා ගොඩගැනීම තුළ ජාතික බැඳියාවන්ට ආධාර කිරීමට අතීශයින් දුෂ්කර සාර්ව ආර්ථික වාතාවරණයක් තුළින් රජයට හවුල් විය. කරුණාකර පිටු අංක 115 සිට 120 දක්වා මූල්‍ය ප්‍රාග්ධනය සහ පිටු අංක 260 සිට 394 දක්වා මූල්‍ය වාර්තා කොටස බලන්න.		

තිරසාරතා සංවර්ධන උපායමාර්ගය පිළිබඳ ප්‍රකාශය

GRI 2-22

බැංකුවේ මහජන සුභසාධන වැඩසටහනට රට තුළ පුළුල්ව පැතිරුණු දිළිඳුකම පිටුදැකීමේ අරමුණ සමඟ, බැංකුව සමාජ ශුභසාධනය තුළ අර්ථවත් අයුරින් ආයෝජනයෙහි යෙදීම කළ යුතු වේ. 2024 ආර්ථික මහා විනාශය රටේ දිළිඳුකමේ පැතිරීම තවදුරටත් වැඩි කළ අතර, එය පහත හෙළීම සඳහා වූ රජයේ ක්‍රියාමාර්ගවලට බැංකුවට හවුල් වීමට සිදුවිය.

අපගේ අරමුණු නොනැවත කරගෙන යමින් සහ බැංකුවේ ක්‍රියාවලීන්ට නවීනත්වය, මානසිකත්වය සහ සමාජ සම්බන්ධතා ගොඩ නගමින්, සේවා ප්‍රමිතීන් වර්ධනය කිරීමට අපි තිරසාර සංවර්ධන උපායමාර්ගය ඉදිරියට ගෙන ගිය අතර, එහි තිරසාර අනාගතය අපි සහතික කළෙමු. අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපි උනන්දුවෙන් අපගේ ප්‍රගතිය පසු විපරම් කළෙමු.

තිරසාරතා කුළුණු සහ නිමැවුම

2020-2024 සැලැස්ම තුළ ඇතුළත් කර ඇති තිරසාරතා කුළුණු දැඩිව පිළිගත් අතර එය අපගේ සාර්ථකත්වයේ ප්‍රධාන සාධකයක් විය.

කුළුණු විස්තරය	තාර්කිකත්වය	නිමැවුම
තිරසාර තැන්පතු වර්ධනය	බැංකුව සිය වර්ධන සැලසුම්වලට අරමුදල් යෙදවීම සඳහා සාපේක්ෂව අඩු පිරිවැය අරමුදල් මූලාශ්‍රයක් ලෙස තැන්පතු ආකර්ෂණය කර ගැනීම අඛණ්ඩව සිදු කරයි.	තැන්පතු කළඹ වාර්ෂිකව 7.6%කින් රු. බිලියන 2,854.7 දක්වා වැඩි වී ඇත
ශක්තිමත් අවදානම් කළමනාකරණය	අවදානම් කළමනාකරණ පද්ධති අඛණ්ඩව සමාලෝචනය කරනු ලබන අතර, නියාමන උපදෙස් මෙන්ම ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ මනා පරිචයනන්ට අනුකූලව ශක්තිමත් කෙරේ.	2024 දී නියාමන කඩකිරීම්, දත්ත ආරක්ෂාව කඩකිරීම් හෝ පාලන ගැටළු කිසිවක් නොමැත. වංචාව පිළිබඳ කිසිදු වැදගත් සිදුවීමක් වාර්තා නොවූ අතර, කාර්ය මණ්ඩලය පශ්චාත් විමර්ෂන සහ විනය ක්‍රියාමාර්ග අවසන් කර ඇත.
යහපත් ණය කළඹ	බැංකුවේ ණය අවදානම් පරාමිති අනුව ණය කළඹ අඛණ්ඩව නියාමනය කරනු ලබන අතර, සියලුම නව ණය දැඩිව ඇගයීමට ලක් කෙරේ.	අක්‍රීය ණය අඩු වූ අතර අලුත් අක්‍රීය ණය නොමැත
කළඹ විවිධාංගීකරණය	බැංකුව තරුණයින්, ආයතන, සහ අපනයනකරුවන් ඇතුළුව නව අංශවලට කළඹ විවිධාංගීකරණය ආරම්භ කර ඇති අතර, මෙම උපාය කළඹ අවදානම නැවත තුලනය කරනු ඇත.	100 ට වැඩි නව ආයතනික ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගත් අතර එයින් 60%කට පහසුකම් ලබාදෙන ලදී.
පුහුණුව හා සංවර්ධනය	සියලුම බැංකු කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණු කරනු ලබන අතර සන්නාම හිමිකම සහ කීර්තිනාම අවදානම් කළමනාකරණය කරන බව සහතික කිරීමට එහිදී පසු අන්ත තාක්ෂණික මෙහෙයුම් පමණක් නොව ඉදිරි අංශ සේවා ප්‍රමිති පුහුණුවට ඇතුළත්ය.	නව ගනුදෙනුකරුවන් 640,220ක් ඇතුළත්වීම හේතුවෙන් සේවා තත්ත්වය සහ සේවක අභිප්‍රේරණය වැඩි විය.
නියාමන අනුකූලතාව	අනුකූලතාව සම්පූර්ණයෙන් බලගැන්වීමට සේවක පුහුණුව සමඟ බැංකුව සිය ඩිජිටල් වේදිකා තවදුරටත් වර්ධනය කිරීමේ ක්‍රියාවලියක නිරත වේ.	2024 දී අනුකූලතා කඩවීම් කිසිත් නොමැත
ප්‍රජා සමාජ වගකීම (CSR)	CSR පිළිබඳ මහජන බැංකුවේ සම්ප්‍රදාය සන්නාම අනන්‍යතාවයේ සංරචකයක් ලෙස කරගෙන යනු ලබන අතර, බැංකුව නවීන මූල්‍ය සේවා සපයන්නෙක් ලෙස පරිවර්තනය කරයි.	ආයතනික සමාජීය වගකීම් (CSR) කටයුතුවල රු. මිලියන 36.0ක් ආයෝජනය කරන ලදී.

කාර්යසාධනය වැඩි කිරීමේ කෙටි හා මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග

උපායමාර්ගික රාමුව තුළ දිගුකාලීන තිරසාරභාවය සඳහා අපගේ උපායමාර්ගික පරමාර්ථ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට යොදවන ලද ප්‍රධාන සක්‍රීයකරුවන් සමඟ, අපගේ වඩා පුළුල් අරමුණුවලට ඵලදායීව සහයවීමට අපගේ කෙටි, සහ මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග සමඟ අපි පෙළ ගැසී ඇත්තෙමු.

කෙටි කාලීන	මධ්‍ය කාලීන
(1) සක්‍රීය ණය අවදානම් කළමනාකරණය සහ ණය අයකිරීම	(1) ශක්තිමත් ණය සහ අවදානම් පාලනය
(2) ඉහළින් වටිනා ගනුදෙනුකරුවන් අත්කර ගැනීම සහ ව්‍යාපාර ප්‍රසාරණය	(2) වෙළෙඳපොල විනිවිදයාම සහ ආදායම් විවිධාංගීකරණය
(3) අනුකූලතාව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය වැඩි කිරීම	(3) තැන්පතු වර්ධනය සහ ද්‍රවශීලතා ප්‍රශස්තකරණය
(4) පිරිවැය තාර්කීයකරණය සහ කාර්යක්ෂමතාවය වැඩි කිරීම	(4) මෙහෙයුම් විශිෂ්ටත්වය සහ ඩිජිටල් පරිනාමනය
(5) ශ්‍රම බලකායේ හැකියාව සහ සහභාගිත්වය වැඩි කිරීම	(5) ඉහළින් කාර්යසාධන සංස්කෘතියක් පෝෂණය කිරීම සහ අනාගතයට සූදානම්වීම

අනාගත දැක්ම

බැංකුවේ මේ දක්වා ඉහළම ලාභදායිතාව වන විශිෂ්ට ප්‍රතිඵලයක් ලබාදීමේ ඉහළ වාර්තාවක් මත අපගේ 2022-2024 සැලැස්ම ක්‍රියාත්මක කරමින් අපි 2024 අවසන් කළ බැවින්, වර්තමාන මූල්‍ය වසර සහ ඉන් ඉදිරියට වඩා ඉහළ ජයග්‍රහනයන්, අපගේ සන්නාම වටිනාකම, දෘශ්‍යතාව ශක්තිමත් කිරීම සහ අපගේ පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකමක් ලබාදීම අපි අපේක්ෂා කරන අතර, ජාතික ආර්ථික ප්‍රතිසාධනයට සැලකියයුතු අයුරින් දායක වෙමු.

අපගේ වටිනාකම් නිර්මාණ ආදර්ශය



ක්‍රියාවලි

ව්‍යාපාර කටයුතු සහ සහය සේවා මගින් මෙහෙයවන

ව්‍යාපාර කටයුතු

පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය, ආයතනික බැංකුකරණය, එතෙර ගනුදෙනුකාර සේවා, ජාත්‍යන්තර බැංකුකරණය, භාණ්ඩාගාරය ව්‍යවසාය බැංකුකරණය, ණය කාඩ්

සහය සේවා

මානව සම්පත්, IT සහ ඩිජිටල් බැංකුකරණය, ප්‍රසම්පාදනය, පරිපාලනය, අලෙවිකරණය සහ සන්නිවේදනය, අවදානම් කළමනාකරණය, සහ අනුකූලතාව, උපායමාර්ගික සැලසුම්කරණය, මූල්‍ය කළමනාකරණය, ප්‍රාග්ධන කළමනාකරණ, ප්‍රජාව සහ CSR

පිරිවැය ධාවක

පොළී වියදම, යටිතලපහසුකම් හා තාක්ෂණය, මානව සම්පත්, පරිපාලන වියදම්, අලෙවිකරණ පිරිවැය

ආදායම් ධාවක

පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය, ව්‍යවසාය බැංකුකරණය, ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාරය සහ ආයෝජන බැංකුකරණය, විදේශීය වෙළෙඳාම සහ OCS සේවා

ප්‍රධාන අවදානම්

ණය අවදානම, පොළී අනුපාත අවදානම, ද්‍රවශීලතා අවදානම, තොරතුරු ආරක්ෂක අවදානම, තිරසාර අවදානම, මෙහෙයුම් අවදානම, රටේ අවදානම,

නිමැවුම

මූල්‍ය ප්‍රාග්ධනය

පිටු 115
සිට 120

බදු පෙර ලාභය
රු. බිලියන 41.6

බදු පසු ලාභය
රු. බිලියන 25.1

වත්කම් මත ඉපයීම් (බදු පෙර) **1.3%**

ස්කන්ධය මත ඉපයීම් (බදු පසු) **14.7%**

නිෂ්පාදන ප්‍රාග්ධනය

පිටු 121
සිට 126

දේපල, පිරියත හා උපකරණවලට එකතු කිරීම
රු. බිලියන 2.6

ATMs, CDMs හා CRMs හරහා ගනුදෙනු
රු. බිලියන 2,142.69

සියලුම පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව

මානව ප්‍රාග්ධනය

පිටු 133
සිට 144

නව බඳවාගැනීම්
292

ස්ත්‍රී පුරුෂ අනුපාතය (පුරුෂ : ස්ත්‍රී) **2:3**

උසස්වීම්
1,194

සේවක රඳවාගැනීමේ අනුපාතය **96.0%**

බුද්ධිමය ප්‍රාග්ධනය

පිටු 127
සිට 132

සමස්ත ගනුදෙනුකාර තෘප්තිය
93%

ඩිජිටල් විසඳුම් ලියාපදිංචිය **4.4**

සම්මාන හා පිළිගැනීම් **33**

අන්තර්ජාල/ජංගම බැංකුකරණය තුළින් සිදුකළ ගනුදෙනු ගණන මිලියන **98.3**

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

පිටු 45
සිට 168

ආයෝජකයින්

කොටසකට ඉපයීම්
රු. මිලියන 25.1

කොටසකට ශුද්ධ වත්කම්
රු. මිලියන 182

ව්‍යාපාර හවුල්කරුවන්

දේශීය මිලදීගැනීම්වල මුළු වටිනාකම
රු. බිලියන 20.9

විදේශීය මිලදීගැනීම්වල මුළු වටිනාකම
රු. බිලියන 1.4

නව වොස්ට්‍රෝ නියෝජිත සම්බන්ධතා **08**

ගනුදෙනුකරුවන්

අක්‍රීය ණය අනුපාතය **5.1%**

ඩිජිටල් ගනුදෙනු ගණන **මිලියන 161.1**

ඩිජිටල් ගනුදෙනුවල වටිනාකම
රු. බිලියන 1,306.8

ප්‍රජාව

වසර තුළ පවත්වන ලද CSR ව්‍යාපෘති ගණන **21**

ප්‍රජාව පදනම් සංවර්ධන ණයදීම් යටතේ ලබාදුන් ණය ගණන **23,303**

සීමාවාසික පුහුණු සම්පූර්ණ කළ උපාධි අපේක්ෂයින් ගණන **243**

ස්වභාවික ප්‍රාග්ධනය

පිටු 169
සිට 176

සූර්ය බලයෙන් උත්පාදිත ගණන
මෙ.වො. 2,539

හරිත මූල්‍යකරණය යටතේ නව පහසුකම්
රු. බිලියන 3.6

කාබන් පාසටහනේ අඩුවීම **43%**

ප්‍රතිචක්‍රීයකරණය කළ කඩදාසි **කි.ග්‍රෑ. 2,182**

නිමැවුම

කොටස්හිමියන්

- ආයෝජන මත ලැබීම
- අනාගත අවධානිත සම්පත් වෙන් කිරීම
- ජාතික සංවර්ධන අරමුණුවලදී හවුල්වීම

ගනුදෙනුකරුවන්

- නව්‍යකරණ මූල්‍ය නිෂ්පාදන හා සේවා සඳහා ප්‍රවේශය
- තරඟකාරී අනුපාත සහ ගාස්තු
- ආරක්ෂාව සහ විශ්වාසය
- ඩිජිටල් පහසුව

සේවකයින්

- රැකියා ආරක්ෂාව සහ වෘත්තීය වර්ධනය
- තරඟකාරී පාරිශ්‍රමික හා ප්‍රතිලාභ
- ධනාත්මක සේවා පරිසරය
- වැඩ-ජීවිත සමබරතාව වර්ධනය

ව්‍යාපාර හවුල්කරුවන්

- කාලීන ගෙවීම්
- ශක්තිමත් හා විශ්වාසී හවුල්කාරත්වය
- වගකීම්සහගත ව්‍යාපාර ව්‍යවහාර

ප්‍රජාව

- මූල්‍ය අන්තර්ගතභාවය
- ව්‍යාපාර වර්ධනය

නියාමක

- මනාව ස්ථාපිත පාලනය සහ පාලන ක්‍රම
- මූල්‍ය ස්ථායීතාව
- පාරිභෝගික ආරක්ෂාව/දත්ත ආරක්ෂාව

සහය දෙනු ලබමින්

මෙහෙයවන ලද - ව්‍යාපාර කටයුතු සහ සහය සේවා - මගින් - ප්‍රතිඵල - නිමැවුම - සඳහා - ව්‍යාපාර සදාචාර හා තිරසාරත්වය - ප්‍රතිපත්ති - දැඩි - ශක්තිමත් චලන ව්‍යුහය - මහජන සුභසාධන මණ්ඩලය

අපගේ වටිනාකම් නිර්මාණ ආදර්ශය අපගේ ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂිත වටිනාකම ලබාදීමේ ක්‍රියාවලිය හඳුනාගැනීමට, ක්‍රියාත්මක කිරීමට සහ දරා ගැනීමට භාවිතා කරනු ලබන අතර, තිරසාර ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීමට අපට ඉන් හැකියාව ලබා දේ. මෙය අපගේ ඒකාබද්ධ උත්සාහයන්හී එකතුව සහ අපගේ පාර්ශ්වකරුවන්ට අපි පිරිනමන අසමසම වටිනාකම් කොටස් නියෝජනය කරන අතර අප උත්පාදනය කරන ආකාරය අවබෝධ කර ගැනීමට සහය වේ. ආර්ථික, සමාජ, පාරිසරික වටිනාකම සහ ජනතාව සඳහා සහ ජනතාවගේ බැංකුවක් ලෙස අපගේ මාර්ගයේ රඳාපැවතීම.

තිරසාරභාවය කෙරෙහි අපගේ බැඳීම

පරිසර සහ සමාජමය මානවිකත්වය පාලන ලක්ෂණ සමඟ ඒකාබද්ධ කිරීම සඳහා විශ්වයෙන් අදාලවන ස්ථාවර මූල්‍ය සංකල්ප වලට අනුකූලව, එම බැංකුව තම මූල්‍ය බලපත්‍රය සහ දිවයින පුරා පැවතුණු පරිසරය භාවිතා කරමින් ස්ථාවරත්වය සාරධර්මය තම මෙහෙයුම් ක්‍රියාවලීන් තුල සාර්ථකව ඒකාබද්ධ කරියි. විනාශවීමට ලක්ව ඇති දිවයින ආරක්ෂා කිරීම, බැංකුවේ දිගුකාලීනත්වය සඳහා අපගේ පාරිභෝගිකයින්ගේ හා හවුල්කරුවන්ගේ සතුට හා සාර්ථකත්වය ඇති විශාල වගකීම පිළිබඳව ද බැංකුව දැනුවත්ව කටයුතු කරයි.

අපගේ ප්‍රවේශය

බැංකු ආයතනයක් ලෙස, තිරසාරතාව කරා අපගේ කැපවීම ප්‍රජාවගේ සංවර්ධනයට අප ණය දෙන සහ දායක වන ආකාරය, සහ සංරක්ෂිත පරිසරයක් සහතික කිරීම කරා දායක වෙන ව්‍යාපෘති තුළ ආයෝජනය මගින් පිළිබිඹු කෙරේ. අපගේ මෙහෙයුම්වල, තිරසාර මූල්‍යකරණයේ කොඳුනාරටිය ලෙස අපගේ පාර්ශ්වකරුවන්ගේ සෞභාග්‍යය තිරසාරභාවයට අපගේ ප්‍රවේශයේ ප්‍රධාන අංගයක් වේ. එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන් සංකල්පය හා එක්ව, තවත් එක් තීරණාත්මක අංගයක් වන්නේ බැංකුවට සාධාරණ අනුපාතයක ප්‍රතිඵල ලැබෙන අවස්ථාවන් වැඩි කිරීම සහ, හරිත මූල්‍යකරණය තුළින් පාරිසරික ප්‍රතිලාභ ශක්තිමත් කිරීමයි. වගකීම් විරහිතව පරිසරය හානියට පත්කරන කර්මාන්ත සඳහා අපි ණය ලබා නොදෙන අතර අපගේ ණය ඇගයීමේ ක්‍රියාවලිය ESG (පාරිසරික, සමාජීය සහ පාලන) ප්‍රතිෂ්ඨාවන් තුළ ක්‍රියාත්මක කරමු.

පාරිසරික ප්‍රතිෂ්ඨාවන්ට කාලගුණ වෙනස්වීම් අවම කිරීම සහ අනුවර්තනය මෙන්ම ජෛව විවිධත්වය, දූෂණය වැලැක්වීම් සහ චක්‍රීය ආර්ථිකය ඇතුළත් වේ. සමාජ ප්‍රතිෂ්ඨාවන් යන්නෙන් අසමානතා ගැටළුව, ඇතුළත්වීම්, කම්කරු සම්බන්ධතා, මානව ප්‍රාග්ධනය හා ප්‍රජාවන් තුළ ආයෝජනය මෙන්ම මානව හිමිකම් ගැටළු අර්ථවත් වේ. කළමනාකරණ ව්‍යුහයන්, සේවක සම්බන්ධතා සහ විධායක පාරිශ්‍රමිකය ඇතුළුව රාජ්‍ය සහ පෞද්ගලික ආයතන පාලනය තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ සමාජීය හා පාරිසරික ප්‍රතිෂ්ඨාවන් ඇතුළත් කිරීම සහතික කිරීමේදී මූලික කාර්යභාරයක් ඉටු කරයි.

විෂයපථය

පරිසරයට වඩාත් බලපෑම් කරන අංශ සහ උප අංශවලින් පරීක්ෂාකාරීව තෝරා ගෙන ඇතුළත් කිරීම කෙරෙහි තිරසාර මූල්‍ය සඳහා අපගේ අවධානය යොමු වේ.

- කාලගුණ වෙනස අවම කිරීම (විශේෂයෙන් වැලැක්වීම, අඩුකිරීම හෝ ශක්තිමත් කිරීම) සහ අනුවර්තනය (එහි ඔරොත්තුදීම වැඩිකිරීම හෝ අන් අය අනුවර්තනයට ශක්තිමත් කිරීම)
- දූෂණය වැලැක්වීම සහ පාලනය
- පාරිසරිකමය සංරක්ෂණය හා සම්පත් කාර්යක්ෂමතාව

- ස්වභාවික සම්පත් සහ යහපත් පරිසර පද්ධති ආරක්ෂාව, ප්‍රතිසංස්කරණය, සහ ප්‍රවර්ධනය
- චක්‍රීය ආර්ථිකයකට සංක්‍රාන්තිය
- මූලික මානව හිමිකම්වලට ගරු කිරීම, ආරක්ෂාව සහ සවිබලගැන්වීම
- ජීවන තත්ත්වය ශක්තිමත් කිරීම
- අත්‍යාවශ්‍ය සේවා කරා ප්‍රවේශය

මෙය තහනම්කළ ලැයිස්තුවක් නොවන අතර, බැංකු සිය අභිමතිය පරිදි, තිරසාරභාවය සහතික කිරීමට සිය මූල්‍ය මැදිහත්වීම අවශ්‍යවන යම් වෙනත් ක්ෂේත්‍ර ඇතුළත් කළ හැකි අතර අවශ්‍යතාව මතුවන පරිදි අංශ/උප අංශ සමාලෝචනය කරයි

එබැවින්, පහත අංශ/උප අංශවලට සහයවීම සඳහා අපි දැනට ස්ථාන ගවේශණය කරමු:

- වනාන්තර සහ දැව කැපීම
- කෘෂිකර්මය
- නිෂ්පාදනය
- විදුලි බල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම
- ගෘස්, වාෂ්ප සහ වායු සමීකරණ සැපයීම
- ICT
- ජල සැපයුම සහ අපද්‍රව්‍ය කළමනාකරණය
- ඉදිකිරීම්
- ප්‍රවාහනය සහ ගබඩා
- මූල්‍ය සේවා
- සංචාරක සහ විනෝදාස්වාදය
- අනෙකුත්

2022 මැයිවල මහ බැංකුව විසින් නිකුත් කළ ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය සමඟ අපි අනුකූල වන අතර, එය හඳුනාගත් අංශ සඳහා විස්තරය, පරාමිති, සහ සීමාවන් අපගේ අභ්‍යන්තර ක්‍රියාවලිවලට එකතු කළෙමු.

තිරසාර පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය බැංකුවේ සමස්ථ මෙහෙයුම්වලට ඵලදායී සහ කාර්යක්ෂම හැකියාව සහ තිරසාර මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකවම වගකීමට බැඳී සිටී. මෙයට අපගේ පරිසරය, පෙව විවිධත්වය, ඔරොත්තු දෙන ප්‍රජාවක් නිර්මාණය කෙරෙහි සෘජුව බලපාන බැංකුවේ තාක්ෂණික, මෙහෙයුම් සහ මානව සම්පත් අංග ඇතුළත් වේ.

එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි මගින් තිරසාරභාවය පරිපාලනය කරන සහ මිණුම්කරන ශක්තිමත් පාලන රාමුවත් නිශ්චය කිරීම සඳහා ද වගකිව යුතුය.

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීසහ මූලික කළමනාකාරී පිරිස ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි පාලනය, සමාලෝචනය සහ යාවත් කිරීම් ක්‍රියාත්මක කිරීමට, තිරසාරභාවයට බලපාන අවදානම් කළමනාකරණය කිරීමට සහ එහි සිදුවීම් සහ විසඳුම කාලීන හා නිවැරදිව අනාවරණය කිරීමට වගකීමට බැඳී සිටී.

බැංකුව සතුව විශේෂිත තිරසාර දෙපාර්තමේන්තුවක් ඇති අතර, එය අපගේ සියලුම ව්‍යාපාර සහ මෙහෙයුම් ක්‍රියාව හරහා තිරසාරභාවය මෙහෙයවීමේ ඉදිරිපෙළ ධාවකයා වේ. මෙම දෙපාර්තමේන්තුව තිරසාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම, තිරසාරභාවයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලි යාවත් කිරීම, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මානව සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය, සහ ප්‍රජාවට සහ පරිසරයට බලපාන ව්‍යාපෘති අර්ථවත් අයුරින් සහ සාර්ථකව ක්‍රියාත්මක කරන බව සහතික කිරීමට වගකීමට බැඳී සිටී.

ශාඛා සහ සේවා මධ්‍යස්ථාන ජාලය

හරිත ණය, පුනර්ජනනීය බලශක්ති මූල්‍යකරණය, සහ වෙනත් තිරසාර මූල්‍යකරණ නිෂ්පාදන ලබාගැනීමේ හැකියාව පිළිබඳව ගනුදෙනුකරුවන්ට දැනුම්දීමේ වගකීම ශාඛා සහ සේවා මධ්‍යස්ථාන ජාලය වෙත පවරා ඇත. ණය ලබාදීම යෝග්‍යතා නිර්ණායක පිළිපදිමින් සිදු කරන අතර, පරිසරයට හානිදායක සහ සමාජ ප්‍රමිති බිඳදමන ව්‍යාපෘති ඉවත් කෙරේ.

ණය ඇගයීම

ණය අනුමත කිරීමේදී පාරිසරික බලපෑම සලකා බලන ණය නිර්ණායක හා ඇගයීම්වට ESG මූලධර්ම ගොඩ නගනු ලබයි.

අවදානම් කළමනාකරණය

අවදානම සිදුවීමේ ප්‍රමාණාත්මතාව මත පදනම් වී අගය කරන අතර, ඒවා කාලගුණයට අදාළ සිදුවීම්, සිය මෙහෙයුම්වල ස්වභාවය, පරිමාණය, සංකීර්ණතාව සහ අන්තර් සම්බන්ධතාවය සලකා බලන පාරිසරික හා හරිත මූල්‍යකරණ කටයුතුවලින් ඇති වේ. ESG අවදානම් බැංකුවේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් යටතේ ස්ථර II තක්සේරුව යටතේ ගන්නා තීරණවලට ඉවහල් වේ. ESG අවදානම් අවම කිරීමට ඵලදායී අවදානම් කළමනාකරණ ව්‍යවහාරයක් සහ අභ්‍යන්තර පාලන තන්ත්‍රයක් අපි ක්‍රියාත්මක කරන අතර විභව/විකල්ප ESG අදාළ අවදානම්වල බලපෑම තක්සේරු කිරීමට ක්‍රියාදාම විශ්ලෙෂණය හා පීඩන පරීක්ෂණ අපි පවත්වමු.

බැංකුව කාලීන ආකාරයෙන් බහුමුහුණත් මෙහෙයුම් මෙවලම් රාශියකින් ඇතිවන අවදානම විසඳන අතර, විමෝචන, අපජලය සහ දූෂණ කාරක කෙරෙහි එහි කටයුතුවල පාසටහන පාලනය කරන සහ අවම කරන නායකත්ව සන්නාමයක් පෙරමුණ ගනී. මේ මගින් පරිසරයට හා පෙළෙව විවිධත්වයට ඇති හානිකර බලපෑම අවම කරයි.

පුහුණුව සහ හැකියා ගොඩ නැගීම

අපගේ සේවකයින්ට තිරසාර මූල්‍ය මනස ඇතුළත් කිරීමට පුහුණුව සහ හැකියා ගොඩ නැගීම අඛණ්ඩ ක්‍රියාවලියකි. අපගේ පුහුණු වැඩසටහන් තුළින්, අපි පාරිසරික පීඩන පරීක්ෂණ සහ ක්‍රියාදාම විශ්ලේෂණවල ප්‍රවීනත්වය ගොඩ නගන අතර, පාරිසරික හා කාලගුණ ආශ්‍රිත අවදානම් මාතෘකාවන්ට යෙදවීම සඳහා බාහිර ප්‍රවීන මූලාශ්‍ර අපි ලබා ගනිමු.

අනාවරණ සහ වාර්තාකරණය

අවදානම් සිදුවීම් තත්‍ය කාලීනව අනාවරණය කර වාර්තා කරන අතර, තිරසාර වාර්තාකරණය සඳහා වැදගත් රාමුවක් වන ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය සහ කාලගුණ ආශ්‍රිත අනාවරණ මත කාර්ය බලකාය වැනි ජාත්‍යන්තර වාර්තාකරණ ප්‍රමිති සමඟ අනුකූලව විස්තීර්ණ තිරසාර වාර්තාකරණයක් වාර්ෂික වාර්තාවේ ඇතුළත්ය.

මිණුම්කරණය

බැංකුව සහ ගනුදෙනුකරුවන්ගේ තිරසාර ව්‍යාපෘතිවල බලපෑම මැනීමට පරාමිති කිහිපයක් භාවිතා කෙරේ. ගනුදෙනුකාර දත්ත රහස්‍යතාවය විසින් ඔවුන්ගේ දත්ත ප්‍රසිද්ධියේ අනාවරණය කිරීම අපට තහනම්වන බැවින් වාර්තාව තුළ බැංකුවේ ප්‍රතිඵල අනාවරණය කර ඇත.

- **පාරිසරික මිනුම්:** කාබන් විමෝචන. බලශක්ති පරිභෝජනය. ජල භාවිතය. අපද්‍රව්‍ය උත්පාදනය (කරුණාකර පිටු අංක 169 සිට 176 දක්වා ස්වභාවික ප්‍රාග්ධනය බලන්න)
- **සමාජීය මිනුම්:** ශ්‍රම ව්‍යවහාර, ප්‍රජා සහභාගිත්වය. විවිධත්වය සහ ඇතුළත්වීම (කරුණාකර පිටු අංක 133 සිට 144 දක්වා මානව ප්‍රාග්ධනය සහ පිටු අංක 145 සිට 168 දක්වා සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය බලන්න)
- **පාලන මිනුම්:** අධ්‍යක්ෂ මණ්ඩලයේ විවිධත්වය, විධායක පාරිශ්‍රමිකය, ව්‍යාපාර සදාචාර (කරුණාකර පිටු අංක 213 සිට 250 දක්වා ආයතනික පාලනය බලන්න)

කාර්යය ප්‍රගමනය

අපගේ මෙහෙයුම්වලට ESG මූලධර්ම අර්ථවත් ලෙස ඇතුළත් කර ගැනීමේදී අපි බහු මාන ප්‍රවේශයක් මත කටයුතු කළෙමු.

තිරසාර මූල්‍ය වැඩි කිරීම	➔ සමාලෝචන ප්‍රතිපත්ති ➔ තිරසාර ව්‍යාපෘති සඳහා ආයෝජනය දිරිමත් කිරීම ➔ පහළු සිට මධ්‍යම පාන්තික ගනුදෙනුකාර පදනම මූල අන්තර්ගතභාවය ➔ ණය ඇගයීමේ ක්‍රියාවලියට ESG අවදානම් ඒකාබද්ධ කිරීම ➔ හරිත මූල්‍යකරණය සඳහා ණය දීම වැඩි කිරීම ➔ ඩිජිටල් නවෝත්පාදනයන් සඳහා ආයෝජනය කිරීම ➔ කඩදාසි භාවිතය අඩු කිරීම ➔ CSR ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම ➔ බැංකුවේ ස්ථාවරත්වය සහ ප්‍රගතිය සහතික කිරීම සඳහා ප්‍රගතිය මැනීම.
පාර්ශ්වකාර මැදිහත්වීම	**අර්ථවත්ව සහභාගිවන අය:** ➔ රජය සහ ව්‍යවස්ථාපිත අධිකාරි ➔ පාරිසරික ආරක්ෂාව, ප්‍රජා සංවර්ධනය සහ හැකියා ගොඩනැගීම පිළිබඳ විශේෂඥතාව
කාලගුණ වෙනසේ අවදානම කළමනාකරණය	➔ වැසි සුලං සහිත කාලගුණ තත්ත්වයන් විසින් ඇතිකළ අවදානම් අවම කිරීමට හඳුනාගත් සහ ක්‍රියාත්මක ඵලදායී ක්‍රියාමාර්ග සහ සහය වූ පීඩාවට පත් ප්‍රජාවන් ➔ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, අපද්‍රව්‍ය කළමනාකරණය, සහ ජල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති වෙත දැඩිව ප්‍රවර්ධනය කළ හරිත මූල්‍යකරණය ➔ දැනුම සහ හැකියාවන් ගොඩ නැගීමට සේවකයින් වෙනුවෙන් දැනුවත් කිරීමේ සැසි කරගෙන යාම
හැකියා ගොඩනැගීම	➔ අපගේ සේවකයින්ට අඛණ්ඩ පුහුණු හා දැනුවත් කිරීමේ සැසි, මහ බැංකුව සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය හවුල්වෙමින් ක්ෂේත්‍රය තුළ සිදුකරන ලදී
වාර්තාකරණය හා අනාවරණය	➔ සුපිරි ඩිජිටල් හැකියාවන් මත පදනම් වී, ඒකාබද්ධ තොරතුරු පද්ධතිය අනාවරණය සහ වාර්තාකරණය සඳහා කාලීන සහ නිවැරදි දත්ත බෙදා හරින ලදී. ➔ සක්‍රිය විසඳුම් සඳහා උවදුරට පත්වන්නන් හඳුනාගැනීම සඳහා පරතර විශ්ලේෂණ

ESG සහ තිරසාර මූලිකාරම්භ

අපි 2024 වසර තුළ මූලිකාරම්භයන් කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, ඒවා එක් එක් ESG කුළුණු යටතේ වෙන් කර, තිරසාරභාවය සඳහා අපගේ ගැඹුරු බැඳීම සහ අපගේ ඩිජිටල් හා භෞතික පාසටහන මත එහි අර්ථවත් ක්‍රියාත්මක කිරීම පෙන්වන ලදී.

තේමාව	විස්තරය	නිමැවුම			
පරිසරය					
කඩදාසි රහිත මෙහෙයුම්	➔ නව ATMs, CDMs, සහ KIOSKs 18ක් පුළුල්ව පැතිරුණු ජාලයට එකතු කරන ලදී. ➔ ඉ-ප්‍රකාශන සහ ඩිජිටල් ණය පිරිසැකසුම සමඟ ගිණුම් විවෘත කිරීම ➔ ඩිජිටල් බැංකුකරණය දිරිගන්වමින් පහසු සහ නව්‍යකරණ බැංකුකරණයට දිරිමත් කිරීම සඳහා මනාව ආරක්ෂිත අන්තර්ජාල සහ ජංගම බැංකුකරණය ක්‍රමවත් කිරීම.	සිල්ලර පාරිභෝගිකයින්	ආයතනික ගනුදෙනුකරුවන් 5150ට වැඩිය	ඩිජිටල් වශයෙන් විවෘත කළ ගිණුම් මිලියන 1	ඩිජිටල් ගනුදෙනු මිලියන 161
		ගනුදෙනුවල වටිනාකම රු. බිලියන **1,269**			
ස්වභාවික ප්‍රාග්ධනය සංරක්ෂණය සඳහා නිෂ්පාදිත ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම	**සහතික කිරීම** ISO 14064 – 1:2018 and ISO 14064-3-2019 මාර්ගෝපදේශ පිළිපදිමින් සිය මෙහෙයුම්වලින් ඇති වන GHG විමෝචනය උනන්දුවෙන් නියාමනය කරන ලදී **බලශක්තිය හා විමෝචන කළමනාකරණය** ➔ දැරියහැකි සහ පිරිසිදු බලශක්තිය ප්‍රවර්ධනය කරන UN SDG 7 සමඟ අනුගත වී, ශාඛා 64කට 2,460 kw PV පුනර්ජනනීය බලශක්ති පද්ධති හඳුන්වා දෙන ලදී. ➔ අළුත්වැඩියාවන්ට වඩා වියදම්වල විදුලි ඒකක 206ක් බලශක්ති කාර්යක්ෂම අපවර්තකවලින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. ➔ සවිකළ ආලෝක වෙනුවට ශාඛා සහ වෙනත් පොදු නඩත්තු ප්‍රදේශවල බලශක්ති කාර්යක්ෂම LED 2x2 ආලෝකයෙන් ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. ➔ හරිත සහ බලශක්ති කාර්යක්ෂම මූලපිරීම්වලට සහයවීමට පිරිවැය ඵලදායී උපකරණ සහ ද්‍රව්‍ය ලබාදෙන ලදී. **නඩත්තුව** ➔ HVAC/පෙනරේටරය සහ CCTV පද්ධතිවල වැඩිවන අමතර කොටස් පිරිවැය අයවැය තුළ මනාව කළමනාකරණය කරන ලදී ➔ ස්ථාවර වත්කම් කළමනාකරණය, නඩත්තු කළමනාකරණය සහ ඩිජිටල් වේදිකාවල තොග පාලන පද්ධති සහිත සැපයුම්කරුවන් සමඟ නඩත්තු වැඩ ප්‍රමුඛ කරන ලදී ➔ යල්පැනපු උපකරණවල ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි කොටස් කාලගුණ කාර්යයන්ට බලපාන UN SDG 13 සමඟ අනුගතව ක්‍රියාත්මක උපකරණ නඩත්තුව සඳහා භාවිතා කරන ලදී. **අපද්‍රව්‍ය කළමනාකරණය** ප්‍රධාන කාර්යාලයේ උත්පාදිත අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය සඳහා වෙන් කරන ලදී.	**අනුකූල විමෝචන වාර්තාවක් ලබා ගැනීම.** ➔ CO_2 විමෝචනයෙන් මෙ.ටො. 1,099.1ක් අඩුකරන ලදී ➔ මාසයට රු. 1,824,482ක පිරිවැය ඉතුරුවක් සමඟ 28% කින් බලශක්ති පරිභෝජනය අඩුකරන ලදී. ➔ මාසයට රු. 116,226ක පිරිවැය ඉතුරුවක් සමඟ 25%කින් බලශක්ති පරිභෝජනය අඩුකරන ලදී. **පිරිවැය අඩුකිරීම** ➔ අඩුකළ කඩදාසි භාවිතයට ඩිජිටල් වේදිකාවන්ගේ පිරිවැය අඩුකළ භාවිතය. ➔ පිරිවැය අඩුකිරීම ඝණ අපද්‍රව්‍ය මුදාහැරීම අඩු කිරීම. ➔ පාරිසරික හායනය අවම කිරීමට අපද්‍රව්‍ය කළමනාකරණය.			

තේමාව	විස්තරය	නිමැවුම
තිරසාර ව්‍යවහාර ඇතුළත් කර ගැනීමට දැනුවත්කිරීමේ සැසි	බැංකුව මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර ඉන් වගකීම්සහගත පරිභෝජනය සහ නිෂ්පාදනය ගණනය කරන SDG 12 සමඟ පෙළ ගැසී චක්‍රීය ආර්ථික මූලධර්ම තුළින් වැඩිකළ බලශක්ති කළමනාකරණය, තිරසාර ජලය සහ ජල කළමනාකරණ ව්‍යවහාරය, සහ සම්පත් භාවිතය ප්‍රශස්ථ කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.	සීමිත සම්පත් වගකීම්සහගත භාවිතය තුළින් තිරසාර දැනුවත්කම පුරුදු පුහුණු කිරීමට සේවකයින්ගේ කුසලතා උසස් කිරීම.
නියාමන අනුකූලතාව	තිරසාර අනාගතයක් කරා ව්‍යාපාර මෙහෙයුම් නියාමනය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා රජය විසින් නියම කරන රෙගුලාසිවලට බැංකුව අනුකූල විය.	වැඩිකළ සන්නාම වටිනාකමින් ඇතිවන යහ පාලනය.
සිල්ලර පාරිභෝගිකයින් සඳහා තිරසාර බැංකුකරණ මුලපිරීම්	→ ජංගම යෙදුම් වන People's Wave සහ People's Pay සමඟ ඩිජිටල් සිල්ලර පාරිභෝගිකයින් මිලියන 3.3ට ලඟාවිය → මාසයකට ඩිජිටල් ගනුදෙනු මිලියන 13 ට වැඩිය → AI ChatBot → අලෙවි යන්ත්‍ර ස්ථානවල QR ගෙවීම් විසඳුම් → පාරිභෝගික ණය උත්පාදන පද්ධති (ROLS) සියලු ශාඛාවලට පුළුල් කරන ලදී	→ මූල්‍ය අන්තර්ගතභාවය සහ මහජන සුභසාධනය ප්‍රවර්ධනය කරමින් බස්නාහිර පළාතෙන් පිටත පදිංචි ගනුදෙනුකාර පදනමෙන් 75%ක් කරා ලඟාවීම. → පහසු වෙබ් අඩවි යාත්‍රණය සහ ගනුදෙනුකාර සහය. → විකුණුම් ස්ථානවල කාලීන කාර්යක්ෂමතාව සහ ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය. → ගනුදෙනුකාර ගිණුම්වලට ණය මුදල් වේගවත් සහ පහසු බෙදාහැරීම සඳහා ඉඩදීම.
ණය ගනුදෙනුකරුවන් සඳහා තිරසාර බැංකුකරණ මුලපිරීම්	බැංකුව තිරසාර මෙවලම්වල සමාහාරය ශක්තිමත් කිරීමට පහත වැඩසටහන් හඳුන්වා දෙන ලදී: → තිරසාර මූල්‍ය රාමුවක් (SFF) නියම කළ අතර එය බැංකුවේ මෙහෙයුම් සහ කටයුතුවලට ව්‍යවහාර ඒකාබද්ධ කිරීම කරා උපායමාර්ගික විතැන්වීමක් සලකුණු කරයි. → පාරිසරික, සහ සමාජීය කළමනාකරණ පද්ධති නිර්මාණය → බැංකව තුළ තිරසාර ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරන ලදී. → විශේෂිත තිරසාර වත්කම් නිෂ්පාදනයක් හඳුන්වා දුන්හ. එය "හරිත බලය" ණය යෝජනා ක්‍රමය ලෙස සන්නාම කළ අතර, මහ බැංකුවේ ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණයේ පරාමිති මත සැලසුම් කරන ලදී.	තිරසාර මූල්‍ය රාමුව පුනර්ජනනීය බලශක්තිය විශේෂයෙන් සූර්ය බලශක්තිය, ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති, කාබනික පොහොර, සහ තිරසාර නිෂ්පාදනය වැනි වර්ධනීය අංශවලට ඵලදායීව ඇතුළු විය. මෙයට පෙර සේවය නොකළ අංශ නව ව්‍යාපාර ස්ථාන රාශියක් නියෝජනය කළ අතර එය ණය වර්ධනය සහ ණය කළඹ විවිධාංගීකරණය වේගවත් කිරීමට හේතු විය. බැංකුවේ තිරසාර ණය කළඹ රු. බිලියන 3.5ක (113%) සැලකියයුතු ශුද්ධ වැඩිවීමක් වාර්තාකළ අතර එයට ගනුදෙනුකාර පදනම් 2%කින් වැඩිවීමට මඟපාදන ලද පාරිභෝගික ණය 1,250ක් සහ තිරසාර කර්මාන්ත සඳහා වාණිජ ණය සහ SME ණය 250ක් ඇතුළත්ය.
සමාජ		
මානව ප්‍රාග්ධනය ඇතුළත් වෙනස් ලෙස නොසලකන වැඩ සංස්කෘතිය	→ ඇතුළත් වෙනස් ලෙස නොසලකන බඳවාගැනීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සහ එහිදී සේවා නියුක්තිය ඉහළම දක්ෂ පංතියකට පිරිනමන ලදී. → පුහුණුව හා සංවර්ධනය	අපගේ ශාඛාවල විශාල ජාලය බොහෝසෙයින් ඒවා පිහිටි ප්‍රජාවන්ගෙන් කාර්ය මණ්ඩලය සමන්විත කරන අතර ඉන් එවැනි ප්‍රදේශවල රැකියා අනුපාතය සහ ආර්ථික කටයුතු වැඩි කරයි. සේවකයින්ට බොහෝ මාතෘකා පිළිබඳ ව්‍යුහගත පුහුණු පිරිනමන ලද අතර ස්වයං අධ්‍යාපනය සඳහා අවශ්‍ය මාර්ගගත හා ඩිජිටල් මෙවලම් ලබා දේ. එමෙන්ම බැංකුකරණයේ සෑම ක්ෂේත්‍රයක්ම මනාව අවබෝධකර ගත් අනාගතයට සූදානම් කණ්ඩායම් පිළියෙල කරමින් බැංකු අතර චක්‍රලේඛ තුළින් අදාළ මඟපෙන්වීම් පිළිබඳ මනාව දැනුවත් කෙරේ.

තේමාව	විස්තරය	නිමැවුම
ප්‍රජාව කාන්තා සවිබල ගැන්වීම තරුණයින් සවිබලගැන්වීමේ මූලපිරිම් ප්‍රජා සමාජ වගකීම (CSR)	➔ අපේක්ෂිත කාන්තා ව්‍යවසායිකාවන්ගේ කුසලතාව නැංවීමට, දැනුවත් කිරීමට සහ මූල්‍ය සහය ලබාදීමට කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රතිපත්තිය හඳුන්වාදෙන ලදී. ➔ මූල්‍ය සහය ලබාදීමට කාන්තාවන් මෙහෙයවන ව්‍යාපාර අංශ හඳුනාගැනීමට එක් එක් ප්‍රාදේශීය ණය ඒකකයේ පත්කළ මධ්‍යගත හා ප්‍රාදේශීය කාන්තා ශූරතාවය. ➔ විශේෂ නිෂ්පාදනයක් වන, වනිතා වාසනා දියත් කරන ලදී. ➔ SME පුහණුව තුළින් මූල්‍ය සාක්ෂරතා පුහුණුව සහ ඩිජිටල් පුහණුව පිරිනමන ලද අතර ඔවුන්ගේ ව්‍යාපාර කළමනාකරණ කුසලතා උසස් කිරීමට දැනුම බෙදා දේ. ➔ වයස අවුරුදු 45ට අඩු අය වෙත සවිමත් කළ People's Spark ණය යෝජනා ක්‍රමය දියත් කරන ලද අතර මූල්‍ය සහ මූල්‍ය නොවන සහය පිරිනමමින් ආරම්භක සහ තරුණ ව්‍යවසායකයින්ට මෙය ගලපා ඇත. ➔ බැංකුව ප්‍රධාන CSR ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කළේය. මේ පිළිබඳ විස්තර සඳහා කරුණාකර පිටු අංක 161 සිට 168 දක්වා ප්‍රජා ප්‍රාග්ධන කොටස බලන්න.	කාන්තාව නිතරම නිවාස සාදන්නාගේ සහ උපයන්නාගේ කාර්යභාරයන් සම්බන්ධ කරන බැවින් ස්ත්‍රීපුරුෂ සමානතාව සහතික කරමින් සහ කාන්තාවන් සවිබල ගන්වමින්, බැංකුව පවුල සහ සමාජයේ තිරසාරභාවය කරා දායක වී ඇත. මෙම නිෂ්පාදනය තුළින් කාන්තා ව්‍යවසායකයින් 825 කට සහය වී ඇත. කාන්තාවන් 500ක් එවැනි වේදිකාවල පුහුණු කරන ලදී තරුණ ව්‍යවසායකයින් 750කට මෙම යෝජනා ක්‍රමයෙන් සහය වී ඇත.
පාලනය		
ශක්තිමත් ප්‍රතිපත්ති රාමුව	බැංකුවට ශක්තිමත් ආයතනික පාලන රාමුවක් සහ ආයතනික තිරසාර රාමුවක් ඇත.ආයතනික සහ විධායක කළමනාකරණය සම්පත් වෙන් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමට බැඳී සිටී. සියලුම නියාමන අවශ්‍යතාවන්ට දැඩිව අනුකූල වන අතර, වීකාබද්ධ වාර්තාකරණය ගෝලීය වාර්තාකරණ දර්ශකයෙන් අවශ්‍ය පරිදි වේ.	මනාව පාලනය වන මනාව ප්‍රාග්ධනීයකරණය කළ සහ මහජන සුභසාධනය සඳහා අභිරුචියක් සහිත උපරිම දක්ෂ පංතියක් විසින් සපිරි සහ මෙහෙයවන සහ යහපත් වාණිජ ප්‍රවීනයින් සහිත බැංකුවක්, ශක්තිමත් සදාචාර සහ යහපාලන පදනමක් මත පදනම් වී ඉහළම ගනුදෙනුකාර සේවාව ලබා දේ.

තිරසාර මූල්‍ය සඳහා පාලන රාමුව

GRI 2-23

තිරසාරභාවය සඳහා වන පුළුල් පාලන ව්‍යුහය යටතේ, හරිත අරමුදල් අධීක්ෂණය කිරීම සඳහා බැංකුව තිරසාර අරමුදල් පාලන ව්‍යුහයක් ස්ථාපිත කර ඇත.

BHAG	නිමැවුම
අධ්‍යක්ෂ මණ්ඩලය (BOD)	තිරසාර මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීමේ සමස්ත වගකීම මණ්ඩලය සතු වන අතර, බැංකුවේ අරමුණු සහ වටිනාකම් සමඟ පෙළගැස්වීමේදී ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ නිර්වචනය කිරීමේ වගකීම ද එය සතු වේ.
තිරසාර මූල්‍ය කමිටුව (SFC)	අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ තිරසාර මූල්‍ය කමිටුව යනු ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ ප්‍රධානත්වයෙන් යුත් විධායක මට්ටමේ කමිටුවක් වන අතර, එය පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය, අවදානම් කළමනාකරණය, ණය, මූල්‍ය හෝ භාණ්ඩාගාරය සහ අනුකූලතා කාර්යය මගින් නියෝජනය කරයි. තිරසාර මූල්‍යකරණය පිළිබඳ අධීක්ෂණ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලයට වගවීම සමඟ SFC සතුය.

හරිත මූල්‍ය ඇගයීම් කමිටුව (GFEC)	අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවේ (BECC) අනුග්‍රහය යටතේ ස්ථාපිත කරන ලද මෙහෙයුම් මට්ටමේ කමිටුවක් වන, හරිත මූල්‍ය ඇගයීම් කමිටුව විසින් මහ බැංකුව විසින් වර්ගීකරණය කළ පරිදි හරිත මූල්‍යකරණය සඳහා සුදුසුකම් ලත් ව්‍යාපෘති ඇගයීමට ලක් කරන අතර, BECC සහ SFC වෙත අතුරු වාර්තා ඉදිරිපත් කරයි. කමිටුවට බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/සහකාර සාමාන්‍යාධිකාරී (පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය), සහකාර සාමාන්‍යාධිකාරී (ක්‍රියාවලි කළමනාකරණ සහ තත්ත්ව සහතික), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණය) සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ඒකකයේ ESMS නිලධාරී යන අය ඇතුළත් විය යුතුය. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යවසාය බැංකුකරණය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, සංවර්ධන සහ ක්ෂුද්‍ර මූල්‍ය) ආරාධනාව මත රැස්වීම්වලට සහභාගී වනු ඇත.

අපගේ මිහිතලය හා අනාගත පරම්පරාවේ යහපැවැත්ම සහතික කිරීමට තිරසාරභාවය අත්‍යවශ්‍යය. මහජන සුභසාධනය සිය හරය වන බැංකුවක් ලෙස, බැංකුකරණය සහ ලාභදායීතාවයෙන් ඔබ්බට ගිය පෙර දැක්ම සහ දූරදර්ශීභාවයෙන් යුත්, ඔරොත්තු දෙන බැංකු ආයතනයක් නිර්මාණය කිරීම සඳහා, පාරිසරික, සමාජීය සහ ආර්ථික අවශ්‍යතා සමතුලිත කරන ව්‍යවහාර අපි වැළඳගෙන ඇත්තෙමු.

ප්‍රතිපත්තිමය බැඳීම් ඇතුළත් කිරීම

GRI 2-24

ආයතනික තිරසාර රාමුව සංවර්ධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටින අතර, ආයතනික හා විධායක කළමනාකරණය ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම සමහ අරමුදල් වෙන්කිරීමේ දී ප්‍රධාන වේ. මෙය ඉහළම මට්ටමේ කළමනාකරණයේදී තිරසාරභාවය පිළිබඳ සංකල්පයේ හිමිකාරත්වය සහතික කරයි.

ප්‍රතිපත්තිමය බැඳීම් ඇතුළත් කරනු ලබන්නේ මහජන බැංකුවේ සේවකයින් තුළින් වන අතර, ඔවුන් ප්‍රතිපත්තිමය මූලපිරීම් කරගෙනයාම සහ අධීක්ෂණය සඳහා වගකියන මූලික පාර්ශ්වකරුවන් වෙති.

පරිසරය, සමාජය සහ ආර්ථිකය කෙරෙහි ඇති වන අහිතකර බලපෑම් අවම කිරීමේ ක්‍රියාවලීන් (දුක්ගැනිවිලි යාන්ත්‍රණ)

GRI 2-25

ගනුදෙනුකාර දුක්ගැනිවිලි නිරාකරණය: බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ ගනුදෙනුකරුවන්ගේ දුක්ගැනිවිලි සඳහා කඩිනම් අවධානය යොමු කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී කඩිනම් විසඳුම් ලබා දීමයි. ඵලදායී හා කාර්යක්ෂමව ක්‍රියාත්මක වන මැසිවිලි නිරාකරණ ක්‍රියා පටිපාටියක් අපි ක්‍රියාත්මක කර ඇත්තෙමු. අපගේ ක්‍රියාවලිය සමඟ අතෘප්තිමත් වන අවස්ථාවක, යම් ගනුදෙනුකරුවෙක්ට එය මූල්‍ය ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කිරීමේ විකල්පය ඇත. පැමිණිලි පැය 24 පුරාම ක්‍රියාත්මක ගනුදෙනුකාර සේවා හදිසි දුරකථන අංකය වන 1961 සහ විශේෂිත ගනුදෙනුකාර සේවා නිරාකරණ ඒකකය තුළින් ලබාගන්නා අතර. ඒ පිළිබඳ කඩිනම්ව කටයුතු කරනු ලබයි.

සේවක දුක්ගැනිවිලි නිරාකරණය: මෙය බැංකුවේ මානව සම්පත් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වීමෙන් යම් දුක්ගැනිවිලි සෘජුවම ඉදිරිපත් කිරීමට සේවකයින් ප්‍රවර්ධනය කරන විනිවිද පෙනෙන යාන්ත්‍රණයකි.

සෘණාත්මක පාරිසරික, සමාජීය සහ ආර්ථික බලපෑම් සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට සහ ගැටළු මතු කිරීමට පුද්ගලයන් සඳහා යාන්ත්‍රණ.

GRI 2-26

සේවකයා ආරක්ෂා කිරීමට නිර්ණාමිකභාවය සහතික කරමින් පැමිණිලි සමාලෝචනය කිරීමට පත්කරන ලද අධ්‍යක්ෂවරයෙක් සහිත තොරතුරු දැනුම් දීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත. පහත සඳහන් ගැටළු ආසන්න අධීක්ෂකවරයාට හෝ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වාර්තා කළ හැක.

(1) විනය නීති සංග්‍රහය උල්ලංඝනය කිරීම

(2) නීතිමය/නියාමන බැඳීම්වලට අනුකූල වීමට අපොහොසත් වීම

(3) යුක්තිය අවගමනය

(4) මූල්‍ය අක්‍රමිකතා

නීති හා රෙගුලාසිවලට අනුකූලතාව

GRI 2-27

මහජන බැංකුව අදාළ නියෝග හෝ රෙගුලාසිවලට අනුකූල නොවීම මත කිසිදු දඩයකට මුහුණ දී නොමැත.

කෙසේවෙතත්, 2023 දෙසැම්බර් අවසානය වන විට, එවැනි ක්‍රියාවන් නැවත ඇතිවීම වැලැක්වීමේ ක්‍රියාවලි බැංකුව හඳුන්වා දී තිබුණු අතර, වඩා ඉහළ අනුකූලතාව සහ වඩාත් තියුණු නියාමනය සඳහා පද්ධති වෙනස්වීම් ක්‍රියාත්මක වීමේ මට්ටමේ පවති.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන (UN SDGs) අරමුණුවලට අපගේ බැඳීම

ජනතාව, මිහිතලය, සහ සෞභාග්‍ය සඳහා කාර්ය සැලැස්මක් වන, එක්සත් ජාතීන්ගේ තිරසාරතා වැඩසටහන 2030, දශක ගණනාවක් ලෝකයට අභියෝග කර ඇති දිළිඳුකම සහ අසමානතා දිළිඳුකම තුරන් කිරීමේ සහ අනාගතය සඳහා තිරසාර සමාජයක් සහතික කිරීමේ අදහස ඇතිව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. ඉන්පසුව, පොදුවේ මිනිස් ජීවිතය හා මිහිතලය කෙරෙහි තීරණාත්මකව බලපෑම් කරන තිරසාර සංවර්ධන අරමුණු (SDGs) ක්ෂේත්‍ර දහහතක් හඳුනා ගනු ලැබූ අතර, එය ලොව පුරා දැඩිව ක්‍රියාත්මක කිරීම සඳහා කොටස් කරන ලදී.

ඒකාබද්ධ වාර්තාකරණය සහ ආර්ථික, පාරිසරික හා පාලන (ESG) වටිනාකම්

මූල්‍ය සහ ESG කාර්යසාධනය සංගත කිරීමක් මත පදනම් වූ ඒකාබද්ධ වාර්තාකරණය තුළින් පාරිසරික, ජෛව විවිධත්වය, ජලය සහ කාලගුණය කෙරෙහි ආරක්ෂිත ප්‍රවේශයක් සමඟ බැංකුව එහි මූල්‍ය අරමුණු තුළනය කර ගන්නා ආකාරය සහ ඉහත මාතෘකා පිළිබඳව විශ්වීය සංකල්ප සෑම අවස්ථාවකදීම යොදා ගන්නා ආකාරය පිළිබඳව සාකල්‍ය පින්තූරය ඒකාබද්ධ කරයි. තවද, ජලය, කාබන් ඩයොක්සයිඩ්, සහ දූෂක වැනි සෘණාත්මක ආකල්ප අනුව, බැංකුව අපජලය සහ විමෝචනය පිළිබඳ නිවැරදි සමස්ත දර්ශනයක් අනාවරණය කරයි. කෙසේ වෙතත්, බැංකුවේ සෑම ක්‍රියාවක්ම තිරසාර ආචාර ධර්ම සමඟ ක්‍රියාත්මක කරන අතර, මනා පරිවයන් සඳහා ආදර්ශමත් පරිසරයක් පෝෂණය කරයි.

තිරසාර සංවර්ධන අරමුණු

වටිනාකම නිර්මාණය සඳහා බැංකුව නියැලී සිටින බොහෝ ප්‍රාග්ධනයක් මත පදනම්ව බැංකුවේ ප්‍රවේශ අනාවරණය කරයි. ප්‍රාග්ධනයන් විශේෂ තිරසාර සංවර්ධන අරමුණු සඳහා සීමා කරන අතර එහිදී මූල්‍ය මැදිහත්වීම සහ කල්පිරීමේ පරිනාමනය මත පදනම් සේවා ආර්ථිකයක් තුළ ගැඹුරින් මුල් බැසගත් ව්‍යවහාර නිවැරදි කිරීම සඳහා ප්‍රවේශයන් ක්‍රියාත්මක වේ. ජනතාව, මිහිතලය, ජීවිත වැනි බොහෝ මූලිකාංග දරා ගැනීමේදී සහ සෞභාග්‍යය මත පාසටහන ඇතිකිරීමේදී තීරණාත්මක වන සාකල්‍ය පරිසරය ශක්තිමත් කරන සහ නැවත සකස් කරන තිරසාර සංවර්ධන අරමුණු සමඟ සමීපව සම්බන්ධ කරයි.

බලපෑම ඇගයීමේ පෙරමුණ මත - SDGs මත බැංකුවේ කටයුතුවල පාසටහන - උපකරණ හා පරාමිති, බැංකුව සේවය කරන වඩා පුළුල් පාලන තන්ත්‍රයකට ඒවා බලපාන ආකාරය පිළිබඳ ව්‍යාපාර ව්‍යවහාර සම්බන්ධ කිරීමට ක්‍රියාත්මකව ඇත. මෙම වාර්තාවේ අනාවරණ පිළිබඳ පදනම සකස් කරන ESG-ආශ්‍රිත අවදානම් සහ අවස්ථා අනාවරණය සඳහා පරාමිති සහ වාර්තාකරන මාර්ගෝපදේශ ප්‍රමිතිගත කරන GRI විධිවිධාන වැනි රාමු යනු ධනාත්මකව දරාගැනීමත් මත මෙන්ම අවාසි සහ නුසුදුසු ස්පර්ශක රේඛාවකින් සිදුකරන ව්‍යාපාර කටයුතුවලින් බලපෑම් කරන බොහෝ විචල්‍යතා පිළිබඳ නිවැරදි පිළිබිඹුවකි. දේශීය සන්දර්භයක් තුළ හරිතාගාර වායු ප්‍රොටෝකොලය, ජීවන චක්‍ර තක්සේරුව හෝ අදාළ තිරසාර සහතික කිරීම් පාරිසරික බලපෑම් ඇගයීම සඳහා මෙවලම් වෙති.

රජයේ ආයතන සහ දේශීය සහ ජාත්‍යන්තර පෙරමුණුවල සියලුම පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීතාව වැඩි කිරීම යනු ඉදිරියට යන ශක්තිමත් ප්‍රතිෂ්ඨාවක් වන අතර, නැවතත් තිරසාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උත්සාහයන්ට සියලුම පාර්ශ්වකරුවන් විසින් මෙහෙයවන කැමැත්තක් ඇති බව සහතික කරයි. SDGs බොහෝ මට්ටම්වලට බලපෑම් කරන අතර, බැංකුව හා සෘජුව සම්බන්ධ ගනුදෙනුකරුවන්ට මෙන්ම වක්‍ර පාර්ශ්වකරුවන් වන පුද්ගලයින් බොහෝමයකට බලපෑම් කරයි.

පාරිසරික පරාමිති: *කාබන් විමෝචන, බලශක්ති පරිභෝජනය, ජල භාවිතය, අපද්‍රව්‍ය උත්පාදනය*

සමාජ පරිමිති: *ශ්‍රම ව්‍යාවහාර, ප්‍රජා සහභාගිත්වය, විවිධත්වය ඇතුළත්වීම*

පාලන පරාමිති: *අධ්‍යක්ෂ මණ්ඩල විවිධත්වය, විධායක පාරිශ්‍රමිකය, ව්‍යාපාර සදාචාර*

අවදානම සහ උවදුරට පත්වීම්

ESG අවදානම් තක්සේරු කිරීමේ ආරම්භයේ සිට, ESG ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම දක්වා, අනුකූලතාවයේ කේන්ද්‍රය වන අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව බැංකුව GRI මාර්ගෝපදේශවලට අනුකූල වේ. සිදුවිය හැකි හිඩැසක වියහැකි හානියේ බර අඩු කිරීම සඳහා උවදුරට පත්වීම් සහ සංවර්ධන උපායමාර්ග අවබෝධ කර ගැනීම මනා පරිචයන් හී කොඳුනාරටිය සකස් කරන රාමුවක කොටසක් වේ. තිරසාර දෙපාර්තමේන්තුව අවශ්‍ය අවශ්‍යතාවලින් ප්‍රවීන වන අතර බැංකුව තුළ තිරසාර මූලධර්ම ක්‍රියාත්මක කිරීමට මනාව දක්ෂ වේ. ESG නිමැවුම් ලෙස ප්‍රමුඛ අවශ්‍යතාව සමානවම ආයෝජකයින් සහ ගනුදෙනුකාරුවන් තුළ ඇති බැංකුවේ කීර්තිනාමය හානියට පත් කළ හැකිය. උදාහරණයක් ලෙස, කාබන් පාසටහන විශ්ලේෂණය බැංකුවේ කාබන් තීව්‍ර කටයුතු පිළිබඳ කාබන් පාසටහන් සම්බන්ධ දැනුම වැඩි කර, විමෝචන අඩු කිරීම සඳහා අවස්ථාව ලබා දේ. අපගේ කාබන් පාසටහන සහතික කිරීම් පිළිබඳ වැඩි විස්තර සඳහා පිටු අංක 169 සිට 176 දක්වා ස්වභාවික ප්‍රාග්ධනය කොටස බලන්න.

බැංකුව සම්පූර්ණයෙන්ම නියාමන අනුකූලතා පදනම මත පමණක් කටයුතු නොකරන අතර, ESG-ආශ්‍රිත මනා පරිචයන්හි බලපෑම මත ද කටයුතු කරයි. එයට හේතුව බැංකුව සාකල්‍ය ප්‍රජාවක් ගොඩ නැගීම සඳහා සිය පසුබිම් වැඩවල කොටසක් තුළ අඛණ්ඩව වර්ධනයන්ට උත්සාහ දරන අතරම – අපගේ උපායමාර්ගික වැඩසටහන තුළ SDGs සඳහා බැඳීම ප්‍රමුඛතාවයන් යන මෙම සටහන මත කීර්තිනාමය සහ සන්නාමය ශක්තිමත් කිරීමයි.

හරිත මූල්‍ය

හරිත ඉතුරුම් සහ තිරසාර තැන්පතු හරිත ඉතුරුම් සංස්කෘතියක ප්‍රධාන මූලික පුවරුව සකස් කරන අතර එහිදී එවැනි තැන්පතු සමාජීය වගකීම්සහගත ආයෝජන වැනි ආයෝජනවල කොටස මත පාරිසරිකමය වශයෙන් සක්‍රීය ක්‍රියාමාර්ගවලට පෙරමුණ ගනී. හරිත බැඳුම්කර ද දිගුකාලීන පදනමක් මත විශාල ප්‍රාග්ධන ප්‍රමාණ ආකර්ෂණය කර ගැනීමේ ක්‍රියාමාර්ගයකි. එය තවදුරටත් පාරිසරික පාසටහන වර්ධනය කිරීමට සහ මහා පරිමාණ තිරසාර ව්‍යාපෘති ශක්තිමත් කිරීමට ආයෝජන මාර්ගයක් සකස් කරන අතරම, ගණනය කළ නොහැකි පෙරමුණු මත SDGs සඳහා දායක විය හැකිය.

ප්‍රමුඛතා හඳුනා ගැනීම

තිරසාරභාවය පිළිබඳ ඒකායන සංකල්පය යටතේ, කාලගුණ වෙනස අවම කිරීම හෝ අනුවත්‍යතාව සහ දූෂණය වැලැක්වීම හෝ පාලනය සඳහා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී අපි UN SDGs සමඟ පෙළ ගැසෙන අතර මේවා සමාජය, පරිසරය සහ කාලගුණය යන ත්‍රිවිධාකාර සාධක මත බැංකුවේ කටයුතුවල හානිකර පාසටහන අඩු කිරීමට උපකාරී වේ.

මානව ප්‍රාග්ධනය ආරක්ෂා කිරීම

සියලුම ධූරාවලිවල කාර්ය මණ්ඩලයට මූල්‍ය උපකරණ SDGs කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ දැනුම් පදනම ගොඩනැගීම SDGs මත පදනම් කටයුතු ක්‍රමවත් කිරීම හා සෑම සේවකයෙක්ම මැදිහත් කිරීම සඳහා බැංකුවේ ධෛර්ය සම්පන්න හා අදාළ වැඩසහනකි. සමාජීය හා පාරිසරික අරමුණු ඉටුකිරීම පිළිබඳ මහජන මෙහෙවර සන්නාමය විසින් මෙහෙයවන වැඩසටහන්වල කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය වර්ධනය කිරීම SDGs විසින් ඉදිරිපත් කරන අභියෝග සහ අවස්ථාවන් පිළිබඳ ඉගෙනුම් පරිසරයක් පෝෂණය කරයි.

සාරාංශය

කෙසේවෙතත්, SDGs සඳහා අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමේ ප්‍රගතිය සැලකියයුතු ලෙස වෙනස්වන අතර එය අදාළ කලාපයේ හෝ රටේ සාර්ව ආර්ථික සහ දේශපාලන පසුබිම මත රඳා පවතී. දරිද්‍රතා මට්ටම් ඉහළ මට්ටමක පවතින බව සැලකෙන ආසියානු කලාපය තුළ, ආර්ථික වර්ධනය සඳහා අරමුදල් සැපයීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පියවර ගනී. එබැවින්, SDGs හි ප්‍රගතිය සෙමින් සිදු වන අතර, සංවර්ධිත රටවල, SDGs හි ප්‍රගතිය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින අතර සමහරක් රටවල සම්පූර්ණ කිරීමට ආසන්න හෝ සම්පූර්ණ කර ඇත.

2022 අගෝස්තු මස, එක්සත් ජාතීන් හා ශ්‍රී ලංකා රජය ශ්‍රී ලංකාව වෙනුවෙන් තිරසාර සංවර්ධන රාමුව (2023-2027) අත්සන් කළේය. වර්තමානයේ රටේ ඉඩම් හායනය, දූෂණය, අපරීක්ෂාකාරී ජල කළමනාකරණය, තර්ජනාත්මක ජෛව විවිධත්වය, වෙරළ බාදනය, නගර ප්‍රදේශවල අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රධාන නගරවල වාහන තදබදව තුළ විමෝචණ දූෂණය වැනි පාරිසරික ගැටළුවලට මුහුණ දේ, 2027 දී අරමුණු සාක්ෂාත් කරගැනීම අභියෝගයක්ව පවතී.

එක්සත් ජාතීන් සහ බැංකුව විසින් මූලිකත්වය ගන්නා පරිදි, ගෝලීය පරිමාණයක් මත ප්‍රධාන වටිනාකම් සකස් කරමින්, බැංකුව බලපෑම් කරන පාරිසරික, සමාජීය හා පාලන පාසටහන් නගාසිටුවීමට එය ශක්තිමත් කාර්යභාරයක් ඉටුකරන ආකාරය පිළිබඳ SDGs සාක්ෂියක් වන අතර, ඒ තුළින් එක් එක් SDG හි ප්‍රධාන ශක්තිය සවිමත් කරයි. ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයේ ඉහළ සන්නාම දෘශ්‍යතාව සහිත වගකීම් සහගත හා වගවියහැකි ආයතනික පුරවැසියෙක් ලෙස, අපේක්ෂිත SDG ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට සහයවන ආකාරයෙන් අපගේ මෙහෙයුම් පෙළ ගැස්වීමට අපි උත්සාහ ගනිමු. එසේ කිරීම මගින් අපගේ ව්‍යාපාරය සඳහා සහ ජාතිය සඳහා සාමූහික සිතුවිලි සම්භාරයක්, ක්‍රියාකාරී නායකත්වය පෝෂණය කරමින් වියහැකි හානිය අවම කිරීමට එහි කටයුතු ක්‍රමවත් කරමින් හානිකර අපජලය සහ විමෝචන සීමාකරන මනා පරිචයන් ක්‍රියාත්මක කරන අතර, තිරසාර ජීවිතයේ සියලුම අංගයන් මත යහපත්, වඩාත් පරිවර්තනීය ප්‍රවේශ ශක්තිමත් කරමු.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

85
ව්‍යාපාර සමාලෝචනය

86 පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණය
89 ව්‍යවසාය බැංකුකරණය
94 ආයතනික බැංකුකරණය
96 භාණ්ඩාගාරය
98 ඒතෙර ගනුදෙනු සේවාව
101 ජාත්‍යන්තර බැංකුකරණය
104 තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් බැංකුකරණය
109 කාඩ් සේවා
112 අලෙවිකරණය

115 මූල්‍ය ප්‍රාග්ධනය
121 නිෂ්පාදිත ප්‍රාග්ධනය
127 බුද්ධිමය ප්‍රාග්ධනය
133 මානව ප්‍රාග්ධනය

145
සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

145 පාරිභෝගික ප්‍රාග්ධනය
151 ව්‍යාපාරික හවුල්කාර ප්‍රාග්ධනය
157 ආයෝජක ප්‍රාග්ධනය
161 ප්‍රජා ප්‍රාග්ධනය

169
ස්වභාවික ප්‍රාග්ධනය

ව්‍යාපාර සමාලෝචනය

මහජන සුභසාධනය අපගේ මූල්‍ය විසඳුම්වල සහ අපගේ ප්‍රධාන අරමුණ වන මූල්‍ය අන්තර්ගතභාවය තුළ කේන්ද්‍රය වේ. ශ්‍රී ලංකා රජය සමඟ හවුල්වීම අපගේ විධිනියෝගයක් වන අතර, ඒ තුළින් අපගේ ජාතිය නැවත ගොඩනැගීමට, සහ ස්වයං-පෝෂිත ජාතියන් ලෙස දේශීය ජනතාවගේ සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ විශ්වාසය යළි ඇති කිරීමට හවුල්වන අතර, ඉන් සිය ජනතාවගේ තිරසාරභාවය කෙරෙහි අවධානය යොමු කර ගෝලීය ප්‍රජාව කෙරෙහි සිය බැඳීමට ගරු කරයි.

අපගේ නිෂ්පාදන සහ සේවා සම්භාරය මූල්‍ය අන්තර්ගතභාවය සහතික කරමින් සහ ආර්ථික කටයුතු උත්පාදනය කරමින් අපගේ පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකමක් ලබාදීමට නිර්මාණය කරන අතර, එය දිගුකාලීනව, ජාතිය ගොඩ නැගීමට අර්ථවත් අයුරින් දායක වේ.

පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණය

අපගේ නිෂ්පාදන සහ සේවා සම්භාරය මූල්‍ය අන්තර්ගතභාවය සහතික කරමින් සහ ආර්ථික කටයුතු උත්පාදනය කරමින් අපගේ පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකමක් ලබාදීමට නිර්මාණය කරන අතර, එය දිගුකාලීනව, ජාතිය ගොඩ නැගීමට අර්ථවත් අයුරින් දායක වේ.

අපගේ ප්‍රවේශය

සුවිශාල ආර්ථික අර්බුදයක කල්පවත්නා බලපෑම්වලින් පසු ආර්ථික ප්‍රතිසාධන ගමන්මඟේ පියවර තබන ජාතියක් ලෙස, ආර්ථික කටයුතුවල ප්‍රවර්තන ශක්තියත් නිර්මාණය කිරීමට සහ එම ගමන්මඟේ නොවැටී සිටීමට නිෂ්පාදන හා සේවා සැලසුම් කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු ජාතියේ විශාලතම වාණිජ බැංකුව ලෙස මෙම ක්‍රියාවලියට අපගේ දායකත්වය සමාජයේ වඩා පුළුල් කොටසක් ආර්ථිකයේ මුඛ්‍යධාරාව වෙත සාර්ථකව ඇතුළත් කිරීමේදී අත්‍යවශ්‍ය බවට පත්ව ඇත.

මෙම කොටස තුළ ප්‍රතිසාධන ගමන්මඟේ සාර්ථකවීමට අපගේ පාර්ශ්වකරුවන් සහ ශ්‍රී ලංකා රජය කෙරෙහි අපගේ බැඳුණු අවධානය ලේඛන ගත කරයි.

සුවිශේෂී අවස්ථා

- සිල්ලර පාරිභෝගිකයින්ට සහයවීම සඳහා බොහෝ අවශ්‍ය ද්‍රවශීලතාව ඇතුළත් කිරීමට පුද්ගලික ණය ලෙස රු. බිලියන 100ක වඩා ලබා දී ඇත.
- මුදල් සඳහා ගනුදෙනුකරුවන්ට පහසු ප්‍රවේශය ලබාදීමට උකස් නිෂ්පාදන සඳහා තනි ණයකාර සීමාව වැඩි කරන ලදී.
- පහසු බැංකු විසඳුම් සඳහා වර්තමාන ගනුදෙනුකාර ඉල්ලීම සමඟ අප පිරිනමන නිෂ්පාදන හා සේවා පෙළ ගැසීම සඳහා අපගේ තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් හැකියාවන් වැඩි කිරීමට නවීන තාක්ෂණය තුළ ආයෝජනය කරන ලදී.

පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණ ඒකකය තැන්පතු වර්ධනය සඳහා පෙරමුණ ගන්නා අතර බැංකුවේ තැන්පතු පදනමින් 98%ක් සඳහා දායක වේ. නිෂ්පාදන රාශියක් සිල්ලර පාරිභෝගිකයින් වෙත පිරිනමන අතර, එය වර්ධනයේ මාවත සනාථ කර ඇත. ආර්ථික අවපාතයෙන් බැංකුවට සිය තැන්පතු පදනම පුළුල් කිරීමේදී එහි උත්සාහයන්ට මෙන්ම දිවයින පුරා සිය වත්කම් නිෂ්පාදන වර්ධනයේදී බාධාවක් නොවූ අතර, නාගරික ප්‍රදේශවල 30%ක සහ අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල 70%ක ව්‍යාපාර අනුපාතයක් සාක්ෂාත් කර ගෙන ඇත.

නිෂ්පාදන හා සේවා ඉතුරුම් හා තැන්පතු

තරුණ විධායක ඉතුරුම් (YES)	උප වෙළෙඳපොල අනුපාතයට වඩා 0.5%ක පිරි නමා ඇති බැවින් GenZ අතර කැපී පෙනෙන කාර්යසාධනයක් මෙම නිෂ්පාදනයට තිබුණි, පාරිභෝගික කළඹ 2024 දී 24.38%කින් වර්ධනය විය.
වනිතා වාසනා	සිය 31 වසරක මෙහෙයුම තුළ, මෙම ගිණුම ජීවිතයේ සහ විවිධ වැඩ ස්ථානවල කාන්තාවන් අතර සාර්ථක වී ඇති අතර 18.6%ක වර්ධන අනුපාතයක් වාර්තාකර ඇත.
ඉසුරු උදාන	ළමුන්ගේ මුල්කාලයේදී ඉතුරුම් ආරම්භ කරන සහ තරුණ දෙමව්පියන් අතර ජනප්‍රිය මෙම නිෂ්පාදනය වසර 26ක් තුළ සාර්ථකව පවති.
සිසු උදාන	පසුගිය වසර 28 සඳහා තරුණ සිසු ජනතාව ග්‍රහනය කර ගැනීම අරමුණු කළ මෙම නිෂ්පාදනය බොහෝ පාසල්වල උප ඒකක ජාලයක් ක්‍රමානුකූලව අත්කර ගෙන ඇත. එහිදී සිසුන්ට ඔවුන්ගේ පහසුව තුළ ගිණුම් විවෘත කිරීමට හැකි අතර, තරුණ වයසේදී ඉතුරුම් පුරුද්ද ලඟාකර ගත හැක. 2024 දී වර්ධන අනුපාතය 4.1%ක් විය.
පරිණත	වැඩිහිටි ජනතාවට මූල්‍යමය වශයෙන් ස්වාධීන වීමට සහයවන මෙම නිෂ්පාදනය 9.1%ක වර්ධන අනුපාතයක් සමඟ 2024 දී තැන්පතු වර්ධනය කර ඇත.
අස්වනු ඉතුරුම්	කාලීන ආදායම් සහිත ගොවීන් සඳහා අරමුණු කරන ලදී.

බැංකුව People's Elegance සහ People's Excelsior සමඟ අධිමිල ගනුදෙනුකාර අංශ අබණ්ඩව ආකර්ෂණය කරන අතර, එය පිළිවෙලින් ඉහළ ශුද්ධ වටිනා පුද්ගලයින් සහ මධ්‍යම මට්ටමේ වැටුප් උපයන්නන් ආකර්ෂණය සිදුකරන ලදී.

අපගේ නිෂ්පාදන කළඹ පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය බලන්න. www.peoplesbank.lk.

ණය

බැංකුව රු. බිලියන 100ට වැඩි පුද්ගල ණය ලබා දී ඇති අතර, ඉන් මහජන සුභසාධනය කෙරෙහි එහි බැඳීම පෙන්නුම් කරයි. බැංකුවේ මුළු ණය කළඹින් පුද්ගලික ණය 25%ක් නියෝජනය කරයි.

උකස් අත්තිකාරම් (උකස් ව්‍යාපාරය)

උකස් අත්තිකාරම්වල පුරෝගාමියා ලෙස, බැංකුවේ ස්වර්ණ ප්‍රදීපා උකස් අත්තිකාරම් යෝජනා ක්‍රමය ගනුදෙනුකරුවන්ගේ හදිසි මූල්‍ය අවශ්‍යතාවන් සඳහා වේගවත් මූල්‍ය විසඳුම් ලබා දේ.

2024 දී, උකස් කළඹ බිලියන 53කින් වර්ධනය වූ අතර. 2023 වසරට සාපේක්ෂව වර්ධන අනුපාතය 22%කී. ඩිජිටල් පරිනාමනයේ නව යුගයක් කරා සැලකියයුතු පියවරක් තැබීම අරමුණු කරමින් ශාඛාව වෙත ගමන් කිරීම ඉවත් කරමින් උකස් අයිතමයේ ආපසු ගෙවීම් සඳහා ගනුදෙනුකරුවන්ට ඩිජිටල් ගෙවීම් විසඳුම් වැළඳ ගැනීමට බැංකුව ඔවුන්ව දිරිමත් කරයි.

ඉතුරුම් හා ණය කළඹ තුළ කාර්යසාධන සමාලෝචනය





අපගේ කණ්ඩායම

විශ්වාසය හා හුවමාරු වගකීමක් මත ගොඩනැගුණු අපගේ පාරිභෝගික බැංකු කණ්ඩායමේ සහයෝගී උත්සාහයන් බැංකුව වෙනුවෙන් සාර්ථක ජයග්‍රහන වසරක් ලබාදීමට දිවයින පුරා ක්‍රියාත්මක වන උපායමාර්ගික ප්‍රවර්ධන වැඩසටහන් සමඟ අඛණ්ඩ උසස් මට්ටමේ සේවා ලබාදීම සහතික කර ඇත. කණ්ඩායමේ සහක්‍රියාවන් පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය සඳහා බැංකුවේ පරමාර්ථ අත්කර ගැනීමට මනාව එක් වූ අතර, එයට කාලීන ආකාරයෙන් ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලන කඩිසර, සහ නම්‍යශීලී මනාව පළපරුද්ද සහිත අය දායක විය. කණ්ඩායමේ සියලුම දෙනා එක්ව ප්‍රජාව මැදිහත්වීමේ වඩසටහන්වල සහභාගි වූ අතර, එය මෙම වාර්තාවේ ප්‍රජා කොටස තුළ දක්වා ඇත.

අභියෝග

ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ස්ථායිතාව සහ මූල්‍ය ශක්තිමත්භාවය සහතික කිරීමට බැංකු ක්ෂේත්‍රය නියාමනය කරයි. එබැවින්, පොළී අනුපාත උච්චාවචනය තවදුරටත් අභියෝගයක් වූ අතර, එයට නිසි ආරක්ෂාව සහ පරීක්ෂාව සමඟ ඉදිරියට යාම අවශ්‍ය වේ.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

ඩිජිටල්කරණය පහසුව සහ වේගය පිළිබඳ විභවතාවලින් පූර්ණ වශයෙන් ප්‍රයෝජන ගැනීම සඳහා, 2025-2026 සහ ඉන් ඔබ්බට බැංකුවේ ගනුදෙනුකරුවන්ට මුහුණ දීම සහ මෙහෙයුම් අංශ යන දෙකම හරහා විනිවිදයාම ප්‍රමුඛතාවයක් වනු ඇත. මෙය ස්වභාවිකව අපගේ ශාඛා ජාලයේ ව්‍යූහය නැවත හැඩගස්වන අතර, අලෙවිකරණ ධාවක කරා පළපුරුදු සේවක කණ්ඩායමක් යෙදවීමට මඟ පාදනු ඇත.

රට තුළ දෙවැනි විශාලතම තැන්පතු දරන්නා ලෙස, 2025 දී සැලකියයුතු තැන්පත් මට්ටමක් අත්කර ගන්නා බව බැංකුවට විශ්වාසයය. එයට 2025 වසර සඳහා අපගේ පාරිභෝගික ඩිජිටල් බැංකු වැඩසටහන් මගින් සහය වනු ඇත. එමෙන්ම 2024 දී පැවති ණය සහ රන් ණය වර්ධන ශක්තිය 2025 දී වේගවත් වනු ඇති බව ද අපට විශ්වාසය. එය බැංකුවේ වත්කම් කළඹ ශක්තිමත් කර අපගේ සමස්ත කාර්යසාධනයට විශාල වශයෙන් දායක වනු ඇත.

ව්‍යවසාය බැංකුකරණය

ව්‍යවසාය බැංකුකරණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යය වන්නේ මාර්ග තුනක එනම් වාණිජ ණය, SME සංවර්ධනය සහ සංවර්ධන බැංකුකරය තුළ නියැලි සිටීමයි. දෙපාර්තමේන්තුවේ මූලික අවධානය වන්නේ සියලුම ව්‍යාපාර ව්‍යවසාය වෙත ණය ව්‍යාප්ත කරමින් බැංකුවේ ණය කළඹ වර්ධනය කිරීමයි.

කළමනාකරණ ප්‍රවේශය

ව්‍යාපාර ණය මාර්ග පිරිනමමින් MSME සහ SME සංවර්ධනය වේගවත් කරමින් ආර්ථික ප්‍රතිසාධන මාර්ගයක රට ගමන් කරන බැවින්, ව්‍යවසායකයින් සහ අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ අපගේ උත්සාහයන් අපි නිවැරදි කළෙමු. මේ සඳහා, අපි ආක්‍රමණශීලී විකුණුම් ශිල්පක්‍රම යොදා ගත් අතර, ඒ තුළ ණය අවශෝෂණය කළ හැකි සහ යහපත් ණය සේවාකරණය සහිත ව්‍යවසායකයින් අපි අපේක්ෂා කළෙමු.

සුවිශේෂී අවස්ථා

- විමධ්‍යගත අපනයන මධ්‍යස්ථාන පහක් ස්ථාපිත කරන ලදී.
- තිරසාර ව්‍යාපෘතිවලට – හරිත බලශක්තිය හා පුනර්ජනනීය බලශක්තිය අරමුදල් යෙදවීමට රු. බිලියන 5ක් වෙන් කිරීම.
- තරුණ ව්‍යවසායකයින් දිරිමත් කරමින් People's Spark ණය යෝජනා ක්‍රමය තුළින් තරුණ සංවර්ධනය.
- ආසියානු සංවර්ධන බැංකුව සමඟ හවුල්කාරත්වය තුළ සැලසුම් කළ කාන්තා සංවර්ධන වැඩසටහන.

උපායමාර්ගය

උපායමාර්ගය අනුව, ව්‍යාසාය බැංකුකරණ අංශයේ මෙහෙයුම් සැලැස්ම පරිදි ආක්‍රමණශීලි ණය දීම ආරම්භ කර ඇත. රටේ බොහෝ ප්‍රදේශ පුරා විහිදුණු අර්ධ නාගරික ප්‍රදේශවල ස්ථීර ගනුදෙනුකාර පදනමක් මත පදනම් වී වාණිජ හා සංවර්ධන ණයදීම සමඟ අපගේ මූලික අවධානය පෙළ ගස්වන ලදී. ව්‍යාසාය බැංකුකරණ අංශයේ ප්‍රමුඛතාවයක් වූයේ ආක්‍රමණශීලීව නව ව්‍යාපාර සම්බන්ධතා පසුපස යන උනන්දුව සමඟ මධ්‍ය ප්‍රමාණයේ ආයතනික වෙළෙඳපොල කරා ප්‍රවේශවීමයි. ආයතනික ණය දීම සඳහා ප්‍රමාණවත් මට්ටමක මධ්‍ය ප්‍රමාණයේ ආයතන මත කැපී පෙනෙන සංවර්ධනයක් ලෙස පෙනී සිටි අතර, 2024 දී සාර්ථක ගමන්මඟ ඉන් පෙන්වා දේ. අක්‍රීය ණය 2024 දී ඉහළ නොගිය අතර, ව්‍යවසාය ණය වාතාවරණය අනුව බැංකුව සඳහා යහපත් අවදානම් තත්ත්වයක් පෙන්නුම් කළේය. ණය ඇගයීම් දැඩි වූ අතර, ණයවල තත්ත්වය ඉහළම ශ්‍රේණියේ පවතින බවත් වියහැකි මූල්‍ය අලාභ අවම බවත් සහතික කරන ලදී.



මූලපිරීම්

විශාල ආයතන සහ ව්‍යවසායකයින් ලඟාකර ගැනීමට ප්‍රධාන මූලපිරීම් කිහිපයක් 2024 දී ක්‍රියාත්මක කරන ලද අතර, ව්‍යාපාර මෙහෙයවීමට අවශ්‍ය ලාභ උත්පාදනය, සේවානියුක්තිය සහ සහය පර්යන්ත සේවා තුළින් විවිධ වටිනාකම් රාශියක් නිර්මාණය කරමින් එය සැලකියයුතු ලෙස ආර්ථිකයට දායක විය. ආනයන සහ අපනයන ගනුදෙනු තුළින් සිය ගෝලීය ලඟාවීම සලකා බලමින්, මූල්‍යකරණය සහ ණය සහය සඳහා වර්ධනීය අවශ්‍යතා බැංකුව ඉක්මණින්ම හඳුනා ගන්නා ලදී.



අපනයන කේන්ද්‍ර

2023 දී අරමුණු කලද, මෙම වැඩසටහන 2024 දී ආරම්භ කරන ලදී මෙවැනි කේන්ද්‍ර තුළින් ව්‍යාපාර ප්‍රවර්ධන කළ හැකි බැවින් ප්‍රාදේශිය ණය වර්ධනයට සහයවීම සඳහා අපගේ උත්සාහයන් තුළ මෙය ප්‍රධාන සංවර්ධනයකි. එමෙන්ම මෙය ආනයන සහ අපනයන පහසුකම් ඇති කරන වෙළෙඳපොල ග්‍රහනය කර ගැනීමට ප්‍රාදේශිය ණය ඒකකවලට වේගයක් වන අතර, ඒ තුළින් උප නගර සහ ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථික නැවත ප්‍රාණවත් කිරීමට දායක වේ. ව්‍යවසාය බැංකුකරණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ එවැනි විමධ්‍යගත කේන්ද්‍ර පහක් ස්ථාපිත කරන ලද අතර, ග්‍රාමීය නිෂ්පාදන ජාත්‍යන්තරව අලෙවිකළ හැකි භාණ්ඩ බවට පරිවර්තනය කිරීමේ උත්ප්‍රේරකයක් ලෙස කටයුතු කරයි.



තිරසාර මූල්‍ය

මහ බැංකුවේ වර්ගීකරණය පරිදි, තිරසාර මූල්‍ය ප්‍රවර්ධනය කිරීම තුළ, ගනුදෙනුකරුවන් ගණනාවකට ණය පහසුකම් ලබාදීමේදී සහ හරිත බලශක්තිය හා පුනර්ජනනීය බලශක්තිය වැනි තිරසාර ව්‍යාපෘතිවලට අරමුදල් ලබාදීමේදී අපගේ උත්සාහයන් අපි වේගවත් කළෙමු. සියලුම ව්‍යවසාය සඳහා ණය දීමට හරිත බලශක්ති ණය යෝජනා ක්‍රමය 2024 දී දියත් කළ අතර, එය රු. බිලියන 3.25 කරා ලඟා විය.

2024 දෙසැම්බර් 31 දිනට හරිත බලශක්ති ණය යෝජනා ක්‍රමයේ කාර්යසාධනය (රු. මිලියන)

2024 සඳහා වෙන් කිරීම රු.මි.	ලබාදුන් මුළු ණය මුදල රු.මි.	O/S ශේෂය රු.මි.	ණය ගණන	2025 වසර සඳහා මාර්ගය රු.මි.
5,000.00	3,247.00	1,570.56	32	3,500.00

People's spark තරුණ සංවර්ධනය

තරුණ පරම්පරාව ව්‍යවසායකයින් කිරීම සඳහා පෙළඹවීම ඉලක්ක කළ ණය යෝජනා ක්‍රමයක් වන මෙම යෝජනා ක්‍රමය ආරම්භක අවස්ථාවේදී ම අයදුම්කරුවන් 700ක් ආකර්ෂණය කළේය. මුදල් සහයට අමතරව, එය ණය යෝජනා ක්‍රමය ආරම්භයේ සිටම තරුණ තරුණියන්ගේ මූල්‍ය අභිලාෂයන් පෝෂණය කරන අතර, ප්‍රාදේශීය ණය විශේෂඥයින් ව්‍යාපාර ණය ලබන්නන්ගේ උපදේශකයින් ලෙස ක්‍රියා කරයි.

2024 දෙසැම්බර් 31 දිනට People's spark ණය යෝජනා ක්‍රමයේ කාර්යසාධනය

2024 සඳහා වෙන් කිරීම රු.මි.	ලබාදුන් මුළු ණය මුදල රු.මි.	O/S ශේෂය රු.මි.	ණය ගණන
2,000.00	437.10	413.47	654

කාන්තාවන් සවිබලගැන්වීම

ව්‍යවසාය අංශය කාන්තා කේන්ද්‍රීය ව්‍යවසායකත්වයේ මධ්‍යම අභිප්‍රේරණ බලකායක් වූ අතර, එය ADB මූල්‍යකරණ ණය මාර්ග හරහා දියත් කරන ලදී. කාන්තා ව්‍යවසායිකාවන්ට උපදෙස් දෙන වේදිකාවක් වන මෙය ADB සහභාගිත්වය ඇතිව ක්‍රියාවට නංවන ලද අතර, ප්‍රජාව, ගම, දිස්ත්‍රික්කය, සහ ජාත්‍යන්තර මට්ටමේදී පවා සිදුවන ආර්ථික කටයුතුවලදී කාන්තා සහභාගිත්වය වැඩි කිරීමට තාක්ෂණික ශක්තීන් ලබා දී ඇත.

ADB හි "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය මාර්ග" යෝජනා ක්‍රමයෙන් අරමුදල් ලබාදුන් ඩිජිටල් වේදිකාව මෙයෙවන SME Connect – ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ (NEDA) මූලික පරමාර්ය වන්නේ – කාන්තා ව්‍යවසායිකාවන් සඳහා දත්ත පදනමක් සංවර්ධනය කිරීම සහ උපදෙස් ලබාදීම, මූල්‍ය සාක්ෂරතාව ලබාදීම සහ දේශීය සහ ජාත්‍යන්තර වේදිකාවලට ඔවුන්ගේ සම්බන්ධය ඇති කිරීම මගින් ඔවුන්ගේ දිගුකාලීන සෞභාග්‍ය සහතික කිරීමයි. කාන්තා වෘත්තිකයින්ගේ තාක්ෂණික නායකත්වය සහ ව්‍යාපාර නිපුනතාව මත පදනම් වූ විවිධාංගීකරණය SME Connect හි පරමාර්ථයක් වන අතර, එය කාන්තා වෘත්තිකයින්ට මූල්‍ය ඉණිමගේ ඉහළට යාමේදී කාන්තා සංචිතය වැඩිකිරීමට සම්ප්‍රදායික ප්‍රවේශ ඉදිරියට ගෙන යයි.

ADB විසින් පත්කළ – Deloitte's හි ග්‍රාමීය කාන්තාවන්ට මූල්‍ය සාක්ෂරතාව ලබාදීමට බැංකුව සමඟ සහයෝගී වූ අතර, ඉතුරුම් යෝජනා ක්‍රම සහ ක්ෂුද්‍ර සහ SME ණය වැනි සිය ජීවනෝපායන්ගේ අත්‍යවශ්‍ය කොටසක් වන ඔවුන්ගේ ව්‍යාපාර නිපුනතාව සහ මූල්‍ය නිෂ්පාදන පිළිබඳ දැනුම අධීක්ෂණය කරයි.

2024 දෙසැම්බර් 31 දිනට කාන්තා සවිබලගැන්වීමේ කාර්යසාධනය

ලබාදුන් මුළු ණය රු.මි.	ණය ගණන
668.28	506

ක්ෂුද්‍ර මූල්‍ය

ක්ෂුද්‍ර මූල්‍ය සඳහා, ව්‍යවසාය ගම්මාන ලෙසින් හඳුන්වන මධ්‍යස්ථාන ක්‍රියාවට නංවන ලද අතර, ඒ තුළින් අනාගත ගනුදෙනුකරුවන්ට පර්ෂදයක් ලෙස බැංකු නිෂ්පාදන ප්‍රමුඛ කිරීමට බැංකු නොමැති සේ සලකනු ලබන පුද්ගලයින් පරිවර්තනය කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතාව ලබා දේ. මෙහිදී පර්ෂද සාමාජිකයින් එකිනෙකාට සහයවන අතරම සිය ව්‍යාපාර වර්ධනය කර ගනී. ණය නිකුත් කිරීම සහ ජීවනෝපායෙන් තැන්පතු සුරක්ෂිත කිරීම යන ද්විත්ව කාර්යයන් වැනි මධ්‍යස්ථාන මගින් ප්‍රධාන ධාරාවට ගෙන එන ලැබේ. එවැනි පර්ෂද ජීවනෝපාය සංවර්ධනය සඳහා බැංකුව විසින් ලබාදෙන සේවා ග්‍රහනය කර ගැනීමට සාර්ථක ඒකකයක් ලෙස සංවර්ධනය කෙරේ.





විශේෂිත ප්‍රාදේශීය ණය ඒකක

ගනුදෙනුකාර පදනම් ව්‍යාප්ත කිරීමට ණයදීම පිලිබඳ ප්‍රාදේශීය ණය ඒකක අභ්‍යන්තර පුහුණුව මගින් සවිබලගන්වන ලදී. මෙම පෙරමුණ මත, 2024 දී ශක්තිමත්ව සාර්ථක වසරක් ලෙස පෙනී සිටින අතර, උපායමාර්ගිකව වෙළෙඳපොලට ණය මාර්ග සංවර්ධනය 2025 විෂය වේ. වර්තමානයේ බොහෝ පෙරමුණුවල ආක්‍රමණශීලී වැඩසටහන් උපාමාර්ගික ප්‍රමුඛතාවයක් වන අතර, වඩා ශක්තිමත් වෙළෙඳපොල කොටසක් ග්‍රහනය කිරීමේදී එය ප්‍රධාන අංගයන් වනු ඇත. නව ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීම සුවිශේෂ වන අතර, 2024 දී ආරක්ෂා කළ නව ව්‍යාපාර මාර්ගවලට අදාළ අවදානම් අවම කරනු ඇත.

ව්‍යාපාර ප්‍රතිසාධන ඒකකය

ආර්ථික අර්බුදයේ කම්පනවලට සහ වසංගතයේ අවශේෂ බලපෑම්වලට ඔරොත්තු දීමට මහ බැංකුව විසින් ස්ථාපිත කරන ලද මෙම ඒකකය අක්‍රීය ණය සහ ව්‍යාපාරයේ ප්‍රතිසාධනය කළමනාකරණය කිරීමට බෙදාහරින ලද ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවධානය යොමු කර ඇත. ඒකකය මගින් ඇතිකළ උත්සාහයන් ව්‍යවසාය බැංකුකරණය තුළ ණයවල තත්ත්වය වර්ධනය කළ අතර, අපේක්ෂිත මට්ටම්වල අක්‍රීය ණය කළමනාකරණය කරන ලදී

යොදාගත් උපායමාර්ගවලට අක්‍රීය ණය සටහන් කර ගැනීම, ණය සහ පොලී අනුපාත නැවත ගෙවීම ප්‍රතිව්‍යුහගත කිරීම, ආර්ථික දුෂ්කරතාවන්ට මුහණ දුන් ගනුදෙනුකරුවන්ට යම් විරාම පිරිනැමීම ඇතුළත්ය. මෙම ඒකකය රු. බිලියන 24ක් වටිනා යෝජනා භාරගෙන ඇති අතර, සමාලෝචිත ණයවලින් 35%ක් ගනුදෙනුකාර මූල්‍ය තත්ත්වයට අනුව ලබාගන්නා ලදී.

නිෂ්පාදන පරාසය – සංවර්ධන ණය යෝජනා ක්‍රම

ග්‍රාමීය සංවර්ධන විධානයේ කොටසක් ලෙස බැංකුව වත්කම් නිෂ්පාදන රාශියක් පිරිනමන අතර, බොහෝ දුරට කෘෂිකර්මාන්තය මත පදනම් වූ ජීවනෝපායන් සංවර්ධනය සඳහා මූල්‍යකරණය කිරීමෙන් මූල්‍ය බර හිලව් කරගැනීමට ක්‍රියා කරයි.

People's Power ණය යෝජනා ක්‍රමය	මෙය වාණිජමය සහ මූල්‍යමය වශයෙන් ශක්තිමත් ව්‍යාපාර ආයතනවල වර්ධනය සහ තිරසාරතාවය සඳහා සහයවීමට ක්ෂුද්‍ර මූල්‍ය අංශයට මූල්‍ය සහය ලබාදෙන ණය යෝජන ක්‍රමයකි. මෙම මුදල් ලබාදෙන යෝජනා ක්‍රමය විස්තීර්ණ මූල්‍ය සහය ලබාදෙන අතර, ඒවා සහන පොලී අනුපාතවලට රු. මිලියන 5ක උපරිමයක් දක්වා නව ව්‍යාපාර ස්ථාපිත කිරීම සහ පවත්නා ව්‍යාපාර පුළුල් කිරීම සහ කාරක ප්‍රාග්ධනය අවශ්‍යතා වැනි ආයෝජන සඳහා ලබා දේ. ව්‍යාපාර තිරසාරතාවය වැඩි කිරීම සහ අංශය තුළ දිගුකාලීන වර්ධනය පෝෂණය කිරීම අරමුණු කරයි.
වනිතා සවිය ණය යෝජනා ක්‍රමය	ශක්තිමත් ව්‍යාපාර ආයතන සඳහා බැංකු සේවා කරා පිවිසීමේ පහසුකම් ඇති කරමින් කාන්තා ව්‍යවසායිකාවන්ගේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට බැංකුව මෙම සහන ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත. මෙම යෝජනා ක්‍රමයෙන් ජාතික ආර්ථික සංවර්ධනයට කාන්තා දායකත්වය වැඩි කිරීම, ග්‍රාමීය ආර්ථික වර්ධනය තුළ ඔවුන්ගේ නායකත්වය ශක්තිමත් කිරීම, සහ ආයෝජනය සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රු. මිලියන 5ක උපරිමයක් ලබාදෙමින් නැගී එන කාන්තා ව්‍යවසායිකාවන් සවිබල ගැන්වීම තුළින් ජීවන තත්ත්වයන් වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය	ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා උපරිමය රු. මිලියන 7ක් වන ආයෝජන ප්‍රාග්ධනය ලබාදෙමින් මහජන බැංකුව සමඟ සහයෝගිත්වයෙන් ඉහළම ආයතනය ලෙස, පොල් සංවර්ධන මණ්ඩලය විසින් අනුග්‍රහය ලබාදෙන මෙය ප්‍රති ආයෝජනය පදනම් සහන ණය යෝජන ක්‍රමයකි. ණය සඳහා 8%ක පොලී අනුපාතයක් අය කරන අතර, බැංකුව පොල් සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගිත්වයෙන් ඵලදායිතාව සහ අස්වැන්න වැඩි කිරීමට පොල් අස්වනු නෙලීමේ ව්‍යවහාරවලට අදාළ උපදේශන සේවා ලබා දේ.
සුළු ඉඩම් හිමි කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන	මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහනක් වන, කෘෂිව්‍යාපාර සහ කෘෂිකර්මය කේන්ද්‍රීය ව්‍යවසාය සංවර්ධනය මෙන්ම ගම පදනම් ගොවි ජාලය හරහා ප්‍රජාව පදනම් මූල්‍ය මැදිහත්වීම තුළින් අරමුදල් සේවයේ යෙදවීම මෙයින් අරමුණු කරන අතර, කෘෂිකර්මය, ධීවර සහ පශුසම්පත් යන ත්‍රිවිධ වෙළෙඳපොල අරමුණු කරයි.
අස්වැන්න ණය යෝජනා ක්‍රමය	කෘෂි යාන්ත්‍රණ සහ විද්‍යාත්මක වගාකිරීමේ ක්‍රම යොදා ගැනීම දිරිගන්වමින් සම්ප්‍රදායික ගොවියන් කෘෂිව්‍යාපාර ව්‍යවසායකයින් දක්වා පරිනාමනය කිරීමට මෙම ණය යෝජනා ක්‍රමය සැලසුම් කර ඇත. මෙම මුලපිරීමෙන් ඵලදායිතාව සහ මූල්‍ය ශක්තිය වැඩි කිරීම අපේක්ෂා කරන අතර, කෘෂිකර්මය-ආශ්‍රිත ව්‍යාපාර විශාල ප්‍රමාණයකට සහය වේ. මෙම යෝජනා ක්‍රමය කෘෂි ඉඩම් මිලදී ගැනීම (රු.මිලියන 5ක ආයෝජන සීමාවක් සමඟ) සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව (රු. මිලියන 2 දක්වා) වැනි ආයෝජන සහය සඳහා මූල්‍ය සහය ලබා දේ.
People's Paddy Pledge ණය යෝජනා ක්‍රමය	මෙය වී මෝල්හිමියන්ට සහ වී මිලදී ගනිමින් රැස්කරන අයට ලබාගත හැකිය. මෙම යෝජනා ක්‍රමය සඳහා ඉහළ සීමා නොමැති අතර වසරකට 13%ක පොළිය අය කෙරේ. නැවත ගෙවීම් දින 180ක උපරිමයකට සීමා වේ.
NCRCS ණය යෝජනා ක්‍රමය	මෙම යෝජනා ක්‍රමයේ පරමාර්ථය වන්නේ ගොවි ප්‍රජාව අතර දිළිඳුකම තුරන් කිරීමයි. විවිධ බෝග තිස් දෙකක් මෙම යෝජනා ක්‍රමය යටතේ ආවරණය කරන අතර, අතුරු අස්වනු නෙලීම, පොහොර යෙදීම සහ ඒකාබද්ධ පලිබෝධ කළමනාකරණය ඇතුළුව සේවයේ යෙදවිය යුතු ස්ථානීය විශේෂ කෘෂි විද්‍යා ක්‍රමවේද මත කෘෂිකර්මය තුළ මනා පරිචයන් භාවිතය සඳහා උපදේශන සේවා ලබා දේ.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

2025 න් ඉදිරියට සංවර්ධනය කේන්ද්‍රීය බැංකු යෝජනා ක්‍රමය සහ නිෂ්පාදන ව්‍යවසාය ධනය පිළිබඳ විෂමතාව ආපසු හරවන බව සහතික කිරීමට බැංකුකරණ ඒකකයේ මූලික මෙවලමක් වන අතර, SME සහ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රම නගාසිටුවීම සමාජයෙ බොහෝ අවධානයට ලක්විය හැකි අංශවලට සේවය කරයි. SME වෙළෙඳපොල අනුව, 2024 දී ප්‍රවර්තන ශක්තිය ගොඩ නැගීමට අපේක්ෂා කරන බැවින් මධ්‍ය ප්‍රමාණයේ වෙළෙඳපොල බැංකුවේ ස්ථීර අවධානය වේ. මෙය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය තුළ යෙදී සිටින පාර්ශ්ව සවිබලගැන්වීමට හේතු වේ.

තාක්ෂණික යෙදවුම්, යථාතත්‍ය කෘෂිකර්මය, සංවර්ධන ණය, ග්‍රාමීය ව්‍යාපාරවල අනාගත නායකයින්ට උපදෙස් දීම බැංකුව ඉදිරියේ ප්‍රධාන සාධක කිහිපයක් වේ. වාණිජ, SME සහ ක්ෂුද්‍ර ණය වෙළෙඳපොල තුළ නැවුම් විභවතා බැංකුව අපේක්ෂා කරන බැවින් කළඹ ශක්තිය තුළ 30-40%ක වර්ධනයක් 2025 දී අපේක්ෂා කෙරේ.

ආයතනික බැංකුකරණය

බැංකුවේ ණය කළඹට 40%ක වැඩි දායකත්වයක් සමඟ, ආයතනික බැංකුකරණ අංශයට (CBD) ආර්ථිකය පහත වැටීමේ අවහිරතා යාත්‍රණය කිරීමේ සහ මූල්‍ය සහය අවශ්‍ය ව්‍යාපාරවලට සහයවීමේ කාර්ය පවරන ලද අතර මේ තුළින් 2024 දී ශක්තිමත් කාර්ය සාධනයක් ලබාදී ඇත.

අපගේ ප්‍රවේශය

මහජන සුභසාධනය පිළිබඳ පැහැදිලි විධානයක් සහිත රජයට අයත් බැංකුවක් ලෙස, රජයට අයත් ව්‍යවසාය (SOEs) CBD කළඹේ විශාල කොටසක් නියෝජනය කරයි. 2024 දී, අපගේ ණය කළඹ විවිධාංගීකරණය කිරීමට උපායමාර්ගික විතැන්වීමක් තුළ අපගේ ණය පැතිරෙන ප්‍රමාණයේ ශේෂයක් සාක්ෂාත් කර ගැනීමට SOEs මත අපගේ ඔරොත්තුදීම අඩු කරමින් පුද්ගලික අංශයේ ආයතන හඹායාමේදී අපි අපගේ උත්සාහයන් පුළුල් කළෙමු.

සුවිශේෂී අවස්ථා

- නව ආයතනික ගනුදෙනුකරුවන් 100ක් ඇතුළත්වීම.
- නව ගනුදෙනුකරුවන්ගෙන් 60%ට වඩා රු. බිලියන 103ක් වන ණය පහසුකම් ලබා දෙන ලදී.
- පුද්ගලික අංශයේ ණය කළඹ තුළ 28%ක වැඩිවීම.
- අක්‍රිය ණය කිසිදු වැඩිවීමක් නොමැතිව මනාව කළමනාකරණය කරන ලදී.

පුද්ගලික අංශය දක්වා ප්‍රසාරණය

නව ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීම කෙරෙහි අවධානය

වසර පුරාම අපගේ පාරිභෝගික කළඹට පෞද්ගලික අංශයේ ආයතන ඇතුළත් කිරීම සඳහා අපි තියුණු වැඩසටහනක් දියත් කළෙමු. අපගේ විකුණුම් කණ්ඩායම්වලට පුහුණුවක් පිරිනමන ලද අතර, ඒ තුළින් ණය ඇගයීම, ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණය සහ විකුණුම් ශිල්පය ඇතුළුව පුද්ගලික අංශයට සහ අපනයන සමාගම් වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීම සඳහා අවධානය යොමු කරන ලදී. සතිපතා රැස්වීම් සහ කුඩා රැස්වීම් මඟින් ඕනෑම ගැටළුවක් ඉක්මනින් විසඳීම හෝ අභියෝග සහ විසඳුම් පිළිබඳ ද්විත්ව-මාර්ග සන්නිවේදනය සහතික කර ඇත. කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු සමඟින්, 2023 දී 20% ක් වූ පුද්ගලික අංශයේ ණය කළඹ 2024 දී 28% දක්වා වැඩි කිරීමට කණ්ඩායම්වලට හැකි විය.

ශක්තිමත් අවදානම් තක්සේරු කිරීම සහ නියාමනය

විකම අවස්ථාවේදී, නව ආයතනවල ශක්තිමත් අවදානම් තක්සේරුව සහ අවදානම් කළමනාකරණය අපි ආරම්භ කළෙමු. අක්‍රියතාව මානව පාලනය කරන ලද බව අඛණ්ඩ නියාමනය මඟින් සහතික කරයි.

දැනට සිටින ගනුදෙනුකරුවන්ට සහය දිගු කිරීම

පුද්ගලික අංශයේ වෙළෙඳපොල සමඟ වඩා හොඳින් සහභාගිවීමට අපි අපගේ විකුණුම් උපායමාර්ගය අභ්‍යන්තරව විතැන් කළ අතර, ආර්ථික දුෂ්කරතා හේතුවෙන් මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දුන් ව්‍යවසායන්ට අපි අතිශයයින් සහය දුගු කළෙමු. විධිමත් ණය විරාම ලබා නොදුන්නද, පසුගිය වසරවල ආර්ථික විනාශය හේතුවෙන් බිඳවැටුණු ව්‍යාපාර ප්‍රතිසාධනය කිරීමට පවත්නා පහසුකම්වල නියමයන් සහ කොන්දේසි බැංකුව සක්‍රීයව ප්‍රතිශෝධනය කර ඇත.

පසුගිය වසරවල අභියෝග මඟින් සෘණාත්මකව බලපෑමට ලක් වූ ඇඟලුම් කර්මාන්තයට සැලකියයුතු සහය අපි ලබාදුන්නෙමු. ණය නැවත උපලේඛණගත කිරීම සහ ප්‍රතිව්‍යුහගතකරණය තුළින්, ආර්ථික පහත වැටීමෙන් ගොඩ ඒමට අපගේ ගනුදෙනුකරුවන්ට අපි සහය ලබා දුන්නෙමු. එවැනි කර්මාන්ත කිහිපයක් වර්තමානයේ මනාව ක්‍රියාත්මක වන බව ද අපි සතුටින් වාර්තා කර සිටිමු.

දේශීය නිෂ්පාදකයින්ට සහයවීම

මෝටර් රථ ආනයනය මත අඛණ්ඩ තහනම් කිරීමට ප්‍රතිචාරාත්මකව, දේශීය පරිභෝජනය සඳහා නිෂ්පාදනය කරන දේශීය මෝටර් රථ චකලස් කිරීමේ පිරියතට අපි සහය ලබා දුන්නෙමු. ඊට අමතරව. තිරසාරතාවය සඳහා බැංකුවේ සමස්ත උපායමාර්ගය සමඟ බැඳුණු පුනර්ජනනිය හා සූර්ය බලශක්තිය සඳහා වන හරිත ව්‍යාපෘතිවලට අපි මුදල් ලබා දුන්නෙමු.

මනාව සූදානම් කණ්ඩායමක්

පුද්ගලික අංශය තුළ අභියෝග සපුරාලීමට තාක්ෂණය හා මෘදු කුසලතා මෙවලම්වලට දක්ෂ ඉහළම කුසලතා සහිත අලෙවි කණ්ඩායමක් අපගේ උපායමාර්ගය වෙනස තුළ අවශ්‍ය වේ. ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණය පිළිබඳ පුහුණුව සහ ගනුදෙනුකාර කළඹක් පෝෂණය කර කළමනාකරණය කිරීමට වෙන් කිරීම තුළ, කණ්ඩායම 2024 අපගේ සාර්ථකත්වයේ අත්‍යවශ්‍ය සංරචකයක් වී ඇති අතර, 2025 සහ ඉන් ඉදිරියට අභියෝග සහ අවස්ථා ජයගැනීමට ඔවුන් මනාව සූදානම් කෙරේ.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

සුපිරි වත්කම්වල තත්ත්වය සහ අක්‍රිය ණයවල අඩුවීමත් සමඟ අපගේ අවධානය පුද්ගලික අංශය සහ ආනයන/අපනයන අංශයේ ණය කළඹ කෙරෙහි වැඩි වනු ඇත. ඊට අමතරව, අපගේ විදේශ විනිමය තැන්පතු හා ප්‍රේෂණ වර්ධනය කෙරෙහි අවධානය යොමු කරන අතරම අපගේ ගනුදෙනුකරුවන්ට ගාස්තු පදනම් නිෂ්පාදන පිරිනමනු ඇත.

භාණ්ඩාගාරය

අපගේ ප්‍රතිපාර්ශ්ව සමඟ දිගුකල් පවත්නා සහ විශ්වාසී සම්බන්ධතා හා බැඳුණු අපගේ මූල්‍ය ස්ථායිතාව රටේ බැංකු ක්ෂේත්‍රයේ වෙළෙඳපොල නායකයෙක් ලෙස අපගේ ස්ථානය ඒකාබද්ධ කරන ශක්තිමත් කාර්ය සාධනයක් සහතික කර ඇත.

අපගේ ප්‍රවේශය

2023 මුල් කොටසේදී පැතිර තිබුණු සාර්ව ආර්ථික අර්බුදය විසින් ඇතිකළ අභියෝග ජය ගැනීමට අපගේ දේශීය සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ දශක ගණනාවක් පුරා ගොඩනගන ලද ශක්තිමත් සම්බන්ධතාවල වාසිය අපි ලබා ගතිමු. මෙම වසර, ජාත්‍යන්තර හවුල්කරුවන් ඇතුළුව අපගේ ප්‍රතිපාර්ශ්වයන් සමඟ අපි අන්තර් බැංකු මාර්ග සාර්ථකව යලි ස්ථාපිත කළෙමු. එය අපගේ ද්‍රවශීලතාවය සහ වෙළෙඳපොල පැවැත්ම වැඩි කර ඇත. ඊට අමතරව, අපගේ භාණ්ඩාගාර කණ්ඩායම භාණ්ඩාගාර කටයුතුවලින් සැලකියයුතු වර්ධනයක් ලබාගනිමින් මතුවන අවස්ථාවන් මත ප්‍රාග්ධනනීය කර ඇත. අපගේ ආයෝජන බැංකුකරණ ඒකකය අපගේ සම්බන්ධතා සහ ආයෝජක විශ්වාසය පිළිබඳ ශක්තිය පිළිබිඹු කරමින් අධික දායකත්වයක් සහිත ණයකර නිකුතුවක් සාර්ථකව සිදු කරන ලදී. මෙවැනි ජයග්‍රහනයන් මූල්‍ය වර්ධනය මත අපගේ උපායමාර්ගික අවධානය ඉස්මතුකර දැක්වීම පමණක් නොව ගතික පරිසරයක් තුළ ඵලදායී අයුරින් වෙළෙඳපොල ඉදිරියට ගෙන යාමට අපට ඇති හැකියාව ද පෙන්නුම් කරයි. භාණ්ඩාගාර ඒකකය සාර්ථකව මෙවැනි අරමණු සාක්ෂාත් කරගත් අතර, නියාමන අවශ්‍යතාවන්ට සහ විදේශ විනිමය ගෝලීය සංග්‍රහයට අනුකූලව කටයුතු කර ඇති අතර, එය බැංකුවේ මෙහෙයුම් නිවැරදි කිරීමේ ආදර්ශය වේ.

සුවිශේෂී අවස්ථා

- ණයකර නිකුතුව – අධික දායකත්වය ලබාගැනීම.
- බලපෑමට ලක් වූ විකුණුම් උපායමාර්ග ඇතුළත් කිරීම.
- අඩු කළමනාකරණය තුළින් නැවත සංකල්පිත ක්‍රියාවලි.
- 2024 අවසානය වන විට පිරිසිදු ණය මාර්ග ප්‍රවේශය.

කාර්යසාධනය

2024 වසර තුළ වර්ධිත වෙළෙඳපොල තත්ත්වයන් හේතුවෙන් වසර ආරම්භයේදී අප මුහුණු දුන් සංරෝධක ක්‍රමානුකූලව පහ වී ගියේය. මෙතෙක් ඉහළම ලාභ වාර්තා කිරීමට එහි ව්‍යාපාර අවස්ථා පුළුල් කිරීමට බැංකුව සමත් විය. මෙයට අනුව, ආයෝජන බැංකුකරණ ඒකකය (IBU) ද වසර තුළ ආරක්ෂක, භාරකාර සහ උපදේශන සේවා ඇතුළත් වන සිය මෙහෙයුම් පුළුල් කරමින් 2024 දී රු. මිලියන 844ක මේ දක්වා ඉහළම ආදායම වාර්තා කර ඇත. මෙම ඒකකය බැංකුවේ බාසල් III අනුකූල ස්ථර 2 ණයකර නිකුතුව සඳහා රු. බිලියන 13,515ක් ඉහළ දැමීමේදී සාර්ථක විය. බැංකුව අතිරික්ත ද්‍රවශීලතාව යොදවමින් කෙටි, මධ්‍ය, සහ දිගුකාලීන ආයෝජනවලට සම්බන්ධ කරන ලද අතර, ආයතනික ණය කටයුතුවල ප්‍රතිසාධනය සහ වර්ධනය අපේක්ෂා කරයි. භාණ්ඩාගාර අලෙවි කණ්ඩායම තුළින් වසර කිහිපයකට පෙර ආරම්භ කරන ලද අපගේ ආක්‍රමණශීලී විකුණුම්වලින් ව්‍යාපාර පරිමාව වැඩි කරමින් යහපත් ප්‍රගතියක් සිදු වූ අතර, ඒ තුළින් භාණ්ඩාගාර ආදායමෙන් සැලකියයුතු ප්‍රමාණයක් වෙන් කරන ලදී. වසර තුළ පොලී අනුපාත සැලකියයුතු ලෙස අඩුවූ බැවින් බැංකුව රු. මිලියන 573ක් වන ප්‍රාග්ධන ලාභ වාර්තා කර ඇත. භාණ්ඩාගාර ඒකකය අර්බුදයේ බලපෑම් හමුවේ ප්‍රවර්තන ශක්තිය ලබාගත් අතර, අභියෝග ජය ගැනීමට අපගේ සාමූහික උත්සාහයන්, අපගේ උපායමාර්ග යොදා ගැනීම, සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ අපගේ පාර්ශ්වකරුවන්ට වටිනාකම ලබාදීම කෙරෙහි අවධානය යොමු කළ ශක්තිමත් සාර්ථක කණ්ඩායමක් ගෙඩනැගීම ඉන් පෙන්නුම් කරයි.

නිරාසර උපායමාර්ග

දැඩි තරඟකාරිත්වය ලාභ සංකෝචනය වීමට මඟ පාදන ලද යුගයක් තුළ, අපගේ ප්‍රගතිය ක්‍රමවත් කිරීම සහ වර්ධනය කිරීමට අඩු කළමනාකරණ සංකල්ප අපි ක්‍රියාත්මක කළෙමු. මෙම ප්‍රවේශය සැලකියයුතු ලෙස අපගේ සේවා ලබාදීම වැඩි කළ අතර, එය වැඩිකළ කාර්යසාධනයට දායක විය. බැංකුවේ භාණ්ඩාගාර මෙහෙයුම්වල විශේෂිත ස්වභාවය හේතුවෙන්, අපගේ මනාව දක්ෂ හා පළපුරුදු සහ වෙළෙඳපොල දැනුවත් කණ්ඩායම රඳවා ගැනීම ශ්‍රමබලකා ජංගමතා පසුබිම තුළ අත්‍යවශ්‍ය වී ඇත. වැටුප් වැඩිකිරීම, සේවක සුභසාධනය වර්ධනය, සහ අවසාන වශයෙන් බැංකුවට හිතකර ප්‍රතිඵල අත්කරදෙන අඛණ්ඩව වැඩකිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. අපගේ ඉහළම වත්කම වන, අපගේ කාර්ය මණ්ඩලය, සුවිශෙෂී කාර්යසාධනයක් ලබාදීමට සහ ඒ තුළින් බැංකුවේ පරමාර්ථ අත්කර ගැනීමට අභියෝග ජයගනිමින් ස්ථිරවම සිය වටිනාකම පෙන්වා දී ඇති බව වාර්තා කිරීම අපට සතුටකි භාණ්ඩාගාරය ශාඛා ජාලය සඳහා බහුවිධ දැනුවත් කිරීමේ සැසි සංවිධානය කළ අතර ඒවා සැලකියයුතු ලෙස භාණ්ඩාගාර නිෂ්පාදන පිළිබඳ ශාඛා කාර්ය මණ්ඩලයේ දැනුම වැඩි කර ඇත.

අභියෝග

බැංකුවේ ගතික අංශයක් ලෙස, භාණ්ඩාගාර ඒකකය වසංගතය තුළ බාධා රහිත සේවාව ලබාදීමට අභියෝග හමුවේ අඛණ්ඩව කටයුතු කළේය. බැංකුවේ නවීන තාක්ෂණය හා ඩිජිටල්කරණය ක්ෂේත්‍රය තුළ බලවේගයක් ලෙස සිය කීර්තිනාමය තවදුරටත් වැඩි කර ඇත. එබැවින්, අපගේ ගනුදෙනුකරුවන්ට ලබාගත හැකි අපගේ මාර්ග වාර්තාව සමඟ අපි අඛණ්ඩව ඉදිරියට යන අතර, ආක්‍රමණශීලී විකුණුම් ධාවකයක් ක්‍රියාත්මක කර, අපගේ දේශීය හා ජාත්‍යන්තර ප්‍රතිපාර්ශ්වයන් සමඟ අපගේ විශිෂ්ට ව්‍යාපාර සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කරමින් හරස් විකුණුම් අවස්ථා ක්‍රියාවට නංවමින් ආයෝජනය සඳහා තිරසාර ස්ථාන අපේක්ෂා කරමු. ශක්තිමත් අනුකූලතා සහ පාලන සංස්කෘතියක් තුළ කටයුතු කරමින්, 2025 සහ ඉන් ඉදිරිය සඳහා අපගේ කාර්යසාධන පරමාර්ථ ලබාදීම පිළිබඳ අපිට විශ්වාසය.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

ඍණාත්මක මූල්‍ය තත්ත්වය සහ රට පහළ ශ්‍රේණිගත කිරීම්වලට තුඩු දුන් දිගුකාලීන ආර්ථික පරිහානියක් මගින් අභියෝග ඇතිකළ අතර, එම අභියෝග 2024 දක්වා දිගටම පැවතුනි. ජනතාවගේ බැහැරකළහැකි ආදායම විශාල වශයෙන් අවම කළ ඉහළ බදු අනුපාත ඇතුළුව ආනයන සීමා සහ වෙනත් අභියෝග මෙයට හේතු විය. බැංකු අංශය හරහා ඇතිකළ දරුණු බලපෑම අභියෝගාත්මක ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කර ඇති අතර, ක්ෂේත්‍රයේ අනෙකුත් තරඟකරුවන් සමඟ එක්ව අපිට ඉදිරියට යා යුතුව ඇත.

තවද, අපි ෆින්ටෙක් සමාගම් සහ සම්ප්‍රදායික නොවන ආකාරයෙන් ආකර්ෂණීය නිෂ්පාදන පිරිනමන වෙනත් ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ තරඟ කරමින් සිටිමු. ගතික පාරිසරික තත්ත්වයන් සහ නවීන තාක්ෂණය සහ නවීන පද්ධති සමඟ ලබාදියයුතු තරුණ පරම්පරාවේ අවශ්‍යතා සහ වුවමනාවන් පිළිබඳ අපි දැනුවත්ය.

එතෙර ගනුදෙනුකාර සේවා

ජාතියේ විදේශ විනිමය අවශ්‍යතා ශක්තිමත් කිරීමට ඇති බැඳීම තුළින් පහසු, නව්‍යකරණ සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය මූල්‍ය විසඳුම් සමඟ විදේශයන් හි ශ්‍රී ලාංකිකයින් සවිබලගැන්වීම.

අපගේ ප්‍රවේශය

කොවිඩ්-19 වසංගතයෙන් පසු විදේශ විනිමය සංචිතවල සැලකියයුතු අඩුවීමක් සලකුණු කළ අභියෝගාත්මක ආර්ථික වාතාවරණයකට ශ්‍රී ලංකාව මුහුණ දුන්හ. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ශ්‍රේණිගතකකරණවල පහත වැටීම මගින් මෙය තවදුරටත් වැඩි කළ අතර, විදේශයන් හි සිටින ශ්‍රී ලාංකිකයින්ගේ සහ විදේශීය ආයතනවල විශ්වාසය පළුදු කළේය. ඇති වූ බලපෑම වූයේ විදේශයන්හී සංක්‍රමණික සේවකයින්ගේ ප්‍රේෂණවල සැලකියයුතු පහත වැටීමකි. ඊට අමතරව, මෙම කාලසීමාව තුළ දේශපාලනික අස්ථාවරත්වය විදේශයන් හි සිටින ශ්‍රී ලාංකිකයින්ගේ විධිමත් ප්‍රේෂණ වර්ග කෙරෙහි සැලකියයුතු ලෙස උනන්දු වූ අතර, ඒවාට බොහෝ ආකර්ෂණීය හුවමාරු අනුපාත පිරිනමන ලදී.

මෙම අභියෝග අවම කිරීමට, බැංකුව අභ්‍යන්තර ප්‍රේෂණ සහ විදේශීය විනිමය තැන්පතු වැඩි කිරීම අරමුණු කළ උපායමාර්ගික මුලපිරීම් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. බැංකුව සිය ස්ථානය ශක්තිමත් කිරීමට නව උපායමාර්ග හඳුන්වා දුන් බැවින්, හා විදේශීය විනිමය ගලා ඒම් වැඩිකළ බැවින් මෙවැනි උත්සාහයන් 2024 දී තීව්‍ර කරන ලදී.

රාජ්‍ය බැංකුවක් ලෙස, OCS විදේශ විනිමය වැඩි කිරීමේ උත්සාහයන් හී ඉදිරි පෙරමුනේ පවතින අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසාධනය සහ දිගුකාලීන සංවර්ධනය සඳහා තීරණාත්මක සම්පත් ලබා ගැනීම සහතික කරයි. දේශීය හා ගෝලීය අභියෝග ජයග්‍රහනය කිරීම කරා අඛණ්ඩ බැඳීම ජාතියේ මූල්‍ය ඔරොත්තුදීම සහ වර්ධනයට සහයවිමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

අභියෝගාත්මක ආර්ථික අවපාතයන් හමුවේ අපගේ බැඳීම් ඉටු කිරීමේ අපගේ නිර්දෝෂ ගමන් වාර්තාව ඉස්මතුකර දැක්වීමට ලැබීම අපට සතුටක් වන අතර, අනෝන්‍ය ප්‍රතිලාභී ප්‍රතිඵල සාක්ෂාත් කර ගනිමින් අපගේ ප්‍රේෂණ හවුල්කරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා ගොඩනැගීමට අපව ශක්තිමත් කර ඇත.

සුවිශේෂී අවස්ථා

- සේවක ප්‍රේෂණ ඉලක්කය 6.7%කින් ඉක්මවිය.
- ගෝලීය හවුල්කරුවන් සමඟ ප්‍රේෂණ සම්බන්ධතා අටක්.
- නව විදේශ විනිමය නිෂ්පාදන තුනක් හඳුන්වා දෙන ලදී.

එතෙර ජීවත්වන සහ වැඩකරන ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ වටිනා විදේශීය ප්‍රේෂණ ඒවීමට පහසුකම් ඇති කරමින් ශ්‍රී ලංකා ආර්ථික ප්‍රතිසාධනයට සහයවිමේදී එතෙර ගනුදෙනුකාර සේවා (OCS) අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කරන අතර, දේශීය හා ජාත්‍යන්තර ගනුදෙනුකරුවන්ට සහයවෙමින් විදේශ විනිමය ගිණුම් සහ විශේෂ රුපියල් ගිණුම් පිළිබඳ ප්‍රවීන මඟපෙන්වීම ලබා දේ. බැංකුවේ ගෝලීය හවුල්කරුවන්ගේ විස්තීර්ණ ජාලය තුළින්, OCS විසින් සිය විදේශ විනිමය ඵලදායීව කළමනාකරණය කිරීමට, ඉපයීම් සියරටට පැමිණවීමට සහ පහසුවෙන් ගනුදෙනු ක්‍රියාත්මක කිරීමට විදේශීය ශ්‍රී ලාංකිකයින් ශක්තිමත් කරනු ලබයි. එසේ කරමින්, OCS රට තුළට වටිනා විදේශ විනිමය ඒවීමට සැලකියයුතු ලෙස දායක වන අතර, එය ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථායිතාවයට තීරණාත්මක මූලාශ්‍රයකි.

එතෙර ගනුදෙනුකාර සේවා සංක්‍රමණික සේවකයින්, අපනයනකරුවන් සහ ආයෝජකයින්ට කැප වූ සේවාව තවදුරටත් සපයනු ලබයි. ඊට අමතරව, අපි අපගේ පුද්ගල විදේශ විනිමය ඉතුරුම් ගිණුම්වල ඉතිරි කිරීමට බාලවයස්කරුවන් දිරිගැන්වීමට පුද්ගලික විදේශ විනිමය බාලවයස්කාර ඉතුරුම් ගිණුම යලි සකස් කරන ලදී.

මුල්පියවර

සේවක ප්‍රේෂණ වැඩි කිරීම

සේවක ප්‍රේෂණ වැඩි කිරීමට, අපි අපගේ ජාත්‍යන්තර පැවැත්ම පුළුල්කරමින් සම්බන්ධතා ශක්තිමත් කරන අතර, කළඹ පුළුල් කිරීමට සුදුසු වෙළෙඳපොල වෙත නැවුම් නිෂ්පාදන ලබා දේ. අපි නව වෙළෙඳපොල තුළට සාර්ථකව ඇතුළත් වූ අතර, බහරේනය, ඕමානය, කුවෙයිට්, ස්පාඤ්ඤය සහ එංගලන්තය වැනි පවත්වා ප්‍රවේශන් වැඩි කරයි. මෙහි ඒකායන අරමුණ වූයේ ප්‍රේෂණ ප්‍රවේශ වර්ධනය කිරීමයි. සිංගප්පූරුව, මැලේසියාව සහ රොමානියා හි වෙළෙඳපොල අපි ආරම්භ කළෙමු. විදේශීය සංචිත ශක්තිමත් කිරීමේදී රජයේ උත්සාහයන්ට සහය වෙමින් 2024 දී ප්‍රේෂණ ගලාඒම්වල සුවිශේෂී වැඩිවීමක් ලබාගැනීමේදී අපි අතීශයින් සාර්ථක වූ බව වාර්තා කිරීම අපට සතුටකි.

මහජන ප්‍රේෂණ ලොගෝව නැවත දියත් කිරීම

"මහජන ප්‍රේෂණ" සේවා ලෝගෝව "Sent with Love" යන නව තේමාව සමඟින් නැවත දියත් කරන ලද අතර, ආදරණීයන් වෙත යවන ලද ප්‍රේෂණවල අර්ථවත් බලපෑම අවධාරණය කරන හෘදයාංගම වීඩියෝවක් සහ දැන්වීමක් ඇතුළත් විය. "ඔබ දුර සිට එවන ආදරය ඔබේ පවුලට ලෝකයක් ගෙන දෙයි" යන පණිවිඩය මෙහි දී ලබා දෙන අතර, මහජන බැංකුවේදී, එම සම්බන්ධතාවයට පහසුකම් සැලසීම සම්බන්ධව අපි ආඩම්බර වන අතර, විදේශීය අංශය වැළඳ ගනිමු.

විදේශීය විනිමය ඉතුරුම් ගිණුම්

අපි පවත්නා නිෂ්පාදන නැවත දියත් කරමින් සහ නව නිෂ්පාදන මාර්ග හඳුන්වා දෙමින් විදේශීය විනිමය සංචිත සේවයේ යොදවන ලදී.

"PFC" – බාල වයස්කාර ඉතුරුම් ගිණුම් "එතෙර උදාන" සහ "එතෙර ඉසුරු" PFC ගිණුම ලෙස නැවත දියත් කිරීම

සමාජයේ යහපැවැත්ම සහ සංවර්ධනයට දායකවීම යන අපගේ මූලික වගකීම හඳුනා ගනිමින්, සියලුම දෙනා ඇතුළත් සමාජය පෝෂණය කිරීමට පිවිසිය හැකි මූල්‍ය සේවා ලබාදීම මගින් මෙම රාජකාරිය ඉටු කිරීමට, 2024 ඔක්තෝබර් 1 දින ලෝක ළමා දිනය සමරමින්, අපි "PFC බාල වයස්කාර ගිණුම්" "එතෙර උදාන" ලෙස නැවත දියත් කළෙමු. ළමුන්ගේ විදේශ අධ්‍යාපනය සිහිනයක් වීමට ඉඩ නොදී සිහිනය ඉටු කර ගැනීමට අද සිටම ඔවුන් වෙනුවෙන් විදේශ විනිමය ඉතුරුම් ආරම්භ කිරීමට දෙමව්පියන්ට සහයවීමට බැංකුව අරමුණු කරයි.

අපගේ එතෙර ගනුදෙනුකාර සේවා විසින් ක්‍රියාත්මක මෙම මුලපිරීම තුළින් බැංකු ක්ෂේත්‍රය තුළ අපගේ නායකත්වය ශක්තිමත් කරමින් නව්‍යකරණය, ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව, සහ තරුණ පරම්පරාව සහ පවුල් සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පෝෂණය කිරීම පෙන්නුම් කරයි.

තැන්පතු මට්ටම අනුව පොලිය දරන විදේශ විනිමය ඉතුරුම් ගිණුමක් වන, "එතෙර ඉසුරු ප්‍රිමියර්" පුද්ගල විදේශ විනිමය ඉතුරුම් ගිණුම (PFCPR) හඳුන්වා දීම.

මහජන බැංකුව විසින් තැන්පතු මට්ටම අනුව පොලිය දරන විදේශ විනිමය ඉතුරුම් ගිණුමක් වන, "එතෙර ඉසුරු ප්‍රිමියර්" පුද්ගල විදේශ විනිමය ඉතුරුම් ගිණුම (PFCPR) හඳුන්වා දෙන ලද අතර, මේ මගින් ගනුදෙනුකරුවන්ට විදේශ විනිමය වැඩි වැඩියෙන් ඉතුරු කර ඉපයීම් වැඩි කරගැනීමට ඉඩ දෙන තරඟකාරී පොලී අනුපාත පිරිනමනු ලබයි.

තැන්පතු මට්ටම අනුව පොලිය දරන විදේශ විනිමය ඉතුරුම් ගිණුමක් වන, ව්‍යාපාර විදේශ විනිමය ගිණුම් (BFCA)

ව්‍යාපාර විදේශ විනිමය ගිණුම් අපනයනකරුවන්ට, හොටෙල්හිමියන්ට සහ විදේශ විනිමය උත්පාදනය කරන ව්‍යාපාරවලට ගලපනු ලබයි. මේ තුළින් ගෝලීය සැපයුම් දාමය තුළ භාණ්ඩ හා සේවාවන්හී ප්‍රවාහවලට පහසුකම් සලසයි. මෙම නව්‍යකරණ නිෂ්පාදනය මගින් වර්ධනීය අවම ශේෂය මත පදනම් වී තරඟකාරී පොලී අනුපාත පිරිනමනු ලබන අතර, ව්‍යාපාරවලට වැහි ප්‍රතිඵල උපරිම කිරීමට අවස්ථාවක් ලබා දේ.

ගනුදෙනුකරුවන් පිළිගැනීම

"ජනතා ප්‍රේෂණ වාසි කෝටියයි" අබණ්ඩව තුන්වන වසරටත් ඉදිරියට ගෙන යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව හරහා සැකසූ ප්‍රේෂණ ප්‍රමාණයේ සැලකිය යුතු වැඩිවීමක් ඇති වූ අතර, එමඟින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ගනුදෙනු සමඟ වටිනා ත්‍යාග උපයා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී. මෙම වැඩසටහන විදේශයන් හි සිටින ශ්‍රී ලාංකිකයන්ගේ අම්ල දායකත්වයන් හඳුනා ගනිමින් සැලකියයුතු බලපෑමක් සිදුකර ඇති අතර, විදේශියන් හී වැඩකරන ශ්‍රී ලාංකිකයින්ගේ කැපවීම සහ ජාතියේ ආර්ථික අනාගතය හැඩ ගැස්වීමේදී ඔවුන්ගේ තීරණාත්මක කාර්යභාරය අපි ප්‍රබලව අගය කරමු.

ත්‍යාගවලින් ප්‍රේෂණ කටයුතු වැඩිපුර දිරිගැන්වීම පමණක් නොව ඉහළ තැන්පතු මට්ටම් වැනි අමතර ප්‍රතිලාභ පිරිනමමින් ගනුදෙනුකාර පක්ෂපාතිත්වයද ශක්තිමත් කිරීම සිදුකරයි. ප්‍රේෂණ ලැබෙන පවුල්වල අවශ්‍යතා සලසන, මෙම වැඩසටහන් මගින් ගනුදෙනුකරුවන්ට මූල්‍ය දිරිගැන්වීම්, සහ වැඩිකළ වටිනාකම පිරිනමන අතර, ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලමින් බැංකුවේ බැඳීම තවදුරටත් ස්ථීර කරයි.

Pre-departure සහ expat ණය

බැංකුව විදේශ සංචාරයට සූදානම්වන පුද්ගලයින් සඳහා Pre-Departure ණය ලබා දෙන අතර, ඒ තුළින් වීසා වියදම්වල සිට ගුවන් වියදම දක්වා සියලුම මූල්‍ය අවශ්‍යතා ලබාදෙන බව සහතික කරයි. ඊට අමතරව, මෝටර්රථයක්, නිවසක්, අධ්‍යාපනය, සහ පුනර්ජනනීය බලශක්තිය අත්කර ගැනීම වැනි විවිධ අරමුණු සඳහා භාවිතා කළ හැකි අසමසම ණය වැඩසටහනක් සඳහා විදේශයන් හි සිටින ශ්‍රී ලාංකිකයන් සුදුසුකම් ලබයි.

හවුල්කාරත්ව ශක්තිය හා පැවැත්ම

මෙම උපායමාර්ගිකව ස්ථාපිත නියෝජිතයින්ට පුද්ගලගත සහය ලබාදීමට කැපවී සිටින අතර, වඩා පහසු ප්‍රේෂණ සේවා ඇති කරමින්, සහ අපගේ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන බැංකු නිෂ්පාදන රාශියක් දක්වා ප්‍රවේශ වීමට සහය ලබා දේ. ඉහළ විභව රටවල මෙම පැවැත්ම විදේශයන් හි සිටින ශ්‍රී ලාංකිකයන්ගේ වර්ධනීය ඉල්ලුම වඩා හොඳින් අවබෝධ කරගෙන සේවය සැලසීමට අපට ඉඩ සලසන අතර, අපගේ ගෝලීය පැවැත්ම පුළුල් කිරීමට අපගේ කැපවීම සවිබලගන්වමින් අපගේ ගනුදෙනුකරුවන්ට සුවිශේෂී වටිනාකමක් ලබාදේ.

අභියෝග

අනෙකුත් දේශීය බැංකු, තරඟකාරී විනිමය අනුපාත සහ අවිධිමත් මාර්ග වලින් ඇති දැඩි තරඟකාරිත්වයට අපි මුහුණ දුන්හ. ඊට අමතරව, ගෝලීය ආර්ථික තත්ත්වයන්හි උච්චාවචනයන්, දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළවල නියාමන වෙනස්වීම් සහ දේශසීමා ගනුදෙනු වල සංකීර්ණතා කළමනාකරණය කිරීම වැනි අභියෝග අපගේ මෙහෙයුම්වලට තවදුරටත් බලපෑවේය.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

2025 සහ ඉන් ඉදිරියට නව ප්‍රේෂණ හවුල්කරුවන් සමඟ එකතුවෙමින් සහ අපගේ ගෝලීය ජාල ව්‍යාප්ත කරමින් නව නිෂ්පාදන දියත් කිරීමට සැලසුම් සකස් කරමින් පවති. විදේශයන්හී ශ්‍රී ලාංකිකයින් ඇඟයීමට සහ ඔවුන්ගේ අම්ල දායකත්වය හඳුනා ගැනීමට විවේකය පදනම් දිරිදීමනා සමඟ අබණ්ඩව හතරවැනි වරටත් "ජනතා ප්‍රේෂණ වාසි කොටියයි" දියත් කරන්නෙමු. නිවසේ සිය ආදරණීයන්ට සහය ලබා දෙන විදේශයන්හී ශ්‍රී ලාංකිකයින්ගේ නොසැලෙන කැපවීම සහ දුෂ්කර කාර්යය අපි ඉහළින් අගය කරමු. අපගේ බැඳීම ආරක්ෂිත හා කාර්යක්ෂම ප්‍රේෂණ සේවා පිරිනැමීමෙන් ඉදිරියට පුළුල් කළෙමු. අපගේ ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ සෞභාග්‍යවත් අනාගතයක් තුළ ආයෝජනය කිරීම සවිබලගන්වන දිගුකාලීන සම්බන්ධතා පෝෂණය කිරීම අපි අරමණු කරමු. පුද්ගලගත සහය සහ නව්‍යකරණ විසඳුම් තුළින්, අපගේ ගනුදෙනුකරුවන්ට ස්ථීර මූල්‍ය පදනමක් ගොඩනැගීමට සහ දිගුකාලීන සාර්ථකත්වය සඳහා අවස්ථාවන් නිර්මාණය කිරීමට සහයවීමට අපි කැප වී සිටිමු.

ජාත්‍යන්තර බැංකුකරණය

ආනයන සහ අපනයන ව්‍යාපාර ඇති කරමින්, වෙළෙඳ මූල්‍යකරණය සහ අදාළ මෙහෙයුම් අංග පිළිබඳව ආයතනික ගනුදෙනුකරුවන් වෙත පුහුණුව ලබා දෙමින්, ජාත්‍යන්තර බැංකුකරණ සේවාව සිය ගනුදෙනුකරුවන්ට රටේ ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රබෝධ කිරීමට සහයවීමට කඩිසර ක්‍රියාවලි සහ කාලීන ගනුදෙනු ඔවුන් වෙත ලබාදෙන ලදී.

අපගේ ප්‍රවේශය

විස්තීර්ණ උපදේශන සේවා ලබාදීම, ගෝලීය වෙළෙඳ ගතිකතා පිළිබඳ අපගේ ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම, සහ ජාත්‍යන්තර ගනුදෙනු ඵලදායීව කරගෙන යාමට අවශ්‍ය දැනුමෙන් ඔවුන් සන්නද්ධ කිරීම මඟින් ජාත්‍යන්තර වෙළෙඳාමට පහසුකම් ඇතිකර, එය වර්ධනය කිරීම අපගේ මූලික අවධානය වේ. ඊට අමතරව, ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳව විශේෂ පුහුණු වැඩසටහන් පිරිනමමින් මහජන බැංකුවේ අපගේ කාර්ය මණ්ඩලයේ ප්‍රවීනතාව ශක්තිමත් කිරීමට අපි කැපවී සිටිමු. වෙනස්වන වෙළෙඳ රෙගුලාසි, අවදානම් අවම කිරීමේ උපායමාර්ග, සහ ගෝලීය වාණිජ්‍ය තුළ මනා පරිචයන් පිළිබඳව අපගේ ගනුදෙනුකරුවන් සහ සේවකයින් දැනුවත්ව සිටින බවත් ඒ තුළින් පහසු සහ කාර්යක්ෂම සීමා හරහා ගනුදෙනු පෝෂණය කරන බවත් මෙවැනි මූලපිරිමිවලින් සහතික කරයි.

සුවිශේෂී අවස්ථා

- රටවල් 70ක අනුරූප බැංකු සම්බන්ධතා 567ට වැඩිය.
- ආනයනය ගනුදෙනු 14,794.
- කාර්ය මණ්ඩලයේ 427ක ට සේවාස්ථ පුහුණුව දෙන ලදී.
- අපනයන ගනුදෙනු 4,983
- වෙළෙඳපොලට පුහුණු වැඩමුළු 03ක් පවත්වන ලදී.

උපායමාර්ගික පාලනය

අපනයන පරිමාව වැඩි කිරීම සහ බැංකුවෙන් ලබාගත හැකි ආනයන පහසුකම් භාවිතය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අපගේ සමාජීය උපායමාර්ගය කේන්ද්‍රගත කොට ඇත. මෙම පරමාර්ථ අත්කර ගැනීම සඳහා, මනාව නිශ්චිත උපායමාර්ගික වැඩසටහන් ගණනාවක් අපි ක්‍රියාත්මක කළෙමු. වෙළෙඳ මූල්‍ය සේවා වැඩි කිරීම, සහ ජාත්‍යන්තර ව්‍යාපාර ගනුදෙනුවල වර්ධනය පෝෂණය කිරීම ඒවායේ අරමුණ විය.

(අ) වෙළෙඳ මූල්‍ය කුටි ස්ථාපිත කිරීම

අපගේ විස්තීර්ණ ජාලය තුළ නිවැරදිව තෝරා ගත් ශාඛාවල වෙළෙඳ මූල්‍ය කුටි අපි උපායමාර්ගිකව ස්ථාපිත කර ඇත. ජාත්‍යන්තර වෙළෙඳාමේ යෙදී සිටින ව්‍යාපාර සහ ව්‍යවසායකයින්ට විශේෂිත වෙළෙඳ මූල්‍ය සේවා සඳහා පහසු ප්‍රවේශය ඇති බව මෙම වැඩසටහනින් සහතික කරයි. ප්‍රධාන ස්ථානවල මෙවැනි කුටි ස්ථානගත කරමින්, ප්‍රවීන මාර්ගෝපදේශ ලබාදීමට, වෙළෙඳ ආශ්‍රිත ගනුදෙනු ක්‍රමවත් කිරීමට, සහ ගනුදෙනුවන්ගේ පළපුරුද්ද වැඩි කිරීමට සහ ඒ තුළින් අපනයනකරුවන් සහ ආනයනකරුවන් සඳහා විශ්වාසදායී මූල්‍ය හවුල්කරුවෙක් ලෙස අපගේ කාර්යභාරය ශක්තිමත් කිරීමට අපි අරමුණු කළෙමු.

(ආ) ප්‍රාදේශිය අපනයන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම

ජාතික අපනයන වර්ධනය ඉදිරියට ගෙන යාමේදී ප්‍රාදේශීය අපනයන මධ්‍යස්ථානවල තීරණාත්මක කාර්යභාරය හඳුනා ගනිමින්, අපනයන ආශ්‍රිත ව්‍යාපාර මෙහෙයවන කාර්ය මණ්ඩලය සඳහා හැකියා ගොඩනැගීම සහ කුසලතා සංවර්ධනය අපි ප්‍රමුඛ කර ඇත්තෙමු. ඉලක්කගත පුහුණු වැඩසටහන්, ප්‍රායෝගික වැඩමුළු සහ ඔවුන්ගේ විශේෂඥතාව වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් කළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන මුලපිරීම් මෙයට ඇතුළත් වේ. අපගේ කණ්ඩායම අපනයන මූල්‍ය, නියාමන අවශ්‍යතා සහ ගෝලීය වෙළෙඳ ව්‍යවහාර පිළිබඳ ගැඹුරු දැනුමකින් සන්නද්ධ කරමින්, සුපිරි උපදේශන සේවා පිරිනැමීමට ව්‍යාපාර සඳහා පහසු සහ වඩා කාර්යක්ෂම අපනයන මෙහෙයුම් ඇති කරමින් අපි ඔවුන් සවිබල ගන්වමු.

(ඇ) වෙළෙඳ මූල්‍ය ව්‍යාපාරවල තීව්‍ර ප්‍රවර්ධනය

වෙළෙඳ මූල්‍ය වර්ධනය වේගවත් කිරීම සඳහා, අපි නව්‍ය අලෙවිකරණ උපාය මාර්ග සහ කාර්ය මණ්ඩලය දිරිගැන්වීම සඳහා නිර්මාණය කර ඇති වැඩිදියුණු කළ ත්‍යාග යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත්තෙමු. මෙම මුලපිරීම තුළින් වෙළෙඳ මූල්‍ය තුළ ප්‍රයෝජනයට නොගත් ව්‍යාපාරික අවස්ථා ග්‍රහනය කර ගැනීම, ගනුදෙනුකරුවන්ගේ සහභාගීත්වය ශක්තිමත් කිරීම සහ වෙළෙඳ ආශ්‍රිත ගනුදෙනුවල වඩා ඉහළ පරිමාවක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. උපායමාර්ගික හවුල්කාරත්වයන්, ඩිජිටල් පැවැත්ම සහ ගලපන ලද මූල්‍ය විසඳුම් භාවිතා කරමින්, වෙළෙඳ මූල්‍ය සේවා සොයන ව්‍යාපාර සඳහා හෙඳුම තෝරාගැනීම ලෙස අපගේ බැංකුව ස්ථානගත කිරීමට අපි අරමුණු කරමු.

මෙවැනි විස්තීර්ණ වැඩසටහන් තුළින්, ජාත්‍යන්තර වෙළෙඳාම පෝෂණය කිරීමට, ව්‍යාපාර ප්‍රජාවට සහයවීමට සහ රටේ ආර්ථික වර්ධනයට දායකවීමට අපගේ කැපවීම අපි අඛණ්ඩව ශක්තිමත් කරමු.

ව්‍යාප්තිය

2024 දී, ජාත්‍යන්තර බැංකුකරණ ඒකකයේ කාර්යසාධනයට ජාතික ආර්ථිකයේ ක්‍රමානුකූල ප්‍රතිසාධනය විසින් ධනාත්මකව බලපෑම් කරන ලද අතර, දළ දේශීය නිෂ්පාදනයේ හි වර්ධනයක් සහ රටේ විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීමක් සලකුණු කළේය. මෙම ආර්ථික ඉහළයාම අංශයේ සමස්ත කාර්යසාධනයට සහය වෙමින් වෙළෙඳාම ආශ්‍රිත ව්‍යාපාරවල පුබුදුවට දායක විය.

කෙසේවෙතත්, මෙම වර්ෂය තුළ ද අභියෝග නොතිබුනාම නොවේ. අංශය විසින් මුහුණ දෙන ලද වඩාත් සැලකියයුතු දුෂ්කරතාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ නියාමන උපදෙස්වලින් මතුවූ අතර, ඉන් බැංකු අංශයට රජයට අයත් ආයතන වෙත නිරාවරණය අඩු කිරීමට උපදෙස් දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම අංශය ඉහළ මට්ටමේ ව්‍යාපාර විශේෂයෙන් ලංකා බනිජ තෙල් සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය වැනි රජයට අයත් ආයතන වලින් සැලකියයුතු අලාභයකට මුහුණ පාන ලදී. මෙම ආයතන සමඟ ගනුදෙනුවල පහත වැටීම ආදායම් උත්පාදනයට සැලකියයුතු ලෙස බලපෑම් කරමින් විදේශ විනිමය වෙළෙඳ පරිමාවන් හී සැලකියයුතු හිඩැසක් ඇති කරන ලදී.

මෙම අභියෝගවලට ප්‍රතිචාරාත්මකව, මෙම අංශය සිය උපායමාර්ගය සක්‍රීයව නැවත ක්‍රමාංකනය කරන ලද අතර, පුද්ගලික අංශයේ ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධතා ශක්තිමත් කිරීම කෙරෙහි සිය අවධානය යොමු කරන ලදී. පුද්ගලික අංශයේ වෙළෙඳ ගනුදෙනුවල වෙළෙඳපොල කොටස පුළුල් කිරීම අරමුණු කර ගනිමින් වෙළෙඳ මූල්‍ය හා වෙනත් ජාත්‍යන්තර බැංකු සේවා ප්‍රවර්ධනය කිරීමට ස්ථිර උත්සාහයක් ගනු ලැබීය. මෙවැනි වැඩසටහන්වලින් අංශයේ උපායමාර්ගික කේන්ද්‍රයේ ථලදායිත්වය පිළිබිඹු කරමින් පුද්ගලික අංශයේ වෙළෙඳ ගනුදෙනුවල සැලකියයුතු වැඩිවීමක් වාර්තා කර ඇත.

කෙසේවෙතත්, පුද්ගලික අංශයේ සහභාගිත්වයන් හී වර්ධනය හමුවේ, ලංකා බනිජ තෙල් සංස්ථාව සහ වෙනත් රජයට අයත් ආයතනවලින් මෙයට පෙර දායක වූ සැලකියයුතු ව්‍යාපාර පරිමාවන් සඳහා සම්පූර්ණයෙන් වන්දි ගෙවීමට ප්‍රමාණවත් නොවන පරිදි ගනුදෙනුවල පරිමාව පැවතුණි. එබැවින්, අංශය සිය ව්‍යාපාර කළඹ විවිධාංගීකරණය කිරීම තුළ ප්‍රසංසනීය ප්‍රගතියක් සිදුකර ඇත. රජයට අයත් ආයතනවල ගනුදෙනුවලින් ඇති කළ පරතරය තවදුරටත් අභියෝගයක්ව පැවති අතර, විදේශ විනිමය ගලාඒම් සහ ආදායම් උත්පාදනය වැඩි කිරීමට තවදුරටත් උපායමාර්ගික වැඩසටහන් අවශ්‍ය විය.

නිෂ්පාදන මාර්ගය	ව්‍යාපාර පරිමාව රු.මි. 2024	ව්‍යාපාර පරිමාව රු.මි. 2023
ආනයන	905,010	972,792
අපනයන	243,258	214,236

වසර තුළල ජාත්‍යන්තර බැංකුකරණ අංශය මූලික කාර්යසාධන දර්ශක කිහිපයක් සාර්ථකව අත්කර ගෙන ඇති අතර, වෙළෙඳ සේවාවල විශිෂ්ටත්වය, කාර්යක්ෂමතාව සහ අඛණ්ඩ සංවර්ධනය කරා සිය බැඳීම ඉන් පිළිබිඹු කරයි.

- **සේවා ප්‍රමිති වැඩි කිරීම:** මෙම අංශය සේවාදායකයින්ට ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි කඩිනම්, කාර්යක්ෂම, සහ උසස් තත්ත්වයේ බැංකුකරණ විසඳුම් ලබාදෙන බව සහතික කරමින් සුපිරි ගනුදෙනුකාර සේවාව ලබාදීමේදී සිය කැපවීම තුළ ස්ථාරව පැවතුණි. ගනුදෙනුකාර කේන්ද්‍රීය උපායමාර්ග ක්‍රියාත්මක කරමින්, සහ ක්‍රියාවලි ක්‍රමවත් කරමින්, මෙම අංශය විශ්වාසී මූල්‍ය හවුල්කරුවෙක් ලෙස සිය කීර්තිතාමය බලගන්වමින් සේවා ප්‍රමිත සැලකියයුතු අයුරින් වර්ධනය කළේය.
- **පුහුණුව තුළින් හැකියා ගොඩනැගීම:** වෙළෙඳ සේවා පිළිබඳ අවශ්‍ය දැනීම සහ ප්‍රවීනතාව සමඟ ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය සන්නද්ධ කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, මෙම අංශය ශාඛා 427 ක කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා විස්තීර්ණ සේවාස්ථ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙවැනි පුහුණු සැසි මගින් වෙළෙඳ මූල්‍ය නිෂ්පාදන, ජාත්‍යන්තර බැංකුකරණ මෙහෙයුම්, නියාමන අවශ්‍යතා පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වැඩි කරන අතර, ගෝලීය වෙළෙඳාමේ යෙදී සිටින ගනුදෙනුකරුවන්ට දැනුවත් මඟපෙන්වීම සහ පහසු සේවා ලබාදීමට ඔවුන් සවිබල ගන්වන ලදී.
- **ISO 9001:2015 නැවත සහතික කිරීම:** තත්ත්ව කළමනාකරණය සහ මෙහෙයුම් විශිෂ්ඨත්වය කරා සිය නොසැලෙන කැපවීම පෙන්වමින්, ජාත්‍යන්තර බැංකුකරණ අංශය වෙළෙඳ සේවා සඳහා සාර්ථකව ISO 9001:2015 සහතික කිරීම ආරක්ෂා කර ගෙන ඇත. මෙම ජාත්‍යන්තරව පිළිගත් සහතික කිරීම තුළින් ක්‍රියාවලි කාර්යක්ෂමතාව, සේවා තත්ත්වය, සහ ගනුදෙනුකාර තෘප්තිය තුළ අංශය විසින් ගෝලීය මනා පරිචයන්ට අනුකූලවීම නැවත සහතික කරයි. මෙවැනි ජයග්‍රහනයන්ගෙන් අංශයේ හැකියාව පවත්වා ගැනීමට ගන්නා ලද ස්ථිර තත්ත්වයේ පාලන ක්‍රියාමාර්ග පවත්වා ගැනීම සහ සිය බෙදාහැරීමේ රාමුව අඛණ්ඩව වර්ධනය කිරීම ඉස්මතු කර දක්වයි.

මෙවැනි ප්‍රධාන කාර්යසාධන දර්ශක ඉටුකරමින්, ජාත්‍යන්තර බැංකුකරණ අංශය වෙළෙඳ මූල්‍ය විසඳුම්වල කැපී පෙනෙන නායකයෙක් ලෙස සිය ස්ථානය ශක්තිමත් කර ඇත. තවද සිය පාර්ශ්වකරුවන් අතර විශ්වාසය හා විශ්වාසනීයත්වය පෝෂණය කරමින් බැංකුවේ ජාත්‍යන්තර ව්‍යාපාර වර්ධනය ඉදිරියට ගෙන ගියේය.

ඊට අමතරව, මෙම අර්බුදය තුළ, අපගේ ගනුදෙනුකරුවන්ගේ අත්‍යවශ්‍ය ගනුදෙනු බාධාවක් නොමැතිව සලසන ලද බව සහතික කරමින් අපගේ වටිනා ගනුදෙනුකරුවන් සඳහා විදේශ විනිමය සුරැකීම අපි ප්‍රමුඛ කළ බව සටහන් කිරීම වැදගත්ය. එමෙන්ම අපි ඔවුන්ගේ ව්‍යාපාර අඛණ්ඩතාව සහ මූල්‍ය ස්ථායිතාවයට උපරිම අනුග්‍රහ ලබා දුන්නෙමු. කොවිඩ්-19 වසංගතය තුළ, ජාත්‍යන්තර බැංකුකරණ අංශය

එක් දිනයක්වත් වසාදැමීමක් නොමැතිවම බාධාරහිත සේවාව සහතික කරමින් මෙහෙයුම් පවත්වා ගන්නා ලදී. අපි සියලූම අත්‍යවශ්‍ය ආනයන සහ අපනයන වලට පහසුකම් ඇති කරන අතර, පහසු වෙළෙඳ මූල්‍ය මෙහෙයුම් පවත්වා ගන්නා ලදී. ආර්ථික අර්බුදය සහ සිවිල් අසහනය හමුවේ පවා, ව්‍යාපාරවලට සහයවීමේ අපගේ බැඳීම ස්ථිරව පවත්වා ගනිමින් අභියෝගාත්මක තත්ත්වයන් හමුවේ ජාත්‍යන්තර ගනුදෙනුවල පහසු ක්‍රියාත්මක කිරීම සහතික කරන ලදී.

අභියෝග

ජාත්‍යන්තර බැංකුකරණය කාර්යක්ෂම සේවා ලබාදීමේදී සහ තිරසාර මෙහෙයුම්වලදී අභියෝග ගණනාවකට මුහුණ දේ. මේවාට විදේශ විනිමය වෙළෙඳපොල උච්චාවචනය, ආනයන භාණ්ඩ මත ඉහළ බදු සහ රේගු බදු, දැඩි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, ගෝලීය වෙළෙඳ යුද්ධ, දේශපාලන බිඳවැටීම් සහ ප්‍රධාන වරායන් සහ නිෂ්කාශන පහසුකම්වල උද්ඝෝෂණ සමඟ කම්කරු හිඟය ඇතුළත් වේ.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

ආනයන සීමා ලිහිල් කර ඇති බැවින් සහ ආර්ථික කටයුතු ප්‍රතිසාධනය වෙමින් පවතින් බැවින්, මහජන බැංකුව වැඩිකළ කාර්යක්ෂමතාවය, තරඟකාරී මිලකරණය, සහ ගලපන ලද මූල්‍ය සේවා සමඟ ජාත්‍යන්තර වෙළෙඳාමට සහය විමට තවදුරටත් කැපවී සිටී. වෙළෙඳ මූල්‍ය පිරිනැමීම් ක්‍රමවත් කරමින්, අපි ගෝලීය වෙළෙඳාම නිසැකව ඉදිරියට ගෙන යාමට පිරිවැය-ඵලදායී සහ විශ්වාසී මූල්‍ය සහය සමඟ ව්‍යාපාර සවිබල ගැන්වූයෙමු.

ඩිජිටල් පරිවර්තනය, ක්‍රියාවලි සරලකරණය සහ සකීය ගනුදෙනුකාර සහභාගිත්වය කෙරෙහි අපගේ අවධානය මෙහෙයුම් හැකියාවන් ශක්තිමත් කළ අතර, ගෝලීය මනා පරිචයන් සමඟ අපගේ සේවා පෙළ ගස්වනු ලබයි. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, ආයෝජන විශ්වාසය සහ පුළුල් වෙළෙඳපොල අවස්ථා සමඟ, ආර්ථිකය පුනරුත්ථාපනය ඇති කිරීම, ශ්‍රී ලංකාවේ ගෝලීය ස්ථානය සවිබල ගැන්වීම සහ ව්‍යාපාර හා ජාතිය වෙනුවෙන් තිරසාර වර්ධනය පෝෂණය කිරීම අපි අරමුණු කරමු.

තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් බැංකුකරණය

අන්තර්ජාල වේදිකා සහ ජංගම යෙදුම් භාවිතය ඩිජිටල් බැංකුකරණයෙහි අත්‍යවශ්‍ය කොටස් වෙති. ඩිජිටල් පහසුව දැඩිව හඹායාම, ක්‍රියාත්මක කිරීම සහ අලෙවි කිරීමේදී අපගේ නිර්දය අධිෂ්ඨානය තුළ, අපගේ ගනුදෙනුකරුවන්ට අපි අතිවිශිෂ්ට සාර්ථකත්වයක් පිරිනමන අතර, එය ජීවිතයේ සෑම තරාතිරමකම ගනුදෙනුකාර පාර්ශ්වවල මූල්‍ය අන්තර්ගතභාවය තුළ උපකාරී වේ.

අපගේ ප්‍රවේශය

දිවයින පුරා පැතිරුණු 750කට වැඩි ශාඛා සහ සේවා මධ්‍යස්ථාන සමඟ, විශාලතම වාණිජ බැංකුව වශයෙන්, අපගේ ගනුදෙනුකාර ලඟාවීම අති විශාලය. සම්ප්‍රදායික බැංකුකරණය අපගේ ගනුදෙනුකරුවන් සමඟ සහභාගි වූ අපගේ මූලික ස්වරූපය වූ අතර, එහිදී දශක ගණනාවක් පුරා, ශාඛා සහ සේවා මධ්‍යස්ථානවලට ඔවුන් පුද්ගලිකව පැමිණීම සිදු විය. කෙසේවෙතත්, නවීන බැංකුකරණ ස්වරූපය ඩිජිටල් මෙවලම්වල දියුණුවත් සමඟ විශාල වෙනසකට භාජනය වී ඇති අතර, අපගේ පාර්ශ්වකරුවන්ට මූලිකවම අපගේ ගනුදෙනුකරුවන්ට ඉහළම වටිනාකම ලබාදීමට අපි ඉක්මණින්ම මෙය යොදා ගෙන ඇත. එබැවින්, 2024 වසර සම්ප්‍රදායික සහ නිතර වෙනස්වන GenZ ගනුදෙනුකාර පදනමේ අවශ්‍යතාවන්ට ගැලපීමට පරිශීලක හිතකාමී ඩිජිටල් මෙවලම් උසස් කිරීම, අත්කරගැනීම සමඟ ක්‍රියාත්මක කිරීම වෙත ඉදිරියට යාමේ අභිලාෂයක් සමඟ අපි ඉදිරියට යමු.

තොරතුරු තාක්ෂණ හා ඩිජිටල්කරණ දෙපාර්තමේන්තු අපගේ ගනුදෙනුකරුවන්ට ආරක්ෂිත පහසුව ලබාදීම පිණිස අපගේ මහත් අපේක්ෂිත තාක්ෂණික හා ඩිජිටල් වැඩසටහන තුළ පෙරමුණ ගනී.

සුවිශේෂී අවස්ථා

- ඩිජිටල් විසඳුම් ලියාපදිංචි වීම් මිලියන 4.4කි.
- අන්තර්ජාල හා ජංගම බැංකුකරණ සේවා සඳහා ලියාපදිංචිවීම් මිලියන 3.3කි.
- 18,250+ ආයතනික ගනුදෙනුකරුවන් ආයතනික අන්තර්ජාල බැංකුකරණ පහසුකම් සඳහා ලියාපදිංචි වී ඇත.
- අන්තර්ජාල හා ජංගම බැංකුකරණ සේවා හරහා ගනුදෙනුවල වටිනාකම රු. ට්‍රිලියන 1.3ට ආසන්න වේ.

ඩිජිටල් බැංකුකරණ පහසුව

අපි වැඩිකළ අංග සහ ප්‍රතිලාභ සමඟ අපගේ වටිනා ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා අපගේ ඩිජිටල් බැංකුකරණ සේවා සම්භාරය අපි ඉදිරියට ගෙන ගියෙමු.

පාරිභෝගික ගනුදෙනුකාර අංශය

People's Wave ජංගම යෙදුම

ශ්‍රී ලංකාවේ ඉහළම මට්ටමේ ජංගම බැංකුකරණ යෙදුම වන මෙය, මූල්‍ය ප්‍රවේශය පුළුල් කිරීමේදී අත්‍යවශ්‍යය. එහි පරිශීලක හිතකාමී සැලැස්ම සහ ශක්තිමත් ආරක්ෂිත ලක්ෂණ විශ්වාසී ඩිජිටල් බැංකුකරණ අත්දැකීමක් සහතික කරයි. පහසුවෙන්ම, පරිශීලකයින්ට ක්ෂණික අරමුදල් මාරු කිරීම ක්‍රියාත්මක කිරීමට, බිල්පත් පියවීමට, ණය සහ ගෙවීම් කළමනාකරණය කිරීමට, සහ උකස් ආශ්‍රිත කාර්යයන් මෙහෙයවීමට හැකි වේ. පෙරවමිති පිවිසීම සහ ආරක්ෂාව සෑම අවස්ථාවකදීම බැංකු කටයුතු ආරක්ෂා කරයි. මෙම යෙදුමේ ජනප්‍රියතාව විස්තීර්ණ බැංකු සේවා ලබාදීමට ඇති සිය හැකියාවෙන් පහසුවෙන්ම ජනිත වන අතර, ඵලදායී ලෙස සිය මුදල් කළමනාකරණය කර ගැනීමට දිවයින පුරා විශේෂයෙන් අඩුවෙන් සේවයලත් කලාපවල පරිශීලකයින් සවිබල ගන්වයි.

People's Web – පාරිභෝගික අන්තර්ජාල බැංකුකරණය

සුපිරි ඩිජිටල් පහසුව සඳහා People's Wave, ව්‍යාප්ත කරමින් විස්තීරණ පාරිභෝගික ලක්ෂණ ලබා දේ. මිලියන 2.5ට ආසන්න ලියාපදිංචි පරිශීලකයින් සහ 45,000ක නව මාසික බඳවාගැනීම් සමඟ, ශක්තිමත් ගනුදෙනුකාර විශ්වාසය සහ ඩිජිටල් සහභාගිත්වය ඉන් පිළිබිඹු කරයි. 24/7 තුළ ලබාගත හැකිවීම, ශක්තිමත් ආරක්ෂාව, සහ පහසු යාත්‍රණය සහිත People's Web ප්‍රශස්ත බැංකුකරණ අත්දැකීම සහතික කරයි. ගනුදෙනුකරුවන් විස්තීර්ණ ගිණුම් කළමනාකරණය, විස්තරාත්මක ගනුදෙනු ඉතිහාස, සහ උකස් අරමුදල් මාරු කිරීමේ හැකියාවන්ගෙන් ප්‍රතිලාභ ලබයි. මෙම වේදිකාව තනි පුද්ගල ගනුදෙනුකාර අවශ්‍යතා රාශියක් ලබා දෙමින් පිවිසියහැකි සහ ආරක්ෂක ඩිජිටල් බැංකුකරණ විසඳුම් ලබා දෙමින් මහජන බැංකුවේ බැඳීම සවිමත් කරයි.

People's Pay Wallet යෙදුම

පරිශීලක කේන්ද්‍රීය ඩිජිටල් ගෙවීම් අත්දැකීමක් මින් ලබා දේ. පහසු ඇතුළත්වීම සඳහා ත්‍රිභාෂා සහය, පෙරවමිතික පිවිසීම, සහ ස්වයං ලියාපදිංචිය මෙහි ලක්ෂණ වේ. පරිශීලකයින් ගබඩාකළ ගෙවීම් විස්තර, දෛනික ගනුදෙන සරලකරණය, ස්වයං ගැලපියහැකි සීමා, අනෙකුත් බැංකුගිණුම්වලට සම්බන්ධතාව, සහ ආරක්ෂිත ගෙවීම් වැඩි කිරීම පාලනය යන ප්‍රතිලාභ ලබයි. පාරිභෝගික තත්‍ය කාලීන බිල්පත් ගෙවීම් සහ නිරුත්සාහී QR ගනුදෙනු සඳහා උපයෝගිතා සපයන්නන් සහ රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව හරහා පහසුකම් සලසයි, 800,000ක පරිශීලකයින් වෙත ලඟාවෙමින්, සහ පසුගිය වසරේ සංඛ්‍යාව දෙගුණ කරමින්. එහි වේගවත් යොදාගැනීම තහවුරු කර ඇත. විශේෂයෙන්, ගනුදෙනුකරුවන්ට සිය CRIB වාර්තා (MyReport) කරා ආරක්ෂිත සහ නිරුත්සාහී ප්‍රවේශය සමඟ ගනුදෙනුකරුවන් සවිබල ගන්වයි. මෙම ඒකාබද්ධතාව ගනුදෙනුකරුවන්ට CRIB සමඟ ලියාපදිංචිවීමට ඉඩදෙන අතර, පරිශීලක හිතකාමී වේදිකාවක් හරහා ඕනෑම ස්ථානයක සිට ඕනෑම අවස්ථාවක සිය ණය තොරතුරු ඉල්ලා සිටිය හැකිය. People's Pay wallet යෙදුම පහසු, ආරක්ෂක සහ කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය සවිබල ගන්වයි.

ආයතනික බැංකු අංශය

People's Wyn ජංගම බැංකුරණ යෙදුම

People's Wyn යෙදුම යනු මහජන බැංකුවේ ආයතනික සේවාදායකයින් වෙනුවෙන් සැලසුම්කළ සුවිශේෂී ජංගම බැංකුකරණ විසඳුමකි. ඉන් පහසුව සහ විනිවිදභාවය පිරිනමමින් දුරස්ථව මූල්‍ය මෙහෙයුම් කළමනාකරණය කිරීමට ව්‍යාපාර ශක්තිමත් කරයි. මෙම යෙදුම CEFT සහ SLIPS, උපයෝගිතා බිල්පත් ගෙවීම්, හරහා මුදල් මාරුකිරීම්වලට සහයවන අතර, තත්‍ය කාලීන චෙක්පත්වල තත්ත්වය නියමනය ඇතුළුව විස්තීර්ණ ගිණුම් දෘෂ්‍යතාව ලබා දේ. ආරක්ෂිත ගනදෙනුවලට බලය දීමේ හැකියාවන් වැඩිකළ පාලනය සහතික කරයි. එහි පරිශීලක හිතකාමී අතුරුමුහුණත සමඟ, People's Wyn මූල්‍ය අවස්ථාවන් වෙත කඩිනමින් ප්‍රතිචාර දක්වමින් එම අවස්ථාවේදීම මුදල් කළමනාකරණය කිරීමට ව්‍යාපාරවලට හැකියාව ඇති කරයි. මෙම යෙදුම ආයතනික සේවා දායකයින් සඳහා උසස්, ආරක්ෂිත හා පිවිසිය හැකි ඩිජිටල් බැංකු විසඳුම් ලබාදීමේ මහජන බැංකුවේ කැපවීම පෙන්නුම් කරයි.

People's Web ආයතනික මාර්ගගත බැංකුකරණ පහසුකම

ශක්තිමත් බහු මට්ටම් ආරක්ෂිත බලය දීම සුරක්ෂිත කළ People's Wyn Mobile හි හැකියාවන් අභිබවමින් විස්තීර්ණ ආයතනික බැංකු සේවා පරාශයක් මෙයින් පිරිනමයි. පුළුල්ව පැතිරුණු යොදා ගැනීම සහ විශ්වාසය පිළිබඳ සාක්ෂි දරමින් මෙම වේදිකාව 18,000ට වැඩි ලියාපදිංචි ආයතනික සේවා දායකයින් වෙත පහසුව සලසයි. එයින් LPOPP, මූල්‍ය මෙහෙයුම් සැලකියයුතු ලෙස ක්‍රමවත් කිරීම ඇතුළුව පහසු උපයෝගිතා සහ ආයතනික බිල්පත් ගෙවීම් පහසු කරයි.

තවද, People's Web Corporate විසින් වැටුප්පත් කළමනාකරණය, විශාල ගෙවීම්, ස්ථිර තැන්පතු ගනුදෙනු, සහ පිටතට යන ප්‍රේෂණ වැනි තීරණාත්මක කාර්යයන් සඳහා විස්තීර්ණ සහ අවසාන විසඳුම ලබා දේ. විශේෂයෙන් ණයවර ලිපි, නාවික කටයුතු සහතිකවිම්, වෙළෙඳ ණය වැනි අත්‍යවශ්‍ය වෙළෙඳ මූල්‍ය නිෂ්පාදන සඳහා යොදා ගැනීමට ආනයනකරුවන් සහ අපනයනකරුවන් සවිබල ගන්වයි. People's Web Corporate ආයතනික ගනුදෙනුකාර පදනම වෙත ගලපන ලද උසස්, ආරක්ෂක සහ කාර්යක්ෂම ඩිජිටල් බැංකු විසඳුම් ලබාදීමට මහජන බැංකුවට ඇති බැඳීම පිළිබඳ සාක්ෂියකි.

ක්‍රියාවලි වර්ධනයන්

People's Wiz Accounts-Digital ගිණුම් විවෘත කිරීම

ඩිජිටල් බැංකුකරණය සහ ගිණිකොණ ආසියාව, අප්‍රිකාව, සහ මැද පෙරදිග හරහා පළමු තත්‍ය කාලීන ඩිජිටල් ගනුදෙනුකරුවන් ඇතුළත් කිරීමේ යෙදුම ස්ථාපිත කිරීමේදී එය උසස්කිරීම සඳහා පුරෝගාමී වීමේදී මෙය නියෝජනය කරයි. මෙම නව්‍යකරණය කඩදාසි පරිභෝජනය සැලකියුතු ලෙස අඩුකරමින් සහ තිරසාර මෙහෙයුම් ව්‍යවහාර සමඟ පෙළ ගැසෙමින් මහජන බැංකුවේ හරිත බැංකුකරණ දැක්මට විශේෂයෙන් දායක වේ.

2017 එය දියත් කිරීමේ සිට, People's Wiz Accounts පුළුල්ව පැතිරුණු පිළිගැනීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පෙන්නුම් කරමින් ගනුදෙනුකරුවන් මිලියන 4.8ක් සාර්ථකව ඇතුළත් කර ඇත. මෙම වේදිකාව ගිණුම් විවෘත කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් කරමින් සහ ප්‍රමාණාධික්‍ය පද්ධති පිවිසුම් ඉවත් කරමින් උසස් මුදල් විශුද්ධිකරණ පද්ධතිය ඇතුළත් කර ඇත.

තවද, ණය කාඩ් ක්ෂණිකව සක්‍රිය කිරීම, ඉ-ප්‍රකාශන, අන්තර්ජාල බැංකුකරණය, ජංගම බැංකුකරණය, සහ කාඩ් රහිත මුදල් පහසුකම් ඇතුළුව සේවා පිරිනැමීම් රාශියක් පරිනමන අතර ගනුදෙනුකරුවන්ගේ රැඳී සිටීමේ කාලය සහ අභ්‍යන්තර මෙහෙයුම් වැඩ තොගය අඩු කරයි. වැඩිකළ ඩිජිටල් ලේඛනගතකරණ ව්‍යවහාරය, විද්‍යුත් තැපෑල හරහා ඉලෙක්ට්‍රොනික් පිරිසැකසුම ඇති කිරීම, සහ පද්ධති ඒකාබද්ධකරණය භෞතික මුද්‍රණය, අත්සන් කිරීම සහ ගොනු කිරීම සඳහා අවශ්‍යතා තවදුරටත් අඩුකරයි.

ගනුදෙනුකරුවන්ට සාර්ථකව ගිණුමක් විවෘත කිරීමත් සමඟ හදිසි SMS සහ ඊමේල් දැනුම්දීමක් ලැබේ. ස්වයංක්‍රියකල ලේඛණ අනාගත යොමුව සඳහා සංරක්ෂණ පද්ධතිය තුළ ආරක්ෂිත හා කාර්යක්ෂම ලේඛණ ගබඩා කිරීම සහතික කර, වේදිකාවේ සමස්ත කාර්යක්ෂමතාව සහ පරිශීලක අත්දැකීම ශක්තිමත් කරයි.

People's eZE Accounts-Virtual ගිණුම් විවෘත කිරීම

People's eZE ගිණුම් සම්ප්‍රදායිකව ශාඛාවට ගමන් කිරීමේ අවශ්‍යතාව ඉවත් කරමින් එහි අතත්‍ය සේවාව සමඟ ගිණුම් විවෘත කිරීම වෙනස් කරයි. මෙම වේදිකාවේ දුරස්ථ ඩිජිටල් අනන්‍යතා සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලිය ඇතුළත් වන අතර, ඕනෑම ස්ථානයක සිට පහසු ගනුදෙනුකරුවන් ඇතුළත් කර ගැනීම ශක්තිමත් කරයි. විශ්‍රාම දෙපාර්තමේන්තුව සමඟ සෘජුව ඒකාබද්ධ කරමින්, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව වැඩි කරමින් ක්ෂණික ජාතික හැඳුනුම්පත සත්‍යාපනය සහතික කරයි.

කෘතිම බුද්ධි සත්‍යාපනය භාවිතා කරමින්, මෙම පද්ධතිය ගනුදෙනුකරුගේ භෞතික පෙනුම ඔහුගේ හැඳුණුම්පත සමඟ හරස් පරීක්ෂාවට ලක් කර ජායාරූප උඩුගත කරන අතර, සත්‍යාපනයේ අමතර මට්ටමක් එකතු කරයි. තවද, මෙම වේදිකාව දුරස්ථ KYC ක්‍රියාවලිය වීඩියෝ ලේඛනගත කිරීම ඇතුළත් කරන අතර, අනාගත යොමු සඳහා ආරක්ෂිත වාර්තාවක් ලබා දේ. Google සේවාව හරහා ස්ථානය පදනම් සත්‍යාපනය නිරවද්‍යතාව තවදුරටත් සහතික කරයි. මෙම විස්තීර්ණ ප්‍රවේශය ආරක්ෂිත, පහසු, සහ කාර්යක්ෂම අතත්‍ය ගිණුම් විවෘත කිරීමේ අත්දැකීම සහතික කරන අතර, ඩිජිටල් නව්‍යකරණය සහ ගනුදෙනුකාර පහසුව කරා මහජන බැංකුවේ කැපවීම පිළිබිඹු කරයි.

People's Wiz Credit – පාරිභෝගික ණය ආරම්භක පද්ධතිය (RLOS)

මෙය පාරිභෝගික ණය පිරිසකසමින් සහ සම්ප්‍රදායිකව අතින් සිදුකළ ක්‍රියාපටිපාටි නවීන ඩිජිටල් වේදිකාවක් සමඟ ප්‍රතිස්ථාපනය කරමින් සැලකියයුතු උසස්වීමක් නියෝජනය කරයි. මෙම පද්ධතිය සමස්ථ ණය ජීවන චක්‍රය ක්‍රමවත් කරමින් කාර්යක්ෂමතාව සහ නිරවද්‍යතාව වැඩි කරයි. මෙම උසස් අවදානම් ශ්‍රේණිගතකරණ යාන්ත්‍රණය ණයකරුගේ ඇඟයීම් ස්වයංක්‍රීය කර, නිවැරදි, දත්ත පදනම් ණය තීරණ සහතික කරයි.

තවද, RLOS අනුරූපතාවය, අනුකූලතාවය සහ ඒකාකාරිත්වය සහතික කරමින් නෛතික ලේඛණ නිර්මාණය ස්වයංක්‍රිය කරයි. ණය ක්‍රියාපටිපාටි ප්‍රමිතිගත කරමින්, මෙම පද්ධතිය මානව දෝෂ අවම කර, මෙහෙයුම් නිරවද්‍යතාව සහ විශ්වාසනීයත්වය වර්ධනය කරයි. සවයංක්‍රිය කළ ණය අනුමත කිරීමේ වැඩ ප්‍රවාහය ප්‍රතිසැකසම් කාලය සැලකියයුතු ලෙස අඩුකරන අතර, පහසු, සම්පූර්ණයෙන් ඩිජිටල් ක්‍රියාවලියක් තුළින් ගනුදෙනුකාර අත්දැකීම වැඩි කරයි. මෙම වේදිකාව වැඩිකළ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාරිභෝගික ණයදීමේදී ගනුදෙනුකාර තෘප්තිය සඳහා තාක්ෂණය යොදා ගැනීමට බැංකුවේ කැපවීම තහවුරු කරයි.

People's Wiz Credit – පාරිභෝගික ණය ආරම්භක පද්ධතිය (CLOS)

ව්‍යාපාර ණය උත්පාදනය සහ අනුමැතිය ක්‍රමවත් කිරීමට සැලසුම් කළ සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කළ පද්ධතියක් මින් හඳුන්වා දේ. මෙම වේදිකාව පුද්ගල ණය පහසුකම් සහ විවිධ නිෂ්පාදන පරාස හරහා විස්තීරණ ණය පැකේජවලට සහය වන අතර, විවිධ ව්‍යාපාර අවශ්‍යතා සපුරාලයි. ඒකාබද්ධ මෙවලම් මූල්‍ය ප්‍රකාශන, අවදානම් ශ්‍රේණිගත කිරීමට, සහ ණය ලබාදීමට ඇති සුදුසුකම ඇඟයීමට පහසුකම් ඇති කරන අතර, කාර්යක්ෂමව සහ ඵලදායීව තීරණ ගැනීම වැඩි කරයි.

අතින් සිදුකළ මැදිහත්වීම අවම කරමින්, CLOS විසින් පහසු සහ වේගවත් කළ ණය පිරිසැකසුම් අත්දැකීමක් සහතික කරයි. මෙම පද්ධතිය සැලකියයුතු ලෙස ණය අනුමත කිරීමේ චක්‍රය වේගවත් කරන අතර. අත්‍යවශ්‍ය අරමුදල් කරා වඩා වේගයෙන් පිවිසීමට ව්‍යාපාර ශක්තිමත් කරයි. මෙම කඩිනම් ක්‍රියාවලිය අවස්ථා ග්‍රහනය ගැනීමට සහ ව්‍යාප්තිය සිදු කිරීමට ව්‍යාපාර සවිබලගන්වමින් ආර්ථික වර්ධනයට සෘජුව දායක වේ. මහජන බැංකුවේ CLOS හි ක්‍රියාත්මක කිරීම ආයතනික සේවාදායකයින්ට සහයවීමට සහ ආර්ථික සංවර්ධනය පෝෂණය කිරීමට උසස් තාක්ෂණය භාවිතා කරමින් සිය බැඳීම තහවුරු කරයි.

People's eZE Credit-Virtual ණය පිරිසැකසුම

People's eZE Credit මගින් භෞතික කඩදාසි කටයුතු සහ ශාඛාව වෙත යාම කෙරෙහි විශ්වාසය සැලකියයුතු ලෙස අඩු කරමින් සම්පූර්ණ අතත්‍ය ණය යෙදුම් වේදිකාවක් හඳුන්වා දේ. මෙම පද්ධතිය විනිවිදභාවය සහ සක්‍රිය අපේක්ෂිත කළමනාකරණය පෝෂණය කරමින් සිය ණය අයදුම්පතේ තත්ත්වය පිළිබඳව තත්‍ය කාලීන යාවත් කිරීම ලබා දේ. ගනුදෙනුකාර පහසුව සහ කාර්යක්ෂමතාව වැඩි කරමින් විද්‍යුත් ලේඛණය උඩුගත කිරීම් අයදුම්පත් ක්‍රියාවලිය ක්‍රමවත් කරයි.

ඩිජිටල් වැඩ ප්‍රවාහය පිරිසැකසුම් කාලය සැලකියයුතු ලෙස අඩු කරමින් මූලික ඉදිරිපත් කිරීමේ සිට අනුමැතිය සහ ණය ලබාදීම දක්වා සමස්ත ණය චක්‍රය වේගවත් කරයි. මෙම දුරස්ථ අයදුම්පත් හැකියාව පහසු සහ පිවිසිය හැකි ණය දීමේ අත්දැකීමක් පිරිනමමින් භෞතික ශාඛා මැදිහත්වීම අවම කරයි. eZE ණය මගින් කාර්යක්ෂමතාව, විනිවිදභාවය, සහ ගනුදෙනුකාර කේන්ද්‍රීය ණයදීමේ විසඳුම් ලබාදීමට ඩිජිටල් නව්‍යකරණය භාවිතා කිරීමට බැංකුවේ කැපවීම පිළිබඳ නිදසුන් ගෙනහැර දක්වයි.

The People's Pay වෙළෙඳ මොඩියුලය

The People's Pay වෙළෙඳ මෙඩියුලය තුළින් මූලිකවම LankaQR ලියාපදිංචිය තුළින් කුඩා ව්‍යාපාර අතර තත්‍ය කාලීන ඩිජිටල් ගනුදෙනු යොදා ගැනීමට පහසුකම් ඇති කරයි. LankaQR සහ mVisa සමඟ සම්පූර්ණයෙන් අනුකූලව, ඉන් ආරක්ෂිත සහ පහසු ඩිජිටල් ගෙවීම් පිරිසැකසුම සහතික කරයි. මෙම මෙඩියුලය QR ලියාපදිංචිය ඉල්ලුම් මෙහෙයවීම ක්‍රමවත් කරන අතර, මෙහෙයුම් කාර්යක්ෂමතාව සැලකියයුතු ලෙස වැඩි කරයි. ඩිජිටල් වේදිකාවන් වෙත සංක්‍රාන්තිය දිරි ගන්වමින්, එය ආර්ථික වර්ධනය පෝෂණය කරමින් හා ගනුදෙනුකාර පහසුව වැඩි කරමින් නවීන මූල්‍ය පරිසර පද්ධතිය තුළ සහභාගිවීමට කුඩා ව්‍යාපාර සවිබල ගන්වයි. මෙම මුල්පියවර මගින් උසස් සහ කාර්යක්ෂම ඩිජිටල් විසඳුම් තුළින් කුඩා ව්‍යාපාරවලට සහයවීම සඳහා මහජන බැංකුවේ ඇති කැපවීම පෙන්නුම් කරයි.

මහජන බැංකුව: ඩිජිටල් බැංකුකරණ විප්ලවය තුළ ගනුදෙනුකරුවන්ගේ සහය වෙනුවෙන් පෙරමුණ ගැනීම

ගතික ඩිජිටල් මූල්‍ය පාලන තන්ත්‍රයක් තුළ, මහජන බැංකුව සිය ඩිජිටල් බැංකුකරණ විසඳුම් පහසුවෙන් යොදා ගැනීම සහතික කිරීමට විස්තීර්ණ ගනුදෙනුකාර සහය ප්‍රමුඛ කරමින් පෙරටු බලඇණියක් ලෙස මතු වී ඇත. තාක්ෂණික ඒකාබද්ධ කිරීම හා බැඳුණු විභව අභියෝග පිළිබඳ දැනුවත් වෙමින්, බැංකුව බහුවිධ සහය රාමුවක් අතීශයින් නිවැරදිව නිර්මාණය කර ඇත. මෙම ප්‍රවේශය ගනුදෙනුකාර තෘප්තිය ඉටුකිරීම පමණක් නොව ඩිජිටල් අන්තර්ගතභාවය පෝෂණය කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යයක් ද ඉටු කරයි. ඒ තුළින් ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකයේ වර්ධනය සැලකියයුතු ලෙස දායක වේ.

I. සවිබලගන්වන ලද කාර්ය මණ්ඩලය: ඩිජිටල් සහය පිළිබඳ කොඳුනාරටිය

මහජන බැංකුවේ දිවයින පුරා විස්තීර්ණ ශාඛා ජාලය ඩිජිටල් බැංකුකරණ යොදා ගැනීම මෙහෙයවීම සඳහා අත්‍යවශ්‍ය සරණියක් ලෙස සේවය කරයි. තාක්ෂණය සමඟ මානව මැදිහත්වීමේ අත්හල නොහැකි කාර්යභාරය හඳුනා ගනිමින්, බැංකුව සිය කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසටහන්වල සැලකිය යුතු අයුරින් ආයෝජනය කරයි. මෙවැනි මුල්පියවර සේවකයින් ප්‍රවීන ඩිජිටල් දූතයින් බවට පරිනාමනය කරමින් හුදෙක් තාක්ෂණික ප්‍රවීනතාව උපරිමයට පත් කරයි.

පැහැදිලි, පිවිසිය හැකි සහ ප්‍රායෝගික ඔප්පු කිරීම් ලබා දෙමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් ඩිජිටල් බැංකුකරණයෙහි සැකසහිතබව බැහැර කිරීමට දැඩි පුහුණුවලට යොමු කරනු ලබයි. ගනුදෙනුකාර විමසිම් රාශියක් විසඳීමට, තාක්ෂණ ගැටළු නිරවුල් කිරීමට සහ ශක්තිමත් අවධාරණයක් හා ආරක්ෂක මනා පරිචයන් සහිත ඩිජිටල් බැංකුකරණ විසඳුම් ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් පුළුල් දැනුවත් ලබාදීමට ඒවා අවශ්‍ය වේ. මෙම පුද්ගලගත මානව කේන්ද්‍රීය ප්‍රවේශය විශ්වාසය ඇති කරමින් ගනුදෙනුකරුවන්ට ඩිජිටල් මෙවලම් විශ්වාසයෙන් වැළඳ ගැනීමට සවිබල ගන්වයි.

II. ඩිජිටල් බැංකුකරණ සහය මොඩියුලය: කාර්ය මණ්ඩලය සවිබලගැන්වීම, සේවය වැඩි කිරීම

මහජන බැංකුවේ ඩිජිටල් බැංකුකරණ සහය මොඩියුලය යනු සියලුම කාර්ය මණ්ඩලය සඳහා මධ්‍යගත අන්තර්ජාල දැනුම් කේන්ද්‍රයකි. ඉන් FAQs වෙත ක්ෂණික පිවිසුම, ගැටළු විසඳීමේ මගපෙන්වීම්, සහ ඩිජිටල් බැංකුකරණ ලේඛණගතකරණය ලබා දේ. මෙය ගැටළු විසඳීම වේගවත් කර, ගනුදෙනුකරුවන්ගේ රැඳී සිටින කාලය අඩුකර, ශාඛා හරහා අනුරූප, උසස් තත්ත්වයේ සහය සහතික කරයි.

නිවැරදි සහය ලබා දෙමින් කාර්ය මණ්ඩලය යාවත්කළ දැනුම ලබා ගනී. ක්‍රමවත් කළ ලේඛණ මෙහෙයවීම ක්‍රියාවලි ප්‍රශස්ථ කරන අතර, පහසු ඩිජිටල් අත්දැකීම ලබා දේ. මෙම මොඩියුලය කාර්ය මණ්ඩලය සවිබල ගන්වන අතර, මෙය ඩිජිටල් අත්දැකීම සඳහා මහජන බැංකුවේ කැපවීම ස්ථීර කරමින් වර්ධිත ගනුදෙනුකාර තෘප්තිය සහ කාර්යක්ෂම සේවා ලබාදීමට හේතු වේ.

III. විශේෂිත සහය මධ්‍යස්ථාන: විශේෂිත සහ කාලීන සහය

මහජන බැංකුව සංකීර්ණ ඩිජිටල් බැංකුකරණ සේවා ගැටළු විසඳීමට විශේෂිත සහය මධ්‍යස්ථාන සහ විශේෂිත සහය කණ්ඩායම් ස්ථාපිත කර ඇත. කාර්ය මණ්ඩල සාමාජිකයින්ට කඩිනම් සහ ඵලදායී විසඳුම් සහතික කරමින් විශේෂ ප්‍රවීනතාව සහිත කණ්ඩායම් වෙත සංකීර්ණ ගැටළු පහසුවෙන් ඉදිරිපත්කළ හැකි බව මෙම උපායමාර්ගික ප්‍රවේශය සහතික කරයි. මෙම පද්ධතිය ගනුදෙනුකාර ඉව්ජාභංගය අවම කරන අතර කාලීන සහ ප්‍රවීන සහය ලබාදීමට බැංකුවේ කැපවීම ශක්තිමත් කරයි.

IV. 24/7 ඇමතුම් මධ්‍යස්ථානය: ගනුදෙනුකරුවන්ට බාධා රහිතව මෙය ලබාගත හැකිය

පැය 24 පුරා සහයෝගයේ වැදගත්කම හඳුනා ගනිමින්, මහජන බැංකුව 24/7 ඇමතුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කරයි. ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ස්ථානය හෝ වේලා කලාපය නොසලකා ඕනෑම අවස්ථාවක සහය ලබා ගත හැකි බව මෙයින් සහතික කරයි. අඛණ්ඩ සහය සඳහා මෙම කැපවීම ගනුදෙනුකාර තෘප්තිය සැලකියයුතු ලෙස වැඩි කරන අතර, බැංකුවේ ඩිජිටල් විසඳුම් සමඟ පහසු හා බාධාරහිත අත්දැකීම තහවුරු කරයි.

V. People's Zen Chatbot: ක්ෂණික හා බුද්ධිමය ඩිජිටල් සහය

මහජන බැංකුවේ AI chat box වන, People's Zen, මගින් විවිධ පරාශයක් ඩිජිටල් බැංකුකරණ විමසීම් සඳහා ක්ෂණික සහය ලබා දේ. 24/4 තුළ ලබාගතහැකි, People's Zen මගින් පහසු ප්‍රතිචාර, කාර්යක්ෂම ගැටළු විසඳීමේ සහය, සහ පුද්ගලගත මඟ පෙන්වීම ලබා දේ. මෙම චැට්බොක්ස් තොරතුරු කරා ප්‍රවේශ්‍ය ක්‍රමවත් කරන අතර, ගනුදෙනුකරුවන්ගේ රැඳී සිටින කාලය අඩුකර, ඩිජිටල් නව්‍යකරණය සහ ආදර්ශවත් ගනුදෙනුකාර සේවාව සඳහා බැංකුවේ කැපවීම සඳහා නිදසුන් ගෙනහැර දක්වයි.

VI. සමාජ මාධ්‍ය සහය: ගනුදෙනුකරුවන් සහභාගි කරවීම, දැනුවත් කිරීම සහ සවිබල ගැන්වීම

මහජන බැංකුව සිය ඩිජිටල් බැංකුකරණ විසඳුම් හා බැඳුණු ලක්ෂණ, ක්‍රියාකාරිත්වයන්, සහ ආරක්ෂක ව්‍යවහාර පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට සමාජ මාධ්‍ය වේදිකාවේ බලය භාවිතා කරයි. බැංකුවේ ඩිජිටල් වේදිකාවල සංකීර්ණතා පිළිබඳව වීඩියෝ ක්ලිප්ස්, තොරතුරු සහිත පෝස්ටර්, සහ අන්තර්ගත මඟපෙන්වීම්වල නියැලෙන අතර, විශ්වාසය ගොඩ නගමින් ඩිජිටල් සාක්ෂරතාව පෝෂණය කරයි. මෙම සක්‍රීය ප්‍රවේශය ඩිජිටල් යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම පමණක් නොව ගනුදෙනුකාර අධ්‍යාපනය සඳහා බැංකුවේ කැපවීම නැවත ශක්තිමත් කරමින් සැමදා වෙනස්වන ඩිජිටල් වාතාවරණයට සහය වේ.

ක්‍රියාවලි ප්‍රතිරූපනය

අයදුම්පත් වැඩසටහන් අතුරුමුහුණත් (API) ජාලය

පරිවර්තනීය, සහ ගනුදෙනුකරු අවධානිත උසස් තාක්ෂණය සඳහා කැමති පාරිභෝගික ගනුදෙනුකරුවන් සහිත බැංකුකරණ ක්ෂේත්‍රය තුළ, හරිත ණය සහ තිරසාර දැනුවත් ආයෝජන ප්‍රමුඛත්වය ලබා ගන්නා බැවින්, බැංකුවේ API පද්ධතිය අපගේ පාර්ශ්වකරුවන්ට ඉහළම වටිනාකම ලබාදීමට විවිධ මෘදුකාංග යෙදුම් අතර පහසු සන්නිවේදනය සහ දත්ත හුවමාරුව එකිනෙකට සම්බන්ධ කර සවිබල ගන්වයි. නවීන තාක්ෂණය සමඟ සන්නද්ධ වෙමින්, මෘදුකාංග පරිසර පද්ධතිවල සංකලනය වීම, පරිමාණය සහ නම්‍යශීලිතාව වැඩි කරමින් එකමුතුව වැඩ කිරීමට ගනුදෙනුකරුවන් කළමනාකරණය, ගෙවීම් ප්‍රවේශ සහ තොග දත්ත පදනම් වේගයෙන් සම්බන්ධ කිරීමට අපට හැකිය.

2023 අනුව 2024 ප්‍රගති දර්ශක

විස්තරය	2023	2024
බස්හාහිර පළාතෙන් පිටත ATMs, CDM සහ CRM යන්ත්‍ර ගණන	779	788
ඩිජිටල් විසඳුම් ලියාපදිංචිවීම් (මිලියන)	3.4	4.4
ජංගම සහ අන්තර්ජාල බැංකුකරණ පහසුකම්වල ලියාපදිංචි ඩිජිටල් ආයතනික ගනුදෙනුකරුවන් ගණන	13,100+	18,250+
ඩිජිටල් වශයෙන් ඇතුළත් වූ ගිණුම් ගණන (මිලියන)	3.8	4.8+
වසර සඳහා ජංගම සහ අන්තර්ජාල බැංකුකරණය හරහා සිදුකළ ඩිජිටල් ගනුදෙනු ගණන (මිලියන)	98.3	161
වසර සඳහා ජංගම සහ අන්තර්ජාල බැංකුකරණය හරහා සිදුකළ ඩිජිටල් ගනුදෙනුවල වටිනාකම (රු.බි.)	1,042	1,296

දත්ත ආරක්ෂාව

ශ්‍රී ලංකාවේ පුද්ගලික දත්තවල ආරක්ෂාව ශක්තිමත් නියාමන පාලන තන්ත්‍රයකින් පාලනය කරන අතර, එය පිලිපැදීම ගිවිසුම් ගත වේ. අපගේ ප්‍රධාන නියාමකයා ශ්‍රී ලංකා මහ බැංකුව වන අතර, එබැවින්, 1988 අංක 30 දරන බැංකු පනත සහ එයට සිදුකළ සංශෝධන මගින් අපව පාලනය කෙරේ. ඊට අමතරව, 2022 අංක 9 දරන පුද්ගල දත්ත ආරක්ෂක පනත මගින් බැංකුව විසින් දරණ දත්ත ඇතුළුව පුද්ගලික දත්ත ආරක්ෂාව සඳහා යාන්ත්‍රණය සපයන අතර, ඩිජිටල් ආර්ථිකයේ වර්ධනය ඇති කරයි.

අපි තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අපගේ මෘදුකාංග පද්ධති සහ ඩිජිටල් විසඳුම් අඛණ්ඩව පරීක්ෂා කර, බැංකුවේ අවශ්‍යතා සඳහා ගලපන ලද බාහිර තාක්ෂණික විසඳුම් මිලදී ගැනීමෙන් වර්ධනය කරයි. ක්‍රියාත්මක කිරීමට පෙර නව යෙදුම් දැඩිව පරීක්ෂා කරමින් 2024 දී අපි මෙම ක්‍රමය අඛණ්ඩව සිදු කළෙමු.

බැංකුව සිය මෘදුකාංග පද්ධතිය සහ ඩිජිටල් විසඳුම් අභ්‍යන්තර මෘදුකාංග සංවර්ධනය තුළින් සහ බැංකුවේ අසමසම අවශ්‍යතා සඳහා ගලපන ලද බාහිර තාක්ෂණික විසඳුම් මිලදී ගැනීමෙන් අඛණ්ඩව වැඩි කරයි. මෙම ක්ෂේත්‍රය තුළ තරඟයෙන් අපි බොහෝ දුරක සිටින අතර, අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට කඩිසර ඩිජිටල් සපයන්නා ලෙස තවදුරටත් සිටිනු ඇත.

තොරතුරුවල ආරක්ෂාව

අපි ප්‍රධාන වශයෙන් අපගේ තාක්ෂණික යටිතල පහසුකම් මත තොරතුරු ආරක්ෂක පද්ධතියක් ක්‍රියාත්මක කළ අතර, ISO200001-2022 සහතික කිරීම සාක්ෂාත් කරගත් ලොව ඉහළම ශ්‍රේණියේ තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සපයන්නන් කිහිප දෙනෙක් සමඟ හවුල්කාර වූයෙමු. අපි සෑම කාර්තුවකම අපගේ අවදානම් තක්සේරු කිරීම් සිදුකරන අතර, අවදානම් තක්සේරු කිරීම, නියාමනය, සහ ආවේක්ෂණ පද්ධතිය ISO 270001-2022 සහතික කිරීම සාක්ෂාත් කරගෙන ඇත.

අපි අඛණ්ඩව අපගේ පද්ධති ආරක්ෂාව තක්සේරු කරන අතර, එහිදී සිදුවීම් සිදුවුන වහාම ක්‍රියාමාර්ග ගනු ලැබේ. එමෙන්ම අපි අපගේ විඩම්බන වැඩසටහන් කාර්තුමය පදනමක් මත තක්සේරු කරන අතර, ගනුදෙනුකාර දත්තවල රහස්‍යතාව සහ තොරතුරු ආරක්ෂාව පිළිබඳ කිසිදු කඩකිරීමක් නොමැතිවම කම්පන අවශෝෂණය කිරීමට සහ සාමාන්‍යකරණය කිරීමට අපගේ පද්ධතිවල හැකියාවන් ද පරීක්ෂා කරමු.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

බැංකුවට වඩා විශාල ගනුදෙනුකාර කොටසක් අත්කර ගැනීමේ තරඟය තුළ මුදුනෙහි සිටීම සඳහා ස්ථාන ගවේෂණය කරමින් සුපිරි ඩිජිටල් හා තොරතුරු තාක්ෂණය තුළ අපි තවදුරටත් ආයෝජනය කරමු.

කාඩ් සේවා

නවින පුද්ගල මූල්‍යකරණයෙහි අත්‍යවශ්‍ය කොටසක්වන, ණය කාඩ් මගින් පහසු සහ හදිසි මුදල් අවශ්‍යතාව ඉටු කරන අතර, ණය ඉතිහාසය ගොඩ නගමින්, වගකීමෙන් භාවිතා කිරීමේදී විවිධ ප්‍රදාන සඳහා ප්‍රවේශය ලබා ගනී.

අපගේ ප්‍රවේශය

ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ සහ හදිසි මුදල් අවශ්‍යතාව ඉටු කිරීමට පහසු ණය සඳහා ඉල්ලුම ආර්ථික අර්බුදයෙන් පසුව ඉහළ ගොස් ඇත. ණය කාඩ් නිෂ්පාදන දශක ගණනාවක් ක්‍රියාත්මකව පවතින නමුත්, පසුගිය වසර කිහිපය තුළ, විවිධ ගනුදෙනුකාර අංශවල ඉල්ලුමේ වැඩිවීමක් අපි හඳුනාගන්නා ලදී. විවිධ වූ අවශ්‍යතා පිළිබඳ දැනුවත් වෙමින්, බැංකුව විවිධ ගනුදෙනුකාර අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලීමට කාඩ් නිෂ්පාදන කිහිපයක් හඳුන්වා දී ඇත.

සුවිශේෂී අවස්ථා

- නව ණය කාඩ් නිකුතුව 484%කින් වැඩි විය.
- කළඹ 32%කින් වර්ධනය විය.
- ණය කාඩ් පරිමාව 16%කින් වැඩි විය.
- බැර කාඩ් පරිභෝගික ගනුදෙනු 43%කින් වැඩි විය.

9%ක වෙළෙඳපොල පහත වැටීම හමුවේ, 2024 දී 32%ක දැඩි වර්ධනයන් අත්කර ගනිමින් මහජන ණය කාඩ් වෙළෙඳපොල ඔරොත්තුදීම පෙන්වා දී ඇත. කාඩ් මධ්‍යස්ථානය රු. බිලියන 4.13ක ලාභදායිතාවක් වාර්තා කළ අතර, වසර තුළ නව ණය කාඩ් 23,960ක් සාර්ථකව නිකුත් කරන ලදී. ඊට අමතරව, මහජන බැංකුව මිලියන 4.5ක ශක්තිමත් සක්‍රිය ණය ගනුදෙනුකාර පදනමක් සමඟ, 2024 දී නව ණය කාඩ් 838,490ක් නිකුත් කරන ලදී. කාඩ් මධ්‍යස්ථානය 9%ක අක්‍රිය ණය අනුපාතයක් ඵලදායී ආකාරයෙන් පවත්වා ගෙන ඇති අතර ඉන් ශක්තිමත් කළඹ කළමනාකරණය සහ මූල්‍ය ස්ථාවරත්වය පිළිබිඹු කරයි.

බැංකු වාතාවරණය ඉලෙක්ට්‍රොනික ගනුදෙනු ප්‍රධාන වශයෙන් කාඩ් සහ ණය කාඩ් ගනුදෙනුවලින් සිදුවී ඇත. ගනුදෙනුකාර වියදම් කිරීම ඇති කරමින් සහ ව්‍යාපාර සඳහා මුදල් ප්‍රවාහ වැඩි තරමින්, ණය කාඩ් භාවිතයේ ගෝලීය බලපෑම තාක්ෂණික නව්‍යකරණයෙන් ඉහළ ගොස් ඇති අතර ලොව පුරා වෙළෙඳපොල සහ ජනතාව සම්බන්ධ කරමින් වියදම් කිරීමේ බාධාවන් ඉවත් කර ඇත. අපගේ හරය ලෙස මහජන සුභසාධනය සහිත සහ කාඩ් නිෂ්පාදනවල වගකිම්සහගත භාවිතය ප්‍රවර්ධනය කරන බැංකුවක් ලෙස, අපගේ ණය කාඩ් අංශය විවිධාකාරයෙන් බස්නාහිර පළාතෙන් පිටත ප්‍රජාවන් තුළ මූල්‍ය අන්තර්ගතභාවය තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි.

මාර්ගගත ප්‍රවේශපත් නිකුතුව සඳහා නිල බැංකුකරණ හවුල්කරු වශයෙන් ශ්‍රී ලංකා දුම්රිය සමඟ මහජන බැංකුව හවුල් වී ඇත.

මෙම වැඩසටහන් මගින් බාධාවකින් තොරව ඩිජිටල් මාර්ග හරහා පහසුවෙන් ප්‍රවේශපත් මිලදී ගැනීම සඳහා දෛනික දුම්රිය මගීන් සඳහා ඉඩදෙමින් ඒවා මිලදි ගැනීමේ පහසුව වැඩි කරයි. ප්‍රවේශපත් ක්‍රියාවලිය ක්‍රමවත් කරමින්, පිවිසීමේ හැකියාව වැඩි කිරීමට, රැඳී සිටීමේ කාලය අඩු කිරීමට, සහ ශ්‍රී ලංකාවේ දුම්රිය සේවයේ නවීකරණයට සහයවීම අපගේ අරමුණ විය.

මහජන බැංකුව අන්තර්ජාල ගෙවීම් ප්‍රවේශයක් සාර්ථකව දියත් කරන ලදී. (IPG)

මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ ජාත්‍යන්තර බෞද්ධ කෞතුකාගාරයට බලය දෙන ලදී. මෙම වැඩසටහන මගින් ලොවපුරා බෞද්ධයින්ට සහ සංචාරකයින්ට පිවිසීම සහ පහසුව වැඩි කරමින් පහසු, ආරක්ෂිත අන්තර්ජාල ගෙවීම් කිරීමට පහසුකම් සලසන ලදී. ඩිජිටල් ගෙවීම් විසඳුම් ඒකාබද්ධ කරමින්, මෙම පූජනීය උරුම ස්ථානයේ සංරක්ෂණය සහ ගෝලීය ලඟාවීමට සහය වන අතර, වඩා යහපත් ආගන්තුක අත්දැකීම් සඳහා නවීන තාක්ෂණය වැළඳ ගන්නෙමු.

මහජන බැංකුව සහ පීපල්ස් ලීසිං සම-සන්නාමකරණය කළ CLASSIQUE VISA Infinite ණය කාඩ් සඳහා ආරම්භ කිරීමට අත්වැල් බැඳගෙන ඇත.

මෙම නිෂ්පාදනය මූලික වශයෙන් පීපල්ස් ලීසිං ගනුදෙනුකරුවන් සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත. මෙම අධිමිල පිරිනැමීම් අසමසම සුබෝපභෝගී, පහසු සහ මූල්‍ය නම්‍යතාවය ලබාදෙමින් ඉතා උසස් ප්‍රතිඵල රාශියක් සමඟ පැමිණේ. සියල්ල ඇතුළත් කළඹක් සහිත, CLASSIQUE VISA Infinite කාඩ්පත අපගේ වඩාත් වටිනා ගනුදෙනුකරුවන්ගේ ජීවන චක්‍රය වර්ධනය කිරීමට ගලපන ලදී.

මහනුවර සිටි සෙන්ටර් හි මහජන කාඩ් සාර්ථකව විශේෂ ණය සහ ප්‍රවර්ධන සංවිධානය කරන ලද අතර සිය 1 වැනි සාංවත්සරික සැමරීම සඳහා හැවිලොක් සිටි මෝල් සමඟ හවුල්කාර විය.

මෙම වැඩසටහනින් ශක්තිමත් ගනුදෙනුකාර ප්‍රතිචාර ආකර්ෂණය කර ගනිමින් තරඟකාරී ණය කාඩ් වෙළෙඳපොල තුළ අපගේ කොටස සැලකියයුතු ලෙස ශක්තිමත් කිරීමේ දී මහජන ණය සන්නාමය සඳහා වෙළෙඳපොල දෘශ්‍යතාව වැඩි කරන ලදී, මෙම වැඩසටහනින් මහජන බැංකුවට කොළඹ පමණක් නොව ප්‍රාදේශීය මට්ටමින් ද ඩිජිටල් ගෙවීම් වැඩි කිරීමට ඉඩ දෙන ලදී.

මහජන බැංකුව POS පරියන්තවල සහ අන්තර්ජාලවල වැඩිකළ ණය කාඩ් ගනුදෙනු මෙහෙයවීමට ජාතික මට්ටමේ ණය කාඩ් භාවිත වැඩසටහනක් දියත් කරන ලදී.

රටතුළ පහසු සහ ආරක්ෂිත මුදල් රහිත ගෙවීම් සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා සෑම දිනම ගනුදෙනු සහ ඩිජිටල් ගෙවීම් සඳහා ණය කාඩ් යොදා ගැනීමට ගනුදෙනුකරුවන් දිරි ගැන්වීම මෙම වැඩසටහනින් අරමුණ කර ඇත.

නිෂ්පාදන පරාශය

පිපල්ස් වීසා ක්ලැසික්/ මාස්ටර් කාඩ් ක්ලැසික් ණය කාඩ්	රු. 99,000ක ණය සීමාවක් පිරිනමයි.
පිපල්ස් බෑන්ක් වීසා ගෝල්ඩ්/ මාස්ටර් කාඩ් ගෝල්ඩ් ණය කාඩ්	රු. 100,000-199,000 අතර ණය සීමා පහසුකමක් පිරිනමයි.
පිපල්ස් වීසා ප්ලැටිනම්/ මාස්ටර් කාඩ් ප්ලැටිනම්	රු. 200,000-599,000 අතර ණය සීමා පහසුකමක් පිරිනමයි.
පිපල්ස් වීසා සිග්නේචර්/ මාස්ටර් කාඩ් වර්ල්ඩ් කාඩ්	දේශීය හා ජාත්‍යන්තරව අදාළ විවිධ ප්‍රතිලාභ පිරිනමන අතර, රු. 600,000 අවම ණය පහසුකමක් පිරිනමයි.
පිපල්ස් බෑන්ක් එලගන්ස් වීසා ඉන්ෆිනිටි ණය කාඩ් හා පීවිල්සී ක්ලැසික් වීසා ඉන්ෆිනිටි ණය කාඩ්	අධිමිල සංචාර ආශ්‍රිත ප්‍රතිලාභ සමඟ පුද්ගලගත සේවා සඳහා නව ප්‍රමිතියක් ස්ථාපිත කරයි. මෙම නිෂ්පාදනයේ ආයතනික ණය කාඩ් පිටපත සමාගම්වලට පහසු පසුවිපරම් කිරීමට සහ තත්‍ය කාලීන වියදම් කළමනාකරණ මෙවලමක් ලෙස වියදම් පාලනය කිරීමට හැකියාව ඇති කරයි. මෙය ව්‍යාපාර ආශ්‍රිත වියදම්වල මායිම් ලකුණු කරන ආයතනික වියදම් පිළිබඳ පිවිසුම් අවසරයකි.
පිපල්ස් බෑන්ක් වීසා වනිතා වාසනා ණය කාඩ්	රු. 100,000-599,000 අතර ණය සීමා පහසුකමක් පිරිනමයි.

අපි නව මුදල් රහිත සහ මාර්ග පැවැත්වූ අතර එය අතිශය ගනුදෙනු ආරක්ෂාව සහිත පහසු ගෙවීම් ප්‍රවේශයක් වන අතර එහිදි ගනුදෙනුකරුවන්ට සිය ඉලෙක්ට්‍රොනික වියදම් කිරීම පසු විපරම් කළ හැකිය.

බැංකුවේ ඩිජිටල් නවීකරණය වෙළෙඳපොල ප්‍රවණතාවල ඉහළ සහ පහළ මායිමට අමතරව, අලෙවිකරණ ධාවකය තුළින් සැලකියයුතු ලෙස දායක වී ඇත. ප්‍රවර්ධන තොරතුරු බෙදා හැරීම සහ අලෙවිකරණ වැඩසටහන් තත්‍ය කාලීනව සහ මහජන අලෙවිකරණ ප්‍රවේශය තුළින් ක්‍රියාත්මක කරන ලදී.

අලෙවිකරු අත්කර ගැනීමේ ව්‍යාපාරය

අපගේ අලෙවිකරු අත්කර ගැනීමේ සේවාව ජාලය තුළින් ගෙවීම් පහසුවෙන්ම භාර ගැනීමට හැකියාව ඇති කරයි. අපගේ මූලික අවධානය SMEs සවිබලගැන්වීම කෙරෙහි වන අතර, ආරක්ෂිත, කාර්යක්ෂම, සහ පිරිවැය ඵලදායී ගෙවීම් භාරගැනීමේ විසඳුම් ලබාදීම මගින් රජයේ ව්‍යාපාතිවලට සහය වේ.

- නව අලෙවිකරුවන් ගණන 2024 දී 47%කින් වර්ධනය විය
- අලෙවිකරු අත්කර ගැනීමේ ව්‍යාපාර පරිමාව 2024 දී 48% කින් වර්ධනය විය

25 සහ ඉන් ඉදිරියට දැක්ම

ණය කාඩ් ගෝලීය මූල්‍ය වාතාවරණය තුළ තීරණාත්මක උපකරණයක් වන අතර, බැංකුව නිෂ්පාදනය සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීමට සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කෙරේ. එහි විස්තීර්ණ ලඟාවීම සහ ගනුදෙනුකාර පදනම සමඟ, නිෂ්පාදනය අපි සේවය කරන විවිධ වෙළෙඳපොල කොටස් හරහා වටිනාකම ලබාදෙමින් සහ බැංකුවට ඉහළ ප්‍රතිඵල අත්කරමින් සුවිශේෂී ආකාරයෙන් වර්ධනය වීමට විභවතාව ඇත.

- පිපල්ස් කාඩ් මධ්‍යස්ථානය ගනුදෙනුකාර සහභාගිත්වය වැඩි කිරීමට සහ වැඩිකළ කාඩ් භාවිතය මෙහෙයවීමට නිදහස් කිරීමේ ලකුණු යාන්ත්‍රණ සමඟ ණයකාඩ් ප්‍රදාන පද්ධතියක් හඳුන්වාදීමට නියමිතය, මෙම වැඩසටහන ගනුදෙනුකරුවන්ට විශේෂ ප්‍රදාන සඳහා ලකුණු ඉපයීමට හා නිදහස් කර ගැනීමට සහ මහජන බැංකු ණය කාඩ් සමඟ පහසු වියදම් කිරීමේ අත්දැකීම ලබාගත හැකිය.
- පිපල්ස් කාඩ් මධ්‍යස්ථානය ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මුදල් වඩා ඵලදායි ආකාරයෙන් කළමනාකරණය කර ගැනීමට සහයවීමට සහ වැඩි විශ්වාසයෙන් සිය ණය කාඩ් භාවිතා කිරීමට අතරමැදි ණය කාඩ් ප්‍රකාශන සේවයක් හඳුන්වා දේ. මෙම වර්ධනීය ඩිජිටල් ප්‍රකාශය මගින් තත්‍ය කාලීන අවබෝධය, වියදම් විශ්ලේෂණ, සහ පුද්ගලගත නිර්දේශ ලබා දෙන අතර, පරිශීලකයින්ට වියදම් පසුවිපරම් කිරීමට, අයවැය සකස් කර ගැනීමට, සහ දැනුවත් මූල්‍ය තීරණ පහසුවෙන් ගැනීමට හැකියාව ඇති කරයි.
- පිපල්ස් කාඩ් මධ්‍යස්ථානය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ (SME) අසමසම අවශ්‍යතා සඳහා ගලපන ලද විශේෂිත SME ණය කාඩ් හඳුන්වා දේ. අගය එකතුකළ ලක්ෂණ සමඟ සැලසුම්කළ, මෙම කාඩ්වක SME වර්ධනයට සහයවන මූල්‍ය නම්‍යතාව, සුවිශේෂී ප්‍රතිලාභ, සහ ගලපන ලද ණය විසඳුම් ලබා දෙන අතර, වඩාත් කාර්යක්ෂමව සිය ව්‍යාපාර කළමනාකරණය කර දේ. ණය, ප්‍රදාන, සහ ව්‍යාපාර සහය සේවා කරා පහසු පිවිසීම සමඟ SME හිමිකරුවන් සවිබල ගන්වමින්, ව්‍යාපාර වර්ධනය මෙහෙයවීමට සහ ඉලක්කගත ගනුදෙනුකාර අංශය සඳහා සඳහා වැඩි වටිනාකම නිර්මාණය කිරීම මෙම වැඩසටහන තුළින් අරමුණු කරයි.
- පිපල්ස් කාඩ් මධ්‍යස්ථානය ගනුදෙනුකාර අත්දැකීම ඉහළ දැමීමට නව ණය කාඩ් ලක්ෂණ සහිත ජංගම බැංකු යෙදුමක් වැඩි කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටී. මෙම යාවත් කිරීම් තත්‍ය කාලීන ගනුදෙනු පසුවිපරම, ණය සීමා කළමනාකරණය, ක්ෂණික බිල්පත් ගෙවීම් සහ වැඩිකළ ආරක්ෂිත පාලන කරා පහසු ප්‍රවේශ ලබාදේ. මෙවැනි ලක්ෂණ ඒකාබද්ධ කරමින්, අපගේ වටිනා කාඩ් සහ ගනුදෙනුකරුවන් සඳහා වඩා පහසු, මූල්‍ය විනිවිදභාවය සහ වඩාත් පරිශීලක හිතකාමී ඩිජිටල් බැංකුකරණ අත්දැකීම පිරිනැමීමට අපි අපේක්ෂා කරමු.
- 2024 දී, පීපල්ස් කාඩ් මධ්‍යස්ථානය වෙළෙඳපොල ලඟාවීම පුළුල් කිරීමට සහ ගනුදෙනුකාර සහභාගිත්වය වැඩි කිරීමට ප්‍රධාන සොපින් මෝල් ප්‍රවර්ධන හතරක් සහ ප්‍රාදේශීය ප්‍රවර්ධන හතරක් පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙවැනි වැඩසටහන් මගින් සුවිශේෂී ගනුදෙනු, වට්ටම්, සහ අගය එකතුකළ ප්‍රතිලාභ පිරිනමන අතර, මහජන බැංකුවේ කාඩ්වල වාසි අත්විඳීමට බොහෝ ගනුදෙනුකරුවන් දිරිමත් කරයි. ප්‍රධාන පාරිභෝගික කේන්ද්‍ර සහ ප්‍රාදේශීය වෙළෙඳපොල උපායමාර්ගිකව ඉලක්ක කරමින්, සන්නාම දෘශ්‍යතාව ශක්තිමත් කිරීම, කාඩ් භාවිතය මෙහෙයවීම, සහ අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට අගනා ප්‍රතිඵල ඉටුකර දෙන සාප්පු සවාරියක් ලබාදීම අපි අරමුණු කරමු.
- කුඩා POS නිෂ්පාදනය හඳුන්වාදීම. මෙම නිෂ්පාදනය SME, සහ ක්ෂුද්‍ර ව්‍යාපාර සවිබලගැන්වීමට සැලසුම් කර ඇත. මෙම මූලපිරීමේ අඩු වියදම් විසඳුම අති නවීන තාක්ෂණය සහ දැරිය හැකි මිල සමඟ කාඩ්පත් පිළිගැනීම වෙන කවරදාටත් වඩා පහසු කරයි. මූලික වශයෙන්, අපගේ කුඩා POS ව්‍යාපාරවලට ඔවුන්ගේ ගෙවීම් විකල්ප පහසුවෙන් පුළුල් කිරීමට උපකාරී වේ.
- රජයේ කාඩ් ගෙවීම් පිලිගැනීමේ ව්‍යාපෘති සමඟ සහ මෙම උපායමාර්ගික විතැන්වීම රජයේ ගෙවීම් ඩිජිටල්කරණයේ වඩා පුළුල් අරමුණක් සමඟ පෙළ ගැස්වීමේදී හවුල්වීය. මෙම වැඩසටහන් මූල්‍ය ගනුදෙනු ක්‍රමානුකූල කිරීමට, විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමට සහ මුදල් මෙහෙයවීම අඩුකර පුරවැසියන් සඳහා පිවිසීම වැඩි කරයි.

අලෙවිකරණය

සම්ප්‍රදායික සහ ඩිජිටල් මාධ්‍ය වේදිකා මත බැංකුවේ සමුච්චිත ඉදිරිපත්වීම බැංකුවේ සන්නාම දෘශ්‍යතාව තීරණය කිරීමේදී සහ සියලුම පාර්ශ්වකරුවන්ගේ මනස තුළ ස්ථානගතවීම සඳහා අත්‍යවශ්‍යය.

අපගේ ප්‍රවේශය

අපි පවත්නා සහ අනාගත ගනුදෙනුකරුවන් කරා ලඟාවීමට සහ ක්ෂේත්‍රය තුළ සන්නාමය සඳහා ඉහළම දැනුවත්කම පවත්වා ගැනීම සඳහා අලෙවිකරණය පිළිබඳ සම්ප්‍රදායික සහ ඩිජිටල් වේදිකාවල විස්තීර්ණ මුසුවක් භාවිතා කර ඇත. ඩිජිටල් අලෙවිකරණය තාක්ෂණය පිළිබඳ දැනුවත් සහ මාර්ගගත සන්නිවේදනයන්ට වඩා කැමති GenZ සහ සහශ්‍ර ගනුදෙනුකරුවන් අතිශයින් සහ ඵලදායීව භාවිතා කරන ලදී. ඊට අමතරව, බැංකුවේ කාර්යසාධනයට සැලකියයුතු ලෙස දායක වූ ඉහළ වටිනාකම ඇති සහ ආයතනික ගනුදෙනුකාර පදනම් වැනි විශේෂ ගනුදෙනුකාර අංශ ආකර්ෂණය කිරීමට ඒකාබද්ධ ආකාරයකින් සන්නිවේදන මාර්ග පිළිබඳ සංයෝජනයන් භාවිතා කරන ලදී.

අලෙවිකරණ දෙපාර්තමේන්තුව බැංකුවේ මූලික ස්වරය කළමනාකරණය කරන අතර, එය බොහෝ කරුණු අතර සන්නාම වටිනාකම, ගනුදෙනුකාර සහභාගිත්වය, දැනුවත්කම, සහ ආදායම් වර්ධනය මෙහෙයවයි.

සුවිශේෂී අවස්ථා

- යූ ටියුබ් වෙතින් Silver Button සම්මානය ග්‍රාහකයින් 100,000
- Tik Tok ග්‍රාහකයින් 10,000
- රට තුළ බැංකු ක්ෂේත්‍රයේ විශාලතම මාර්ගය වට්ස් ඇප්
- Facebook අනුගාමිකයින් 900,000

අලෙවිකරණ මාර්ග

සමාජ මාධ්‍ය

වර්තමාන අන්තර්සම්බන්ධිත ලෝකය තුළ, බැංකු ක්ෂේත්‍රයේ අලෙවිකරණය පිළිබඳ වාතාවරණය විචක්ෂණ පරිනාමයක් කර ඇත. අපගේ තරඟයේදී අපව ඉදිරියෙන් තැබීම සඳහා අප සවිබලගැන්වීමට මාර්ගගත සහභාගිත්වය පිළිබඳ සීමාවන් ඉදිරියට ගෙන යාමට අපගේ අලෙවිකරණ දෙපාර්තමේන්තුව SEO අලෙවිකරණය, සමාජ මාධ්‍ය, සහ ඩිජිටල් ප්‍රචාරණය අපි භාවිතා කරමු. අන්තර්ගත අලෙවිකරණය, සහ අනෙකුත් ඩිජිටල් උපායමාර්ගවල සංයෝජනය අපගේ ශක්තිමත් සන්නාම දෘශ්‍යතාව පවත්වා ගැනීමට අපට සහය විය.

බැංකුවේ යූ ටියුබ් මාර්ග ග්‍රහකයින් 100,000 පසුකළ අතර, Silver Button තත්ත්වය ලබාගෙන ඇත. Tik Tok අනුගමනය කිරීම 100,000 ඉක්ම වූ අතර. එය මෙම ක්ෂේත්‍රයේ ඉහළම අගය වේ. බැංකුවේ නිෂ්පාදන පරාශය පිළිබඳ අදාළ සහ කාලීන තොරතුරු ලබාදීමට වට්ස් ඇප් මාර්ගයක් ද නිර්මාණය කරන ලද අතර, එය සියලුම බැංකු අතර රටේ විශාලතම වට්ස්ඇප් බවට පත්විය. මුහුණු පොත, LinkedIn සහ ඉන්ස්ටග්‍රෑම් බැංකුවේ දෘශ්‍යතාව වර්ධනය කිරීමට භාවිතා කළ සමාජ මාධ්‍ය මෙවලම් වන අතර, තාක්ෂණය දැනුවත් ගනුදෙනුකාර පදනම්න් ග්‍රහනය කරයි. මෙය ඔවුන්ගේ ජංගම දුරකථන සහ නිවාසවල සැප පහසුව තුළින් සන්නාමය සමඟ සහභාගි වේ.

මහජන සම්බන්ධතා

මහජන සම්බන්ධතා මගින් පිරිවැය ඵලදායී සහ ඉහළින් විශ්වාසී ආකාරයෙන් ගනුදෙනුකරුවන් සහ පොදු ජනතාව ඇතුළුව අපගේ පාර්ශ්වකරුවන් කරා ලඟාවීමට මාධ්‍යයක් පිරිනමයි. එබැවින් සුදුසු මට්ටමක දෘශ්‍යතාව සන්නාමය මගින් ලැබෙන බව සහතික කිරීමට මහජන සම්බන්ධතාවල වටිනාකම සහ මහජන සම්බන්ධතා ලිපි ගණන තරඟය හරහා සමීපව නියාමනය කෙරේ.

සේවා මට්ටම් ඇගයීම

අභිරහස් ගනුදෙනුකාර සමීක්ෂණය සෑම මාස හයකම පවත්වන අතර, ඒවායේ සොයා ගැනීම් සේවා තත්ත්වය සහ ගනුදෙනුකාර අත්දැකීම කෙරෙහි උපරිම අවධානය පවත්වා ගැනීමේ අරමුණක් සමඟ තරඟකරුවන්ට එරෙහිව සලකුණු කෙරේ. සමීක්ෂණවල සොයා ගැනීම් ගනුදෙනුකාර ස්පර්ශක ස්ථාන සඳහා වග කියන ප්‍රධාන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ මූලික කාර්යසාධන දර්ශකයක් ලෙස සේවය කරයි. ඊට අමතරව. සොයාගැනීම් බැංකුවේ පුහුණු සහ සංවර්ධන කටයුතු සැලසුම් කිරීමට යෙදවුමක් ලෙස ද භාවිතා කෙරේ.

සමාජීය වශයෙන් දැනුවත් අලෙවිකරණය

ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්, කාන්තාවන් සහ සමාජයේ වෙනත් අංශ වැනි අදාළ ගනුදෙනුකාර කණ්ඩායම්වලට නව නිෂ්පාදන මාර්ගගත කිරීම රටතුළ ආර්ථික කටයුතුවල කාන්තා සහභාගිත්වය වැනි වෙනස්වන සමාජ ගතිකතාවන්ට ප්‍රතිඵලදායී සමඟ නිෂ්පාදන විශේෂතාව මත සැලසුම් කර ඇත. අලෙවිකරණ වැඩසටහන්වල නිසි ප්‍රතිඵලදායී ලබා දෙන බැංකු රහිත වැඩිහිටියින්ගේ සමාජ යහ පැවැත්මට සහ මූල්‍ය අන්තර්ගතභාවයට බැංකුව සංවේදී වේ.

ඊට අමතරව, අවසාන වශයෙන් සමාජයට බලපාන කරුණු පිළිබඳ මහජන අවධානය ගෙන ඒමට මාර්ගගත කටයුතු රාශියක් වාර්ෂිකව සිදුකරන අතර, ඉන් මහජන මතය තුළ ධනාත්මක වෙනසක් සිදු කරයි.

ත්‍රිභාෂාත්මක වෙබ් පැවැත්ම සහ ඉන්ද්‍රීය තීව්‍රතාව තුළ සීමාවන් මගින් අංග විකල අය ඇතුළුව විවිධ ආබාධ සහිත පුද්ගලයින් සඳහා හිතකාමී අතුරු මුහුණත් සමාජයේ සියලු ජනවිකාශ සහ උප අංශ ඇතුළත් කර සහභාගි කරවීමට දායක වේ.

කෘතීම බුද්ධි හැකියාවන් වැඩි කිරීම

ඕනෑම අවස්ථාවක තොරතුරු නිකුත් කිරීම හෝ ඒ සඳහා පිවිසීම පිළිබඳ වේගවක් පරිනාමනයක් තුළ අපගේ ගනුදෙනුකරුවන්ට තවදුරටත් සහයවීමට බැංකුවේ වෙබ් අඩවියට සියලුම කෘතීම බුද්ධියෙන් බලගැන්වීම් එකතු කරන ලදී. පිරිවැය ඵලදායීව අලෙවිකරණ සන්නිවේදනය තුළ භාවිතා කරන නිර්මාණ වැඩි කිරීමට කෘතීම බුද්ධි තාක්ෂණය බැංකුව විසින් භාවිතා කරමින් සිටී.

ආයතනික සමාජීය වගකීම

මෙම අංශය බැංකුවේ ආයතනික සමාජීය වගකීම් උපායමාර්ගය සමස්ත අලෙවිකරණ උපායමාර්ගයට ඒකාබද්ධ කර ඇති අතර, ඒ තුළින් උපරිම බලපෑම සඳහා ප්‍රජා සුභසාධන වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් සන්නාමය මෙන්ම සමාජය සඳහා වටිනාකම නිර්මාණය වැඩි කරයි. කරුණාකර 2024 තුළ බැංකුවේ CSR කටයුතුවල වැඩිදුර විස්තර සඳහා මෙම වාර්තාවේ ප්‍රජා ප්‍රාග්ධන පරිච්ඡේදය බලන්න.

අලෙවිකරණ සන්නිවේදන

GRI 417-3

අලෙවිකරණ සන්නිවේදන පිළිබඳව රෙගුලාසි සහ/හෝ ස්වේච්ඡා සංග්‍රහ සමඟ අනුකූල නොවූ අවස්ථා කිසිවක් නොමැත. නියාමන බලධාරීන් සමඟ අනුකූලතාව අපගේ ආයතනික පාලන න්‍යාය පත්‍රය මත ඉහළ වන බැවින් සහ බැංකුවේ සියලුම මෙහෙයුම්වලින් ඇතිකරන තර්ජනයක් වන බැවින්, අලෙවිකරණ සන්නිවේදන මුද්‍රාහැරීමට පෙර දැඩිව පරීක්ෂා කරයි. භාෂා තුනෙන්ම නිර්මාණය කළ, සියලුම අදාළ තොරතුරු, නියමයන්, සහ කොන්දේසි ඇතුළත් කිරීම මගින්, ගනුදෙනුකරුවන්ට ඩිජිටල් මාර්ග සහ ශාඛාවලදී මේවා කරා පිවිසිය හැකිය.

විශේෂ පැය 24 ඇමතුම් මධ්‍යස්ථානයේ සේවා වැඩිදුර සහය සහ තොරතුරු සඳහා ලබාගත හැකිය. ඊට අමතරව, මහජන බැංකුවේ ත්‍රිභාෂා වෙබ් අඩවිය මගින් නිෂ්පාදන අංග, පොළී අනුපාත, හුවමාරු අනුපාත, අදාළ ගාස්තු, වෙනත් අදාළ විස්තර පිළිබඳ තොරතුරු ලබා දෙන අතර, නිතරම යාවත් කරනු ලබයි.

අභියෝග

සමාලෝචිත වසර තුළ වෙනස්වන ආර්ථික තත්ත්වයන් පොදු ජනතාවගේ මනස ප්‍රධාන වශයෙන් පීඩාවට පත් කරන ලදී. එබැවින්, අලෙවිකරණ පණිවිඩ ලැබීමට, අර්ථ නිරූපණය කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට බහුතරයකගේ මානසික තත්ත්වය හිතකර නොවූ බැවින්, අලෙවිකරණ ස්වරයන් ප්‍රමුඛතාවයක් නොවීය.

ශක්තිමත් ඩිජිටල් නිපුනතාව සහිත දක්ෂයින් බඳවා ගැනීම සහ රඳවා ගැනීම දැනට පවත්නා විශාල පරිමාණයේ බුද්ධි ගලනය හේතුවෙන් අභියෝගයක් විය.

මහජනතාවගේ අඛණ්ඩ සමාජ මාධ්‍ය වෙත සම්බන්ධතාවය සහ ප්‍රතිලාභිත්වය සොයා නොගත් සෘණාත්මක පුවත් ඉක්මණින්ම ව්‍යාප්ත වියහැකි බැවින් අභියෝගයක් ඇති කළ හැක. මෙය මැඩලීම සඳහා, අපි කථනය පැහැදිලි කිරීම සඳහා රූපවාහිනී කථා සාකච්ඡා සහ සමාජ මාධ්‍යවල සහභාගිවීම ඇතුළුව විවිධ උපායමාර්ග ක්‍රියාත්මක කළෙමු.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

2025 සඳහා අපගේ අලෙවිකරණ උපායමාර්ගය ජනතාවට අපගේ පණිවිඩය ඵලදායීව යැවීමට ස්ථීර පණිවිඩවලට වඩා වීඩියෝ සවිමත්කළ මාධ්‍ය භාවිතය අපි ප්‍රමුඛ කරන්නෙමු. 2025 දී මහජන බැංකුවේ ආයතනික සන්නාමය ගොඩ නැගීම මත මහජන සුභසාධනය සහ ආයතනික ගතිකතාව ඇතුළත් කරන දෙමුහුන් ආදර්ශයකට මහජන සුභසාධන ආයතනයක් ලෙස දැකියහැකි අවබෝධයකින් වෙනස් වෙමින් අපි අවධානය යොමු කරන්නෙමු. අපගේ නිෂ්පාදන පිරිනැමීම හුදෙක් ජනවිකාශන දත්ත මත විශ්වාසයට වඩා ඔවුන්ගේ අසමසම අවශ්‍යතා ගැලපීමට විශේෂ ගනුදෙනුකාර කණ්ඩායම් වෙත ගලපනු ලැබේ. අපි අපගේ ඩිජිටල් වැඩසටහන් ආක්‍රමණශීලිව හඹා යන අතර, ඩිජිටල් බැංකුකරණ පහසුකම් භාවිතා කරන ආකාරය ක්‍රියාත්මක කරන අතර, වංචා සහ ප්‍රෝඩාවන්ට අනුව බැංකු කටයුතු ආරක්ෂා කිරීම කෙරෙහි මහජනතාව දැනුවත් කරයි.

මූල්‍ය ප්‍රාග්ධනය

රජයට අයත් ආයතනයක් ලෙස, බැංකුව එහි කාර්යසාධනය බොහෝ දුරට රටේ ආර්ථික වාතාවරණය සමඟ බැඳී ඇති බැවින්, එහි මහජන සුභසාධන කාර්යභාරය වාණිජ ඉලක්ක සමඟ ඒකාබද්ධ කිරීම පිළිබඳ විශේෂඥයෙකි. කෙසේවෙතත්, 2024 දී, පරමාදර්ශී විතැන් වීම හඳුන්වා දෙන ලද අතර, එහිදි සමාජ සත්කාර විධානය කෙරෙහි අපගේ අවධානය යොමු නොකර, අපි පෞද්ගලික අංශයට බැංකුකරණය දැඩි ලෙස හඹා යන්නෙමු.

සුවිශේෂී අවස්ථා

- 97.4% ශුද්ධ පොළී ආදායම් වර්ධනය
- රු. බිලියන 25.1ක බදු පසු ලාභය – ඓතිහාසිකව හොඳම ප්‍රතිඵල
- ගනුදෙනුකාර තැන්පතුවල 7.6%ක වර්ධනය
- 8.5%කින් මුළු වත්කම් වර්ධනය

අපගේ ප්‍රවේශය

අපි අලුත්කළ උනන්දුව සමඟ නව වසරට පැමිණි අතර, පුද්ගලික අංශයේ කොටසක් වැළඳ ගැනීමට අපගේ උපායමාර්ගය මනාව සකස් කළ අතර, ඉන් සාර්ව ආර්ථික වෙනස්වීම්වල විපාකය තුළ ප්‍රතිසාධනයෙහි සංඥා පෙන්වා ඇත. මෙවැනි ප්‍රවණතා නියාමනය කරමින්, ඩිජිටල්කරණය, ණයදීමේ අවස්ථාවන් සඳහා වර්ධනීය ඉල්ලුම මත ප්‍රාග්ධනීයකරණය කරමින්, විචක්ෂණ සහ දූරදර්ශිභාවය සමඟ අමතර ද්‍රවශීලතාව කළමනාකරණය කරමින් කඩිසරකම පිළිබඳ අපි ඉදිරියට යමු.

වැදගත් තේමා

ඵලදායිතාව

සමාජ ආර්ථික බලපෑම

අවදානම සහ පාලනය

අවස්ථා | **අභියෝග** | **නිර්මාණය කළ අගය**

- පුද්ගලික අංශය හා පුද්ගල අංශයේ ප්‍රතිසාධනය උදාසීන අවස්ථාවක දී වුවත් ඉදිකිරීම් අංශයේ ආරම්භක මෙහෙයුම් සමඟ ණයදීම සඳහා මඟ පාදයි.
- විදේශ විනිමය සංචිත ගොඩනගමින් වැඩිකළ අභ්‍යන්තර ප්‍රේෂණ.
- බැංකුවේ පැවැත්ව පවතින අවස්ථාවල සංචාරක ප්‍රබෝධය හා බැඳුණ SMEs සහ MSMEs වල සුවිශේෂී වැඩිවීම.
- ඩිජිටල් බැංකුකරණය තුළ නායකයෙක් ලෙස හඳුන්වාදීම.
- හරිත මූල්‍යකරණය සඳහා වැඩි කළ අවස්ථා.
- මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මූල්‍ය අන්තර්ගතභාවයට සහයවීම, කෘෂිකර්මය සහ ග්‍රාමීය සංවර්ධනය පෝෂණය කිරීම තුළ නියාමකයාට හවුල්වීම.
- ආර්ථික ප්‍රතිසංස්කරණ කරා අරමුණු කළ ප්‍රතිපත්තිවල වෙනස්වීම්වල අවිනිශ්චිතතාව බැංකුවේ උපායමාර්ගික ගැලපීමට බලපෑම.
- රජයට අයත් ආයතන වෙත ණයදීම මත සීමා හඳුන්වාදීම අපගේ අවධානය සහ ව්‍යාපාරය පුද්ගලික අංශය සහ කර්මාන්ත සමඟ දැඩි ප්‍රවේශයකට මාරුවීමක් අවශ්‍ය විය.
- උච්ඡාවචන පොලී අනුපාත, උද්ධමනය, සහ ව්‍යහාර මුදලේ අවප්‍රමාණය ණය ඉල්ලුම හා ද්‍රවශීලතාවයට බලපෑම් කිරීම.
- බැංකුව රුපියල් බිලියන 25.1 ක වාර්තාගත ලාභයක් ලබා ඇති අතර එය ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම අගය වන අතර ඒ සඳහා ගෙවන බදු, චක්‍රීය ආර්ථිකයක් පෝෂණය කිරීම සඳහා නැවත ආයෝජනය කරනු ලබන අතර, බදු ජාතිය තුළ අධ්‍යාපනය, සෞඛ්‍යය, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යම් දුරකට ග්‍රාමීය ප්‍රජාවන් හි ආන්තික කොටස් සඳහා සහන සැලසීම සඳහා නැවත ආයෝජනය කරනු ලැබේ.

ප්‍රාග්ධන සම්බන්ධතා

මානව ප්‍රාග්ධනය

අපගේ යහපත් මූල්‍ය කළමනාකරණය සහ ඉන් ඇති වූ ජයග්‍රහන අනුව බැංකුවට ඉහළම දක්ෂයින් බඳවා ගත් අතර, ඔවුන් රඳවාගෙන සංවර්ධනය කිරීමට ක්ෂේත්‍රයේ සමාන හෝ ඊට ඉහළ වැටුප් ගෙවන ලදී.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

මූල්‍ය ශක්තිය විවිධ ආකාරයෙන් අපගේ පාර්ශ්වකරුවන් සමඟ සහභාගිවීමට අපට සහය වූ අතර, එය සෑම පාර්ශ්වකාර අංශයටම අසමසම වේ. මෙයට ප්‍රතිලාභී පොළි අනුපාත, සහ අපගේ ගනුදෙනුකරුවන්ට මිලකරණය, ප්‍රජාව තුළ ආයෝජනය, තරුණ සංවර්ධනය, සහ අපගේ ව්‍යාපාර හවුල්කරුවන්ට නැවත ආයෝජනයට හා දියුණුවීමට සහයවන වේගවත් ආපසු ගෙවීමේ ක්‍රියාපටිපාටි ඇතුළත්ය.

බුද්ධිමය ප්‍රාග්ධනය

අපගේ දැනුම් සුරක්ෂිතාගාරවල වැඩිකළ තත්ත්වයට දායක වන පුහුණු සහ සංවර්ධනය සහ විදේශීය පුහුණුවලට නිරාවරණය තුළ අපි ආයෝජනය කරමු.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

උපායමාර්ගික ස්ථානවල දේපල අත්කර ගැනීම, සහ උසස් සන්නාම දෘශ්‍යතාව සඳහා පවතින දේපල ප්‍රතිසංස්කරණය, වෙළෙඳපොල තුළ අපගේ නායකත්ව ස්ථානය පවත්වා ගැනීමට දායක වන පරිවර්තනීය තාක්ෂණය, නවීන ඩිජිටල් ක්‍රියාවලි අත්කර ගැනීම.

ස්වභාවික ප්‍රාග්ධනය

අපගේ පරිසරය සංරක්ෂණය සඳහා අදාළ තිරසාරතාවය තුළ ආයෝජනය බැංකුවේ අනාගතය දායක මිහිතලය මත බැංකුවේ ස්ථාවරත්වය සහතික කරයි.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය

දිළිඳුකම පිටුදැකීම

දිළිඳුකම සියලුම ආකාරයෙන් සැමතැනම අවසන් කිරීම.

බැංකුවේ ජයග්‍රහන සහ එහි බදු සංරචකය ජීවනෝපායන් සහ ඔරොත්තු දීම නඟා සිටුවන සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීමට ජාතිය තුළ නැවත ආයෝජනය කරන ලදී.

තිරසාර නගර හා ප්‍රජාවන්

නගර හා මානව ජනාවාස අතුළත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර කිරීම.

බැංකුවේ පුළුල්ව පැතිරුණු ශාඛා සහ සේවා මධ්‍යස්ථාන ජාලය තිරසාර ප්‍රජාවන් සඳහා මූල්‍ය අන්තර්ගතභාවය සහතික කරයි. අපගේ පාසටහන තුළ යහපත් මූල්‍ය සහ මිලකරණ මූලධර්ම අපි යොදවමු.

සාමය, සාධාරණත්වය, ශක්තිමත් ආයතන

තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ ඇතුළත් සමාජයන් ප්‍රවර්ධනය කිරීම, සියලුම දෙනාට සාධාරණත්වය ලබාදීම, ඵලදායී, වගවන සහ ඇතුළත් ආයතන සෑම මට්ටමකදීම ගොඩනැඟීම.

තිරසාර ආකාරයකින් අපගේ මූල්‍ය ප්‍රාග්ධනය කළමනාකරණය කරමින්, අපි රජයට අයත් ආයතනයක් ලෙස සෑම අංගයකදීම සංවර්ධනය කරා දායක වෙමු.

අරමුණු සඳහා හවුල්කාරත්වය

තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරත්වය ක්‍රියාත්මක කිරීම සහ පුබුදු කිරීමේ මාර්ග ශක්තිමත් කිරීම.

තීක්ෂණ කළමනාකරණ මූලධර්ම මත පදනම් වී යහපත් මූල්‍ය හැකියාව සහිත ආයතනයක් ලෙස ශ්‍රී ලංකා රජය සමඟ හවුල්කාර වීම දේශීය ආර්ථිකය සහ ප්‍රතිසාධනය හා ආර්ථික සංවර්ධනය තුළ තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා රජයේ නොසැලෙන උත්සාහයන් ශක්තිමත් කිරීම කරා අපගේ දායකත්වය ලබා දේ.

2024 ප්‍රධාන අවධානය

අපගේ ප්‍රතිපාර්ශ්වයන් කරා අපගේ බැඳීම සපුරාලමින් සහ 2023 අවසානයේදී පිරිසිදු අරමුදල් මාර්ග වෙත පිවිසෙමින් ස්ථාවර පියවරක් මත අපි වසර ආරම්භ කළෙමු. පුද්ගලික අංශයේ ආයතන වෙත ශක්තිමත්ම බැංකුව වීමේ අපගේ උපායමාර්ගය හඹායමින්, දියුණුවන පුද්ගලික අංශය වෙත පිවිසීම සහ ඔවුන්ගේ අරමුදල් අවශ්‍යතා සඳහා තෙරපුම්-විකුණුම් ප්‍රවේශයක් ක්‍රියාත්මක කරන ලදී. වාණිජමය සහ කර්මාන්ත ණය මෙන්ම කල්බදු සඳහා ඉල්ලුම අපගේ ණය කළඹ වැඩිකර ඇති බව සටහන් කිරීමට ලැබීම අපට සතුටකි. අපි ස්ථාවර වත්කම් ගුණාත්මතභාවයක් පවත්වා ගත් අතර, ඔරොත්තුදීම සහ අනුවර්ත්‍යතාව සමඟ වර්ධනීය ණය සහ කල්බදු ශේෂ සමඟ අපි රැඳී සිටියෙමු.

තවද, රජයට අයත් ආයතනවල ණය සීමා සහ එවැනි ආයතනවලින් තිරසාර අයකිරීම්වලට පූර්ණ අනුකූලතාවය පෙන්වූ බැවින්, රජයට අයත් ආයතනවලින් අයකිරීම් සුරක්ෂිත කර ගැනීමේ බැංකුවේ උත්සාහයන් ප්‍රයෝජනවත් විය. ඊට අමතරව, මේ සම්බන්ධයෙන් පූර්ව නිශ්චිත ඉලක්ක ඉටු කර ගනිමින් වෙනත් ගනුදෙනුකාර අංශවලින් එකතු කිරීම් සහ අයකිරීම් කෙරෙහි අවධානය පවත්වා ගැනීමේදී බැංකුව ඔරොත්තුදීම පෙන්නුම් කළේය.

2024 සාර්ව ආර්ථික දළ විශ්ලේෂණය

ඉතා පැහැදිලි යලිපුබුදුවක් සමඟ, ද.දේ.නි. පුරෝකථනය කළ වර්ධන අනුපාතවලින් ඉදිරියට 5%කින් වර්ධනය වූ අතර, උද්ධමනය තනි අඟුරක් දක්වා පහත වැටුණි. අංශමය වර්ධනය තුළ කෘෂිකර්මය සඳහා 8.3%ක්, සේවා අංශය 57.5කින් වර්ධනය වූ අතර, කර්මාන්ත නිමැවුම 25.5%කින් පුළුල් විය. 2023 දී ආරම්භ කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇ.ඩොලර් 2.9ක සහන පැකේජය අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරන ලද බවට සැකයක් නොමැති නමුත්, ස්ථාවර අනාගතයක් සඳහා ඔරොත්තුදීම සමඟ ස්ථිරව ඉදිරිය බලන ජාතියක් සඳහා මුදල් සහ මූල්‍ය ක්‍රියාමාර්ග අඛණ්ඩව පැවතීමත් සමඟ රාජ්‍ය අංශයේ විශදම විශාල වශයෙන් අඩුවිය.

රජයේ මූල්‍ය ආදායම රු. ට්‍රිලියන 4.0 දක්වා වර්ධනය වූ අතර, සෑම කල්හීම රජයේ වියදම් රු. ට්‍රිලියන 5.3ක් විය. 2024 වසර මැතිවරණ වසරක් වුවද, 2023 දී (රු. ට්‍රිලියන 5.4) පැවති අගයට වඩා අඩු අගයක් විය. අභ්‍යන්තර සේවක ප්‍රේෂණ රු. මිලියන 6.6 දක්වා ඉහළ ගිය අතර, 2016 දී පැවති ඉහළම අගයට ආසන්න විය. සංචාරක ක්ෂේත්‍රය 2023 දී පැවති ඇ.ඩොලර් 2.1ට සාපේක්ෂව 2024 දී ඇ. ඩොලර් 3.2ක ආදායමක් උපයාගෙන ඇත. විදේශීය සංචිත 2023 පැවති ඇ.ඩොලර් මිලියන 4.4ට සාපේක්ෂව 2024 දී ඇ.ඩොලර් මිලියන 6.1ක් විය. මූල්‍ය ප්‍රතිපත්තියේ සහ අනුරූපතාවයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස, රුපියල ඇ.ඩොලරයට අනුව අධිප්‍රමාණය වූ අතර එය ආසන්න වශයෙන් 10.7% – 11.5% ක් වූ 2024 අවසානයේදී නිරුද්ධමනයකට රට මුහණ දුන්හ. ෆිට්ච් ශ්‍රේණිගතකරණය CCC+ දක්වා විතැන් වූ අතර, 2023 දෙසැම්බර් හි RD ශ්‍රේණිගතකරණය සිට පූර්ව 2022 මට්ටම්වලට නැවත ස්ථානගතවීම සමඟ ආපසු ඉහළ ගියේය.

අපගේ කාර්යසාධනය

අපගේ හවුල්කරුවන්ට අපගේ කැපවීම් සපුරාලීමට සහ අපගේ මහජන සුභසාධන වගකීම ඉටු කරන අතරම ලාභ උපයන තිරසාර මූලධර්ම මත ගොඩනගා ඇති ඔරොත්තු දෙන බැංකු මෙහෙයුමක් ගොඩනැගීමට අපි මහත් අපේක්ෂා සහිත උපාය මාර්ගයක් ආරම්භ කළෙමු. ඒ අනුව බැංකුවේ ස්ථානය වසර දෙකකට පසු අඛණ්ඩතාවක් ලෙස අපේක්ෂිත මට්ටමට වඩා පහළ අගයක් විය. පිරිවැය අඩු කිරීම සඳහා ස්ථිර තීරණය සමඟ, අපගේ මානව ප්‍රාග්ධනය කරා නෛසර්ගික වටිනාකමක් රඳවා ගනිමින්, මහජන බැංකුවේ ඉතිහාසය තුළ මේ දක්වා උපරිමය වන ස්ථිර කාර්යසාධනයක් අපි ලබා දී ඇති බව සඳහන් කිරීමට ලැබීම අපට ආඩම්බරයකි.

අපි පසුගිය වසරට වඩා 148.8%ක වර්ධනයක් අත්කර ගත් අතර, රු. බිලියන 25.1ක බදු පසු ලාභයක් වාර්තා කළේය. පරිහානි ආර්ථිකයක් තුළ ගනුදෙනුකාර තැන්පතු වාර්ෂිකව 7.6%කින් වර්ධනය වූ අතර රු. ට්‍රිලියන 2.9 දක්වා ඉහළ යමින් 16.4%ක ගනුදෙනුකාර තැන්පතු වෙළෙඳපොල කොටසක් අත්කර ගෙන ඇත. මුළු වත්කම් වාර්ෂිකව 8.5%කින් වර්ධනය වූ අතර රු. ට්‍රිලියන 3.3ක් සාක්ෂාත් කරගෙන ඇත. ණය කළඹ රු. ට්‍රිලියන 1.8 දක්වා අත්කර ගැනීමට 4.5%කින් වර්ධනය විය. වසර තුළ අක්‍රීය ණයවල ඉදිරි විතැන්වීමක් දක්නට නොමැත.

මුළු මෙහෙයුම් ආදායම 2023ට වඩා 54.9%කින් වර්ධනයක් අත්කර ගත් අතර, රු. බිලියන 125.2ක් දක්වා ඉහළ ගියේය. ශුද්ධ පොලී ආදායම 2023 දී පැවති රු. බිලියන 54.3ට සාපෙක්ෂව රු. බිලියන 107.2ක් විය. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම 2023 දී පැවති රු. බිලියන 12.8ට සාපේක්ෂව රු. බිලියන 14.2 දක්වා වැඩි විය. ශුද්ධ පොලී ආන්තික 2023 1.8% සිට 2024 දී 3.4% දක්වා වැඩි විය. හානිකරණ අයකිරීම රු. බිලියන 5.5 හි රඳවාගෙන ඇත.

මෑතකාලීන රජයේ ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් ඇති වූ වාසි ඇතුළුව කිසිදු ව්‍යාතිරේකයක් නොමැතිව සියලුම විචක්ෂණ අඩු කිරීම්වලින් පසු, බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව 16.5%හි පැවති අතර, එය නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළින් පැවතුණි.

2024 අවසානය වන විට රුපියල් සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය 353.9%හි පැවති අතර, 2023 දී අගයේ සිට 256.7%ක ඉහළයාමකි. සියලුම ව්‍යවහාර මුදල් සඳහා, 2023 දී පැවති 207.9%ට සාපේක්ෂව 2024 දී 279.5%ක් විය. රුපියල් සහ සියලුම ව්‍යවහාර මුදල් සඳහා 100%ක අවම නියාමන අනුපාතය ඉක්මවා ඇත.

2024ක් අවසන් වූ වසර සඳහා බැංකුවේ තෝලන අනුපාතය 2024 මූල්‍ය වසර අගදී 3.7%ක් වූ අතර ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය 2024 මූල්‍ය වසර අගදී 3.178.9%ක් විය. මේ සියල්ල නියාමන අවම අවශ්‍යතා පහසුවෙන් ඉක්මවා ඇත.

2025 ජනවාරිවල, ෆිට්ච් ශ්‍රේණිගතකරණය බැංකුවේ ජාතික දිගුකාලීන ශ්‍රේණිගතකරණය A (lka) සිට AA-(lka) දක්වා ඉහළට ශ්‍රේණිගත කර ඇත.

පසුගිය වසර හතරක – සාරාංශයක්

2021-2024 දක්වා අපගේ දිගුකාලීන ගමන අපි ග්‍රහනය කිරීමේදී, අපි එය පහත පරිදි සටහන් කරමු:

- 2021 = ඔරොත්තු දෙන වසරක්
- 2022 = සැම අවස්ථාවකම අඩු සහ පෙර නොදුටු විරූ වසරක්
- 2023 = ප්‍රතිසාධන හා නැවත මතුවන වසරක්
- 2024 = සැම අවස්ථාවකම ඉහළ වසරක්

ද්‍රවශීලතාව කළමනාකරණය

අපනයන සීමාවන් අඛණ්ඩව පැවති බැවින් සහ අපනයන වෙළෙඳ පොල විවිධ හේතු "නිසා" එකතැන රැඳුන බැවින් සන්නාමය අමතර ද්‍රවශීලතාව පැවතණි. අමතර ද්‍රවශීලතාව කෙටි සිට මධ්‍යම දක්වා උපකරණවල විචක්ෂණශීලීව ආයෝජනය කරන ලද අතර, නව ගනුදෙනුකාර අංශවලට ණයදීම වැඩි විය.

ණය ප්‍රතිමිලකරණය

ණය ප්‍රතිමිලකරණය පොලී අනුපාත වෙනස් කිරීම, ආපසු ගෙවීමේ කාලසීමාව, හෝ අවශ්‍ය තැන්වලදී වෙනත් ණය නියමයන් සිදුවීම හා අඩු අක්‍රීය ණය පවත්වා ගැනීමට කඩිසර ඇගයීම් සමඟ සම්බන්ධ වන අතර, එම ණය සේවාකරණය අඛණ්ඩව පවති. දරන ලද පිරිවැය හමුවේ, මෙම උපායමාර්ගික ප්‍රවේශය තුළින් විචක්ෂණ අවදානම් කළමනාකරණය සඳහා සහ අභියෝගාත්මක ආර්ථික වාතාවරණයන් හමුවේ තිරසාර ණයගැති සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා බැංකුවේ කැපවීම පිළිබිඹු කරයි.

රජයට අයත් ආයතනවල අයකර ගැනීමේ හැකියාව

බැංකුව විසින් දරන හිඟ ණයවලින් බහුතරය රජයට අයත් ආයතන හා සම්බන්ධ වේ. මෙවැනි මූල්‍ය සහභාගිත්වයන් මහජන සුභසාධනය හා ආර්ථික අඛණ්ඩතාවය සඳහා අත්‍යවශ්‍ය ඉන්ධන, ගල්අඟුරු, පොහොර, ඖෂධ සහ වෙනත් අත්‍යවශ්‍ය නිෂ්පාදන වැනි තීරණාත්මක සම්පත්වල බාධාරහිත වෙන් කිරීම සහතික කිරීම සඳහා සේවය කරයි.

අපි 2024 දී රජයට අයත් ආයතන වෙත නිරාවරණ සැලකියයුතු ලෙස අඩුකළ අතර, තිරසාර මූල්‍ය කළමනාකරණයක් යොදා ගැනීම සහ පුද්ගලික අංශයේ ණය දීම ප්‍රසාරණය, විචක්ෂණ ණය කළමනාකරණය සහ ජාතියේ සමස්ත මූල්‍ය ඔරොත්තුදීම වැඩි කිරීම සඳහා අපගේ බැඳීම කෙරෙහි අවධානය යොමු කරන ලදී, අළුතින් හඳුන්වා දුන් තනි ණය සීමාවන් සහ රජයට අයත් ආයතන සඳහා දැඩි ණයදීමේ සීමා සමඟ, නියාමන වාතාවරණය ලාභදායී සහ තිරසාර අඛණ්ඩතා පැවැත්මක් මෙහෙයවීම තුළ අපගේ උත්සාහයන්ට සහයවීමට වෙනස් වී ඇත.

හානිකරණ අයකිරීම්

ශුද්ධ හානිකරණ අයකිරීම් 2023 දී රු. බිලියන 7.4 සිට රු. බිලියන 5.5 දක්වා අඩුවිය. මෙම මුදල ශුද්ධ අයකිරීම් වන බවත් එයට SLFRS 9 – "මූල්‍ය උපකරණ" වල 5.4.1 වගන්තියට අනුකූලව අවසර දුන් ප්‍රමාණයට අක්‍රීය ණය හා අත්කාරම්වලට අදාළ අත්හිටුවීම්වල පොළිය ඇතුළත් බවත් පැහැදිලි කිරීම වැදගත්ය. මෙම ගැලපීම විනිවිදභාවය සහ ගිණුම්කරණය සමඟ අනුකූලතාව සහතික කරයි.

විදේශ විනිමය සංචිත ගොඩ නැගීම

එතෙර සේවක ප්‍රජාවගෙන් ප්‍රේෂණ දිරි ගැන්වීමට, අපි ආකර්ශනීය දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලද අතර, විදේශ විනිමය තැන්පතු කෙරෙහි ප්‍රතිලාභ සහතික කරන ලදී. මෙම ප්‍රතිඵලය ප්‍රේෂණ ගලාඒම්වල සුවිශේෂී වර්ධනය තුළින් පිලිබිඹු වේ. එමෙන්ම අපි විදේශ විනිමය තැන්පතු වැඩි කිරීමට අපගේ තැන්පතු බලමුළු ගැන්වීමේ උපායමාර්ගයට අනුකූලව අපනයන ලැබීම් සඳහා ව්‍යාපාරයක නිරත වූයෙමු. අභ්‍යන්තර ප්‍රේෂණ වාර්ෂික ඉලක්කය පසුකළ අතර, පුද්ගලික අංශයට ණයදීම යහපත් ප්‍රතිඵල අතකර දී ඇත. අපගේ විදේශ විනිමය සංචිත ඒකාබද්ධ කිරීම අපගේ වැඩ සටහනේ ඉහළින්ම වූ අතර, අපනයන අංශය ස්ථීර පියවරක් දැනට පෙන්නුම් කරන බැවින් අපි පිරිවැය අයකිරීම අපේක්ෂා කරමු. මුදල් උච්ඡාවචන යාත්‍රණය කිරීමට සහ මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීමට හා තිරසාර වර්ධනය ඉදිරියට ගෙන යාමට මෙම උපායමාර්ගික ප්‍රවේශය අපි ඉදිරියට ගෙන යන්නෙමු.

ආදායම

මෙම කොටස ආරම්භයේදී අපගේ කාර්යසාධන සමාලෝචනය තුළ ඉස්මතුකර දක්වන පරිදි, අපි 2024 දී බදු පසු ලාභය තුළ වාර්තාගත වර්ධනයක් තිබුණි. සම්ප්‍රදායික සීමාවෙන් ඔබ්බට පිරිනැමීම් සමඟ SME සහ MSME ණය, හරිත ණය, සහ ඩිජිටල් ණය විසඳුම් ඇතුළත් කරන විවිධාංගීකරණය කළ ණය කළඹ මෙම ජයග්‍රහනයට හේතුව වන අතර, එය පාරිභෝගික පදනම වර්ධනය වීම පමණක් නොව ස්ථීර ආදායමක් නිර්මාණය කරන අවදානම් නිරාවරණ අඩු කර ඇත.

2024 දී බැංකු තරඟයේ වෙනස් කරන්නා වූ ඩිජිටල් පරිනාමනය පුළුල්ව ජනප්‍රිය සහ පරිශීලක හිතකාමී People Wallet යෙදුම සමඟ ගනුදෙනු පරිමාවන් වැඩි කළ අතර ඒ තුළින් වඩා ඉහළ ගාස්තු පදනම් ආදායම වැඩි කර ඇත. අපගේ ව්‍යාපාර හවුල්කාර පදනම් පුළුල් කරමින්, ආදායම් වර්ධනය සහ යොමු කිරීමේ වැඩසටහන් සඳහා මාර්ග විවෘත කරමින්, දේපළ වෙළඳාම් අංශය, සෞඛ්‍ය සේවා සහ ඊ-වාණිජ්‍ය වේදිකා සමඟ අපි සම-සන්නාමගත සන්ධාන ඇති කර ගත්තෙමු.

හරිත මූල්‍යකරණය, පුනර්ජනනීය බලශක්තියට අරමුදල්කරණය, සහ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති, තිරසාර නිවාස ණය පිරිනැමීම ජීවන රටා සංක්‍රමණ ප්‍රවනතාව තුළ වෙනස් වන තරුණ ජන විකාශනවලට යොදා ගත්තේය.

නුඹුන්වත්භාවය

වර්ධන වැඩසටහන්වල සංයෝගයක් වන, විචක්ෂණ අවදානම් කළමනාකරණය තුළින් මානව ප්‍රාග්ධනය ප්‍රසාරණය හා කුසලතා වැඩි කිරීම සහ නුඹුන්වතභාවය පාදක වන ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් සාක්ෂාත් කර ගැනීමට සහය වූ ඩිජිටල්කරණය මගින් වැඩිකළ සේවා විශිෂ්ටත්වය කරා බැඳීම කෙරෙහි අවධානය යොමු කලේය. 2024 දී 50.3% දක්වා අඩු වූ යහපත් පිරිවැයට ආදායම් අනුපාතය කළමනාකරණය කිරීම තුළින් අඩු කළමනාකරණය පෙන්වන අතර, ශක්තිමත් අවදානම් කළමනාකරණය රාමුවක් මත පදනම් වූ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ කාර්යක්ෂම, සහ ඵලදායී සම්පත් කළමනාකරණය වැඩි කරයි.

2024 අවසානයට, බැංකුව 10.9%ක පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතයක් සහ 16.5%ක මුළු ප්‍රාග්ධන අනුපාතයක් වාර්තා කළ අතර, මෙය නියාමනය අවමයට වඩා ඉහළ අගයන් වෙති. පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය යන ද්විත්වය 2024 තුළ බැංකුව සඳහා ශක්තිමත් ප්‍රාග්ධන තත්ත්වයන් පෙන්නුම් කරන ලදී. මෙය සැකයෙන් තොරවම, අලාභ අවශෝෂණය කරගැනීමට ඇති සිය හැකියාව සහ මූල්‍ය ස්ථායිතාව පිළිබඳ බැංකුව කෙරෙහි නියාමක, ආයෝජක, තැන්පතු හිමියන්ගේ විශ්වාසය, කරයි.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

2024 සඳහා අපි අත්කරගෙන ඇති ප්‍රතිඵලවලින් බැංකුවේ උපායමාර්ගික නව්‍යකරණයේ බලය, ගනුදෙනුකාර අවධානය, සහ වෙනස් මූල්‍ය වාතාවරණයන් හි දී අනුවර්තනය වීමේ එහි හැකියාව පෙන්වා දේ.

නව මූල්‍ය වසර සහ ඉන් ඉදිරියට අපි විශ්වාසයෙන් පියවර තබන බැවින්, 2024 දි අපි අත්කර ගත් මූල්‍යමය තත්ත්වය මත රඳා පැවැත්ම සහ ඉදිරියට යාම සඳහා අපි කටයුතු කරන්නෙමු. අපගේ ඩිජිටල් ආධිපත්‍ය පවත්වා ගැනීමට අපි ආයෝජනය කරන බැවින් සහ තිරසාර වර්ධන උපායමාර්ග මත අවධානය යොමු කරන බැවින්, පුද්ගලික අංශය සහ කර්මාන්තවලට ඉඩ සැලසීමට ගැඹුරින් හා පළලින් යුත් මහජන සුභසාධන ආයතනයක් වීමේ අපගේ මූලික වගකීමට නොසැලෙන කැපවීමක් සමඟ, අප ජාතියේ ප්‍රතිසාධන හා වර්ධන ගමන්මගේ ඉදිරියට යාමට, සහ සාර්ව ආර්ථික වාතාවරණය තුළ විභව අභියෝගවලට සහ මතුවන ගනුදෙනුකාර අපේක්ෂාවන්ට ප්‍රතිචාර දැක්වීමට මනාව ස්ථානගත වෙමු.

අපි අපගේ ශක්තිමත් ප්‍රාග්ධන පදනම පවත්වා ගන්නා අතරම, නිෂ්පාදන සහ ණය පිරිනැමීම් විවිධාංගීකරණය කර තාක්ෂණය භාවිතා කර තිරසාර වර්ධනයට මඟ පාදන අපගේ වෙළෙඳපොල කොටස ශක්තිමත් කිරීමට තිරසාර ව්‍යවහාර මූලධර්ම සමඟ ඉදිරියට යන්නෙමු. මෙය මහජන බැංකුව ඉහළම සන්නාමයක් බවට පත් කරන බව සහ අපගේ වෙළෙඳපොල කීර්තිනාමය වැඩි කරනු ඇති බව අපට සහතිකය.

2024 දී අප ගොඩනගන ලද ශක්තිමත් මූල්‍ය පදනම මතුවන අවස්ථාවන් මත ප්‍රාග්ධනීය කරමින් යම් අනාගත අභියෝග ජයගතහැකි බවට සහ ජාතික ප්‍රතිසාධනය සහ ආර්ථික වර්ධනයට සැලකියයුතු ලෙස දායක වනු ඇති බවට අපි සර්වශුභවාදි වෙමු.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ශාඛා 355ක ජාලයක් දක්වා විහිදෙන ප්‍රධාන භෞතික යටිතල පහසුකම් වලින් සමන්විත කාර්යාල පහසුකම් ඇතුළු බැංකුවට අයත් ස්පෘශ්‍ය වත්කම් සමූහය නිශ්පාදිත ප්‍රාග්ධනය වේ.

සුවිශේෂී අවස්ථා

- දිවයින පුරා විහිදුණු ශාඛා 751 ක් සහ සේවා මධ්‍යස්ථාන ජාලය
- ස්වයං සේවා ඒකක 307
- ජනගහනයෙන් 68.9%ක් ආවරණය කරන ගනුදෙනුකාර කළඹ
- සූර්ය බලශක්තියෙන් සමන්විත හරිත ගොඩනැගිලි 100

අපගේ ප්‍රවේශය

සාමූහික ජාලගත ප්‍රධාන යටිතල පහසුකම් සමඟින් ගනුදෙනුකාර සම්බන්ධතා මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියාත්මක සේවා මධ්‍යස්ථාන, ස්වයං බැංකුකරණ ඒකක (SBU), ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATMs), මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs) සහ වෙනත් පහසුකම් සමඟ රටේ සෑම කොටසක්ම ආවරණය කරන ශාඛා ජාලයක් ක්‍රියාත්මක කරයි. තරුඟකරුවන් විසින් සාපේක්ෂව අඩු සේවාවක් සපයන, ඩිජිටල් යටිතල පහසුකම් සීමිත ග්‍රාමීය ප්‍රජාවන් අතර ප්‍රජා බැංකුකරණ වැඩසටහන් කඩඉම බැංකුවේ පැවැත්ම හා තිරසාර ආර්ථික කටයුතු සඳහා මූලික වේ.

වැදගත් තේමාවන්

ඩිජිටල් නායකත්වය

සෞඛ්‍ය හා ආරක්ෂාව

අවස්ථා

- කාර්යක්ෂමතාව වැඩිකරන සහ පිරිවැය අඩුකරන ඩිජිටල් ආධිපත්‍ය සහ ලීන් කළමනාකරණ සංකල්ප
- ඩිජිටල්කරණය තුලින් සුවපහසු බැංකු සේවා සඳහා ගනුදෙනුකාර පදනම යොමු කිරීම.

අභියෝග

- තවදුරටත් පවත්නා සාර්ව ආර්ථික අභියෝග
- ආනයන භාණ්ඩ මත අධික බදුකරණය
- මන්දගාමී ඉදිකිරීම් කර්මාන්ත කටයුතු
- 2024 දී ඉහළ උපයෝගිතා පිරිවැය

නිර්මාණය කළ වටිනාකම

- ATMs, CDMs, CRMs සහ KIOSKs මඟින් සිදුකරන ලද රු. මිලියන 135.8 ක් ඉක්ම වූ ගනුදෙනුවල වටිනාකම රු. බිලියන 2.142.69ක් වේ.
- මිලියන 1.04 ඉක්මවූ ඩිජිටල් පහසුකම් තුලින් විවෘත කරන ලද නව ගිණුම්.
- ඩිජිටල් යෙදුම් මඟින් සිදුකරන ලද වටිනාකම රු. බිලියන 1,295.6ක් වූ ගනුදෙනු මිලියන 161ක් පවත්වා ඇත.
- ඩිජිටල් පහසුකම් මඟින් පිරිනමන ලද ණය රු. බිලියන 97.3ක් ඉක්මවා ඇත.

ප්‍රාග්ධන සම්බන්ධතා

මූල්‍ය ප්‍රාග්ධනය

ඩිජිටල්කරණය සහ හරිත ගොඩනැගිලි පිරිවැය අඩු කිරීමට දායක වේ.

මානව ප්‍රාග්ධනය

වෘත්තිමය සෞඛ්‍ය හා ආරක්ෂාව මනාව නඩත්තුකළ පරිශ්‍රය විසින් සහතික කරන අතර, ඩිජිටල්කරණය කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය කර ගනුදෙනුකරුවන්ට පහසුව ලබා දේ.

බුද්ධිමය ප්‍රාග්ධනය

ස්ථාවර සන්නාම දෘශ්‍යතාව අපගේ ගනුදෙනුකරුවන් මානසිකව බලගැන්වීම.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

ගනුදෙනුකාර සෞඛ්‍ය හා ආරක්ෂාව තහවුරු වන පහසුකම හා නව්‍යකරනය තුලින් ආකර්ශනීය පරිසරයක ව්‍යාපාර කටයුතු සිදු කිරීම.

ස්වභාවික ප්‍රාග්ධනය

හරිත ගොඩනැගිලි සහ පුනර්ජනනීය බලශක්තිය වගකීම් සහිතව භාවිතය තුලින් මිහිතලය සුරැකීම දිරිගන්වයි.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය

දැරියහැකි සහ පිරිසිදු බලශක්තිය

පොසිල ඉන්ධනවල බලපෑම අඩු කිරීම පවතින ශාඛාවල හරිත ශාඛා ගොඩනගමින් සහ පුනර්ජනනීය බලශක්තිය යොදා ගනිමින් මහජන බැංකුව හරිත ගොඩනැගිලි සංකල්පය යොදා ගනී.

යෝග්‍ය වැඩ සහ ආර්ථික වර්ධනය

සෑම සේවකයෙකුටම සිය ආර්ථික වර්ධනය ඇති කිරීම සඳහා බැංකුව යෝග්‍ය කාර්යන් සහ ප්‍රතිලාභ සහතික කරයි.

කර්මාන්තය,නව්‍යකකරණය හා යටිතලපහසුකම්

නව ඩිජිටල් පහසුකම් නව දෘඩාංග හා ව්‍යාපාර ඩිජිටල්කරණ රාමුව සඳහා බැංකුවේ අඛණ්ඩ ආයෝජනය සමස්ථ කර්මාන්තයේ නව්‍යකරනය හා යටිතල පහසුකම් සඳහා දායක වේ.

විෂමතා අවම කිරීම

සෑම තරාතිරමකම පුද්ගලයින්ට අපගේ නිෂ්පාදන හා සේවා කරා පිවිසීමට දිවයින පුරා ගනුදෙනුකාර ස්පර්ෂක ස්ථාන තුළින් අවස්ථාව ලබාදීම තුළ අපි සමාජ විෂමතාව අඩුකර ඇත.

වගකීම්සහගත පරිභෝජනය හා නිෂ්පාදනය

බැංකුව අඛණ්ඩ ඩිජිටල්කරණය තුළින් වගකීම්සහගත පරිභෝජනය නගා සිටුවන අතර එය බැංකුකරණ සේවා ලබා දීමේදී සහ ප්‍රසම්පාදන කටයුතුවල කඩදාසි භාවිතය වැඩිවැඩියෙන් තුරන් කරයි.

දේශගුණික ක්‍රියාමාර්ග

පරිසර දූෂණය අවම කරමින් අපද්‍රව්‍ය හා සම්පත් භාවිතය අවම කිරීම තුල දේශගුණික ක්‍රියාමාර්ග කෙරෙහි බැංකුවේ කැපවීම සිදුකර ඇත.

මූලපිරීම්

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල

කොළඹ 2, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවතේ අංක 374 දරන ස්ථානයේ මහල් 23කින් සහ බිම් මහල තුනකින් සමන්විත නව මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉදි කිරීම අවසන් අදියරේ ඇති අතර 2025 දෙවන කාර්තුවේදී ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

ශාඛා ව්‍යාප්තිය

මාතලේ, කෑගල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල සහ පුල්මුඩේ සහ ගල්කිරියාගම ශාඛා දිවයින පුරා විහිදුනු බැංකුවේ ශාඛා ගොන්නට නව එකතු කිරීම් වෙති. යාපනය ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල සහ කින්නියා සහ කල්මුනේ ශාඛා වර්තමානයේ ඉදිකරමින් පවතින අතර, බදුරලිය සහ මනුකුලම් හි තවත් ශාඛා තැනීම සඳහා ඉදිකිරීම් ආරම්භයට පෙර දැනටමත් ඇගයීම් අදියරේ පවතී. ඒවා බැංකුවේ විස්තීරණ ව්‍යාපාරික ජාලයට එක් කිරීමට යෝජිතය.

ශාඛා අළුත්වැඩියාව

බැංකු පරිශ්‍රයන් තුලට පැමිණීම මඟින් ගනුදෙනුකරු සමඟ මූලික සම්බන්ධතාවය ආරම්භ වන බැවින් බැංකුව සහ එහි ශාඛා ජාලය, මෙහෙයුම්වල අඛණ්ඩතාවය ලබාදීමට හා යටිතල පහසුකම් සඳහා අලුත්වැඩියා කටයුතු අවශ්‍ය වේ. එබැවින් 2025 වර්ෂය තුල ශාඛා 60ක අලුත්වැඩියා කටයුතු නිමකර ඇත.

2024 අවසානය වන විට, තිරසාරභාවය සඳහා අපගේ කැපවීම ශක්තිමත් කරමින් ශාඛා 100ක් සූර්ය බලශක්තියට සාර්ථකව එක් කරන ලදි. අපගේ හරිත බලශක්ති වැඩසටහන්වලට අනුව, 2025 අවසානය වන විට තවත් ශාඛා 50ක් සූර්ය බලශක්තියෙන් බලගැන්වීමට යෝජනා කර ඇත. අපගේ කාබන් පාසටහන අඩුකිරීම, බලශක්ති කාර්යක්ෂමතාව ඉටුකිරීම සහ පාරිසරික තිරසාරභාවයට සහයවීම මෙම වැඩසටහනින් අරමුණු කරයි.

ආරක්ෂාව

2024 දී බැංකුව දිවයින පුරා සියලුම ශාඛාවල නවීනතාව පවත්වාගෙන යන බැවින් ආරක්ෂාව ප්‍රධානතම සාධකයක් විය. ආරක්ෂක නිලධාරීන්, ශක්තිමත් යටිතලපහසුකම් සහ පහසුකම්, සීසිටීවී නියාමන පද්ධති සහ සංඥා පද්ධති නඩත්තුව ආරක්ෂාව සඳහා බැංකුවේ ප්‍රධානතම පිළිපැදීමේ අංගයක් සහ කොටසක් වන අතර, සිය ශාඛා ජාලය හරහා ආරක්ෂක සන්නාමයක් සේවකයින්ට සහ ගනුදෙනුකරුවන්ට ලබා දේ. ආරක්ෂක අධීක්ෂණය දිවයින පුරා විහිදුන මෙහෙයුම් තුළ විමධ්‍යගත කෙරේ.

තිරසාර දේපල කළමනාකරණය

භෞතික පරිශ්‍ර, අළුත්වැඩියාවන් සහ යලි සකස් කිරීම්, ගොඩනැගිලි නවීකරණයන් පවත්වා ගැනීම සහ සාකල්‍ය කාලගුණ සූදානම සහතික කිරීම, සහ කාර්යාල පරිශ්‍රවල භෞතික ජාලයේ නඩත්තුවට අදාළ සියලු ගනුදෙනු ඉටු කිරීම අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය ආරක්ෂා කිරීමේදී තීරණාත්මක සංරචකයකි. අපි ගෝලීය මනා පරිචයන්, සහ තිරසාර යටිතලපහසුකම් මෙහෙයවීමේ විධිනියෝග වන දේශීය නීති හා රෙගුලාසිවලට අනුකූල වෙමු.

බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය

වත්කම් වර්ගය	වටිනාකම් 2023 රු. '000	වටිනාකම් 2024 රු. '000	වෙනස %
සින්නක්කර ඉඩම	24,775,609	26,091,472	5.31
සින්නක්කර ගොඩනැගිල්ල	10,760,917	11,265,027	4.68
බදු පදනම් මත ගොඩනැගිලි	3,352,340	3,399,138	1.40
මෝටර් රථ	1,448,468	1,587,530	9.60
ගෘහ භාණ්ඩ	750,748	824,771	9.86
යන්ත්‍රෝපකරණ, උපකරණ සහ ස්වයං බැංකු ඒකක	5,525,264	5,833,758	5.58
පරිගණක	8,226,740	9,056,416	10.09
මුළු වටිනාකම	54,840,085	58,058,111	5.87

සමූහයේ නිෂ්පාදිත ප්‍රාග්ධනය

වත්කම් වර්ගය	වටිනාකම් 2023 රු. '000	වටිනාකම් 2024 රු. '000	වෙනස %
සින්නක්කර ඉඩම	29,219,040	31,244,230	6.93
සින්නක්කර ගොඩනැගිල්ල	15,895,921	16,473,663	3.63
බදු පදනම් මත ගොඩනැගිලි	3,438,103	3,484,901	1.36
මෝටර් රථ	1,718,942	1,834,746	6.74
ගෘහ භාණ්ඩ	1,337,011	1,418,303	6.08
යන්ත්‍රෝපකරණ, උපකරණ සහ ස්වයං බැංකු ඒකක	6,634,352	7,110,042	7.17
පරිගණක	9,192,438	10,133,061	10.23
මුළු වටිනාකම	67,435,808	71,698,947	6.32

බැංකු ශාඛා ජාලයේ භූගෝලීය පිහිටීම

GRI 2-6



උතුර	
ශාඛා	22
ATM	48
CRM	15
SBU	15

වයඹ	
ශාඛා	32
ATM	77
CDM	1
CRM	29
SBU	26

උතුරු මැද	
ශාඛා	26
ATM	60
CRM	25
SBU	23

මධ්‍යම	
ශාඛා	44
ATM	105
CRM	44
SBU	41

නැගෙනහිර	
ශාඛා	30
ATM	64
CDM	1
CRM	19
SBU	19

බස්නාහිර	
ශාඛා	102
ATM	258
CDM	10
CRM	116
SBU	110

ඌව	
ශාඛා	26
ATM	57
CRM	19
SBU	19

සබරගමුව	
ශාඛා	32
ATM	64
CDM	3
CRM	22
SBU	23

දකුණ	
ශාඛා	41
ATM	103
CRM	33
SBU	31

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවන්ට අනුව අපගේ දේපල තබාගැනීම අපි තවදුරටත් සිදු කරන්නෙමු. අපගේ සැලසුම්කළ ව්‍යාප්තිය 2025 දී මෙහෙයුම් ආරම්භ කරනු ඇත.

බුද්ධිමය ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනයට අපගේ ප්‍රවීන සේවක වත්කම්වල සමුච්චිත වටිනාකම, නිහඬ දැනුම, ක්‍රියාවලි, බුද්ධිමය දේපළ, තරඟකාරී වාසිය සහ භාවිතය තුළ ඇතුළත් තාක්ෂණික වටිනාකම, සන්නාම පොරොන්දුව හෝ කීර්තිනාමය යනාදිය ඇතුළත් වේ. එමෙන්ම අපට ලබාදෙන තරඟකාරී වාසිය සහ තරඟයෙන් අපව වෙනස් කරන සංස්කෘතිය, සදාචාර, සහ නවෝත්පාදන හැකියාවන් සහ නව්‍යකරණය ද ඇතුළත් වේ.

සුවිශේෂී අවස්ථා

- නව ගණුම් මිලියන 10 වැඩි ප්‍රමාණයක් ඩිජිටල් බැංකුකරණය සඳහා ඇතුළත්වීම.
- ආසන්න වශයෙන් ට්‍රිලියන 1.3ක් වටිනා ගනුදෙනු People's Wave, People's Wyn, People's Pay, සහ People's Web හරහා පවත්වා ඇත.
- HRIS දියත් කිරීම අවසන් වන අතර සියලුම HR කාර්යයන් සඳහා එක් බිහිදොරක් ලෙස ක්‍රියාකරයි.
- ගනුදෙනුවලින් 81% ක් POS සහ කාඩ් ඇතුළුව ඩිජිටල් තුළින් සිදුකර ඇත.
- ඩිජිටල් තුළින් පිරිසකසන ලද ණය ප්‍රමාණය 74,000+

අපගේ ප්‍රවේශය

2024 මුල් කොටසේදී බුද්ධි ගලනය සහ ජනතා සංක්‍රමණය බැංකුවේ නිහඬ දැනුම් පදනම සහ ප්‍රවීනතා සුරක්ෂිතාගාර රඳවා ගැනීමේ අපගේ උත්සාහයන්ට අභියෝග කළේය. කෙටි කාලීන අහිතකර බලපෑම්වලට මුහුණ දීම සඳහා සේවක වැටුප් ගෙවීම වැඩිදියුණු කිරීම, කුසලතාවයෙන් යුත් දක්ෂයින් බඳවා ගැනීම සහ සේවක යහපැවැත්ම ශක්තිමත් කිරීම සඳහා අපි ප්‍රමුඛත්වය දුන්නෙමු. ආර්ථික දුෂ්කරතාවලදී අපගේ ගනුදෙනුකරුවන්ට සහයවීමට විවිධාකාරයෙන් ප්‍රජාව වෙත ලඟාවීම සඳහා 2024 වසර තුළ අපගේ මහජන මෙහෙවර වැඩසටහන අපි ඉදිරියට ගෙන ගියෙමු. මෙම වාර්තාමේ අදාළ කොටස්වල මේවා සම්පූර්ණයෙන් ලේඛණගත කර ඇත.

වැදගත් තේමා

ඩිජිටල් නායකත්වය

කුසලතා මට්ටම් උසස් කිරීම/නැවත ඇති කිරීම

පුහුණුව හා සංවර්ධනය

දක්ෂතා කළමනාකරණය

අවස්ථා	අභියෝග	නිර්මාණය කළ වටිනාකම
පිරිවැය අඩුකිරීමට, ක්‍රියාත්මක කාලය වැඩි කිරීමට සහ වෙළෙඳපොල වේගවත් කිරීමට ඩිජිටල් විසඳුම් අඛණ්ඩව වර්ධනය කිරීම.	තොරතුරු තාක්ෂණ/ඩිජිටල් සම්පත් බඳවා ගැනීමට සහ අභ්‍යන්තර දක්ෂයින් රඳවා ගැනීමට ඉහළ පිරිවැය දැරීම. ඩිජිටල් හා සම්ප්‍රදායික බැංකු සේවා පිරිනැමීම තුළින් ඩිජිටල් බැංකුකරණයට මාරුවීමට ජ්‍යෙෂ්ඨ ගනුදෙනුකරුවන් දිරි ගැන්වීම.	2024 වසර සඳහා අන්තර්ජාල හා ජංගම බැංකුකරණ පහසුකම් සඳහා ලියාපදිංචිය මිලියන 10 ආසන්නය. තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් පස් දෙනෙකු බඳවා ගැනීම.	අන්තර්ජාල හා ජංගම බැංකුකරණ පහසුකම්වලින් ගනුදෙනු ගණන මිලියන 13කි.

ප්‍රාග්ධන සම්බන්ධතා

මූල්‍ය ප්‍රාග්ධනය

ඩිජිටල් හැකියාව සහ සන්නාම උපායමාර්ග තුළින් ඉහළ ශුද්ධ වටිනාකම සහිත වෙළෙඳපොල අංශ වෙත පිවිසීම.

මානව ප්‍රාග්ධනය

පුහුණුව හා නිපුනතා සංවර්ධනය ඩිජිටල් හා මාර්ගගත පුහුණුව තුළින් වේගවත් කරන ලදී.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

අඛණ්ඩව ඩිජිටල් නව්‍යකරණය හා තෝරා ගත් ශාඛා නව්‍යකරණය කිරීම.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

ඩිජිටල් නව්‍යකරණය තුළින් ගනුදෙනුකාර තෘප්තිය සහ වැඩිදියුණු කළ සන්නිවේදනය.

ස්වභාවික ප්‍රාග්ධනය

ඩිජිටල් නව්‍යකරණය ප්‍රමුඛ කිරීම තුළින් කඩදාසි රහිත මෙහෙයුම් ක්‍රියාවලියට යොමු කිරීම.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය

කර්මාන්තය, නව්‍යකරණය හා යටිතල පහසුකම්

සිය ව්‍යාපාර ආදර්ශයට නව ඩිජිටල් නිෂ්පාදන, නව දෘඩාංග සහ ඩිජිටල්කරණය සඳහා බැංකුවේ අඛණ්ඩ ආයෝජනය සමස්ථ කර්මාන්තය, නව්‍යකරණය හා යටිතලපහසුකම්වලට දායක වීම.

වගකීම්සහගත පරිභෝජනය හා නිෂ්පාදනය

පද්ධති සහ ක්‍රියාවලි උසස් කිරීම තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ බලශක්තිය, ජලය, සහ වෙනත් සම්පත් සංරක්ෂණය ප්‍රවර්ධනය වීම.

සාමය, සාධාරණත්වය සහ ශක්තිමත් ආයතන

ශක්තිමත් පාලනය හා අනුකූලතා සංස්කෘතියක් පවත්වා ගැනීම තුළින් සදාචාර හා වෙනස්ව නොසලකන ආයතනයක් ලෙසට තත්ත්වය පවත්වාගෙන යාම.

ඩිජිටල් නව්‍යකරණය හා තාක්ෂණික යාවත් කිරීම්වල අප සිදුකළ දියුණුව මෙම වාර්තාවේ පිටු අංක 104 සිට 108 දක්වා තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් බැංකුකරණය කොටසේ විස්තර කර ඇත.

තාක්ෂණික නිපුනතා සහ ආයතනිකමය දැනුම

සියලුම සම්ප්‍රදායික බැංකුකරණය තුළ ඉතුරුම් බලමුළු ගැන්වීම සහ මූල්‍ය අන්තර්ගතභාවය සහතික කරමින් ජාතියේ ආර්ථික සංවර්ධනයට සහයවෙමින්, බැංකුවේ අසමසම විධිනියෝගය සිය ගනුදෙනුකරුවන්ට අවශ්‍ය මූල්‍ය විසඳුම් ලබාදීමේදී බැංකුවල සම්ප්‍රදායික සහ ඩිජිටල්කරණය කළ ක්‍රම බැංකුව ඒකාබද්ධ කරයි. රටේ අර්ධ නගර හා ග්‍රාමීය ප්‍රදේශවල පදිංචි 70%ක පමණ ගනුදෙනුකාර පදනමක් බැංකුවේ පුළුල් ශාඛා ජාලය භාවිතා කරන අතර, ජාතියට සහ එහි ජනතාවට සිය වගකීම ඉටු කිරීමට ප්‍රවීනතා සම්භාරය විවිධාංගීකරණය කිරීම.

එම නිසාම, බැංකුවේ බුද්ධිමය වත්කම් පදනම යනු වටිනාකම ඵලදායිව ලබාදීමට අවශ්‍ය විවිධ වෘත්තිකයින්, විශේෂඥයින්, සහ මූල්‍ය විසඳුම් ක්ෂේත්‍රයෙහි ප්‍රවීනයින්, තාක්ෂණය, ඩිජිටල්කරණය, මානව සම්පත් උපදේශනය හා වෙනත් විවිධ මෙහෙයුම් දක්ෂයින්ගේ ගතික මුසුවකි. පළපුරුදු බැංකුකරුවන්ගේ සිට තරුණ සිමාවාසිකයින් දක්වා වන ශ්‍රමබලකාය සංස්කෘතිය, අධ්‍යාපනය, පළපුරුද්ද සහ දැනුම පිළිබඳ පොහොසත් නියෝජනයක් සිදු කරයි. 2024 දී, පසුගිය වසරවල බුද්ධි ගලනය හා ජනතා සංක්‍රමණය හේතුවෙන් අපට අහිමි වූ සේවක සංඛ්‍යාව ප්‍රතිස්ථාපනය කිරීමේ කොටසක් ලෙස 250ට වැඩි පුද්ගලයින් අපි බඳවා ගත්තෙමු.

බඳවා ගැනීම් 2024

තනතුර	බඳවාගත් ගණන	එකතුව
කළමනාකරණ අභ්‍යාසලාභීන්	5	නිලධාරි
ප්‍රධාන නිලධාරි ව්‍යාපෘති කළමනාකරණ	1	විධායක
ප්‍රමාණ තක්සේරුකරු	1	නිලධාරි
පද්ධති පරිපාලක	2	නිලධාරි
පුහුණු ලේකම් සහකාර	25	මෙහෙයුම්
සහය නීති නිලධාරි	2	නිලධාරි
ගෘහ නිර්මාණ ශිල්පි	1	නිලධාරි
ගනුදෙනුකාර සේවා සහයක	249	මෙහෙයුම්
අලෙවිකරණ නියෝජ්‍ය ප්‍රධානී	1	විධායක
පුල්ස්ටැක් මෘදුකාංග සංවර්ධක	2	නිලධාරි
කණිෂ්ඨ පුල්ස්ටැක් මෘදුකාංග සංවර්ධක	3	නිලධාරි
එකතුව	292	

තාක්ෂණික ප්‍රවීනතාව/සුදුසුකම් 2024

සුදුසුකම	සේවකයින් ගණන
MSc/MBA/පශ්චාත් උපාධි	845
ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී	1,682
CIMA/CFA/CMA/CA ශ්‍රී ලංකා/බැංකුකරණය	2,086
නීති පිළිබඳ සුදුසුකම්	89
තොරතුරු තාක්ෂණ සුදුසුකම්	338
ඩිප්ලෝමාධාරීන්	275
වෙනත්	4,003
එකතුව	9,318

පසුගිය දශක හය සඳහා මෙහෙයුම තුළ, අපි බැංකු වෘත්තිකයින් සංවර්ධනය කර, පෝෂණය කර, දැනමුතුකම් ලබා දී ඇති අතර ඔවුන් දිගු කාලයක් සඳහා අඛණ්ඩව අප වෙත සේවය සලසයි. අපගේ සේවකයින් සමහරෙක් මූල්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රවීනයින් වන අතර, ඔවුන්ගේ බැංකුකරණ දැනුම පමණක් නොව ජාතික සංවර්ධනය සඳහා ඔවුන්ගේ මනාව ලබාගත් අදහස් සඳහා ඔවුන්ගේ යෙදවුම් සහ පළපුරුද්ද යොදවයි.

වසර 64ක දිගුකාලීනයක් පුරා බැංකුව සංවර්ධනය කර ඇති දැනුම් බැංකුව, තරඟයේ ඉදිරියෙන්ම සිටින ගනුදෙනුකාර සේවා සපයන්නෙක් ලෙස චැට්බොක්ස් හඳුන්වා දී ඇති බැවින් කෘතිම බුද්ධිය භාවිතය සඳහා විශාල වශයෙන් ඉදිරියට ගමන් කරමින් සිටී. කෘතිම බුද්ධිය යනු බොහෝ කර්මාන්තවල අත්හල නොහැකි සහයකයෙක් වන අතර, බැංකුව සහ ගනුදෙනුකරු අතර ඉදිරි පෙරමුණු සම්බන්ධතාවයක් ඇති කරන ක්‍රියාවලීන් සඳහා පහසුකම් සැලසීමේදී කෘතිම බුද්ධියට විශාල කාර්යභාරයක් ඉටු කිරීමට සිදුවන අනාගතයක් බැංකුව අපේක්ෂා කරයි.

ආයතනික සංස්කෘතිය

රජයට අයත් බැංකුවක් ලෙස, අපගේ රාජකාරිය වන්නේ ජාතියේ අභිමානය බවට පත්වෙමින් දිළිඳුකම තුරන් කිරීම කරා මෙහෙයවන මහජන සුභසාධන අංග මෙහෙයවීමයි. වසර ගණනාවක් පුරා, අභ්‍යන්තර සහ බාහිර ගනුදෙනුකරුවන් සඳහා ඩිජිටල්කරණය වෙත මාරුවීමක් සමඟ බැංකුකරණ ගතිකතා ඇතුළත් කිරීමට අපි වෙනස් වී ඇත. මෙය වත්මන් අවශ්‍යතාවක් වන අතර, එහිදී ගනුදෙනුකරුවන් බැංකුකරණයේ පහසුව සහ අවකාශය සොයන අතර. ඇඟිලි තුඩින් සිදුකරන බැංකුකරණයට පක්ෂපාතී වේ. මෙවැනි අවශ්‍යතා ක්‍රම අපි යොදාගෙන ඇතත්, බැංකුව සිය ජනතාව අරමුණු කළ සම්ප්‍රදායන් සහ වටිනාකම අඛණ්ඩව රඳවා ගන්නා අතර, කිසිඳු ආකාරයකින් වෙනස් ලෙස නොසලකන සියලුම ආර්ථික පසුබිම්වල සියලුම ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලයි. එබැවින්, අප ජාතියේ අභිමානය විම පිළිබඳව අපි සතුටු වෙමු.

බැංකුවේ සන්නාම ශක්තියෙන් 50%කට දායක වන බැංකුවේ ස්කන්ධ කොටස වැඩි වී ඇති බැවින්, අපගේ සන්නාම වටිනාකම වැඩි කිරීමට අපි සැලකියයුතු ලෙස ආයෝජනය කර ඇත්තෙමු. වෙළෙඳපොල තුළ ඉහළම සන්නාම හිමිකමක් අත්කර ගැනීම පිළිබඳව අපි ආඩම්බර වෙමු. 2024 ජූනි මස, ෆිට්ච් ශ්‍රේණිගතකරණ විසින් බැංකුවේ ජාතික දිගුකාලීන ශ්‍රේණිගතකරණය ඉදිරි දැක්ම ස්ථාවර තත්ත්වය අනුව AA-(lka) හි නැවත සහතික කර ඇත.

රජයට අයත් ආයතනයක් ලෙස, බැංකුව ශ්‍රී ලංකා ණය කළඹට නිරාවරණය වන අතර, බැංකුවේ ශක්තිමත් දේශීය අධිකාරය බැංකුවේ සන්නාම හිමිකමට බලපෑ හැකි සාධක වෙති.

2024 දී තොරතුරුවල ආරක්ෂාව

බැංකුව එහි වත්කම් සහ පාර්ශ්වකාර තොරතුරු සුරක්ෂිත කිරීමට ශක්තිමත් ආරක්ෂක වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති අතර, එය විස්තීර්ණ තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි විසින් මෙහෙයවනු ලබයි.

මහජන බැංකුව සිය තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (ISMS) සඳහා කීර්තිමත් ISO/IEC 27001:2022 සහතික කිරීම සාක්ෂාත් කරගත් පළමු දේශීය වශයෙන් ක්‍රමානුකූල වැදගත් බැංකුව සහ රජයට අයත් බැංකුව විය.

බැංකුව ශක්තිමත් ආරක්ෂක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාපිත ආරක්ෂක ප්‍රමිති හා මාර්ගෝපදේශවලට අනුකූල වේ.

බැංකුව ආරක්ෂක මූලධර්ම ඇතුළත් කිරීමට සේවකයින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් වැඩි කිරීම මඟින් ආරක්ෂාව – දැනුම්වත් සංස්කෘතියක් පෝෂණය කළේය.

තොරතුරු ආරක්ෂණ දෙපාර්තමේන්තුව ආරක්ෂක දුර්වලතා කාලිනව හඳුනා ගැනීම සහ පිළියම් යෙදීම සඳහා අභ්‍යන්තර උවදුරට පත්වීමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යාපාර ක්‍රියාවලි සංවර්ධනය

අතින් සිදුකරන යම් ව්‍යාපාරික ක්‍රියාවලි කිහිපයක් ඩිජිටල් වේදිකාවලට පරිවර්තනය කිරීමේදී, ඩිජිටල්කරණය සහ තාක්ෂණික යාවත්කිරීම් ප්‍රමුඛ කෙරේ. අපගේ ඩිජිටල් විසඳුම්වල අංගයක් සහ කොටසක් වන තාක්ෂණික ගතිලක්ෂණවලට ඇතුළත්කර ගැනීම සඳහා පරිසර හිතකාමී බිහිදොර, ආරම්භයේ සිට අවසානය දක්වා කඩදාසි රහිත යාන්ත්‍රණයක් තුළ සහභාගිවීම ඇතුළත්ය. ඩිජිටල් බිහිදොරක් මත ගනුදෙනුකරුගේ විස්තර ග්‍රහනය කිරීම ක්‍රමවත් සහ වේගවත් වලංගුතාව සහතික කරන අතර, අනෙකුත් වැඩ ක්ෂේත්‍රවල ඉහළ වටිනාකම ලබාදීම සඳහා කාර්ය මණ්ඩල කාලය ඉතිරි කර දේ. ණය කාඩ් පහසුකම්, කාඩ් රහිත මුදල් පහසුකම, කෙටි පණිවිඩ සංඥා ලියාපදිංචිය ඊ-ප්‍රකාශන හා ජංගම යෙදුම ලියාපදිංචිය අපගේ ඩිජිටල් නිෂ්පාදන මාලාවේ අනෙකුත් තාක්ෂණික ලක්ෂණ කිහිපයකි. (විද්‍යුත් අකාරයෙන් ඔබගේ ගනුදෙනුකරු හඳුනා ගන්න) (eKYC) සාම්ප්‍රදායික KYC ක්‍රියාවලියට නවීන ප්‍රතිපාර්ශ්වයක් සපයන මෙය, ගනුදෙනුකරුවෙකු අලුතින් ඇතුළත් කරන ලද බැංකු ගිණුමක් සමඟ සම්බන්ධ වීමට පෙර ඔහුගේ අනන්‍යතාවය සත්‍යාපනය කිරීම සඳහා මූලික සැලැස්මක් සකසයි.

උපයෝගිතාවයේ පහසුව, පරිශීලක-හිතකාමී අතුරුමුහුණත් සහ උපදෙස්වල පැහැදිලිතා සඳහා, අපගේ ඩිජිටල් නිෂ්පාදන සඳහා දායක වන වයස අවුරුදු 55 ට වැඩි ගනුදෙනුකරුවන් 375,000 ක් සිටිති. ත්‍රිභාෂාත්මක ලක්ෂණය මඟින් ඩිජිටල් බැංකු විසඳුම් සඳහා පරිශීලකයින් මිලියන 3.3ක් ලියාපදිංචි කරන අතර, සරලකළ පරිශීලක අතුරු මුහුණත් අපගේ ඩිජිටල් විසඳුම් කළඹ වඩා ශක්තිමත් කරයි.

	2023	2024
රට පුරා ඇති ATMs CDM සහ CRM යන්ත්‍ර සංඛ්‍යාව	1,157	1,173
බස්නාහිර පළාතෙන් පිටත ATMs CDM සහ CRM යන්ත්‍ර සංඛ්‍යාව	779	788
ඩිජිටල් විසඳුම් ලියාපදිංචිය	මිලියන 3.4	මිලියන 4.4
ඩිජිටල් ආයතනික පහසුකම් සඳහා ලියාපදිංචි සංඛ්‍යාව	13,100+	18,250+
ඇතුළත් වූ ඩිජිටල් ගිණුම් ගණන	මිලියන 3.8	මිලියන 4.8+
මාර්ගගත සහ ජංගම බැංකුකරණය හරහා සිදු කරන ලද ගනුදෙනු සංඛ්‍යාව	මිලියන 98.3	මිලියන 161
මාර්ගගත සහ ජංගම බැංකුකරණය හරහා සිදු කරන ලද ගනුදෙනුවල වටිනාකම	රු.බි. 1,042	රු.බි. 1,296

මෙම වාර්තාවේ පිටු අංක 104 සිට 108 දක්වා වූ තොරතුරු තාක්ෂණය හා ඩිජිටල් බැංකුකරණය පිළිබඳ කොටසින් ඩිජිටල් ක්‍රියාවලි, නිෂ්පාදන හා ලබාදීමේ ක්‍රම පිළිබඳ විස්තරයක් ඇතුළත් වේ.

ආපදා ප්‍රතිසාධනය

ගනුදෙනුකරුවන් අරමුණුකළ සහ මෙහෙවර තීරණාත්මක පද්ධති හදිසි අවස්ථාවලදී ක්‍රියාත්මක කිරීමට ප්‍රතිචලිත කර ඇති බව සහතික කිරීම සඳහා බැංකුව මෙම අවදානම් ප්‍රතිසාධන සැලැස්ම කෙරෙහි සමීප අවධානය යොමු කරයි. අපගේ ගනුදෙනුකරුවන් සඳහා ඩිජිටල් යෙදුම් ලබාගත හැකිවීම වර්තමාන තරඟකාරී බැංකු ක්ෂේත්‍රය තුළ අත්‍යවශ්‍ය වන බැවින්, මෙම සැලැස්ම වරින් වර පරීක්ෂා කෙරේ.

පර්යේෂණ, සංවර්ධනය හා නව්‍යකරණය

ෆින්ටෙක් සමාගම් සමඟ සහයෝගයෙන්, අප විසින් පුරෝගාමී වූ ශ්‍රී ලංකාවේ පළමු වැනි අපගේ නව්‍යකරණ මධ්‍යස්ථානය තුළින් අපි අඛණ්ඩව නව්‍යකරණය වෙමු. අපගේ මූලික අවධානය ලෙස මහජන සුභසාධනය සමඟ, බැංකු ක්ෂේත්‍රය තුළ නවීනතාව ඇතුළත් කිරීමට අපගේ සීමාවන් අපි පුළුල් කළ අතර, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ අනාගතවාදී භූ දර්ශනයක් හරහා අපගේ දුරස්ථ පාරිභෝගික පදනමට වටිනාකමක් ලබා දෙන්නෙමු.

2025 සහ ඉන් ඉදිරියට දැක්ම

ඩිජිටල්කරණය කෙරෙහි නව්‍යකරණය අපි සිදුකරගෙන යන අතර, තාක්ෂණික පරාක්‍රමයන් යාවත් කරමින් තිරසාර ව්‍යාපාර කටයුතුවලට යෝග්‍යවීමට සුදුසු දක්ෂයින් බඳවා ගනිමු. අපගේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා, අපි අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය පෝෂණය සහ සංවර්ධනය කරන අතර ඩිජිටල් අනාගතයක් සඳහා ගැලපෙන ප්‍රවීනතාව සඳහා වෙළෙඳපොල නිරීක්ෂණය කිරීම විශේෂ වැදගත්කමකි. එමෙන්ම අපි අපගේ 2024 සැලැස්මේ දක්වා ඇති පරිදි කෘතීම බුද්ධිය (AI) භාවිතා කරමින් ක්‍රියාවලි සංවර්ධනය ද සිදු කරමු.

බැංකුව තුළ මානසික ප්‍රබුද්ධතාවය සහිත ව්‍යවහාර සහතික කිරීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙහෙස නොබලා කටයුතු කරන බැවින්, ඉදිරි වසරවල තිරසාර ව්‍යාපාර මෙහෙයුමක් සහතික කිරීමට අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය එහි සංයෝජනය තුළ සිය පවත්නා ශක්තිය තවදුරටත් වැඩි කරනු ඇති බව අපට විශ්වාසය.

මානව ප්‍රාග්ධනය

අපගේ සාර්ථකත්වයේ නිර්මාණකරුවන් වන, අපගේ සේවකයින් අපගේ අනෙක් පාර්ශවකරුවන්ට තිරසාර වටිනාකමක් ලබාදීම සඳහා තරඟකාරී වාසිය අප වෙත ලබාදෙන ගාමක බලවේගය වේ. වෘත්තීමය ප්‍රගතිය සඳහා උපකාරී වැඩ පරිසරයක් නිර්මාණය කරමින්, ඔවුන්ගේ යහපැවැත්ම සඳහා අපි කැපවී සිටින අතර, ඔවුන්ගේ අපේක්ෂාවන් සහ බැංකුවේ පරමාර්ථ සපුරාලීමට සාකල්‍ය සේවක වටිනාකම් කොටසක් අපි පිරිනමමු.

සුවිශේෂී අවස්ථා

- 7,500ට වැඩි සේවක පිරිස
- සේවක රඳවාගැනීමේ අනුපාතය 96%
- ද්විත්ව මාර්ගික කාර්යසාධන ඇගයීම් ක්‍රමය ක්‍රියාත්මකයි
- සේවයින් 21ක් සඳහා විදේශ පුහුණු
- සේවක සහභාගිත්ව සමීක්ෂණය සඳහා 78.52%ක සහභාගිත්ව අනුපාතය
- පිරිමි: කාන්තා අනුපාතය 2:3
- සේවකයෙකුට ලාභය රු. මිලියන 3.3
- රු. බිලියන 35.8ක් වැටුප් හා ප්‍රතිලාභ ගෙවීම්
- උසස් කිරීම් 1,194
- සේවක තෘප්තිය පිළිබඳ සමීක්ෂණය සේවායෝජකයෙක් ලෙස බැංකුව තුළ තෘප්තිමත්භාවය 72.46%

අපගේ ප්‍රවේශය

විවෘත සන්නිවේදනය, පිළිගැනීම, සහයෝගිතාවය, සහ සේවක යහපැවැත්ම සඳහා ප්‍රමුඛත්වය ලබාදීමෙන් අපි අපගේ සේවකයින් සමඟ ශක්තිමත් සම්බන්ධතා නිර්මාණය කර පෝෂණය කරන්නෙමු. සේවක පුහුණුව සහ සංවර්ධනයට අමතරව, බැංකුකරුවන්ගේ ඊලඟ පරම්පරාවේ සේවායෝජක වශයෙන් තෝරා ගැනීම වෙනුවෙන් අපි උත්සාහ දරන බැවින් රැකියා ස්ථානය සහ රැකියා තෘප්තිමත්භාවය සහතික කිරීමට අවශ්‍ය සම්පත් අපි ඔවුන්ට ලබා දෙන්නෙමු. අඛණ්ඩ වූත් යෝග්‍ය වූත් සේවක පුහුණුව සහ සංවර්ධනය මෙන්ම සේවක මානසික යහපැවැත්ම, සහ ද්විත්ව මාර්ගික කාර්යසාධන ඇගයීම් පද්ධතිය හඳුන්වාදීම අපගේ මානව ප්‍රාග්ධනය වර්ධනය සහ රඳවා ගැනීම කෙරෙහි අපගේ අවධානය යොමු කරයි.

වැදගත් තේමා

සේවක ඵලදායිතාව

කුසලතා කළමනාකරණය

පුහුණුව හා සංවර්ධනය

මානසික යහපැවැත්ම

සේවක ප්‍රතිනිපුණතාව

සෞඛ්‍ය හා ආරක්ෂාව

අවස්ථා | **අභියෝග** | **නිර්මාණය කළ වටිනාකම**

- ඩිජිටල් පහසුව අපේක්ෂා කරන ගනුදෙනුකරුවන්ට අවශ්‍ය සේවා මට්ටමක් පිරිනැමීම වෙනුවෙන් තාක්ෂණික නිපුණත්වයකින් යුතු මෙන්ම ඉහළ ඩිජිටල් දැනුමැති Z පරම්පරාවේ සේවකයින් බඳවා ගැනීම.
- ක්ෂේත්‍රයේ ප්‍රමිතීන්ට අනුකූලවන අතරම ඇගයීමේදී සේවකයින්ගේ හඬට ඉඩ ලබා දෙන ද්විත්ව මාර්ගික කාර්යසාධන ඇගයීම් පද්ධතියක් හඳුන්වාදීම.
- මානව සම්පත් ක්‍රියාවලි සහ සේවක අවශ්‍යතා වඩා යහපත් අයුරින් කළමනාකරණය කිරීමට HRIS පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
- බුද්ධි ගලනය සහා ගෝලීය සංක්‍රමණය නිසා සේවකයින් 400ක් අහිමි වූ අතර, අපගේ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩ සේවයක් සහතික කිරීමට ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය වේගවත් කිරීමට බැංකුවට සිදුවිය.
- අලුතින් බඳවා ගත් අයට පුහුණුව සහ ප්‍රති නිපුණතාව හේතුවෙන් සේවක පුහුණුව සහ සංවර්ධනය සඳහා වැඩි පිරිවැයක් දැරීමට වීම.
- සම්ප්‍රදායික බැංකුකරණය හා ඩිජිටල් බැංකුකරණයේ සංකලනයකට Z පරම්පරාව හුරුවීම සහ ඔවුන් බැංකුවේ සංස්කෘතිය හා වටිනාකම් අනුගමනය කරන බව සහතික කිරීම.

- සේවක ප්‍රතිලාභ සඳහා රු. බිලියන 35.8ක් වෙන් කර ඇත.
- සේවකයින් 21කට විදේශ පුහුණු ලබා දී ඇත.
- සේවකයින් 1,194ක් උසස් කරන ලදී.
- විශ්‍රාම ප්‍රතිලාභ ලෙස රු. බිලියන 1.4ක් වෙන් කරන ලදී.

ප්‍රාග්ධන සම්බන්ධතා

මූල්‍ය ප්‍රාග්ධනය

සේවක දායකත්වය ආදායම් වර්ධනය සඳහා මූලික වේ.

ඒ හා සමානවම, වගකීම්සහගත පරිභෝජනය බලශක්තිය, කඩදාස, ජලය වැනි සම්පත් සම්බන්ධයෙන් පිරිවැය අඩුකිරීමට සහය වේ.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන්, සහ ප්‍රජාව වැනි අනෙකුත් පාර්ශ්වකරුවන් කරා නිරාවරණය වීම සහ අන්තර් ක්‍රියා කිරීම මගින් වඩා ශක්තිමත් සම්බන්ධතා, මෘදු කුසලතා ගොඩ නැගීමට, සහ අපගේ සේවකයින්ගේ පාරිසරික දැනුවත්භාවය සහ තිරසාරභාවය පිළිබඳ හැඟීම් ඇතුළත් කිරීමට සහයවන අතර, රැකියා තෘප්තිය හා බැංකුව වෙත කැපවීම කෙරෙහි මෙහෙයවයි.

බුද්ධිමය ප්‍රාග්ධනය

පුහුණුව සහ සංවර්ධනය, පර්යේෂණාත්මක කාර්යය ආකල්ප, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සමඟ අන්තර් ක්‍රියා සහ විදේශ පුහුණුවලට නිරාවරණය වීම මගින් අපගේ දැනුම් සමුදායෙහි ගුණාත්මකබව ඉහළ නැංවීමට දායක වේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

අපගේ HRIS පද්ධතිය සේවකයින්ට සිය මානව සම්පත් අවශ්‍යතා කිසිදු බාධාවකින් තොරව, වේගවත්ව කාලය ඉතුරු වන අයුරින් කළමනාකරණය කර ගැනීමට උපකාර කරයි. එමගින් ඔවුන්ට ඵලදායී වැඩ ධාරාවන් හී තවදුරටත් නිරතවීමට උපකාර වේ.

ස්වභාවික ප්‍රාග්ධනය

අපගේ සේවක සහභාගිත්වයෙන් සිදුකරන ව්‍යාපෘතිවල තිරසාරභාවය ඔවුන් තුළ පරිසරයට වඩාත් සංවේදීතාව නිර්මාණය කිරීමට සහ තිරසාරභාවය සහ සංරක්ෂිත මිහිතලයකට එහි වටිනාකම පිළිබඳ දැනුවත් කිරීමට සහය වේ.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය

දිළිඳුකම පිටුදැකීම

සෘජු රැකියා අවස්ථා නිර්මාණය කරමින් රට පුරා දිළිඳුකම තුරන් කිරීම වෙත බැංකුව දායක වේ.

යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම

බැංකුව සියලු සේවකයින්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීමට සිය ශක්තිමත් සෞඛ්‍ය සහ සනීපාරක්ෂක ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන ඇත.

ගුණාත්මක අධ්‍යාපනය

බැංකුව සියලුම ශ්‍රේණිවල කාර්ය මණ්ඩලයට සේවක පුහුණු සහ සංවර්ධන අවස්ථා ලබා දෙන අතර, ඔවුන්ගේ අධ්‍යාපනික වර්ධනයන්ට සහය වේ.



යෝග්‍ය වැඩ සහ ආර්ථික වර්ධනය

බැංකුව බැංකුකරණ ක්ෂේත්‍රය තුළ විශාලතම සේවා යෝජකයා වන අතර, අදාළ කම්කරු රෙගුලාසිවලට අනුකූල වන පරිදි වූ මානව සම්පත් ප්‍රතිපත්ති සහ සේවක ප්‍රතිලාභ රාශියක් ඇත.

විෂමතා අවම කිරීම

බැංකුව වෙනස් ලෙස නොසලන සේවායෝජකයෙක් වන අතර, ජනවර්ගය, ආගම හෝ වෙනත් යම් ජනවිකාශවලට පක්ෂපාතී නොවී කුසලතාව මත පදනම් සේවකයින් බඳවාගෙන් ඔවුන් සඳහා වර්ධනය සඳහා අවස්ථා මෙන්ම ප්‍රතිලාභ ලබා දේ.

යහපාලනය

අපගේ මානව ප්‍රාග්ධනය සඳහා උපදේශනයේදී ශක්තිමත් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මාලාවක් ක්‍රියාවට නැංවීම මගින් ඉහළ මට්ටමක අඛණ්ඩතාවක් සමඟ වීකාබද්ධ වූ සදාචාරාත්මක හැසිරීම සහතික කෙරේ.

සිය මහජන සුභසාධන සංස්කෘතිය සඳහා පිළිගත් ඉහළ දෘෂ්‍යතා සන්නාමයක් සහිත විශාලතම වාණිජ බැංකුව ලෙස, සහ ජාතියේ ප්‍රකෘතිමත් විමේ මාවතේ ශ්‍රී ලංකා රජය සමඟ හවුල් වෙමින්, බැංකුව තම වටිනාම වත්කම වන මානව ප්‍රාග්ධනය ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් මත පෝෂණය කරන අතර, “Voice of Yours” මාර්ගගත/ඩිජිටල් නාලිකාව හරහා සේවකයින්ට අදහස් හුවමාරු කර ගැනීමට අවස්ථා නිර්මාණය කරයි. මෙය සහකම්පනයෙන් යුතු සේවායෝජකයෙක් විමේ තවත් අංගයක් වන අතර, එහිදී සේවකයින්ට සිය යෝජනා, නිර්දේශ සහ විසඳුම් සඳහා අදහස් සමඟ සහකාර සාමාන්‍යාධිකාරීවරයෙක් කරා සෘජුව ප්‍රවේශ විය හැකිය. එබැවින්, අපගේ සේවකයින්ට අප පිරිනමන වටිනාකම අර්බුදකාරී කාලවලදී අපව ආරක්ෂාව කරා ගෙන ගිය සදාචාරාත්මක පාලනයේ සහ සානුකම්පිත සබඳතා පෝෂණය කිරීමේ එකතුවකි.



මෙම ප්‍රතිපත්ති පිටු අංක 213 සිට 250 දක්වා ආයතනික යහපාලනය කොටස තුළ විස්තර කෙරේ.

මැසිවිලි නිරාකරණය

GRI 2-25, 26

සේවක ගැටළු විසඳීමේ Voice of Yours යාන්ත්‍රණය යනු සේවක අදහස්, පැමිණිලි, මැසිවිලි, සහ ඉදිරි යෝජනා සහ නිර්දේශ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ඉදිරිපත් කිරීමට සේවකයින්ට ලබාගත හැකි ප්‍රධානම මාර්ගයකි. එහිදී මෙම පද්ධතිය තුළින් ලැබෙන මැසිවිල්ලක්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයෙන් සමන්විත කමිටුවක් විමර්ෂණය කරන අතර, ඔවුන්ගේ සොයා ගැනීම් සුදුසු ක්‍රියාමාර්ග සඳහා ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී වෙත ඉදිරිපත් කෙරේ.

සාමූහික කේවල් කිරීමේ ගිවිසුම

GRI 2-30

බොහෝ සේවකයින් සාමූහික කේවල් කිරීමේ ගිවිසුම මගින් ආවරණය කෙරේ. කෙසේවෙතත්, බැංකුව සියලුම සේවකයින් සඳහා සමාන ප්‍රතිලාභ සහ කොන්දේසි පිරිනමමින් සේවකයින්ට සාධාරණ හා සමාන රැකියා අවස්ථා ක්‍රියාත්මක කරයි. මෙය අපගේ මානව සම්පත් අභිප්‍රේරණය කිරීමේ තීරණාත්මක අංගයක් වන අතර, ආර්ථික දුෂ්කරතාවන් හමුවේ පවා අපගේ සාර්ථකත්වයට අත්තිවාරමක් වන බවට සැකයක් නැත.

විෂමාචාර සන්නිවේදන ප්‍රතිපත්තිය

GRI 2-25, 26

විෂමාචාර සන්නිවේදන ප්‍රතිපත්තිය තුළින් මෙහෙයුම් වාතාවරණය තුළ විෂමාචාර දුරු කරමින් දැනුවත්භාවය වැඩි කිරීම පිළිබඳ උත්සාහයන් මෙහෙයවයි. බැංකුව විෂමාචාරය මත ශූන්‍ය ඉවසුම් ප්‍රතිපත්තියක් භාවිතා කරන අතර, සියලුම තොරතුරු දැනුම්දීමේ අවස්ථා කඩිනම්ව මෙහෙයවීමට කටයුතු කිරීම, වරදේ ස්වභාවය සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් ලබාදීම, තොරතුරු හෙළි කරන්නාගේ පොදු යහපත සුරැකීම සහ බැංකුවේ කීර්තිනාමයට ඇතිවිය හැකි හානිය වලක්වාලීම සඳහා කටයුතු කරයි. තොරතුරු හෙළි කරන්නාගේ නිර්ණාමිකභාවය සෑම මට්ටමකදීම සුරක්ෂිත කරන අතර, වැරැද්ද නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග හඳුන්වා දේ.

පහත සඳහන් පැමිණිලි ආසන්න අධීක්ෂක හෝ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට යොමු කළ හැකිය.

1. විනය රීති සංග්‍රහය උල්ලංඝනය කිරීම
2. නීතිමය/නියාමන බැඳීමට අනුකූලවීමට අපොහොසත් වීම
3. යුක්ති අවගමනය
4. මූල්‍ය අක්‍රමිකතා

දූෂණ-විරෝධී පාලන තන්ත්‍රය

GRI 205-2, 3

බැංකුව දූෂණය හා අල්ලස නොමැති සංස්කෘතියකට ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වන අතර, මෙහෙයුම් සහ පාලනයේ සියලුම අංගවල විනිවිදභාවය ලබාදෙන සන්නාමයක් භාවිතා කරයි. ශක්තිමත් මුදල් විශුද්ධිකරණ පාලන රාමුවක් ක්‍රියාත්මක කිරීමත් සමඟ සියලුම මට්ටම්වල නිසි උද්‍යෝගයෙන් කටයුතු කිරීමක් සිදු කරයි.

මානව සම්පත් අංශය දූෂණය හා ඒ ආශ්‍රිත වැරදි ඇතුළු සදාචාර විරෝධී පරිචයන් පිළිබඳ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි පිළිබඳව සේවකයින් දැනුවත් කිරීමට වැඩමුළු සහ තොරතුරු දැනුවත් කිරීමේ සැසි පවත්වයි. සේවකයින් 4,909ක් වූ සහභාගිවන්නන් ඉලක්ක කර ගනිමින් සමකාලීන දූෂණ විරෝධී ප්‍රතිපත්ති පිළිබඳ පුහුණු පැය 33,000කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා දී ඇති අතර, ශ්‍රම බලකාය දූෂණ විරෝධී ප්‍රතිපත්ති පිළිබඳව හොඳම පරිචයන් සමඟ සිටින බව සහතික කිරීම එහි ප්‍රධාන ගුණාංගයක් වුණි.

ක්‍රියාත්මක වෙමින් පවතින ශූන්‍ය ඉවසුම් ප්‍රතිපත්තියක් සමඟ අල්ලස් සහ දූෂණය පිළිබඳ අපගේ ස්ථාවරය ඉතා පැහැදිලිය. හඳුනාගත් ඕනෑම වරදක් සඳහා කඩිනම් සහ දැඩි විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

වැඩසටහන	සහභාගිවූවන් ගණන	පුහුණු පැය
දූෂණ විරෝධී ප්‍රතිපත්ති පිළිබඳව සන්නිවේදනය හා පුහුණුව (විගණනය, අනුකූලතාව, අවදානම් සහ තොරතුරු ආරක්ෂාව පිළිබඳ පුහුණු පැය ගණන)	4,909	33,576

දූෂණ විරෝධය සඳහා සේවක පුහුණුව

සන්නිවේදනය කළ ප්‍රතිපත්ති	ප්‍රතිශතය (%)	ගණන
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්	100	සියලුම අය
සියලුම සේවකයින්	100	සියලුම අය
පුහුණුවූවන්	42	3,240
2024 සඳහා දූෂණ සිදුවීම්	1	80
විනය ක්‍රියාමාර්ග/සේවයෙන් පහකිරීම්	1	86

කුසලතා කළමනාකරණය

GRI 2-7

රටේ විශාලතම වාණිජ බැංකුව ලෙස, ස්ථිර කාර්ය මණ්ඩලයේ 6,770ට වැඩි ප්‍රමාණයක් සහ පූර්ණ කාලීන සේවා පදනම මත කොන්ත්‍රාත් සේවකයින් ලෙස තවත් 863ක් සේවයේ යෙදවීමට ලැබීම පිළිබඳ අපි ආඩම්බර වෙමු. විවිධ හැකියාවන්, නිපුණතා, සහ වෘත්තීමය හැඩගැස්ම මත, අනාගතය සඳහා අප අඛණ්ඩව ගොඩනගන මනා පළපුරුද්දකින් යුතු මානව ප්‍රාග්ධනයක විශ්වාසී භාරකරුවන් වීම අපට සතුටකි.

කණ්ඩායම් සංයුතිය

ස්ත්‍රී පුරුෂභාවය සහ කලාපය අනුව මුළු ශ්‍රම බලකාය (ස්ථිර සේවකයින් සහ වෙනත්)

පළාත	පිරිමි	ගැහැණු	එකතුව	එකතුව %
බස්නාහිර	1,104	1,968	3,072	40
දකුණ	267	515	782	10
මධ්‍යම	288	487	775	10
වයඹ	204	390	594	8
ඌව	196	247	443	6
උතුරු	169	215	384	5
සබරගමුව	205	324	529	7
නැගෙනහිර	251	289	540	7
උතුරු මැද	213	301	514	7
එකතුව	2,897	4,736	7,633	100

ස්ත්‍රී පුරුෂභාවය සහ කලාපය අනුව ස්ථිර සේවකයින්

පළාත	පිරිමි	ගැහැණු	එකතුව	එකතුව %
බස්නාහිර	979	1,756	2,735	40
දකුණ	245	452	697	10
මධ්‍යම	258	425	683	10
වයඹ	191	358	549	8
ඌව	170	209	379	6
උතුරු	156	185	341	5
සබරගමුව	170	288	458	7
නැගෙනහිර	237	261	498	7
උතුරු මැද	182	248	430	6
එකතුව	2,588	4,182	6,770	100

ස්ත්‍රී පුරුෂභාවය සහ කලාපය අනුව ස්ථිර නොවන සේවකයින්

පළාත	පිරිමි	ගැහැණු	එකතුව	එකතුව %
බස්නාහිර	125	212	337	39
දකුණ	22	63	85	10
මධ්‍යම	30	62	92	11
වයඹ	13	32	45	5
ඌව	26	38	64	7
උතුරු	13	30	43	5
සබරගමුව	35	36	71	8
නැගෙනහිර	14	28	42	5
උතුරු මැද	31	53	84	10
එකතුව	309	554	863	100

විවිධත්වය, සමානතාව සහ ඇතුළත්වීම

GRI 405-1

සමාන අවස්ථා සපුරාලන සේවායෝජකයෙක් ලෙස, ස්ත්‍රී පුරුෂභාවය, වාර්ගිකත්වය හෝ ආගමික බාධකයන් නොමැතිව සැමට සමාන වන බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමෙන් බැංකුව සිය සේවක සංඛ්‍යාවේ විවිධත්වය ඉතා උනන්දුවෙන් ආරක්ෂා කරයි.

රටපුරා විහිදී ඇති, අපගේ ශාඛා ජාලය දැඩි විවිධත්වයකින් යුත් පිරිසකින් සමන්විත අතර, වෙනස් කොට නොසැලකීම සහ වෙනයම් ආකාරයේ හානිකර වූ සේවා පිරිනමන ස්ථානයක් නොවීම මෙන්ම සාධාරණ සහ අනෝන්‍ය වශයෙන් සහයෝගය දක්වන පරිසරයක් තුළ ඔවුන් සේවයේ යොදවනු ලැබේ.

රැකියා වර්ගය, ස්ත්‍රීපුරුෂභාවය, සහ වයස් කාණ්ඩය අනුව සම්පූර්ණ ස්ථිර සහ ස්ථිර නොවන සේවකයින් – 2024

	ආයතනික කළමනාකාරිත්වය		විධායක කළමනාකාරිත්වය		නිලධාරීන් (3-III-ශ්‍රේණිය I)		මාණ්ඩලික සහකාර ශ්‍රේණිය		කළමනාකරණ අභ්‍යාසලාභීන්		ගනුදෙනුකාර සේවා සහයක		අනෙකුත් කාණ්ඩ		වෙනත් කොන්ත්‍රාත් සේවකයින්		මුළු එකතුව		මුළු එකතුව %	
වයස් කාණ්ඩය	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු
18-25									3		208	421			2	2	213	423	33.5	66.5
26-45	1		2	2	777	1,694	554	1,508	28	43	37	63	395	309	12	14	1,806	3,633	33.2	66.8
46-55	7	5	12	10	321	327	49	9					277	70			666	421	61.3	38.7
56 ට වැඩි	4	1	7	1	119	199	19	1					63	57			212	259	45.0	55.0
මුළු එකතුව	12	6	21	13	1,217	2,220	622	1,518	31	43	245	484	735	436	14	16	2,897	4,736	38.0	62.0
ප්‍රතිශතය (%)	66.7	33.3	61.8	38.2	35.4	64.6	29.1	70.9	41.9	58.1	33.6	66.4	62.8	37.2	46.7	53.3	38.0	62.0		

2024 සඳහා දෙපාර්තමේන්තු අනුව – මුළු සේවකයින්

වයස	පිරිමි	ගැහැණු	එකතුව
ශාඛා	1,826	3,704	5,530
ප්‍රාදේශිය ප්‍රධාන කාර්යාල	460	398	858
භාණ්ඩාගාරය හා ප්‍රාථමික වෙළෙඳ ඒකකය (PDU)	14	23	37
ආයතනික සහ අක්වෙරළ බැංකු ඒකකය (OSBU)	40	106	146
විතෙර ගනුදෙනුකාර සේවා	31	45	76
කාඩ් මධ්‍යස්ථානය	31	38	69
ප්‍රධාන කාර්යාලය	492	418	910
ව්‍යාපාර පුනර්ජීවන ඒකකය	3	4	7
එකතුව	2,897	4,736	7,633

වයස් කාණ්ඩය අනුව – මුළු සේවකයින්

වයස	පිරිමි	ගැහැණු
18-25	213	423
26-35	559	1,163
36-45	1,247	2,470
46-55	666	421
>56	212	259
එකතුව	2,897	4,736

ස්ත්‍රීපුරුෂභාවය අනුව කලාපීය ව්‍යාප්තිය

කලාපය	පිරිමි	ගැහැණු
අම්පාර	115	113
අනුරාධපුරය	125	186
බදුල්ල	127	168
මඩකලපුව	76	105
කොළඹ උතුරු	73	165
කොළඹ නැගෙනහිර	64	182
කොළඹ බස්නාහිර	61	204
කොළඹ දකුණ	81	223
ගාල්ල	87	198
ගම්පහ	132	373
හම්බන්තොට	95	133
යාපනය	92	136
කලුතර	82	187
මහනුවර	130	272
කෑගල්ල	84	172
කුරුණෑගල	143	291
මාතලේ	66	102
මාතර	85	184
මොනරාගල	69	79
නුවරඑලිය	92	113
පොලොන්නරුව	88	115
පුත්තලම	61	99
රත්නපුර	121	152
වව්නි	77	79
ත්‍රිකුණාමලය	60	71
ප්‍රධාන කාර්යාලය	611	634
එකතුව	2,897	4,736

සේවකයින් නොවන ශ්‍රමිකයින්

GRI 2-8

බැංකුවට සිය සේවා සපයන බැංකු සේවකයින් නොවන ශ්‍රමිකයින් වර්ග දෙකක් ඇත. එක් වර්ගයක් වන්නේ කොන්ත්‍රාත් සේවකයින් සහ බැංකු ක්ෂේත්‍රය තුළ අත්දැකීම් ලබාගැනීම සඳහා සීමාවාසික සහ පුහුණු අවස්ථා ලබාදෙන ලද අවසන් වසරේ විශ්ව විද්‍යාල සිසුන්ය. 2024 දී, විශ්ව විද්‍යාල සිසුන් 1,352කට සහ කොන්ත්‍රාත් සේවකයින් 1,389කට අපි එවැනි අවස්ථා සපයා ඇත.

දෙවන වර්ගය වන්නේ බාහිර ශ්‍රමික සමාගම් විසින් ලබාගන්නා ලද ආරක්ෂක නිලධාරී සහ රියදුරන් වැනි සහයක සේවා වෙනුවෙන් ගිවිසුම්ගත පුද්ගලයින් වන අතර, ඔවුන් බැංකුවේ සේවකයින් ලෙස සලකනු නොලැබේ. ඔවුන්ගේ යෙදවුම් බැංකුවේ පොදු කාර්යයන් කෙරෙහි අවශ්‍ය වුවද බැංකු මෙහෙයුම් කටයුතුවලදී අත්‍යවශ්‍ය කොටසක් ලෙස නොසැලකේ.

දක්ෂයින් අත්කර ගැනීම සහ සේවක පිරිවැටුම

GRI 401-1

බැංකුව රජයට අයත් බැවින් සහ විරැකියාව කෙරෙහි විසඳුම් ලබාදීමේ ජාතික වැඩසටහනේ නියැලීම ප්‍රමුඛතාවක් වන බැවින් උසස් තත්ත්වයේ සේවා නියුක්තිය නිර්මාණය කිරීම බැංකුව විසින් සිදුකරයි. සමාන රැකියා අවස්ථා සලසන සේවා යෝජකයෙක් ලෙස, බැංකුව මෙම වගකීම දිවයින පුරා විෂමතාවයකින් තොරව ඉටු කරනු ලබයි. බැංකුව සිය මෙහෙයුම් සඳහා සුදුසු දක්ෂයින් බඳවා ගන්නා අතර, බැංකුව තුළ ඇති විවිධ පුහුණු හා සංවර්ධන අවස්ථා හරහා අනාගතයට යෝග්‍ය ආකාරයට ඔවුන් පත් කළ හැකිය. 2024 වසර තුළ, සේවකයින් 304 ක් ඉල්ලා අස්වූ අතර, එය මුළු සේවක පිරිසෙන් 4.0%ට ආසන්න විය. බැංකුව නව බඳවාගැනීම් තුළින් විශාල ප්‍රමාණයෙන් සංක්‍රමණය වූ සේවකයින් වෙනුවට වෙනත් අය සාර්ථකව ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. බැංකු වෘත්තියට දක්ෂ සුදුසු සම්පත් සමඟ පවත්නා ඇබෑර්තු පිරවීමට බඳවාගැනීමේ ක්‍රියාව අඛණ්ඩව සිදුවේ.

ස්ත්‍රීපුරුෂභාවය සහ කලාපය අනුව නව බඳවා ගැනීම්

වසර	වසර 18-25		වසර 26-35		වසර 36-45		වසර 46-55		වසර 56ට වැඩි		
	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	එකතුව
බස්නාහිර	9	66	11	20	5						111
දකුණ		22		10							32
මධ්‍යම	5	28	1	8							42
වයඹ	1	14	1	3							19
ඌව	1	13		7							21
උතුරු	1	8		1							10
සබරගමුව	1	15		4							20
නැගෙනහිර		14		1							15
උතුරු මැද	3	12	3	4							22
එකතුව	21	192	16	58	5	0	0	0	0	0	292

අපගේ බඳවාගැනීමේ ප්‍රතිපත්තිය තුළින් නිපුණතා සහ සුදුසුකම් සහිත දක්ෂයින් බඳවා ගැනීමේදී සාධාරණත්වය සහ අපක්ෂපාතිත්වය සහතික කරයි. එමනිසාම, සාධාරණ බඳවා ගැනීම සහතික කරන අතර, බැංකුවේ සංස්කෘතිය සහ තිරසාරභාවයට ධනාත්මකව බලපාන විවිධත්වයෙන් යුතු සහ සියල්ල ඇතුළත් සේවා ස්ථානයක් අපි පෝෂණය කරමු. මූල්‍ය ක්ෂේත්‍රයෙහි තරඟකාරී දැවැන්තයෙක් වශයෙන්, මහජන බැංකුවේ අනාගතය සඳහා ගාමක බලවේගය වියහැකි ඉහළම දක්ෂයින් බඳවා ගැනීමට අපි කැප වන්නෙමු.

ස්ත්‍රීපුරුෂභාවය සහ කලාපය අනුව පිරිවැටුම

වසර	වසර 18-25		වසර 26-35		වසර 36-45		වසර 46-55		වසර 56ට වැඩි		එකතුව
බස්නාහිර	1	3	8	18	12	29	5	4	30	36	146
දකුණ			1	3	2	3	2		5	7	23
මධ්‍යම	1		2	4	6	3	2	3	8	10	39
වයඹ				2		5		3	11	8	29
ඌව				1	1		1		4	3	10
උතුරු				3	2	2			2		9
සබරගමුව			1	1	1	3			4	3	13
නැගෙනහිර	1	2	2	1	1	4	1	2	10	2	26
උතුරු මැද			1		3	3			1	1	9
එකතුව	3	5	15	33	28	52	11	12	75	70	304

ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පෙරමුණු කොට ගත් සංස්කෘතියක් සඳහා, වැටුප්, දීමනා, වන්දි ප්‍රදානයන් වෘත්තීමය අවස්ථා සහ උසස්වීම් සමානව බලගැන්වීම අපගේ මානව සම්පත් අංශය විසින් සහතික කරන අතර ස්ත්‍රී පුරුෂ සමානතාව වර්තමානයේ අත්‍යවශ්‍ය පරමාර්ථයක්ව පවතී.

මානව සම්පත් පිළිබඳ විස්තර පහත වර්ගීකරණය මගින් අනුප්‍රාප්තිය සහ ජ්‍යෙෂ්ඨත්වය ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ කිසිදු භේදයකින් තොරව ලබාදෙන සංස්කෘතියක් පෙන්නුම් කරයි. බැංකුවේ ආයතනික හා විධායක කළමනාකාරිත්වය තුළ ප්‍රසංසනීය කාන්තා සහභාගිත්වයක් ඇති අතර, ධුරාවලියේ විවිධ මට්ටම්වල බැංකුවේ නිලධාරීන් තුළද කාන්තා සේවක සංඛ්‍යාව ඉහළින් සිටී. ගනුදෙනුකාර සේවාව ද වැඩිපුර කාන්තා සහභාගිත්වය ඇති ක්ෂේත්‍රයක් වන අතර, මාණ්ඩලික සහකරුවන් සහ ලේකම්වරුන්ගේ කාන්තා වර්ගීකරණය තුළ ප්‍රබල සංඛ්‍යා ඇත.

වර්ගීකරණය	පිරිමි	ගැහැණු
යතනික කළමනාකාරිත්වය	12	6
විධායක කළමනාකාරිත්වය	21	13
නිලධාරීන් (3 – III – ශ්‍රේණිය 1)	1,217	2,220
මාණ්ඩලික සහකාර ශ්‍රේණි	622	1,518
ගනුදෙනුකාර සේවා සහකාර	245	484
කළමනාකරණ අභ්‍යාසලාභීන්/ තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්	31	43
රියදුරන්	119	
ආරක්ෂක නිලධාරීන්	96	
ලේකම්වරුන්	23	274
පහළ ශ්‍රේණි	511	178
එකතුව	2,897	4,736

දේශීය ප්‍රජාවගෙන් බඳවාගත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව අනුපාතය

GRI 202-2

බැංකුවේ මෙහෙයුම් ශ්‍රී ලංකාව තුළ සීමා වන බැවින්, එහි සියලුම බඳවාගැනීම් දේශීය ප්‍රජාවගෙන් පමණක් සිදු කෙරේ. එබැවින්, අපි කිසිදු ලෙසකින් වෙනස් කොට නොසලකමින් දිවයින පුරා විවිධ පසුබිම් සහ ජනවර්ගවලින් අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය කෙරෙහි බඳවා ගැනීම් සිදු කරමු. රටෙහි විශාලතම වාණිජ බැංකුව වශයෙන්, අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් යම් විශේෂිත ප්‍රදේශයක බහුතර ප්‍රජා සංකේන්ද්‍රණයෙන් බඳවා ගැනීමට හැකි වී ඇත. ඔවුන් දේශීය ප්‍රජාවන්ගේ අපේක්ෂාවන් අවබෝධ කර ගන්නා බැවින් සහ ගනුදෙනුකාර අවශ්‍යතා සහ ඉල්ලුම සපුරාලීමට වඩා හොඳින් සමත්වන බැවින් බැංකුව සමඟ සමීප සම්බන්ධතා සහ ඉහළ බැඳීම් නිර්මාණය කරයි. මෙය දේශීය ප්‍රජාවන් සමඟ වඩා ගැඹුරු සම්බන්ධතා පෝෂණය කිරීමට අපට උපකාරී වන අතරම, ආගමික, සංස්කෘතික, සහ ජනවාර්ගික විවිධත්වය සඳහා අපගේ සහජ බැඳීයාව වැඩි කරනු ලබයි. එමෙන්ම මෙය ප්‍රජාවක් තුළ වඩාත් අවශ්‍ය සමාජ සත්කාරක (CSR) වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී බැංකුවට උපකාරී වී ඇත. ඊට අමතරව, අපගේ ආයතනික කළමනාකාරිත්වය දේශීය වශයෙන් බඳවා ගන්නා අතර, බැංකුවේ සාර්ථකත්වයට බැඳියාවෙන් සහ කැපවීමෙන් දායක වේ.

කුසලතා පූර්ණ ශ්‍රම බලකාය රඳවා ගැනීම

2024 පළමු අර්ධය තුළ සිදු වූ බුද්ධි ගලනය සහ ගෝලීය සංක්‍රමණය හේතුවෙන් දක්ෂයින් රඳවාගැනීම අපගේ සාර්ථකත්වය කෙරෙහි තීරණාත්මක සාධකයක් විය. වැටුප් හා ප්‍රතිලාභ පැකේජ පුළුල් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම, උපකාර අවශ්‍යවන අයට සහයවීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීනයින් සේවයේ යොදවන ලද සේවක මානසික සෞඛ්‍ය ඒකකයක් නිර්මාණය කිරීම, ධනාත්මක වැඩ පරිසරයක් නිර්මාණය කිරීම යන කරුණු හේතුවෙන් හැරයාමේ ප්‍රවනතා අවහිර කිරීමටත් සහ මානව ප්‍රාග්ධනය ගොඩ නැගීමටත් දායක විය. ද්විත්ව මාර්ගික කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම ප්‍රධාන ජයග්‍රහණයක් වූ අතර, එහිදි සේවකයින්ට ඔවුන්ගේ කාර්යසාධනය සම්බන්ධයෙන් සහ පුහුණුව සහ සංවර්ධනය සඳහා හඳුනාගත් ක්ෂේත්‍ර සම්බන්ධව ඔවුන්ගේ අධීක්ෂකයින් සමඟ අර්ථවත් සාකච්ඡා පවත්වා ගැනීමට අවස්ථාව සලසා දී ඇත. මෙම ක්‍රියාවලිය ආරම්භයේදී යම් ප්‍රමාණයක අකැමැත්තක් ලැබුනද, අවසානයේදී එය සඳහා ඉහළ පිළිගැනීමක් ලද බව වාර්තා කිරීම අපට සතුටකි. සේවක පුහුණුව සහ සංවර්ධන අවස්ථා කුසලතා පූර්ණ සේවකයින් රඳවා ගැනීමට සහ අනාගතය වෙනුවෙන් මානව සම්පත ගොඩ නැගීම කෙරෙහි තීරණාත්මක සාධකයක් විය.

සේවක පුහුණුව සහ සංවර්ධනය

GRI 404-1, 2

බැංකුකරණය, අවදානම් කළමනාකරණය, දූෂණ විරෝධී, වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව, අනෙකුත් මෘදු කුසලතා සංවර්ධනයේ සැම අංගයක්ම ආවරණය කරන පරිදි මනාව ව්‍යුහගත කරන ලද පුහුණු දින දර්ශනයක් වසර පුරා ක්‍රියාත්මක කරන ලදී. සේවකයෙකුට සාමාන්‍ය පුහුණු පැය ගණන ආසන්න වශයෙන් පැය 26ක් වූ අතර සමුච්චිත පිරිවැය රු. මිලියන 121.5ක් විය. සම්පූර්ණයෙන් පුහුණු පැය 196,755ක් අභ්‍යන්තරව, මාර්ගගතව, සහ ඩිජිටල් ආකාරයෙන් ආවරණය කරන ලදී. බාහිර පුහුණු වී සඳහා සුදුසුකම්ලත් සම්පත් දායකයින් විසින් ලබාදෙන ලද අතර, ජාත්‍යන්තර වෙළෙඳාම, නීතිය, අවදානම් කළමනාකරණය සහ භාණ්ඩාගාර අංශයට අදාළ විදේශීය පුහුණු ලබාදුන් අතර එමගින් අනාගතයට යෝග්‍ය සේවක සංඛ්‍යාවක් ගොඩ නැගීමට අවස්ථාව සැලසේ. වේතන, උසස්වීම්, සහ වෙනත් ප්‍රතිලාභ සලකා බැලීමේදී සේවක පුහුණුව සහ සංවර්ධනය ප්‍රධාන විෂයයක් වූ අතර, එය අපගේ සේවකයින්ගේ අභිප්‍රේරණය සහ සක්‍රීයතාව වැඩි දියුණු කරනු ලබයි.

පුහුණු දින දර්ශනය

පුහුණු වැඩසටහන්	වැඩසටහන් ගණන	සහභාගිවවූවන් ගණන	පැය ගණන
අභ්‍යන්තර පුහුණු	479	23,436	187,099
බාහිර පුහුණු	101	515	8,912
විදේශීය පුහුණු	11	21	744
එකතුව	591	23,972	196,755

රු.මි. 121.5 – සේවක පුහුණු සඳහා ආයෝජනය

එක් සේවකයෙකුට ආසන්න වශයෙන් පැය 26ක සාමාන්‍ය පුහුණු පැය ගණන

35,287 – ඩිජිටල් පුහුණු පැය ගණන

27 – මාර්ගගත පුහුණු සැසි

සේවක වර්ගය අනුව සේවක පුහුණුව

සේවක වර්ගය අනුව සාමාන්‍ය පුහුණු පැය	සාමාන්‍ය පුහුණු පැය	
	පිරිමි	ගැහැණු
ආයතනික කළමනාකාරිත්වය	51	81
විධායක කළමනාකාරත්වය	54	49
නිලධාරීන් (3 – III – ශ්‍රේණිය 1)	32	29
මාණ්ඩලික සහකාර	22	22
ගනුදෙනුකාර සේවා සහකාර	45	39
කළමනාකරණ අභ්‍යාසලාභීන්/ තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්	54	58

2022-2024 සඳහා අපගේ උපායමාර්ගික සැලැස්ම තුළ දක්වා ඇති පරිදි, ගනුදෙනුකාර කේන්ද්‍රීයතාව, අවදානම් කළමනාකරණය, අනාගතය සඳහා සූදානම්වීම සහ මෙහෙයුම් විශිෂ්ඨත්වය පිළිබඳ අවධානය යොමු කරමින් බැංකුවේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සේවක පුහුණු පාසල කැපවී සිටී. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මාර්ගගත සහ ඩිජිටල් ඉගෙන්වීම් විශාල වශයෙන් දායක වන අතර, එය අපගේ සියලුම සේවකයින් තුළ ඩිජිටල් හැකියාව වැඩි දියුණු කරයි. සැලසුම්කළ පරිදි, ගනුදෙනුකාර කේන්ද්‍රීය මානසිකත්වය, පැමිණිලි කළමනාකරණය, සාකච්ඡාමය කුසලතා සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය, පුද්ගල පිළිවෙලභාවය හැඩගැන්වීම, සමාජ හා ආයතනික ආචාර ධර්ම, ආතති කළමනාකරණය සහ උපදේශන කුසලතා, උපායමාර්ගික සැලසුම් කිරීම, මෙන්ම නිලධාරී ශ්‍රේණි සඳහා ඩිජිටල්, ණය, උකස්, භාණ්ඩාගාර කටයුතු සහ විදේශ මුදල් නිමැවුම්, විගණනය, අනුකූලතා, අවදානම් කළමනාකරණය, සහ ලින් (Lean) කළමනාකරණය ඇතුළත් තාක්ෂණික කුසලතා සංවර්ධන වැඩසටහන් ඇතුළත් වන පරිදි මෘදු කුසලතා සහ පුද්ගල සංවර්ධනය කෙරෙහි අපි අවධානය යොමු කරමු.

වේතන හා ප්‍රතිලාභ

GRI 401-2

ව්‍යුහගත මට්ටම්න් සැමට අදාළ වන පරිදි සේවකයින්ගේ කුසලතා මට්ටම, ආකල්ප, සහ තාක්ෂණික පුහුණුව මත පදනම් වී මූල්‍යමය සහ මූල්‍යමය නොවන ප්‍රතිලාභ රාශියක් බැංකුව පිරිනමයි. සමාන අවස්ථා පිරිනැමීම සහ වෙනස් කොට නොසැලකීමට බැඳී සිටින සේවායෝජකයෙක් වශයෙන්, බැංකුවේ මූලික මැදිහත්වීම වන්නේ සිය මෙහෙයුම්වල තිරසාරභාවය සහ සිය සේවකයින් සඳහා තිරසාර වෘත්තීය හා පුද්ගලික ජීවිත සමතුලිතතාව සහතික කිරීමයි. කාර්යසාධන පාරිතෝෂික ප්‍රතිලාභ බැංකුවේ කාර්යසාධනය මත පදනම් වූ අතර, වැටුප් වර්ධක සැලසුම්කළ පරිදි ගෙවන ලදී. වැටුප් ප්‍රතිශෝධන වරින් වර සහ ක්ෂේත්‍රයේ ව්‍යවහාරවලට අනුකූලව සිදු කරනු ලබයි.

සේවකයින්ට අදාළ නීති සහ රෙගුලාසිවලට අනුව පාරිතෝෂිකය, සේවක අර්ථසාධක අරමුදල් (EPF), සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් (ETF) ගෙවීම් හිමිව ඇත. බැංකුව 2024 මූල්‍ය වර්ෂය සඳහා ETF වෙත රු. මිලියන 530.6ක් සහ EPF වෙත රු. මිලියන 2, 122.4ක් දායක වී ඇත.

ප්‍රතිලාභ	විස්තරය
ජීවිත රක්ෂණය	පුද්ගල අනතුරු රක්ෂණාවරණය
සෞඛ්‍යාරක්ෂාව	වෛද්‍ය ප්‍රතිලාභ සහ මරණ පාරිතෝෂිකය
ආබාධිතභාවය හා ගිලන්වීමේ ආවරණය	ඔව්
කොටස් හිමිකම	නැත
විශ්‍රාම ප්‍රතිපාදන	ඔව්
වෙනත්	වාර්ෂික පාරිතෝෂික දීමනා, යම් ශ්‍රේණිවලට ගමන් වියදම් දීමනා, නිවාඩු නිකේතන, සේවක ණය
මාපිය නිවාඩු	ප්‍රසූත නිවාඩු පමණක් ලබා දේ

ප්‍රසූත නිවාඩු

GRI 401-3

මාපිය නිවාඩු	ගැහැණු
ප්‍රසූත නිවාඩු සඳහා හිමිකම් ඇති සේවක සංඛ්‍යාව	4,736
ප්‍රසූත නිවාඩු ලබා ගත් සේවක සංඛ්‍යාව	655
ප්‍රසූත නිවාඩුවෙන් පසු ආපසු පැමිණි සේවක සංඛ්‍යාව	655
නැවත සේවයට පැමිණීම (%)	100

අපි සේවකයින්ගේ දළ වැටුප වැඩිකළ බැවින් සහ අදාළ කාලයේදී අතිකාල දීමනා ලබාදුන් බැවින් වැටුප් වර්ධනය කිරීම 2024 දී ප්‍රධාන යාන්ත්‍රණයක් වූ අතර, වැටුප් ගෙවීම් තුළ ක්ෂේත්‍රයේ ප්‍රමිතිවලට ඉහළින් සිටීමට පූර්වාදර්ශ සකස් කරන ලදී. වැටුප් හා දීමනා ගෙවීම් මෙහෙයවන පද්ධතියක් ක්‍රියාවට නංවා ඇති අතර, එමඟින් සේවකයින්ට සුදුසු දීමනා ලබාදීමට අදාළ මුද්‍රිත පිටපත ලබා දීම සිදු කෙරේ.

අවම වැටුප් අවශ්‍යතා

GRI 202-1

බැංකු ක්ෂේත්‍රයට ප්‍රවේශවන අදියරේදී රටෙහි අවම වැටුපට සාපේක්ෂව ස්ත්‍රී පුරුෂභාවය අනුව නීතිමය වශයෙන් සම්මත අවම වැටුපක් නොමැත. බැංකුව අවම ප්‍රවේශ මට්ටමේ වැටුප් අනුපාතයට වඩා ඉහළින් වැටුප් ගෙවීම් සිදු කරයි.

වේතන ගෙවීමේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව

GRI 405-2

සේවක වර්ගීකරණ සහ ප්‍රධාන මෙහෙයුම් ස්ථාන අනුව පිරිමින්ට සාපේක්ෂව මූළික වැටුප් සහ වන්දි ගෙවීම්වලදී අපි 1:1 අනුපාතයක් අඛණ්ඩව පවත්වාගෙන ඇත. අපගේ ප්‍රතිපත්ති අනුව සම්පූර්ණයෙන් වෙනස් කොට නොසැලකීම සහ ස්ත්‍රීපුරුෂ සමානාත්මතාව සහතික කරයි.

කෙසේවෙතත්, සේවකයින්ගේ සේවාකාලය සමඟ වැටුප් ශ්‍රේණිවල වෙනස්වීම් හේතුවෙන් වේතන අනුපාතවල වෙනස්වීම් සිදුවිය හැකිය.

ස්ත්‍රී හා පුරුෂයන්ගේ මූලික වැටුප් සහ වේතන අනුපාතය – 2024

වර්ගය	පිරිමි	ගැහැණු
ආයතනික කළමනාකාරිත්වය	1.00	0.86
විධායක කළමනාකාරිත්වය	1.00	0.99
නිලධාරීන් (3 – III – ශ්‍රේණිය 1)	1.00	1.00
මාණ්ඩලික සහකාර ශ්‍රේණි	1.00	1.11
ගනුදෙනුකාර සේවා සහාකාර සහ වෙනත්	1.00	0.95

මෙහෙයුම් වෙනස්වීම් සඳහා වූ අවම දැනුම්දීමේ කාලසීමාව

GRI 402-1

අපගේ සේවකයින්ට බලපෑ හැකි යම් මෙහෙයුම් වෙනස්වීම් පිළිබඳව ප්‍රමාණවත් දැනුම්දීමක් ඔවුන්ට ලබාදීමට අපි කැපවී සිටිමු. සහකම්පනයන් සහිත සේවායෝජකයෙක් ලෙස, අපගේ සේවකයින්ගේ අභිප්‍රේරණය කෙරෙහි ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සහතික කිරීම මෙන්ම ලේසිය සහ පහසුව සමඟ අදාළ වෙනස්වීම්වලට ගැලපීමට ප්‍රමාණවත් තරම් කාලය අපගේ සේවකයින්ට ලබාදීමට අපි අපේක්ෂා කරමු.

මෙහෙයුම් වෙනස්වීම් සඳහා වූ දැනුම්දීමේ කාලසීමාවන් පහත පරිදි වේ:

වෙනසේ වර්ගය	දැනුම්දීමේ කාලසීමාව
ස්ථාන මාරු අභියාචනා	සති 2
ඉල්ලා අස්වීම්	මාස 1
විශ්‍රාම ගැනීම්	මාස 3
සේවය අවසන් කිරීම්	මාස 1-3

වෘත්තීමය සෞඛ්‍ය හා ආරක්ෂාව

GRI 403-2, 3, 4, 5, 6, 7, 9, 10

ආපදා කළමනාකරණය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු සහය සේවා) අධීක්ෂණය යටතේ විශේෂිත ඒකකයක් වන, ගිනි හා ආපදා කළමනාකරණ ඒකකය ආරක්ෂාව සහතික කිරීම වෙනුවෙන් ක්‍රියාත්මකව පවතී. ශාඛා ජාලය හා ප්‍රධාන කාර්යාලයේ දෙපාර්තමේන්තුවල සේවකයින් සඳහා ආපදා තත්වයකදී එක්රැස්වන ස්ථාන වශයෙන් එක් එක් අංශ සඳහා විශේෂිත වූ ස්ථාන වෙන් කර ඇති අතර, ඔවුන් ආපදා තත්ත්ව වලදී අවශ්‍යවන විශේෂ ආරක්ෂිත ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණු කරන ලදී.

අනතුරුදායක සිදුවීම් හඳුනා ගැනීම, අවදානම් තක්සේරු කිරීම, සහ සිදුවීම් විමර්ෂණය කිරීම දෙපාර්තමේන්තුව භාර නිලධාරියා වගකිව යුතුවේ. ආපදා තත්ත්ව වලදී වේගවත්ව ක්‍රියාත්මකවීම සඳහා වරින් වර ප්‍රථමාධාර සම්බන්ධව පුහුණු ලබා දෙන අතර, කාර්යාල පරිසරයේ ආපදා වැලැක්වීම සහ හැසිරවීම පිළිබඳ විශේෂ පුහුණුව 2024 දී සිදුකරන ලදී. කොළඹ ගිනිනිවන සේවා දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් වාර්ෂික ගිනි හා ආපදා පෙරහුරුවක් ද අපි පැවැත්වූයෙමු.

කායික සහ මානසික යහපැවැත්ම

බැංකු සේවකයින්ගේ යහපැවැත්ම වෙනුවෙන් විශේෂිත වූ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇති අතර, යම් සේවකයෙකුගේ කායික හා මානසික සෞඛ්‍ය සේවා ස්ථානයේ තත්ත්වයන් හේතුවෙන් පීඩාවට පත් නොකරන බව ඉන් සහතික කරයි. මෙම විශේෂිත මධ්‍යස්ථානය මානසික සෞඛ්‍යය, යහපැවැත්ම සහ රැකියාවේ සමෘද්ධිය සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් සේවකයින්ට උපදේශනය සැපයීම සඳහා සුදුසුකම් ලත් සහ පළපුරුදු විශේෂඥයෙකු බඳවා ගැනීමෙන් ශක්තිමත් කරමින් විවෘත ප්‍රතිපත්තියකින් පෝෂණය කරන අතර, යහපත් වෘත්තීය-පුද්ගලික ජීවිත සමතුලිතතාවයක් සඳහා පෙරමුණ ගනී.

සේවක යහපැවැත්ම සහ ඵලදායිතාව සේවා ස්ථානය තුළ ආතතිය අවම කරමින් පවත්වා ගන්නා අතර, ඒ තුළින් අනවසර නොපැමිණීම් සහ විභව ආදායම් අහිමිවීම් අවමකර ගනී. යහපත් වෘත්තීය-පුද්ගලික ජීවිත සමතුලිතතාවයක් සාක්ෂාත් කර ගැනීමට සේවකයින් ශක්තිමත් කරමින් යහපත් වැඩ සංස්කෘතියක් පෝෂණය කිරීමේ ක්‍රියාමාර්ග අපි ක්‍රියාත්මක කර ඇත්තෙමු.

අපගේ සේවකයින් සඳහා මානසික යහපැවැත්ම තීරණාත්මක අංගයක් බව හඳුනා ගනිමින්, මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ බාහිර විශේෂඥයින්ගෙන් සැදුම්ලත් ස්වයං සුවතා මධ්‍යස්ථානයක් කළමනාකරණය විසින් ස්ථාපිත කරන ලදී. මෙම මධ්‍යස්ථානය සේවකයින්ට ඔවුන්ගේ චින්තන ක්‍රියාවලීන් හරහා වැඩ කිරීමට උපදේශන ප්‍රතිකාර ලබා දෙන අතර, පසුගිය වසරවල විඳි දුෂ්කරතා හේතුවෙන් ආතතියට සහ අසහනයට පත්ව ඇති බව ද අපි අවබෝධ කර ගත්තෙමු. මෙම මධ්‍යස්ථානය සේවකයින්ගේ අභ්‍යන්තර අරගලවලින් ඔවුන්හට නිදහස් වීමට, ඔවුන්ට තම ආදරණීයයන් සමඟ බෙදා ගැනීමෙන් වැළකී සිටීමට හැකි වන ආරක්ෂිත, සානුකම්පිත සහ සුරක්ෂිත පරිසරයක් ලබා දේ. උපකාර සොයන සේවකයින් සම්බන්ධයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් උපරිම රහස්‍යභාවය සහතික කරනු ලැබේ, කුමන තරාතිරමක හෝ සේවකයෙකුට මෙම සේවාව නොමිලේ ලබාදෙන අතර, කාලය වෙන්කරගැනීම මූලික සැසියේ ප්‍රතිපෝෂණය මත පදනම් වේ.

යෝගා සැසි, Zumba සැසි සහ තවත් බොහෝ සේවක කේන්ද්‍රීය ව්‍යායාම ක්‍රම සැලසිම මගින් ජීවිතයේ යහපත් සමතුලිතතාවයක් ලබා දෙන සංස්කෘතියකට සහාය වෙමින්, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම සඳහා දැනුවත් හා ක්‍රියාශීලීව සිටීමට සේවකයින් දිරිමත් කිරීම සඳහා බැංකුව විසින් ශාරීරික සෞඛ්‍ය සේවා ක්‍රම ද ලබා දී ඇත. සේවක සෞඛ්‍ය හා යහපැවැත්මට නිරවද්‍ය හා සෞඛ්‍ය සම්පන්න ඉරියව් සහ වෙනත් සාධක ප්‍රධාන වන සංස්කෘතියක් තුළ ව්‍යායාම රහිත රැකියා ස්වභාවය හේතුවෙන් ශක්තිමත් මැදිහත්වීමක් අත්‍යවශ්‍ය වේ.

අපගේ වටිනා සේවකයින්ගේ සමස්ත යහපැවැත්ම සහතික කිරීමට ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ නවලෝක වෛද්‍ය මධ්‍යස්ථානයක්, Zumba සැසි, නොමිලේ කායවර්ධන මධ්‍යස්ථාන පහසුකම් සහ යෝගා සැසි අපි සපයා ඇත.

සේවක සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා වැඩ කරන පරිසරය ආරක්ෂිත කලාපයක් බවට පරිවර්තනය කිරීම සඳහා ආරක්ෂාකාරී සහ පහසු (ergonomic) ගෘහ භාණ්ඩ, යහපත් ආලෝකකරණය සහ අනෙකුත් විධිවිධාන සැලසිමට අපි උත්සාහ දරන බැවින්, මිනිස්-යන්ත්‍ර අතුරුමුහුණතේ භෞතික මානයන් ශක්තිමත් කිරීම සඳහා ආරක්ෂක සහ පහසු භාවිතයන් අත්‍යවශ්‍ය එකතු කිරීමකි. ආරක්ෂක සහ පහසු සේවා මානයන් (ergonomics and dimensions) සේවක සෞඛ්‍ය, සහ රැකියාව පිළිබඳ උද්යෝගය ඇති කිරීමට ප්‍රධාන නිර්ණායක වන අතර, තවද සේවා ස්ථානය තුළ අගය කිරීමේ හැඟීම යමෙකුගේ විශ්වාසය වැඩි කිරීම සඳහා වර්තමානයේ ප්‍රධාන සාධකයක් ද වේ.

යහපත් සෞඛ්‍ය සහ කාර්යසාධනය සඳහා නවීන උපායක් වන නිසි අවබෝධය (mindfulness) හඳුන්වාදීමත් සේවා දිනදර්ශනය තුළට ඒකාබද්ධ කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් අනුමත කිරීමක් සිදුකර ඇත. මානව සම්පත් කණ්ඩායම අපේක්ෂා කරන නිසි අවබෝධය රැකියාවේ කාර්යසාධනය වර්ධනය කරන අතර, සේවකයින් ප්‍රජාවකගේ ජීවිත සුරක්ෂිතතාව සමඟ ස්ථිරව කටයුතු කරමින් සිටින ඉහළ ආතතිමය පරිසරයක යහපත් මානසික සෞඛ්‍ය සහතික කරයි.

ආරක්ෂිත සේවා ස්ථානයක් සඳහා අවශ්‍යතාව පිළිබඳ දැනුවත්භාවය ගොඩ නැඟීමට සහ ඉගැන්වීම සඳහා සේවකයන් 730ක සහභාගිත්වයෙන් අපි ව්‍යාපාර අඛණ්ඩතාව, ආපදා කළමනාකරණය, සේවා ස්ථාන ගිනි අවදානම් පිළිබඳ පුහුණු සැසි 13ක් පැවැත්වූයෙමු.

රු. මිලියන 2,896ක් වෛද්‍යාධාර ගෙවීම් සිදුකර ඇති අතර, වැඩ ආශ්‍රිත තුවාලවීම්/ආපදා 29ක් වාර්තා විය. වැඩ ආශ්‍රිත රෝග පිළිබඳව 2024 දී වාර්තා වී නොමැත.

වෘත්තීමය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ පුහුණුව

වැඩසටහන	සහභාගිවූවන් ගණන	සහභාගිවූවන්
බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම, ආපදා කළමනාකරණ සැලසුම්, වෘත්තීමය සෞඛ්‍ය හා ආරක්ෂාව	11	723
ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය	1	3
සේවා ස්ථාන ගිනි හා ආරක්ෂාව පිළිබඳ සැසි	1	4
එකතුව	13	730

කාර්යසාධන කළමනාකරණය

GRI 404-3

අපගේ මානව ප්‍රාග්ධනය පෝෂණය කිරීමේදී සැලකියයුතු ජයග්‍රහණයක් වූයේ ද්විත්ව-මාර්ගික කාර්යසාධන කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීමයි. ඒ මගින් සේවකයින්ට නියමිත මූලික කාර්යසාධන දර්ශක මත පදනම්ව කාර්යසාධනය ඇගයීමේදී ඔහුගේ හෝ ඇයගේ අධීක්ෂක සමඟ සෘජුවම සාකච්ඡාවක නිරත විය හැකිය. මානව සම්පත් දෙපාර්තමේන්තුව මූලික අවස්ථාවේදී සියලුම සේවකයින්ට සහය ලබා දෙන අතර, එහි ප්‍රතිඵල පිළිබඳ අපි සතුටු වෙමු. ජාත්‍යන්තරව පිළිගත් කාර්යසාධන ඇගයීම් ක්‍රම සමඟ බැංකුව පෙළ ගැස්වීමේදී මෙය අපගේ මානව සම්පත් මෙවලම් කට්ටලයේ අනිවාර්ය අංගයක්ව තවදුරටත් පවතිනු ඇත. 2024 දී, බැංකුවේ සේවකයින්ගෙන් 100%ක් වාර්ෂික කාර්යසාධන ඇගයීමට ලක්කර ඇත.

උසස්වීම් හා ස්ථානමාරු

විනිවිදභාවය සහතික කරන සහ සෑම ශ්‍රේණියකටම අනුකූලව ව්‍යුහගතකර ඇති විධිමත් උසස්වීම් සහ ස්ථානමාරු ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත. ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටම දක්වා සියලුම උසස්වීම් ලිඛිත විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් සමඟ සිදු වේ. සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් තුළින් විධායක, ආයතනික කළමනාකාරිත්වය සහ වෙනත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය දක්වා උසස්වීම් පිළිබඳ තීරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරනු ලබයි. බොහෝ ශ්‍රේණි සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම් දක්වා උසස්වීම් සාමාන්‍යයෙන් පුරප්පාඩු ඇති වූ අවස්ථාවල පැන නගී.

ස්ථානමාරුවීම් වර්තමාන සහ/හෝ පිටත ප්‍රාදේශිකයන් තුළට සිදු කරනු ලැබේ. එහි යම් අතෘප්තිමත්වීමක් වන විටක සඳහා ස්ථානමාරු ප්‍රතිපත්තිය යටතේ ස්ථාපිත අභියාචනා කමිටුව වෙත යොමු කෙරේ.

අනුප්‍රාප්තික සැලැස්ම

විධායක සහ ආයතනික කළමනාකරණ වර්ගීකරණ ක්ෂේත්‍රවල නායකත්වය පිළිබඳ ඉදිරි පරම්පරාවේ නායකත්වය ගොඩ නැගීම බැංකුවේ තිරසාරභාවය සඳහා අතීශයින් වැදගත් වේ. උපායමාර්ගිකව සකස්කළ සහ අනුමත කළ අනුප්‍රාප්තික සැලැස්ම මෙවැනි ජ්‍යෙෂ්ඨ භූමිකාවන් සඳහා ක්‍රියාත්මකව පවතී. කළමනාකරු සහ ඉහළ ශ්‍රේණිවල සේවකයින් සඳහා විශේෂයෙන් සැලසුම්කළ අනුමත සේවක සැලැස්මක් ද ක්‍රියාත්මකව පවතින අතර එය 2024 දී පුළුල් කිරීමේ සැලසුම් සමඟ ක්‍රියාත්මක කරන ලදී. තවද, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (KMP) තනතුරු සඳහා ඉදිරි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා විධායක සංවර්ධන වැඩසටහන් සහ නායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන් බැංකුව පවත්වනු ලබයි.

වෙනස් කොට සැලකීමේ සිදුවීම් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග

GRI 406-1

මහජන බැංකුවට ක්ෂේත්‍රය තුළ ඉහළම කාන්තා සේවක සංඛ්‍යාවක් සතුවන අතර, ඉන් බැංකුවේ වෙනස් කොට නොසැලකීමේ ප්‍රතිපත්තිය පිළිබිඹු කරයි. කාන්තා සේවිකාවන් 62%ක් සහිත දීප ව්‍යාප්ත ආයතනයක් ලෙස, බැංකුව සිය කාන්තා සේවිකාවන්ගේ වෘත්තීය-පුද්ගලික ජීවිත සමතුලිතතාව සම්බන්ධයෙන් වන අභියෝගවලට උපකාර කරයි. භෞතික හා මානසික වශයෙන් හිරිහැරකිරීමේ තහනම් වන අතර, ඒ සම්බන්ධ යම් උත්සාහ කිරීම් දැඩි විනය ක්‍රියාමාර්ගයකට හේතු වනු ඇත. අපගේ ක්‍රියාවලි ඩිජිටල් වේදිකා බවට අපි පරිවර්තනය කරන බැවින් මෙය භෞතික සහ අතත්‍ය අවකාශයන් සඳහා ද අදාළ වේ.

2024 වසර සඳහා, අපගේ ශාඛා ජාලයේ සහ ප්‍රධාන කාර්යාලයෙන් කිසිදු හිරිහැරකිරීමක් සම්බන්ධ පැමිණිලි ලැබී නොමැත. මහජන සුහසාධනය මූලිකම පරමාර්ථය ලෙස, අපගේ මානව ප්‍රාග්ධනයේ සුහසාධනය සඳහා සැලකිල්ලක් දැක්වීම සඳහා අපගේ සේවා ස්ථානයේ විය ප්‍රථමයෙන් යොදවන්නෙමු.

සාමූහික කේවල් කිරීම

බැංකුව සේවක අයිතියක් වන වෘත්තීය සමිති සමඟ සහයෝගී ක්‍රමවේදයක් යොදා ගන්නා අතර, ඔවුන්ගේ අදහස් සහ යෝජනාවලට ගරු කරයි. වර්තමානයේ සේවකයින් අතරින් 7,253ක සාමාජිකත්වය සහිත වෘත්තීය සමිති හයක් ඇත.

සේවක සමිතිය	සේවකයින් ගණන
ලංකා බැංකු සේවක සංගමය	5789
නිලධාරී සංගමය	247
ශ්‍රී ලංකා නිදහස් බැංකු සේවක සංගමය	25
ජාතික සේවක සංගමය	106
සමස්ථ ලංකා බැංකු සේවක සංගමය	21
ප්‍රගති බැංකු සේවක සංගමය	1,065
එකතුව	7,253

මානව හිමිකම්, ළමා ශ්‍රමය හා බලහත්කාර ශ්‍රමය

GRI 408-1, 409-1

අපි, අපගේ රටේ උත්තරීතර නීතිය තදින්ම පිළිපදින්නෙමු. අප රටේ මානව හිමිකම් ආරක්ෂා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙන්ම 1948 දී එක්සත් ජාතීන්ගේ මහ සභාව විසින් සම්මත කරන ලද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය (UDHR) වෙනත් යම් බාහිර සාධක නොසලකා සෑම පුද්ගලයෙකුගේම අහිමිකළ නොහැකි අයිතිවාසිකම් පිළිබඳව ප්‍රකාශ කරයි.

අපි මානව හිමිකම් ආරක්ෂා කිරීම සහතික කරන අතර, සියලුම දෙනාගේ පවිත්‍ර අයිතිවාසිකම් තහවුරු වෙන ආකාරයෙන් අපගේ ව්‍යාපාර පවත්වන බව අපි සහතික කරමු.

අපි ළමා ශ්‍රමය හෝ බලහත්කාර ශ්‍රමය ලබාගැනීමක් හෝ ඒ සඳහා අනුබල දීමක් හෝ සිදුකර නොමැත.

අභියෝගය

අපගේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ බඳවාගැනීම් තුළ පළපුරුදු, දැනුම සහිත, සහ ඵලදායී තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් බඳවා ගැනීම අප මුහුණපාන අභියෝගයකි. ලබාගත හැකි වෘත්තිකයින් රාජ්‍ය ආයතනයක් ලෙස අපට ගැලපිය නොහැකි වේතනයක් ඉල්ලා සිටී.

අනාගත දැක්ම

තොරතුරු තාක්ෂණ හැකියාව ඇති අය බඳවා ගැනීම සහ ඩිජිටල් තාක්ෂණයේ ධාරිතාව ගොඩ නැගීම ප්‍රමුඛතාවක් වනු ඇත. මේ සමඟම, අපගේ මානව ප්‍රාග්ධනයේ නිසි අවබෝධය සහ මානසික සෞඛ්‍ය පිළිබඳ අපි අවධානය යොමු කර ඇති අතර, මෙම ක්ෂේත්‍රය මනාව කළමනාකරණය කර ගැනීමට සහ තිරසාර වෘත්තීය-පුද්ගලික ජීවිත සමතුලිතතාව පවත්වා ගැනීමට අවශ්‍ය මෙවලම් සහ ප්‍රවීනතාවයෙන් ඔවුන්ට සහය වන්නෙමු.

සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

ගනුදෙනුකාර ප්‍රාග්ධනය

විශ්වාසය, පක්ෂපාතීත්වය සහ තෘප්තිය මත ගොඩ නැගෙමින්, අපගේ ගනුදෙනුකාර ප්‍රාග්ධනය සමඟ අප ගොඩ නගාගෙන ඇති සම්බන්ධතා අපගේ කල්පැවැත්ම සහ ඵලදායිත්වය මත සෘජු බලපෑමක් ඇති කරයි. සමාජීය ව්‍යූහයන් කිහිපයක් ඇතුලත්ව කරන විශාල වශයෙන් විවිධ ගනුදෙනුකාර ප්‍රාග්ධනයක භාරකරුවන් වීමට අපි වරප්‍රසාද ලබා ඇත.

සුවිශේෂී අවස්ථා

- පුද්ගලික අංශයේ නව ආයතනික ගනුදෙනුකරුවන් 100ට අධිකය
- සම්බන්ධ වූ නව ගනුදෙනුකරුවන් 640,120 (වෙනත් අංශ)
- ගනුදෙනුකාර පැමිණිලි විසඳීම 91.62%
- ඩිජිටල් විසඳුම් ලියාපදිංචිවීම් මිලියන 4.4කි
- ගනුදෙනුකරුවන්ගෙන් 51.2% කාන්තාවන් වීම

අපගේ ප්‍රවේශය

බැංකු ක්ෂේත්‍රය අඛණ්ඩව වෙනස්වන බැවින්, පුද්ගලික අංශයේ ආයතන ඇතුළත් කර ගනිමින් ගනුදෙනුකාර ප්‍රාග්ධනය පුළුල් කර ගැනීමට අපේක්ෂිත විකෘණුම් ක්‍රියාමාර්ගයක් මත ගොඩ නැගීමට අපගේ සුපිරි ඩිජිටල් හැකියාවන් සහ ලීන් කළමනාකරණ ව්‍යූහයන් අපි යොදා ගන්නා අතර, පවත්නා ගනුදෙනුකරුවන්ට වටිනාකම ලබාදීම තවදුරටත් කරගෙන යන්නෙමු. ජංගම උපාංග මත ඇඟිලි තුඩු බැංකුකරණය සාම්ප්‍රදායික ක්‍රම අභිබවා යන බව පෙනෙන බැවින්, සාම්ප්‍රදායික බැංකුකරණය වේගයෙන් පසුබාමින් පවතින අතර, සිය අරමුදල් කළමනාකරණය කිරීමේ පහසුව කෙරෙහි අවධානය යොමු කරන අපගේ ගනුදෙනුකරුවන්ගේ වෙනස් වන සහ හදිසි අවශ්‍යතාවලට ගැලපෙන පරිදි, අපි ඔවුන් වෙත පිරිනමන අපගේ නිෂ්පාදන හා සේවා සකස් කරන්නෙමු.

වැදගත් තේමා

මූල්‍ය කාර්යසාධනය

පාරිභෝගික අත්දැකීම්

මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ඩිජිටල් හැකියාව

කුසලතා කළමනාකරණය

සමාජ-ආර්ථික බලපෑම

සන්නාම හිමිකම

ගනුදෙනුකාර ප්‍රවේශය

සෞඛ්‍ය හා ආරක්ෂාව

අවස්ථා | **අභියෝග** | **නිර්මාණය කළ වටිනාකම**

- පුද්ගලික අංශයේ ආයතන ඇතුළත් කර ගැනීමට ගනුදෙනුකාර පැවැත්ම පුළුල් කරන ලදී.
- GenZ ගනුදෙනුකාර අංශ ග්‍රහනය කර ගැනීමට දැඩිකළ ඩිජිටල් හා තාක්ෂණික හැකියාවන්.
- ශක්තිමත් කළ සන්නාම.

- ආර්ථික අපහසුතා හමුවේ ගනුදෙනුකරුවන් ජීවනෝපාය නඩත්තුව කෙරෙහි අවධානය යොමු කළ බැවින්, අලෙවිකරණ සන්නිවේදනය පිළිබඳ අපේක්ෂිත පණිවිඩය යටපත් කර ඇත.
- ඉහළ පොලී අනුපාත වසරේ පළමු කොටසේදී ණය දීම කෙරෙහි අඛණ්ඩව බලපාන ලදී.
- දැඩි නියාමන ක්‍රියාමාර්ග වෙළෙඳපොල විනිවිදභාවය සඳහා ආක්‍රමණශීලී අලෙවි ක්‍රම සීමා කරන ලදී.

ලාභදායිතාව
රු. බිලියන 25.08

2024 දී නිකුත් කළ නව ණය කාඩ් 23,960

ණයදීම
රු. බිලියන 763.4

ප්‍රාග්ධන සම්බන්ධතා

මූල්‍ය ප්‍රාග්ධනය

ප්‍රේෂණ වෙළෙඳපොල කොටස වැඩිවීම, ඩිජිටල්කරණය සහ නව ගනුදෙනුකාර අංශවලට විවෘතවීම විශිෂ්ට මූල්‍ය කාර්යසාධනයට හේතු විය.

මානව ප්‍රාග්ධනය

දක්ෂයින් කළමනාකරණය සහ ගෙවීම් හා දීමනා කුසලතා කලමනාකරණ පැකේජය උසස් කිරීම ගනුදෙනුකාර තෘප්තියට දායක වෙමින් වැඩිකල සේවා තත්ත්වයක් ලබාදීමට හේතු විය.

බුද්ධිමය ප්‍රාග්ධනය

තාක්ෂණික හා ඩිජිටල් නව්‍යකරණ නව ගනුදෙනුකාර අංශ ආකර්ෂණය කළ අතර, පවත්නා ගනුදෙනුකරුවන්ගේ පක්ෂපාතිත්වය සහතික කරන ලදී.

නිෂ්පාදන ප්‍රාග්ධනය

ඩිජිටල්කරණය තුළ ආයෝජන සහශ්‍ර හා GenZ පරම්පරාවේ අපේක්ෂාවන්ට අනුකූලව නව ගනුදෙනුකාර අත්දැකීමක් ලබා දේ.

ස්වභාවික ප්‍රාග්ධනය

ඩිජිටල්කරණය සහ හරිත ගොඩනැගිලිවල ප්‍රතිඵලයක් ලෙස අඩුකළ කඩදාසි භාවිතය, ස්වභාවික ප්‍රාග්ධනය සංරක්ෂණය කිරීමට දායක විය.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය

දිළිඳුකම පිටු දැකීම

බැංකුවේ මූල්‍ය අන්තර්කරණ පිළිබඳ ප්‍රතිපත්තිය ව්‍යාපාර සහ පුද්ගලික වර්ධනය සඳහා මූල්‍ය ප්‍රවේශය තුළින් දුර්දෘතාවයෙන් මිදීමට සියලුම ගනුදෙනුකරුවන් සවිමත් කරයි.

විෂමතා අඩු කිරීම

බැංකුව කිසිදු ජන විකාශ පදනමක් මත පදනම්ව කිසිදු පුද්ගලයෙකුට වෙනස් කොට සැලකීමක් සිදු නොකරන අතර, සෑම පුද්ගලයෙකුටම මූල්‍ය සේවා සඳහා ප්‍රවේශන පහසුකම් හරහා සමාජ අසමානතාවය අඩු කිරීමට සහය දක්වයි.

ගනුදෙනුකාර පැතිකඩ

සිය මූලික පරමාර්ථය ලෙස මහජන සුභසාධනය සමඟ, බැංකුවේ මිලියන 15.1 ක ගනුදෙනුකාර පදනමෙන් 79.9% ක් උප නගර සහ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන අතර, එම ප්‍රදේශවල අපගේ සන්නාමය මනාව ස්ථාපිතව ඇත. මුළු පදනමෙන්, 51.2ක් කාන්තාවන් වන අතර 57.5%ක් සහශ්‍ර සහ GenZ වර්ගීකරණවලට අයත් වේ.







බෙදාහැරීම සහ සේවා මාර්ග

දිවයින පුරා පැවැත්ම

බෙදාහැරීමේ ශාඛා කටයුතු කළමනාකරණය ශුද්ධ ලාභය තුළ රු. බිලියන 25කට හේතු වූ අතර, එය බැංකු ඉතිහාසය තුළ අත්කරගත් ඉහළම ලාභ ආන්තිකය වේ. අපේක්ෂිත මට්ටමේ ගුණාත්මකභාවයක් සමඟ අපගේ ගනුදෙනුකරුවන්ට සේවය කිරීමට, අපි අපගේ සේවකයින්ගෙන් කුසලතා නැවත උසස් කළ අතර, වර්ධනයන් පෙරමුණු ගැන්වීම සඳහා සේවා තත්ත්වය පිළිබඳ පවත්වන ලද ගනුදෙනුකාර අත්දැකීම් සමීක්ෂණ 3ක් සමඟ අපගේ මෙහෙයුම් ක්‍රියාවලි නැවත සකස් කර ඇත. අපි දිවයින පුරා ශාඛා 355ක් සහ සේවා මධ්‍යස්ථාන 396ක් ක්‍රියාත්මක කරමු.

ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණය

ගනුදෙනුකරුවන් සිය බැංකු අවශ්‍යතා සම්බන්ධයෙන් මිලදී ගැනීමේ පෙරමුණ මත ප්‍රතිචාර දක්වන ආකාරය අනුව ඉදිරියේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණය පදනම් වේ. ඉහළ ගනුදෙනුකාර අත්දැකීම ශ්‍රේණිගතකිරීම් සහිත වඩාත් තෘප්තිමත් ශාඛා නිසි කාර්යසාධනය පදනම් පිළිගැනීම් සහ ප්‍රසාද දීමනා ලබාදෙන බව සමීක්ෂණයෙන් අනාවරණය කර ඇත. පළමු හැඟීම, නිරීක්ෂණ සමීක්ෂණ සහ වෙනත් සේවා පරාමිති ගනුදෙනුකාර අත්දැකීම පිළිබඳ ශාඛා ශ්‍රේණිගත කිරීමට සහ ගනුදෙනුකාර සේවා තත්ත්වය වැඩි කිරීමට යොදා ගනී. ලේඛණ කළමනාකරණ ප්‍රතිපත්තිය, ගනුදෙනුකාර ආරක්ෂක ප්‍රතිපත්තිය, අන්තර්ගත කළමනාකරණ ප්‍රතිපත්තිය සහ වැඩසටහන් කළමනාකරණ ප්‍රතිපත්තිය මෙහෙයුම් විශිෂ්ටත්වය ඉදිරියට ගෙන යන ලක්ෂණ වේ. ගනුදෙනුකාර රහස්‍යතාව සහ දත්ත ආරක්ෂාව අපගේ මෙහෙයුම් වාතාවරණය තුළ තීරණාත්මක වන අතර, එය මෙම වාර්තාවේ පිටු අංක 104 තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් බැංකුකරණ කොටස තුළ විස්තර කෙරේ.

තත්‍ය කාලීන ගනුදෙනුකාර සන්නිවේදනය

අපි සන්නාමය, නිෂ්පාදන සහ ඩිජිටල් යෙදුම් ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම පිළිබඳ දැනුවත් කිරීම සඳහා සන්නිවේදනය බෙදාහරිමින් මූල්‍ය සාක්ෂරතාව ඇති කිරීමට පියෝ ටීවී (Peo TV) නාලිකාව සමඟ අපගේ ප්‍රධාන ශාඛා සහ සේවා මධ්‍යස්ථානවල වාතාවරණය උසස් කරන ලදී.

පහසුව සඳහා ස්වයං බැංකුකරණ ඒකක

ස්වයං බැංකුකරණ ඒකක ලෙස kiosks යන්ත්‍ර යොදා මුදල් ආපසු ලබාගැනීම, තැන්පත් කිරීම සහ බිල්පත් ගෙවීමට පහසුකම් ලබා දේ. චෙක්පත් තැන්පත් කිරීමට පහසුකමක් ද ක්‍රියාත්මක කරයි. ස්වයං බැංකුකරණ ඒකක 307ක් ශාඛා ජාලය තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මකය.

24x7 ඇමතුම් මධ්‍යස්ථානය

පහසු බැංකුකරණ කටයුතු සඳහා අපගේ ගනුදෙනුකරුවන්ට සහයවීමට සහ උපකාර කිරීමට ත්‍රිභාෂාත්මක ඇමතුම් මධ්‍යස්ථාන පැය 24x7 ක්‍රියාත්මක වේ.

ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණය

ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණය අනිවාර්ය අවශ්‍යතාවක් වන අතර, ගනුදෙනුකාර සේවා මෙහෙයුම් ඒකකයේ අධීක්ෂණය යටතේ ඵලදායී ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණ පද්ධතියක් අපි අඛණ්ඩව ක්‍රියාත්මක කරමු. පැමිණිලි ගොනු කිරීම සඳහා පැය 24 තුළම හදිසි ඇමතුම් ලබාගත හැකි අතර, එය විනිවිදභාවය, කඩිනම්බව සහ විශ්වාසනීයත්වයෙන් මෙහෙයවනු ලබයි. ඔවුන්ගේ ගැටළු සතුටුදායක අයුරින් විසඳීමට බැංකුව අපොහොසත් වුවහොත්, ගනුදෙනුකරුවෙකුට ගැටළුව මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු කළ හැකිය. 2024 දී එවැනි සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැති බව සඳහන් කිරීම අපට සතුටකි. 2025 දී ප්‍රධාන කළමනාකරුවෙකුගේ මඟපෙන්වන අධිකාරිය යටතේ පැමිණිලි සඳහා ස්වාධීන ඒකකයක් අපි ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන්නෙමු.

කාර්යය නිවැරදි කිරීම සහ වැලැක්වීම සඳහා ශාඛා කළමනාකරුවන්ගේ සම්මන්ත්‍රණයේදී මාසික වාර්තාවක් සභාගත කරනු ලැබේ.

ගනුදෙනුකාර පැමිණිලිවල තත්ත්වය – 2024

විස්තරය	ගණන
ලැබුණු ගනුදෙනුකාර පැමිණිලි ගණන	191
විසඳා ඇති ගනුදෙනුකාර පැමිණිලි ගණන	175
විසඳීමට ඇති පැමිණිලි	16
විසඳීමට ඇති විමර්ශන	4
නීතිමය කටයුතු සිදුකරමින් පවතින නඩු	-
ක්‍රියාත්මක වෙමින් පවතින	12

ගනුදෙනුකාර සෞඛ්‍ය සහ ආරක්ෂාව

GRI 416-1

අපගේ සියලුම ගනුදෙනුකාර සම්බන්ධතා ස්ථාන ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සහතික කිරීමට සැලසුම් කරන අතර, ගිනි පිටවීම්, ගිනි නිවීමේ යන්ත්‍ර, සහ දුම් සංවේදී සයිරන් නළාවලින් සමන්විත වේ. ආයුධ සහිත සහ රහිත ආරක්ෂක පිරිස් ස්ථානවල සිටින අතර, සවිකිරීම් ක්‍රියාත්මකව පවතින්නේද යන්න සහතික කර ගැනීමට වරින් වර පරීක්ෂා කිරීම් සිදුකරනු ලැබේ. අපගේ ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සහතික කිරීමට අපි ඉහළම පරීක්ෂාවෙන් කටයුතු කරන අතර, අපගේ පරිශ්‍ර පවත්වා ගැනීමට බලගන්වා ඇති සියලුම නියාමන සහ නෛතික ක්‍රියාමාර්ගවලට අපි අනුකූල වෙමු.

අලෙවිකරණය හා ලේබල්කරණය

GRI 417-1, 2

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනුකාර ප්‍රතිඥාවේ අවශ්‍යතාවන්ට අපි මුළුමනින්ම අනුකූල වෙන අතර, අපගේ ගනුදෙනුකරුවන්ට අපගේ නිෂ්පාදන හා සේවා සම්බන්ධයෙන් නිවැරදි, කාලීන, සහ නිසැක දත්ත භාෂා තුනෙන්ම (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) ලබා දේ. නියමයන් සහ කොන්දේසි මෙන්ම අපගේ නිෂ්පාදන හා සේවා තක්සේරු කිරීමේදී බැංකුව වෙත ගනුදෙනුකරුවන්ගේ වගකීම ද මෙයට ඇතුළත් වේ. පැය 24 ඇමතුම් මධ්‍යස්ථානවල පිරිස අවශ්‍යනම් වැඩිදුර තොරතුරු ලබාදීමට සන්නද්ධ කර පුහුණු කර ඇත. 2024 දී නිෂ්පාදන සහ සේවා තොරතුරු සහ ලේබල් කිරීම සම්බන්ධයෙන් අනුකූල නොවන සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.

ගනුදෙනුකාර දත්ත ආරක්ෂාව

GRI 418-1

දත්ත ආරක්ෂාව තුළ කඩවීම් හෝ ගනුදෙනුකාර දත්ත අහිමිවීම් වාර්තා වී නොමැත. බැංකුව සිය වෙළෙඳපොල සමීක්ෂණවල දී ගනුදෙනුකාර රහස්‍යතාව සහ විශ්වාසනීයත්වය ආරක්ෂා කරන අතර, සිය වෙළෙඳපොල සමීක්ෂණ ආයතනවලින් ගනුදෙනුකාර රහස්‍යතාව අනිවාර්ය කරමින් සහ එවැනි බාහිර සේවා සපයන්නන් සමඟ වෙනම අනාවරණය නොකිරීමේ ගිවිසුම් අත්සන් කරමින් මෙය සිදු කරයි. පිටු අංක 104 සිට 108 දක්වා තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් බැංකුකරණ කොටසේ දත්ත ආරක්ෂාව සහතික කිරීමේදී අපගේ උත්සාහයන් පිළිබඳ වැඩි විස්තර දක්වා ඇත.

අපි මෙරට නීතිය හෝ නියාමන අවශ්‍යතා කඩකරන යම් ව්‍යාපාර හෝ ව්‍යාපෘති සඳහා මුදල් ලබා දී නොමැත.

මහජන බැංකුවේ නිෂ්පාදන පරාසය

GRI 2-6

2024 වසර අවසානයට බැංකුවේ නිෂ්පාදන පරාසයට වැඩ කරන පුද්ගලයින්, කාන්තාවන්, තරුණයින්, ළමුන්, අවුරුදු 5 ට අඩු ළමුන්, සංක්‍රමණික සේවකයින්, විශ්‍රාමිකයන්/විශ්‍රාමික පුද්ගලයින්, අපනයන සමාගම්, ආනයන සමාගම් සහ වෙනත් ව්‍යාපාර සඳහා විශේෂයෙන් ඉලක්ක කරගත් ඇතුළත් සන්නාමගත නිෂ්පාදනයක් ඇතුළත්ය.

පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය		
තැන්පතු නිෂ්පාදන	අත්තිකාරම්	වෙනත්
1. ජංගම ගිණුම්	1. පුද්ගලික ණය	1. ණය/හර කාඩ්
2. ඉතුරුම් - ඉසුරු උදාන - සිසු උදාන - Yes - වනිතා වාසනා - ජන ජය - අස්වැන්න - පරිනත - පීපල්ස් රිලැක්ස් - සාමාන්‍ය ඉතුරුම් - චිතෙර වාසනා - අස්වැන්න ගිණුම - ආයෝජන ඉතුරුම් ගිණුම - මුධරහා ඉතුරුම් ගිණුම	2. කාලීන ණය	2. කාලීන ණයි
	3. නිවාස ණය	3. ජංගම බැංකුකරණය/ SMS බැංකුකරණය
	4. වෘත්තීමය ණය	4. අන්තර්ජාල බැංකුකරණය
	5. මෝටර් රථ ණය	5. ජීවිත සත්‍යාපන සහතිකපත
	6. අධ්‍යාපනික ණය	
3. ස්ථිර තැන්පතු	7. උකස් ණය	
4. වික්ෂණ තැන්පතු		
5. විදේශ විනිමය තැන්පතු		

ව්‍යාපාර නිෂ්පාදන

ව්‍යවසාය බැංකුකරණය

1. ජංගම ගිණුම්
2. ඉතුරුම් ගිණුම්
3. ස්ථාවර තැන්පතු
4. අයිරා
5. කාලීන ණය
6. කුඩා ණය
7. සංවර්ධන සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය
8. වෙළෙඳ මූල්‍ය

ආයතනික බැංකුකරණය

1. ජංගම ගිණුම්
2. ඉතුරුම් ගිණුම්
3. ස්ථාවර තැන්පතු
4. අයිරා
5. කාලීන ණය
6. වෙළෙඳ මූල්‍ය
   - ආනයන/අපනයන මූල්‍යකරණය
   - නැවිගත කිරීම සහ බැංකු ඇපකර
   - ජාත්‍යන්තර වෙළෙඳ ගෙවීම් සඳහා පහසුකම් (ණයවර ලිපි, පිළිගැනීම්)

භාණ්ඩාගාරය සහ ආයෝජන බැංකුව

1. මුදල් වෙළෙඳපොළ කටයුතු
2. රජයේ සුරැකුම්පත් වෙළඳාම
3. රජයේ සුරැකුම්පත් මත ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු
4. විදේශ විනිමය ගනුදෙනු
5. ව්‍යුත්පන්න ගනුදෙනු (ඉදිරි විනිමය හිවිසුම්, විදේශ විනිමය හුවමාරු)
6. ආයෝජන බැංකුකරණය
   - ණය ප්‍රතිව්‍යුහගතකරණය
   - උපදේශන සේවා
   - භාරකාර සේවා

ජාත්‍යන්තර මෙහෙයුම්

1. වෙළෙඳ සේවා
2. චිතෙර ගනුදෙනුකාර සේවා
3. විදේශ විනිමය ප්‍රේෂණ
4. විදේශ විනිමය තැන්පතු
5. ජාත්‍යන්තර ගෙවීම් සහ පියවීම් සේවා

අනාගත දැක්ම

අපගේ දැක්ම වන්නේ අනාගතය සඳහා දේශීය වශයෙන් නව වෙළෙඳපොළ තුළට ව්‍යාප්ත වීමයි. අපගේ සේවා ලබාදීම ශක්තිමත් කිරීම සඳහා, සියලුම සේවා පරාමිති ඉහළම මිණුම් සලකුණු සපුරාලන බව තහවුරු කර ගැනීම සඳහා සේවා ගුණාත්මක ප්‍රශ්නාවලිය 2025 දී සේවයේ යොදවනු ලැබේ. මෙහෙයුම් කාර්යසාධනයේ සතුටුදායක මට්ටම්වලට වඩා ඉහළ ගුණාත්මක ශාඛා ගෙන ඒම ඉදිරියට යන ක්‍රියාවලියකි. ප්‍රශස්ථ ගනුදෙනුකාර සේවා මට්ටම් ලබාදීමට අපි අපගේ සේවකයින්ගේ කුසලතා වර්ධනය කරන අතර, ඔවුන්ට පුද්ගල සංවර්ධන අවස්ථා පිරිනමමු. සේවා තත්ත්ව ක්‍රියා පෙරමුණ ගැනීමට සියලුම ශාඛා, ප්‍රාදේශීය කාර්යාල, සහ ප්‍රධාන කාර්යාල තුළ විශේෂිත වැඩසටහන් 2025 දී දියත් කිරීමට නියමිතය.

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය

අපගේ ව්‍යාපාර හවුල්කාර සංයුතිය අපගේ මෙහෙයුම්වල අත්‍යවශ්‍ය කොටසක් වන අතර, අභ්‍යන්තර සහ බාහිර ගනුදෙනුකරුවන්ට බාධා රහිත සහ ගුණාත්මක සේවාවක් සහතික කිරීමට අවශ්‍ය සම්පත් ලබා දේ. අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලියට දායකවෙමින්, ව්‍යාපාර හවුල්කරුවන් සමඟ අපි පවත්වා ගන්නා සම්බන්ධතා වටිනාකම ලබාදීම සහ වටිනාකම් අත්පත් කර ගැනීම මඟින් සාර්ථක සහ තිරසාර ව්‍යාපාර සහතික කරනු ලබයි.

සුවිශේෂී අවස්ථා

- ආයතනික සාමාජිකත්ව 12
- වෙස්ට්‍රෝ ගිණුම් 88ක් සමඟ අනුරූප බැංකුකරණ සම්බන්ධතා 42
- ගනුදෙනු වටිනාකම රු. බිලියන 22.3
- දේශීය සැපයුම්කරුවන් සඳහා නිර්මාණය කල වටිනාකම 93% ඉක්මවයි

අපගේ ප්‍රවේශය

අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ට ආර්ථික වටිනාකමක් උත්පාදනය කිරීමට සහ බැංකුව සඳහා උසස් සේවාවක් ලබා ගැනීමට විනිවිදභාවයෙන් හා සදාචාරාත්මක ලෙස ඔවුන් සමඟ ඇති සබඳතා ආයෝජනය කිරීමට සහ පෝෂණය කිරීමට අපි කැපවී සිටිමු. අඛණ්ඩතාව, සාධාරණත්වය සහ ගුණාත්මක බෙදාහැරීම මත පදනම්ව, අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සම්බන්ධ වීමේ අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලීන්, කර්මාන්ත රෙගුලාසි, සදාචාරාත්මක මූලාශ්‍ර සැලකිල්ලට ගනිමින් සහ කම්කරු රෙගුලාසිවලට අනුකූලතාව දක්වා ඇත.

වැදගත් තේමා

සෞඛ්‍ය හා ආරක්ෂාව

සැපයුම්කාර වටිනාකම නිර්මාණය

සමාජ ආර්ථික බලපෑම

අවස්ථා | **අභියෝග** | **නිර්මාණය කළ වටිනාකම**

- ඉහළ ආර්ථික ක්‍රියාකාරකම් සමඟින්, ප්‍රසම්පාදනය වැඩි කිරීම තුළින් ව්‍යාපාරික හවුල්කරුවන්ට අපගේ වටිනාකම් නිර්මාණය ඉහළ නැංවීමේ හැකියාව.

- ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව සේවාවක් සහතික කිරීම සඳහා ආර්ථික ධාරිතාවයෙන් සැලකිය යුතු ලෙස අඩු වී ඇති ව්‍යාපාරික හවුල්කරුවන්ගේ පුනර්ජීවනය හෝ අඛණ්ඩ සැපයුමක් සඳහා ආදේශක සෙවීමට බැංකුවට සිදු විය.
- සම්ප නියාමනය සහ වාර්තාකරණ අවශ්‍යකරන දැඩි නියාමන වාතාවරණය

- දේශීය සැපයුම්කරුවන්ට රු. බිලියන 20.9ක් ගෙවා ඇත

- විදේශ සැපයුම්කරුවන්ට රු. බිලියන 1.4ක් ගෙවා ඇත

ප්‍රාග්ධන සම්බන්ධතා

මූල්‍ය ප්‍රාග්ධනය

කාර්යක්ෂම සැපයුම් දාම කළමනාකරණය නාස්තිය අඩුකර, පිරිවැය ඉතුරුකර, හොඳම සේවා/නිෂ්පාදන ප්‍රසම්පාදනය කර ඵලදායිතාව වැඩි කරයි.

මානව ප්‍රාග්ධනය

සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ පුහුණුව ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනයේ වර්ධනය ඇති කරයි.

බුද්ධිමය ප්‍රාග්ධනය

කාලෝචිතබව හා කාර්යක්ෂම බව වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල්කරණය අඛණ්ඩව කරනු ලබයි.

සදාචාරාත්මක ව්‍යාපාරික භාවිතයන් ආරක්ෂා කිරීම මඟින් ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයක් ඇති කරයි.

නිෂ්පාදන ප්‍රාග්ධනය

උසස් තාක්ෂණය හා ඩිජිටල්කරණය තුළ ආයෝජන, සැපයුම්දාව ක්‍රියාවලි ක්‍රමවත් කරන අතර, බාධාවකින් තොරව ප්‍රසම්පාදන ක්‍රියාවලින් මඟින් කාල කාර්යක්ෂම තාවය වැඩි කරයි. එමෙන්ම ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය සමඟ සබඳතා ශක්තිමත් කරයි.

ස්වභාවික ප්‍රාග්ධනය

සදාචාර මූලාශ්‍රකරණය සහ බලශක්ති කාර්යක්ෂම ක්‍රියාවලි සහතික කිරීමට යොදා ගත් දැඩි නිවාරණ ක්‍රම අපගේ ව්‍යාපාර හවුල්කරුවන් තුළ පාරිසරික, සමාජීය හා තිරසාර දැනුවත්කම ගොඩ නගයි. වගකීම්සහගත ආකාරයෙන් ප්‍රසම්පාදනය, ගබඩා කිරීම, භාවිතය සහ බැහැර කිරීම සඳහා බැංකුවේ ප්‍රවේශය මෙම තේමාවන් කරා සැපයුම් දාම වගවීම බහිස්කරණය කරයි.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය

ස්ත්‍රී පුරුෂ සමානතාව

බැංකුව සිය ව්‍යාපාර හවුල්කරුවන් අතර ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශ්වය සඳහා සමාන අවස්ථාව ලබා දේ.



යෝග්‍ය වැඩ සහ ආර්ථික වර්ධනය

බැංකුවේ ව්‍යාපාර හවුල්කරුවන් ආර්ථික දායකත්වයන් වර්ධනය කිරීමට සහ යෝග්‍ය රැකියා ලබාදීමට අවස්ථාව ලබා දී ඇත

තිරසාර නගර සහ ප්‍රජාවන්

බැංකුවේ පුළුල් සැපයුම් දාම සිය ව්‍යාපාර හවුල්කරුවන් අතර තිරසාර මෙහෙයුම් දිරිගන්වයි.

දේශගුණික ක්‍රියාකාරිත්වය

බැංකුව වගකීම්සහගත ප්‍රසම්පාදන ව්‍යවහාර පවත්වා ගන්නා අතර, එය පාරිසරික දැනුවත්කම සහ සංරක්ෂණ දිරිගන්වයි.

අරමුණු සඳහා හවුල්කාරත්වය

බැංකුවට සිය අරමුණු සාක්ෂාත් කර ගැනීමට දේශීය හා විදේශීය ව්‍යාපාර හවුල්කරුවන්ගේ විශාල ජාලයක් ඇත

ව්‍යාපාර හවුල්කාර වර්ග

GRI 2-6

බැංකුවට අත්‍යවශ්‍ය සහ පර්යන්ත සේවා ලබා දෙමින්, අපගේ ව්‍යාපාර හවුල්කාර සංයුතිය විවිධ ව්‍යාපාර නියෝජනය කරමින් විවිධ වන අතර, කිසිදු වෙනස් ලෙස සැලකීමක් නොමැතිව දේශීය ප්‍රජාවගෙන් බොහෝ දුරට ජනනය වේ. විනිවිද ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් අපි ඔවුන්ව සහභාගි කරන අතර, අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක හවුල්කාරිත්වයක් සහතික කරන, අඛණ්ඩ ව්‍යාපාර මෙහෙයුම් සඳහා ප්‍රයෝජනවත් සහජීවනය ඇති කරන ඵලදායී සංවාදයක නිරත කරයි. ප්‍රසම්පාදන සංග්‍රහය මාර්ගෝපදේශ සකස් කරන අතර, එය වෙනස්වන අවශ්‍යතා සඳහා ප්‍රසම්පාදන ප්‍රතිපත්ති යාවත් කිරීමට අඛණ්ඩව වැඩිදියුණු කරයි.

	අනුරූප බැංකු	වෙස්ට්‍රෝ නියෝජිතයින්	වෙළෙඳ හවුල්කරුවන්	රාජ්‍ය ආයතන
ව්‍යාපාර වර්ධන හවුල්කරුවන්	දේශසීමා බැංකුකරණයේ අත්‍යවශ්‍ය අංග වන මේවා ජාත්‍යන්තර වෙළඳාම, විදේශ විනිමය ගනුදෙනු සහ දේශසීමා හරහා ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට උපකාරී වේ.	අපගේ ජාත්‍යන්තර බැංකු හවුල්කරුවන් සමඟ පවත්වා ගන්නා මේවා, ජාත්‍යන්තර වෙළෙඳාමට පහසුකම් ඇති කරමින් විදුලි පණිවිඩ සහ විදේශ විනිමය ගනුදෙනු, තැන්පතු සහ මුදල් ආපසු ගැනීම් සඳහා අත්‍යවශ්‍ය වේ.	වෙළෙඳ හවුල්කරුවන් අපගේ දෛනික ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේදී බොහෝ ආකාරවලින් අපට සහාය වන අතර, අපගේ මෙහෙයුම් උපාංගයේ අත්‍යවශ්‍ය කොටසකි.	රජයට අයත් බැංකුවක් ලෙස, රජයට අයත් ව්‍යවසායන් අපගේ ගනුදෙනුකාර කළඹේ සැලකිය යුතු කොටසකි.
සැපයුම්කරුවන්	උපයෝගිතා සේවා සපයන්නන්	අමුද්‍රව්‍ය සපයන්නන්	ස්ථාවර වත්කම් සපයන්නන්	සංචාරක හා ප්‍රවාහන සපයන්නන්
	විදුලිය, ජලය සහ විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සේවාවන් අපගේ ව්‍යාපාරයේ ක්‍රියාදාමයට බැඳී ඇති අතර, එය නොමැතිව අපට ක්‍රියාත්මක විය නොහැක.	අපගේ මෙහෙයුම් කටයුතුවලදී ද්‍රව්‍ය සැපයුම්කරුවන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර, මෙහෙයුම් අඛණ්ඩතාව සහතික කරන සදාචාරාත්මකව පදනම් කරගත්, උසස් තත්ත්වයේ ද්‍රව්‍ය සපයන අතර, අපගේ පාරිසරික හා සමාජීය වගකීමට සහාය වෙමින්, තිරසාරභාවයට සහාය වේ.	ද්‍රව්‍ය සහ උපකරණ සැපයුම්කරුවන්, ගෘහ භාණ්ඩ, සවිකිරීම්, මෙවලම් සහ තාක්ෂණ සැපයුම්කරුවන්, වාහන අලෙවිකරුවන් සහ දේපළ වෙළඳාම් සපයන්නන් යනු අපගේ සියලුම පාර්ශ්වකරුවන්ට වටිනාකම ලබා දීමට අපට උපකාර කරන සක්‍රීය කරුවන් වෙති.	සංචාරක සහ ප්‍රවාහන සැපයුම්කරුවන්, අපගේ මෙහෙයුම්වල ආවේණික කොටසක් වන අතර, ඔවුන් කාර්ය මණ්ඩල ප්‍රවාහනය පමණක් නොව, දිවයින පුරා විසිරී සිටින අපගේ සේවාදායකයින් හමුවීමට සහය වේ.

	මෘදුකාංග සැපයුම්කරුවන්	සන්නිවේදනය	අපද්‍රව්‍ය කළමනාකරණය	ණය අයකරන ආයතන	මානව සම්පත් සපයන්නන්
නඩත්තු හවුල්කරුවන්	බැංකුවේ අපේක්ෂිත ඩිජිටල් ධාවකයට අපගේ මෘදුකාංග සැපයුම්කරුවන් විසින් මනාව සහාය වේ.	අපගේ සන්නිවේදන උපකරණ නඩත්තු කිරීම ප්‍රධාන අවශ්‍යතාවයක් වන අතර, වර්තමානයේ අන්තර්ක්‍රියාකාරී සන්නිවේදනය මෙම ක්ෂේත්‍රයේ උසස් යටිතලපහසුකම් මත තවදුරටත් රඳා පවතී.	තෙවන පාර්ශවීය ප්‍රතිචක්‍රීකරුවන්, මහා නගර සහ නගර සභා අපගේ පරිශ්‍රය හොඳ තත්ත්වයේ පවත්වා ගැනීමට සහය වන අතර, අපගේ සේවකයින්ගේ සහ පරිශ්‍රයට පැමිණෙන අමුත්තන්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා දායක වේ.	අභියෝගාත්මක අයකර ගැනීමේ කාලසීමාවලදී අයකිරීමේ හෝ ණය එකතු කිරීමේ ආයතන විසින් මිල කළ නොහැකි සහයෝග යක් ලබා දෙන ලදී. 2024 දී අපගේ විශිෂ්ට සාර්ථකත්වයට ඔවුන්ගේ උත්සාහයන් දායක විය.	බැංකුව තුළ ඇති පර්යන්ත රාජකාරී බාහිරින් ලබාගත් පිරිස් විසින් කාර්යක්ෂමව හසුරුවන ලද අතර, එමඟින් අපගේ සේවකයින්ට වැඩි වටිනාකම එක් කිරීමේ සේවාවන් සහ ගනුදෙනුකාර මැදිහත්වීම් සඳහා තම කාලය කැප කිරීමට ඉඩ ලබා දී ඇත.

	කොන්ත්‍රාත්කරුවන්	පරිශ්‍ර සපයන්නන්
වෙනත්	මනාව නඩත්තු කරන ලද සහ මානව පිහිටා ඇති පරිශ්‍ර අපගේ ඉහළ දෘශ්‍යමාන සන්නාමය අඛණ්ඩව පවත්වාගෙන යාමට දිරිගැන්වීමක් වන අතර, නොපෙනෙන නමුත් ස්පෘශ්‍ය වටිනාකමක් එකතු කරයි. සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා නිසි සැලකිල්ල සමඟ අපගේ දේපළ හොඳ පිළිවෙළකට තබා ගැනීමට සහ පවත්වා ගැනීමට බාහිර කොන්ත්‍රාත්කරුවන් සහ පරිශ්‍ර සපයන්නන් වෙහෙස නොබලා උත්සාහ කරත

GRI 204-1

වර්ගය	2024	2023
ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව	අපි 2020 වසරේ සිට මුදල් අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති විද්‍යුත් ප්‍රසම්පාදන වේදිකාව භාවිතා කරන අතර සැපයුම්කාර ලියාපදිංචිය භාවිතා නොකරයි.	අපි 2020 වසරේ සිට මුදල් අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති විද්‍යුත් ප්‍රසම්පාදන වේදිකාව භාවිතා කරන අතර සැපයුම්කාර ලියාපදිංචිය භාවිතා නොකරයි.
අනුරූප බැංකු සංඛ්‍යාව	42	44
වෙස්ට්‍රෝ නියෝජිතයින් සංඛ්‍යාව	88	80
සැපයුම්කරුවන්ට ගෙවීම (රු.බි.)	22.3	21.4
දේශීය (93.7%)	20.9	19.4
විදේශීය (6.3%)	1.4	2.0

ජාත්‍යන්තර ව්‍යාපාර හවුල්කරුවන්

විදේශීය සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ හා සේවා සුරක්ෂිත කර ගැනීමේදී බැංකුවේ ජාත්‍යන්තර ප්‍රවේශය අත්‍යවශ්‍ය සංරචකයක් වී ඇත. මෙම අවස්ථාවෙහිදී විදේශීය සැපයුම්කරුවන්ගෙන් අත්‍යවශ්‍ය හා පර්යන්ත භාණ්ඩ සාධාරණ මිලකට ඵලදායී ලෙස ප්‍රවාහනය කිරීමට හා සියලු නියාමන අවශ්‍යතාවලට සදාචාරාත්මකව හා සාමාජීය වශයෙන් අනුකූල වන පරිදි මුළු ලොව පුරා විහිදුනු සුරක්ෂිත හා විශ්වාසදායී හවුල්කරුවන්ගේ ජාලයක් බැංකුව තබා ගනී.

වසර ගණනාවක් පුරා, බැංකුව සිය ජාත්‍යන්තර ව්‍යාපාර හවුල්කරුවන් සමඟ ශක්තිමත් සම්බන්ධතා ගොඩ නගා ඇති අතර, භූ දේශපාලනික වාතාවරණ සහ ගෝලීය පීඩනයන්ගේ වෙනස්වීම් වලදීද එය ඉදිරියට ගෙන යන බැවින් බැංකුවේ වර්ධනයට සහය වේ.

ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය

බැංකුව මනාව ව්‍යුහගත ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන අතර, එය මිලදී ගැනීමේ තීරණවල අනුරූපතාව සහ වගවීම මත පදනම් වේ. සියලුම නීති හා රෙගුලාසිවලට අනුකූල වෙමින්, මෙම ප්‍රතිපත්තිය පිරිවැය ඉතුරුම් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවන් සහතික කරයි. එමෙන්ම එය විනිවිදභාවය සහ සාධාරණත්වය දැඩිව කළමනාකරණය කරන සහ මනාව පාලනය කරන සිය ටෙන්ඩර් ක්‍රියාවලිය තුළ ආවේණික දෙයක් වන බැවින් එය කීර්තිනාම කළමනාකරණයට දායක වේ. ක්ෂේත්‍රයේ ප්‍රවීනයින්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) ප්‍රසම්පාදන සඳහා සියලුම තාක්ෂණික පිරිවිතර ඇගයීමට ලක් කරයි. කමිටුව මෙහෙයුම් සහ ප්‍රාග්ධන අයවැය (CAPEX සහ OPEX) සංවර්ධනය කරන අතර, එය වසර තුළ ප්‍රසම්පාදනය සඳහා පදනම දමයි. මෙයට පිරිවැය අතුළත් වන අතර, බැංකුවේ සාර්ථක කාර්යසාධනය සඳහා දායක වේ.

බැංකුව ව්‍යාපාර කරන ආකාරය පිළිබඳ බහුතර කාර්යය හරිත සහ ලීන් සංස්කෘතියක් හරහා ක්‍රියාත්මක කරන ලද අතර, එහිදී සම්පත් සහ පොදුකාර්යය වියදම අවම කෙරේ.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය

GRI 308-1, 414-1

- ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පළමුව ලබා ගන්නා අතර, නව සැපයුම්කරුවන්ගේ හරිත සහ සදාචාර සාක්ෂිපත් සහතික කිරීමට ඔවුන් දැඩි නිවාරණයට යටත් කෙරේ. DI කාඩ් සහ IT උපකරණ වැනි තීරණාත්මක සහ ඉහළ අන්තයේ භාණ්ඩ ගෝලීය ටෙන්ඩරයක් හරහා මිලදී ගන්නා අතර, එහිදී බැංකුව තෝරාගත් ගෝලීය සැපයුම්කරුවන් සමඟ දිගුකාලීන සම්බන්ධතා පවත්වා ගනී
- සියලුම සැපයුම් දාම මධ්‍යම පරිසර අධිකාරියේ නිර්ණායක සහ භාණ්ඩ ළමා ශ්‍රමය සහ බලාත්කාර ශ්‍රමයෙන් තොර බවට සහතික කරන වෙනත් නියාමන ව්‍යාවහාර පිළිපදින බව සහතික කිරීමට සියලුම නව සැපයුම්කරුවන් පාරිසරික අනුකූලතාව සඳහා නිවාරණය කෙරේ.
- ඩිජිටල් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ විනිවිදභාවය සහතික කරමින් ටෙන්ඩර් මාර්ගගත ක්‍රමය තුළින් වැඩි වශයෙන් සිදු කරනු ලබයි.
- සැපයුම්කරුවන් රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය මත ලියාපදිංචි විම අවශ්‍ය වන අතර, එය මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකි.

සැපයුම් දාමය

ව්‍යාපාරික කටයුතුවල බැංකුවේ අඛණ්ඩ සහභාගිත්වයට දෛනික පදනමක් මත නව සැපයුම්කරුවන් ඇතුළත් කිරීම අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලිය සහතික කිරීම සඳහා, OPEX දක්වා ඇති පිරිවැය පරාමිති සමඟ අවශ්‍යවන ප්‍රමාණයන් හි කාලීන පදනමක් මත යහපත් තත්ත්වයේ නිෂ්පාදන හා සේවා මිලදී ගැනීමට සැපයුම් දාමය සමඟ සම්බන්ධීකරණ ව්‍යාපාර කටයුතු බැංකුව සිදුකරයි. සාධාරණ මිල ගණන්, විශිෂ්ට සේවා මට්ටම්, සදාචාර මාර්ග, සහ සමාජීය වශයෙන් අනුකූල ව්‍යවහාර භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා මනා පරිචයන් පිළිබඳ මූලික පිරික්සුම් ලැයිස්තුව සකස් කරයි.



පාරිසරික තක්සේරුව සඳහා සැපයුම්කරුවන් නිවාරණය

පිළිගත් සහ තිරසාර ව්‍යාපාර මෙහෙයුමක් සහිත පාරිසරික දැනුවත් ආයතනයක් ලෙස, සැපයුම්කරුවන් පාරිසරික හා සමාජ නිර්ණායකවලට අනුකූල වන බව සහතික කිරීමට බැංකුව සැපයුම්කාර නිවාරණය සවිබල ගන්වයි. පාරිසරික ආරක්ෂක වගන්ති ප්‍රසම්පාදන ප්‍රතිපත්ති සහ ටෙන්ඩර්වලට ඇතුළත් කරන අතර, පාරිසරික ප්‍රතිෂ්ඨාවන් සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ දී අත්‍යවශ්‍යය. සිය නිෂ්පාදන ක්‍රියාවලිය තුළ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කළ රෙගුලාසි සැපයුම්කරුවන් පිළිපදින අතරම ළමා ශ්‍රමය සහ බලාත්කාර ශ්‍රමය පිළිබඳ තහනම් කිරීම්වලට දැඩි අනුකූලතාව ඇතුළුව කම්කරු රෙගුලාසිවලට දැඩි අනුකූලතාව පෙන්වීම වඩාත් වැදගත් වේ.

බැංකුව විසින් ක්‍රියාවේ යොදවා ඇති තිරසාර ව්‍යවහාර ඇතුළුව දේශීය නීති හා රෙගුලාසිවලට සැපයුම්කරුවන් අනුකූල වන බව අපේක්ෂා කරන අතර, ඒ සඳහා බල කරන්නෙමු. මෙය බැංකුවට මූලාශ්‍රකරණය, නිෂ්පාදනය, අගය එකතු කිරීම සහ ඔවුන්ගේ සැපයුම් බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළ මහජන සුභසාධනය සහ ප්‍රජාසංවර්ධනයේ වැදගත් අංගයකි.

කර්මාන්ත සංගම් සමඟ සාමාජිකත්වය

GRI 2-28

ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් ලෙස, අපි ගැටළුසහගත ක්ෂේත්‍ර හඳුනාගනිමින් සහ විසඳුම් සොයමින් ජාතියේ සමාජීය හා ආර්ථික වර්ධනය කරා අපි නිරන්තරයෙන් වැඩ කරමින් සිටිමු. ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ නිර්දේශවලට සහයවීමට සහ ක්ෂේත්‍රයේ සහ ජාතික සංවර්ධනයට සහයවීමට අධ්‍යයන සහ විශ්ලේෂණ සිදුකරමින් අපි අපගේ වගකීම් භාරගනිමු. මෙම කාර්යය තුළ, අපි පහත සංගම්වල සාමාජිකයින් වෙමු.

- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා බැංකු සංගමය (ඇපකර) සමාගම.
- බැංකු ක්ෂේත්‍රයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමය – ශ්‍රී ලංකාව
- ආසියා පැසිෆික් ග්‍රාමීය සහ කෘෂිකාර්මික ණය සංගමය
- බැංකුවල අනුකූලතා නිලධාරීන්ගේ සංගමය - ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (ඇපකර) සමාගම.
- බැංකුකරුවන්ගේ නිෂ්කාශන සංගමය
- ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය
- ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය
- ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමය
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය

අනාගත දැක්ම

අපගේ ව්‍යාපාර හවුල්කරුවන් සියලුම දෙනා සමඟ ශක්තිමත් හා ඔරොත්තු දෙන සම්බන්ධතා අපි තවදුරටත් ගොඩ නගන අතර, දේශීය මූලාශ්‍රකරණය ප්‍රමුඛතාවක් වනු ඇත. අවශ්‍යතාව පරිදි සහ අවශ්‍ය විට, බැංකුව ව්‍යාපාර හවුල්කාර කළඹ පුළුල් කිරීමට ගවේෂනය කරන අතර, එය අනුමත විදේශ විනිමය අයවැය තුළ මනාව බැංකුවේ අනාගත අවශ්‍යතා මත රඳා පවතී. අපි ලීන් සහ හරිත මෙහෙයුම් කරා විතැන් වන බැවින්, අපි පිරිවැය අඩු කිරීමට හා මිලදී ගන්නා සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීමට උත්සාහ කරමු.

ආයෝජක ප්‍රාග්ධනය

ආයෝජක ප්‍රාග්ධනය ලෙස ප්‍රසිද්ධ අපගේ ආයෝජකයින් මූල්‍යකරණයේ තීරණාත්මක මූලාශ්‍ර වන අතර, අපට ඵලදායිව වර්ධනය, නව්‍යකරණය සහ ක්‍රියාත්මක වීමට හැකියාව ඇති කරයි. ඉහළ කාර්යක්ෂමතාව සහිත විනිවිදභාවය සහ පැහැදිලි සන්නිවේදනය අපගේ ආයෝජන ප්‍රාග්ධනය සමඟ දිගුකාලීනව ශක්තිමත් සම්බන්ධතා ගොඩ නගා පවත්වාගෙන යාමට උපකාරී වේ.

සුවිශේෂී අවස්ථා

- ස්කන්ධය මත ඉපයීම 14.67%
- වත්කම් මත ඉපයීම 1.31%
- ප්‍රජාවට රු. මිලියන 36
- පුද්ගලික අංශයේ ආයතන 100ට වැඩියෙන් ඇතුළත්වීම
- 92.27%ට වඩා වැඩි රජයේ හිමිකාරිත්වය

අපගේ ප්‍රවේශය

සිය ශක්තිමත් පාලන ව්‍යුහය, වෙනස් කළ නොහැකි අනුකූලතා සංස්කෘතිය, සහ සදාචාර සහ සියලුම ව්‍යාපාර මෙහෙයුම් අංගවල මනාව ස්ථාපිත ක්‍රියාවලි සමඟ, අනෝන්‍ය ප්‍රතිලාභ සඳහා සිය ආයෝජකයින්ට වටිනාකම ලබා දීමට බැංකුව කැප වී සිටී. අපි අපගේ වත්කම් කළඹ උසස් කර, පුද්ගලික අංශයේ ආයතන ඇතුළත් කිරීමට අපගේ ගනුදෙනුකාර පදනම විවිධාංගීකරණය කර, අපගේ මානව ප්‍රාග්ධනය පෝෂණය කරන අතර, ආයෝජක විශ්වාසය වැඩි කිරීමට අපගේ ඩිජිටල් හැකියාවන් සවිමත් කර 2024 දී අනෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබන වඩා හොඳ කාර්යක්ෂමතාවක් අත්කර ගනිමු.

වැදගත් තේමා

සමාජ ආර්ථික බලපෑම

අවදානම හා යහපාලනය

සේවක ඵලදායිතාව

අවස්ථා → **අභියෝග** → **නිර්මාණය කළ වටිනාකම**

- සමාජීය ස්ථාවරත්වය සහ වර්ධිත ආර්ථික තත්ත්වන් නව ව්‍යාපාර අවස්ථා තවදුරටත් විවෘත කරයි.
- සුපිරි ඩිජිටල් හැකියාව බැංකුවේ ගනුදෙනුකාර පදනමට තරුණ පරම්පරාවේ ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ඇත.
- බුද්ධිගලනය සහ ජන සංක්‍රමණය අපව ප්‍රතිෂ්ඨාපනය සඳහා උත්සාහ කිරීම අවශ්‍ය කර ඇත.
- සිටින දක්ෂයින් ඉල්ලා සිටින පාරිශ්‍රමික රජයේ නිශ්චිත පරාමිතිවලට ඉදිරියෙන් ඇති බැවින්, සුදුසුකම් සහිත සහ පළපුරුදු තොරතුරු තාක්ෂණ දක්ෂයින් බඳවා ගැනීම අභියෝගයක්ව පවතී.

බදු, විශේෂ බදු සහ කොටස්හිමියන්ට ලාභාංශ ලෙස රු. බිලියන 33.5ක් ගෙවා ඇත.

ප්‍රාග්ධන සම්බන්ධතා

මූල්‍ය ප්‍රාග්ධනය

අපගේ ආදායම දරා ගැනීම සහ ලාභ වැඩි කිරීම ආයෝජක ප්‍රාග්ධනය වැඩි කරයි.

මානව ප්‍රාග්ධනය

මානව ප්‍රාග්ධනය අපගේ සාමූහික අරමුණු සාක්ෂාත් කර ගැනීමට දායක වේ.

බුද්ධිමය ප්‍රාග්ධනය

ඩිජිටල්කරණය සහ නවෝත්පාදනය තුළ ක්ෂේත්‍රයේ නායකත්වය ආයෝජක ප්‍රාග්ධනය වැඩි කිරීමට දායක වේ.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

පිරියත හා උපකරණවල ආයෝජන වටිනාකම නිර්මාණයට සහ වැඩිකළ ආයෝජනයට හේතු වේ.

ස්වභාවික ප්‍රාග්ධනය

ඩිජිටල්කරණය, ස්වයංක්‍රීයකරණය සහ පාරිසරික ව්‍යාපෘතිවලට දායකත්වය තුළ ආයෝජන පරිසරය කෙරෙහි අපගේ බලපෑම අවම කරයි.

වික්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය



යෝග්‍ය වැඩ සහ ආර්ථික වර්ධනය

බැංකුව සිය ව්‍යාපාරික කටයුතු සහ සෘජු ආර්ථික දායකත්වයන් තුළින් සැලකියයුතු සෘජු ආර්ථික දායකත්වයක් සිදු කරයි.

සාමය, සාධාරණත්වය සහ ශක්තිමත් ආයතන

බැංකුව ජනතාව සඳහා නිෂ්පාදන හා සේවා පරාසයක් ලබාදීමට රජය සහ රාජ්‍ය නොවන සංවිධාන රාශියක් සමඟ කටයුතු කරයි.

ආයෝජක ප්‍රාග්ධනයේ වටිනාකම

1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ (2019 සංශෝධිත) පිහිටුවන ලද මහජන බැංකුව, ස්කන්ධ කොටස් ප්‍රාග්ධනයෙන් 92.27% ක් දරන ශ්‍රී ලංකා රජය සහ ඉතිරි 7.73% දරන සමූපකාර සමිති සමඟ ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම රාජ්‍ය අංශයේ බැංකුව ලෙස සේවය කරයි. බැංකුව මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හරහා ශ්‍රී ලංකාවේ මහජනතාවට සෘජුව වගකියනු ලබන අතර, වටිනාකම නිර්මාණයේ හරය සකස් කරන මූල්‍ය උපකරණවල නායකයෙක් වීමේ විධානයක් සමඟ මූල්‍ය භාරකාරත්වය සඳහා බැංකුව මත රඳාපවතින ප්‍රජාවන්ට සේවය කරයි.

බැංකුවේ අරමුණ "සමූපකාර සමිති, අනුමත සමිති, වගා කමිටු සහ අනෙකුත් පුද්ගලයින් සඳහා මූල්‍ය සහ අනෙකුත් ආධාර සැපයීම මගින් ලංකාවේ සමුපකාර ව්‍යාපාරය, ග්‍රාමීය බැංකුකරණය සහ කෘෂිකාර්මික ණය සංවර්ධනය කිරීම." ලෙස ලේඛණගත කර ඇත. බැංකුවේ මහජන සුභසාධන අරමුණ පිළිබිඹු කරමින්, එය බිම් මට්ටමේ ප්‍රජාවන්ට සේවය සලසන අතර, සැමට තිරසාරභාවය නිර්මාණය කිරීමට සෘජුව හෝ වක්‍රව ආර්ථික බලපෑම තුළ බැරෑරුම් කාරයභාරයක් සකස් කරයි. 20024 දී, සිය වත්කම් කළඹේ පරිමාණය නිර්මාණය කර ගනිමින් පුද්ගලික අංශය තමන් වෙත ඇද ගැනීම සඳහා සිය ගනුදෙනුකාර අංශ විවිධාංගීකරණය කළ අතර, මේ දක්වා සේවය නොකළ වෙළෙඳපොලක තුළ සිය සන්නාමය ශක්තිමත් කළේය. අපගේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට අපගේ ආයෝජන ප්‍රාග්ධනයේ වැදගත් දායකත්වය මිලකළ නොහැක.

ආර්ථික දායකත්වය

GRI 201-1

2024 දී උත්පාදනය කර බෙදාහරින ලද සෘජු ආර්ථික වටිනාකම තුළින් අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල සුවිශේෂී වර්ධනය, පිරිවැය ඉතුරුම් වැඩසටහන්වල ඵලදායිත්වය, අවදානම් කළමනාකරණයේ ශක්තිමත්බව සහ සදාචාර පාලන ක්‍රියාවලින්ට අඛණ්ඩ බැඳීම පෙන්වා දේ.

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා,	2020 රු. '000	2021 රු. '000	2022 රු. '000	2023 රු. '000	2024 රු. '000	වර්ධනය %
ආදායම් මූලාශ						
පොළිය	179,717,526	197,330,011	321,935,983	394,794,898	349,292,146	-11.5
හුවමාරුව (විදේශ විනිමය)	2,402,191	(1,405,861)	17,053,885	8,584,947	(435,708)	-105.1
කොමිස් හා ගාස්තු	6,723,826	8,268,168	16,397,745	13,806,168	14,923,343	8.1
ප්‍රාග්ධන ලාභය	336,495	143,459	184,223	347,203	537,614	54.8
අනෙකුත්	1,801,670	2,914,043	1,656,773	4,708,927	3,660,594	-22.3
එකතුව	190,981,708	207,249,820	357,228,609	422,242,143	367,977,989	-12.9
ආදායම උපයෝගී කර ගැනීම						
තැන්පතුකරුවන්/ණය ගැණුම්කරුවන් වෙත පොලී ලෙස	118,783,744	114,869,171	246,177,918	340,473,452	242,050,205	-28.9
වැටුප් ලෙස සේවකයින්ට	19,685,506	22,711,335	26,602,748	24,493,737	35,834,826	46.3
භාණ්ඩ සහ සේවා සපයන්නන් වෙත	11,128,830	12,276,709	15,882,049	21,352,264	21,265,446	-0.4
මූල්‍ය වත්කම්වල ශුද්ධ හානිකරණ අලාභ	11,567,174	14,472,820	33,346,451	7,437,572	5,450,173	-26.7
රජයට - බදු, විශේෂ බදු සහ ලාභාංශ	14,444,917	16,328,960	13,944,390	13,926,049	33,476,273	140.4
ප්‍රජාව වෙත	28,703	12,665	38,213	40,721	35,964	-11.7
වර්ධනය සඳහා රඳවා තබාගත්	15,342,833	26,578,159	21,236,840	14,518,348	29,865,102	105.7
එකතුව	190,981,708	207,249,820	357,228,609	422,242,143	367,977,989	-12.9

ජාතික දායකත්වය	2024	2023
රජයට – බදු, විශේෂිත බදු සහ ලාභාංශ (රු.බි.)	33.48	13.93
ස්කන්ධය මත ප්‍රතිලාභ (%)	14.7	6.6
වත්කම් මත ප්‍රතිලාභ (%)	1.3	0.5





ජාතියට මූල්‍ය නොවන දායකත්වය

මහජන බැංකුව ශ්‍රී ලංකා රජයට ලාභාංශ බැරකරන අතර, (බදු ගෙවීම් වලට අමතරව) දිවයින පුරා සිය ශාඛා ජාලය තුළින් විශ්‍රාම වැටුප් සහ අස්වැසුම ගෙවීම් ඇතුළුව සුබසාධන සේවාවන් ජනතාවට ලබාදෙන අතර, ඉන් ග්‍රාමීය ප්‍රජාවන් ඔවුන්ගේ දෛනික අවශ්‍යතා ඉටුකර ගනී.

බැංකුව රාජ්‍ය ආයතන හරහා අත්‍යවශ්‍ය, මහා පරිමාණ පොදු භාණ්ඩ සහ සේවාවන්ට ජාත්‍යන්තර ගනුදෙනු සඳහා පහසුකම් සපයන රාජ්‍ය අංශයේ බැංකු දෙකෙන් එකකි. රටේ ආර්ථිකයේ කොඳුනාරටිය සකස් කරන පොහොර, ඖෂධ, බනිජ තෙල්, සහ ගල් අඟුරු සහ වෙනත් අත්‍යවශ්‍ය භාණ්ඩ විශාල තොග මිලදී ගැනීමේදී මහජන බැංකුව නායකත්ව කාර්යභාරයක් ඉටුකරන බව සහතික කරයි. අපි මූල්‍ය අන්තර්ගතභාවය සහතික කරමින් බැංකු රහිත හෝ බැංකු පහසුකම් අඩුවෙන් ඇති ජනගහනයේ අතීශයින් ග්‍රාමීය කොටසකට විධිමත්, ආරක්ෂිත මූල්‍ය සේවා ප්‍රවේශය සඳහා පහසුකම් සපයයි.

බදුකරණය

GRI 207-1, 2, 3

බදුකරණය හා ආශ්‍රිත කරුණු පිළිබඳ විශේෂඥයින් බදු පාලන තන්ත්‍රය ඵලදායී ආකාරයෙන් පිළිපදිමින් එයට අනුකූල වන අතර, ආදායම් බදු ගණනය කිරීම, ගොනු කිරීම සහ බදුකරණ පද්ධතියට අදාළ ආශ්‍රිත කාර්යයන් හැසිරවීමට බාහිර උපදේශකයින් බඳවා ගනී.

බදු නීති මෙන්ම නියාමන කරුණු පිළිපැදීම අධීක්ෂණය කරනු ලබන අභ්‍යන්තර විගණන සහ අනුකූලතා ඒකකය මගින් මෙහෙයවන දැඩි අධීක්ෂණ යාන්ත්‍රණ බැංකුව ක්‍රියාත්මක කරයි, බදු ව්‍යවහාර පිළිබඳ සමාජීය වගකීම තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් මහජන බැංකුව ඉටු කරන අතර, සෑම විටම සදාචාරාත්මක හැසිරීම් සඳහා කැපවීමේ සන්නාමයක නියැලෙමින්, සමාජීය වගකීමට සිය දායකත්වය කිසිවෙකුට නොදෙවෙනි බව සහතික කරමින් නායකත්වයේ ප්‍රාවරණය දරනු ලබයි.

වෙනස්වන බදුකරණ වාතාවරණය තුළ අනුකූලතාව සහතික කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතාව වර්ධනය කිරීමේදී බදු ඒකකය උපකාර වේ. කිසිදු පදනමක් මත බදු මඟහැරීම හෝ අනුකූල නොවන අවස්ථා නොමැත.

අනාගත දැක්ම

ඉහළ අවංකකම සහ ආචාර ධර්ම, ශක්තිමත් අවදානම් කළමනාකරණය සහ ආයතනික පාලනය, අපගේ මානව ප්‍රාග්ධනය පෝෂණය කිරීම සහ තිරසාර අනාගතයක් කෙරෙහි අපගේ දැක්ම නියම කිරීම යන ස්ථිර පදනම මත, අපි අඛණ්ඩව වර්ධනය වෙමු. අපගේ සමස්ථ මෙහෙයුමට අපගේ ආයෝජන ප්‍රාග්ධනයේ වටිනා දායකත්වය අගය කිරීම නොකර සිටිය නොහැක. එමනිසා, අපි මෙම වත්කම් සමඟ සමීප බැඳීමක් සංවර්ධනය කරන බව සහතික කිරීමට කාලීන අනාවරණ සහ රැස්වීම් සමඟ විනිවිද සහ පැහැදිලි සන්නිවේදනය තුළ අපි අඛණ්ඩව මැදිහත් වෙමු.

ප්‍රජා ප්‍රාග්ධනය

දශක හයක් පුරා, බැංකුව ප්‍රජාව සමඟ ශක්තිමත් සම්බන්ධතා පෝෂණය කර ඇති අතර, ජනතාවගේ අවශ්‍යතා සපුරාලීමට කැපවී ඇත.ඒ් තුළ ග්‍රාමීය ව්‍යවසායකයින් සවිබල ගැන්වීම, කාන්තාවන් මෙහෙයවන ව්‍යාපාරවලට සහයවීම, සහ සිසුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා නියැලීමට දිරිගැන්වීම සිදු කර ඇත.

ඉස්මතු කිරීම්

- රු. මිලියන 36.0ක් ප්‍රජා සංවර්ධනය තුළ ආයෝජනය කර ඇත.
- සිසුන් 525කට සීමාවාසික පුහුණුව ලබා දී ඇත.
- රු. මිලියන 8.9ක් සෞඛ්‍ය පහසුකම් සඳහා ලබාදී ඇත.

අපගේ ප්‍රවේශය

අප වටා සිටින ප්‍රජාවන් තුළ වටිනාකම ඇති කිරීම බැංකුවට ප්‍රධාන වටිනාකමකි. අපගේ කැපවීම ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කරගැනීම ඉක්මවා යන අතර, අපගේ සහයෝගය වඩාත් අවශ්‍යවන ක්ෂේත්‍රවලට සහය ලබා දේ. තිරසාරභාවය අපගේ උපායමාර්ගික වැඩසටහනේ තීරණාත්මක අංගයක් වන අතර, අප ක්‍රියාත්මක කරන බොහෝ CSR ව්‍යාපෘති තුළින් ආර්ථික දුෂ්කරතා යම් තරමකට තුරන් කරන බවත්, ව්‍යාපාරවලට පහසුකම් සපයන බවත් සහතික කිරීමට අපගේ බැඳීම් තුළ සැලකියයුතු ආයෝජන අපි සිදුකරමු.

ආදි වාසීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් කිසිවක් වාර්තා වී නොමැත.

GRI 411-1

වැදගත් තේමා

සමාජ ආර්ථික බලපෑම

පාරිසරික බලපෑම

අවස්ථා | **අභියෝග** | **නිර්මාණය කළ වටිනාකම**

- දිවයින පුරා අපගේ පුළුල් පැතිරීමත් සමඟ, සමාජ සත්කාර කටයුතු තුළින් ප්‍රජා සංවර්ධනය තුළ සහභාගිවීම මහජන මෙහෙවර ප්‍රධාන සංකල්පය යටතේ අපගේ ආයතනික සන්නාමය ශක්තිමත් කිරීමට සහය වී ඇත.
- ආර්ථිකයේ ප්‍රතිසාධන ගමන්මඟ සමඟ, සිය පුළුල් ශාඛා ජාලය සහ සේවා මධ්‍යස්ථාන හරහා ප්‍රජාවගේ ලඟාවීම තවදුරටත් මනාව ස්ථානගත කර ඇති අතර, තරුණ සංවර්ධනය සඳහා ග්‍රාමීය ප්‍රජාව වෙත විනිවිදව යමින් කාන්තා ව්‍යවසායිකාවන්ට තවදුරටත් සහය ලබා දේ.
- සමස්ත ආර්ථික පරිහානිය ජන සංක්‍රමණය සහ බුද්ධිගලනය හේතුවෙන් පිරිවැය සම්පත් ලබාගැනීමත් ඉහළ යාමත් ව්‍යාපාති කෙරෙහි අඛණ්ඩව බලපා ඇත.

ආර්ථික වටිනාකම

රු. බිලියන 10.2ක ණය සංවර්ධන ව්‍යාපාර 23,303කට බෙදාහරින ලදී

ගනුදෙනුකාර වටිනාකම

සන්නාම වටිනාකම වැඩිකරන සමාජීය දැනුවත් ආයතනයක් ලෙස දෘශ්‍යතාව

සේවක වටිනාකම

ස්වේච්ඡා අවස්ථාවන්

සමාජීය වටිනාකම

ප්‍රජා සංවර්ධනය

ප්‍රාග්ධන සම්බන්ධතා

මූල්‍ය ප්‍රාග්ධනය

බැංකුවේ මූල්‍ය ප්‍රාග්ධනයේ කොටසක් තරුණ හා කාන්තා ව්‍යවසායකත්ව සහාය සඳහා විශේෂ අවධාරණයක් සමඟ ප්‍රජා සංවර්ධනය තුළ විචක්ෂණව ආයෝජනය කර ඇත.

මානව ප්‍රාග්ධනය

බැංකුවේ තිරසාර ප්‍රතිපත්ති සහ වගකීම් වඩාත් පුළුල් ප්‍රජාවක් කරා හුවමාරු කිරීම තුළින් අනෝන්‍ය ප්‍රතිලාභී හවුල්කාරත්වයන් සඳහා අපගේ පාර්ශ්වකරුවන් සමඟ වඩා ශක්තිමත් බැඳීම් නිර්මාණය කරයි.

බුද්ධිමය ප්‍රාග්ධනය

මහජන මෙහෙවර සන්නාමය යටතේ වන CSR කටයුතු, ප්‍රජා මූල ව්‍යාපෘති හරහා ප්‍රතිරූපය වැඩි කරන අතර, මූල්‍ය කළමනාකරණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ දැනුම හුවමාරුව තුළින් ලාභදායී ව්‍යාපාරවල නියැලීමට සිය හැකියාව ශක්තිමත් කරයි.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

ඩිජිටල්කරණය සහ ස්වයං-බැංකු ඒකක දුර්ස්ථ ප්‍රජාවන් සඳහා පහසු සහ පිවිසියහැකි බැංකු සේවාවන් අඛණ්ඩව පිරිනමන අතර ඒ තුළින් බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය වැඩිකර, සිය ජීවනෝපාය ව්‍යාපාරවල ප්‍රගතියෙහි දෘශ්‍යමාන හවුල්කරු බවට පත්වේ.

ස්වභාවික ප්‍රාග්ධනය

ඩිජිටල්කරණය සහ කඩදාසි රහිත මෙහෙයුම් සංකල්ප අපගේ ව්‍යාපාරික සංස්කෘතිවලට ශක්තිමත්ව ඇතුළත් කරන අතර, ඉන් ස්වභාවික ප්‍රාග්ධනය සුරක්ෂිත කර, තිරසාර අනාගතයක් ගොඩනැගීම කරා දායක වේ. 2024 දී ගිණුම් විවෘත කිරීම සහ විද්‍යුත් ප්‍රකාශන විකල්ප දැඩි ලෙස වැඩි වීමත් සමඟ ප්‍රජාව වෙත මුදල් ගලායාම සැලකිය යුතු ලෙස සිදුවී ඇත.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය

දිළිඳුකම පිටු දැකීම

ඉතුරුම් සහ මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සහ රැකියා උත්පාදනය තුළින් ප්‍රජාවන් තුළ දිළිඳුකම අඩු කිරීමට බැංකුව දායක වේ.

සාගින්න නොමැතිවීම

රටේ ආහාර දාමයට සහාය වන ගොවීන්ට සහ අනෙකුත් ආහාර නිෂ්පාදකයින්ට බැංකුව ණය පහසුකම් සපයයි.

යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම

ආයතනික සමාජ සත්කාරවල කොටසක් ලෙස බැංකුව රෝහල්වලට අරමුදල් සහ ද්‍රව්‍ය පරිත්‍යාග කරයි.

ගුණාත්මක අධ්‍යාපනය

බැංකුව පාසල් පොත් පරිත්‍යාග කරමින් අධ්‍යාපනයට සහය වේ.

පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

බැංකුව ග්‍රාමීය පාසල්වලට පානීය ජලය සැපයීම සඳහා විශේෂයෙන් වෙන් වූ සමාජ සත්කාර ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය

බැංකුව ග්‍රාමීය පාසල් සඳහා සූර්ය බලශක්තිය පහසුකම ලබා දේ.

අරමුණු සඳහා හවුල්කාරිත්වය

ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘති පැවැත්වීම සඳහා බැංකුව විවිධ රාජ්‍ය සහ වෙනත් ආයතන සමඟ හවුල් වේ.

ප්‍රජා සහභාගිත්වය

GRI 413-1

වර්ගය	ආයෝජනය රු.මි.	ව්‍යාපෘති ගණන	ප්‍රතිඵලය
සංස්කෘතික හා ආගමික	24.7	22	ප්‍රජාවන් අතර ජනවාර්ගික හා ආගමික එකමුතුව ප්‍රවර්ධනය කිරීම
අධ්‍යාපනය	2.4	04	නව ආකාරයේ ඉගෙනුම් හා අර්ථවත් සහභාගිත්වය සඳහා අනාගත පරපුර සවිබලගැන්වීම
සෞඛ්‍ය	8.9	03	නිරෝගී ජාතියක් සඳහා සෞඛ්‍ය, දීර්ඝායුස සහ මාතෘ සහ ළමා ආරක්ෂාව සහතික කිරීම

ආයතනික සමාජ වගකීම් (CSR) වැඩසටහන්

මහජන මෙහෙවර යනු අපගේ සමාජ සත්කාරක වැඩසටහනෙන් ක්‍රියාත්මක කරන ප්‍රධාන සංකල්පය වේ. අපගේ විශාල සම්පත් සහ දැවැන්ත ජාලයේ වාසිය ලබා ගනිමින්, සහය, සවිබලගැන්වීම සහ බලාපොරොත්තුව පිරිනමමින් අපගේ ප්‍රජාවන්ගේ හදවතේ ඇති ගැටළු අපි විසඳමු. බැංකුව සේවය කරන වාතාවරණය සහ ප්‍රජාවන් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරමින්, අපි ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට සේවය කරන අතර, එහිදී මූල්‍ය යහපැවැත්ම සඳහා මධ්‍යස්ථානයක් ලෙස, බැංකුවට සහජ පැවැත්මක් ඇත.

අපි ප්‍රධාන වැඩසටහන් කිහිපයක ආයෝජනය කළ අතර ඉන් ප්‍රජාවගේ ජීවිතය කෙරෙහි පුළුල් හා අර්ථවත් බලපෑමක් නිර්මාණය කරයි. බැංකුවේ බෞද්ධ සංගමය, හින්දු සංගමය, මුස්ලිම් එකතුව සහ ක්‍රිස්තියානි සංගමය ප්‍රජාවට සහ එකිනෙකාට සහය වෙමින් විවිධ සමාජ සත්කාර වැඩසටහන්වල සහභාගි වී ඇති අතර, යම් තිරසාර ආයතනයක තීරණාත්මක අංගයක් වන ආගමික හා ජනවාර්ගික එකමුතුව ඉන් විදහා දක්වයි.

සංස්කෘතික හා ආගමික බැඳීම

මහනුවර ඇසළ පෙරහැරට අනුග්‍රහය 2024

ශ්‍රී ලංකාවේ අති විශිෂ්ට සංස්කෘතිය සුරක්ෂිත කර ගැනීමට දායක වෙමින්, 2024 දී චෛතිහාසික සහ ලොව පිළිගත් මහනුවර ඇසළ පෙරහැරට අනුග්‍රහය දක්වා ඇත. වඩාත් ප්‍රචලිත සංස්කෘතික උත්සවයක් වන මේ සඳහා දේශීය සහ ජාත්‍යන්තර නරඹන්නන් විශාල වශයෙන් මහනුවරට පැමිණෙන අතර, සංචාරක ඉපයීම් වැඩිකර ලෝක මට්ටමෙන් ශ්‍රී ලංකාවේ සංස්කෘතික වටිනාකම සැලකියයුතු ලෙස වැඩි කරයි.

මහජන බැංකුව මහනුවර ඇසළ පෙරහැර සඳහා අනුග්‍රහකත්වය පිරිනමයි.

පිංකම් මාලාවක් සමඟ අනුරාධපුරයේ පොසොන් පෝය සැමරීම

මහජන බැංකුව සිය ජාතික හා ආගමික සම්ප්‍රදායන් කෙරෙහි ඇති අඛණ්ඩ කැපවීම පෙන්නුම් කරමින්, පොසොන් පොහොය නිමිත්තෙන් අනුරාධපුරයේ දී පිංකම් මාලාවක් සංවිධානය කළේය. මෙහි මුලපිරීම් ලෙස, බැංකුව අඛණ්ඩව 41 වන වසරටත් වාර්ෂික දානමය පුණ්‍යකර්මය (හීල් දානය) පවත්වන ලද අතර, පූජනීය ජය ශ්‍රී මහා බෝධි පරිශ්‍රයේ සිල් සමාදන් වූ 30,000 කට අධික බැතිමතුන්ට ආහාර ලබා දුන්නේය.

මීට අමතරව, 18 වන වසරටත්, මහජන බැංකුව විසින් චෛතිහාසික රුවන්වැලි මහා සෑයේ පැවති ආකර්ෂනීය භක්ති ගීත ප්‍රසංග යක් වන "පොසොන් බොදු ගී සරණිය" ඉදිරිපත් කරන ලදී. මෙම උත්සවය සංස්කෘතික අගය කිරීම පෝෂණය කිරීමට සහ බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කලාත්මක කුසලතා ප්‍රදර්ශනය කිරීම සඳහා සංවිධානය කරන ලදි. මහජන බැංකු කාර්ය මණ්ඩලය සමඟ නිවත්තකවේතිය මහා විද්‍යාලයේ සිසුන් විසින් ගායනා කළ බොදු ගී සමඟ ප්‍රවීණ සංගීතඥ කරුණාරත්න විජේවර්ධන විසින් මෙම ප්‍රසංගය මෙහෙයවන ලදී.

සමස්ත වැඩසටහන මහජන බැංකුවේ අනුරාධපුර ප්‍රාදේශිය කාර්යාලය විසින් සංවිධානය කළ අතර, රටේ ආගමික සහ සංස්කෘතික උරුමය නගා සිටුවීමට බැංකුවේ කැපවීම ශක්තිමත් කරන ලදී.

පූජනීය ජය ශ්‍රී මහා බෝධියේදී නව ආරක්ෂක මුරපොළ පරිත්‍යාගය

මහජන මෙහෙවර වැඩසටහන තුළින් ආයතනික සමාජ වගකීම් කරා සිය අඛණ්ඩ බැඳීමේ කොටසක් ලෙස, අනුරාධපුර පූජනීය ජය ශ්‍රී මහා බෝධි පරිශ්‍රය නැරඹීමට පැමිණෙන බැතිමතුන්ගේ ආරක්ෂාව වැඩි කිරීම සඳහා අලුතින් ඉදිකළ මුර පොලවල් දෙකක් මහජන බැංකුව මෑතදී පරිත්‍යාග කළේය. ඊට අමතරව, නරඹන්නන් සඳහා ආරක්ෂක ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ස්ථාපිත කිරීමට උසස් තත්ත්වයේ ස්කෑනර් තුනක් බැංකුව ලබාදුන්නේය.

මහජන බැංකුව ආරක්ෂක මුරපොල ඉදිකිරීම සඳහා සම්පූර්ණයෙන් මුදල් යොදාවන ලද අතර, ශ්‍රී ලංකා යුධ හමුදාව ඉදිකිරීම් කාර්යය භාරග නිමින් මෙයට දායක විය. ප්‍රජාවට ප්‍රතිලාභ ලැබෙන ජාතික සහ ආගමික උත්සාහයන්ට සහයවීමට බැංකුවේ ඇති අඛණ්ඩ කැපවීම මෙම වැඩසටහනෙන් පිළිබිඹු කරයි.

මහජන බැංකුව පූජනීය ශ්‍රී මහා බෝධියට නව ආරක්ෂක මුරපොල පරිත්‍යාග කිරීම.

තරුණ නිපුනතා සංවර්ධනය

හෙටදින නවෝත්පාදකයින් සවිබලගැන්වීම තරුණ නිපුනතා සංවර්ධන ව්‍යාපාතියක් වන අතර, එය සර්වෝදය සංවිධානය සමඟ සහයෝගිත්වයෙන් පවත්වන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ තරුණයින් අනාගතයේ වැඩිහිටියන් ලෙස පියවර නඟන විට, ඔවුන් ලාභදායී සහ තිරසාර ආර්ථික කටයුතුවල සහභාගිකරවීමට සහ ශ්‍රමබලකායට සූදානම් කිරීමට ඔවුන් සන්නද්ධ කිරීමයි.

සෞඛ්‍ය සේවා ඉහළ නැංවීම

ශ්‍රී ලංකා ජාතික රෝහලේ (NHSL) ළමා හෘද රෝග වාට්ටුව ප්‍රතිසංස්කරණය කිරීම

මහජන බැංකුව සිය මහජන මෙහෙවර CSR ළමා වැඩසටහන යටතේ, කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ (NHSL) ළමා හෘද රෝග වාට්ටුව (1 වාට්ටුව) ප්‍රතිසංස්කරණය කිරීම සාර්ථකව අවසන් කර ඇත. මෙම නවීකරණය ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට මහජන බැංකුවේ දිගුකාලීන කැපවීම තුළ සැලකියයුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

මහජන බැංකුව පළමුවෙන්ම 1999 දී ශ්‍රී ලංකා ජාතික රෝහලේ (NHSL) හෘද රෝග වාට්ටුවට පරිත්‍යාග කර ඇත. රොහලේ වෙනස්වන අවශ්‍යතා හඳුනා ගනිමින්, බලධාරීන් හදවත් රෝග ශල්‍යකර්ම ඒකකය V මෙම වාට්ටුවේ නැවත ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ අතර, එහි පහසුකම නවීන ප්‍රමිතිවලට උසස් කිරීමට බැංකුවේ සහය අපේක්ෂා කර තිබුණි.

අලුතින් ප්‍රතිසංස්කරණය කළ ඒකකය තීරණාත්මක සෞඛ්‍ය සේවා සඳහා වර්ධනීය ඉල්ලුම සපුරාලමින් බයිපාස්, කපාට, සහ ධමණි පිළිබඳ ශල්‍යකර්ම සඳහා පහසුකම් ලබා දෙමින් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. මෙම වැඩසටහනින් ජාතියේ යහපැවැත්ව සඳහා වෛද්‍ය යටිතල පහසුකම් වැඩි කිරීමට බැංකුවේ කැපවීම නැවත තහවුරු කරයි.

මහජන බැංකු ශ්‍රී ලංකා ජාතික රෝහලෙ හෘද රෝග වාට්ටුව ප්‍රතිසංස්කරණය කිරීම.

විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින් සඳහා සීමාවාසික පුහුණුව

මහජන බැංකුව රජයේ සහ පුද්ගලික ආයතන ඇතුළුව විශ්ව විද්‍යාල 21ක් සමඟ අවබොධතා ගිවිසුමක් අත්සන් කර ඇත. මෙහි අරමුණ වන්නේ උපාධි අපේක්ෂකයින්ට සිය උපාධි වැඩසටහනේ කොටසක් ලෙස සීමාවාසික පුහුණුව පිරිනැමීමයි. මෙම වැඩසටහනින් අරමුණු කරන්නේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ සිය රැකියා අවස්ථාවන් වැඩි කර ගැනීමට සිසුන්ට අත්‍යවශ්‍ය නිපුනතා, සහ ක්ෂේත්‍රයේ දැනුමෙන් ඔවුන් සන්නද්ධ කිරීමයි.

2024 දී, උපාධි අපේක්ෂකයින් 243 ක් සාර්ථකව ඔවුන්ගේ සීමාවාසිකත්වය සම්පූර්ණ කළ අතර, අනාගත වෘත්තිකයින් පෝෂණය කිරීමේ බැංකුවේ කැපවීම බල ගන්වමින් වසර පුරා මෙම වැඩසටහනින් සිසුන් 525ක් ප්‍රතිලාභ ලබා ඇත.

පාරිසරික වගකීම් සහගතබව

පාරිසරික භාරකාරත්වය බැංකුවේ දැඩි අවධානයක්ව පවතී. පෙව විවිධත්වය සංරක්ෂණය, පරිසර දූෂණය අවම කිරීම, පුනර්ජනනීය බලශක්තිය දියුණු කිරීම, වැසිජලය භාවිතා කිරීම සහ හරිත හා කාලගුණ මූල්‍ය තුළ මතුවන නායකත්වය, යන මේ සියලුම දෑ නවින සංවර්ධනයන් වන අතර, ස්වභාවික ප්‍රාග්ධනය ඉදිරි පරම්පරාව සඳහා චිරස්ථායී කරන බව සහතික කරමින් සියලුම මානව-භූගෝල ප්‍රපංචවලින් පරිසරය ආරක්ෂා කරන බව ඉන් සහතික කරයි.

ප්‍රජා පාදක සංවර්ධන ණය ප්‍රදානය

GRI 203-1

	2024 දෙසැම්බර් අවසානයට			
	බැංකුව විසින් අරමුදල් සැපයීම		ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම හරහා අරමුදල් සැපයීම	
	ණය සංඛ්‍යාව	හිඟ මුදල රු.මි.	ණය සංඛ්‍යාව	හිඟ මුදල රු.මි.
කෘෂිකාර්මික	4,420	4,230.75	10,382	3,427.87
වාණිජ	1,881	1,070.91	339	273.62
පාරිභෝගික	17	13.46	-	-
මූල්‍ය	45	13.8	1	0.32
නිවාස සහ දේපල සංවර්ධනය	52	17.87	6	1.37
කර්මාන්ත	360	72.69	178	43.64
වෙනත් ආර්ථික කටයුතු	4,405	675.18	819	109.94
සේවා	254	146.16	104	24.97
සංචාරක	10	7.50	30	84.42
මුළු එකතුව	11,444	6,248.32	11,859	3,966.15

වක්‍ර ආර්ථික බලපෑම

GRI 203-2

ජාතියේ ප්‍රමුඛ මූල්‍ය ආයතනය ලෙස, බැංකුව සිය පරාර්ථකාමී වැඩසටහන් තුළින් ආර්ථිකය සහ යහපැවැත්ම පෝෂණය කිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. බැංකුව විශ්‍රාම වැටුප් ලබා දීම, විශ්වවිද්‍යාල ගාස්තු ගෙවීම සහ අධ්‍යපනිකයින්ගේ වැටුප් ගෙවීම වැනි අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ලබන්නාට කිසිදු වියදමක් නොමැතිව පහසුකම් සැලසීම සිදු කරයි. එමෙන්ම, සිය ශාඛාවල මුදල් රැස්කිරීමට හැකියාව ඇති කරමින් "ශ්‍රී දළදා මාලිගාවේ බෞද්ධ සුබසාධන අරමුදල" ඇතුළුව පුනඃ ආයතන සඳහා බැංකුව සහය වේ.

මූල්‍ය සේවාවන්ට අමතරව, අපනයන වැඩි දියුණු කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය කිරීම, සමුපකාර අංශයේ ආර්ථික පුනර්ජීවනයට මහජන බැංකුව සක්‍රීයව දායක වේ. බැංකුව වත්කම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ආර්ථික පුනර්ජීවනය පිළිබඳ උපායමාර්ගික, ප්‍රවීන මඟපෙන්වීම සමඟ ව්‍යාපාරවලට සහය වෙමින් ප්‍රාදේශීය ණය ඒකක වෙත මූල්‍ය සහය ලබා දේ.

බැංකුවේ CSR වැඩසටහන් ආසන්න බලපෑමෙන් ඉදිරියට පුළුල් කරමින්, දිගුකාලීන ආර්ථික ප්‍රගතිය අත්විඳීමට නිපුනතා සංවර්ධනය, හැකියා ගෙඩනැගීම සහ තරුණ සවිබල ගැන්වීම පෝෂණය කරයි. ඊට අමතරව, තිරසාරභාවය සහ සංස්කෘතික කටයුතු සඳහා බැංකුවේ සහය අන්තර් ප්‍රජා එකමුතුව ශක්තිමත් කරන අතර, සමාජීය විෂමතා අඩුකර සහජීවනයෙන් යුත්, දරාගත හැකි සමාජයක් ප්‍රවර්ධනය කරයි.

2025 සහ ඉන් ඉදිරියට

අපි අනාගතය සඳහා අර්ථවත් සහ බලපෑම්සහගත ආකාරයෙන් ප්‍රජා සංවර්ධනය සහ CSR වැඩසටහන් කරගෙන යන්නෙමු. මහජන සුභසාධනය කේන්ද්‍රය කරගත් බැංකුවක් ලෙස මෙය අපගේ තිරසාර මෙහෙයුම්වල ආවේනික අංගයකි, අපගේ විශාල ශාඛා ජාලය ජාතියේ පදනම වන, ග්‍රාමීය ප්‍රජාවන් අතර මුල්බැසගෙන ඇති අතර, ආයතනික සහ නව ව්‍යාපාරවල ගම්‍යතාවය උපයෝගී කර ගැනීම සඳහා අපගේ අපේක්ෂිත උත්සාහය, අපගේ ප්‍රජාවන්ට ආර්ථික වශයෙන් ශක්තිමත් වීමට සහ සමගියෙන් ඒකාබද්ධ වීමට සේවය කිරීම සඳහා ජයග්‍රාහී සංයෝජනයකි.

ස්වභාවික ප්‍රාග්ධනය

අපගේ ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීමේදී ව්‍යාපාරය තුළ සොභාදහමේ ත්‍යාගයක් වන සීමිත සම්පත්වල වගකීම්සහගත පරිභෝජනය වාර්තාවේ මෙම කොටස තුළ සංක්ෂිප්ත කර ඇත. තිරසාර සංවර්ධනයට පදනම වන ඉන් ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම තහවුරු කරයි.

සුවිශේෂී අවස්ථා

- හරිත මූල්‍යකරණයට පහසුකම් ලෙස රු. බිලියන 4ක් ලබාදී ඇත.
- පුනර්ජනනීය බලශක්තිය භාවිතය තුළ ශාඛා 73ක සූර්ය කෝෂ සවිකළ අතර ජාතික පද්ධතිය මත ඇති බර මෙ.වො. 2.54කින් අඩුකර ඇත.
- ජල පරිභෝජනය 4,540.0 M^3 කින් අඩුකර ඇත.
- GHG විමෝචන 1,645.18 ton$C0_2e$ කින් අඩුකර ඇත.

අපගේ ප්‍රවේශය

ස්වභාවික ප්‍රාග්ධනයේ වටිනාකම පිළිගනිමින්, ලාභදායී ව්‍යාපාරයක් සහ තිරසාර පරිසරයක් අතර එකමුතු සම්බන්ධතාවක් පෝෂණය කිරීමට අපගේ මෙහෙයුම් රාමුවට ඇතුළත් කරමින්, අපගේ ප්‍රතිපත්ති පාලන තන්ත්‍රය තුළට ආරක්ෂණය සහ සංරක්ෂණය අපි දැඩිව ඇතුළත් කර ගනිමු. රටතුළ විශාලතම වාණිජ බැංකුව ලෙස, කෘෂිකර්මාන්තය, අභ්‍යන්තර ජල මාර්ග සහ සාගරය ඇතුළුව පෘථිවියට සමීපව සම්බන්ධ කර්මාන්ත, ව්‍යාපාර සහ පුද්ගලයින් අපි ප්‍රමුඛ කරමු. ණය දීමේ ප්‍රතිපත්තිවල සිට පරිපාලන තීරණ දක්වා, සහ නවීන ඩිජිටල් බැංකුකරණ විසඳුම්වල සැලකියයුතු ලෙස ආයෝජනය කරමින්, සහ හරිත මූල්‍යකරණය පිළිබඳ අවධානය යොමු කරමින්, බැංකුව එහි සියලුම මෙහෙයුම් යාන්ත්‍රණවල වගකීම්සහගත භාවිතය පිළිබඳ සංකල්පය තවදුරටත් ප්‍රමුඛ කරයි. “මහජන මෙහෙවර” ලෙස හැඳින්වෙන බැංකුවේ සමාජ වගකීම් (CSR) වැඩසටහන් තුළට අපගේ මිහිතලය සහ එහි ස්වභාවික ප්‍රාග්ධනය සංරක්ෂණය සඳහා කටයුතු කරන කාර්යයන් කිහිපයක් ඇතුළත්ය.

වැදගත් තේමා

සමාජ ආර්ථික බලපෑම

පාරිසරික බලපෑම

අවස්ථා | **අභියෝග** | **නිර්මාණය කළ වටිනාකම**

- නවීන ඩිජිටල් බැංකුකරණ විසඳුම් අඛණ්ඩව කරගෙන යාම සහ ඒ තුළින් GenZ ගනුදෙනුකරුවන් විශාල කොටසක් ආකර්ෂණය.
- මාර්ගගත රැස්වීම් වේදිකා, කාලය ඉතිරි කිරීම සහ ප්‍රවාහනය සඳහා පොසිල ඉන්ධන භාවිතය අඩු කරයි.
- පරිසර පද්ධතිය සඳහා වගකීම ඇතුළත් බැංකුකරණ විසඳුම් සපයන්නෙක් ලෙස, සන්නාම ගොඩනැගීම.
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පරිහානිය හරිත ශාඛා ගොඩනැගීම ප්‍රමාද කරයි.
- තොරතුරු තාක්ෂණ ඩිජිටල් තාක්ෂණය වර්ධනය යම් ප්‍රමාණයකින් තොරතුරු තාක්ෂණ ඩිජිටල් අපද්‍රව්‍යවලට දායක වේ.

- කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය කි.ග්‍රෑ. 2,122
- ප්‍රාදේශීය කාර්යාල 73ක සූර්ය ස්ථාපනය තුළින් මො.වො. 2.539 ක සූර්ය බලශක්ති හැකියාව ජාතික පද්ධතියට ලබා දේ.

- සේවකයෙකුට බලශක්ති තීව්‍රතාව 8.0 GJ

ප්‍රාග්ධන සම්බන්ධතා

මූල්‍ය ප්‍රාග්ධනය

හරිත බලශක්තියට පරිවර්තනය ජාතික විදුලි භාවිතාව අඩුකරයි.

ජලය හා කඩදාසි භාවිතය තුළ අඩුකිරීම්වලින් සමාන ප්‍රතිලාභ අපේක්ෂා කළ හැකිය

හරිත මූල්‍යකරණ ව්‍යාපෘති සඳහා ලබාදුන් පහසුකම් අක්‍රීය ණය නොමැතිව පොලී ආදායම තුළ යහපත් ලාභයක් ඇති කර ඇත – රු. බිලියන 4.89ක් සහ විවැනි ව්‍යාපෘති මෙ.වො. 37.12ක් ආවරණය කරනු ලැබේ.

මානව ප්‍රාග්ධනය

අපගේ පරිසරය රැකබලා ගැනීමේ මුල් බැසගත් සංස්කෘතියක් දක්නට තිබියදී, අපගේ සේවකයින්, ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිවලට සහභාගී වෙමින් බලශක්ති පරිභෝජනය, අපද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වගකීමෙන් කටයුතු කිරීම නිසා තිරසාරභාවය සඳහා ප්‍රවර්ධකයෝ වූහ.

බුද්ධිමය ප්‍රාග්ධනය

මහජන මෙහෙවර අඛණ්ඩව සන්නාම කීර්තිනාමය වැඩි කරන අතර, එය 2024 දී බුද්ධි ගලනය හා ජනතා සංක්‍රමණය තුළ නව දක්ෂයින් ආකර්ෂණය කර ගැනීමට උත්ප්‍රේරකයක් විය.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

සූර්ය බලශක්තිය උපරිම කරන අතරම සූර්ය බලය සහ LED ආලෝකකරණය භාවිතා කරමින් අපි බැංකු ශාඛා හරිත ගොඩනැගිලි බවට පරිවර්තනය කිරීම දිගටම කරගෙන යමින් සිටිමු. අපි ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සමාජයේ ප්ලැටිනම් (GBCSL) සමාජිකයෙක් වන අතර, සියලුම නව ශාඛා ඔවුන්ගේ හරිත SL ශ්‍රේණිගතකරණ පද්ධතියේ ප්‍රමිතීන් සපුරාලමින් ඉදිකිරීම සිදු කෙරේ.

සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය

වසර අවසානය දක්වා, ද්‍රවශීලතා මට්ටම් අතිරික්ත වූ බැවින් බැංකුවේ ණය දීමේ හැකියාව දැඩිව පුළුල් කරන ලදී. බැංකුව හරිත ව්‍යාපෘති සඳහා ණය දීමට සහ ව්‍යාපාර සමාජ වගකීම් කටයුතුවල (CSR) කටයුතු වල යෙදීමට සමත් විය.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකත්වය

පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

බැංකුව සිය පාරිසරික කැපවීම්වල කොටසක් ලෙස ජලය සංරක්ෂණය කරයි.

දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය

බැංකු ශාඛා ගොඩනැගිලි හරිතකරණය.

තිරසාර නගර සහ ප්‍රජාවන්

දුරස්ථ ප්‍රදේශවල අඩු වරප්‍රසාද නොලත් පාසල් සඳහා පිරිසිදු පානීය ජලය සහ සූර්ය බලශක්තිය සැපයීම සඳහා බැංකුව ප්‍රජා ව්‍යාපෘති හරහා තිරසාර ප්‍රජාවන් ප්‍රවර්ධනය කරයි.

වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය

ඩිජිටල් විසඳුම් අනුගමනය කිරීමෙන් සහ සියලු ගොඩනැගිලිවල විදුලිය භාවිතය සංරක්ෂණය කිරීමෙන් කඩදාසි භාවිතය අවම කිරීම මගින් බැංකුව සම්පත් සංරක්ෂණය කරයි.

දේශගුණික ක්‍රියාව

බැංකුව එහි GHG විමෝචනය නිරීක්ෂණය කරයි.

ස්වභාවික ප්‍රාග්ධනයේ වගකීම්සහගත භාවිතය සඳහා වැඩසටහන්

හරිත මූල්‍යකරණය

අනාගත අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කළ නිෂ්පාදන ලෙස, බැංකුව විසින් දියත් කළ හරිත මූල්‍ය උපකරණ සඳහා උත්සාහය සහ ව්‍යාපාර කිරීමේ තිරසාර ක්‍රම හඳුන්වාදීම සඳහා පරිසර නායකත්වය පෙරමුණ ගැනීමට බැංකුව දෙයාකාරයකින් කටයුතු කරයි. ගනුදෙනුකරුවන් අප මෙන්ම පරිසරයේ සක්‍රීය පාරිභෝගිකයින් වන බැවින් අපගේ ස්ථාපිත හරිත මූලධර්ම අපගේ ගනුදෙනුකාර පදනම සමඟ හුවමාරු කර ගැනීමට උපකරණයක් ලෙස බැංකුව හරිත මූල්‍ය ක්‍රියාමාර්ග දකී.

බැංකුව සූර්යබල ස්ථාපනය සඳහා රු. බිලියන 3.6ක් ලබාදී ඇති අතර විවිධ හරිත ව්‍යාපෘති සඳහා තවත් රු. මිලියන 462ක් ලබා දී ඇත. මෙම හරිත ව්‍යාපෘතිවලට පෛවම්තික මූල්‍යකරණය, හරිතාගාර, අපද්‍රව්‍ය කළමනාකරණය, සහ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය ඇතුළත්ය. වැඩි හරිත ව්‍යාප්තියක් ඇති නිෂ්පාදන බෙදාහැරීම මඟින්, බැංකුව පරිසරයේ වගකීම් භාරගෙන, අපගේ පාරිභෝගිකයන්ට ඔවුන්ගේ වාණිජ ක්‍රියාකාරකම් සහ ජීවන රටාවල හරිත ක්‍රම භාවිතා කිරීමට සහ ඒවා අනුගමනය කිරීමට දිරිගන්වයි.

අපගේ ප්‍රතිපත්තියට අනුකූලව, 2024 දී ගනුදෙනුකරුවන් 19 දෙනෙකුට රු. බිලියන 3.6ක හරිත ණය ලබාදී ඇත.

බලශක්ති කළමනාකරණය

GRI 302-1, 3

අපි 2024 දී සූර්ය කෝෂ ශාඛා 64ක ස්ථාපනය කළෙමු. වර්තමානයේ, අපගේ ශාඛා 747න් 73ක් සූර්ය බලශක්තියට පරිවර්තනය කර ඇති අතර, එමඟින් අපගේ මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය අඩුකර ඇත. ජාතික පද්ධතිය මත බර අවම කරමින් මුළු බලශක්ති උත්පාදනය මෙ.වො. 2.539ක් විය.

බැංකුව බලශක්ති කළමනාකරණය සඳහා අපගේ බැඳීම වැඩි කිරීමට 2023 දී ආරම්භ කළ මූලපිරීම් කිහිපයක් ඉදිරියට කරගෙන ගියේය.

- බලශක්ති භාවිතය අවම කිරීම සඳහා සියලුම නව යන්ත්‍ර සූත්‍ර සහ ඉලෙක්ට්‍රොනික උපකරණවල "බලශක්ති කාර්යක්ෂමතා අනුපාතය" සලකා බැලීම
- බලශක්තිය ඉතිරි කර ගැනීම සඳහා ආලෝකය සඳහා LED බල්බ යොදාගැනීම
- බලශක්ති කාර්යක්ෂමතා තරු ශ්‍රේණිගත කිරීමක් සහිත තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම. ඉන්වර්ටර්-තාක්ෂණික බලශක්ති-කාර්යක්ෂම වායු සමීකරණ ස්ථාපනය කිරීම සහ නියමිත වේලාවට සේවා සැපයීම සහ අලුත්වැඩියා කිරීම හරහා දෝෂ වළක්වා ගනිමින් පවත්වා ගැනීම.
- පරිසර හිතකාමී ශීතකරණ භාවිතා කිරීම. දුරස්ථ නිරීක්ෂණ හැකියාවන් සහිත ශබ්ද රහිත අඩු විමෝචන සහ ඉන්ධන කාර්යක්ෂම ජනක යන්ත්‍ර ස්ථාපනය කිරීම.

බලශක්ති මූලාශ	බලශක්ති වර්ගය	පරිභෝජන මට්ටම (Giga Jules)
පුනර්ජනනීය	විදුලිය	6,235.70
පුනර්ජනනීය නොවන ඉන්ධන	පෙට්‍රල්	244.22
	ඩීසල්	2,292.98
එකතුව		8,772.90

බලශක්ති තීව්‍රතාවය සේවකයෙකුට -8.00 GJ

අපගේ කාබන් පාසටහන අඩු කිරීම

අපගේ ශාඛා ජාලය සූර්ය බලශක්තියට පරිවර්තනය කිරීමේ කටයුතුවල අපි උද්‍යෝගිමත්ව සහභාගි වන බැවින් අපගේ කාබන් පියසටහන අඩු කිරීම සඳහා අපි සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත්තෙමු. අපගේ කාබන් පියසටහන තවදුරටත් අඩු කිරීම සඳහා ඉදිරි වසරවලදී ද මෙය අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

කඩදාසි අඩුකිරීම සහ ප්‍රතිචක්‍රීයකරණය

බැංකුවේ ඩිජිටල් ධාවකය සහ දිවයින පුරා විහිදුන SBUs, Kiosks, ATMs සහ CDMs ජාලය හරහා බොහෝ ගනුදෙනුකරුවන් ශාඛා ජාලයේ කඩදාසි භාවිතය අඩු කිරීමේදී සැලකියයුතු ලෙස දායක වී ඇත. රහස්‍යගත ද්‍රව්‍ය හෝ ගනුදෙනුකාර දත්ත අඩංගු නොවන නිෂ්ඵල කඩදාසි මෙහෙයවීමට අපි බාහිර පාර්ශ්වයක් සමඟ කටයුතු කරන්නෙමු. යල්පැනපු ලේඛණ – විනම් සංරක්ෂිත ද්‍රව්‍ය-තීරුවලට කපා අනාගත සංසරණයෙන් විනාශ කරමු. තොරතුරු තාක්ෂණ අංශය දැනුම කළමනාකරණය, සාක්ෂි ස්ථාපනය පිළිබඳ ඩිජිටල්කළ සංස්කෘතියක් වැළඳගෙන ඇති බැවින්, අංශය විසින් පෙරමුණ ගත් අන්තර්ගත කළමනාකරණ පද්ධතියකට මූලික ලේඛනවල ඩිජිටල් සුරක්ෂිතාගාරයක් සමමුහුර්ත කරමින් පවතී.

2023 දී ප්‍රතිචක්‍රීයකරණය කළ කි.ග්‍රෑ. 4,432ට සාපේක්ෂව 2024 දී කි.ග්‍රෑ. 2,122ක් ප්‍රතිචක්‍රීයකරණය කරන ලදී.

අපද්‍රව්‍ය කළමනාකරණය

බැංකුව විසින් නිපදවන අපද්‍රව්‍යවලින් සැලකියයුතු ප්‍රමාණයක් සේවක ආහාර අපද්‍රව්‍ය, සහ කඩදාසි අපද්‍රව්‍ය වලින් ජනනය වන අතර ඒවා මහනගර හෝ නගර සභා සහ මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත තෙවන පාර්ශවීය ප්‍රතිචක්‍රීකරණ සේවා සපයන්නන් විසින් සහාය දක්වන රෙගුලාසිවලට අනුව බැහැර කෙරේ. අපගේ අපජලය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රෙගුලාසිවලට අනුකූලව බැහැර කරනු ලැබේ. විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ සේවා සපයන්නන් තෝරා ගැනීම සඳහා විනිවිද භාවයෙන් යුතු ටෙන්ඩර් ක්‍රියාවලියක් ද භාවිතා වේ.

වායු විමෝචන කළමනාකරණය

GRI 305-1, 2, 3, 4, 5

ISO 14064-1-2018 මූලධර්මවලට අනුව ලබාදෙන ලද GHG ප්‍රකාශනය මත පදනම්ව B-Advancy Certification Lanka Private Limited විසින් පවත්වන ලද ස්වාධීන තෙවන පාර්ශවීය සත්‍යාපනයක් වන, හරිතාගාර වායු සහතික කිරීම පිළිබඳ වලංගු කිරීම සහ සත්‍යාපනය කිරීම සඳහා මාර්ගෝපදේශයක් සහිත හරිතාගාර වායු පිරිවිතර පිළිබඳ ISO 14064-3: 2019 GHG සත්‍යාපනය බැංකුව සාක්ෂාත්කර ගෙන ඇත.

බැංකුව හරිතාගාර වායු (GHG) විමෝචනය, GHG ඉන්වෙන්ටරි, GHG වාර්තා, සහ වෙනත් සහය ලේඛණ ISO 14064-1:2018 අවශ්‍යතාවන්ට අනුකූල වී ඇති බව සහ ඒවා සංවර්ධනය කර ඇති බව සතුටින් වාර්තා කර සිටිමු. සත්‍යාපනය තුළ නිරීක්ෂණය වූ අනුකූල නොවීම් නොමැති අතර සත්‍යාපන ක්‍රියාවලිය තුළ වර්ධන 3ක් වාර්තා විය.

කාලගුණ වෙනස්වීම් සඳහා ක්‍රියාව

GRI 201-2

බැංකුව කාලගුණ වෙනස්වීම් කෙරෙහි සිය බලපෑම අවම කිරීමට මූලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කර ඇති අතර, සමාලෝචිත වසර තුළ චක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සමඟ පෙළ ගැසී ඇත.

ISO 14064-3: 2019 සඳහා සහතිකය

වාර්තාකරණ කාලසීමාව	01/01/2024 - 31/12/2024
සංවිධානය	මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, ශ්‍රී ලංකාව
ප්‍රකාශන අංකය	SL/OD/20231103
නිකුත් කළ දිනය	2025/01/28
සහතික කිරීමේ මට්ටම	සාධාරණාය
මුළු විමෝචනය	2150.23 ටොන් CO_2e
සෘජු විමෝචනය	294.14 ටොන් CO_2e
මුළු වක්‍ර විමෝචනය	1856.09 ටොන් CO_2e
බලශක්ති වක්‍ර විමෝචනය	868.49 ටොන් CO_2e
අනෙකුත් වක්‍ර විමෝචන	987.6 ටොන් CO_2e
පෙළපදනක විමෝචන:	-

- ටංග්ස්ටන් බල්බ වෙනුවට LED විදුලි පහන් සවි කිරීමට කටයුතු ක්‍රියාත්මක කිරීම
- පැරණි ඒවා වෙනුවට බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ දැමීමට ඉන්වර්ටර් සඳහා වායු සමීකරණ සවි කිරීම
- කාන්දුවීම් වළක්වා ගැනීම සඳහා බැංකුව CO_2 ගිනි නිවන උපකරණ අඛණ්ඩව නියාමනය කිරීම
- බැංකුවේ ප්‍රවාහන කටයුතු වලින් GHG විමෝචනය අවම කිරීම සඳහා සමාගම සතු වාහන සඳහා කාර්යක්ෂම මාර්ග සැලසුම් පද්ධතියක් බැංකුව විසින් ස්ථාපිත කර ඇත.
- අපද්‍රව්‍ය අවම කිරීම මගින් බැංකුවේ කාබන් පියසටහන අවම කිරීම සඳහා, බැංකු මෙහෙයුම්වලදී කඩදාසි භාවිතය අවම කිරීමට බැංකුව සියලු මූලපිරීම් ගෙන ඇත.
- පාරිසරික උද්‍යාන නඩත්තු කරමින් බැංකුව නව්‍ය තිරසාර ක්‍රියාමාර්ගයක් ආරම්භ කර ඇත.

GHG විමෝචන හඳුනාගැනීම සහ කළමනාකරණය

අදාළත්වය	තමන් විසින්ම හෝ වෙනත් ප්‍රභවයන් සමඟ ඒකාබද්ධව අපේක්ෂිත පරිශීලකයින්ගේ (උදා. පාරිභෝගිකයින්, සැපයුම්කරුවන්, ආයෝජකයින්, රජයන්, රාජ්‍ය නොවන සංවිධාන) අවශ්‍යතා සපුරාලීම සඳහා තෝරාගත යුතු වක්‍ර විමෝචන හෝ ඉවත් කිරීම් සලකා බැලීම.
සම්පූර්ණත්වය	සියලුම අදාළ මූලාශ්‍ර ඇතුළත් කිරීම සඳහා ඉන්වෙන්ටරියේ ඇතුළත් කළ යුතු වක්‍ර විමෝචන සහ ඉවත් කිරීම් සලකා බැලීම.
අනුකූලතාව	පරිශීලකයෙකුට අර්ථවත් සංසන්දනය කිරීම සඳහා වක්‍ර විමෝචන සහ ඉවත් කිරීම් ඇතුළත් කිරීම අවශ්‍යද යන්න සලකා බැලීම (උදා: බඩු තොගය තුළ GHG සම්බන්ධ තොරතුරු).
නිරවද්‍යතාවය	වක්‍ර විමෝචන ඇතුළත් කිරීම සහ ඉවත් කිරීම්, ඒවායින්ම හෝ වෙනත් ප්‍රභවයන් සමඟ ඒකාබද්ධ කිරීම අවශ්‍යද යන්න සලකා බැලීම, ඉන්වෙන්ටරි එකතුව සාධාරණ ලෙස අවිනිශ්චිතතාවයෙන් නිදහස් කිරීම සඳහා වැදගත් වේ.
විනිවිදභාවය	හෙළිදරව් කිරීම් සහ සාධාරණීකරණයකින් තොරව වක්‍ර විමෝචන සහ ඉවත් කිරීම් බැහැර කිරීම, සාධාරණ විශ්වාසයකින් යුතුව තීරණ ගැනීමට අපේක්ෂිත පරිශීලකයින්ට බාධාවක් වේද යන්න සලකා බැලීම.

සැලකියයුතු විමෝචන ඇගයීමට නිර්ණායක

විශාලත්වය	ප්‍රමාණාත්මකව සැලකිය යුතු යැයි උපකල්පනය කරන විමෝචන හෝ ඉවත් කිරීම්.
බලපෑම් මට්ටම	සංවිධානයට විමෝචනය සහ ඉවත් කිරීම් නිරීක්ෂණය කිරීමට සහ අඩු කිරීමට හැකියාව ඇති ප්‍රමාණය (උදා: බලශක්ති කාර්යක්ෂමතාව, පාරිසරික සැලසුම්, ගනුදෙනුකාර සහභාගීත්වය, යොමු නියමයන්).
අවදානම හෝ අවස්ථාව	සංවිධානයේ අවදානමට නිරාවරණය වීමට දායක වන විමෝචන හෝ ඉවත් කිරීම් (උදා: මූල්‍ය, නියාමන, සැපයුම් දාමය, නිෂ්පාදන සහ පාරිභෝගිකයින්, නඩු පැවරීම, කීර්තිනාම අවදානම් වැනි දේශගුණය ආශ්‍රිත අවදානම්) හෝ ව්‍යාපාර සඳහා එහි අවස්ථාව (උදා: නව වෙළෙඳපල, නව ව්‍යාපාර ආකෘතිය).
අංශ-විශේෂිත මගපෙන්වීම	අංශ-විශේෂිත මගපෙන්වීම මගින් සපයනු ලබන පරිදි GHG විමෝචනය ව්‍යාපාරික අංශය විසින් වැදගත් ලෙස සලකනු ලැබේ.
බාහිරින් ලබා ගැනීම	සාමාන්‍යයෙන් මූලික ව්‍යාපාරික කටයුතු වන බාහිරින් ලබා ගත් කටයුතු හේතුවෙන් ඇතිවන විමෝචන සහ ඉවත් කිරීම.
සේවක සහභාගිත්වය	බලශක්ති භාවිතය අඩු කිරීමට සේවකයින් පෙළඹවිය හැකි විමෝචනය හෝ දේශගුණික විපර්යාස පිළිබඳ කණ්ඩායම් හැඟීම (උදා: බලශක්ති සංරක්ෂණ දිරිගැන්වීම්, කාර්පූල් කිරීම, අභ්‍යන්තර කාබන් මිලකරණය)
වර්ගීකරණය 1 – සෘජු විමෝචනය සහ ඉවත් කිරීම්	ජෙනරේටරය සඳහා ඩීසල් LPG, වායුසමීකරණවලින් සහ ශීතකරණවලින් පහවයන GHG විමෝචන, ගිනි නිවීමේ උපකරණ වලින් පහවයන විමෝචන, සමාගමට අයත් වාහන, පාලිත වාහන
වර්ගීකරණය 2 – ආනයන බලශක්තියෙන් වක්‍ර විමෝචනය	ජාතික පද්ධතියෙන් මිලදී ගත් විදුලිය
වර්ගීකරණය 3 – ප්‍රවාහනයෙන් විමෝචනය	මිලදී ගත් භාණ්ඩ, ව්‍යාපාර සංචාර-ගුවන්, සේවක ප්‍රවාහනය

හරිතාගාර වායු (GHG) ඉන්වෙන්ටරි සාරාංශය 2024

විෂය පථය	විමෝචන මූලාශ	GHG විමෝචනය (ටොන් Co_2e)				මුළු විමෝචනය
		CO_2	CH_4	N_2O		tonCO2e
විෂය පථය 1	ස්ථාවර දහනය	18.19	0.05	0.01		18.26
සෘජු විමෝචනය	ජංගම දහනය	260.23	0.41	3.95		264.59
	පහවයන විමෝචන	0.02	-	-	11.28	11.30
	1 කාණ්ඩයේ එකතුව	278.44	0.46	3.96	11.28	294.14
විෂය පථය 2	මිලදී ගත් විදුලිය	868.49	-	-		868.49
වක්‍ර විමෝචනය	විෂය පථය 2 එකතුව	868.49	-	-		868.49
විෂය පථය 3	මිලදී ගත් භාණ්ඩ	0.06	0.0001	0.001		0.07
වෙනත් වක්‍ර විමෝචනය	ව්‍යාපාරික ගමන් - ගුවන්	37.58	0.003	0.19		37.77
	සේවක ගමනාගමනය	916.59	1.57	5.47		923.63
	විෂය පථය 3 එකතුව	954.23	1.57	5.66		961.47
වර්ගීකරණය 04	උපද්‍රව්‍ය උත්පාදනය	12.85	-	-		12.85
	4 කාණ්ඩයේ එකතුව	12.85	-	-		12.85
වර්ගීකරණය 06	සම්ප්‍රේෂණය සහ බෙදාහැරීමේ පාඩුව	8.87				8.87
	මිලදී ගත් ජලය	4.41				4.41
	6 කාණ්ඩයේ එකතුව	13.27				13.27
මුළු විමෝචන		2,127.297	2,031	9,627	11.278	2,150.23

සෘජු (විෂයය 1) GHG විමෝචන

දළ සෘජු (විෂය 1) GHG විමෝචනය සමාන මෙට්‍රික් ටොන්	ජෙනරේටරය සඳහා ඩීසල් - 3.21 tCO_2e CO_2 LPG - 15.04 tCO_2e සමාගමට අයත්/පාලිත වාහන සඳහා ඉන්ධන - 264.59 tCO_2e CO_2 ගිනි නිවීමේ උපකරණවලින් අහිමිවීම - 0.02 tCO_2e ශීතකාරක - 11.28 tCO_2e

බලශක්ති වක්‍ර (විෂය 2) GHG විමෝචන

දළ පිහිටීම මත පදනම් වූ වක්‍ර බලශක්ති (විෂය 2) CO_2 සමාන මෙට්‍රික් ටොන් GHG විමෝචනය	868.49 (tonCO2e)
මූලාශ්‍රය: https://www.energy.gov.lk/index.php/en/knowledge/resources/yourlife/carbon-footpr	

GHG විමෝචන සන්සන්දනය 2024 අනුව 2024 – හේතු

මූල්‍ය වර්ෂය	සමස්ත විමෝචනය ($tonCO_2e$)	01 කාණ්ඩයේ විමෝචනය ($tonCO_2e$)	02 කාණ්ඩයෙ විමෝචනය ($tonCO_2e$)	03 කාණ්ඩයෙ විමෝචනය ($tonCO_2e$)	04 කාණ්ඩයෙ විමෝචනය ($tonCO_2e$)	06 කාණ්ඩයෙ විමෝචනය ($tonCO_2e$)
2024	2,150.23	294.14	868.49	961.47	12.85	13.27
2023	2,011.45	303.16	798.13	896.75	0	13.4

සේවකයෙකුගේ GHG විමෝචන තීව්‍රතාව 2023 දී 5.39 $tonCO_2e$ පැවති අතර 2024 දී 2.56 $tonCO_2e$ ක් විය. වාර්තාකරණ වසර සඳහා GHG විමෝචනවල 2.83 $tonCO_2e$ සිට 5.39 $tonCO_2e$ දක්වා 2023ට සාපේක්ෂව මුළු විමෝචනවල අඩුවීමක් ඇත.

පාරිසරික තිරසාර ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි වගකීම්සහගත මෙහෙයුමක් තුළ සහභාගිවීමට අපි කැපවී සිටිමු. එය ප්‍රශස්ත බලශක්තිය, අපද්‍රව්‍ය, සහ සම්පත් කළමනාකරණයට හේතු වන අපගේ නිෂ්පාදන හා සේවාවන් හී කාර්යක්ෂමතාව වැඩි කිරීම තුළින් බැංකුවේ සමස්ත GHG (හරිතාගාර වායු) විමෝචන මූලිකවම අඩු කරයි.

ජල සංරක්ෂණය

GRI 303-5

වැසි ජලය රැස් කිරීම මේ වන විට ප්‍රධාන කාර්යාලය ඇතුළුව, විශේෂයෙන් වියළි ශුෂ්ක තත්ත්වයන් සහිත, ජල මූලාශ්‍ර රඳවා තබා ගැනීම හා නැවත භාවිතා කිරීම අවශ්‍ය වන වන්නි වැනි ප්‍රදේශවල ශාඛා බොහොමයක දැනට හඳුන්වා දී ඇත. 2024 දී, ප්‍රධාන කාර්යාලය 2023 දී පරිභෝජනය කළ 16,482 m^3 ට සාපේක්ෂව 2024 දී 11,942 m^3 පරිභෝජනය කර ඇත.

බැංකුව විසින් පාසිකුඩා සේවක පුහුණු මධ්‍යස්ථානය, අම්පාර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, සහ හක්මන ශාඛාව සහ කෑගල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලවල අප ජල කළමනාකරණ පිරියත ඉදිකර ඇත.

කාලගුණ වෙනස අවම කිරීම සඳහා ක්‍රියාව

අපගේ මිහිතලය රැකගැනීමට දායකවන කටයුතුවල අර්ථවත් අයුරින් සහභාගවීමේ ක්‍රම සහ මාර්ග ගවේශණය කරමින් අපගේ පරිසරයේ වඩා හොඳ භාරකරුවන් වීමට අපි උත්සාහ ගනිමු. එබැවින්, නැවත වනවගා කිරීමේ අභ්‍යාසයට අරමුදල්කරණය ශක්තිමත් සාධකයකි. වඩා පිරිසිදු වායුගෝලයක්, (පැතිරුනු කාබන් පැවැත්ම අඩු කිරීම) සහතික කිරීම සහ සංරක්ෂණ හා නැවත වගා කිරීමේ උත්සාහයන් මගින් ප්‍රගුණ කරනු ලබන අප වටා ඇති "හරිතාගාර" උණුසුම අඩු කිරීම සඳහා අපි ආරක්ෂක වියන් වලින් රටේ ධනය ශක්තිමත් කරමු, ඉදිරි පරම්පරාව සඳහා අපගේ මිහිතලය චිරස්ථායි කිරීමට නැවත වන වගාවේ නිපුනයින් වීමට අපි දැනුවත් උත්සාහයන් සිදු කරන බැවින් නැවත වන වගා උත්සාහයන්ට අරමුදල් යෙදීමේ මූලාශ්‍ර අපි ක්‍රමවත් කර ඇත.

අපගේ වනාන්තර නැවත පිළිසකර කරමින්, තිරසාර පරිසරයක් පිළිබඳ උනන්දු වන වගකීම්සහගත පාරිභෝගිකයින් ලෙස වඩා යහපත්, විශාල සහ මෘදු කාලගුණයක් අපි ප්‍රජාවන්ට ලබා දෙමු.

අනාගත දැක්ම

ශාඛා ජාලය පුරා හරිත ක්‍රියාත්මක කිරීම් අධීක්ෂණය කරන අපගේ චිකම සන්නාමය මගින් ක්‍රියාත්මක හරිත සංකල්පය පිළිබඳ සාකල්‍ය වෘත්තිකයින් වෙමින්, නව්‍යකරණ හරිත ව්‍යවහාර සමඟ අනාගතය ගොඩ නැගීමට අපගේ අවධානය යොමු කරන අතර, එය සම්පත් සුරැකීමට, බලශක්ති කාර්යක්ෂමතාව වැඩි කිරීමට සහ පාරිභෝජන භාණ්ඩ නැවත භාවිතා කිරීමට බලපෑම් කරනු ඇත.

අපි ISO 14064-1:2018 වැනි විශ්වීය ප්‍රමිති මගින් අනුබලය ලබා ඇති අතර, එය අපගේ හරිත සංකල්පවලට අනුකූලව අපගේ තිරසාර සන්නාමය අනුමත කර අපගේ තිරසාර උත්සාහයන් හිදී අපට සහය වේ.

අපි අපගේ සෑම පාර්ශ්වකරුවෙක්ම වඩා හරිත ක්‍රියාවන් සඳහා දිරි ගැන්වීමට අපි උත්සාහ දරන බැවින් හරිත මූල්‍ය සහ සැපයුම් දාමවල අපි තවදුරටත් සහභාගි වන්නෙමු.

පාලනය

178
අවදානම් කළමනාකරණ වාර්තාව

213
ආයතනික පාලනය

243
අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා

244
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පරිශ්‍රමික කමිටු වාර්තාව (BHRRC)

245
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව (BIRMC)

246
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු වාර්තාව (BECC)

247
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව (BNC)

248
අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු වාර්තාව

249
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටු වාර්තාව

250
අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ගික සැලසුම් සමාලෝචන කමිටු වාර්තාව

251
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

253
අභ්‍යන්තර පාලන පිළිබඳ විගණකාධිපතිගේ සහතික කිරීමේ වාර්තාව



අවදානම් කළමනාකරණ වාර්තාව

අඛණ්ඩ සහ තිරසාර ව්‍යාපාර මෙහෙයුම් සහතික කිරීමට, මූල්‍ය ස්ථායීතාව රඳවා ගැනීමට, සියලුම පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට, සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවීමට සමස්ත අවදානම් කළමනාකරණය කිරීමේදී අපි අවදානම අවම කිරීමේ ක්‍රියාමාර්ග හඳුනාගෙන, තක්සේරු කර ක්‍රියාත්මක කරමු. බැංකු ක්ෂේත්‍රය වඩ වඩාත් සංකීර්ණතාවට සහ තරඟකාරිත්වයට පත් වන බැවින්, විශ්වාසය, ලාභදායිතාව සහ තිරසාරභාවය සහතික කිරීමට ශක්තිමත් අවදානම් කළමනාකරණ පාලන තන්ත්‍රයක් අත්‍යවශ්‍ය වේ.

අපගේ ප්‍රවේශය

අපගේ පරමාර්ථ තුළ ඇතුළත් සාධක කිහිපයක් මත පදනම් වී අපි අවදානම් කළමනාකරණයට ප්‍රවේශ වන්නෙමු. රාජ්‍ය ආයතනයක් වීම තුළ අපගේ මූලික විධිනියෝගය වන්නේ රටේ සාර්ව ආර්ථික සංවර්ධනයට සහයවීමයි. එය මූල්‍ය අන්තර්ගතභාවය, මූල්‍යකරණය තුළින් ග්‍රාමීය සංවර්ධනය, SME සහ ක්ෂුද්‍ර ව්‍යාපාරවලට උපදෙස් ලබාදීම, ඩිජිටල් ආර්ථික මූලපිරීම් මෙහෙයවීම සහ රජයට අයත් බැංකුවක් ලෙස තිරසාර ආකාරයෙන් ජාතික ආර්ථික ඉලක්ක අත්කර ගැනීමට සහාය වීම හා සම්බන්ධවේ. සමාලෝචිත වසර තුළ, දේශපාලනික සහ සමාජ ආර්ථික වාතාවරණය වෙනස්වීම් රාශියකට මුහුණ දුන් අතර, 2022-2024 ව්‍යාපාර සැලැස්ම සාක්ෂාත් කරගැනීමට සහ තිරසාර ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට බැංකුවේ උපායමාර්ගික දැක්ම නැවත සකස්කළ යුතුව තිබුණි.

PESTEL විශ්ලේෂණය

2024 දී බැංකුවේ අවදානම් වාතාවරණය හැඩගැස්වීමට සහ තීරණය කිරීමට බාහිර සාධක කිහිපයක් සඳහා සමීප පරීක්ෂණයක් සහ ඇගයීමක් අවශ්‍ය වන අතර, එයට ප්‍රධාන වශයෙන් දේශපාලනික, ආර්ථික, සමාජීය, තාක්ෂණික, පාරිසරික සහ නෛතික සාධක ඇතුළත් වේ.

දේශපාලනික	2024 වසර විප්ලවීය වෙනසක් ගෙන ආ වසරක් වූ අතර ඒ, සමගම පාලනය සඳහා ද වෙනස් ප්‍රවේශයක් දක්නට ලැබිණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යටතේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය ද සමීපව සලකා බලන ලදී. මෙම වසර තීරණාත්මක මැතිවරණ ක්‍රියාවලීන් දෙකක් සිදු වූ වසරක් වූ අතර, සැප්තැම්බර් හා දෙසැම්බර් මාසවල පැවැත්වීමට නියමිතව තිබූ මැතිවරණ හේතුවෙන් රටේ ඇති වූ පොදු අවිනිශ්චිතතාව නිසා ව්‍යාපාර ගම්‍යතාවය සඳහා වසරේ මුල්භාගයේදී සුළු සහනයක් ලැබිණි.

ආර්ථික	රට තවමත් ණය ප්‍රතිව්‍යුහගතකරණය කරමින්, IMF නිර්දේශිත මූල්‍ය ප්‍රතිපත්ති සහ රජයට අයත් ආයතනවල ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරමින් සිටී. මෙයට සමානව නියාමක විසින් බලගන්වන ලද සහ මූල්‍ය පාලන තන්ත්‍රය පාලිත තනි අංකයේ උද්ධමනය, පොලී අනුපාත අඩු කිරීම, සහ 2024 දී සංචාරක සහ සේවක ප්‍රේෂණවල ස්ථීර වැඩිවීම මගින් ස්ථාවර විදේශ විනිමය අනුපාත සහතික කර ඇත. ජීවන වියදම ඉහළ අන්තයක පැවති අතර, ඉහළ උපයන විට බදු අනුපාත, බැහැර කළ හැකි ආදායම අඩු කිරීමට හේතු විය. සාර්ව-ආර්ථික ස්ථායීකරණය 2024 දී ක්‍රමානුකූලව වර්ධනය වූ අතර ඒ සඳහා මුදල් සහ මූල්‍ය ප්‍රතිපත්තිය කළමනාකරණය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යංශය හා නියාමක විසින් ගනු ලැබූ විචක්ෂණ පියවර හේතු විය. 2024 දී මෙය බැංකු ක්ෂේත්‍රය මෙන්ම CSE තුළ වඩා ඉහළ කාර්යසාධනයක් ඇති කිරීමට හේතු වී ඇත.
සාමාජීය	සාමාන්‍ය අවනිශ්චිතතාවක් පැවතියද සමාජ අසහනය පහව ගොස් තිබුණි. ලෝක බැංකුවේ දත්ත අනුව, දරිද්‍රතා මට්ටම වැඩි වී ඇත. රජය "අස්වැසුම". ඇතුළුව බොහෝ ක්‍රමවලින් සහන ලබාදෙමින් උවදුරට පත්වියහැකි ප්‍රජාවට සහය විය. ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන වශයෙන් හරිත විදේශයන් හි රැකවරණය පතා තරුණයින් හා තරුණ වෘත්තිකයන් අතර ජන සංක්‍රමණයක් හා බුද්ධිගලනයක් ඇති විය. 2024 මෙම බුද්ධිගලනය බැංකු අංශයටද බෙහෙවින් බලපාන ලදී. අඩු උද්ධමනය සහ රජයේ සමාජ ආරක්ෂණ වැඩසටහන් හේතුවෙන් සමාජීය ස්ථාවරත්වය ක්‍රමයෙන් වර්ධනය විය.
තාක්ෂණික	2024 දී ගතික තාක්ෂණය ආරම්භක පරිසර පද්ධතිය අපනයන වෙළෙඳපොල ප්‍රවේශයේ විභවතා පෙන්නුම් කළ අතර, තොරතුරු තාක්ෂණ හා විදුලි සන්නිවේදන ඇතුළුව ICT අංශය සහ එහි උප අංශ මගින් මෙහෙයවන ලදී. ඩිජිටල් වශයෙන් පරිවර්තනය කළ ජාතියක් ඉලක්කකරන තාක්ෂණික පදනම මත රජයේ ප්‍රතිපත්තියෙන් නව්‍යකරණය හා ඩිජිටල්කරණය යොදා ගැනීම කෙරෙහි අවධානය යෙමු කළේය. ICT අංශය 2023 වන විට ඩිජිටල් ආර්ථිකයට සැලකියයුතු ප්‍රමාණයකින් දායක වනු ඇති බවට බලාපොරොත්තු විය හැක. බැංකු ක්ෂේත්‍රය සම්ප්‍රදායික ඩිජිටල් වැඩසටහන්වලට අමතරව, චැට්බොක්ස්, මාර්ගගත ණය අනුමැතිය සහ E-KYC වැනි කෘතීම බුද්ධියෙන් උත්පාදනය කරන බැංකු මෙහෙයුම් කෙරෙහි වඩාත් යොමු වනු ඇත.
පාරිසරික	මුහුදු මට්ටම් ඉහළයාම්, ගංවතුර සහ නියඟ විසින් ඇති කරන සැලකියයුතු පාරිසරික පරිසර පද්ධති හානි, වැනි කාලගුණ වෙනසේ බලපෑම් කෘෂිකර්මය, ප්‍රවාහනය, සහ සමස්ත ආර්ථික චක්‍රය බිඳ දමනු ඇත. බැංකු ක්ෂේත්‍රය විශේෂයෙන් හරිත බලශක්තියට සහයවෙමින් 2024 දී තිරසාර මූල්‍ය වැඩසටහන් කෙරෙහි වඩාත් අවධානය යොමු කරන අතර, මහ බැංකුවේ හරිත මූල්‍ය වර්ගීකරණයට අනුකූල වේ.
නෛතික	නෛතික රාමුව ආර්ථික වර්ධනයට සහය වීමට සහ සාධාරණත්වය රඳවා ගැනීමට පරිණාමය විය. මෙම පෙරමුණේ වේගවත් වීමක් වඩා ආරක්ෂිත සමාජ සහ වඩා ඉහළ ගෝලීය පිළිගැනීමක් සඳහා සාධාරණත්වය සහ සාමය පිළිබඳ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සමඟ පියවර තැබීමට කාලානුරූප සාධකයකි. 2024 දී බැංකු ක්ෂේත්‍රය පරාටේ ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම, දත්ත ආරක්ෂක පනත ක්‍රියාත්මක කිරීම සහ අපනයන පාලන රෙගුලාසි කෙරෙහි වැඩි අවධානය යොමු කර ඇත.

අවදානම් සංස්කෘතිය සහ දැක්ම

පැහැදිලි නිශ්චිත වැකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් තුළ, සියලුම අවදානම් වර්ගීකරණ සඳහා බැංකුවේ අවදානම් රුචිය මගින් දක්වා ඇති පරිදි නියමිත සීමාවන් පැහැදිලිව ප්‍රකාශ කරමින්, වැදගත් සහ අදාළ අවදානම් නිරාවරණ අපි තක්සේරුකර, ප්‍රමාණනය කර, කළමනාකරණය කර වාර්තා කරමු. අවදානම් කළමනාකරණය බැංකුවේ මෙහෙයුම්වල සෑම අංගයකටම වැකාබද්ධ කර ඇති අතර, එයට උපායමාර්ගික සැලසුම්කරණය, ව්‍යාපාර සංවර්ධනය, මූල්‍ය කළමනාකරණය, ගනුදෙනුකාර මැදිහත්වීම්, දූෂණ විරෝධී ක්‍රියාකාරකම්, ව්‍යාපාර අරමුණු සමඟ පෙලගැසීම සහ සංසක්ති ආකාරයෙන් අවදානම් කළමනාකරණය ඇතුළත් වේ.

බාසල් ස්ථර I සහ II යටතේ ආවරණය කරන අවදානම

ස්ථර I	ස්ථර II	
ණය අවදානම	ව්‍යාපාර අවදානම සහ උපායමාර්ගික අවදානම	නෛතික අවදානම
වෙළෙඳපොල හුවමාරු අනුපාත අවදානම, පොලී අනුපාත අවදානම සහ මිල අවදානම ඇතුළු වෙළෙඳපොල අවදානම (ස්කන්ධ සහ පාරිභෝගික ද්‍රව්‍ය)	ද්‍රවශීලතා අවදානම	අනුකූලතා අවදානම
මෙහෙයුම් අවදානම	සංකේන්ද්‍රණ අවදානම	කීර්තිනාම අවදානම
	තාක්ෂණික හා තොරතුරු ආරක්ෂක අවදානම	

අවදානම් පාලනය හා රාමුව

වගවීම, වගකීම, ස්වාධීනත්වය, සන්නිවේදනය, වාර්තාකරණය, සහ විනිවිදභාවය ඇතුළත් කරමින්, බැංකුව ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව (IRMF) අවදානම් හඳුනාගැනීමට, තක්සේරු කිරීමට, මැනීමට, අවම කිරීමට, නියාමනය කිරීමට සහ වාර්තා කිරීමට සහය වේ. ආරක්ෂක මාර්ග ත්‍රිත්වය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ මූලික අංගයකි.

පළමු ආරක්ෂක මාර්ගය	දෙවන ආරක්ෂක මාර්ගය	තෙවන ආරක්ෂක මාර්ගය
ව්‍යාපාරික මාර්ග/ආයතනික කාර්යය	අවදානම් කළමනාකරණය සහ පාලනයන්	සහතිකය
➔ අවදානම් කළමනාකරණය සඳහා අවදානම් හඳුනාගැනීම සහ හිමිකාරිත්වය, බැංකුවේ පිළිගත් අවදානම් රුචිය සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති තුළ අවදානම් පවතින බව සහතික කිරීම. ➔ පාරිභෝගික, ආයතනික සහ ව්‍යවසාය බැංකුකරණය ➔ භාණ්ඩාගාරය ➔ ශාඛා මෙහෙයුම් ➔ තොරතුරු තාක්ෂණය, තොරතුරු තාක්ෂණ ආරක්ෂණ දෙපාර්තමේන්තුව	➔ අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය සඳහා මග පෙන්වීම සැපයීම, ඵලදායී අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවක් පවත්වාගෙන යාම සහ අවදානම් කළමනාකරණ රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ස්වාධීන නියාමනය ➔ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ➔ අනුකූලතා දෙපාර්තමේන්තුව ➔ මූල්‍ය දෙපාර්තමේන්තුව ➔ මානව සම්පත් දෙපාර්තමේන්තුව	➔ අපේක්ෂිත අවදානම්, ක්‍රියාවලි සහ භාවිතයන් පිළිබඳ ස්වාධීන හා නිරපේක්ෂ සහතිකයක් ලබා දීම. මූලික සහතික විම සහ ඉහළම මට්ටමේ පාලනය සහ අනුකූලතාව පිළිබඳව සහතික කිරීම. ➔ අභ්‍යන්තර විගණනය ➔ බාහිර විගණනය ➔ නියාමන අනුකූලතාවය
දෛනික මෙහෙයුම් සඳහා වගකීම්සහගත සහ වගවීම්සහගත ව්‍යාපාර සහ ආයතනික මට්ටමේ අභ්‍යන්තර පාලනයන්.	ස්වාධීන අවදානම් නියාමනය, ප්‍රතිපත්ති සමාලෝචන, අනුකූලතා පාලන තන්ත්‍රය, කාර්යසාධනයේ ඵලදායිත්වය මැනීම.	ස්වාධීන තත්ත්ව සහ සහතික පරීක්ෂාවන් ලබාදෙන අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යයන්

බැංකුව විසින් ආරක්ෂක ත්‍රිත්ව මාර්ගයක් ඇතුළත් ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් තුළ බැංකුව ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ඊට නිශ්චිත අවදානම් පරිසරය, නිශ්චිත අවදානම් රුචිය, අවදානම් පාලන පද්ධතිය සහ පීඩන පරීක්ෂණ ඇතුළත් අවදානම් ඇගයීමේ ආකෘති ඇතුළත් වේ. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව අවදානම් හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට, මැනීමට, අවම කිරීමට, නියාමනය කිරීමට සහ වාර්තා කිරීමට උපකාරී වේ. සමස්තයත් වශයෙන් ඉහල සිට පහළට අපගේ සාර්ථක කාර්යසාධනයට තීරණාත්මක වූ ව්‍යාපාර සහ මෙහෙයුම් තුළින් පැතිරෙන අවදානම් කළමනාකරණය කරමින් අවම කිරීමට මනාව සම්බන්ධීකරණයෙන් යුත් උත්සාහයක් පවත්වා ගන්නා ලදී.

අවදානම් කළමනාකරණය සහ ක්‍රමවේදය

- සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය ශක්තිමත් අවදානම් පාලන සංස්කෘතියක් ඇති කිරීම.
- බැංකුවේ ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවයට සම්බන්ධ බැංකුවේ අවදානම් නිරාවරණයන් නියාමනය කිරීම සඳහා ඵලදායී පද්ධතියක් සංවර්ධනය කිරීම.
- අදාළ සියලුම ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සන්නිවේදනය කිරීම සඳහා ඵලදායී සන්නිවේදන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- අදාළ සේවකයින්ට අවදානම් කළමනාකරණය, අවම කිරීම සහ වාර්තා කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ සැසි සහ පුහුණුව ලබාදීම.
- ආරක්ෂක මාර්ග ත්‍රිත්වයේ පරිශුද්ධභාවය සහතික කිරීම සඳහා මනා නිශ්චිත සහ ස්වාධීන රැකියා කාර්යයන්
- ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් යොදා ගැනීම සහ සහාය දීම.
- අනුකූල සංස්කෘතියක් කාලීන, නිවැරදි සහ විනිවිද පෙනෙන නියාමන වාර්තාකරණය බලාත්මක කරන ශක්තිමත් සහ ස්වාධීන අනුකූලතා කාර්යය.
- අවශ්‍ය අවස්ථාවලදී හෙළිදරව් කිරීම්.
- නියාමන සහ නීතිමය අවශ්‍යතා සහ ක්ෂේත්‍රයේ මනා පරිචයන් සමඟ පෙළගැස්වීම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ භාවිතයන් වරින් වර සමාලෝචනය කිරීම.

අවදානම් පාලන රාමුව



ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ කාර්යය ව්‍යුහය



2024 දී අවදානම් වාතාවරණය

අපගේ අවදානම් වාතාවරණය අභ්‍යන්තර සහ බාහිර සාධක පරාශයකින් හැඩගස්වන අතර, එයට ආර්ථික තත්ත්වය, වෙළෙඳපොල උච්ඡාවචන, නියාමන වෙනස්වීම්, සයිබර් ආරක්ෂක තර්ජන, සහ මෙහෙයුම් අභියෝග ඇතුළත්ය. ඵලදායී අවදානම් කළමනාකරණය අපගේ මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම, අපගේ ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම, සහ පාර්ශ්වකාර විශ්වාසය පවත්වා ගැනීමට කේන්ද්‍රීය වේ. පසුගිය වසර පුරා, අපි පහත අවදානම් වර්ගීකරණ පරීක්ෂාකාරීව නියාමනය කර කළමනාකරණය කර ඇති අතර, ඒ සෑම එකක්ම බැංකුව සඳහා අසමසම අභියෝග හා අවස්ථා නියෝජනය කරයි:

ණය අවදානම, ද්‍රවශීලතා අවදානම්, සංකේන්ද්‍රණ අවදානම්, තොරතුරු තාක්ෂණ හා සයිබර් ආරක්ෂක අවදානම, වෙළෙඳපොල අවදානම, මෙහෙයුම් අවදානම, කීර්තිනාම අවදානම, අනුකූලතා අවදානම, වංචා අවදානම, දක්ෂතා අවදානම, සහ කාලගුණ අවදානම.

ප්‍රධාන අවදානම	බැංකුවට බලපෑම	බැංකුවේ ප්‍රතිචාරය
ණය අවදානම	දිවයින පුරා අපගේ විශාල ව්‍යාප්තිය සමඟ, ණය අවදානම ප්‍රධානම අවදානම වන අතර එය ණය සහ අත්තිකාරම් ලබාදීම හා බෙදාහැරීම තුළින් ඇතිවේ. බැංකුවේ මුළු වත්කම්වලින් 50.68%ක් ණය කළඹට දායක වේ.	ණය අවදානම ගනුදෙනුකාර ණය සේවාකරණය මත රැඳෙන බැවින්, අපගේ ණය දීම නිසි පරීක්ෂාව සහ විචක්ෂණය අනුව සිදු කෙරේ. ණය විශ්ලේෂණ සහ ණය ශ්‍රේණිගතකරණය දැඩිව යොදා ගන්නා අතර, ලැයිස්තු පරීක්ෂාව, CRIB නිවාරණය, ගනුදෙනුකරුගේ ණය ශ්‍රේණිගතකරණය සහ අවදානම පදනම් මිලකරණය අපගේ ණය ප්‍රතිපත්තියට ඇතුළත් කෙරේ. අංශ සහ කර්මාන්ත විශ්ලේෂණ පීඩනයට ලක්වූ කර්මාන්ත හඳුනා ගැනීමට සහ ණය දීමේදී පරීක්ෂාව ක්‍රියාවට නැංවීමට සිදු කෙරේ. ණය උසස් කිරීම මහ බැංකුවේ මාර්ගෝපදේශ පරිදි සිදුකර නියාමනය කෙරේ. ➔ ණය ගැනියන් සඳහා අවදානම් පදනම් මිලකරණය: නව අවදානම පදනම් මිලකරණ ප්‍රවේශයක් හඳුන්වා දී ඇති අතර එහිදී ණය මිලකරණය ණයකරුගේ ණය අවදානම් පැතිකඩ, කර්මාන්තයට අදාළ අභියෝග, සාර්ව ආර්ථික සාධක, වගකීම් සහගත ණයට සහ ඉහළ අවදානම්වලට වන්දි ගෙවීමට පෙළ ගන්වනු ලබයි. ➔ කර්මාන්ත ක්ෂේත්‍ර අනුව විස්තීර්ණ ණය අවදානම් නැවත තක්සේරුව: බැංකුව අංශමය කාර්යසාධන පරාමිති, සහ පූර්ව සංඥා දර්ශක ඇතුළත් කරමින් විවිධ අංශ හරහා ණය අවදානම් නැවත අගයීමට ලක් කර ඇත. මෙය තිරසාර වර්ධනය පෝෂණය කරමින් සහ අංශ විශේෂිත උවදුරු අවම කරමින් ණය ප්‍රමුඛතාවයන්ට උපායමාර්ගික ගැලපීම් ඇති කරයි. ➔ SOE නිරාවරණ කළමනාකරණය: රජයට අයත් ආයතන (SOEs) හා බැඳුණු දැඩිකළ අවදානම් සමඟ, බැංකුව වඩා දැඩි ණය සීමා පනවා ඇති අතර, වඩාත් සංරක්ෂිත ණය ප්‍රවේශයක් සමඟ පෙළ ගැසෙමින් මෙවැනි ආයතනවල පවත්නා නිරාවරණ සමාලෝචනය කර ඇත. ➔ ශක්තිමත් කළ ණය පූර්ව සමාලෝචන ප්‍රගතිය: ණය පැහැර හැරීමේ අවදානම් අවම කිරීම සඳහා දැඩි ඇගයීම් නිර්ණායක හඳුන්වා දීම, උසස් විශ්ලේෂණ උපයෝගී කර ගැනීම සහ අවදානම් කළමනාකරණය සහ ණය අනුමත කිරීමේ නියමයන් අතර සමීප සහයෝගීතාවයක් වර්ධනය කිරීම මගින් බැංකුව සිය ණය තක්සේරු රාමුව වැඩිදියුණු කර ඇත.

ප්‍රධාන අවදානම	බැංකුවට බලපෑම	බැංකුවේ ප්‍රතිචාරය
විදේශ විනිමය අවදානම	2024 දී හුවමාරු අනුපාතියේ වර්ධනයන් සම්පූර්ණ වසර සඳහා 9.69%ක් වූ නමුත් දෙවැනි අර්ධයේදී 3.03%ක අඩුවීමක් තිබුණි. මින් මෙම වසර තුළ අඩු වූ විදේශ විනිමය උච්චාවචන පෙන්නුම් කරයි. 2024 පුරා අඩු සහ ස්ථාවර විදේශ විනිමය අවදානම් මට්ටම් හේතුවෙන්, බැංකුව කෙරෙහි බලපෑම අවම මට්ටමක පැවතිණ.	බැංකුව සංක්‍රමණික සේවකයින් අතර දැඩි අලෙවිකරණ වැඩසටහනක් දියත් කර ඇති අතර, එය 2024 දී ප්‍රේෂණ අතිශයින් වැඩිකර ඇත. ඊට අමතරව, නව සහ පවතින අපනයන ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා බොහෝ කලාපවල අපනයන මධ්‍යස්ථාන ස්ථාපිත කරන ලදී. හුවමාරු මුදල් අතර විවිධාංගීකරණය පවත්වා ගනිමින් සහ විදේශ විනිමය අවදානම් අවම කිරීමට අනුකූලතා අවශ්‍යතා දැඩිව පිළිපදිමින් අපි අපගේ විදේශ මුදල් (FCY) කළඹ කළමනාකරණය කළෙමු.
ද්‍රවශීලතා අවදානම	සාමාන්‍යයෙන්, 2024 වසර බැංකු ක්ෂේත්‍රයට අතිරික්ත ද්‍රවශීලතාවයේ වසරක් වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වෙළෙඳපොළේ ණය වර්ධනය අඩු වීමයි. ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙළෙඳපොළෙන් විදේශ මුදල් මිලදී ගැනීම ද්‍රවශීලතා අතිරික්තය තවදුරටත් වැඩි කළේය.	අපනයන සීමා පැවති බැවින් සහ ණය මාර්ග අඩු වී ඇති බැවින්, බැංකුව කෙටි කාල සිට මධ්‍ය කාලය දක්වා ආයෝජන ස්ථාපිත කරමින් සහ පුද්ගලික අංශයේ ආයතනවලට ණයදීම මගින් අතිරික්ත ද්‍රවශීලතාව සමඟ කටයුතු කළේය. ඒ අනුව, බැංකුව 2024 පුරාම ශක්තිමත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගන්නා ලදී.
සංකේන්ද්‍රණ අවදානම	බැංකුවේ සංකේන්ද්‍රණ අවදානම වන්නේ රජයට අයත් ආයතනවලට ණයදීම් වන අතර 2024 දී එය මුළු ණය කළඹ තුළ 28.6%කට දායක විය. රජයට අයත් ආයතනයක් ලෙස, මහජන සුභසාධනය සඳහා බැංකුවේ අපේක්ෂාව මින් පිළිබිඹු කරයි.	බැංකුව තනි අංශයකට නිරාවරණය වීම අඩු කිරීම සඳහා විවිධ අංශ, කර්මාන්ත සහ භූගෝලීය කලාප හරහා තම ණය කළඹ විවිධාංගීකරණය කිරීමෙන් සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කර ඇත. අධික සංකේන්ද්‍රණ වැළැක්වීම සඳහා එය තනි ණය ගැතියන්, කර්මාන්ත අංශ සහ භූගෝලීය කලාප සඳහා දැඩි නිරාවරණ සීමාවන් ස්ථාපිත කර බලාත්මක කරන ලදී. මීට අමතරව, බැංකුව විවිධ අංශ හා සම්බන්ධ ණය සංකේන්ද්‍රණ අවදානම පිළිබඳ නිතිපතා තක්සේරු කිරීම් සිදු කරන අතර, එවැනි අවදානම් කලින්ම හඳුනා ගැනීම සහතික කිරීම සඳහා සිය ණය කළඹට සංකේන්ද්‍රණ අවදානමේ විභව බලපෑම් තක්සේරු කිරීම සඳහා පීඩන පරීක්ෂණ සහ ක්‍රියාදාම විශ්ලේෂණයන් සිදු කරයි.
තාක්ෂණික අවදානම	පහසු බැංකුකරණයක් අපේක්ෂා කරන ගනුදෙනුකාර අංශ විශාල ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා බැංකුකරණය ගතිකව ඩිජිටල් වේදිකා භාවිතා කරන බැවින්, තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂාව ඉහළ අවදානම් සාධකයක් ලෙස පවතී. ගනුදෙනුකාර දත්ත ආරක්ෂණ පනත සහ බැංකු සඳහා මහ බැංකුවේ තාක්ෂණික අවදානම් මාර්ගෝපදේශ මඟින් මෙම අවදානම අවම කිරීම සඳහා දැඩි පියවර බලාත්මක කරන ලදී.	බැංකුවේ නව්‍යකරණ ඩිජිටල් වේදිකා මෘදුකාංග පද්ධතිය තුළ ආරක්ෂිතව ස්ථාපිත කර ඇති අතර, ඉන් පහසුවෙන් අනිටු මෘදුකාංග පහරදීම් සොයන අතර, නිත්‍ය කාලීන අවදානම් දර්ශක උත්පාදනය කරයි. තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ බාධාරහිත සේවා සහතික කිරීමට DR විසඳුම් අපි අබණ්ඩව පරීක්ෂා කරමු.
වෙළෙඳපොල අවදානම	පොළී අනුපාත, විදේශ විනිමය අනුපාත, සහ වෙනත් වෙළෙඳපොල විචල්‍යතා 2023ට සාපේක්ෂව 2024 දී සාපේක්ෂව අඩු උච්චාවචන ප්‍රදර්ශනය කරන ලද අතර, එයට මහ බැංකුවේ මූල්‍ය සහ විදේශ විනිමය ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් හේතු විය. 2024 දී අත්කරගත් ස්ථාවරත්වය තවදුරටත් තහවුරු කරමින් 2.37% ක සැලකිය යුතු අවම උච්චාවචනයක් වාර්තා කළ වසරේ දෙවන අර්ධය සමඟ සතිපතා සාමාන්‍ය බරතබන ලද මූලික ණයදීමේ අනුපාතය (AWPLR) වසර සඳහා 26.04%ක් විය.	- බැංකුවක් ලෙස, අනාගත අවදානම් අවම කිරීමට අපගේ ණය කළඹ විචක්ෂණව ප්‍රතිමිලකරණ ලදී. ඊට අමතරව, මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට සම්පූර්ණ අනුකූලතාව තුළ අපගේ විදේශ විනිමය පවත්වා ගන්නා ලද අතර, විදේශ විනිමය අවදානම අවම මට්ටමක තබා ගැනීම සඳහා මුදල් විවිධාංගීකරණය කර ඇත. - කටයුතුවල ප්‍රමාණය සහ සංකීර්ණතාව මත පදනම් වී, සහ විදේශ විනිමය වෙළෙඳපොල තුළ සහභාගිත්වය මත, විදේශ විනිමය ගෝලීය සංග්‍රහයේ අදාළ මූලධර්ම සමඟ කටයුතු පෙළ ගැසීමට බැංකුව විසින් සුදුසු පියවර ගෙන ඇත. ශක්තිමත්, සාධාරණ, ද්‍රවශීලතා, විවෘත සහ සුදුසු විනිවිද වෙළෙඳපොලක් ප්‍රවර්ධනය කිරීමට පොදු මඟපෙන්වීම් රාශියක් ලබා දෙන අතර, එහිදී වෙළෙඳපොළ සහභාගීවන්නන්ට, පවතින වෙළෙඳපොළ තොරතුරුවලට අදාළව තරඟකාරී මිල ගණන් මත විශ්වාසයෙන් සහ ඵලදායීව ගනුදෙනු කිරීමේ හැකියාව ලැබිණි.

ප්‍රධාන අවදානම	බැංකුවට බලපෑම	බැංකුවේ ප්‍රතිචාරය
		2024 මහ බැංකුවේ වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි, විනිමය අනුපාත අවදානම් කළමනාකරණය කරන අතරම ගැඹුරු සහ වඩාත් ද්‍රවශීලී විදේශ විනිමය වෙළෙඳපොළක් පෝෂණය කිරීමට සහාය වීම සඳහා මෙම සංග්‍රහයට අනුගත වීම අත්‍යවශ්‍ය විය.
මෙහෙයුම් අවදානම	දිවයින පුරා පැතිරුණු බැංකුවේ අති විශාල ජාලය, ගනුදෙනුකාර පදනම සහ සේවක ශක්තිය ඕනෑම මෙහෙයුම්මය අවදානම් සිදුවීමකට ඉඩ සලසයි. කාර්යක්ෂමව, කාලීනව සහ සියලු පාර්ශ්වකරුවන්ට අවම බලපෑමක් සහිතව කළමනාකරණය සිදු නොකළහොත්, මෙම ව්‍යාකූලතාවය විශ්වාසය හා ලැදියාව බිඳවැටීම, මූල්‍යමය හානි ද සමග විශාල හානියකට පවා හේතු විය හැක.	අනෙකුත් අවදානම් සාධක අතර, මෙහෙයුම් අවදානම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමුඛතාවයක් ගන්නා අතර, සියලුම මෙහෙයුම් සහ ව්‍යාපාරික ඒකක සඳහා ව්‍යුහගත ආකාරයකින් නිරූපනය කර ඇත. ප්‍රේරක සිදුවීම් IRMF හි ප්‍රකාශිත පරිදි උත්සන්න කර, විසඳුම සඳහා පසුවිපරම් කර විනිවිදභාවය සඳහා අනාවරණය කරනු ලැබේ. අතින් සිදුකරන පැමිණිලි කළමනාකරණය කිරීමේදී මෙහෙයුම් අවදානම් අවම කිරීමට හඳුන්වා දෙන ලද ඩිජිටල්කරණ ගනුදෙනුකාර පැමිණිලි කළමනාකරණ පද්ධතිය 2024 දී බැංකුවේ තාක්ෂණික වර්ධනයන්ගෙන් එකක් වන අතර අපේක්ෂිත පරමාර්ථ වර්ධිත කාර්යක්ෂමතාව, තත්‍ය කාලීන නියාමනය තුළින් අත්කර ගත හැකිය.
කීර්තිනාම අවදානම	ධනාත්මක ප්‍රචාරණයේ හොඳම ක්‍රමය සමාජ මාධ්‍ය වේදිකා හරහා මාර්ගගත ක්‍රමය වන අතර, සමාජ මාධ්‍ය විසින්ම බැංකුව පිළිබඳව නිෂේධාත්මක තොරතුරු ව්‍යාප්ත කිරීමට හෝ තත්‍ය කාලීනව අතිශයෝක්තියට නැංවිය හැකි අතර එමඟින් කීර්තිනාමයට හානි සිදු විය හැක. රාජ්‍ය බැංකුවක් ලෙස, බැංකුවේ සංවර්ධන ප්‍රයත්නයන්ට සහාය වීමට අපි බැඳී සිටින අතර, ක්ෂේත්‍රයේ වෙළෙඳපොල තරඟකරුවෙකු ලෙස අපගේ කීර්තිනාමය ශක්තිමත් කිරීම සඳහා පුද්ගලික අංශයට අපගේ ප්‍රවේශය පුළුල් කිරීමේදී අපි පරිස්සම් වූයෙමු.	අපගේ සුපිරි ඩිජිටල් හැකියාව සමඟ, සමාජ මාධ්‍ය අවදානම් වේගයෙන් හඳුනාගත හැකිවන අතර, විසඳුම් ඉදිරිපත් කරමින්, හෝ බලපෑමට පත් පාර්ශ්වකරුවන් සමඟ ධනාත්මක සන්නිවේදනය ආරම්භ කරමින් තත්‍ය කාලීනව නිවැරදි කරන්නෙමු.
අනුකූලතා අවදානම	නියාමන හෝ නීත්‍යානුකූල අවශ්‍යතාවලට අනුකූල වීම කඩකිරීමෙන් දඬුවම්, දඩ මුදල් සහ/හෝ බැංකුව දිගුකාලීන නීතිමය ක්‍රියාපටිපාටියකට සහභාගි වීමට සිදුවීමේ හැකියාවක් පවතින අතර එය බැංකුවේ කීර්තිනාමයට හානි විය හැක.	බැංකුවට ස්වාධීන අනුකූලතා දෙපාර්තමේන්තුවක් සහ නීති දෙපාර්තමේන්තුවක් ඇත, එමඟින් බැංකුව පුරා අවශ්‍ය ප්‍රමිතීන් සන්නිවේදනය කරන අතර, නියාමන වාර්තාකරණය කාලීන, නිවැරදි සහ විනිවිද බව සහතික කරයි. 2024දී කිසියම් කඩකිරීමක් සඳහා අපට එරෙහිව නියාමන දඩ, දඬුවම් හෝ නීතිමය ක්‍රියාමාර්ග නොතිබුණි.
වංචා අවදානම	ඩිජිටල් ආර්ථිකයකට පහසුවෙන් දැකියහැකි වංචාව සහ මුදල් වංචා කිරීම සෘණාත්මක බලපෑමක් ඇති කරයි. සාමාන්‍යයෙන්, ඩිජිටල් මාර්ග මුදල් විශුද්ධිකරණය සහ මූල්‍ය අපරාධ සඳහා දැනට භාවිතා කරන අතර, එය ගෝලීය වශයෙන් වැඩි වෙමින් පවතී.	ගනුදෙනුකරුවන් හා ගනුදෙනු සඳහා සහ සැකසහිත ගනුදෙනු හඳුනා ගැනීමේ සහ කාර්ය වැඩි කිරීමේ අපගේ නිවාරණ යාන්ත්‍රණ, ශක්තිමත් ක්‍රියාවලි වන අතර, එය වංචා අවදානම් සහ මූල්‍ය අවදානම් වැලැක්වීමේදී අපට සහය වේ. අපගේ මෙහෙයුම්වල තිරසාරභාවය සහතික කිරීම සඳහා, අපි කලින් කල අපගේ මානව සම්පත් පුහුණු කරන අතර, අවදානම් අවම කිරීම සහතික කිරීමට ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සමාලෝචනය කෙරේ.

ප්‍රධාන අවදානම	බැංකුවට බලපෑම	බැංකුවේ ප්‍රතිචාරය
දක්ෂතා අවදානම	දක්ෂතා අවදානම බැංකුවට සැලකිය යුතු අභියෝගයක් විල්ල කරන අතර එය එහි මෙහෙයුම් කාර්යක්ෂමතාව, අවදානම් කළමනාකරණ හැකියාවන් සහ දිගුකාලීන තිරසාරභාවයට බලපායි. දක්ෂ වෘත්තිකයන් නොමැති වීම හෝ ප්‍රමාණවත් කුසලතා මාර්ගයක් නොමැති වීම ණය අවදානම් තක්සේරුව, භාණ්ඩාගාර මෙහෙයුම් සහ නියාමන අනුකූලතාව වැනි තීරණාත්මක ක්ෂේත්‍රවල තීරණ ගැනීම දුර්වල කරනු ලැබිය හැකිය. ඊට අමතරව, ඉහළ සේවක පිරිවැටුම හෝ කුසලතා පරතර ව්‍යාපාර අඛණ්ඩතාවය බිඳ වැටීමින් බඳවා ගැනීම් සහ පුහුණුව සඳහා පිරිවැය වැඩි කිරීමට හේතු විය හැක. ඉහළ දක්ෂයින් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට අපොහොසත් වීම බැංකුවේ තරඟකාරී වාසිය අඩු කළ හැකි අතර එය නව්‍යකරණයට සහ පාරිභෝගික සේවයට බලපෑ හැකිය.	බැංකුව උපායමාර්ගික ශ්‍රමබලකාය සැලසුම් කිරීම, අඛණ්ඩ නිපුනතා සංවර්ධනය සහ ශක්තිමත් අනුප්‍රාප්ති සැලැස්මක් ක්‍රියාත්මක කිරීම මගින් දක්ෂතා අවදානම කළමනාකරණය සිදු කෙරේ. පුහුණු වඩසටහන් සහ වෘත්තීමය සංවර්ධන මුලපිරීම් සේවක ප්‍රවීනතාව වැඩි කිරීමට හඳුන්වා දෙන ලදී. තරඟකාරී වැටුප් ගෙවීම් ව්‍යුහය සහ වෘත්තීමය ප්‍රගති අවස්ථාව දක්ෂ වෘත්තිකයින් ආකර්ෂණය කර රඳවා ගැනීමට සැලසුම් කරන ලදී.
කාලගුණ අවදානම	දේශගුණික අවදානම යනු බැංකු ගනුදෙනුකරුවන්ට අහිතකර ප්‍රතිවිපාක ඇති කිරීමට සහ බැංකුව සමඟ එකඟ වූ බැඳීම් ඉටු කිරීමට ඔවුන්ට නොහැකි වීමට හේතුවන දේශගුණික විපර්යාස සඳහා විභවතාවයයි. තවද, අහිතකර දේශගුණික විපර්යාස බැංකුවේ භෞතික සම්පත් කෙරෙහි ද බලපානු ඇත. මෙයට ජීවිත, පද්ධති සහ භෞතික වත්කම් කෙරෙහි බලපෑම් ඇතුළත් වේ. ස්වභාවධර්මයේ බලයක් වන මෙය සමඟ ගනුදෙනුකරන විට, එය ඇතිවන අවදානමකි.	බැංකුව බහුවිධ ප්‍රවේශයකින් මෙම අවදානම කළමනාකරණය කරන අතර, එය නියාමන අවශ්‍යතා සහ තිරසාර මූල්‍ය මූලධර්ම හා බැඳී පවතී. මහ බැංකුවේ තිරසාර මූල්‍ය මාර්ග සිතියමට අනුකූල ව්‍යාපෘතිවලට සහය වෙමින් සැලකියයුතු අරමුදල් පරිසර හිතකාමී ව්‍යාපාර සහ ආයෝජනවලට සහනාධාර ලබාදීමට වෙන් කරනු ලබයි. ඊට අමතරව, කාලගුණ සංවේදී කර්මාන්ත අභියෝගවලට අනුව ඔරොත්තුදීම වැඩි කිරීමට උවදුරු සහිත කළඹ අඛණ්ඩව නියාමනය සමඟ ණය ඇගයීම්වලට කාලගුණයට අදාළ අවදානම් ඒකාබද්ධ කෙරේ.
විභව අවදානම	2024 ආරම්භය දේශපාලන අවශ්‍යතාවන්ගෙන් පිරී තිබූ අතර, එය ආර්ථිකයට විවිධ ආකාරවලින් බලපෑවේය.	අපි අපගේ ප්‍රධාන වටිනාකම් තවදුරටත් රකින අතර, SME සහ MSME අංශ සහ තරුණ සංවර්ධනය මෙහෙයවීම තුළින් ආර්ථිකයට සහයවීමට ස්ථාන ගවේෂණය කරමු.

අපගේ අවදානම් විශ්වය

කටයුතු	ණයදීම	අරමුදල්	වෙළෙඳාම	ව්‍යාපාර මෙහෙයුම්	තරඟය	නියාමනය
බැංකුවේ කටයුතු බැංකුව නිරාවරණය වන අවදානම් සාමූහිකව නියෝජනය කරයි.	ණය අවදානම → පැහැර හැරීමේ අවදානම → සංකේන්ද්‍රණ අවදානම → ශ්‍රේණිගතකරණ සංක්‍රමණික අවසාන	ද්‍රවශීලතා අවදානම → ස්කන්ධ අවදානම → පොලී අනුපාත අවදානම	වෙළෙඳපොල අවදානම → වෙළෙඳ ද්‍රව්‍ය අවදානම → හුවමාරු අනුපාත අවදානම	මෙහෙයුම් අවදානම → සේවක අවදානම → IT අවදානම → අනුකූලතා අවදානම → ව්‍යාපාර අඛණ්ඩතා අවදානම → සයිබර් ආරක්ෂක අවදානම	උපායමාර්ගික අවදානම → කීර්තිනාම අවදානම → ව්‍යාපාර අවදානම	අනුකූලතා අවදානම → නෛතික අවදානම
බැංකුවට බලපෑම තක්සේරු කිරීමට බාහිර අවදානම නියාමනය කරන ලදී.						
භූගෝලීය		සාර්ව ආර්ථික				නියාමනය

අවදානම් රුචිය හා ඉවසීම

අවදානම් රුචිය හා ඉවසුම් මට්ටම්වලින් බැංකුවට සිය උපායමාර්ගික පරමාර්ථ හඹායාමේදී අවශෝෂනය කර ගැනීමට අපේක්ෂා කරන උපරිම අවදානම් ප්‍රමාණය විස්තර කරයි. මෙය රාමුවක් ලෙස කටයුතු කරන අතර ඒතුළ තිරසාර කාර්යසාධනයක් ඇති කිරීම සඳහා ප්‍රශස්ත වර්ධන විකල්ප ඇගයීමට ලක් කරයි. අවදානම් රුචි ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සමාලෝචනය කර අනුමත කරනු ලබන අතර, එහිදී ප්‍රාග්ධන පදනමේ වෙනස්වීම්, සාර්ව ආර්ථික වෙනස්වීම්, රටේ සහ ප්‍රතිපාර්ශ්ව අවදානම්, අපේක්ෂිත ව්‍යාපාරික වර්ධනය සහ බැංකුවේ සමස්ත ව්‍යාපාර උපායමාර්ගය හා බැඳුණු ආයතනික සැලැස්ම සහ පාර්ශ්වකාර අවශ්‍යතා සලකා බලනු ලබයි.

අවදානම් රුචිය යන්නෙන් බැංකුව උපායමාර්ගික පරමාර්ථ සපුරා ගැනීම සඳහා භාර ගැනීමට කැමතිවන අවදානමේ ප්‍රමාණය හා වර්ගය අදහස් වන අතර, අවදානම් ඉවසීම යන්නෙන් බැංකුව භාර නොගන්නා අවදානමෙන් ඔබ්බට උපරිම අවදානම් සීමාවක් සැකසීමට බැංකුව භාරගන්නා සහ හඳුනාගන්නා අවිනිශ්චිතතා මට්ටම අදහස් වේ.

2023 දෙසැම්බර් 31 ට අනුව 2024 දෙසැම්බර් 31 ට බණ්ඩිත අවදානම් රුචිය

ණය අලාභ රුචිය	ඉහළ අවදානම	මධ්‍යම අවදානම	පහළ අවදානම	පහත සඳහන් දිනට තත්ත්වය	
				31 දෙසැම්බර් 2024	31 දෙසැම්බර් 2023
හානිකරණය වූ ණය (3වන අදියර) අනුපාතය %	>7	3.5-7	<3.5	10.26	8.83
අදියර 3 ණය අනුපාතයට හානිකරණය වූ ණය (3වන අදියර) (%)	<30	30-50	>50	41.49	40.96
කල් ඉකුත් වූ (%)	>12	6-12	<6	16.84	12.75
ලාභ අලාභ අයකිරීම (%)	>50	35-50	<35	13.11	48.47
සංකේන්ද්‍රණය (HHI ක්‍රමය)	>0.25	0.15-0.25	<0.15	0.11	0.21
අයකිරීම (%)	<10	0-20	>20	8.55	15.76
TOD අතිරික්තය (%)	>20	10-20	<10	8.68	65.36
අක්වෙරළ නිරාවරණය (OBU) (%)	>5	3-5	<3	1.55	1.45

මෙහෙයුම් අලාභ රුචිය	ඉහළ අවදානම	මධ්‍යම අවදානම	පහළ අවදානම	පහත සඳහන් දිනට තත්ත්වය	
				31 දෙසැම්බර් 2024	31 දෙසැම්බර් 2023
මෙහෙයුම් අලාභ – අභ්‍යන්තර වංචා	>5	1-5	0	1	2
මෙහෙයුම් අලාභ – බාහිර වංචා (උකස්)	>300	150-300	<150	135	237
මුළු මෙහෙයුම් වියදමට මුළු මෙහෙයුම් අලාභ (%)	>1.0	0.5-1.0	<0.5	0.05	0.17
ක්‍රමානුකූලව ලබා ගැනීමේ හැකියාව (%)					
ඉතා වැදගත් (%)	<97.5	97.5-99.9	>99.9	100	99.95
සාමාන්‍ය ලෙස වැදගත් (%)	<95	95-97.5	>97.5	100	99.89
අඩුවෙන් වැදගත් (%)	<87	87-90	>90	100	100
සාමාන්‍යයට වඩා අඩුවෙන් ප්‍රමාණය කළ ශාඛා විගණන ප්‍රතිශතය	>10	5-10	<5	7%	13.41

වෙළෙඳපොල අවදානම් රුචිය	ඉහළ අවදානම %	මධ්‍යම අවදානම %	පහළ අවදානම %	පහත සඳහන් දිනට තත්වය 31 දෙසැම්බර් 2024	31 දෙසැම්බර් 2023
විනිමය හුවමාරු අලාභ	>10	5-10	<5	Nil	Nil
FIS වෙළෙඳ ණය	>10	5-10	<5	Nil	Nil
ADR	>85	75-85	<75	56.10%	69.43%
LCR (සියලුම මුදල්)	<90	90-100	>100		
කල්පිරීම නොගැලපීම අනුපාතය	> +/-35	+/-(25-35)	25	-49.44%	-38.77%

පීඩන පරීක්ෂණය

බැංකුවේ පීඩන පරීක්ෂණ රාමුව නියාමන මඟපෙන්වීම් සහ ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූලව සකස් කරන අතර, එහිදී සාර්ව ආර්ථික ක්‍රියාදාම විශ්ලේෂණය සහ ව්‍යාපාර ආකෘති ඇගයීම් ඇතුළත් ශිල්පීය ක්‍රමවල සංයෝජනයක් භාවිතා කර ගනිමින් මෘදු, මධ්‍යස්ථ සහ ප්‍රධාන පීඩන මට්ටම් යටතේ ශ්‍රේණිගත කරයි. නිරන්තර පීඩන පරීක්ෂණ මගින් අවදානම් රුචිය සහ බැංකුවේ ඉවසීමේ මට්ටම් ඇගයීමට ලක් කරයි, එය ලාභදායීතාවය, ද්‍රවශීලතාවය, තිරසාරභාවය කෙරෙහි බලපෑම් කළ හැකි අතර, බැංකුවේ මෙහෙයුම් පුරා අවදානම් දැනුවත්භාවය වැඩි දියුණු කරමින් අපේක්ෂිත අවදානම් සාධකවල ක්‍රියාකාරී කළමනාකරණයට සහාය වේ. පීඩන පරීක්ෂාව බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ (ICAAP) අනිවාර්ය අංගයකි. සාර්ව ආර්ථික සහ වෙළෙඳපොල විචල්‍යයන් හේතුවෙන් ඉපැයීම්, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවයට ඇති විය හැකි බලපෑම් ඇතුළුව බැංකුවේ අවදානම් පැතිකඩ සහ මූල්‍ය තත්ත්වය කෙරෙහි ඇති විය හැකි බලපෑම බැංකුව තක්සේරු කරයි. පීඩන පරීක්ෂණ අභ්‍යාසයේ සියලුම වැදගත් අවදානම් වර්ග ඇතුළත් වේ.

BIRMC විසින් බැංකුවේ පීඩන පරීක්ෂණ ප්‍රතිඵල සහ ඒවාට පාදක වන ප්‍රධාන උපකල්පන පිළිබඳ නිතිපතා සමාලෝචන පවත්වනු ලැබේ. ICAAP සඳහා ප්‍රාග්ධන සැලසුම්කරණය, උපාය මාර්ගික සැලසුම්කරණය, අවදානම් රුචිය නිර්වචනය කිරීම, උපායමාර්ගික තීරණ සඳහා අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය කිරීම සහ අර්ථ දක්වා ඇති පරාමිතීන් තුළ අවදානම කළමනාකරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය යෙදවුම් වේ.

ණය අවදානම	වෙළෙඳපොල අවදානම	ද්‍රවශීලතා අවදානම	මෙහෙයුම් අවදානම
පීඩන අවස්ථා	**පීඩන අවස්ථා**	**පීඩන අවස්ථා**	**පීඩන අවස්ථා**
➔ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම – සාමාන්‍ය ණය, අක්‍රීය ණය බවට පරිවර්තනය වීම නිසා සමස්ත අක්‍රීය ණය ප්‍රමාණය වැඩිවීම – ඉහළම ණය ගැතියන් 10 න් – ඉහළම කර්මාන්ත 3 න් ➔ අදියර වත්කම්වල විතැන්වීම ➔ අපේක්ෂිත ආර්ථික අලාභවල බලපෑම ➔ ඉහළම ණය ගැතියන් 10 දෙනාගෙන් වත්කම්වල ගුණාත්මකභාවය වැඩි කිරීම ➔ ඉහළම කර්මාන්ත 3ක වත්කම්වල ගුණාත්මක භාවය වැඩි කිරීම. ➔ සාමාන්‍ය කල HHI හි වැඩිවීම	➔ වෙළෙඳපොළ පොලී අනුපාතවල චලනයන් ➔ වෙළෙඳපොළ විනිමය අනුපාතවල චලනයන් ➔ වෙළෙඳපොළ කොටස් මිලෙහි චලනයන් ➔ වෙළෙඳපොළ රන් මිල මත පදනම්ව උකස් කිරීමේ සංවේදීතා විශ්ලේෂණය ➔ ආර්ථික අර්බුදයේ බලපෑම	➔ “උණුසුම් මුදල්”/ පාරිභෝගික අරමුදල් ආපසු ගැනීම් වලින් බලපෑම් ➔ වත්කම් සහ වගකීම් පරිමාවන් වල වෙනස්කම් වලින් සිදුවන බලපෑම් ➔ රාජ්‍ය සුරැකුම්පත්වල වෙළෙඳපොල වටිනාකම අනුව සිදුවන බලපෑම ➔ HQLA සහ ශුද්ධ මුදල් පිටතට ගලායාමේ පරිමාව වෙනස් වීමෙන් සිදුවන බලපෑම්	➔ පසුගිය වසර 3 (පසුගිය මාස 36) මත පදනම්ව වාර්තා වූ සාමාන්‍ය අලාභ ප්‍රමාණය ➔ පූර්වාසන්න වසර (පසුගිය මාස 12) මත පදනම්ව වාර්තා කල සාමාන්‍ය අලාභ ප්‍රමාණය

පොලී අනුපාත අවදානම (IRR) පීඩන පරීක්ෂණය

	කම්පනයේ විශාලත්වය 5%	කම්පනයේ විශාලත්වය 10%	කම්පනයේ විශාලත්වය 15%
2024			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	1,437	2,874	5,748
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	16.41	16.28	16.02
2023			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	2,321	4,643	4,265
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	17.41	16.42	16.46

හුවමාරු අනුපාත අවදානම පීඩන පරීක්ෂණය

	කම්පනයේ විශාලත්වය 5%	කම්පනයේ විශාලත්වය 10%	කම්පනයේ විශාලත්වය 15%
2024			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	166	332	498
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	16.52	16.51	16.49
2023			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	183	367	550
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)	17.35	17.33	17.31

	කම්පනයේ විශාලත්වය 5%	කම්පනයේ විශාලත්වය 10%	කම්පනයේ විශාලත්වය 15%
2024			
ස්කන්ධ කළඹේ උපරිම වෙළෙඳපොල වටිනාකමට බලපෑම (රු.මි.)	82	163	326
උපායමාර්ගික ස්කන්ධවල සාධාරණ අගයට බලපෑම (රු.මි.)	19	40	79
මුළු බලපෑම (රු.මි.)	101	203	406

ණය අවදානම

බැංකුවේ ණය අවදානම ණය හා අත්තිකාරම් කළඹ, මූල්‍ය ඇප, ණයවර ලිපි, ගනුදෙනුකරුවන් වෙනුවෙන් නිකුත්කළ හා සිදුකල ප්‍රතිග්‍රහනයන් තුළින් ඇති වන අතර, ආරක්ෂිත මාර්ග ත්‍රිත්වය යටතේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් තුළ කළමනාකරණය කෙරේ. ණය අවදානම සඳහා පාදක වූ කරුණු ලෙස ගනුදෙනුකරුවෙකුට හෝ ඔහුගේ ඇපකරුට බැංකුවේ ගිවිසුම් බැඳීම් සපුරාලීමට අසමත්වීම, පැහැර හැරීමේ අවදානම සහ සංකේන්ද්‍රණ අවදානම දැක්විය හැක. බැංකුව වත්කම්වල ගුණාත්මකභාවය සහ අක්‍රීය ණය නිසි අයුරින් පවත්වා ගනිමින්. ණය අවදානම සාර්ථකව කළමනාකරණය කොට අවම කිරීමට පියවර ගෙන ඇති අතර, එය 2024 සඳහා මූල්‍ය ජයග්‍රහනයන්ගෙන් පිළිබිඹු වේ.

ණය අවදානම කළමනාකරණය කිරීමේ පරමාර්ථ

- ණය කළමනාකරණයට අදාළ මූලික කාර්යසාධන (KPI) සාක්ෂාත්කර ගැනීම සහතික කරන කළඹේ ගුණාත්මකභාවය
- ණය කළඹ තුළ විචක්ෂණ කළමනාකරණය තුළින් මනාව විවිධාංගීකරණය කළ කළඹක් පවත්වා ගැනීම
- ප්‍රතිඵල උපරිම කිරීම තුළින් ප්‍රශස්ථ අවදානම් ප්‍රදාන ගෙවීම් නිදහස්වීමක් අත්කර ගැනීම
- උසස් කළඹක් සහ වත්කම්වල ගුණාත්මකභාවයක් පවත්වා ගැනීම සහ පහසු සීමාවක් තුළ අක්‍රීය ණය අවම කිරීම/කළමනාකරණය කිරීම

පූර්ව අනුමත යාන්ත්‍රණය	පශ්චාත් අනුමත යාන්ත්‍රණය
ණය තක්සේරු නිර්ණායක මත පදනම් වූ ඇගයීම ණය අනුමැතියේ බහු ස්ථර අවශ්‍ය අවස්ථාවලදී CRO විසින් ස්වාධීන සමාලෝචනය ව්‍යුහගත සීමාවන්, පැහැරහැරීම, සංකේන්ද්‍රණ සහ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය මත රඳා පවතී ණයකරු ශ්‍රේණිගතකරණය සහ ලකුණු කාඩ් අවදානම් පදනම් මිලකරණය අවශ්‍ය අවස්ථාවල තනි ණයකරු සීමා පූර්ව නිවාරණය හා මුර ලැයිස්තු පිළිපැදීම	පූර්ව අවවාද සංඥා හඳුනා ගැනීම පීඩන ක්ෂේත්‍ර හඳුනාගැනීමේදී ගනුදෙනුකරුවන් සමඟ සක්‍රීය සහභාගිත්වය හා විසඳුම් ලබාදීම පීඩන පරීක්ෂණ සහ ක්‍රමවේද පරීක්ෂාව අයකිරීම සහ නැවත ගෙවීමේ ක්‍රියාවලිය

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC) බැංකුවේ ණය අවදානම් කළමනාකරණය සඳහා පාලනය ලබා දෙන අතර, එය ණය ප්‍රතිපත්ති සකස් කර යාවත් කිරීම සඳහා වගකීමට බැඳී සිටී. මෙයට අයත් කාර්යයන් වන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශකත්වයෙන් ව්‍යාපාර අවශ්‍යතා සහ සාර්ව ආර්ථික තත්ත්වයන් සලකා බැලීම, අධ්‍යක්ෂ මණ්ඩලය විකඟවන විශාල සහ වඩා ඉහළ ණය නිරාවරණ මෙහෙයවීමට ණය අනුමත ව්‍යුහය සකස් කිරීම සහ තනි පුද්ගල ණය නිරාවරණ පිළිබඳ කලින් කල සමාලෝචන පැවැත්වීම සහ අනවශ්‍ය අවදානම් සංකේන්ද්‍රණ අවම කිරීමට සමස්ත කළඹ මෙහෙයවීම, වඩා ඉහළ නිරාවරණ හා වෙන්කිරීම්වල ප්‍රමාණය ඵලදායීව කළමනාකරණය කරන බව සහතික කිරීම, ණය ශ්‍රේණිගත පද්ධති සහ අවදානම පදනම් මිලකරණ ආදර්ශ සංවර්ධනය කර පවත්වා ගැනීම, ඉහත පූර්ව නිශ්චිත සීමා තුළ ණය යෝජනා අනුමත කිරීම සහ ප්‍රතික්ෂේප කිරීම, සහ බැංකුවේ අවදානම් රුචිය තුළ රජයට අයත් ආයතනවල නිරාවරණය විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම වේ.

ණය අවදානම් කළමනාකරණයේ පාලන ව්‍යුහය



ණය අවදානම කළමනාකරණය

අනු අංකය	ක්‍රමවේදය	විස්තරය
1.	ශක්තිමත් අවදානම් ප්‍රතිපත්ති සහ පාලන රාමුව	BECC විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහයෝගය සමඟ ණය අවදානම් රාමුව සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය ප්‍රතිපත්තිය සහ ණය ක්‍රියා පටිපාටි අත්පොත (CPM) – බැංකුවේ ණය සංස්කෘතිය නිර්වචනය කරයි.
2.	වගකීම් සහිත ණය දීමේ සංස්කෘතිය	අභ්‍යන්තර සන්නිවේදනය සහ කාර්ය මණ්ඩල පුහුණුව අවදානම් දැනුවත් සංස්කෘතියක් සහතික කරන අතර, බැංකුව තුළ වගකීම් සහගත ණය දීමේ සංස්කෘතියක් පෝෂණය කරයි. ණය ලබා දීමට හෝ ණය සීමාව වැඩි කිරීමට පෙර සම්පූර්ණ ගනුදෙනුකාර ණය ඇගයීමක් සිදු කරනු ලැබේ. විවිධ අවදානම් සාධක තක්සේරු කිරීමට සහ පැහැර හැරීමේ සහ අලාභයේ සම්භාවිතාව පුරෝකථනය කිරීමට අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආකෘති භාවිතා වේ.
3.	අධිකාරිය බෙදීම.	සියලුම ණය අවදානම් නිරාවරණය සඳහා අවසාන අධිකාරිත්වය සහ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. ණය අධිකාරියේ සීමාවන් සඳහා අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC) වෙත පවරා ඇත. ණය කමිටු සහ ව්‍යාපාරික මාර්ග වෙත අනුමත සීමාවන් පැවරීමට අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC) හට බලය ඇත. සෑම ව්‍යාපාරික මාර්ගයක්ම පැහැදිලිව ප්‍රකාශ කර ඇති අතර, බහු මට්ටමේ අවදානම් පිළිගැනීමේ නිර්ණායක සහ ණය අනුමත කිරීමේ අධිකාරිය අනුමත කර ඇත. ණය පහසුකමකට යම් පශ්චාත් බෙදාහැරීමේ වැදගත් වෙනස්වීම් (කාලය, ගිවිසුම් හෝ ඇප ව්‍යුහය වෙන්වීම් වැනි) සඳහා මුල් අනුමත අධිකාරියේ අනුමැතිය අවශ්‍යය. අවදානම් තක්සේරුව සහ පශ්චාත් නියාමනය සඳහා වගකීම් බෙදීම ණය අනුමත කිරීමේ මාර්ගෝපදේශ සහ දක්ෂතාවන් හි විශේෂත්වය ඇති කරයි. ණය අනුමත කිරීමේ බලතල අදාළ ශ්‍රේණියට අනුකූල පුද්ගලයන් වෙත පවරනු ලබන අතර, කලින් කල සමාලෝචනය පවත්වනු ලැබේ.
4.	වගකීම් දරන්නන්ගේ අවදානම් ශ්‍රේණිගත කිරීම	බැංකුව විසින් අභ්‍යන්තර ඇගයීම් ක්‍රමවේද, විශේෂිත ලකුණු කාඩ් සහ ලකුණු නවයේ ශ්‍රේණිගතකරණ පරිමාව ඇතුළු ක්‍රියාමාර්ග රාශියක් යොදා ගනිමින් ණය වටිනාකම් අගය කරන අතර, ණය ගැනුම්කරවන් වෙත ශ්‍රේණිගතකරණ පැවරීම සිදුකරයි. එක් එක් වර්ගයේ ණය ගැනුම්කරුවන්ට විවිධ අවදානම් ශ්‍රේණිගතකරණ ලකුණු කාඩ් පැවරෙන අතර, BIRMC විසින් කලින් කල ඒවායේ අදාළත්වය සඳහා සමාලෝචනය කරනු ලැබේ.
5.	ණය අවදානම අවම කිරීම සහ ඇපකර කළමනාකරණය	විභව ණය අලාභ අවම කර ගැනීමට, ව්‍යුහගත කිරීම, ඇපකරණ වැඩපිළිවෙල, ශුද්ධ ගිවිසුම් සහ ඇපකර වැනි උපායමාර්ග භාවිතා කෙරේ. බැංකුවේ ඇපකර ප්‍රතිපත්තියට අනුව ඇපකර ලබාගනු ලබන අතර, චංචල සහ නිශ්චල දේපල උකස්, මුදල් තැන්පතු, පිරියත හා යන්ත්‍රෝපකරණ, කොටස් මත උකස්, ණය කළඹ ආයතනික සහ පුද්ගලික ඇපකර ප්‍රධාන ඇපකර වර්ග වෙති.
6.	ණය අධීක්ෂණය සහ සමාලෝචනය	ණය අවදානම් තත්ත්වයන් අඛණ්ඩව අධීක්ෂණය කර කළමනාකරණය කෙරේ. ව්‍යාපාර ඒකකවලට අනුයුක්ත ණය නිලධාරීන් විසින් ණය නියාමනය සිදු කරනු ලැබේ. අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුව ස්වාධීනව ණය යෝජනා පිළිබඳ පූර්ව සමාලෝචනය සහ පසු සමාලෝචනය සිදු කරයි. ණය නිලධාරීන්ට තම ගනුදෙනුකරුවන්ගේ ණය අවදානම් කළමනාකරණය කිරීමට අදාළ විශේෂඥතාව සහ පළපුරුද්ද ඇත. සෑම ණය නිලධාරියෙකුම/සම්බන්ධතා කළමනාකරුවෙකුම ඔවුන්ගේ අදාළ ණය ගැතියන්ගේ ණය නිරීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය. ණය අවදානම පිළිබඳ වැඩිදුර සමාලෝචනය සහ අධීක්ෂණය සඳහා BECC, BIRMC සහ CRMC වෙත වරින් වර ණය සමාලෝචන වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.
7.	නිර්වචනය කරන ලද අවදානම් රුචියට අනුකූලව පුළුල් ණය සීමාවන්	කර්මාන්ත/අංශ සඳහා උපරිම ණය සීමාවන් ස්ථාපිත කිරීම, ණය ශ්‍රේණිගත කිරීම් මත පදනම් වූ නිරාවරණයන්, රජය සතු ව්‍යවසායන්, භූගෝලීය ප්‍රදේශ සහ තනි ණය ගැනුම්කරුවකු සහ උපරිම නවාතැන් පහසුකම් වැනි නියාමන සීමාවන්ට දැඩි ලෙස අනුකූල වේ.

අනු අංකය	ක්‍රමවේදය	විස්තරය
8.	අඛණ්ඩ පසු විපරම් සහ සම්පූර්ණ අයකිරීමේ ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කිරීම.	සියලුම ණය ගැණුම්කරුවන්ට එක හා සමානව සලකන සහ සම්පූර්ණයෙන් පියවන තෙක් සියලු ණය අඛණ්ඩව පසුවිපරම් කිරීම සහතික කරන අයකිරීමේ ක්‍රියා පටිපාටියක් බැංකුව ස්ථාපිත කර ඇත
9.	පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා ඇතුළුව පුනරුත්ථාපන හා පුනර්ජීවන ක්‍රියාවලිය	සම්මත ප්‍රතිව්‍යුහගත සහ ප්‍රතිසැකසුම්ගත ක්‍රියාපටිපාටියට අමතරව පීඩනයට පත් ව්‍යාපාරික ණය ගැනීයන් ආමන්ත්‍රණය කිරීම සඳහා බැංකුවට පූර්ණ ප්‍රතිඥා දී ඇති පුනරුත්ථාපන සහ පුනර්ජීවන ක්‍රියා පටිපාටියක් ඇත.
10.	ණය හානිකරණය	අදියර වත්කම් සමග කටයුතු කිරීම සඳහා හානිකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. ණය හානිකරණය සඳහා වෙන් කිරීම ශේෂ පත්‍රයේ ණයවල ධාරණ අගයේ අඩු කිරීමක් ලෙස සටහන් වේ. ණය හාණිකරණය සඳහා වෙන් කිරීම් ආදායම් ප්‍රකාශයේ සිදුකරන අතර, බැංකුවේ සියලුම නිරාවරණයන් සඳහා තක්සේරු කිරීම් සිදු කෙරේ. මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ණය හානිකරණය ගණනය කර ගිණුම්ගත කරන අතර, අවදානම් කළමනාකරණය සහ ණය පාලන දෙපාර්තමේන්තුව විසින් සත්‍යාපනය සිදු කරනු ලැබේ.
11.	පුහුණුව හා සංවර්ධනය	වෙළෙඳපොළ වෙනස්වීම් සහ ණය ගැණුම්කරුවන්ගේ අවශ්‍යතාවලට අනුකූලව දැනුම කාලීනව යාවත්කාලීන කිරීම සහතික කිරීම සඳහා බැංකුව විසින් ණය මාර්ග කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ පුහුණුව සහ සංවර්ධනය නියම කෙරේ. පුහුණුව සහ සංවර්ධනය මගින් ණය ඇගැයීමේ ක්‍රියාවලියේ ඉහළ ගුණාත්මක භාවය සහ පසු බෙදාහැරීමේ කටයුතු කළමනාකරණය සහතික කෙරේ.

උපරිම ණය නිරාවරණය



අදියර වත්කම් වෙන්කිරීමේ ආවරණ අනුපාතය

අදියර	වෙන්කිරීම් ආවරණය 2024 %	වෙන්කිරීම් ආවරණය 2023 %
අදියර 1	1.31	0.77
අදියර 2	2.79	2.90
අදියර 3	41.92	41.65
එකතුව	8.93	7.42

සංක්‍රමණ අවදානම

සංක්‍රමණ අවදානම කාලසීමාව සමඟම ණයකරුගේ ණය ශ්‍රේණිගතකරණය පරිහානියට පත්වීම හේතුවෙන් සිදුවේ. 2024 දී, ආයතන ගනුදෙනුකරුවන්ගේ ණය ශ්‍රේණිගතකරණ සංක්‍රමණය බැංකුව සමීපව නිරීක්ෂණය කරන ලදී.

2018 – 2024 දක්වා ආයතනික ගනුදෙනුකරුවන් පහළට ශ්‍රේණිගත කිරීම

වසර	සංක්‍රාන්තියේදී ගනුදෙනුකරුවන් ගණන	පහළට ශ්‍රේණිගත කළ ගනුදෙනුකරුවන් ගණන (%)
2018	322	19
2019	318	20
2020	320	21
2021	321	11
2022	329	14
2023	300	37
2024	257	17

පැහැරහැරීමේ අවදානම

ණය ගිවිසුමක ණයකරු හෝ ඇපකරු එහි ගිවිසුම්ගත බැඳීම් කඩකිරීම තුළින් ඇතිවන පැහැරහැරීමේ අලාභය පැහැරහැරීමේ අවදානමක් ලෙස හඳුන්වනු ලබයි. වැඩි දුර අලාභ අවම කිරීමට අවශ්‍ය වූ විට අවශ්‍ය ක්‍රියාමාර්ග යොදා ගනිමින් මෙය අපගේ ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රියාවලි මගින් අවම කරනු ලබයි. අපි 2024 දී 10.26%ක යහපත් කළඹක් සමඟ බැංකුවේ අදියර 3 වත්කම් කළඹ පවත්වා ගත්තෙමු.

සංකේන්ද්‍රණ අවදානම

තනි පුද්ගල ණයකරුවෙක්, කර්මාන්ත අංශයක් හෝ භූගෝලය කලාපයක් ණය සේවාකරණය ප්‍රතික්ෂේප කරන විට බැංකුවේ වත්කම් කළඹ තුළ වටිනාකම හෝ ප්‍රතිඵලවල ඇතිවියහැකි අලාභය හේතුවෙන් සංකේන්ද්‍රණ අවදානම ඇති වේ. රජයට අයත් බැංකුවක් වශයෙන්, මහජන බැංකුව රජයට අයත් ව්‍යවසාය අංශය මෙන්ම උකස්, SME ණය, සහ පුද්ගල අත්තිකාරම් වැනි වෙනත් ඉහළ ඉල්ලුම් අංශවලට නිරාවරණය විචක්ෂණව කළමනාකරණය කර ඇත.

සංකේන්ද්‍රණ අවදානම යනු තනි පුද්ගල ප්‍රතිපාර්ශ්වයක්, කර්මාන්ත අංශයක් හෝ භූගෝලීය කලාපයක් නිරාවරණය අහිතකර දිශාවක් වෙත විතැන්වන විට බැංකුවේ ණය සහ අත්තිකාරම් කළඹ තුල වටිනාකම අහිමිවීමේ විභවතාවයයි. රජයට අයත් බැංකුවක් (SOE) වශයෙන්, මහජන බැංකුවට රජයට අයත් ව්‍යවසාය අංශය වෙත සැලකියයුතු නිරාවරණ ඇති අතර, අනෙකුත් නිරාවරණ වන්නේ පාරිභෝගික/පුද්ගල ණය, ව්‍යවසාය ණය, SME සහ සංවර්ධන ණය සහ උකස්කර ය.

විශාල නිරාවරණ සඳහා සංකේන්ද්‍රණය (රු. මිලියන 100ට වැඩි)

2023 දෙසැම්බර් 31 දිනට	ක්ෂේත්‍රයේ අංශ ගණන	තනි ගනුදෙනුකරුවන් ගණන	සෘජු නිරාවරණය රු.මි.	වක්‍ර නිරාවරණය රු.මි.	මුළු ගණන රු.මි.	ශේෂ පත්‍රයේ ප්‍රතිශතයක් ලෙස සෘජු නිරාවරණය (%)
රාජ්‍ය ව්‍යවසාය සහිත	18	379	956,757	75,053	1,031,810	55.89
රාජ්‍ය ව්‍යවසාය රහිත	17	340	184,146	35,338	219,484	10.77

2024 දෙසැම්බර් 31 දිනට	ක්ෂේත්‍රයේ අංශ ගණන	තනි ගනුදෙනුකරුවන් ගණන	සෘජු නිරාවරණය රු.මි.	වක්‍ර නිරාවරණය රු.මි.	මුළු ගණන රු.මි.	ශේෂ පත්‍රයේ ප්‍රතිශතයක් ලෙස සෘජු නිරාවරණය (%)
රාජ්‍ය ව්‍යවසාය සහිත	18	433	698,922	69,035	767,957	21.19
රාජ්‍ය ව්‍යවසාය රහිත	17	395	254,155	43,584	297,739	9.03

2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ඉහළම ගනුදෙනුකරුවන් 20% හි තත්ත්වය

වසර	ඉහළ 3%	ඉහළ 5%	ඉහළ 10%	ඉහළ 20%
රාජ්‍ය ව්‍යවසාය ඇතුළුව				
2024	39	49	60	68
2023	58	65	74	80
රාජ්‍ය ව්‍යවසාය නොමැතිව				
2024	19	25	34	47
2023	16	21	29	42

2024 සංකේන්ද්‍රණයේ එක් එක් මට්ටම සඳහා ඉවසුම් සීමාව

මිටරය	අඩු සංකේන්ද්‍රණය	මධ්‍යම සංකේන්ද්‍රණය	ඉහළ සංකේන්ද්‍රණය
HHI	<0.15	0.15-0.25	>0.25

2024 මූල්‍ය වසර සඳහා කාර්තුමය තත්ත්වය

	31 මාර්තු 24	30 ජූනි 24	30 සැප්තැම්බර් 24	31දෙසැම්බර් 24
නම සංකේන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසායන් සහිත)	0.19	0.19	0.19	0.07
නම සංකේන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසායන් රහිත)	0.02	0.02	0.02	0.02
අංශය සංකේන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසායන් සහිත)	0.20	0.20	0.21	0.11
අංශය සංකේන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසායන් රහිත)	0.13	0.13	0.13	0.13

ණය අවදානම් පීඩන පරීක්ෂණය 2024

	සුළු %	මධ්‍යම %	විශාල %
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත මත හානිකරණ බලපෑමේ වැඩිවීම – ඉහළ අවදානම් පරිසරය තුළ			
අදියර 1 කාණ්ඩයේ සිට අදියර 2 කාණ්ඩයට මාරුවීම			
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	10.85	10.81	10.76
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.50	16.47	16.43
අදියර 2 කාණ්ඩයේ සිට අදියර 3 කාණ්ඩයට මාරුවීම			
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	10.74	10.59	10.45
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.39	16.25	16.10
අදියර 1 කාණ්ඩයේ සිට අදියර 2 කාණ්ඩයට සහ අදියර 2 කාණ්ඩයේ සිට අදියර 3 කාණ්ඩයට එකවර මාරුවීම			
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	10.70	10.52	10.34
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.36	16.18	16.00
පැහැරහැරීමේ හැකියාව තුළ කම්පනය			
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	10.84	10.80	10.76
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.50	16.46	16.41

	සුළු %	මධ්‍යම %	විශාල %
අලාභ දෙන පැහැරහැරීමේ කම්පනය			
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	10.81	10.74	10.67
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.47	16.40	16.33
පැහැරහැරීමේ හැකියාව තුළ සහ අලාභ දෙන පැහැරහැරීමේ කම්පනය			
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	10.52	10.12	9.69
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.17	15.77	15.34
විශාල ණයගැණුම්කරුවන් විසින් ගෙවීම පැහැර හැරීම			
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	10.71	10.62	10.53
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.36	16.27	16.19
විශාල ආයතන තුන විසින් ගෙවීම පැහැර හැරීම			
සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	10.58	10.28	9.98
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය	16.24	15.94	15.64

වෙළෙඳපොල අවදානම

වෙළෙඳපොල අවදානම යනු පොලී අනුපාත, හුවමාරු අනුපාත, ස්කන්ධ මිල ගණන්, සහ පාරිභෝජන භාණ්ඩ මිල ගණන් වැනි වෙළෙඳපොළ මෙහෙයවන විචල්‍යතාවල වෙනස්වීම් හේතුවෙන් ඇතිවිය හැකි විභවතාවයයි.

මහජන බැංකුව වෙළෙඳපොල අවදානමට නිරාවරණය වන අතර, ප්‍රධාන වශයෙන් එය වෙළෙඳ කළඹ තුළින් ඇති වන පොලී අනුපාත අවදානම පාරිභෝජන භාණ්ඩ මිල අවදානමට නිරාවරණය වූ සිය රන් කළඹ තුළින් රන් මිල වෙත නිරාවරණය වීම තුළින් සිදු වේ. විදේශ විනිමය සඳහා බැංකුවේ නිරාවරණය මහ බැංකුවේ ශුද්ධ විවෘත තත්ත්වය පවත්වා ගෙන යාම සහ විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර සීමාවන්ට දැඩිව අනුකූලව වෙමින් කළමනාකරණය කෙරේ. ස්කන්ධ වෙළෙඳපොල නිරාවරණය වෙළෙඳ කළඹේ අඩු පරිමාව හේතුවෙන් සීමා කෙරේ.

වෙළෙඳපොල පාලන අවදානම් ව්‍යුහය



අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකාබද්ධ කමිටුව (BIRMC)	වත්කම් හා වගකීම් කමිටුව (ALCO)	අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (RMD)	භාණ්ඩාගාර මධ්‍යපෙළ කාර්යාලය (TMO)
බැංකුවේ වෙළෙඳපොල අවදානම් නිරාවරණය නියාමනය කර, ප්‍රතිපත්ති හා අවදානම් රුචි සීමා සකස් කර, වෙළෙඳපොල කළමනාකරණය පිළිබඳ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දේ.	වත්කම් හා වගකීම් කමිටුව (ALCO) වෙළෙඳපොල අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීමට සහ නිශ්චිත අවදානම් රුචිය තුළ වෙළෙඳපොල අවදානම් අනාවරණ පවත්වා ගැනීමට සහ සුදුසු මිලකරණ ව්‍යුහයන් නිර්දේශ කිරීමට, මූල්‍ය වෙළෙඳපොල ඇතිවන අවදානම් විශ්ලේෂණය කිරීමට සහ අවම කිරීමේ ක්‍රියාවන් නිර්දේශ කිරීමට වගකීමට බැඳී සිටී.	RMD වෙළෙඳපොල අවදානම් තක්සේරුව, නියාමනය හා වාර්තාකරණය ඇතුළුව දෛනික අවදානම් කළමනාකරණ කටයුතු සඳහා වගකීමට බැඳී සිටී.	භාණ්ඩාගාර මධ්‍යපෙළ කාර්යාලය විසින් (TMO) භාණ්ඩාගාර ඉදිරි කාර්යාලය සහ භාණ්ඩාගාර පසු කාර්යාලයෙන් ස්වාධීනව බැංකුවේ භාණ්ඩාගාර ගනුදෙනු මැණුම්කර නියාමනය කරයි. මෙම කාර්යාලය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අවදානම් සීමාවලට අනුකූලතාව සහතික කරයි.

2023 ට අනුව 2024 මහජන බැංකුවේ වෙළෙඳපොල අවදානම් නිරාවරණය

	2024			2023		
	අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් අගයට මූල්‍ය වත්කම් රු.මි.	ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් රු.මි.	ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද උපකරණ ණය රු.මි.	අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් අගයට මූල්‍ය වත්කම් රු.මි.	ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් රු.මි.	ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද උපකරණ ණය රු.මි.
වත්කම්			167,697		143,131	63,267
භාණ්ඩාගාර බිල්පත්		325,061	948,540		814	760,061
භාණ්ඩාගාර බැඳුම්කර		4,441	10,799			16,799
ශ්‍රී. ලං. සං. බැඳුම්කර						
ශ්‍රී. ලං. රජයේ බැඳුම්කර			-	10,180	240	
වෙනත් ආයෝජන	9,423	308				
වගකීම්						
ණයකර			54,156			46,997

කළමනාකරණ රාමුව

ක්‍රමය	විස්තරය
ප්‍රතිපත්ති රාමුව	බැංකුවේ වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් වන්නේ: භාණ්ඩාගාර ප්‍රතිපත්තිය, ආයෝජන ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, පිඩන පරීක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය සහ රටේ සීමා ප්‍රතිපත්තිය.
අවදානම් කළමනාකරණය	වෙළෙඳපොල අවදානම් කළමනාකරණය සඳහා යොදාගත් මෙවලම්වලට ඇතුළත් වන්නේ: අවදානම් අගය (VaR), කාල පරතරය, සංවේදීතා විශ්ලේෂණය, සහ පිඩන පරීක්ෂාව. තක්සේරු අනුපාත සහ ක්‍රමවේද ස්වාධීන සත්‍යාපනයට යටත් වේ.
වෙළෙඳපොල අවදානම් සීමා	වෙළෙඳපොල අවදානම් සීමාවන් තක්සේරු කර අවදානම් කළමනාකරණය විසින් ALCO වෙත නිර්දේශ කර පසුව BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ. විවෘත තත්ත්ව සීමාවන්, ප්‍රතිපාර්ශ්වික සීමාවන් සහ අලෙවි නියෝජිත සීමාවන් වැනි සීමාවන් අනුමත වෙළෙඳපොල අවදානම් සීමාවන් මත පදනම්ව අර්ථ දක්වා ඇත. නිෂ්පාදන, අංශය, ණය ශ්‍රේණිගත කිරීම සහ භූගෝලය මත පදනම්ව සීමාවන් නියාමනය කෙරේ. TMO සීමාවන්ට එරෙහිව කාර්යසාධනය නියාමනය කරන අතර, මාසික පදනමින් ALCO සහ BIRMC වෙත වාර්තා කරයි. මෙම සීමාවන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වරින් වර සමාලෝචනය කරනු ලබන අතර BIRMC සහ BOD විසින් අනුමත කරනු ලැබේ.
කාර්ය ක්‍රියාත්මක අංශ	අවදානම් රුචිකත්ව ප්‍රකාශය මගින් අර්ථ දක්වා ඇති මට්ටම් තුළ වෙළෙඳපොල අවදානම් නිරාවරණ පවත්වා ගැනීම සහතික කිරීම සඳහා නිශ්චිත විශේෂිත කළමනාකරණ ක්‍රියාවන් සිදුකරන අවදානම් සීමාවන් දක්වා ඇත.

2024 දෙසැම්බර් 31 දිනට වෙළෙඳපොල අවදානම් සීමා සහ තත්ත්වයන්

වෙළෙඳපොල අවදානම		වෙළෙඳපොල අවදානම් රුචිය	
		අනුමත සීමාව	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා
විනිමය හුවමාරු ශුද්ධ විවෘත තත්ත්වය		ඇ.ඩො.මි. +10/-25	අනුකූල විය
අවදානමේ වටිනාකම (VaR) (විශ්වාසී මට්ටම 99%, දින 1)	– ව්‍යවහාර මුදල	ඩොලර් 250K	අනුකූල විය
	– පොළී අනුපාත	රුපියල් මිලියන 3.4 (වෙළෙඳ)	අනුකූල විය
සමුච්චිත අලාභ (උපලබ්ධි)	– FIS වෙළෙඳ (උපලබ්ධි නොවූ)	රුපියල් මිලියන 3 (දිනකට)	අනුකූල විය
		රුපියල් මිලියන 500	අනුකූල විය
ඉදිරි විනිමය හුවමාරු පරතරය සීමාව		ඩොලර් මිලියන 600 (මාස)	අනුකූල විය
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	– FVPL (වෙළෙඳ)	රුපියල් බිලියන 500	අනුකූල විය
	– AC හි ආයෝජන	රුපියල් බිලියන 1,600	අනුකූල විය
	– FVOCI (AFS)	රුපියල් මිලියන 20	අනුකූල විය
ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරය	– වෙළෙඳ	ඩොලර් මිලියන 20	අනුකූල විය
	– ආයෝජන	ඩොලර් මිලියන 55	අනුකූල විය
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB)		ඩොලර් මිලියන 50	අනුකූල විය
අන්තර් බැංකු ණය ගැනීම්	– මුළු සීමාව	ඩොලර් මිලියන 1.046.68	අනුකූල විය
	– කෙටි කාලීන සීමාව	ඩොලර් මිලියන 261.67	අනුකූල විය
පවත්නා වටිනාකම් පදනම් ස්ථාන (PVBP) සීමාව		රුපියල් මිලියන 25	අනුකූල විය
රන් භාණ්ඩවල ඒකක භාරය		රුපියල් බිලියන 2.5	අනුකූල විය
ආයතනික ණය සීමාව (ණයකර)		රුපියල් බිලියන 15	අනුකූල විය
බැංකු නොවන PDU සඳහා මූල්‍ය ගිවිසුම් සීමාව PDU		රුපියල් බිලියන 3.0	අනුකූල විය
කැපුම් සීමාව		10%	අනුකූල විය
Swap අරමුදල් සඳහා සීමාව		මාස 3කට අඩු කාල සීමාවක් සඳහා O/S හි 75%	අනුකූල විය
පොළී අනුපාත අවදානම (D-Gap + VaR on Fwd.Fx)		රුපියල් මිලියන 17.5	අනුකූල විය
කොටස් වෙළෙඳ කළඹ තුළ ආයෝජන වටිනාකම		අන්ත 1: රුපියල් බිලියන 1 අන්ත 2: රුපියල් බිලියන 1	අනුකූල විය
නැවතුම් අලාභ සීමාව (කොටස් වෙළඳාම)		30%	අනුකූල විය
S&P SL20 දර්ශකය මත කොටස් ප්‍රතිශතය		25%	අනුකූල විය

2024 රට වෙනුවෙන් ප්‍රතිසාධන වර්ෂයක් වූ අතර, එබැවින්, දේශීය හා ජාත්‍යන්තර සාධකවල එකතුවක් මගින් වෙළෙඳපොල අවදානමට සැලකියයුතු ලෙස බලපෑමක් එල්ල කරන ලදී. මෙම ක්‍රියාවලිය ක්‍රමයෙන් සිදුවුවද, පුරෝකථනය කළ ප්‍රමාණයෙන් ඉදිරියට ගොස් 5% ක වර්ධනයක් අත්කර ගනිමින් ආර්ථික ප්‍රගතියේ මාවතකට පියවර තබන ලද අතර, එයට සංචාරක කර්මාන්තයේ වේගවත් ගතිකතාව, වැඩිකළ ප්‍රේෂණ, සහ කර්මාන්ත අංශයේ විශාල නැගිටීම හේතු විය. පහත වැටුණ බැහැර කළහැකි ආදායම පාරිභෝජන වියදම අඩුකිරීමකට හේතු විය. වසර පුරා උද්ධමනය අඩුව පැවතියද, පුද්ගලික අංශයේ ණය වර්ධනය එයට සමාන නොවීය.

මූල්‍ය ප්‍රතිපත්තිය තුළ පහසුකම් සලසන ස්ථාවරයක් යොදා ගනිමින් නියාමක විසින් පොළී අනුපාත අඩු කිරීම එයට හේතු විය. පිස්කල් පෙරමුණ මත, රජය බදු ඉහළ දමා, රජයේ වියදම් කපාදමා, බලාත්කාර අතිරික්ත ලබා ගැනීමට අඛණ්ඩව අපනයන තහනම් කර තිබුණි. සමස්තයක් වශයෙන්, පුරෝකථනය කරන ලද 2.5%ට වඩා රට 5%ක වර්ධනයක් සාක්ෂාත් කර ගෙන ඇත.

එමනිසා, වෙළෙඳපොල අවදානම දේශීය ආර්ථිකයේ සහ ජාත්‍යන්තර සාධකවල වෙනස්වීම්වලට යටත් වූ අතර, බැංකුව යම් සෘණාත්මක බලපෑම්වලින් ආරක්ෂා කර ගැනීමට දැඩි ක්‍රියාමාර්ග යොදා ගනිමින් අපි විසින් සමීපව නියාමනය කරන ලදී.

පොලී අනුපාත අවදානම (IRR)

වෙළෙඳපොළ පොලී අනුපාතවල අධික උච්චාවචනයන් බැංකුවේ ශුද්ධ පොලී ආදායමට සෘජුවම බලපාන අතර එය පාදක වූ වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම කෙරෙහි තවදුරටත් බලපෑමක් සිදු කරයි. 2024 දී පොලී අනුපාතවල උච්චාවචනය මෑත වසරවල වඩාත් ගතික මට්ටමට සමාන වූ අතර, එය මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්තිය, උද්ධමනය, සහ ගෝලීය වෙළෙඳපොල තුළ වෙළෙඳ භාණ්ඩවල මිල උච්චාවචන වැනි සාර්ව ආර්ථික සාධකවලින් ඇති විය.

විවිධ කල්පිරීම් සහිත වත්කම් සහ වගකීම් අතර කාලීන වෙනස්වීම හේතුවෙන් ඇතිවන ප්‍රතිමිලකරණ අවදානම, සත්‍ය හා අපේක්ෂිත පොලී ආන්තික අතර වෙනසින් ඇතිවන මූලික අවදානම, සහ බැංකුවේ ඉපැයීම් සහ වත්කම් වටිනාකම අතර ඍණාත්මක බලපෑම් වලින් ඇතිවන ඵලදාවට බලපාන ලද ඵලදා වක්‍ර අවදානම, 2024දී අඛණ්ඩ අභියෝගයක් විල්ල කළ පොළී අනුපාත අවදානමේ උප කාණ්ඩ වෙති.

පොලී අනුපාත අවදානම් සමාලෝචනය

පොළී අනුපාත අවදානම කළමනාකරණය විස්තීර්ණ හා සාමූහික ප්‍රයත්නයකි. පොළී අනුපාත අවදානම සඳහා අවදානම් රුචිය අනුමත කිරීමට, සහ VaR සහ අවදානමේදී ඉපයීම් (EAR) සඳහා සමස්ත සීමා සකස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. වෙළෙඳපොළ අවදානම් ප්‍රතිපත්තිය මගින් සම්පූර්ණයෙන් මෙය ක්‍රියාත්මක කරන පරාමිත විස්තර කරයි. භාණ්ඩාගාරය පොළී අනුපාත අවදානම අනුමත අවදානම් රුචිය තුළ කළමනාකරණය කරන අතර, මධ්‍යම කාර්යාලය පූර්ව නිශ්චිත ශිල්ප යොදා ගනිමින් ක්‍රියාවලිය නියාමනය කරයි. වත්කම් හා වගකීම් කමිටුව (ALCO) ප්‍රතිමිලකරණ තීරණ හා බැංකුවේ වත්කම් සහ වගකීම් කළඹ අඛණ්ඩව නියාමනය කිරීම සඳහා වගකිව යුතුය. සාකල්‍ය ආකාරයකින් පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීමට පීඩන පරීක්ෂාව මගින් සාර්ව ආර්ථික අස්ථාවරත්වයන් සැලකිල්ලට ගනිමින් සමස්ත බලපෑම් මැන බලයි.

එක් වසරක සීමාව තුළ අවදානමේ ඉපැයීම් (1%ක ශුද්ධ බලපෑම)

	මාස 1 දක්වා	මාස 1-3	මාස 3-6	මාස 6-12
ශුද්ධ වත්තකම් (රු.මි.)	40,250	14,163	(86,061)	(1,137,644)
1% ක වෙනසක් සඳහා අලාභය (රු.මි.)	386	118	(538)	(2,844)

වත්කම් හා වගකීම් කල්පිරීමේ නොගැලපීම් 2024

2024	මාසයක් දක්වා රු.මි.	මාස 1-3 රු.මි.	මාස 3-6 රු.මි.	මාස 6-12 රු.මි.	වසර 1-3 රු.මි.	වසර 3-5 රු.මි.	වසර 5ට වැඩි රු.මි.
අනුපාත සංවේදී වත්කම්	318,440	389,748	350,208	220,159	703,643	261,982	797,201
අනුපාත සංවේදී වගකීම්	278,190	375,584	436,269	1,357,803	267,501	192,382	3,490
කාලසීමා පරතර	40,250	14,163	(86,061)	(1,137,644)	436,142	69,600	793,711
සමුච්චිත පරතරය	40,250	54,413	(31,648)	(1,169,292)	(733,150)	(663,550)	130,161

2023	මාසයක් දක්වා රු.මි.	මාස 1-3 රු.මි.	මාස 3-6 රු.මි.	මාස 6-12 රු.මි.	වසර 1-3 රු.මි.	වසර 3-5 රු.මි.	වසර 5ට වැඩි රු.මි.
අනුපාත සංවේදී වත්කම්	282,058	612,881	230,331	702,889	266,472	221,262	455,512
අනුපාත සංවේදී වගකීම්	227,313	345,616	563,234	1,112,512	122,960	294,188	3,234
කාලසීමා පරතර	54,745	267,265	(332,902)	(409,623)	143,512	(72,926)	452,278
සමුච්ඡිත පරතරය	54,745	322,310	(10,893)	(420,515)	(277,004)	(349,930)	102,349

IRR පීඩනය පරීක්ෂා කිරීම

	කම්පනයේ විශාලත්වය 0.25%	කම්පනයේ විශාලත්වය 0.5%	කම්පනයේ විශාලත්වය 1.00%
2024			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	1,437	2,874	5,748
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (%)	16.41	16.28	16.02
2023			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	2,321	4,643	4,265
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (%)	17.41	16.42	16.46

විදේශ විනිමය අවදානම (FX risk)

විනිමය අනුපාතවල අහිතකර උච්චාවචනයන් හේතුකොටගෙන බැංකුවේ ඉපැයීම් සහ/හෝ ප්‍රාග්ධනයට සිදුවන බලපෑමක ප්‍රතිඵලයක් වශයෙන් විදේශ විනමය අවදානම ඇති වේ. විදේශ විනිමය අවදානම සඳහා බැංකුවේ නිරාවරණය, ආනයන/අපනයන ගනුදෙනු, ප්‍රේෂණ, සහ දේපල වෙළෙඳාම වැනි විදේශ විනිමයෙන් නම්කළ ගනුදෙනුවලින් ඇති වේ. 2024 දී හුවමාරු අනුපාතවල වෙනස්වීම සම්පූර්ණ වසර සඳහා 9.69%ක් වූ නමුත් මෙම කාලසීමාව තුළ අඩු වූ විදේශ විනිමය අස්ථාවරත්වය පිළිබිඹු කරමින් දෙවන අර්ධයේ 3.03%ට අඩු වූ අතර, 2024 වසර පුරාම අඩු ස්ථාවර විදේශ විනිමය අවදානම මට්ටම් හේතුවෙන්, බැංකුව කෙරෙහි බලපෑම අවම මට්ටමක පැවතුණි.

විදේශ විනිමය අවදානම් සමාලෝචනය

විදේශ විනිමය ප්‍රේෂණ වෙළෙඳපොල කොටස වර්ධනය කර ගැනීමට බැංකුව සමත් වූ අතර, විදේශ විනිමය බැඳීම් සහ ගනුදෙනුකාර අවශ්‍යතා විචක්ෂණව කළමනාකරණය කරන ලදී.

බැංකුවේ භාණ්ඩාගාර ඒකකය විසින් විදේශ විනිමය සීමාවන් දැඩිව පිළිපැදීම, විදේශ විනිමය ශුද්ධ විවෘත තත්ත්වය මෙන්ම අවසර ලත් පරාමිති තුළ විනිමය තත්ත්වයන් පවත්වාගෙන ගිය අතර, විදේශ විනිමය අවදානම විචක්ෂණව කළමනාකරණය කිරීමට බැංකුව ශක්තිමත් කර ඇත. නිශ්චිත අවදානම් ඉවසීමේ සීමා දෙනිකව ස්වාධීනව නියාමනය කරන ලදී. මෙවැනි සීමාවන් තුළ භාණ්ඩාගාර අලෙවිකරුවන්ට ක්‍රියාත්මකවීමට ඉඩදුන් අතර, මෙවැනි නිරාවරණ තුළින් ඇතිවන අවදානම අවම කරන ලදී. ඉන් විදේශ විනිමය අනුපාතවල වෙනස්වීමෙන් ඇති වියහැකි අලාභ අවම කර, බැංකුවේ අවදානම් රුචිය තුළ පවත්වා ගනී.

තවද, භාණ්ඩාගාර මැදි කාර්යාලය ඉදිරියට යන පදනමක් ලෙස විදේශ විනිමය නියාමනය කරන ලදී.

2024 දෙසැම්බර් 31 දිනට තත්ත්වය

	විදේශ විනිමයට සමාන ශුද්ධ නිරාවරණය ('000)	රුපියලට සමාන ශුද්ධ නිරාවරණය ('000)
එක්සත් ජනපද ඩොලර්	-3,790	-1,111,370
යුරෝ	35	10,816
මහ බ්‍රිතාන්‍ය පවුම්	18	6,623
ජපන් යෙන්	27,448	51,348
සිංගප්පූරු ඩොලර්	89	19,111
චීන යුආන් (රෙන්මින්බි)	2,039	81,922
ඕස්ට්‍රේලියානු ඩොලර්	255	46,426
වෙනත්	-	616,811

විනිමය අනුපාත අවදානම් ආතතිය පරීක්ෂණය

	කම්පනයේ විශාලත්වය 5%	කම්පනයේ විශාලත්වය 10%	කම්පනයේ විශාලත්වය 15%
2024			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	166	332	498
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (%)	16.52	16.51	16.49
2023			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	183	367	550
සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (%)	17.35	17.33	17.31

මාස අවසාන විදේශ විනිමය ශුද්ධ තත්ත්වය (NOP) සහ දෛනික අවදානම් වටිනාකම 2024



ස්කන්ධ අවදානම

බැංකුවේ ස්කන්ධ අවදානම ඇතිකරන පරිපාලිත සමාගම්වල උපායමාර්ගික ආයෝජන හැර, ලාභ සහ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකම යටතේ වර්ගීකරණය කර ඇති කළඹ මෙයට අයත් වන අතර, බැංකුවේ ආයෝජනය අඩු මට්ටමක පවතින බැවින්, මෙය සීමාවේ.

ස්කන්ධ අවදානම සමාලෝචනය

අඛණ්ඩ වෙළඳපල නියාමනය කොටස් වෙළෙඳපොල නිවැරැදිව කියවීමට සහ උපායමාර්ගික ස්කන්ධ ආයෝජන තීරණ ගැනීමට උපකාරී වී ඇත. මෙය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇති සීමාවන් දැඩිව පිළිපැදීම සමඟ, ස්කන්ධ අවදානම කාර්යක්ෂමව අවම කිරීමට සහ කළමනාකරණය කරගැනීමට බැංකුවට සහය වී ඇත.

ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC) නිරන්තරයෙන් සාර්ව ආර්ථික තත්ත්වයන්, කොටස් වෙළෙඳපොළ මිලගණන්, ස්කන්ධ අවදානමට බලපාන ආයතනවල කාර්යසාධනය නියාමනය කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ආයෝජන බැංකු ප්‍රතිපත්ති අත්පොතේ විස්තර මඟින් පරිමාව සහ නැවතුම් අලාභ සීමාවන් ඇතුළුව ස්කන්ධ අවදානම කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියා පටිපාටි, මෙවලම් සහ ශිල්පීය ක්‍රම විස්තර කරයි. යෝජිත ස්කන්ධ ගනුදෙනු, හානිකරණ තක්සේරු කිරීම් සහ සීමාවන්ට අනුව නිරාවරණයන් පිළිබඳ ස්වාධීන ඇගයීම් බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වෙළෙඳපොල අවදානම් කාර්යය මඟින් සිදු කරනු ලැබේ. වෙළඳාම් නොවන ස්කන්ධ අවදානම් රාමුව පිළිබඳ ස්වාධීන අධීක්ෂණයක් ද මෙම ඒකකය විසින් පවත්වාගෙන යනු ලබයි.

ස්කන්ධ අවදානම සම්බන්ධ පීඩන පරීක්ෂණය

	කම්පනයේ විශාලත්වය 5%	කම්පනයේ විශාලත්වය 10%	කම්පනයේ විශාලත්වය 15%
2024			
ස්කන්ධ කළඹෙහි උපරිම වෙළෙඳපොළ වටිනාකමට සිදුකරන බලපෑම (රු.මි.)	82	163	326
උපායමාර්ගික කොටස්වල සාධාරණ වටිනාකමට වන බලපෑම (රු.මි.)	19	40	79
මුළු එකතුව (රු.මි.)	101	203	406

වෙළෙඳ භාණ්ඩ අවදානම

බැංකුව වෙළෙඳ භාණ්ඩ වෙළඳාමේ නියැලී නොසිටින බැවින්, බැංකුවට සෘජු වෙළෙඳ භාණ්ඩ අවදානමක් නොමැති නමුත්, බැංකුවේ උකස් ව්‍යාපාරය යම් තරමකට වතුර බලපෑමට ලක් කරයි. එබැවින්. රන් වෙළෙඳපොල තුළ මිල උච්ඡාවචන බැංකුවේ උකස් මෙහෙයුම් කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති කරයි. රන් මිලෙහි වෙළෙඳපොල මිල 2024 දී 14.7කින් වැඩි විය, 2024 ඔක්තෝබර්වල රන් අවුන්සයක මිල 817,229ට ලඟාවිය. අපගේ ගනුදෙනුකරු කළඹින් විශාල කොටසක් රත්‍රන් අවසාන උපාය වත්කම් ලෙස දකින අතර, මේ සම්බන්ධයෙන් වෙළෙඳ භාණ්ඩ අවදානමට බැංකුවේ නිරාවරණය ඉතා ඉහළය.

මෙම අවදානම අවම කිරීමට, බැංකුව විචක්ෂණ ණය වටිනාකම පවත්වා ගනිමින් ඉදිරිපත් කර ඇති රන් අයිතම කෙරෙහි අවධානය සමඟ තරඟයට සාපේක්ෂව අඩු උකස් අත්තිකාරමක් පවත්වා ගනී. වැඩිකළ ගනුදෙනුකාර නිසි පරීක්ෂාව අපි ක්‍රියාත්මක කරන සාධක වන අතර, සොරාගත් හෝ ව්‍යාජ අයිතම සඳහා විස්තීර්ණ රක්ෂණ ආවරණයක් පවත්වා ගනිමු. පශ්චාත් බෙදාහැරීම තුළ, අපි භාණ්ඩ ස්වාධීනව තක්සේරු කිරීම, නියැදියක් දිනපතා සත්‍යාපනය කිරීම සහ අවසාන අයකර නොගැනීම්වලදී, මුදවා නොගත් භාණ්ඩ වෙන්දේසි කිරීමේ ක්‍රියාවලිය දිගටම කරගෙන ගියෙමු.

වත්කම් හා වගකීම් කමිටුව රන්වල වෙළෙඳපොල මිලගණන් කලින් කල විශ්ලේෂවලදී සහ තරඟකාරී නිෂ්පාදන පිරිනැමීම් අනුව මැනීමේදී සැලකියයුතු කාර්යභාරයක් ඉටු කරයි. සත්‍යතාව හඳුනා ගැනීම පිළිබඳ විශේෂඥයින් වන අපගේ කාර්ය මණ්ඩලයට ලබා දෙන විශේෂඥ පුහුණුව සහ නව්‍ය තාක්ෂණය සමඟ එක්ව, රත්‍රන් නිවැරැදිව තක්සේරු කිරීම සඳහා බැංකුවේ අති නවීන උපකරණ, මඟින් 2024 දී රත්‍රන් සහ උකස් කටයුතු සම්බන්ධයෙන් වෙළෙඳ භාණ්ඩ අවදානම සාර්ථකව කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට බැංකුවට හැකියාව ලැබේ.



ද්‍රවශීලතා අවදානම

බැංකුවට සිය මූල්‍ය බැඳීම් අවශ්‍ය විට සහ මතුවන විට සපුරාලීමට නොහැකිවීම ද්‍රවශීලතා අවදානම යනුවෙන් හඳුන්වයි. මෙය ඉපයීම්වල හෝ ප්‍රාග්ධනයේ විභව අලාභ අවස්ථාවල ඇති වේ. පසුගිය වසරේ සෘණාත්මක ද්‍රවශීලතා මට්ටම් ආපසු හරවන ලදී. 2024 දී අපි ද්‍රවශීලතා අතිරික්තයකට මුහුණ දුන් අතර කෙටි කාලයේ සිට මධ්‍ය කාලීන ආයෝජන උපකරණවල ආයෝජනය කරමින් කළමනාකරණය කර ගත් බව වාර්තා කිරීමට ලැබීම අපට සතුටකි. අපගේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 16.5%ක් වන අතර, සියලුම මුදල් සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය 279.52%ක් සහ රුපියල් සඳහා 353.86%ක් විය.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

ALCO විසින් ද්‍රවශීලතා පැතිකඩ ස්ථිරව නියාමනය කරමින් අභ්‍යන්තර ද්‍රවශීලතා ඉලක්ක සහ නියාමන ද්‍රවශීලතා අවශ්‍යතාවන්ට අනුකූලතාව සහතික කරයි. ද්‍රවශීලතා හිඟයන් පියවා ගැනීමේ මාර්ග සහ විකල්ප අරමුදල් වැඩපිළිවෙල ගවේෂණය කිරීම, අදාළ අවදානම් රුචිය සීමාවන් නිර්දේශ කිරීම සහ පීඩන පරීක්ෂණ ඇගයීම සහ අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ පසුව ක්‍රියාත්මක කිරීම සඳහා ද වැය වගකිව යුතුය. තවද, මෙය භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය සහ ශාඛාවලින් ස්වාධීනව අඛණ්ඩව නියාමනය කරන අතර, අවශ්‍යනම්, අවදානම් කළමනාකරණ රාමුව ආමන්ත්‍රණය කරමින් වහාම වාර්තා කෙරේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – භාණ්ඩාගාර, ආයෝජන බැංකුකරණ හා මූල්‍ය ආයතන නියමිත අවදානම් සීමාව තුළ බැංකුවේ අරමුදල් සහ ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබඳ දෛනික කළමනාකරණය සඳහා මූලිකවම වගකිව යුතුය. මූලික ද්‍රවශීලතා දර්ශකවල කාර්යසාධනය නිශ්චිත පරාමිතිවල තිබෙන බව සහතික කිරීමට ඒවා නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය, BIRMC, සහ ALCO විසින් සමාලෝචනය කරනු ලැබේ.

කළමනාකරණ රාමුව

ශක්තිමත් ප්‍රතිපත්තිමය හා ක්‍රියාපටිපාටිමය රාමුවක් තුළ අපි ද්‍රවශීලතා අවධානම කළමනාකරණය කරමු.

1. ද්‍රවශීලතාව මැනීම: ද්‍රවශීලතාවය මැනීම සඳහා බැංකුව ද්විත්ව ප්‍රවාහ ප්‍රවේශය සහ කොටස් ප්‍රවේශය අනුගමනය කරයි. විවිධ කාල බැඳුම්කරවල ගලායාම් සහ ගලාඒම්වල නොගැලපීම් වත්කම් හා වගකීම්වල කල්පිරීම මත පදනම වී ප්‍රවාහ ක්‍රමය භාවිතයෙන් විශ්ලේෂණය කෙරේ. කොටස් ප්‍රවේශය තැන්පතුවලට ණය අනුපාතය, බැඳීම් අනුපාතය (භාවිතයට නොගත් අයිරා කොටස/භාවිතයට නොගත් අන්තර් බැංකු මාර්ග), ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය සහ සමුච්චිත නොගැලපීම් වැනි ප්‍රධාන අනුපාත භාවිතා කරමින් ද්‍රවශීලතාවය මනිනු ලැබේ.
2. විවිධාංගීකරණය වූ අරමුදල් පදනම: වෙළෙඳපොල තත්ත්වයන් නියාමන ප්‍රතිෂ්ඨාවන්, සහ පොලී අනුපාත වෙනස්වීමේ ප්‍රවනතා මත පදනම් බහුවිධ මූලාශ්‍රවලින් බැංකුව ද්‍රවශීලතාව ලබාගනී. තැන්පතු යනු බැංකුවේ මුළු වත්කම් සහ වගකීම්වලින් 87% ක් වන විශාලතම අරමුදල් ප්‍රභවය වන අතර, අනෙකුත් ණය ගැනීම් 7% සහ කොටස් හිමියන්ගේ අරමුදල් 6% කි. අර්ධ ස්ථායී අරමුදල් ප්‍රභවයක් ලෙස සැලකෙන ඉතුරුම්වලින් සැලකිය යුතු ප්‍රතිශතයක් බැංකුව සතුව ඇත.

3. අවිනිශ්චිත අරමුදල් සැලැස්ම: පිඩන තත්වයන් තුළ ද්‍රවශීලතා අවශ්‍යතා කළමනාකරණය කිරීම පිළිබඳ මඟපෙන්වීම් ලබාදීමට බැංකුවට විස්තීර්ණ අවිනිශ්චිත අරමුදල් සැලැස්ම (CFP) ඇත. මෙය ද්‍රවශීල අර්බුද අවස්ථාවල පවා පාර්ශ්වකාර අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ වෙළෙඳපොල විශ්වාසය පවත්වා ගැනීම සහතික කිරීම සඳහා වේ. CFP විසින් ක්‍රියාකරණය සඳහා ක්‍රියාත්මක අවස්ථාව දක්වා ඇති අතර, පහත ක්‍රියාදාමවලදී සක්‍රිය කරනු ලැබේ:
   - ද්‍රවශීල වත්කම් අනුපාතය මාසය පුරා 20%ට වඩා පහත වැටීම.
   - අඛණ්ඩව දින හතක් සඳහා අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතවල 20%කින් අඩුවීම.
   - අක්‍රීය ණය අනුපාතය 50%ට වඩා වැඩිවීම.
   - ඒකාබද්ධ අත්තිකාරම්/තැන්පතු අනුපාතය දින 15කට වඩා 105% ඉක්මවීම.
   - වෙළෙඳපොල සහභාගිවන්නන් විසින් ඇමතුම් පහසුකම් ආපසු ගැනීම හෝ බැංකුවේ ණය සඳහා වෙළෙඳපොල අනුපාතය මත අධික වාරිකයක් පැනවීම.
   - ණය ශ්‍රේණිගතකරණය අවස්ථා දෙකකට වඩා පහත වැටීම.
   - අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවමින් තැන්පතු ආපසු ගැනීම.

2024 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රධාන ද්‍රවශීලතා දර්ශක	
ප්‍රධාන දර්ශක	2024 දෙසැම්බර් 31 වැනි දිනට (%) තත්වය (%)
තැන්පතු අනුපාතයට ණය	
රුපියල්	53.19
විදේශ මුදල්	101.50
බැඳීම් අනුපාතය	
ව්‍යවස්ථාපිත ආවරණ අනුපාතය	
රුපියල්	353.86
විදේශ මුදල්	279.52

	සියලුම මුදල් (රු. '000)				දේශීය මුදල් (රු. '000)			
	31 දෙසැම්බර් 2024 දිනට ශේෂය	සුළු	මධ්‍යම	ප්‍රධාන	31 දෙසැම්බර් 2024 දිනට ශේෂය	සුළු	මධ්‍යම	ප්‍රධාන
කම්පනයේ විශාලත්වය (%)		5%	10%	15%				
HQLA	1,417,850,575				1,415,804,753			
මුළු මුදල් ගලායාම	667,806,233				493,075,035			
මුළු මුදල් ගලාඒම	160,564,255				92,973,037			
ශුද්ධ මුදල් ගලායාම	507,241,978				400,101,997			
LCR %	279.52				353.86			
ක්‍රියාදාමය I – HQLA හි වැටීම								
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය (%)		265.55	251.57	237.59		336.17	318.47	300.78
ක්‍රියාදාමය II – ශුද්ධ මුදල් ගලායාමේ වැඩිවීම								
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාත (%)		266.21	254.11	243.06		337.01	321.69	307.71
ක්‍රියාදාමය III – HQLAහි වැටීම සහ ශුද්ධ මුදල් ගලායාමේ වැඩිවීම (උපරිම ක්‍රියාදාමය)								
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාත (%)		252.90	228.70	206.60		320.16	289.52	261.55

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු සේවකයින්, ක්‍රියාවලීන්, පද්ධතිවලට අදාළ කර ඇති ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලීන්, හෝ බැංකුවේ පාලනය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කිරීමට බැංකුවේ හැකියාවට බලපාන අහිතකර කාලගුණික තත්ත්වයන් වැනි බාහිර තත්ත්වයන්ය, බාසල් නිර්වචනයට නීතිමය අවදානම ඇතුළත් වන අතර, එය බැංකුවේ කීර්තිනාමය කෙරෙහි වක්‍ර බලපෑමක් ඇති අතර, පිරිවැය වැඩිකරන නමුත් උපායමාර්ගික සහ කීර්තිනාම අවදානම බැහැර කරයි. මනාව කළමනාකරණය නොකරන්නේනම්, මෙහෙයුම් අවදානම සෘජු හා වක්‍ර හානිවලට හේතු වේ. බැංකුවට විස්තීර්ණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් සහ ක්‍රියාපටිපාටිමය රාමුවක් ඇති අතර, එය වැදගත් මෙහෙයුම් අවදානම් කලින් හඳුනා ගැනීම, මැනීම, කළමනාකරණය, නියාමනය, සහ වාර්තාකරණයට සහය වේ. යම් ව්‍යාපාර මෙහෙයුමක ආවේනික අවදානමක් ඇති විට, එය අවම කිරීම මුල් හඳුනාගැනීම, ක්‍රියාත්මක සිදුවීම් වැඩි කිරීම සහ කළමනාකරණය මත රැඳී පවතී.

අපි අපගේ තිරසාරභාවය කෙරෙහි සෘජු බලපෑමක් ඇති සාධක කිහිපයක් සහතික කිරීමට මෙහෙයුම් අවදානම් කළමනාකරණය කරමු.

- මෙහෙයුම් අසාර්ථක වීමෙන් සිදුවන අලාභ අවම කර ගැනීමෙන් විශාල අවදානම් අලාභ හැකි පමණින් වලක්වා ගැනිම.
- බහුවිධ කාර්යයන් සහ ව්‍යාපාරික ඒකක හරහා මෙහෙයුම් අවදානම පිළිබඳ පොදු අවබෝධයක් වර්ධනය කර ගනිමින් බැංකුව හරහා අවදානම් පිරිවැය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- අභ්‍යන්තර හැකියාවන් ගොඩනැගීම සහ වැඩිදියුණු කිරීම මගින් තීරණාත්මක සහ ව්‍යසනකාරී අවදානම් වලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම.
- අභ්‍යන්තර සම්පත් වඩා හොඳින් කළමනාකරණය කිරීම සහ බැංකුවේ මෙහෙයුම් ඵලදායී ලෙස පාලනය කිරීම තුළින් පිරිවැය ඉතිරිකිරීම් අවබෝධ කර ගැනීම.
- බැංකුවේ කීර්තිනාමය සහ සන්නාම ප්‍රතිරූපය ආරක්ෂා කිරීම.
- බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම්වල සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සහ පහළම ඉලක්ක සපුරා ගැනීමට සහාය වීම.

මෙහෙයුම් අවදානම් පාලනය

මෙහෙයුම් අවදානම් පාලන ව්‍යුහය



පාලනය හා වාර්තාකරණය

බැංකුව BASEL රෙගුලාසි අනුගමනය කරන අතර, එහිදී මෙහෙයුම් අවදානම් පුළුල් ක්ෂේත්‍ර හතක් යටතේ වර්ගීකරණය කෙරේ.

- මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව මෙහෙයුම් අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති, ව්‍යුහ, සහ ක්‍රියාවලිවලින් සමන්විතය.
- මෙහෙයුම් අවදානම් අංශ සමීපව අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම මගින් BIRMC විසින් මණ්ඩලයට සහය වේ.
- ආරම්භක අවස්ථාවේදී මෙහෙයුම් අවදානම් හඳුනාගැනීමට සහ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට වාර්තා කිරීමට ශාඛා සහ ව්‍යාපාර ඒකක පළමු ආරක්ෂක මාර්ගය සකස් කරයි. සියලුම කාර්ය මණ්ඩලය පුහුණු කරන අතර, මෙහෙයුම් අවදානම් නිරාවරණ හඳුනාගෙන තක්සේරු කිරීම පිළිබඳව සියලුම කාර්යමණ්ඩලය පුහුණු කර දැනුවත් කර ඇත.
- සියලුම ව්‍යාපාර ඒකක නිශ්චිත මෙහෙයුම් අවදානම් පාරමිතිවලට අනුව නිරාවරණ ඇගයීමට අවදානම් සහ පාලන ස්වයං-තක්සේරු (RCSA) පවත්වනු ලබයි.
- අභ්‍යන්තර විගණනය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහතිකය ලබාදීම සඳහා ජාලය හරහා සමස්ත මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ නිරන්තර සමාලෝචන පවත්වයි.
- මෙහෙයුම් අවදානම් නව නිෂ්පාදන, ක්‍රියාවලි, සහ ඉදිරියට කරන පදනමක් මත කටයුතු පිළිබඳ තක්සේරු කෙරේ.
- සැලකියයුතු අලාභ සිදුවීම්වල තොරතුරු, මතුවන ගැටළු, අවදානම් අධීක්ෂණය, නියාමනය සහ අවදානම් සමාලෝචනය අවදානම් කමිටු වාර්තාව තුළ කාර්තුමය වාර්තා තුන් වාර්තා කරන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ/හෝ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුවට (ORMC) ඉදිරිපත් කෙරේ. අවදානමේ විභව බලපෑම සහ වාර ගණන මත පදනම් වී, පාලන දෝෂ ORMC වෙත වාර්තා කෙරේ.
- මෙහෙයුම් අවදානම් නියාමනය පිළිබඳ ප්‍රාදේශීය මට්ටමේ අවදානම් නිලධාරීන්, විගණන නිලධාරීන් සහ අනුකූලතා නිලධාරීන් යන තනතුරුවල අදහස් අදාළ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ට වාර්තා කෙරේ.

2024 වසර සඳහා වාර්තා වූ මුළු මෙහෙයුම් අලාභ රු. මිලියන 29.915ක් විය. අලාභවල වඩාත් වැදගත් මූලාශ්‍රය වූයේ (වටිනාකම අනුව) බාහිර වංචා වේ.

සංඛ්‍යා අනුව සහ වටිනාකම අනුව බාසල් රාමුවේ අලාභ සිදුවීම් වර්ගය යටතේ පසුගිය වසර දෙක තුළ මෙහෙයුම් අලාභවල සන්සන්දනයක් පහත වගුව සහ සටහනින් පෙන්නුම් කරයි.

අලාභ සිදුවීම	2024				2023			
	ගණන	මුළු ගණනින් ප්‍රතිශතය (%)	වටිනාකම රු.මි.	මුළු වටිනාකමින් ප්‍රතිශතය (%)	ගණන	මුළු ගණනින් ප්‍රතිශතය (%)	වටිනාකම රු.මි.	මුළු වටිනාකමින් ප්‍රතිශතය (%)
අභ්‍යන්තර වංචා	1	0.41	0.02	0.07	2	0.51	8.72	9.99
බාහිර වංචා	139	56.97	20.64	68.98	258	66.15	52.45	60.12
රැකියා නියුක්ති පරිචය සහ සේවා ස්ථාන ආරක්ෂාව	-	-	-	-	-	-	-	-
සේවාදායක, නිෂ්පාදන සහ ව්‍යාපාර පරිචය	-	-	-	-	-	-	-	-
සේවාදායක, නිෂ්පාදන සහ ව්‍යාපාර පරිචය	2	0.82	0.13	0.43	1	0.26	0.15	0.17
ව්‍යාපාර බිඳ වැටීම් හා පද්ධති දෝෂ	1	0.41	0.14	0.47	5	1.28	3.72	4.26
ක්‍රියාත්මක කිරීම, ලබාදීම සහ ක්‍රියාවලි කළමනාකරණය	101	41.39	8.99	30.05	124	31.8	22.21	25.46
එකතුව	244	100.00	29.92	100.00	390	100.00	87.25	100.00







මෙහෙයුම් අවදානම හඳුනා ගැනීම සහ ඇගයීම

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ව්‍යාපාර ඒකක සමඟ මෙහෙයුම් අවදානම්වල සිදුවිය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමට කටයුතු කරයි. සියලුම කාර්ය මණ්ඩලය මෙහෙයුම් අවදානම් නිරාවරණ පිළිබඳ පුහුණු කරන අතර, මෙම අවදානම් හඳුනා ගැනීම සහ ඇගයීම සඳහා සක්‍රීයව නිරත කරයි. නිශ්චිත මෙහෙයුම් අවදානම් පරාමිතිවලට අනුව නිරාවරණ ඇගයීම සඳහා සියලුම ව්‍යාපාර ඒකක විසින් අවදානම් හා පාලන ස්වයං ඇගයීම් (RCSA) පවත්වනු ලබයි. ව්‍යාපාර ඒකක විසින් වාර්තා කරන අලාභ සිදුවීම් සහ ආසන්න අලාභවලට අමතරව, RCSA හි ප්‍රධාන සොයාගැනීම් අවදානම් කළමනාකරණය තුළ වියහැකි පරතර හඳුනාගෙන ඒ සඳහා කාර්යය සැලසුම්වලට මාර්ගයක් සොයා ගනී. ඉදිරියට යන පදනමක් මත නව නිෂ්පාදන, ක්‍රියාවලි සහ කටයුතු මත මෙහෙයුම් අවදානම් ඇගයීම් සිදු කෙරේ.

සහන මට්ටම්

බැංකුවේ අවදානම් රුචි ප්‍රකාශනය තුළ මෙහෙයුම් අවදානම් දර්ශක සඳහා නිශ්චිත විශේෂ සීමා සහ සහන මට්ටම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කර ඇත. මෙයට මෙහෙයුම් වියදම්වල ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් අලාභවල මුළු වටිනාකම, අභ්‍යන්තර සහ බාහිර අලාභ සිදුවීම් සංඛ්‍යාව සහ සාමාන්‍යයට වඩා අඩුවෙන් ශ්‍රේණිගත කළ ශාඛා විගණනයේ ප්‍රතිශතය ඇතුළත්ය. අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විධිමත් වාර්තාකරණය අවශ්‍ය අවස්ථාවේදී නිවැරදි ක්‍රියාමාර්ග සහතික කිරීමට සහය වේ.

අවම කිරීමේ උපායමාර්ග

- සියලුම මෙහෙයුම් කාර්යයන්ට අදාළව ආරක්ෂක මාර්ග ත්‍රිත්වයේ පැවැත්මට සම්පූර්ණයෙන් අනුකූල වී සහතික කිරීම සහ රාජකාරි බෙදාදීම සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තීර්ණ රාමුවක් ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීමට අර්බුද කළමනාකරණ ක්‍රියාපටිපාටි සහ ආපදා පිළියම් සැලසුම්.
- ප්‍රතිසාධන සැලසුම් (RCP) සම්පූර්ණයෙන් අනුකූලවීම සහ දෙපාර්තමේන්තු මට්ටමේ RCP ක්‍රියාත්මක කිරීමේ නියමනය ක්‍රියාත්මක කිරීම.
- මෙහෙයුම් අලාභ රක්ෂණය තුළින් තෙවැනි පාර්ශ්වයකට මාරු කිරීම.
- බාහිර හවුල්කරුවන් තෝරාගැනීම සහ නියාමනය සඳහා දැඩි නිර්ණායක යොදා ගැනීම.
- සේවක මණ්ඩලයට අඛණ්ඩව පුහුණුව ලබාදීම මගින් අවදානම දැනුවත් සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- නව නිෂ්පාදන සහ සේවා දියත් කිරීමට පෙර, මෙහෙයුම් අවදානමේ වියහැකි බලපෑම් පිළිබඳ විශ්ලේෂණයක් පැවැත්වීම.

තාක්ෂණික අවදානම් කළමනාකරණ

ඩිජිටල්කරණ පරිනාමනයේ ප්‍රමුඛයා ලෙස, බැංකුව සංකීර්ණ හා වෙනස් වන තාක්ෂණික පදනම් අවදානම් රාශියකට මුහුණ දේ. ඩිජිටල් මෙහෙයුම් වැඩිවීමත් සමඟ, දත්ත කඩකිරීම්, බලෙන් ඇතුළුවීමේ උත්සාහයන්, තතුබෑම් සහ අනිෂ්ට මෘදුකාංග ප්‍රහාර වැනි විවිධ සයිබර් තර්ජනවල අවදානම්වලට බැංකුව නිරාවරණය වේ. සංවේදී දත්ත සහ ශක්තිමත් ආරක්ෂක ක්‍රියාමාර්ග ආරක්ෂා කිරීම මෙවැනි අවදානම් අවම කිරීමට උපකාරී වේ. ඊට අමතරව. සැලසුම් නොකළ පද්ධති බිඳවැටීම හෝ කඩා වැටීම ව්‍යාපාර මෙහෙයුම් බිඳදැමිය හැකි අතර, ගනුදෙනුකාර අත්දැකීමට බලපෑම් කළ හැකි අතර, සැලකිය යුතු මූල්‍ය අලාභයන්ට තුඩු දිය හැක.

පද්ධති ඔරොත්තුදෙන බව සහ බිඳවැටීම්වලින් ඉක්මණින්ම ප්‍රතිසාධනය වියහැකි බවට සහතික කිරීම ප්‍රධාන ගැටළුවකි. තාක්ෂණය වේගයෙන් වෙනස්වන බැවින්, වර්තමාන පද්ධති, මෘදුකාංග සහ දෘඩාංග යල්පැනගිය බවට සහ සහය නොකරන බවට අවදානමක් ඇති අතර එය මෙහෙයුම් කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ නවතම තාක්ෂණයන්ට ගැලපීම පවත්වා ගැනීම අභියෝග මතු කරනු ඇත. ඩිජිටල් යුගයේදී පවා, තීරණාත්මක මෘදුකාංග, දත්ත ගබඩාවලට හෝ සේවාදායක කාමර වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම දත්ත අඛණ්ඩතාවට හා පෞද්ගලිකත්වයට අවදානමක් ඇති බැවින් භෞතික ආරක්ෂාව පිළිබඳව ගැටලුවක්ව පවතී. තවද, ව්‍යාපාර වර්ධනය වන බැවින්, දත්තවල පරිමාව සහ තොරතුරු තාක්ෂණය සඳහා ඉල්ලුමද එසේම වැඩි වේ. ප්‍රමාණවත් නොවන සේවාදායක හැකියාව, හෝ ජාලයේ පළල වැනි ප්‍රමාණවත් නොවන යටිතලපහසුකම් පරිමාවට බාධා විය හැකි අතර කාර්යසාධනයට බලපෑම් ඇති කළ හැකිය.

තාක්ෂණික අවදානම අවම කිරීම

බැංකුව මෙවැනි තාක්ෂණික අවදානම් විසඳීම සඳහා ප්‍රධාන උපායමාර්ග සහ ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරයි.

- **ආරක්ෂිත දත්ත මධ්‍යස්ථානය**

  සියලුම මෙහෙවර තීරණාත්මක යෙදුම් සහ ආපදා ප්‍රතිසාධන ක්‍රම ඉහළින් ආරක්ෂිත, ISO – සහතිකලත් දත්ත මධ්‍යස්ථානයක ගබඩා කෙරේ. මෙවැනි දත්ත මධ්‍යස්ථාන උසස් ආරක්ෂක ක්‍රියාමාර්ගවලින් සන්නද්ධ කරනු ලබයි. මේවාට භෞතික පිවිසීම පාලනය, නිරීක්ෂණ පද්ධති සහ ජෛවමිතික සහතික කිරීම ඇතුළත් වන අතර, එයට අවසරලත් පුද්ගලයින්ට පමණක් තීරණාත්මක යටිතලපහසුකම්වලට පිවිසිය හැකිය.

- **ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා ප්‍රතිසාධන පරීක්ෂණය**

  ව්‍යාපාර අඛණ්ඩතාවයේ සහ ආපදා ප්‍රතිසාධන සැලසුම්වල ඵලදායීතාවය ඇගයීම සඳහා සියලුම තීරණාත්මක පද්ධති සඳහා නිතිපතා, දැඩි පරීක්ෂණ පවත්වනු ලැබේ. සැබෑ අර්බුදයකදී ඉක්මනින් යථා තත්ත්වයට පත්වීමට සහ අක්‍රීය කාලය අවම කිරීමට බැංකුව සූදානම් බව සහතික කිරීම සඳහා මෙම පරීක්ෂණ විවිධ ආපදා ක්‍රියාදාම පන ගන්වයි.

- **විස්තීර්ණ තොරතුරු තාක්ෂණ පාලන රාමුව**

  ශක්තිමත් තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහයක් ක්‍රියාවට නංවා ඇති අතර, ඉන් අවදානම් කළමනාකරණය, නියාමන අනුකූලතාවය සහ දත්තවල රහස්‍යතාව කෙරෙහි අවධානය යොමු කරයි. දත්ත කඩවීම්, මෙහෙයුම් බිඳවැටීම් සහ අදාළ ප්‍රමිතිවලට අනුකූල නොවීම් අවම කිරීමට ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, මනා පරිචයන් අනුගමනය කරන බව මෙම පාලන රාමුව මගින් සහතික කරයි.

- **ගිනි නිවාරණය සහ දුම් අනාවරණ පද්ධති**

  ගිනි හානියෙන් තීරණාත්මක දෘඩාංග සහ දත්ත ආරක්ෂා කර ගැනීමට සියලුම දත්ත මධ්‍යස්ථානවල සහ UPS (බාධාරහිත බලශක්ති සැපයීම) කාමරවල උසස් ගිනි නිවාරක පද්ධති සහ දුම් අනාවරක උපායමාර්ගිකව ස්ථාපිත කෙරේ. මෙවැනි පද්ධති ඉක්මන් අනාවරණය සහ ගිනි උවදුරු අවම කිරීමට සඳහා සැලසුම් කර ඇති අතර, සංවේදී උපකරණවල හානිය වලක්වයි.

- **ආපදා ප්‍රතිසාධන ක්‍රියාපටිපාටි**

  හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා පැහැදිලි, ව්‍යුහගත ප්‍රවේශයක් සැපයීම සඳහා විස්තරාත්මක, නිරන්තර, යාවත්කාලීන කරන ලද ආපදා ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාවට නංවා ඇත. වේගවත් ප්‍රතිසාධනය සහතික කිරීම, ව්‍යාපාර බිඳවැටීම අවම කිරීම සහ දරුණු සිදුවීම් හෝ ස්වාභාවික විපත් හමුවේ පවා සේවා අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා මෙම සැලසුම් සැලසුම් කර ඇත.

තාක්ෂණික අවදානම් සමාලෝචනය

බැංකුව ව්‍යුහගත සහ විනිවිද ක්‍රියාවලියක් තුළින් තාක්ෂණික අවදානම් සමාලෝචනය හා කළමනාකරණය සඳහා සක්‍රීය ප්‍රවේශයක් පවත්වා ගනී.

- ISO/IEC 27001:2022 සහතික කිරීම

  බැංකුව සිය තොරතුරු තාක්ෂණ කළමනාකරණ පද්ධතිය (ISMS) සඳහා ජාත්‍යන්තරව පිළිගත් ISO/IEC 27001:2022 සහතිකය සාර්ථකව පවත්වා ගෙන ඇත. මෙම සහතික කිරීම මගින් දත්ත ආරක්ෂාව, රහස්‍යතාව, සහ අවංකකම සියලුම මෙහෙයුම් හරහා ප්‍රමුඛ කරන බව සහතික කරමින් ඉහළම ප්‍රමිතියේ තොරතුරු ආරක්ෂක ප්‍රමිති පිළිපැදීම සඳහා බැංකුවේ බැඳීම තහවුරු කරයි.

- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්ති

  තොරතුරු ආරක්ෂාව බැංකුවේ ඉහළම මට්ටමේ ඉහළ ප්‍රමුඛතාවයකි. අධ්‍යක්ෂ මණ්ඩලය විස්තීර්ණ තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අනුමත කර ඇති අතර, එය තීරණ ගැනීම සඳහා මෙහෙයවන අතර ඉහළ සිට පහළට සියලුම කාර්ය මණ්ඩලය බැංකුවේ දත්ත ආරක්ෂා කිරීමේදී සහ අවදානම් අවම කිරීමේදී සිය වගකීම් අවබෝධ කරගෙන ඇති බව සහතික කරයි.

- අබණ්ඩ අවදානම් තක්සේරු කිරීම්

  තොරතුරු තාක්ෂණයට අදාළ සියලුම ක්‍රියාවලි ඇගයීම සඳහා සාමාන්‍ය සහ තාවකාලික අවදානම් තක්සේරු කිරීම් දෙකම සිදු කෙරේ. මෙවැනි තක්සේරු කිරීම් උවදුරු හැකියාව, ආරක්ෂාව තුළ පරතරය, සහ බැංකුවේ තාක්ෂණික යටිතල පහසුකම්වලට ඇති විභව තර්ජන හඳුනාගැනීමට සහය වේ. සොයා ගැනීම් පරීක්ෂාකාරීව සමාලෝචනය කරන අතර, යම් හඳුනාගත් අවදානම් කඩිනමින් අවම කරන බව සහතික කරමින් තොරතුරු ආරක්ෂක මෙහෙයුම් කමිටුව තුළින් විසඳනු ලැබේ.

තාක්ෂණික අවදානම

පද්ධති ලබාගත හැකිවීම	
පද්ධති වර්ගය	මුළු වැඩකරන කාලය සහ සිමාවන්ගේ ප්‍රතිශතයක් ලෙස ලබාගැනීමේ හැකියාව
ඉතා වැදගත් (මාර්ගගත තත්‍යකාල පද්ධති)	>99.9% කොළ – අඩු අවදානම 97.5%-99.9% කහ – මධ්‍ය අවදානම <97.5 රතු – ඉහළ අවදානම
මධ්‍යස්ථව වැදගත්	>97.5% කොළ – අඩු අවදානම 95%-97.5% කහ – මධ්‍ය අවදානම <95 රතු – ඉහළ අවදානම
අඩු වැදගත්	>90% කොළ – අඩු අවදානම 87%-90% කහ – මධ්‍ය අවදානම <87 රතු – ඉහළ අවදානම

නම	මුළු තීරණාත්මක පද්ධතියේ RCSA හි ප්‍රතිශතයක් ලෙස ලබාගත හැකිවීම
තෙවන පාර්ශ්ව අලෙවිකරුවන් සඳහා RCSA (තීරණාත්මක පද්ධති)	>90% කොළ – අඩු අවදානම 70%-90% කහ – මධ්‍ය අවදානම <70% රතු – ඉහළ අවදානම
නම	**මුළු තීරණාත්මක පද්ධතියේ RCSA හි ප්‍රතිශතයක් ලෙස ලබාගත හැකිවීම**
ජාල නියෝජිත සහ ආරක්ෂණ යෙදුම (Kaspersky අවසන් අන්ත ආරක්ෂාව)	100% කොළ – අඩු අවදානම 99.9% කහ – මධ්‍ය අවදානම <99.9% රතු – ඉහළ අවදානම
නම	**වසරට වාර්තාකළ මුළු සිදුවීම්**
මෙහෙයුම් අලාභ ලෙස වාර්තා කළ තොරතුරු ආරක්ෂක සිදුවීම් ගණන (වසරට)	< 3 සිදුවීම්/වසර 3-7 සිදුවීම්/වසර > 7 සිදුවීම්/වසර

සේවක අවදානම

සේවක අවදානම යනු නුසුදුසු සේවක කටයුතු, ප්‍රමාණවත් නොවන මානව සම්පත්, සහ සේවකයින්ට අදාළ රෙගුලාසිවලට බැංකුව අනුකූල නොවීම හේතු කොට ගෙන ඇතිවන අලාභයන්ය, නුසුදුසු සේවක කටයුතු, ප්‍රමාණවත් නොවන මානව සම්පත, සහ කම්කරු රෙගුලාසි වලට බැංකුව අනුකූල නොවීමෙන් සිදුවිය හැකි අලාභ හේතුවෙන් රට පුරා විසිරී සිටින එහි විශාල ශ්‍රම බලකාය තුළින් බැංකුව සේවක අවදානමට නිරාවරණය වේ.

දක්ෂයින් පිටවීම 2024 වසර තුළ ද සිදුවූ අතර, තරඟකාරිත්වය, දක්ෂතාව සහ ඵලදායිතාව කෙරෙහි බලපෑම අවම කර ගැනීමට බැංකුවට එය අභියෝගයක් විය.

මානව සම්පතට අදාළ අවදානම් කළමනාකරණය කිරීමට, බැංකුවේ සේවක ව්‍යවහාර අතර ඒකාකාරිත්වය සහතික කිරීමට, සහ ඵලදායී බඳවාගැනීමේ ක්‍රියාපටිපාටි යොදා ගැනීමට මානව සම්පත් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි පවතින අතර, ඒවායින් වැඩවල බිඳවැටීම අඩුකිරීම, මූල්‍ය දුෂ්කරතාවන්ගෙන් සේවකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආරක්ෂා කිරීම, කාර්ය මණ්ඩල පිරිවැටුම/දක්ෂයින් පිටවීම අවම කිරීම, සහ යහපත් හා ආරක්ෂිත සේවා පරසරයක් පවත්වා ගැනීම සිදු කරයි.

උපායමාර්ගික අවදානම

උපායමාර්ගික අවදානම යනු අහිතකර ව්‍යාපාර තීරණ, තීරණ අවිධිමත්ව ක්‍රියාත්මක කිරීම, අභියෝගාත්මක ව්‍යාපාර පරිසරය සහ මෙහෙයුම් පරිසරය තුළ වෙනස්වීම්වලට ප්‍රමාණවත් නොවන ප්‍රතිචාරය හේතුවෙන් ඉපයීම් සහ දෘශ්‍යතාවයට විභව අලාභයයි. මණ්ඩලය සහ විධායක කළමනාකාරිත්වය විසින් අනුමත කරන ලද බැංකුවේ උපායමාර්ගික සැලැස්ම හරහා උපායමාර්ගික අවදානම් කළමනාකරණය කෙරේ. උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇත්තේ විවිධ මට්ටම්වල පුළුල් පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය සහ ව්‍යාපාරික ඒකක සමඟ සාකච්ඡා කිරීමෙනි. අවදානමක් ඇති වූ විට, බැංකුවේ ඉපයීම් මත බලපෑම වැළැක්වීමට සහ අවම කිරීමට කළමනාකරණ ක්‍රියාමාර්ග රාශියක් සංවර්ධනය කෙරේ.

ව්‍යාපාර කාර්යසාධනය වත්කම් හා වගකීම් කමිටුව විසින් සතිපතා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව පසු විපරම් කරනු ලැබේ. සෑම ව්‍යාපාර ඒකකයක් සඳහාම අයවැයගත ඉලක්කවලට සාපේක්ෂව සැබෑ කාර්යසාධනය තක්සේරු කරනු ලැබේ. අවශ්‍ය නම්, ව්‍යාපාර පරිසරය තුල සිදුවන ඕනෑම වෙනස්කමකට ගැලපෙන පරිදි උපාය මාර්ග සංශෝධනය කරනු ලැබේ.

උපායමාර්ගික අවදානම ලකුණු කාඩ්පතක් භාවිතා කරමින් තක්සේරු කරන අතර එහිදී බැංකුවේ විශාලත්වය, සංකීර්ණතාව, මෙහෙයුම්වල නවීනත්වය, පාරිසරික විශ්ලේෂණය මෙන්ම ගනුදෙනුකාර විස්තරකරණය ඇතුළු සාධක රාශියක් සැලකිල්ලට ගනු ලැබේ. ලකුණු කාඩ්පත උපායමාර්ගික අවදානම අවම කිරීමට වර්ධනයන් අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහය වේ.

නෛතික අවදානම

බාසල් රෙගුලාසි වලට අනුව, නෛතික අවදානම මෙහෙයුම් අවදානමේ උප කාණ්ඩයක් ලෙස වර්ගීකරණය කර ඇති අතර, එය නියාමන අනුකූලතාව, ගිවිසුම්ගත බැඳීම්, කම්කරු නීති සහ අවදානම අවම කිරීම තුළ කඩකිරීම්වලින් ඇතිවේ. නෛතික අවදානම බැංකුවේ නීති දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරන අතර අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් නියාමන අනුකූලතාව කළමනාකරණය කරයි. ශක්තිමත් අනුකූලතා රාමු ක්‍රියාත්මක කිරීම, වර්න්වර විගණන පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවල බාහිර නීති උපදෙස් ලබා ගැනීම, සහ අධ්‍යක්ෂ මණ්ඩලය බලය පවරා ඇති පරිදි දෙවැනි පාර්ශ්ව සමඟ නීති දෙපාර්තමේන්තුව විසින් සියලුම නීතිමය බැඳීම් ලේඛණ බලතල පවරා, අනුමත කර අත්සන් කර ඇති බව සහතික කිරීම මඟින් අපි මෙම අවදානම් අවම කරමු.

කීර්තිනාම අවදානම

මහජන බැංකුව, රජයට අයත් දේශීයව ක්‍රමානුකූල වැදගත් බැංකුවක් ලෙස, බැංකුව දිවයින පුරා එහි විස්තීර්ණ පැවැත්ම සහ ආර්ථිකය කෙරෙහි එයට ඇති බලපෑමට අනුගත වේ. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ රාජ්‍ය බැංකුවක් ලෙස අපි, අපගේ කීර්තිනාම අවදානම කෙරෙහි ඉහළ අවධානයක් යොමු කරයි. කීර්තිනාමය කෙරෙහි බලපාන අපගේ කීර්තිය, සන්නාම දෘශ්‍යතාව සහ සදාචාර ආයතනික පාලනය පවත්වාගෙන ශක්තිමත් කිරීම කෙරෙහි අපගේ දැඩි අවධානය අපි යොමු කරමු. නවීන ගනුදෙනුකරුවාගේ වෙනස්වන සහ මතුවන අවශ්‍යතා සමාජ මාධ්‍ය මඟින් තවදුරටත් ශක්තිමත් කරයි. ඒ තුළින් ප්‍රජාවගෙන් කොටසට සෘණාත්මක හෝ ධනාත්මක තත්‍ය කාලීන තොරතුරු ගෙන යන අතර, අපගේ ප්‍රතිරූපය ගොඩ නැගීම හෝ විනාශ කිරීම හෝ සිදු කරයි. එබැවින්, සෘණාත්මක මහජන හැඟීම, විශ්වාසය අහිමිවීම, ක්ෂේත්‍රයේ ප්‍රමිති සමඟ අනුකූලතාවය නොමැතිකම, බැඳීම් හෝ අභ්‍යන්තර සේවා තත්ත්ව පිළිබඳ දෝෂය, හෝ බැංකුවේ අවංකකම පිළිබඳ විශ්වාසය සහ සිය ව්‍යාපාර කරගෙන යාමට ඇති හැකියාව පිළිබඳ විශ්වාසය පහත වැටීම අපගේ කීර්තිනාමයට සැලකියයුතු ලෙස හානි කළ හැකි අතර, එය මූල්‍ය හෝ මූල්‍ය නොවන අලාභවලට හේතු විය හැකිය.

අපගේ කීර්තිනාම අවදානමේ අස්පෘශ්‍යතාවය, ප්‍රත්‍යක්ෂලාභයක් හෝ අලාභයක් ඇති කරන අතර, අවශ්‍ය අවස්ථාවලදී ක්‍රියාත්මක අදහසක් සමඟ වෙළෙඳපොල හැඟීමට දැඩි සංවේදීතාවක් සමඟ එය කළමනාකරණය කරමු.

මහජන බැංකුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ රාජ්‍ය බැංකුවන් ලෙස දශක හයකට ආසන්න කාලයක් සඳහා සිය නිර්දෝෂී ගමන් මාවතක් පවත්වාගෙන ඇති බැවින්, බැංකුවේ කීර්තිනාමය කෙරෙහි සෘණාත්මක බලපෑම අවම වේ. ගනුදෙනුකාර විශ්වාසය ශක්තිමත් කීර්තිනාමයකින් ව්‍යුත්පන්න වන අතර, එය බැංකුවේ අවංකකම, සිය කාර්ය මණ්ඩලයේ දක්ෂතාව, සහ උසස් තත්ත්වයේ සිය නිෂ්පාදන පිළිබඳ කැඩපතකි.

	2024 දෙසැම්බර් 31	2023 දෙසැම්බර් 31
බාහිර ශ්‍රේණිගතකරණය (ෆිට්ච් ශ්‍රේණිගතකරණය)	AA-	A
සන්නාම හිමිකම් ලකුණු	4.0	4.0

අනුකූලතා අවදානම

නීති, රෙගුලාසි, සහ ක්ෂේත්‍රයේ ප්‍රමිතිවලට අනුකූල නොවීම නියාමන සහ අනුකූලතා අවදානම්වලට හේතු වේ. 2024 දී, අපි සාර්ථකව ගතික නියාමන වාතාවරණය යාත්‍රා කළ අතර, එයට විවක්ෂණ රෙගුලාසි මත දැඩිකළ පරීක්ෂාකාරිබව, මුදල් විශුද්ධිකරණ විරෝධී අවශ්‍යතා, ගනුදෙනුකාර දත්ත ආරක්ෂාව, තිරාසරභාවය සහ පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේ මනා සහ ජාත්‍යන්තර ප්‍රමිති අවශ්‍ය විය. අපගේ කැපවූ අනුකූලතා දෙපාර්තමේන්තුව මෙම තීරණාත්මක අංග අධීක්ෂණය කරන අතර, එය කාලීන, නිවැරැදි සහ විනිවිද අනාවරණ සමඟ ශක්තිමත් ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, මාලාවකින් මෙහෙයවන ලදී.

පාලනය

ශක්තිමත් පාලන ව්‍යුහයක් අනුකූලතාව සහතික කරන අතර, 2024 දී කඩවීම් පිළිබඳ සිදුවීමක් හෝ කිසිදු නියාමන දඩයක් නොතිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩලය	අදාළ බාහිර රෙගුලාසි සහ අභ්‍යන්තර මාර්ගෝපදේශවලට අනුකූල වීම සහතික කිරීමේ ඉහළම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර ඒ සඳහා BIRMC සහ BAC විසින් සහාය දක්වයි.
අනුකූලතා දෙපාර්තමේන්තුව	➔ නියාමන තක්සේරු කිරීම් හරහා බැංකුවේ අනුකූලතා තත්ත්වය අධීක්ෂණය කරන අතර සහ සෘජුවම BIRMC වෙත වාර්තා කරයි. ➔ අනුකූලතා දෙපාර්තමේන්තුව ව්‍යවස්ථාපිත සහ අනිවාර්ය අවශ්‍යතා, අනුකූල නොවන සිදුවීම් සහ සේවක පුහුණුව සහ ශාඛා තක්සේරු කිරීම් පිළිබඳ දෙපාර්තමේන්තු සහ ශාඛා ප්‍රධානීන්ගේ අත්සන් සහිතව මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි. එම කාර්තුව තුළ කිසියම් විශේෂ අනුකූලතා සම්බන්ධ කරුණු පිළිබඳව BIRMC සහ BAC වෙත වාර්තා ද ඉදිරිපත් කරනු ලැබේ. ➔ බැංකුවේ අනුකූලතා අවදානම අභ්‍යන්තර හොඳම භාවිතයන් සහ බාහිර රෙගුලාසිවලට අදාළව ලකුණු පහක ශ්‍රේණිගත කිරීමේ පරිමාණ ලකුණු කාඩ්පතක් හරහා තක්සේරු කෙරේ. මෙම ලකුණු කාඩ්පත BIRMC වෙත ඉදිරිපත් කෙරේ.

අත්‍යවශ්‍ය අනුකූලතා කාර්යයන්

- නියාමන අවශ්‍යතාවලට අනුකූල නොවීමේ අවදානම තුරන් කිරීම හෝ අවම කිරීම සඳහා අනුකූලතා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමෙන් බැංකුව කීර්තිනාම අවදානමෙන් ආරක්ෂා කිරීම.
- සියලුම සේවකයින් සඳහා චර්යාධර්ම/ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කිරීම සහ සියලු මට්ටම්වල අනුකූලතාව නියාමනය සහ සහතික කිරීම.
- සියලුම දෙපාර්තමේන්තු විසින් පිළිපැදිය යුතු, ඔබේ ගනුදෙනුකරු හඳුනාගැනීමේ (KYC) රෙගුලාසි දැන ගැනීමට පෙළගැසී ඇති මුදල් විශුද්ධිකරණයට එරෙහි/ත්‍රස්තවාදී අරමුදල්කරණයට එරෙහිව ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
- පැහැදිලි සහ කාලෝචිත සන්නිවේදනය සහ අන්‍යෝන්‍ය අවබෝධය මත පදනම්ව නියාමකයින් සමඟ නිරන්තර සහ සුහද සබඳතා පවත්වා ගැනීම.
- බැංකුව තුළ අනුකූලතා සංස්කෘතියක් පෝෂණය කිරීම.
- අදාළ නෛතික සහ නියාමන වර්ධනයන් සමඟ සමීපව සිටීමට සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.
- අනුකූලතා ගැටළු ඇති කළ හැකි සියලුම අදාළ නියාමන වර්ධනයන් සහ නීතිවල වෙනස්කම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.
- පිළිගත හැකි කාල රාමුවක් තුළ අනුකූලතාවයට අදාල කඩවීමක් ඉස්මතු කිරීම සහ එය ආමන්ත්‍රණය කිරීමට සහ නිවැරැදි කිරීමට කළමනාකාරිත්වය සමඟ කටයුතු කිරීම.
- මහ බැංකු නියෝග සහ මාර්ගෝපදේශ මත සහ නීතියෙන් නියම කර ඇති පරිදි සතිපතා, මාසික, කාර්තුමය සහ වාර්ෂික අනුකූලතා වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම සහ නීතියෙන් දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත අවශ්‍ය විටදී මාසික අනුකූලතා වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම.

සහය අනුකූලතා කාර්යයන්

- නියාමන, කීර්තිනාම සහ සදාචාරාත්මක කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට සහ කාර්ය මණ්ඩලයට උපදේශන සේවා සැපයීම. සාර්ථක බලගන්වන්නෙක් ලෙස අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම.
- දේශීය නියාමන අවශ්‍යතා, අභ්‍යන්තර අනුකූලතාවය සහ සදාචාර ප්‍රමිතීන්ට අනුකූලව නව නිෂ්පාදන සහ පද්ධති ව්‍යුහගත කිරීමේදී යෙදවුම සැපයීම.
- නියමිත කාල පරාසයන් තුළ තක්සේරු කිරීම් සහ සමාලෝචන පැවැත්වීමෙන් අභ්‍යන්තර හා බාහිර රෙගුලාසිවලට අනුකූල වීම තහවුරු කිරීම.
- අදාළ අභ්‍යන්තර හා බාහිර කමිටු තුළ අනුකූලතා කාර්යය නියෝජනය කිරීම.
- කළමනාකරණයට සහ කාර්ය මණ්ඩලයට අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති පැහැදිලිව සන්නිවේදනය කිරීම.
- අනුකූලතා ගැටළු විසඳීම සඳහා අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යයන් සමඟ සම්බන්ධ වීම.
- විගණන මඟින් හඳුනාගත් අනුකූලතා ගැටළු පිළිබඳව පසු විපරම් කිරීම.
- විගණකවරුන් සමඟ සම්බන්ධ වීම සහ අවදානම් මත පදනම් වූ තක්සේරුව මත අහඹු අනුකූලතා විගණන පැවැත්වීම.

අත්‍යවශ්‍ය අනුකූලතා කාර්යයන්	සහය අනුකූලතා කාර්යයන්
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස් මත පාරිභෝගික ප්‍රඥප්තියක් ස්ථාපිත කිරීම. බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ මහ බැංකු විධානය මත පදනම්ව ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන් සංග්‍රහය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම. මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදී අරමුදල්කරණය වැළැක්වීම සඳහා ගණුදෙණු නිරීක්ෂණය කිරීම සහ සැක කටයුතු ගනුදෙනු මූල්‍ය බුද්ධි අංශය වෙත වාර්තා කිරීම සඳහා පද්ධති සහ පාලන ස්ථාපිත කිරීම. මුදල් විශුද්ධිකරණයට විරෙහි වීම ඇතුළුව අනුකූලතාව පිළිබඳව කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීම සහ ශාඛා ජාලය හරහා පුහුණුව සඳහා පහසුකම් සැලසීම සඳහා විද්‍යුත් ඉගෙනුම් මොඩියුලයක් සංවර්ධනය කිරීම. චර්යාධර්ම සංග්‍රහයක් සංවර්ධනය කිරීම ඇතුළුව අනුකූලතා අවදානම සහ කීර්තිනාම අවදානම අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම. ණය තොරතුරු කාර්යාංශය සමඟ සම්බන්ධ වීමෙන් ගනුදෙනුකරුවන්ගේ යාවත්කාලීන ණය තොරතුරු පවත්වාගෙන යාම.	

මූල්‍ය අපරාධ අනුකූලතාව (FCC)

බැංකු ක්ෂේත්‍රයට ස්පෘශ්‍ය තර්ජනයක් වන, FCC මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණයෙන් සමන්විත වේ. අනවශ්‍ය ඇතුළත් කිරීම් තුරන් කිරීම සඳහා ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ පාලන ප්‍රමිතීන් පිළිබඳ ශක්තිමත් චෙකතුවක් අප සතුව ඇති අතර, මෙම පෙරමුණේ දේශීය හා ජාත්‍යන්තර නීති සහ රෙගුලාසි උල්ලංඝනය කරන ස්ථාපිත සබඳතා නියාමනය කිරීම, වාර්තා කිරීම සහ ඉවත් කිරීම දිගටම කරගෙන යන්නෙමු. ගනුදෙනුකාර නිසි පරීක්ෂාව, ගනුදෙනු නියාමනය, ගෙවීම සහ නම් පරීක්ෂා කිරීම/අනාවරණය, සැකසහිත කටයුතු විමර්ෂණය සහ වාර්තාකරණයට අපි දැඩිව අනුකූල වන අතර සහ බැංකුවට අවදානමක් ඇති කළ හැකි කටයුතු වැලැක්වීමට සහ/හෝ සොයාගැනීමට සියලූම නව නිෂ්පාදන හා සේවා පිළිබඳ ඇගයීමක් පවත්වමු.

මුදල් විශුද්ධිකරණය, ඔබගේ ගනුදෙනුකරු දැනගන්න සහ ගනුදෙනුකාර නිසි පරීක්ෂාව වැනි කරුනු පිළිබඳ සියලූම සේවකයින් ව්‍යුහගත වැඩසටහනක් සහ ඊ-ඉගෙනුම් මොඩියුල තුළින් පුහුණු කෙරේ. විශ්වීය වශයෙන් විශාල සහ සැකසහිත ගනුදෙනු නැවත විශ්ලේෂණය කර, ඇගයීමට ලක් කර මූල්‍ය විමර්ෂණ ඒකකය වෙත වාර්තා කෙරේ.

2025 සඳහා අවධානය

2025 අභියෝග සහ අවස්ථාවන් සඳහා සූදානම් වන බැංකුවක් ලෙස, බැංකුව වෙනස්වන අභියෝග විසඳීමට සිය ශක්තිමත් කළමනාකරණ රාමුව තව තවත් ශක්තිමත් කරන අතර, තිරසාර වර්ධනය සඳහා සහය ලබා දේ. සාර්ව ආර්ථික අවිනිශ්චිතතා, වෙනස්වන නියාමන අවශ්‍යතා, සහ සයිබර් ආරක්ෂක තර්ජන, සහ කාලගුණ විපර්යාස වැනි මතුවන අවදානම් සහ සක්‍රිය සහ යොදාගත හැකි ප්‍රවේශයක් සඳහා ඉල්ලුම බැංකුව හඳුනාගනී.

අපගේ අවදානම් කළමනාකරණ අවධානයේ කොඳුනාරටිය වන්නේ යහපත් ණය කළඹක් පවත්වාගෙන යාම වන අතර, සමාන බැංකු අතර වෙළෙඳපොල තුළ තරඟකාරී වීමයි. තත්‍ය කාලීන ආර්ථික දර්ශක සහ අංශයට විශේෂ උවදුරු ඇතුළත් කරමින් අපගේ ණයකරු අවදානම් තක්සේරු ආදර්ශ නැවත සකස් කිරීම සඳහා අපි උසස් විශ්ලේෂණ ක්‍රියාත්මක කරමු. අපගේ පූර්ව සංඥා පද්ධතිය සක්‍රිය කළඹ ගැලපීම්වලට ඉඩදෙමින් වේගයෙන් මතුවන ණය පීඩන සොයා ගැනීමට උසස් කරනු ලැබේ. ඉලක්කගත පීඩන පරීක්ෂා තුළින් කාලගුණ අවදුරු අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

නිරන්තරයෙන් වෙනස්වන වෙළඳපොල සහ ද්‍රවශීලතා අවදානම මැඩ පැවැත්වීමට, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ඊලඟ පරම්පරාවේ ක්‍රමවේද විශ්ලේෂණ මෙවලමක් යොදා ගනු ලබන අතර, ඉන් බැංකුවේ ප්‍රාග්ධනය හා ලාභදායිතාවට පොලී අනුපාත කම්පන, විනිමය වෙනස්වීමේ කම්පන වැනි වෙළෙඳපොල විචල්‍යතා වෙනස්වීම් වඩා හොඳින් අපේක්ෂා කළ හැකිවේ. අපි විවිධාංගීකරණය වූ අරමුදල් ප්‍රභවයන් සහ හදිසි සැලසුම් ඇතුළුව ගතික ද්‍රවශීලතා කමනාකරණ උපායමාර්ග ක්‍රියාවට නංවමින් වෙළෙඳපොළ කඩාකප්පල් කිරීම්වලදී ස්ථායීතාවය පවත්වා ගන්නෙමු.

මෙහෙයුම් ඔරොත්තුදීම 2025 දී බැංකුව සඳහා අවධානය කරනු ලබන වෙනත් ප්‍රධාන ක්ෂේත්‍රයකි. අවදානම් තක්සේරු සහ අබණ්ඩ අනුකූලතාව සහ නියාමනය තුළින්, බැංකුව අවදානම් පාලනය නියාමන අනුකූලතාව ක්‍රමවත් කරනු ලැබේ. සේවක පුහුණු වැඩසටහන් අවදානම් දැනුවත් සංස්කෘතියක් පෝෂණය කිරීමට තීව්‍ර කරනු ලබන අතර, සංකීර්ණ හා මූල්‍ය සහ තාක්ෂණික වාතාවරණයන් යාන්ත්‍රණය කිරීමට අවශ්‍ය නිපුනතාවලින් සේවකයින් සන්නද්ධ කෙරේ.

තාක්ෂණික වර්ධනයන් 2025 සඳහා බැංකුවේ උපායමාර්ග හැඩ ගැස්වීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ජංගම සහ අන්තර්ජාල බැංකුකරණ වේදිකා පුළුල් කරමින්, බිඳවැටීම් හමුවේ පවා පහසු සේවා ලබාදීම සහතික කරමින් බැංකුව ඩිජිටල් පරිනාමනය ප්‍රමුඛ කරනු ලබයි. අනපේක්ෂිත අර්බුදවලට අනුව බැංකුවේ ඔරොත්තුදීම බලගන්වමින් ආපදා ප්‍රතිසාධන පෙරාතු ලේඛණ ව්‍යාපාර අඛණ්ඩතාව පවත්වා ගැනීමට දැඩිව පරීක්ෂා කරනු ලැබේ.

මෙහෙයුම් විශිෂ්ටත්වය බැංකුවේ 2025 වැඩසටහනේ කොඳුනාරටිය වශයෙන් පවතිනු ඇත. විද්‍යුත් අවදානම් ඇගයීම සහ (E-RCSA) සහ අබණ්ඩ අනුකූලතාව නියාමනය තුළින්, බැංකුව අවදානම් අධීක්ෂණය සහ නියාමන අනුකූලතාව ක්‍රමවත් කරනු ඇත. සේවක පුහුණු වැඩසටහන් අවදානම් දැනුවත් සංස්කෘතියක් පෝෂණය කිරීමට තීව්‍ර කරනු ලබන අතර, සංකීර්ණ හා මූල්‍ය සහ තාක්ෂණික වාතාවරණයන් යාත්‍රණය කිරීමට අවශ්‍ය නිපුනතාවලින් සේවකයින් සන්නද්ධ කෙරේ. මේ සමඟ, බැංකුව හරිත මූල්‍යකරණ වැඩසටහන් වැඩි කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලට සහයවීම, ගෝලීය කාලගුණ ඔරොත්තුදීමේ ප්‍රමිතිවලට පෙළ ගැසීම මඟින් තිරසාරභාවය කරා සිය බැඳීම තවදුරටත් විශාල කරනු ඇත.

අවසාන වශයෙන්, බැංකුව කෘතීම බුද්ධි පාලනය සහ දැඩි ආරක්ෂණ රාමු සහ උසස් ආරක්ෂක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමින් තර්ජන මැඩපැවැත්වීම වැනි මතුවන අවදානම් විසඳනු ඇත. අවදානම් අවම කිරීම සමඟ නව්‍යකරණය තුලනය කරමින්, සියලුම පාර්ශ්වකරුවන් සඳහා ස්ථාවරත්වය, වර්ධනය, සහ දීඝ්‍රකාලීන වටිනාකම සහතික කරමින් විශ්වාසයෙන් 2025දී ඉදිරියට යාමට බැංකුව කටයුතු කරනු ඇත.

ආයතනික පාලනය

ව්‍යවස්ථාපිතව ස්ථාපිත, රජය සතු බැංකුවක් ලෙස මහජන බැංකුවට පෞද්ගලික අංශයේ බැංකුවලට වඩා බෙහෙවින් සංකීර්ණ පාලන රාමුවක් ඇත. බැංකු ක්ෂේත්‍රයේ පාලනය කරන දැඩි රෙගුලාසිවලට අමතරව, මහජන බැංකුවේ පාලන පද්ධතිය මෙහෙයවනු ලබන්නේ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ නියමයන් සහ පනතට පසුව කරන ලද සංශෝධන මගිනි. මහජන බැංකුව ලැයිස්තුගත ආයතනයක් නොවුනත්, බැංකුව ශ්‍රී ලංකා වරලත් ආයතනික ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන් සංග්‍රහයට ස්වේච්ඡාවෙන් අනුකූල වේ.

බැංකුවේ ඉහළම පාලන ආයතනය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර, ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥාප්තිය හා අධ්‍යක්ෂවරුන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහය මගින් මෙහෙයවනු ලබන අතර, බැංකුවට සේවක ආචාරධර්ම පද්ධතිකයක්ද ඇත.

මහජන යහපත වෙනුවෙන් විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා, බැංකුව සිය වාර්ෂික වාර්තා තුළ 2021 ඒකාබද්ධ වාර්තාකරණ රාමුව සහ ගෝලීය වාර්තාකරණ මුලපිරීම (GRI) ප්‍රමිති, එහි වාර්ෂික වාර්තාවේ ඇතුළුව ජාත්‍යන්තර ESG වාර්තා කිරීමේ ණය අවදානම ප්‍රමිතීන් ද යොදා ගෙන ඇත.

අනුකූලතාවය

විගණකාධිපති විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් සහ 253 සහ 254 පිටුවල පිළිවෙළින් පළ කර ඇති මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකයක් ලබා දේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකු පනතේ නියෝගවලට අනුකූල වීමේ මට්ටම ද ඔහු සහතික කරයි.

2024 සඳහා ප්‍රධාන අවධානය

- බැංකුවේ අනුකූලතාව සහ පාලනයේ ගුණාත්මකභාවය පිළිබඳ බැංකුවේ තත්ත්වය සමාලෝචනය කිරීම සහ බැංකුවේ උපායමාර්ගික සැලැස්මට අනුකූලව අවශ්‍ය අවස්ථාවලදී අදාළ වෙනස්කම් සිදු කිරීම.
- වෙනස්වන සාර්ව ආර්ථික තත්ත්වයන්ට ගැලපීම.
- අවදානම් ඵලදායී කළමනාකරණය.
- තිරසර බව කාවැද්දීම.

පාලන රාමුව

බාහිර බාල අවශ්‍යතා

- 1988 අංක 30 දරණ බැංකු පනත (සංශෝධිත පරිදි)
- ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ
- 1953 අංක 24 දරන භූවමාරු පාලන පනත
- 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත
- 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
- බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 බැංකු පනත් නියෝගය
- 2017 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන් විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන් සංග්‍රහය
- ගෝලීය වාර්තාකරණ ප්‍රවේශයේ හි ගෝලීය වාර්තාකරණ ප්‍රමිති
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs)
- ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) පදනමේ ඒකාබද්ධ වාර්තාකරණ රාමුව

අභ්‍යන්තර පාලන අවශ්‍යතා

- 1961 අංක 29 දරන මහජන බැංකු පනත (සංශෝධිත පරිදි)
- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය
- අනු කමිටු සහ කළමනාකරණ කමිටු යොමු නියමයන්
- අධ්‍යක්ෂවරුන් සඳහා ව්‍යාපාර චර්යා සහ සදාචාර සංග්‍රහය
- විස්තරාත්මක ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි
- සේවකයින් සඳහා ආචාර ධර්ම සංගහය
- පාරිභෝගික ප්‍රඥාප්තිය
- අන්තර් විගණනය
- අභ්‍යන්තර පාලන

ප්‍රධාන පාලන මූලධර්ම

- වගවීම
- විනිවිදභාවය
- සාධාරණත්වය
- වගකීම

අපගේ ආයතනික වටිනාකම්



වටිනාකම් නිර්මාණය

පාර්ශ්වකරුවන්ගේ වටිනාකම් නිර්මාණය

උපායමාර්ගික ප්‍රතිඵල

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය GRI 2-9, 405-1

ස්ත්‍රී පුරුෂ විවිධත්වය
කාලසීමාව – 2024 ජනවාරි 1 සිට 2024 ඔක්තෝබර් 3 දක්වා



ස්ත්‍රී පුරුෂ විවිධත්වය
කාලසීමාව – 2024 ඔක්තෝබර් 3 සිට 2024 දෙසැම්බර් 31 දක්වා











සාමූහික කුසලතා GRI 2-17

කාලසීමාව - 2024 ජනවාරි 1 සිට 2024 ඔක්තෝබර් 31 දක්වා

	විශේෂිත අධ්‍යක්ෂවරුන් ගණන	ප්‍රතිශතය
මූල්‍ය හා ගිණුම්කරණය	6	75
ව්‍යාපාර පරිපාලනය	7	88
විගණන	2	25
මානව සම්පත් සහ කළමනාකරණය	5	63
නීති	3	38
ආර්ථික විද්‍යාව	2	25
වාණිජ	3	38
ජාත්‍යන්තර සංවර්ධනය	3	38
අයවැය සකස් කිරීම	1	13
තොරතුරු තාක්ෂණ/BPO	1	13
ඉංජිනේරු	1	13

කාලසීමාව - 2024 ජනවාරි 1 සිට 2024 දෙසැම්බර් 31 දක්වා

	විශේෂිත අධ්‍යක්ෂවරුන් ගණන	ප්‍රතිශතය
ආර්ථික විද්‍යාව	4	80
පොදු කළමනාකරණය	3	60
කළමනාකරණය හා ගිණුම්කරණය	3	60
ව්‍යාපාර පරිපාලනය	1	20
නීති හා රෙගුලාසි	1	20
මානව සම්පත් කළමනාකරණය	1	20
තොරතුරු තාක්ෂණය	1	20
ගණකාධිකාරණය	1	20
බැංකු හා මූල්‍ය	1	20
මානව විද්‍යාව	1	20
විදුලි ඉංජිනේරු	1	20

පාලන ව්‍යුහය හා සංයුතිය

GRI 2-9

බැංකුවේ ආයතනික පාලන රාමුව ප්‍රධාන ස්ථර දෙකකින් සමන්විත වේ: අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ක්‍රමෝපායික මෙහෙයවීම, මූල්‍ය පරමාර්ථ සම්පත් වෙන්කිරීම සහ අවදානම් ඉවසුම පිළිබඳ අධීක්ෂණය ලබා දී ආයතනික කළමනාකරණය සමඟ සමඟ සහයෝගයෙක් කටයුතු කරයි. බැංකුවේ සියලුම පාර්ශ්වකරුවන් සඳහා අන්‍යෝන්‍ය ප්‍රතිලාභ උත්පාදනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම කළමනාකරණයට පැවරී ඇත.

මහජන බැංකුවේ ආයතනික පාලන රාමුව



අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ එහි කමිටු සංයුතිය

GRI 2-9

අධ්‍යක්ෂවරුන් විසින් දරනු ලබන අනෙකුත් වැදගත් තනතුරු, ධුර කාලය සහ අධ්‍යක්ෂවරුන්ගේ නිපුණතා වැනි අමතර තොරතුරු සඳහා කරුණාකර 26 සිට 29 පිටුවල ඇති අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ බලන්න.

කාලසීමාව – 2024 ජනවාරි 1 සිට 2024 ඔක්තෝබර් 4 දක්වා

	විධායක/විධායක නොවන අධ්‍යක්ෂවරු	ස්වාධීන අධ්‍යක්ෂවරු	ස්ත්‍රී පුරුෂ භාවය	අඩු නියෝජනය සමාජ කණ්ඩායම්	පාර්ශ්වකරුවන්ගෙ නියෝජනය
අධ්‍යක්ෂ මණ්ඩලය	8	3	7 පිරිමි 1 ගැහැණු	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 8
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)	3	1	3 පිරිමි	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 3
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC)	3	1	3 පිරිමි	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 3
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව (BITC)	3	1	3 පිරිමි	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 3
අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණය කමිටුව (BIBC)	3	0	2 පිරිමි 1 ගැහැණු	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 3
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC)	3	0	3 පිරිමි	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 3
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)	3	2	2 පිරිමි 1 ගැහැණු	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 3
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)	3	1	2 පිරිමි 1 ගැහැණු	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 3
අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ගික සැලැස්ම සමාලෝචනය කමිටුව (BSPRC)	3	2	2 පිරිමි 1 ගැහැණු	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 3

කාලසීමාව 2024 ඔක්තෝබර් 4 සිට 2024 දෙසැම්බර් 31 දක්වා

	විධායක/විධායක නොවන අධ්‍යක්ෂවරු	ස්වාධීන අධ්‍යක්ෂවරු	ස්ත්‍රී පුරුෂ භාවය	අඩු නියෝජනය සමාජ කණ්ඩායම්	පාර්ශ්වකරුවන්ගෙ නියෝජනය
අධ්‍යක්ෂ මණ්ඩලය	5	0	4 පිරිමි 1 ගැහැණු	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 05
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC)	3	0	3 පිරිමි	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 03
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව (BITC)	2	0	2 පිරිමි	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 03
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC)	3	0	3 පිරිමි	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 03
අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ගික සැලැස්ම සමාලෝචනය කමිටුව (BSPRC)	3	0	2 පිරිමි 1 ගැහැණු	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්.	රජයෙන්/පත් කරන ලද සාමාජිකයින් 03

ආයතනික පාලනය සඳහා වන මනා පිළිවෙත් සංග්‍රහය සමඟ අනුකූල වීම

අධ්‍යක්ෂ මණ්ඩලය (මූලධර්මය අ.1)

2024 ඔක්තෝබර් 3 දක්වා කාලසීමාව

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ මුදල් අමාත්‍යවරයා විසිනි. අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. සියලුම අධ්‍යක්ෂවරුන් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ කීර්තිමත් වෘත්තිකයන් වෙති. සභාපතිවරයා විශේෂයෙන්ම මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 31කට වැඩි පළපුරුද්දක් ඇති මනා පළපුරුදු වෘත්තිකයෙකි. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ විවිධ කුසලතා සහ පළපුරුද්ද බැංකුවේ අවදානම් කළමනාකරණ සහ පාලන ක්‍රියාවලිය පොහොසත් කරයි.

2024 ඔක්තෝබර් 4 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව

වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය 2024 ඔක්තෝබර් 4 දින සිට පත්කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති, මහාචාර්ය පී චන් ඩී ප්‍රනාන්දු මූල්‍ය, බැංකුරණ, සහ උසස් අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල වසර 25කට වැඩි විස්තීරණ වෘත්තියක් සහිත පළපුරුදු උගත් සහ මූල්‍ය ප්‍රවීනයෙකි.

නිතිපතා මණ්ඩල රැස්වීම් පැවැත්වීම (මූලධර්මය අ.1.1)

අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් මසකට වරක් රැස්වන අතර අවශ්‍යතාවය මත අමතර රැස්වීම් කැඳවනු ලැබේ. 2024 වර්ෂය තුළ මණ්ඩලය 18 වතාවක් රැස් වූ අතර, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ඉහළ පැමිණීම, ක්‍රියාකාරී සහභාගීත්වය සහ නිර්මාණාත්මක සහ විවෘත සංවාදයන්ගෙන් සමන්විත විය.

අධ්‍යක්ෂවරුන් තමන් සාමාජිකයන් වන සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගි විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට නොපැමිණීමේ අවස්ථා සාමාන්‍යයෙන් සිදු වූයේ පෙර යොදාගත් රාජකාරි, පුද්ගලික වගකීම් හෝ අසනීප හේතුවෙනි.

ඊට අමතරව, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අධ්‍යක්ෂ මණ්ඩල නොවන සාමාජිකයින්ට සහ උපදේශක සාමාජිකයින්ට, ආරාධනයෙන්, න්‍යාය පත්‍රයේ නිශ්චිත අයිතමයන් ඇමතීමට රැස්වීම්වලට සහභාගී විය හැකිය. ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින්ට සහ/හෝ බාහිර විශේෂඥයින්ට බැංකුවේ උපාය මාර්ගයට අදාළ කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අනුකමිටු වෙත නිරන්තරව ඉදිරිපත් කිරීම් කිරීමට අවසර ඇත.

2024 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අදාළ කමිටු රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පහත විස්තර කෙරේ:

කාලසීමාව – 2024 ජනවාරි 1 සිට 2024 ඔක්තෝබර් 3 දක්වා

අධ්‍යක්ෂකවරයාගේ නම	තනතුර	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව BAC	අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව BHRRC	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව BIRMC	අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව BECC	අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව BNC	අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව BIBC	අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව BITC	අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව BSPRC
සුජීව රාජපක්ෂ මහතා	ස්වාධීන	14/14	-	9/9	-	-	12/12	-	-	3/3
ඉසුරු බාලපටබැඳිගේ මහතා	ස්වාධීන නොවන	15/15	-	9/9	5/6	18/18	-	2/3	6/6	-
මංජුල වෙල්ලාලගේ මහතා	ස්වාධීන නොවන	12/15	-	8/9	-	16/18	11/12	-	-	-
විශාඛා අමරසේකර මිය	ස්වාධීන නොවන	17/18	14/14	-	6/6	-	-	3/3	-	3/3
ඩී තොටවත්ත මහතා	ස්වාධීන නොවන	14/15	14/14	-	5/6	-	-	-	-	-
ඒ එම් පී එම් බී අතපත්තු මහතා	ස්වාධීන නොවන	13/14	11/14	-	-	-	12/12	3/3	-	-
එච් එම් යූ කේ සමරරත්න මහතා	ස්වාධීන නොවන	15/15	-	-	-	18/18	-	-	6/6	-
ඩී ටී සී සොයිසා මහතා	ස්වාධීන	14/15	-	-	-	-	-	-	6/6	3/3

කාලසීමාව – 2024 ඔක්තෝබර් 4 සිට 2024 දෙසැම්බර් 31 දක්වා

අධ්‍යක්ෂකවරයාගේ නම	තනතුර	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව BHRRC	අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව -BECC	අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව BSPRC
මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු මයා	ස්වාධීන	3/3	-	-	1/1
එම් ටී අයි වී අමරසේකර මිය	ස්වාධීන නොවන	3/3	-	-	1/1
එම් ජේ තිලකරත්න මයා	ස්වාධීන	3/3	1/1	3/3	-
ආර් බී ආර් එමර්සන් මයා	ස්වාධීන	3/3	1/1	3/3	1/1
ආචාර්ය ඒ කදිර්ගාමර් මයා	ස්වාධීන	3/3	1/1	3/3	-

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය GRI 2-12

(මූලධර්මය අ.1.2)

බැංකුවේ නායකත්වය, අධීක්ෂණය, පාලනය, සංවර්ධනය ලබාදීම සහ දිගුකාලීන සාර්ථකත්වය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී ඇත. අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව කොටස් හිමියන්ට වටිනාකම නිර්මාණය කිරීමට ද ඔවුන් පහසුකම් සපයයි. බැංකුව පුරා නිවැරදි සංස්කෘතිය පෝෂණය කිරීම, වටිනාකම් ඇති කිරීම සහ සදාචාරාත්මක හැසිරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති කරුණු පිළිබඳ විධිමත් කාලසටහනක් ඇත, එය දැනට පවතින බව සහතික කිරීම සඳහා නීතිපතා සමාලෝචනය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති කරුණු පහත වගුවේ සාරාංශගත කර ඇති අයිතම ඇතුළත් වේ:

යහපාලනය	උපාය මාර්ග සහ දිශාවන්	අවදානම් කළමනාකරණ වගවීම සහ පාලනය
යහපාලන විධිවිධාන සමාලෝචනය	උපාය මාර්ග සහ වාර්ෂික අයවැය අනුමත කිරීම	මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම, වෙළෙඳපොළ වෙත වෙනත් යාවත්කාලීන කිරීම් සහ ලාභාංශ පිළිබඳ නිර්දේශ
අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සඳහා කොන්දේසි සහ සාමාජිකත්වය	අත්පත් කර ගැනීම සහ බැහැර කිරීමේ කටයුතු සඳහා අවසර දීම	මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම, වෙළෙඳපොළ වෙත වෙනත් යාවත්කාලීන කිරීම් සහ ලාභාංශ පිළිබඳ නිර්දේශ
	අවදානම් කළමනාකරණ උපාය මාර්ග සහ අවදානම් රුචිය තහවුරු කිරීම	අධිකාරී මට්ටම්, මූල්‍ය සහ භාණ්ඩාගාර ප්‍රතිපත්ති අනුමත කිරීම අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය පිළිබඳ සමාලෝචනය සෞඛ්‍ය හා ආරක්ෂක ප්‍රතිපත්ති අනුමත කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අරමුණ සහ වටිනාකම සහ එම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ උපාය මාර්ගය තීරණය කරන අතර, බැංකුවේ පැවැත්ම සහ දියුණුව සහතික කිරීම සඳහා එහි වටිනාකම් ක්‍රියාත්මක කරමින් බැංකුවේ වත්කම් සහ කීර්තිනාමය ආරක්ෂා කරන ක්‍රියා පටිපාටි සහ වටිනාකම් ක්‍රියාත්මක කරයි.

බැංකුවේ සෑම දෙනාටම උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් සන්නිවේදනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත් සහතික කරයි. බැංකුවේ උපායමාර්ගික මඟ පෙන්වීම සහ කළමනාකාරිත්වයේ මග පෙන්වීම සහ අධීක්ෂණය සඳහා මේ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

අභ්‍යන්තර හා බාහිර සම්බන්ධතා සහ සන්නිවේදනය සඳහා යාන්ත්‍රණයන් අනුරූපනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. එමෙන්ම මෙහෙයුම් රටාව, අභ්‍යන්තර හා බාහිර සම්බන්ධතා සහ සන්නිවේදනය සඳහා යාන්ත්‍රණයන් අනුරූපනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. මෙහෙයුම් රටාව, බාහිර හා අභ්‍යන්තර සම්බන්ධතා, වෙළෙඳපොල සහ ව්‍යාපාර, අවශ්‍ය ප්‍රතිලාභ අනුපාත සහ කාර්ය සාධන ප්‍රමිතීන්, වර්ධනය සහ වෙනස් කිරීමේ ප්‍රතිපත්ති සහ අයවැය ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම ආවරණය වන පරිදි බැංකුවේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සම්පාදනය කිරීම සහ සන්නිවේදනය කිරීම ද සහතික කරයි. මෙම ක්‍රියාවලියේදී, බැංකුව සේවකයින්ට හා බාහිර ඡන්ද කොට්ඨාශවලට තනි හඬකින් කතා කළ යුතු බවත්, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී හෝ ඔහුගේ බලයලත් පුද්ගලයා ප්‍රධාන ප්‍රකාශකයා ලෙස කටයුතු කරන බවත් හඳුනා ගනී.

බැංකුවේ මූලික අරමුණ වන්නේ එහි උපායමාර්ගික රාමුව තුළ එහි ප්‍රකාශිත අරමුණට අනුකූලව ධනය නිර්මාණය කිරීමයි. මේ සම්බන්ධයෙන්, එය;

- බැංකුවේ උපායමාර්ග, ප්‍රතිපත්ති, ව්‍යාපාර සැලසුම්, අවදානම් ප්‍රතිපත්ති, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටිය සහ යාන්ත්‍රණය සහ කළමනාකරණ කාර්ය සාධන නිර්ණායක අනුමත කිරීම සහ ඉදිරි වසර තුන සඳහා ක්‍රියාත්මක වන පදනමක් මත මැනිය හැකි/හඳුනාගත හැකි ඉලක්ක සමඟ සෑම මට්ටමකදීම අර්ථවත් සැලසුම් නිෂ්පාදනය කරන බවට කටයුතු කිරීම.
- නොසැලකිලිමත් හෝ දැඩි ලෙස නොසැලකිලිමත් නොවන ආකාරයෙන් ක්‍රියා කිරීම සහ යහපත් ව්‍යාපාරික මූලධර්ම සහ විචක්ෂණ බැංකු භාවිතයන් අනුව ක්‍රියා කිරීම.
- බැංකුවේ ප්‍රාග්ධනය සහ වත්කම් සුරැකීම; සහ
- ක්ෂේත්‍රය තුළ සහ සමස්තයක් ලෙස ආර්ථිකය තුළ බැංකුව පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් පවත්වා ගැනීම.

අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම්වලින් සමහරක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු වෙත පවරා ඇත. වර්ෂය තුළ ලබා ඇති ප්‍රගතිය සමඟ එක් එක් කමිටුවට පවරා ඇති කාර්ය විෂය පථය මෙම වාර්තාවේ 243 සිට 250 දක්වා පිටුවල දක්වා ඇත.

බැංකුවේ අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිතාව නියාමනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩල විකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට පවරා ඇත. බැංකුවේ "අවදානම් භාරගැනීමේ හැකියාව" තීරණය කිරීමේ අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අවදානම් කළමනාකරණ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබන අතර, හඳුනාගත් අවදානම් සහ අවිනිශ්චිතතා නියාමනය කිරීම, පාලනය කිරීම සහ වාර්තා කිරීම ඇතුළත් වේ. එයට අමතරව, අවදානම් කළමනාකරණයට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි සභාපතිවරයා විසින් යොමුකළ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කරයි.

ව්‍යාපාරයට අදාළ වන පරිදි රටේ නීතිවලට අනුකූලවීම සහ ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමේ ක්‍රියා පටිපාටිය

(මූලධර්මය අ.1.3)

බැංකුව විසින් සිදුකරනු ලබන විවිධ ව්‍යාපාරික කටයුතුවලට අදාළ වන, රටේ නීතිරීතිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය සාමූහිකවද, තනි පුද්ගලයින් වශයෙන්ද කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. එමනිසා, අදාළ සියලුම නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාව පවත්වා ගැනීමට අදාළ සියලුම ක්‍රියාපටිපාටි සහ පාලනයන් ක්‍රියාත්මකව ඇති බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

සමහර කරුණු සම්බන්ධව වරින් වර ස්වාධීන විනිශ්චය ලබාගැනීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ඔහුගේ/ඇයගේ රාජකාරී සහ වගකීම් මුදාහැරීමට අදාළ යම් කරුණු පිළිබඳ බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් (මෙයටම සීමා නොවූවද, නීති, ගිණුම්කරණ හා මූල්‍ය උපදෙස් ඇතුළුව) ලබාගැනීමට හිමිකම ඇත.

සමාගම් ලේකම්

(මූලධර්මය අ.1.4)

සෑම අධ්‍යක්ෂකවරයෙකුටම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා හමුවිය හැකිවේ. එකඟ වූ සියලුම ක්‍රියා පටිපාටි සහ අදාළ නීති රීති පිළිපදින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතුය.

ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා සියලුම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල ලේකම්වරයා ලෙස කටයුතු කරන අතර, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කමිටු රැස්වීම්වල වාර්තා පවත්වාගෙන යයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ අනෙකුත් වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනුකමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- මහජන බැංකු පනත සහ අදාළ නීති සම්පාදනය අනුව කටයුතු සිදු කිරීම

- අදාළ නීති සම්පාදනයට සහ මනා පරිචයන්ට අනුකූලව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ යුතුකම් සහ වගකීම් සම්බන්ධයෙන් සහය වීම ඇතුළුව ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන්ට යොදා ගැනීම පහසුකම් සැලසීම
- විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ කළමනාකාරිත්වය අතර සන්නිවේදන සම්බන්ධීකාරක ලෙස ක්‍රියා කිරීම
- නියාමන අවශ්‍යතාවලට අනුකූලව සම්බන්ධිත පාර්ශ්වයන් සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ සුදුසු හෙළිදරව් කිරීම් සහතික කිරීම
- අදාළ වන සියලුම නීති සහ රෙගුලාසිවලට බැංකුවේ අනුකූලතාව සහතික කිරීම සඳහා මහජන බැංකු පනත සහ අනෙකුත් අදාළ නීති පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කර නීති උපදෙස් ලබා ගැනීම.

අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන විනිශ්චය

(මූලධර්මය අ.1.5)

බැංකුවේ තීරණ සම්බන්ධයෙන් ස්වාධීන තීන්දුවක් ගෙන ඒමට අධ්‍යක්ෂවරුන්ට අවශ්‍ය වේ. පළපුරුදු වෘත්තිකයන් ලෙස, ඔවුන්ගේ රාජකාරී වෙනත් පුද්ගලයින්ගේ බලපෑමකින් තොරව සිදු කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් ගතික සහ නිර්මාණාත්මක දායකත්වය ප්‍රවර්ධනය කරයි.

අධ්‍යක්ෂවරුන් විසින් ප්‍රමාණවත් කාලය සහ උත්සාහය කැප කිරීම

(මූලධර්මය අ.1.6)

අධ්‍යක්ෂවරුන් රැස්වීමකට පෙර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සමාලෝචනය කිරීමට සහ අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් සහ ගැටළු පිළිබඳව පසු විපරම් කිරීමට ප්‍රමාණවත් කාලයක් කැප කිරීමට අපේක්ෂා කෙරේ.

සියලුම වගකීම් සතුටුදායක ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා සෑම රැස්වීමකදීම ප්‍රමාණවත් කාලයක් කැප කිරීම සහතික කිරීමට අධ්‍යක්ෂවරුන්ගෙන් බලාපොරොත්තු වේ.

අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව GRI 2-17

(මූලධර්මය අ.1.7)

අඛණ්ඩ සංවර්ධනය සඳහා අදාළ පුහුණුව ලබා ගැනීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට හිමිකම් ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය/කමිටු වෙත අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය අදාළව පවතින බව සහතික කිරීම සඳහා, බැංකුව ක්‍රියාත්මක වන ව්‍යාපාර සහ වෙළෙඳපොල පිළිබඳ ඔවුන්ගේ දැනුම, කුසලතා සහ අවබෝධය නිතිපතා ප්‍රබෝධමත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ට අඛණ්ඩ පුහුණුවීම් සහ යාවත්කාලීන කිරීම් සපයනු ලැබේ.

බැංකුවේ මෙහෙයුම්, ආයතනික යහපාලනය, නීතිමය සහ නියාමන වර්ධනයන් පිළිබඳ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්ගේ හෝ උපදේශකවරුන්ගේ ලිඛිත වාර්තා සහ ඉදිරිපත් කිරීම් මෙයට ඇතුළත් වේ.

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී

GRI 2-11

(මූලධර්මය අ.2)

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී (CEO)/සාමාන්‍යාධිකාරී (GM) මහජන බැංකුවේ නායකත්වය සහ අඛණ්ඩතාව සහ ස්ථිරසාරභාවය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සඳහා සාමූහිකව වගකිව යුතු අතර, සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී /සාමාන්‍යාධිකාරී අතර වගවීම සහ වගකීම් පිළිබඳ පැහැදිලි සහ බලාත්මක වෙන් කිරීමක් ඇත. එක් එක් පාර්ශ්වය විශේෂිත කාර්යභාරයක් ඉටු කරන අතර, බලය සහ අධිකාරියේ සමතුලිතතාවය සහතික කිරීම සහ එක් පුද්ගලයෙකු සඳහා තීරණ ගැනීමේ සහ පාලනයේ අසීමිත බලතල වළක්වා ගැනීම සඳහා තහවුරු කිරීම එහි අරමුණයි.

ඵලදායී මෙහෙයුම් සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය දීම, මෙහෙයවීම සහ කළමනාකරණය කිරීම සහ එහි නෛතික සහ නියාමන වගකීම් සම්පූර්ණයෙන් ඉටු කිරීම සඳහා සභාපතිවරයා වගකිව යුතුය. ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ මූලික වගකීම වනුයේ බැංකුවේ දෛනික මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමයි.

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරු එක් පුද්ගලයකුට ඒකාබද්ධ කිරීමට ගත් තීරණය සාධාරණීකරණය කර ඉස්මතු කළ යුතුය

(මූලධර්මය අ.2.1)

එක් පුද්ගලයකු වටා තීරණ ගැනීම සම්බන්ධ අසීමිත බලයක් කේන්ද්‍රගතවීම වලක්වමින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී යන ධුරයන් පැහැදිලිව බෙදා වෙන් කොට ඇත. සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී පිළිබඳ මෙම වාර්තාවේ පිටු අංක 27 සහ 32 හි විස්තර කර ඇත.

සභාපතිවරයාගේ කර්යභාරය

GRI 2-11, 12

(මූලධර්මය අ.3)

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ කළමනාකාරිත්වය විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය ඵකඟත්වය පළ කරන ලද උපායාමාර්ග සහ ප්‍රතිපත්ති ඵලදායක ලෙස ක්‍රියාවට නංවනු ලබන බව තහවුරු කිරීම සඳහා සභාපති වගකිව යුතුය, එමෙන්ම සභාපතිවරයා විසින් යහපාලන පිළිවෙත් අනුගමනය කිරීම සඳහා නායකත්වය සපයන අතර, කොටස් හිමියන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී සන්නිවේදනය සහතික කිරීම සඳහා අධීක්ෂණය සපයයි. සභාපතිවරයා යනු මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ විධායකයෙක් සහ විධායක නොවන කාර්යභාරයක් ද නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු නිසිපරිදි පවත්වාගෙන යාම

(මූලධර්මය අ.3.1)

සභාපතිවරයා නායකත්වය සැපයීම පමණක් නොව බැංකුවේ සහ එහි කොටස් හිමියන්ගේ යහපත ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සඳහා ද වගකිව යුතුය. ඒ අනුව, සභාපතිවරයා පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් වගකීමට බැඳේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ඵලදායී අයුරින් සැලසුම්කර පවත්වනු ලබන බවට සහතික කිරීම
- අනෙකුත් අධ්‍යක්ෂවරුන් විවිධ අනුකමිටු සාමාජිකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා පිළිබඳව දැනුවත් වෙමින් එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා න්‍යාය පත්‍රය සැකසීම
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට නිවැරදි, කාලීන සහ පැහැදිලි තොරතුරු ලැබීම සහතික කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා නිවැරදිව සටහන් කර අධ්‍යක්ෂවරුන් අතර බෙදා හැරීම සහතික කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලයට සහ තනි තනි අධ්‍යක්ෂවරුන්ට ගැටළු කාලීන ආකාරයෙන් සාකච්ඡා කිරීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සහ පාලනය සැපයීම
- විනිවිද සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් උපකාරී සහ යහපත් අදහස් හුවමාරු කරගැනීමට විධායක නොවන අධ්‍යක්ෂවරුන් දිරි ගැන්වීම සහ ඒ තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරිත්වයට දායක වීම පහසු කිරීම
- සමූහයේ උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේදී සහ තක්සේරු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය පර්පූර්ණ කාර්යභාරයක් ඉටු කරන බව සහතික කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ බැංකුවේ යහපත වෙනුවෙන් ගනු ලබන බව සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ විකඟතාව සාධාරණ පිළිබිඹු කරන බව සහතික කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායිතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අර්ථවත් ප්‍රතිචාර ඇති කිරීමට ස්වයං තක්සේරුකරණය සඳහා නායකත්වය දීම

පළමු හමුවීමේදී සහ නියමිත කාල සීමාවන්හිදී (අවම වශයෙන් සෑම වසරකටම වරක්වත්) හෝ තත්ත්වයන් වෙනස් වන ඕනෑම අවස්ථාවක, සියලු අධ්‍යක්ෂවරු සද්භාවයෙන් යුතුව, බැංකුව සමඟ බැඳියා පිළිගැටුමක් ඇති වියහැකි යම් ව්‍යාපාරයක් හෝ වෙනත් අවශ්‍යතා වාර්තා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට හෙළිදරව් කළ යුතුය.

- වෙනත් යම් සමාගමක, හවුල්ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාර අවස්ථා තුළ සියලුම ව්‍යාපාර බැඳියාවන් (සෘජු හෝ වක්‍ර)
- වෙළෙඳ, ව්‍යාපාර හෝ වෙනත් ආර්ථික බැංකුවල සාමාජිකත්වය, සහ
- ඕනෑම ගනුදෙනුවක් සඳහා ඕනෑම පොලියක් (සෘජු හෝ වක්‍ර)

අධ්‍යක්ෂවරුන් අනෙකුත් බැංකු හෝ සම්බන්ධිත පාර්ශ්ව සමඟ ඔවුන්ගේ කටයුතුවල යම් බැඳියා පිළිගැටුමක් හෝ බැඳියා පිළිගැටුමක පෙනීම් ඇතිවීම වළක්වනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැදගත් යැයි තීරණය කර ඇති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලිය යුතු කරුණක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයෙකුට බැඳියා පිළිගැටුමක් තිබේ නම්, එම කාරණය සංසරණ මාර්ගයෙන් හෝ කමිටුවක් මගින් (අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන යෝජනාවකට අනුව එම කාර්යය සඳහා පිහිටුවා ඇති සුදුසු මණ්ඩල කමිටුවක් හැර) කටයුතු කරනු නොලැබේ. නමුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමේදී අධ්‍යක්ෂවරුන් හෝ ඔවුන්ගේ ආශ්‍රිතයන්ගේ බැඳීමක් ඇති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකට එම අධ්‍යක්ෂ ඡන්දය දීමෙන් වැළකී සිටින අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ ගණපූරණයට ඔවුන් ගණන් නොගනු ඇත.

බැංකුවක් අනුබද්ධ සමාගමක් හෝ බැංකුවේ ආශ්‍රිත සමාගමක් වන අවස්ථාවක දී හැර වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස කිසිදු අධ්‍යක්ෂවරයකු පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම සිදු නොකෙරේ.

මූල්‍යමය විචක්ෂණභාවය

(මූලධර්මය අ.4)

මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් මූල්‍ය විචක්ෂණභාවයක් සහ දැනුමක් ඇති සාමාජිකයින්ගෙන් සමන්විත වේ. මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මඟපෙන්වීම් සපයන ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරීවරුන් සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ට අමතරව, සෙසු අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ පුළුල් වෘත්තීය පළපුරුද්ද තුළින් අත්කරගත් ප්‍රමාණවත් මූල්‍ය විචක්ෂණභාවය සහිත අය වෙති.

අධ්‍යක්ෂ මණ්ඩල සමතුලනය

(මූලධර්මය අ.5)

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් අට දෙනෙකු සමඟ මනාව සමතුලිත වී ඇති අතර, ඔවුන්ගෙන් තුන් දෙනෙක් ස්වාධීන නිලය තුළ කටයුතු කරයි. මෙය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය සඳහා මනා පරිචයන් සංග්‍රහය මගින් නියම කර ඇති අවමයට වඩා ඉහළ අගයකි.

සියළුම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් කළමනාකරණය පිළිබඳ ස්වාධීන වන අතර, වැදගත් මැදිහත් වීමක් තිබියහැකි හෝ නිදහස් හෝ ස්වාධීන විනිශ්චයක් ක්‍රියාත්මක කිරීම සමඟ වැදගත් මැදිහත් වීම සාධාරණව ගම්‍යමාන වියහැකි යම් ව්‍යාපාරික හෝ වෙනත් සබඳතාවයකින් තොර වේ.

සෑම විධායක නොවන අධ්‍යක්ෂවරයෙක්ම නිශ්චිත නිර්ණායකයන්ට අනුව අත්සන් කරන ලද ස්වාධීන/ස්වාධීන නොවන බවට ප්‍රකාශයක් ඉදිරිපත් කරන අතර, ස්වාධීනත්වය තීරණය කිරීමේ නිර්ණායකවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ඒවා ඇගයීමට ලක් කෙරේ.

සමාලෝචිත වර්ෂය තුළ, විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීමට අවශ්‍ය කිසිදු තත්වයක් උද්ගත නොවීය. සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයකු බැවින් ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයකු පත්කිරීමේ අවශ්‍යතාව ද උද්ගත නොවීය.

තොරතුරු සැපයීම

(මූලධර්මය අ.6)

අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් දැනුම්දීමක් ලබා දෙමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කල්තියා සැලසුම් කර ඇත. සෑම අධ්‍යක්ෂ මණ්ඩලයකටම හෝ කමිටු රැස්වීමකටම පෙර, රැස්වීමට වැඩකරන දින හතකට පෙර සියලුම අධ්‍යක්ෂවරුන් වෙත න්‍යාය පත්‍රය, අන්තර්ගතය සහ කළමනාකරණ ඉදිරිපත් කිරීම්වල සාරාංශයක් ඇතුළුව අදාළ සියලුම පත්‍රිකා ලබා දෙන බව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහතික කරයි. රැස්වීම්වලට සහභාගී වීමට නොහැකි වන අධ්‍යක්ෂවරුන් ලේඛනගත වාර්තා තුළින් යාවත්කාලීන කරනු ලබන අතර, වාර්තාවලින් අනුගමනය කළ යුතු කරුණු සමඟ ඊළඟ රැස්වීමේදී අදාළ කරුණු සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකරේ.

එක් එක් අංශයේ/අනුබද්ධිත ආයතනවල ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක සමඟින් දෙන ලද මාසයකට මාසික ගිණුම් සකස් කර ඊළඟ මාසයේ අධ්‍යක්ෂවරුන් අතර බෙදා හරිනු ලැබේ. සපයනලද තොරතුරු ප්‍රමාණවත් නොවන බව හෝ අපැහැදිලි බව අධ්‍යක්ෂ මණ්ඩලයට හැඟේ නම්, වැඩිදුර පැහැදිලි කිරීම් හෝ අමතර තොරතුරු ඉල්ලා සිටීමට ඔවුන්ට අයිතියක් ඇත. වැඩිදුර විස්තර සැපයීම සඳහා අවශ්‍ය යැයි හැගෙන විට අදාළ කළමනාකරණ නිලධාරීන් රැස්වීම් සඳහා කැඳවිය හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම්

GRI 2-10

(මූලධර්මය අ.7 සහ අ.8)

මහජන බැංකු පනතට අනුව, විෂයභාර අමාත්‍යවරයා විසින් උපරිම වශයෙන් අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකු පත් කරනු ලබන අතර, ඉන් දෙදෙනෙක් සමූපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද අධ්‍යක්ෂවරුන් වෙති.

2007 අංක 11 දරන බැංකු පනත් නියෝගයේ විධිවිධානවලට අනුකූලව, අවුරුදු නවයක උපරිම කාල සීමාවකට සහ අවුරුදු 70 දක්වා වූ වයස් සීමාවකට යන දෙකෙන් පළමුව පැමිණෙන කාලයකට යටත්ව වසර තුනක කාලයක් සඳහා පත්වීම් සිදු කෙරේ.

අධ්‍යක්ෂ තනතුරු සඳහා වන සියලුම පත්වීම් අධ්‍යක්ෂවරුන් සඳහා සුදුසු සහ නිසි නිර්ණායක යටතේ තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කෙරේ.

විවිධත්ව නියෝජනයට අදාළ නිශ්චිත කොන්දේසි නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය සාධනය

GRI 2-18

(මූලධර්මය අ.9)

අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙක්ම සංග්‍රහයේ අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සාධන ඇගයීම් පිරික්සුම් ලැයිස්තුවේ දක්වා ඇති සියලුම නිර්ණායක ඇතුළත් කරමින් කණ්ඩායමක් ලෙස වාර්ෂිකව ඔහුගේ/ඇයගේ ඵලදායිත්වය මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ ස්වයං ඇගයුමක් සිදුකරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ප්‍රතිචාර සම්පාදනය කර සාරාංශ වාර්තාවක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් තොරතුරු හෙළිදරව් කිරීම

(මූලධර්මය අ.10)

අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් නීති සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ පහත පරිදි අනාවරණය කර ඇත:

- 26 සිට 29 පිටුවල නම, සුදුසුකම්, සංක්ෂිප්ත පැතිකඩ සහ විශේෂඥභාවයේ ස්වභාවය
- 179 පිටුවේ 2024 වර්ෂයේ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු රැස්වීම් ගණන සහ පැමිණීම.
- 243 සිට 250 පිටුවල අධ්‍යක්ෂවරයා සභාපතිවරයා හෝ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන කමිටුවල නම්.
- 241 සිට 242 පිටුවල සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

ප්‍රධාන විධායක නිලධාරියාගේ ඇගයීම

(මූලධර්මය අ.11)

ඇගයීම් ක්‍රියාවලිය මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරිගේ කාර්යසාධනය සහ නායකත්වය සම්බන්ධයෙන් ඵලදායී සාකච්ඡාවක් සඳහා විධිමත් අවස්ථාවක් ලබා දේ. උපාය මාර්ගික සැලසුම්කරණය සහ කාර්යසාධන කළමනාකරණය යටතේ සකස් කරන ලද ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි සඳහා මූලික කාර්යසාධන දර්ශක අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් කාර්තුමය ලෙස සමාලෝචනය කර, ඒවායේ සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව සමාලෝචන ඉදිරිපත් කරයි.

මෙම ඉලක්ක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරන අතර, ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරිගේ වාර්ෂික ඇගයීම් ක්‍රියාවලිය සඳහා පදනම ලෙස භාවිතා කෙරේ. යම් අහිතකර විචල්‍යතා සඳහා පැහැදිලි කිරීම් ගනු ලබන නිවැරදි ක්‍රියාමාර්ග සමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට සැපයීමේ වගකීම ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි විසින් දරයි.

අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායිකයින්ගේ පරිශ්‍රමික ක්‍රියා පටිපාටිය

GRI 2-19, 20

(මූලධර්මය ආ.1, ආ.1.1, ආ.1.2, ආ.1.3)

අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමිකය මුදල් අමාත්‍යාංශය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශ අනුව තීරණය කරනු ලබයි. කිසිම අධ්‍යක්ෂකවරයෙක් ඔහුගේ/ඇයගේ පාරිශ්‍රමිකය තීරණය කිරීමට සම්බන්ධ නොවේ. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් බැංකුවේ පාරිශ්‍රමික ප්‍රතිපත්ති සහ සාමූහික ගිවිසුමට අනුකූලව විකඟ වූ යොමු නියමයන් තුළ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමිකය සහ ප්‍රතිලාභවලට අදාළව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

බැංකුවේ ඉහළ කාර්යසාධනය, සුදුසුකම් සහ පළපුරුද්ද සහිත සේවකයින් ආකර්ෂණය කර රඳවා තබා ගැනීමට සහ අභිප්‍රේරණය කිරීමට පාරිශ්‍රමිකය සැලසුම් කර ඇත. සාමූහික ගිවිසුම යටතේ ඔවුන්ගේ පාරිශ්‍රමිකය අනුමත කිරීම සඳහා අවසාන බලධාරියා වන මුදල් අමාත්‍යවරයා වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමේදී අවශ්‍ය යැයි සලකන විට බාහිරව වෘත්තීය උපදෙස් ලබා ගනී. පාරිශ්‍රමික ප්‍රතිපත්ති ප්‍රකාශය සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සභාපතිවරයාගේ සහ සාමාජිකයින්ගේ නම් හෙළිදරව් කරන, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වාර්තාව 244 පිටුවේ දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද සමස්ත පාරිශ්‍රමිකය 241 පිටුවේ දක්වා ඇත.

කොටස් හිමියන් සමඟ සබඳතා

(මූලධර්මය ඇ.1, ඇ.2)

ශ්‍රී ලංකා රජය ප්‍රධාන කොටස්කරුවා වන රාජ්‍ය බැංකුවක් ලෙස, මහජන බැංකුව සෘජුවම මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. රටේ සමාජ – ආර්ථික සංවර්ධන ඉලක්ක සමඟ පෙළගැස්වීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වේ.

වාර්ෂික වාර්තාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් මුද්‍රණය කර මුදල් අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුවට බෙදා හරිනු ලැබේ. අමාත්‍යාංශයට අදාළ කරුණු සඳහා බැංකුව මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වේ.

ප්‍රධාන සහ වැදගත් ගනුදෙනු

(මූලධර්මය ඇ.3)

361 සිට 365 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන, සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ යටතේ සටහන 43 හි අනාවරණය කර ඇති ඒවා හැර, බැංකුවේ හෝ සමූහයේ ශුද්ධ වත්කම් පදනම සැලකිය යුතු ලෙස වෙනස් කරන ගනුදෙනු කිසිවක් නොතිබුණි.

ආර්ථිකය, පරිසරය සහ ජනතාව කෙරෙහි සංවිධානයේ බලපෑම් කළමනාකරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට පවරයි. අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී පත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයන් පත් කිරීම සඳහා සහභාගී වන අතර, බැංකුවට තීරණාත්මක වන බුද්ධිමය ප්‍රාග්ධනයේ අභිප්‍රේරණය සහ ආරක්ෂාව සහතික කරයි, කළමනාකාරිත්වය සහ අනෙකුත් සේවකයින් සඳහා සුදුසු සහ ප්‍රමාණවත් පුහුණුවක් ඇති බව සහතික කරන අතර ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කරයි.

මූල්‍ය වාර්තාකරණය

(මූලධර්මය ඈ.1)

වාර්ෂික වාර්තාව මගින් බැංකුවේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ අපේක්ෂාවන් පිළිබඳ සමබර සමාලෝචනයක් ඉදිරිපත් කරයි. තොරතුරු ඉදිරිපත් කිරීමේදී, අවබෝධය සහ පැහැදිලි බව වැඩි කිරීම සඳහා ප්‍රකාශානාත්මක හා දෘෂ්‍ය සංරචකයන් ද්විත්වයම භාවිතා කර ඇත. මුදල් අමාත්‍යාංශය සහ නියාමකයින් ඇතුළු අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති මෙම වාර්තාවේ සහ අනෙකුත් සන්නිවේදනයන්හි අපගේ කාර්යසාධනය පිළිබඳ සමබර දැක්මක් අප විසින් සපයා ඇත. වාර්ෂික වාර්තාවේ සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ අන්තර්කාලීන සන්නිවේදනයන් නිකුත් කිරීමේදී ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීමට බැංකුව සෑම උත්සාහයක්ම ගනී.

සංග්‍රහයට අවශ්‍ය පරිදි පහත හෙළිදරව් කිරීම් මෙම වාර්තාවේ ඇතුළත් වේ:

- 256 පිටුවේ මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය තුළ ඔවුන්ගේ වගකීම් ප්‍රකාශයක් ඇතුළත් වේ.
- 251 සහ 252 පිටුවල මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය ඇතුළත් වේ.
- 85 සිට 1976 දක්වා පිටුවල කළමනාකරණ විග්‍රහය ඇතුළත් වේ.
- 256 පිටුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශයේ සමාගමේ අඛණ්ඩතා පැවතීම පිළිබඳ ප්‍රකාශය ඇතුලත් වේ.
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිලිබඳව 241 සහ 242 පිටුවල අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනයන්හී සටහන් 43හි හෙළිදරව් කෙරේ.

අභ්‍යන්තර පාලන සහ විගණන කමිටුව

(මූලධර්මය ඈ.2 සහ ඈ.3)

බැංකුවේ කොටස් හිමියන්ගේ අවශ්‍යතා සහ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අවදානම් කළමනාකරණය සහ ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධති සඳහා සුදුසු සහ ප්‍රමාණවත් ක්‍රියාවලීන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය එහි වගකීම දැන සිටියි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වන අතර,

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් එහි රාජකාරී ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. ඔවුන්ගේ කාර්යභාරයන් සහ වගකීම් 246 පිටුවේ දක්වා ඇති කමිටු වාර්තාවල දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සහාය දක්වයි. බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ සවිස්තර වාර්තාවක් පිටු 178 – 212 හි ඇතුළත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අවදානම් බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය මගින් සහාය දක්වයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සහ සඵලතාවය සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අවදානම් වෙත නිරන්තරව වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ රාජකාරිවලට එවැනි විගණනවල විෂය පථය සහ ප්‍රතිඵල සහ එහි සඵලතාවය සමාලෝචනය යටතේ තබා ගැනීම ඇතුළත් වේ. බැංකුවේ බාහිර විගණනය සිදු කරන විගණකාධිපතිවරයා සමඟ සම්බන්ධ වීමේ දී ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මූලික කාර්යභාරයක් ඉටු කරයි.

ව්‍යාපාර චර්යා සහ අචාර ධර්ම සංග්‍රහය සහ ආයතනික යහපාලන වාර්තාව

(මූලධර්ම අෑ.4 සහ අෑ.5)

බැංකුවට ව්‍යාපාර චර්යා සහ ආචාර ධර්ම සංග්‍රහ දෙකක් පවතින අතර, එකක් අධ්‍යක්ෂවරුන්ට සහ අනෙක සේවකයන්ට අදාළ වේ. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව බැංකුවේ වෙනස් වන ව්‍යාපාරික මෙහෙයුම් සැලකිල්ලට ගනිමින් අදාළ සංග්‍රහයන් අදාළ සහ ප්‍රමාණවත් ලෙස පවතින බව සහතික කිරීම සඳහා වී්වා නිතිපතා සමාලෝචනය කිරීමේ වගකීම දරයි.

ව්‍යාපාර චර්යාවන් සහ අචාර ධර්ම සංග්‍රහය ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහයේ උපලේඛන 1 හි සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල වේ.

213 සිට 242 පිටු වලින් මෙම ආයතනික පාලන වාර්තාව අෑ 5 මූලධර්මයේ දක්වා ඇති පරිදි ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සංග්‍රහයට අනුකූල වීමේ ප්‍රමාණය හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයට අනුකූල වේ.

කොටස් හිමියන්ගේ සබඳතා

(මූලධර්ම ඉ සහ ඊ)

මහජන බැංකුවේ ප්‍රධාන කොටස් හිමියා ශ්‍රී ලංකා රජය වන බැවින් සංග්‍රහය ආශ්‍රිත විධිවිධාන අදාළ නොවේ.

තිරසාර වාර්තාව

GRI 2-9, 12 , 13, 14

(මූලධර්මය උ)

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුව සඳහා තිරසාර ප්‍රතිපත්තියක් අනුමත කර ඇති අතර, එහි දර්ශනය, අරමුණු සහ සමාජ හා පාරිසරික සංවර්ධනය සඳහා උපාය මාර්ගික ඉලක්ක ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා පාලන ව්‍යුහයක් පිහිටුවා ඇත.

වී අනුව, සැම භූගෝලීය පාලනයක් තුළම බැංකුවේ මෙහෙයුම් පුරාවට ත්‍රිත්ව පාලන අංගයක් ඇතුළත් කර ඇත. බැංකුවේ තිරසාර ව්‍යාපාර මුල පිරීම් සංග්‍රහයේ මූලධර්මවලට අනුකූලව පහත පරිදි විස්තර කෙරේ:

මූලධර්මය 1 – ආර්ථික තිරසාරබව – මූල්‍ය ප්‍රාග්ධනය 115-120 පිටුවල

මූලධර්මය 2 – පරිසරය – ස්වභාවික ප්‍රාග්ධනය පිටු 169-177

මූලධර්මය 3 – ශ්‍රම ව්‍යවහාර මානව ප්‍රාග්ධනය පිටු 133-144

මූලධර්මය 4 – සමාජය – සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය පිටු 161-168

මූලධර්මය 5 – නිෂ්පාදන වගකීම – සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය පිටු අංක 145-150 දක්වා ගනුදෙනුකරු පිළිබඳව.

මූලධර්මය 6 – පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම, නියැලීම සහ ඵලදායී සන්නිවේදනය, 55-54 පිටුවල පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය

මූලධර්මය 7 – තිරසාර වාර්තාකරණය වාර්තාකරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස විධිමත් කිරීමට සහ නිතිපතා සිදු කිරීමට 4-6 පිටුවල අපගේ ඒකාබද්ධ වාර්තාව පිළිබඳව.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය සහතික කිරීම සඳහා පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි නිතිපතා සමාලෝචනය කරයි. එමඟින් එහි තීරණ ගැනීමේ හැකියාව සහ වාර්තාකරණයේ සහ මූල්‍ය ප්‍රතිඵලවල නිරවද්‍යතාවය ඉහළම මට්ටමින් පවත්වා ගෙන යනු ලැබේ.

මහ බැංකුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකු පනත් නියෝගය සහ ඉන් පසුව සිදු කළ සංශෝධන

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
3. (1)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**		
	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන ආකාරයෙන් බැංකුවේ ආරක්ෂාව සහ ප්‍රබලතාවය ශක්තිමත් කර ඇත:		අනුකූල විය
(a)	උපායමාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් සැකසීම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 – 2026 කාල සීමාව සඳහා උපාය මාර්ගික සැලැස්මක් අනුමත කරන ලදී. උපායමාර්ගික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2025, 2026 සහ 2027 වසර සඳහා 2025 – 2027 සඳහා උපායමාර්ගික සැලැස්ම දැනටමත් සකස් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සහ සමාලෝචන කමිටුව (BSPRC) විය 2025 මාර්තු 5 දින නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. 2024 අයවැය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. අයවැය 2024 – CAPEX සීමාවන් (සංශෝධිත) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. සවිස්තරාත්මක සාකච්ඡාවලින් පසුව, 2024 දෙසැම්බර් 31 (සංශෝධිත) අවසන් වන වර්ෂය සඳහා බැංකු සහය සේවා දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව යන දෙකටම CAPEX අයවැය සඳහා මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී. 2024 අයවැය අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, (සංශෝධිත) සහකාර සාමාන්‍යාධිකාරී කාණ්ඩයේ බොහෝ ප්‍රධාන කළමනාකාර මණ්ඩලය සාකච්ඡාවට සහභාගී වී ඇත. සවිස්තරාත්මක සාකච්ඡා කිරීමෙන් අනතුරුව, එහි දක්වා ඇති උපකල්පනවලට යටත්ව පහත සඳහන් කරුණු සඳහා මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී. (අ) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වසර සඳහා අයවැය (ආ) 2025 පලමු කාර්තුව අවසානයේ ඉලක්ක අවශ්‍ය පරිදි සමාලෝචනය/ප්‍රතිශෝධනය කිරීම	
(b)	අවදානම් ප්‍රතිපත්ති සහ කළමනාකරණය ඇතුළු සමස්ත ව්‍යාපාර උපාය මාර්ග අනුමත කිරීම	උපාය මාර්ගික සැලැස්මට උපාය මාර්ගික අරමුණු සහ බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ග ඇතුළත් වේ. අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඇත 2025 – 2027 උපායමාර්ගික සැලැස්මට 2025 ඇතුළුව අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා සමස්ත ව්‍යාපාරික උපාය මාර්ගය, මැනිය හැකි ඉලක්ක ඇතුළත් වේ.	අනුකූල විය
(c)	අවදානම් කළමනාකරණ	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් කළමනාකරණය සහ අදාළ ප්‍රධාන කළමනාකරණ කර්ය මණ්ඩලයෙහි සහාය ඇතිව බැංකුවේ සියලුම අවදානම් තක්සේරු කිරීමේ මූලිකත්වය ගනී. එසේම, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කලමනාකරණ කමිටුව බැංකුවේ නව ක්‍රමෝපායන්, නව උපාය මාර්ග නිසා පැන නගින අවදානම් සහ එවැනි අවදානම් අවම කර ගැනීමේ මාර්ග සහ විධි තවදුරටත් සාකච්ඡා කරයි.	අනුකූල විය
(d)	සියලුම පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියලුම පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී ආයතනික සන්නිවේදන ප්‍රතිපත්තියක් අනුමත කර ක්‍රියාත්මක කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය 2024 දී දැනට පවතින සන්නිවේදන ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඇත.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
(e)	අභ්‍යන්තර පාලන පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධති	**අභ්‍යන්තර පාලන පද්ධති** මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ සැලසුම් සහ සඵලතාවය පිළිබඳ ක්‍රියාවලිය හරහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය තක්සේරු කිරීමට බැංකුවේ වාර්ෂික අධ්‍යක්ෂ මණ්ඩල යාන්ත්‍රණයක් ඇත. තවද, බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය ඉහත ක්‍රියාවලියේ සඵලතාවය තහවුරු කිරීමේ ක්‍රියාවලියට වටිනාකම එක් කරයි. අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. **කළමනාකරණ තොරතුරු පද්ධති** බැංකුව විසින් කළමනාකරණ තොරතුරු ඒකකයක් ස්ථාපිත කර ඇති අතර, එහි ප්‍රධාන කාර්යභාරය වන්නේ ජනනය කරන ලද වාර්තාවල නිරවද්‍යතාවය සහතික කිරීම සහ අවශ්‍ය පාර්ශ්ව වෙත වාර්තා කාලීන අයුරින් බෙදා හැරීමයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව එහි කොටසක් ලෙස ප්‍රධාන කාර්යාලයේ MIS ඒකකයේ විගණනයක් සිදු කර ඇත. 2024 වර්ෂය තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ විගණනය සහ ඒ සඳහා නිරීක්ෂණ සහ ප්‍රතිචාර BAC වෙත ඔවුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කර ඇත.	අනුකූල විය
(f)	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMPs)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්වචනය කර ඇති පරිදි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්, සහකාර සාමාන්‍යාධිකාරීන්, මූල්‍ය ප්‍රධානී, ප්‍රධාන ආදායම් නිලධාරී/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සම්බන්ධතා කළමණාකරු), සහතික කළ අභ්‍යන්තර විගණක අනුකූලතා නිලධාරී, භාණ්ඩාගාර ප්‍රධානී, නීති ප්‍රධානී, තොරතුරු තාක්ෂණ ප්‍රධානී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පහත සඳහන් කාණ්ඩ නිර්වචනය කර නම් කර ඇත. 2019 අංක 1 දරන බැංකු පනත් නියෝගයේ තීරණය කිරීම සහ 2007 අංක 11 දරන බැංකු පනත් නියෝග යේ 3 (1) (i) (B) වගන්තිය යටතේ වැටෙන පහත වර්ගයේ වෙනත් නිල ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වශයෙන් නිර්වචනය කොට ඇත.	අනුකූල විය
(g)	අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමණාකරණ කාර්යය මණ්ඩලයේ අධිකාරිත්ව වපසරිය සහ ප්‍රධාන වගකීම් නිර්වචනය	අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය අතර පැහැදිලි අධිකාරිය සහ වගකීම් වෙන් කිරීමක් ඇත. බැංකුවේ උපායමාර්ගික තීරණ ගැනීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් සඳහා ප්‍රධාන කළමණාකාර කාර්යය මණ්ඩලය වගකිව යුතුය. මනා පරිච සංග්‍රහය – ඇමුණුම ෂෂෂ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්ති අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති බලතල ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන වගකීම් සම්පූර්ණයෙන්ම මෙහෙයුම් මත පදනම් වන අතර, ඒවා ඔවුන්ගේ අදාළ රැකියා විස්තරය තුළ නිශ්චිතව දක්වා ඇත. ප්‍රධාන කළමනාකාරිත්වයේ නිලධාරීන්ගේ අධිකාරී බලය නියෝජිත අධිකාරියේ සීමාවන් යටතේ අර්ථ දක්වා ඇත	අනුකූල විය
(h)	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් බැංකුවේ කටයුතු අධීක්ෂණය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරිත්වයේ පිරිස් හරහා බැංකුවේ කටයුතු නිසි ලෙස අධීක්ෂණය කර ඇත.	අනුකූල විය
(i)	ස්වකීය පාලන භාවිතයන්හි සඵලතාවය තක්සේරු කිරීම		අනුකූල විය
	(i) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම, නම් කිරීම සහ පත් කිරීමත	මහජන බැංකු පනතේ 8 වැනි වගන්තියට අනුව අධ්‍යක්ෂවරුන් පත් කිරීම අමාත්‍යවරයා විසින් සිදු කරනු ලබන අතර, ඉන් දෙදෙනෙකු සමූපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබේ. සියලුම ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තෝරා ගැනීම, නම් කිරීම සහ නිර්දේශ කිරීමේ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව විසින් සකස් කරනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන ඇත.	
	(ii) බැඳියා පිළිගැටුම් කළමණාකරණය සහ	බැඳියා පිළිගැටුම් නිසි ලෙස සටහන් කර ඇත	

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
	(iii) දුර්වලතා නිර්ණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී වෙනස්කම් ක්‍රියාත්මක කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩලයේ 2023 වසර සඳහා ස්වයං ඇගයීම් ආකෘති මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.	
(j)	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අනුප්‍රාප්තික සැලැස්ම	ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අනුප්‍රාප්තික සැලැස්ම ක්‍රියාත්මක වේ.	අනුකූල විය
(k)	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ නිතිපතා රැස්වීම්	ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයින්ට ඔවුන්ගේ කාර්යය ක්ෂේත්‍රයට අදාළ කරුණු පැහැදිලි කිරීමට අවශ්‍ය වූ විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය කැඳවනු ලැබේ.	අනුකූල විය
(l)	නියාමන පරිසරය සහ නියාමකයා සමඟ ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගැනීම	නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ක්‍රියාවලි ක්‍රියාත්මක වන අතර බැංකුව නියාමකයින් සමඟ සබඳතාවක් පවත්වාගෙන යයි. අධ්‍යක්ෂවරුන් ලෙස පත්කිරීමේදී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන් සංග්‍රහය (1.3) සහ දැනට සිටින අධ්‍යක්ෂවරුන්ගේ විස්තර ආදිය ඔවුන්ට ලබා දේ. පැවැත් වූ ව්‍යවස්ථාපිත විභාගයේදී මතු වූ අධීක්ෂණ ගැටළු කෙටුම්පත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇත. අනුකූලතා නිලධාරියා මාසික පදනමින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරියාගේ පැමිණීම නියාමකයා සමඟ පවත්වාගෙන යන සබඳතාව තවදුරටත් සනාථ කෙරේ.	අනුකූල විය
(m)	බාහිර විගණකවරුන් බඳවා ගැනීම	මහජන බැංකු පනතේ 34 වැනි වගන්තියට අනුව, විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වේ.	අනුකූල විය
3.1 (ii)	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීන් පත් කිරීම සහ ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් නිර්වචනය කිරීම සහ අනුමත කිරීම	මහජන බැංකු පනතේ 10 වැනි වගන්තියට අනුව අමාත්‍යවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අතරින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා පත් කරයි. 2022 දෙසැම්බර් 21 දින සිට සුජීව රාජපක්ෂ මහතා මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සභාපති සහ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ ලෙස පත් කර ඇති අතර 2024 ඔක්තෝබර් 03 දින ඉල්ලා අස්විය. මුදල්, ආර්ථික සංවර්ධන සහ ප්‍රතිපත්ති සම්පාදන හා සංචාරක අමාත්‍යංශය විසින් මාහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු මහතා 2024 ඔක්තෝබර් 4 දින සිට සභාපති සහ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂ ලෙස පත් කර ඇත. බැංකුවේ ආයතනික යහපාලනයේ මනා පරිචයන් සංග්‍රහයේ 2.22 සහ 2.23 වගන්ති මගින් සභාපතිවරයාගේ බලතල සහ කාර්යභාරයන් නිර්වචනය කරයි. ආයතනික යහපාලනයේ මනා පරිචයන් සංග්‍රහය (CBPCG) බැංකුවේ 3.9 ඇමුණුම III හි ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යභාරයන්, යුතුකම් සහ වගකීම් නිර්වචනය කරයි.	අනුකූල විය
3.1 (iii)	විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	2024 වර්ෂය තුළ බැංකුව රැස්වීම් 18ක් පවත්වා ඇත. 2024 වර්ෂය තුළ චක්‍රලේඛ යෝජනා 27ක් සම්මත කර ඇති අතර ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී නිසි පරිදි අනුමත කරන ලදී.	අනුකූල විය
3.1 (iv)	අධ්‍යක්ෂවරුන් විසින් න්‍යාය පත්‍රයට යෝජනා ඇතුළත් කිරීමට කටයුතු කිරීම.	ව්‍යාවහරයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ කරුණු සහ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුලත් වේ. මනා පරිචයන් සංග්‍රහයේ 2.16(ආ) වගන්තියට අනුව, ක්‍රමවත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රයට කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට හැකිවන පරිදි විධිවිධාන ක්‍රියාත්මක වන අතර, එහිදී එවැනි කරුණු හා යෝජනා බැංකුවේ ව්‍යාපාර සහ අවදානම් කළමනාකරණය ප්‍රවර්ධනයට අදාළ කෙරේ.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
3.1 (v)	රැස්වීම් පිළිබඳ දැනුම්දීම	ආයතනික යහපාලනයේ මනා පරිචයන් සංග්‍රහය 1.3 හි දක්වා ඇති පරිදි, සෑම අවුරුද්දකම නිතිපතා පැවැත්විය යුතු සභා රැස්වීම්වල දින දර්ශනය සකස් කිරීම මාණ්ඩලික ලේකම්වරයාගේ වගකීමක් වන අතර, එය සභාවේ අනුමැතියට යටත්ව සිදුකෙරේ. 2025 සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දින දර්ශනය අධ්‍යක්ෂ මණ්ඩලයේදී අනුමත කර ඇත. තවද, ව්‍යවහාරයක් ලෙස, සියලුම අධ්‍යක්ෂවරුන්ට නිතිපතා රැස්වීම්වලට සහභාගී වීමට අවස්ථාවක් ලබා දීම සඳහා අවම වශයෙන් දින 7 ක දැනුම්දීමක් අධ්‍යක්ෂ මණ්ඩලයට දෙනු ලැබේ. විශේෂ සහ හදිසි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා තවදුරටත් නියමිත දැනුම් දීම සිදු කර ඇත.	අනුකූල විය
3.1 (vi)	අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම	2024 වර්ෂය තුළ පැවති රැස්වීම්වලින් තුනෙන් දෙකකට සියලුම අධ්‍යක්ෂවරුන් සහභාගී වී ඇත. සමහර අධ්‍යක්ෂවරුන් අන්තර්ජාලය හරහා සහභාගී වී ඇති අතර අධ්‍යක්ෂවරුන් කිසිවෙක් අඛණ්ඩව රැස්වීම් තුනකට සහභාගි නොවී සිට නැත.	අනුකූල විය
3.1 (vii)	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා පත් කිරීම සහ වගකීම් පැවරීම	1988 අංක 30 දරන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන සෑහීමට පත් කරන නීතිඥයෙක් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වේ.	අනුකූල විය
3.1 (viii)	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ උපදෙස් හා සේවාවන් සඳහා ප්‍රවේශය අධ්‍යක්ෂවරුන්ට ඇත	ආයතනික පාලනයේ මනා පරිචයන් පිළිබඳ සංග්‍රහයේ 2.25 වගන්තියේ මේ සම්බන්ධයෙන් විධිවිධාන ඇත.	අනුකූල විය
3.1 (ix)	අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වාගෙන යාම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධ මනා පරිචය සංග්‍රහයේ දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයාගේ රාජකාරිවලට මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදනයක් ඇතුළත් වේ. තවද, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට අධ්‍යක්ෂ මණ්ඩලය හරහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා සහ මණ්ඩල අනු කමිටු වාර්තා වෙත ප්‍රවේශය ඇත.	අනුකූල විය
3.1 (x)	වාර්තා ප්‍රමාණවත් විස්තර සහිත වීම සහ නියමකයින් සහ අධීක්ෂණ අධිකාරීන් සඳහා විමර්ශන ලේඛණ වශයෙන් සේවය කිරීම්	විස්තරාත්මක වාර්තා ලබා දී ඇති නිර්ණායක ආවරණය කරමින් තබා ගන්නා අතර එය සාමාජිකයින් පිළිබඳ තනි පුද්ගල අදහස්, බැංකුවේ උපායමාර්ග සහ ප්‍රතිපත්ති සමඟ අනකූල වුවද, නොවූවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසාන තීරණය වැනි අවශ්‍ය විස්තර ඇතුළත් වේ. තීරණවලට එළඹීමේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විසින් භාවිතා කරන ලද වැඩිදුර වාර්තා සහ තොරතුරු සඳහන් කර ඇත,	අනුකූල විය
3.1 (xi)	ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීමට අධ්‍යක්ෂවරුන්ට ඇති හැකියාව	බැංකුවේ වියදම්න් සුදුසු තත්ත්වයන් යටතේ ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ.	අනුකූල විය
3.1 (xii)	බැදියා පිළිගැටුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම	1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 11 වැනි වගන්තිය අධ්‍යක්ෂ මණ්ඩලයේ බැදියා පිළිගැටුම් පිළිබඳව කථා කරයි. අධ්‍යක්ෂවරුන්ට ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ සමීප සම්බන්ධයක් ඇති හෝ ඔහුට හෝ ඇයට සැලකිය යුතු සම්බන්ධයක් ඇති කාරණාවකදී ඔහු ඡන්දය දීමෙන් වැලකී සිටීම හා ඝණපූර්ණයකදී ගණනය නොකර සිටීම මෙම ක්‍රියාපටිපාටිය මගින් තහවුරු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිචය සංග්‍රහයේ 2.13 වගන්තියේ ද මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදනයක් ඇත.	අනුකූල විය
3.1 (xiii)	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සඳහා වෙන් කර ඇති කරුණු පිළිබඳ නිල කාර්ය සටහන	මනා පරිචය සංග්‍රහය ඇමුණුම III - අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති බලතල ඇතුළත් වේ.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
3.1 (xiv)	නුඛුන්වත්භාවය පිලිබඳ ගැටළු ඇත්නම් මහ බැංකුවට දැන්වීම	බැංකුවට තම වගකීම් ඉටු කිරීමට නොහැකි වූ විට හෝ නොහැකි බවට හඳුනා ගැනීමට ක්‍රියා පටිපාටිවලට නොහැකි බව සලකන්නේ නම්, යම් තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැනුම් දීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ය. 2024 වසර තුළ එවැනි තත්ත්වයක් උද්ගත වී නැත.	අනුකූල විය
3.1 (xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව	අධ්‍යක්ෂ මණ්ඩලය මුදල් මණ්ඩලයට අවශ්‍ය මට්ටමින් බැංකුව ප්‍රාග්ධනීකරණය කර ඇත. අනුකූලතා නිලධාරියා සහ ICAAP විසින් ඉදිරිපත් කරන ලද මාසික අනුකූලතා සහතිකය මගින් මෙය ආමන්ත්‍රණය කර ඇත	අනුකූල විය
3.1 (xvi)	වාර්ෂික වාර්තාව තුළ ආයතනික පාලන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 වාර්ෂික වාර්තාවේ 213 සිට 242 දක්වා පිටුවල මෙම නියෝගයේ 3 වන වගන්තියට අනුකූල වීම පිළිබඳ සිය ආයතනික පාලන වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත.	අනුකූල විය
3.1 (xvii)	අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං ඇගයීම	අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා වාර්ෂිකව සියලුම අධ්‍යක්ෂවරුන්ගෙන් ඇගයීම් ආකෘති පත්‍ර ලබා ගනී. 2024 ඔක්තෝබර් 4 දක්වා සිටිය සියලුම අධ්‍යක්ෂවරුන්ගේ ඇගයීම් ආකෘති 2024 වසර සඳහා ලබා ගෙන ඇති අතර එහි සාරාංශය 2025 මාර්තු වල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූල විය
3.(2)	**අධ්‍යක්ෂවරුන්ගේ සංයුතිය**		
3.(2) (i)	අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව	අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 2024 වර්ෂය තුළ 2024 ඔක්තෝබර් 3 දක්වා අධ්‍යක්ෂක මණ්ඩලය හත් (7) කට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත විය. 2024 ඔක්තෝබර් 3 දින දක්වා අධ්‍යක්ෂ ධුර දැරූ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත පරිදි වේ සුජීව රාජපක්ෂ මහතා (ස්වාධීන/විධායන නොවන) ඉසුරු බාලපටබැඳි මහතා (ස්වාධීන නොවන/විධායන නොවන) මංජුල වෙල්ලාලගේ මහතා (ස්වාධීන නොවන/විධායන නොවන) විශාකා අමරසේකර මහත්මිය (ස්වාධීන නොවන/විධායන නොවන) ඒ එම් පී එම් බී අතපත්තු මහතා (ස්වාධීන නොවන/විධායන නොවන) දුෂ්මන්ත තොටවත්ත මහතා (ස්වාධීන/විධායන නොවන) 2024 සැප්තැම්බර් 24 දින ඉල්ලා අස්විය උදේනි සමරරත්න මහතා (ස්වාධීන නොවන/විධායන නොවන) දුෂාන් සෝසා මහතා (ස්වාධීන/විධායන නොවන) 2024 ඔක්තෝබර් 3 දින සිය 2024 දෙසැම්බර් 31 දක්වා අධ්‍යක්ෂ ධුර දැරූ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත පරිදි වේ මහාචාර්ය නාරද ප්‍රනාන්දු මහතා (ස්වාධීන/විධායන නොවන) විශාකා අමරසේකර මහත්මිය (ස්වාධීන නොවන/විධායන නොවන) ජයන්ත තිලකරත්න මහතා (ස්වාධීන/විධායන නොවන) බ්‍රැඩ්ලි එමර්සන් මහතා (ස්වාධීන/විධායන නොවන) ආචාර්ය අයිලන් කදිර්ගාමර් මහතා (ස්වාධීන/විධායන නොවන)	2024 ඔක්තෝබර් 3 දක්වා අනුකූල විය
3.(2) (ii) (a) and (b)	අධ්‍යක්ෂවරයෙකුගේ සේවා කාලය	අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් කිසිවකු වසර නවයක සේවා කාලය ඉක්මවා නැත.	අනුකූල විය
3.(2) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ තුලනය	බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොමැත.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
3.(2) (iv)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්	2024 ඔක්තෝබර් 4 දක්වා අධ්‍යක්ෂ නියෝගයට අනුකූල වීම සඳහා ප්‍රමාණවත් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවකින් මණ්ඩලය සමන්විත විය. 2024 වසර තුළ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වූයේ සුජීව රාජපක්ෂ මහතා (2024 ඔක්තෝබර් 4 දින ඉල්ලා අස්විය) දුෂ්මන්ත තොටවත්ත මහතා (2024 නොවැම්බර් 28 දින ඉල්ලා අස්විය) දුෂාන් සෝසා මහතා (2024 ඔක්තෝබර්ඩ්4 දින ඉල්ලා අස්විය) මහාචාර්ය නාරද ප්‍රනාන්දු මහතා (2024 ඔක්තෝබර් 4 දින පත් කරන ලද) ජයන්ත තිලකරත්න මහතා (2024 ඔක්තෝබර් 14 දින පත් කරන ලද) බ්‍රැඩ්ලි එමර්සන් මහතා (2024 ඔක්තෝබර් 14 දින පත් කරන ලදී) ආචාර්ය අයිලන් කදිර්ගාමර් මහතා (2024 ඔක්තෝබර් 14 දින පත් කරන ලද)	අනුකූල විය
3.(2) (v)	විකල්ප ස්වාධීන අධ්‍යක්ෂවරුන්	විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීමට මහජන බැංකු පනතේ ප්‍රතිපාදන නොමැති අතර 2024 වසර තුළ එවැනි තත්ත්වයක් උද්ගත වී නොමැත.	අනුකූල විය
3.(2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා වන නිර්ණායකි	1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් සිදු කරනු ලබන අතර, මුදල් අමාත්‍යවරයාගේ සහ වෙළෙඳ අමාත්‍යාංශයේ නියෝජිතයා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරු වන අතර අනෙකුත් අධ්‍යක්ෂවරු ස්වාධීන අධ්‍යක්ෂවරු වෙති.	අනුකූල විය
3.(2) (vii)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් ගණපූරණයෙන් අඩකට වඩා වැඩිපුර සමන්විත වීම	බැංකුවේ මනා පරිචයන් සංග්‍රහයේ 2.3 වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමිත ගණපූරණය පහක් වන අතර බැංකුවේ සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අය වේ. 2024 මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම අනුව, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අවශ්‍ය ගණපූරණයට අනුකූලව කටයුතු කර ඇත.	අනුකූල විය
3.(2) (viii)	සන්නිවේදනයේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හඳුනා ගැනීම සහ වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩ හෙළි කිරීම	සභාපතිවරයා, විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය 2024 වාර්ෂික වාර්තාවේ අනාවරණය කර ඇත.	අනුකූල විය
3.(2) (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් සඳහා විධිමත් හා විනිවිද පෙනෙන ක්‍රියා පටිපාටිය	1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම් මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබේ. 2019 අංක 1 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගයට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලබා ගත් සුදුසුකම් සහ විධිමත් අනුමැතියට යටත් වේ.	අනුකූල විය
3.(2) (x)	තාවකාලික පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යක්ෂවරුන් නැවත තෝරා ගැනීම	විෂයභාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන බැවින් එවැනි තත්ත්වයක් උද්ගත නොවීය.	අනුකූල විය
3.(2) (xi)	අධ්‍යක්ෂවරයා ඉවත් කිරීමට හෝ ඉල්ලා අස්වීමට හේතු සන්නිවේදනය කිරීම	මහජන බැංකු පනතේ 8(4) වගන්තිය, විෂය භාර අමාත්‍යවරයාට ලිපියක් ලිවීමෙන් අධ්‍යක්ෂවරයෙකුට ඉල්ලා අස්වීමට ප්‍රතිපාදන සපයයි. තවද අමාත්‍යවරයාට ගැසට් නිවේදනයක් නිකුත් කිරීමෙන් අධ්‍යක්ෂවරයෙකු ඉවත් කිරීමටද හැකිය. අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම සහ එසේ ඉල්ලා අස්වීමට හේතුව ශ්‍රී ලංකා මහ බැංකුවට නිසි ලෙස දැනුම් දෙනු ලැබේ.	අනුකූල විය
3.(2) (xii)	බැංකුවක අධ්‍යක්ෂවරුන් හෝ සේවකයන් වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු වීම තහනම් කිරීම	මෙම අවශ්‍යතාවය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගත් වාර්ෂික ප්‍රකාශයෙන් ආවරණය වේ.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
3.(3)	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ සුදුසුකම් තක්සේරු කිරීමේ නිර්ණායක**		
3.(3) (i)	අධ්‍යක්ෂවරයාගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුයි.	මහා පරිචයන් සංග්‍රහයේ 2.1 වගන්තියේ මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදනයක් ඇත. අධ්‍යක්ෂවරුන් ලෙස සේවය කරන කිසිවිකුට 2024 වසර තුළ වයස අවුරුදු 70 ඉක්මවා නොමැත.	අනුකූල විය
3.(3) (ii)	අධ්‍යක්ෂවරුන් සමාගම් 20කට වඩා වැඩි සංඛ්‍යාවක සහ විශේෂිත ව්‍යාපාර ආයතන වශයෙන් වර්ගීකරණය වන සමාගම් 10 කට වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු නොකල යුතුය.	කිසිදු අධ්‍යක්ෂවරයෙක් 2024 වසරේදී බැංකුවේ ආශ්‍රිත හෝ පරිපාලිත සමාගම් ඇතුළුව සමාගම්/අස්ථිත්ව/ආයතන 20කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂ ධූර දරා නොමැත.	අනුකූල විය
3.(3) (iii)	අධ්‍යක්ෂවරයා හෝ ප්‍රධාන විධායක නිලධාරියා බලපත්‍රලාභී බැංකුවක ඔහුගේ/ඇයගේ ධූරය නැවැත්වීමේ දින සිට මාස හයක කාලය කල්පිරීමට පෙර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස පත් නොකළ යුතුය.	2024 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස අධ්‍යක්ෂවරුන් කිසිවෙක් පත් කර නොමැත.	අනුකූල විය
3.(4)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන කළමනාකරණ කාර්යයන්**		
3.(4) (i)	පැවරීමේ විධිවිධාන අවබෝධය හා අධ්‍යයනය.	මහජන බැංකු පනතේ 32 වැනි වගන්තිය මගින් බැංකුවේ ඕනෑම නිලධාරියෙකුට එහි බලතල පැවරීමට සහ, අවශ්‍ය පරිදි සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් අවලංගු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ලබා දී ඇත.	අනුකූල විය
3.(4) (ii)	බලය පැවරීමේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයට බාධාවක් නොවිය යුතුය.		
3.(4) (iii)	බැංකුවේ මෙහෙයුම් සමග අදාළත්වය සහතික කිරීම සඳහා බලය පැවරීමේ කටයුතු සමාලෝචනය.	පවරන ලද බලතල බැංකුවේ අවශ්‍යතාවලට අදාළව පවතින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර සමාලෝචනය කරනු ලැබේ. .මීට අමතරව, ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා වත්මන් ආර්ථික සංදර්භයට අනුකූලව නියෝජිත ණය අධිකාරියේ (DCA) සීමාවන් සංශෝධනය කර ඇත.	අනුකූල විය
3.(5)	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා**		
3.(5) (i)	කාර්යය භාර බෙදා වෙන් කිරීම.	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරු දරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද පුද්ගලයන් දෙදෙනෙකු විසින්ය.	අනුකූල විය
3.(5) (ii)	විධායක නොවන සභාපති සහ ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කිරීම.	2022.දෙසැම්බර් 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුවේ සභාපතිවරයා ලෙස නැවත පත් වූ සුජීව රාජපක්ෂ මහතා ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයකු බැවින් ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයකු පත් කිරීමට එවැනි අවශ්‍යතාවක් මතුව නැත. කෙසේවෙතත් සුජීව රාජපක්ෂ මහතා 2024 ඔක්තෝබර් 4 දින සිට ඉල්ලා අස් වූ අතර, මහාචාර්ය නාරද ප්‍රනාන්දු මහතා 2024 ඔක්තෝබර් 4 දින සිට ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරයක් ලෙස පත් කරන ලදී.	අනුකූල විය
3.(5) (iii)	සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ අනන්‍යතාව සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සමඟ ඇති සබඳතා හෙළිදරව් කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් තහවුරු කරන ලද පරිදි, පොදු අධ්‍යක්ෂ තනතුරු හැර සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අතර, (මූල්‍ය, ව්‍යාපාර, පවුල හෝ වෙනත් වැදගත්/අදාළ සම්බන්ධතා ඇතුළුව) වෙනත් සබඳතාවක් නොතිබුණි. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගෙන් ප්‍රකාශයක් ලබා ගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මකව ඇත.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
3.(5) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීම් ක්‍රියාවලිය	අවශ්‍යතාවයට අනුකූල වන අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ස්වයං ඇගයීම් ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇත.	අනුකූල විය
3.(5) (v)	නාය පත්‍රය සඳහා වගකීම සභාපතිවරයා සතු නමුත් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වෙත පැවරිය හැකිය	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා නාය පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සකස් කරනු ලැබේ	අනුකූල විය
3.(5) (vi)	අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කර ප්‍රමාණවත් තොරතුරු සපයා ඇති බවට සහතික වීම	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පැන නගින ගැටළු පිළිබඳව සියලුම අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කරන බවට සභාපතිවරයා සහතික කරයි. නාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්ෂවරුන් වෙත බෙදා හරිනු ලබන්නේ ඔවුන්ට පත්‍රිකා කියවා බැලීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙමිනි. පෙර මාසයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත බෙදා හරිනු ලබන අතර, සහතික කිරීම/අනුමැතිය සඳහා ඊළඟ මණ්ඩල රැස්වීමේ දී සභාගත කරනු ලැබේ.	අනුකූල විය
3.(5) (vii)	සියලුම අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය දිරිමත් කිරීම සහ බැංකුවේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට නායකත්වය දීම	අධ්‍යක්ෂණයේ අවශ්‍යතාවය ආවරණය වන පරිදි ස්වයං-ඇගයීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා වාර්ෂිකව සියලුම අධ්‍යක්ෂවරුන්ගෙන් ඇගයීම් ආකෘති පත්‍ර ලබා ගනී.	අනුකූල විය
3.(5) (viii)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය සහ විධායක නොවන සහ විධායක අධ්‍යක්ෂවරුන් අතර සබඳතා දිරිමත් කිරීම	අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් වාර්ෂිකව සියලුම අධ්‍යක්ෂවරුන්ගෙන් ස්වයං ඇගයීම් ආකෘති පත්‍ර ලබා ගන්නා අතර, සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන බැවින් වෙනම අංශ ස්වයං ඇගයීම් පෝරමයට ඇතුළත් කර නොමැත.	අනුකූල විය
3.(5) (ix)	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ විධායක වගකීම් සෘජු අධීක්ෂණයෙන් වැළකීම	සභාපතිවරයා ප්‍රධාන කළමනාකාරීත්වයේ හෝ වෙනත් විධායක රාජකාරිවල අධීක්ෂණයට සෘජුව සම්බන්ධ නොවේ.	අනුකූල විය
3.(5) (x)	කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනය සහතික කිරීම	බැංකුවේ ප්‍රධාන කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යයි.	අනුකූල විය
3.(5) (xi)	ප්‍රධාන විධායක නිලධාරියා දෛනික කටයුතු භාරව සිටින ඉහළ විධායක ලෙස ක්‍රියා කරයි	ආයතනික පාලනය පිළිබඳ මනා පරිචය පිළිබඳ සංග්‍රහයේ 3.1 (අධිකාරී) වගන්තියට අනුව, ඔහු බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරවල දෛනික කළමනාකරණය භාරව සිටින ඉහළම විධායක වේ.	අනුකූල විය
3.(6)	**අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ කමිටු**		
3.(6) (i)	අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පිහිටුවීම, ඒවායේ කාර්යයන් සහ වාර්තා කිරීම	බැංකුව විසින් විගණන කමිටුව, මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, නාමයෝජනා කමිටුව සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ලෙස අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් පිහිටුවා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව ඉහත අවම අවශ්‍යතාවයට අමතරව බැංකුව විසින් අතිරේක මණ්ඩල අනු කමිටු හතරක් පිහිටුවා ඇත, මෙම කමිටුවල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනගැනීම සහ සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට ඉදිරිපත් කර සභාගත කෙරේ. 2024 වාර්ෂික වාර්තාවේ 243 සිට 250 දක්වා පිටුවල එහි රාජකාරි, කාර්යභාරය සහ කාර්ය සාධනය පිළිබඳ සාරාංශයක් ඇතුලත් එක් එක් මණ්ඩල අනු කමිටුවල තනි පුද්ගල වාර්තා අනාවරණය කර ඇත.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
3.(6) (ii)	**විගණන කමිටුව**		
(a)	සභාපතිවරයා ගිණුම්කරණය සහ/හෝ විගණනය තුළ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වීම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහය සාමාජිකයෙකු වන ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස දුෂ්මන්ත තොටවත්ත මහතා පත් කර ඇත. තොටවත්ත මහතා 2024 නොවැම්බර් 28 දින ඉල්ලා අස්විය.	2024 නොවැම්බර් 28 දක්වා අනුකූල විය
(b)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත කමිටුව	විශාකා අමරසේකර මෙනවිය සහ ඒ එම් පී එම් බී අතපත්තු මහතා නම් කර ඇති විධායක නොවන අධ්‍යක්ෂවරුන් කමිටුවේ සාමාජිකයින් වෙති.	2024 නොවැම්බර් 28 දක්වා අනුකූල විය
(c)	**විගණන කමිටුවේ කාර්යයන්**		
	(i) අදාළ ව්‍යවස්ථාවන්ට අනුකූලව සැපයිය යුතු විගණන සේවා සඳහා බාහිර විගණකවරයා පත් කිරීම;	රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. එබැවින් බාහිර විගණකවරයාගේ සහභාගිත්වය තුළ ඉටුකිරීමට කමිටුවට කාර්යභාරයක් නොමැත	අනුකූල විය
	(ii) විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම;	විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් කමිටුව නිර්දේශ ඉදිරිපත් කර ඇත.	අනුකූල විය
	(iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් යොදාගැනීම; සහ	කමිටුව විසින් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අවශ්‍ය විටදී සමාලෝචනය කර සාකච්ඡා කර ඇත.	අනුකූල විය
	(iv) සේවා කාලය, විගණන ගාස්තුව සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහ කිරීම	රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ.	අනුකූල විය
(d)	සේවා කාලය, විගණන ගාස්තුව සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහ කිරීම	විගණකාධිපති බැංකුවේ විගණකවන බැවින් මෙය අදාළ නොවේ.	අනුකූල විය
(e)	බාහිර විගණකගේ විගණන නොවන කාර්යයන් සඳහා වෙන් කිරීම	විගණකාධිපති බැංකුවේ විගණකවන බැවින් මෙය අදාළ නොවේ	අනුකූල විය
(f)	විගණනයේ විෂය පථය තීරණය කිරීම	විගණන කමිටු රැස්වීමේදී විගණනය ආරම්භ වීමට පෙර කමිටුව විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව බාහිර විගණකවරුන් සමඟ විගණනයේ ස්වභාවය සහ විෂයපථය සාකච්ඡා කර අවසන් කර ඇත.	අනුකූල විය
(g)	බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය	ත්‍රෛමාසික හා වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ හෙළිදරව් කිරීම් සඳහා සකස් කරන ලද වාර්තා මූල්‍ය ප්‍රධානියා විසින් කමිටුව වෙත ඉදිරිපත් කරන විට බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක් කමිටුවට ඇත. මූල්‍ය ප්‍රධානියා විසින් 2024 වර්ෂය සඳහා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ ප්‍රධාන මූල්‍ය අනුපාත සහ උපකරණ පුවරුව ඉදිරිපත් කර ඇත.අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා කමිටුව විසින් එය නිර්දේශ කර ඇත.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
(h)	අතුරු සහ අවසන් විගණන පිළිබඳ බාහිර විගණක සමඟ සාකච්ඡාව	කමිටුව 2024 සැප්තැම්බර් 02 දින විගණකාධිපතිගේ නියෝජිතයින් සමඟ රහසිගත සාකච්ඡාවක් පවත්වා ඇත.	අනුකූල විය
(i)	කළමනාකරණ ලිපිය සහ බැංකුවේ ප්‍රතිචාරය සමාලෝචනය කිරීම	විගණන කමිටුව විසින් කළමනාකරණ ලිපිය සහ එහි ප්‍රතිචාර සහ 2022 වසර සඳහා සමාලෝචනය කර ඇත.	
(j)	**අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳ සමාලෝචනය**		
	(i) අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය, කාර්යයන්හි ප්‍රමාණවත්භාවය සහ එහි කාර්යය ඉටු කිරීමට අවශ්‍ය බලය පිළිබඳ සෑහීමකට පත්වීම	විගණන සැලැස්ම සමඟ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය සහ කාර්යයන් කමිටුව විසින් සාකච්ඡා කර ඇත. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සාමාලෝචනය කර නිර්දේශ කර ඇත. කමිටුවේ අනුමැතිය සඳහා අලුතින් යෝජිත සමාලෝචන සහ විමර්ශන කණ්ඩායම පිහිටුවීම සඳහා විවේකගත් කාර්ය මණ්ඩලය හැර 2024/25 වසර සඳහා තක්සේරු කරන ලද යෝජිත සේවක සංඛ්‍යාව කමිටුව විසින් මණ්ඩලයට නිර්දේශ කර ඇත.	අනුකූල විය
	(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල	CIA විසින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත 2024 විගණන සැලැස්ම ඉදිරිපත් කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණනයේ විෂය පථය පිළිබඳව සාකච්ඡා කර ඇත. කළමනාකරණ ලිපිය වන මහබැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ ආදිය මගින් ඉස්මතු කර ඇති ගැටළු පවතින ශාඛා පිළිබඳ ප්‍රධාන නිර්දේශ නිරීක්ෂණය කර ඇත. කමිටුව විසින් BAC හි අනුමැතිය සඳහා 2024 වසර සඳහා යෝජිත විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී. විගණන සැලැස්ම සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය කමිටුව විසින් නිරන්තරව අධීක්ෂණය නියාමනය කර ඇත. වසර තුළ පැවති සිය රැස්වීම්වලදී අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල කමිටුව සමාලෝචනය කර ඇත. තොරතුරු තාක්ෂණය, සැපයුම්, අනුකූලතාව, ණය පාලනය, අවදානම් කළමනාකරණය, භාණ්ඩාගාර පසු කාර්යාලය වැනි දෙපාර්තමේන්තුවල විගණන වාර්තා, රූප ග්‍රහණය කර ඉදිරිපත් කිරීම පිළිබඳ තොරතුරු පද්ධති විගණනය, මහජන කාඩ්පත් මධ්‍යස්ථානය, ෆිනකල් භාණ්ඩාගාර පද්ධතිය - 2022 ආදිය වේ.	අනුකූල විය
	(iii) අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම	අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම කමිටුව විසින් සමාලෝචනය කර ඇත.	අනුකූල විය
	(iv) ප්‍රධානියා, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ බාහිරින් ලබාගත් සේවා සපයන්නන්ගේ ඕනෑම පත්වීමක් හෝ අවසන් කිරීමක් නිර්දේශ කිරීම.	2024 වර්ෂය තුළ ප්‍රධානියා, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් පත්කිරීමක් හෝ අවසන් කිරීමක් නොමැත.	අනුකූල විය
	(v) ප්‍රධාන අභ්‍යන්තර විගණන සහ බාහිරින් ලබාගත් සේවා සපයන්නන් ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් කමිටුව විසින් ඇගයීමට ලක් කරනු ලබන අතර, ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිරින් සේවා සපයන්නන්ට ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීම	2024 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා/ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ ඉල්ලා අස්වීම් නොමැත.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
	(vi) අභ්‍යන්තර විගණන අංශය එහි විගණන කටයුතු වලින් ස්වාධීන වන අතර එය අපක්ෂපාතීව, කාර්යක්ෂමව සහ නිසි වෘත්තීය ආරක්ෂාව සහිතව කටයුතු කරයි.	බැංකුවේ අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ විධිවිධානවලට අදාළව අභ්‍යන්තර විගණන කටයුතුවල ස්වාධීනත්වය අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අපක්ෂපාතීව, ප්‍රවීණතාවයෙන් සහ නිසි වෘත්තීය රැකවරණයෙන් යුතුව කටයුතු කරයි.	අනුකූල විය
(k)	අභ්‍යන්තර විමර්ශන	කමිටුව අභ්‍යන්තර විමර්ශනවල ප්‍රධාන සොයාගැනීම් සහ ඒ සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සලකා බලයි.	අනුකූල විය
(l)	විගණන කමිටු රැස්වීම්වලට සහභාගිවන්නන්	මහජන බැංකුවේ විධායක අධ්‍යක්ෂවරුන් නොමැති බැවින් මෙය අදාළ නොවේ.	අනුකූල විය
(m)	ප්‍රකාශිත අධිකාරී බලය, සම්පත් සහ තොරතුරු වෙත ප්‍රවේශය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික පාලනයේ මනා පරිචයන් සංග්‍රහය 1.3 වගන්තිය 6.1.7 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අයිතීන් පිළිබඳව සාකච්ඡා කරන අතර කමිටුවට එවැනි අධිකාරිත්වයක් ඇති බව සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ක්‍රියාත්මක යොමු නිර්දේශ විසින් මෙය සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.	අනුකූල විය
(n)	නීතිපතා රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් 2024 වර්ෂය තුළ රැස්වීම් දහහතරක් (14) ක් පවත්වා ඇති අතර එම රැස්වීම්වල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පවත්වාගෙන යනු ලැබේ.	අනුකූල විය
(o)	වාර්ෂික වාර්තාවේ අනාවරණය	2024 වාර්ෂික වාර්තාවේ 243 පිටුවේ ප්‍රකාශයට පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ වාර්තාවේ විගණන කමිටු කටයුතු පිළිබඳ විස්තර අනාවරණය කර ඇත. රැස්වීම් සංඛ්‍යාව සහ එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම 2024 වාර්ෂික වාර්තාවේ 220 පිටුවේ අනාවරණය කර ඇත.	අනුකූල විය
(p)	රැස්වීම්වල වාර්තා පවත්වා ගැනීම	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පත් කර ඇති අතර, රැස්වීම් පිළිබඳ සවිස්තර වාර්තා තබා ගනී.	අනුකූල විය
(q)	තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය සහ බාහිර විගණක සමඟ සම්බන්ධතාව	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන අතර, එය කාර්ය මණ්ඩලය වෙත දන්වා ඇත. විගණන කමිටුව විසින් සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.	අනුකූල විය
3.(6) (iii) මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු **GRI 2-19, 20**			
(a)	බැංකුවේ අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට අදාල පාරිශ්‍රමික ප්‍රතිපත්තිය	අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමිකය තීරණය වන්නේ මුදල් අමාත්‍යාංශය විසින් සකසන ලද මාර්ගෝපදේශ මගිනි. ප්‍රධාන කළමනාකරණ පිරිස්වල පාරිශ්‍රමිකය සාමූහික ගිවිසුම මත පදනම් වී තීරණය කෙරේ. 2024 – 2025 සාමූහික ගිවිසුම ක්‍රියාත්මකව පවතින අතර, වන්දි පාරිශ්‍රමික ප්‍රතිපත්තිය තීරණය කිරීම ක්‍රියාත්මක වේ.	අනුකූල විය
(b)	අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී, සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අරමුණු සහ ඉලක්ක සැකසීම.	අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු යටතේ පැවරී ඇති වගකීම් අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අරමුණු සහ ඉලක්ක සකස් කිරීමට කමිටුවට සිදුවේ. ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමණාකරණ කාර්ය මණ්ඩලයට අරමුණු සහ ඉලක්ක ලේඛනගත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව ප්‍රධාන කළමණාකරණ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය, කාර්ය සාධක නිර්ණායකවලට අනුකූලව සමාලෝචනය කරයි.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
(c)	ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ කාර්යසාධනය ඇගයීම	බැංකුවේ ආයතනික සහ විධායක කළමනාකාරිත්වය සඳහා නව කාර්යසාධන ඇගයීම් ආකෘතියක් ක්‍රියාත්මක කර ඇත. 2023 වසර සඳහා නියමිත ඉලක්කවලට සාපේක්ෂව ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ප්‍රධාන කළමනාකාරිත්වයේ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් කමිටුව විසින් සලකා බලා ඇත.	අනුකූල විය
(d)	ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන විට හැර, කමිටුවේ සියලුම රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරියා පැමිණ සිටිය යුතුය.	ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන අවස්ථාව හැර, කමිටුවේ සියලුම රැස්වීම්වලදී ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහභාගී වී ඇත.	අනුකූල විය
3.(6) (iv) නාමයෝජනා කමිටුව			
(a)	අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය පත් කිරීම	මහජන බැංකු පනතේ විධිවිධාන අනුව විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබේ. මානව සම්පත් ප්‍රතිපත්තිය (බඳවා ගැනීම්, උසස්වීම්, වැටුප් ගෙවීම, පුහුණු සහ සංවර්ධන සහ අවසන් කිරීමේ ප්‍රතිපත්තිය) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර එය ක්‍රියාත්මකව පවතී.	අනුකූල විය
(b)	අධ්‍යක්ෂවරුන් නැවත තෝරා ගැනීම	මහජන බැංකු පනතේ විධිවිධාන අනුව විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන බැවින් මෙම අවශ්‍යතාවය පැනනගින්නේ නැත.	අනුකූල විය
(c)	ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු ප්‍රධාන කළමනාකාර තනතුරු සඳහා පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමේ නිර්ණායකය	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස සලකනු ලබන ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සහ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ සුදුසුකම් සඳහා අවශ්‍ය ප්‍රධාන ගුණාංග වැනි තෝරීම් නිර්ණායක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන්ගේ රැකියා විස්තරවල ඇතුළත් කර ඇත. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ රැකියා විස්තර 2024 වසර තුළ කමිටුව විසින් සමාලෝචනය කර ඇත. තවද, බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය තෝරා ගැනීම සහ පත්කිරීම සඳහා වන ඇගයීම් නිර්ණායක සඳහා කමිටුව අනුමැතිය ලබා දී ඇත. සියලුම ප්‍රධාන කළමණාකාරිත්ව කාර්ය මණ්ඩලය සඳහා තෝරාගැනීම, නම් කිරීම සඳහා නිර්දේශ කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත නමයෝජනා කමිටුව විසින් සිදුකරයි.	අනුකූල විය
(d)	යෝග්‍ය සහ සුදුසු පුද්ගලයන්	2024 වසර සඳහා වන අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ප්‍රකාශන අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගෙන ඇත.	අනුකූල විය
(e)	අනුප්‍රාප්තික සැලැස්ම සහ නව විශේෂඥතා	අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශය විසිනි. ප්‍රධාන විධායක නිළධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අනුප්‍රාප්තික සැලැස්ම ක්‍රියාත්මක වේ. මීට අමතරව, බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර සාමාන්‍යාධිකාරී ශ්‍රේණිවල තනතුරු දැරූ බොහෝ නිලධාරීන් විශ්‍රාම ගොස් හෝ ඉක්මනින් සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත බැවින් හෝ අපේක්ෂිත කාල රාමුවලට පෙර ඉහළ ශ්‍රේණිවලට උසස්වීම් ලැබීම නිසා බැංකුව නව අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව බැංකුවේ යෝජිත අනුප්‍රාප්තික සැලැස්ම 2023 ඔක්තෝම්බර් සිට 2024 දෙසැම්බර් දක්වා කාලය සඳහා සමාලෝචනය කර ඇති අතර, මහ බැංකුවේ ගැටළු ආමන්ත්‍රණය කරමින් ද එය සකස් කර ඇති බව නිරීක්ෂණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සමාලෝචනය කර නිර්දේශ කර ඇත. මෙම යෝජිත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
(f)	කමිටු සභාපතිවරයා සහ වඩා යහපත් වන පරිදි අධ්‍යක්ෂවරුන්ගෙන් වැඩිදෙනෙක් ස්වාධීනවීම. ප්‍රධාන විධායක නිලධාරි ආරාධිතව රැස්වීම්වලට සහභාගී වේ.	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වන සුජීව රාජපක්ෂ මහතා විසින් කමිටුවේ සභාපතිත්වය දරනු ලබයි. අනෙකුත් සාමාජිකයින් වූයේ මංජුල වෙල්ලාලගේ සහ ඒ එම් පි එම් බී අතපත්තු යන මහත්වරුන්ය. මගපෙන්වීමට අවශ්‍ය පරිදි, ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයක් සමඟ කමිටුව පිහිටුවීම වඩාත් සුදුසුය. ප්‍රධාන විධායක නිලධාරි අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු රැස්වීම්වලට ආරාධනාවකින් සහභාගී වේ	
3. (6) (v)	**ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව**		
(a)	BIRMC හි සංයුතිය	BIRMC හි යොමු නිර්දේශ අනුව, BIRMC හි කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, අවදානම් කළමනාකරණය සහ ආරාධනය මත අනෙකුත් නිලධාරීන්ගෙන්ද (අනුකූලත්වය හාර නිලධාරියා ද ඇතුළුව) සමන්විත වේ.	2024 ඔක්තෝබර් 3 දක්වා අනුකූල විය
(b)	අවදානම් තක්සේරුව	අදාළ අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු හරහා බැංකුවේ ණය, වෙළෙඳපොල, උපායමාර්ගික, මෙහෙයුම් සහ ද්‍රවශීලතා අවදානම් වැනි අවදානම් තක්සේරු කිරීමට ක්‍රියාපටිපාටියක් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙ ක්‍රියාත්මක කර ඇති අතර, එවැනි අවදානම් කාර්තුමය අවදානම් වාර්තා සහ අවදානම් අනුකෘතික වගුව ඔස්සේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, අවදානම් කළමනාකරණය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ **අනුබද්ධ ආයතනවල අවදානම් සමාලෝචනය** බැංකුව එක් එක් අනුබද්ධිත ආයතනයක් සඳහා වෙන වෙනම අවදානම් උපකරණ භාවිතා කරන අතර මෙම අවදානම් උපකරණ පුවරු වලට අවදානම් රුචිය සීමාවන් ඇතුළත් වේ. සෑම කාර්තුවක් සඳහාම අනුබද්ධ සමාගම්වල අවදානම් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර කමිටුව විසින් පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පුද්ගලික සීමිත සමාගම සහ පීපල්ස් ට්‍රැවල්ස් පුද්ගලික සීමිත සමාගම එක් එක් අනුබද්ධිත ආයතනයක අවදානම් මට්ටම් සමාලෝචනය කර සටහන් කර ඇත.	අනුකූල විය
(c)	අවදානම් කළමනාකරණ මට්ටමේ කමිටු සමාලෝචනය	කමිටුව විසින් 2024 ජනවාරි මාසයේදී 2023 වර්ෂය සඳහා කමිටුවේ යොමු නිර්දේශයන් (TOR) අනුව සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය ඇගයීමට ලක් කර ඇත. 2024 වසර සඳහා ඇගයීම අවසන් කර ඇති අතර, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. ණය අවදානම් කළමනාකරණ කමිටුව, මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව, වත්කම් සහ වගකීම් කමිටුව සහ විධායක මෙහෙයුම් කමිටුව දැනට බැංකුවේ ක්‍රියාත්මක වන කළමනාකරණ මට්ටමේ කමිටු වෙති.	අනුකූල විය
(d)	විවක්ෂණ මට්ටම් ඉක්මවන අවදානම් අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග	නිශ්චිත ප්‍රමාණාත්මක සහ විවක්ෂණ මට්ටම්, ගුණාත්මක අවදානම් සීමාවන් ඉක්මවා ගිය අවදානම් දර්ශක කමිටුව විසින් සමාලෝචනය කර සලකා බලා ඇත.	අනුකූල විය
(e)	රැස්වීම් වාර ගණන	2024 මූල්‍ය වසර තුළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් හයක් (06) පවත්වා ඇත.	අනුකූල විය
(f)	නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට හෝ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියා කිරීම	මෙය හසුරුවන්නේ BHRRC නමින් වෙනම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් මගිනි.	අනුකූල විය
(g)	මණ්ඩලය වෙත අවදානම් තක්සේරු වාර්තාව	කමිටුව ඔවුන්ගේ සමාලෝචනය සඳහා අවදානම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
h	අනුකූලතා කාර්යය	නීති, රෙගුලාසි සහ නියාමන මාර්ගෝපදේශ සමඟ බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා කමිටුව අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් පත් කරන ලද අනුකූලතා නිලධාරියා ව්‍යවස්ථාපිත සහ අනිවාර්ය අවශ්‍යතා/රෙගුලාසි සහ අනුකූලතා තත්ත්වය පිළිබඳ මාසික වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයටද සහ අනුකූලතා අවදානම පිළිබඳ කාර්තුමය වාර්තාව BIRMC වෙත ද ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන ව්‍යවස්ථාපිත විභාගයේ දී කරන ලද නිර්දේශවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා, 2024 අනුකූලතා වැඩසටහන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.	අනුකූල විය
3.(7)	**සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු** GRI 2-15		
3.(7) (i)	බැඳියා පිළිගැටුම් වැළැක්වීම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අනුමත කර ඇත. ඉන් සම්බන්ධිත පාර්ශ්වවල වර්ගීකරණ පිළිබඳ කථා කරන අතර ගනුදෙනු අනුකූලව අනුමත කරනු ලබයි. මින් බැංකුවේ ඕනෑම ගනුදෙනුවකින් පැනනැඟිය හැකි බැඳියා පිලිගැටුම් වළක්වා ගැනීමට බැංකුවට හැකියාව ලබා දේ. මෙම ප්‍රතිපත්තිය පසුව 2024 දී මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.	අනුකූල විය
3.(7) (ii)	නියෝගය මගින් ආවරණය වන සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය අනුමත කරන ලද අතර ඉන් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වර්ග හඳුනා ගන්නා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ.	අනුකූල විය
3.(7) (iii)	තහනම් ගනුදෙනු	බැංකුව සමඟ සමාන ආකාරයේ ගනුදෙනුවක් කරගෙන යාමේදී බැංකුවේ වෙනත් ගනුදෙනුකරුවකුට ලබා දීමට අනුමත ප්‍රමාණයට වඩා "වඩාත් හිතවාදී සැලකීමක්" යම් පාර්ශ්වයකට ලැබෙන ආකාරයේ ගනුදෙනුවක බැංකුව නොයෙදෙනෙ බව සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන යම් ක්‍රියාවලියක් බැංකුවට ඇත. අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් ලද ප්‍රකාශන සහ තොරතුරු මත පදනම්ව, බැංකුව ජාතික හැඳුනුම්පත සහ පද්ධතියේ CIF තුළින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනා ගන්නා අතර, කාර්තුමය පදනමක් මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කෙරේ. බැංකුව මගින් සමාන ආකාරයේ ව්‍යාපාර කටයුත්තකදී බැංකුවේ වෙනත් ගනුදෙනුකරුවන් හට පිරිනමනු ලබන සැළකිල්ලට වඩා "වැඩි හිතවාදී සැළකීමක්" සම්බන්ධිත පාර්ශ්වයන් වෙත ලබානොදෙන බවට මේ මගින් තහවුරු කරයි.	අනුකූල විය
3.(7) (iv)	අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙකුට අනුග්‍රහය ලබා දීම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියට මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදනයක් ඇතුළත් වේ. තහවුරු කර ඇති පරිදි, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙකුට හෝ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයෙකුට අනුග්‍රහ පහසුකම් ලබා දී නොමැත.	අනුකූල විය
3.(7) (v)	බැංකුවේ අධ්‍යක්ෂවරුන් ලෙස පසුව පත් කරනු ලබන පුද්ගලයන්ට හෝ පුද්ගලයන්ගේ අවශ්‍යතාවලට හෝ එම පුද්ගලයන්ගේ සමීප ඥාතීන් වෙත දක්වන ලද අනුග්‍රහය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියට මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදනයක් ඇතුළත් වේ. මෙම නියෝගයට අනකූලවීම සඳහා ද බැංකුවට ක්‍රියාත්මක ක්‍රියාවලියක් ඇත.	අනුකූල විය
3.(7) (vi)	බැංකු සේවකයින් හෝ ඔවුන්ගේ සමීප ඥාතීන් වෙත හිතවාදී සැලකිල්ල හෝ අනුග්‍රහය දැක්වීම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියට මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදනයක් ඇතුළත් වේ. මෙම නියෝගයට අනුකූලවීම සඳහා ද බැංකුවට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාවලියක් ඇත. 2024 වර්ෂය තුළ සේවක ණය පහසුකම් වැනි බැංකුවේ සියලුම සේවකයින් ට අදාළ පොදු යෝජනා ක්‍රම හැර හිතකර පදනමක් මත කිසිදු අනුග්‍රහයක් සේවකයින්ට ලබා දී නොමැත. ප්‍රධාන කළමණාකරණ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සමඟ ගනුදෙනු හඳුනාගෙන වාර්තා කිරීමේ ක්‍රියාවලියක් බැංකුව සතුව ඇති අතර, සේවකයාට හෝ සමීප ඥාතියාට සැලකිය යුතු උනන්දුවක් ඇති ඕනෑම සබඳතාවයක් කාර්තුමය පදනමින් ඒකාබද්ධ අවධානම් කළමණාකරණ කමිටුව වෙත ඉදිරිපත් කෙරේ.	අනුකූල විය

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
3.(7) (vii)	මුදල් මණ්ඩලයේ අනුමැතිය යටතේ අනුග්‍රහය දැක්වීම් ප්‍රේෂණ	අදාළ පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියට අනුව, ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. කෙසේවෙතත්, 2024 වසර තුළ එවැනි සිදුවීම් කිසිවක් සිදුවී නොමැත.	අනුකූල විය
3.(8)	**අනාවරණය කිරීම**		
3.(8) (i)	වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම	බැංකුව ඒ අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සිදුකෙරේ. කාර්තුමය මූල්‍ය ප්‍රකාශ සකස් කර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් සකස් කර පුවත්පත්වල මුද්‍රණය කර ප්‍රකාශයට පත් කෙරේ. 2024 1 කාර්තුව – 2024 මැයි 31 ඩේලි එෆ්ටී, දිනාපතා අරුණ, තිනකරන් 2024 2 කාර්තුව – 2024 අගෝස්තු 31 ඩේලි එෆ්ටී, දිනපතා ලංකාදීප, තිනකරන් 2024 3 කාර්තුව – 2024 නොවැම්බර් 29 ඩේලි එෆ්ටී, දිනාපතා අරුණ, තිනකරන් 2024 4 කාර්තුව – 2024 මාර්තු 058 ඩේලි එෆ්ටී, දිනාපතා අරුණ, තිනකරන්	අනුකූල විය
3.(8) (ii)	වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම්		
(a)	වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන නිශ්චිත හෙළිදරව් කිරීම ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඇති බවට ප්‍රකාශයක්.	මේ සඳහා වන ප්‍රකාශය 2024 වාර්ෂික වාර්තාවේ 256 පිටුවේ මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීමෙහි ඇතුළත් වේ.	අනුකූල විය
(b)	බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ මණ්ඩලයේ වාර්තාව	බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව 2024 වාර්ෂික වාර්තාවේ 251 සිට 252 දක්වා පිටුවල "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" තුළ අනාවරණය කර ඇත.	අනුකූල විය
(c)	අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ සඵලතාවය පිළිබඳ බාහිර විගණකගේ සහතිකය	අභ්‍යන්තර පාලන පිළිබඳ විගණකාධිපතිගේ සහතික කිරීමේ වාර්තාව 2024 ඔවුන්ගේ වාර්ෂික වාර්තාවේ 253 සිට 254 දක්වා පිටුවල අනාවරණය කර ඇත	අනුකූල විය
(d)	යෝග්‍යතාවය බැංකුව සමඟ කරන ගනුදෙනු, සහ බැංකුව විසින් ගෙවන ලද මුළු ගාස්තු/වැටුප් ඇතුළු අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු GRI 2-15	අධ්‍යක්ෂවරුන්ගේ විස්තර යටතේ අනාවරණය කර ඇති නම්, සුදුසුකම් සහ පළපුරුද්ද ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර 26 සිට 29 දක්වා පිටුවල දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සටහන 43 යටතේ 361 සිට 365 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර ඇත. 2023 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික හා ඔවුන් සමඟ ගනුදෙනුවල සමස්ත වටිනාකම	අනුකූල විය

	රු.'000
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	7,435.0
රැකියාවෙන් පසු විශ්‍රාම වැටුප්	-
අවසන් කිරීමේ ප්‍රතිලාභ	-
කොටස් පදනම් වූ ගෙවීම්	-
අනෙකුත් දිගු කාලීන ගෙවීම්	-
ණය කාඩ්පත් ඇතුළුව ණය සහ අත්තිකාරම්	1,028.2
තැන්පතු	245,532.3
ආයෝජන	-

අංශය	මූලධර්මය	අනුකූල වීම සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාව
(e)	බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් ප්‍රතිශතයන් ලෙස එක් එක් සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩය වෙත පිරිනමන ලද මුළු අනුග්‍රහය	2024 සම්බන්ධිත පාර්ශ්ව සඳහා පිරිනමන ලද මුළු අනුග්‍රහය රු. '000 / බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් ප්‍රතිශතය අධ්‍යක්ෂවරු: - / - අධ්‍යක්ෂකවරුන්ගේ පවුලේ සමීපතමයන්: - / - ප්‍රධාන කළමණාකරණ කාර්ය මණ්ඩලය: 76,383.0 / 0.1 ප්‍රධාන කළමණාකරණ කාර්ය මණ්ඩලයේ පවුලේ සමීපතමයින්: 9,694.6 / 0.0 පරිපාලිත සමාගම්: 190,272.5 / 0.1 උප පරිපාලිත සමාගම්: 186,046 / 0.1 රජය සහ රජයට සම්බන්ධ ආයතන: 459,310,989 / 375.1 බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙක් හෝ බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකුගේ සමීපතම පවුලේ සාමාජිකයෙක් සමඟ ඇති සැලකියයුතු සම්බන්ධතා: 4,058.2 / 0.0	අනුකූල විය
(f)	KMP සමඟ පාරිශ්‍රමික සහ ගනුදෙනුවල ලද මුළු අනුග්‍රහය	2024 අධ්‍යක්ෂවරුන් සමඟ පාරිශ්‍රමික හා ගනුදෙනුවල සමස්ත වටිනාකම රු. '000 කෙටිකාලීන සේවක ප්‍රතිලාභ: 665,149.6 රැකියාවෙන් පසු විශ්‍රාම වැටුප්: 68,699.5 අවසන් කිරීමේ ප්‍රතිලාභ: - කොටස් පදනම් වූ ගෙවීම්: - අනෙකුත් දිගු කාලීන ප්‍රතිලාභ: - ණය කාඩ්පත් ඇතුළුව ණය සහ අත්තිකාරම්: 98,792.7 තැන්පතු: 463,536.6 ආයෝජන: -	අනුකූල විය
(g)	අනුකූලතාව පිළිබඳ බාහිර විගණකවරුන්ගේ සහතිකය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික යහපාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ සිද්ධිවාචික සොයාගැනීම් වාර්තාව ලබා ගෙන ඇත. විගණකවරුන්ගේ සියලුම සොයාගැනීම් මෙම ආයතනික යහපාලන වාර්තාවේ ඇතුළත් කොට ඇත	අනුකූල විය
(h)	විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති හා අභ්‍යන්තර පාලනයන් වෙත අනුකූලතාව තහවුරු කෙරෙන වාර්තාව	මෙය 2024 වාර්ෂික වාර්තාවේ 256 පිටුවේ මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් තුළ අනාවරණය කර ඇත	අනුකූල විය
(i)	අනුකූල නොවන වාර්තාව	මෙය 79 පිටුවේ නීතිය සහ රෙගුලාසි වලට අනුකූල වීම යටතේ සටහන් කර ඇත.	අනුකූල විය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය, 2007 අංක 11 දරන බැංකු පනතේ විධිවිධානවලට අනුකූලව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) පිහිටුවන ලදී. එහි ක්‍රියාදාමයන් කමිටුවේ ක්‍රියාකාරිත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද ප්‍රඥප්තිය මත පදනම් විය.

2024 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනාගෙන් කමිටුව සමන්විත වේ.

සභාපති

දුෂ්මන්ත තොටවත්ත මහතා (ස්වාධීන)

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරු)

විශාකා අමරසේකර මහත්මිය (ස්වාධීන නොවන)

ඒ එම් පී එම් බී අතපත්තු මහතා (ස්වාධීන නොවන)

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් දෙදෙනෙකු (02) වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි. ප්‍රධාන අභ්‍යන්තර විගණක, මූල්‍ය ප්‍රධානී සහ බාහිර විගණකගේ නියෝජිතයෙකු, එනම් ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී සාමාන්‍යයෙන් රැස්වීම්වලට සහභාගි වේ.

කමිටුවේ ආරාධනය මත අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්/ප්‍රධාන විධායක නිලධාරිට සහ කළමනාකාරිත්වයේ ඕනෑම සාමාජිකයෙකුට ද රැස්වීම්වලට සහභාගී විය හැක.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නිශ්චිතව පහත දැක්වෙන කාර්යභාර්යන් ඉටු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විශේෂයෙන් -

- ව්‍යවස්ථාව මගින් නියම කර ඇති මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ කියාවලිය සමාලෝචනය කරයි.
- අභ්‍යන්තර පාලන පද්ධතිය සහ ව්‍යාපාර අවදානම් කළමනාකරණය පිළිබඳ පරීක්ෂා කරයි.
- බාහිර හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලීන් සමාලෝචනය කරයි.
- විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ, නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා පවතින ක්‍රියා පටිපාටි සමාලෝචනය කරයි.
- තොරතුරු පද්ධති ආරක්ෂාවට සම්බන්ධ ඒවා ඇතුළුව බැංකු මෙහෙයුම්වල විවිධ ක්ෂේත්‍රවල අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අදාළ වන පරිදි ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මෙහෙයුම් අත්පොත් සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරයි.
- ඔවුන්ගේ වාර්ෂික විගණන මෙන්ම සිදු කරන ලද විශේෂ විගණන මත පදනම්ව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කරයි.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව පහත සඳහන් කරුණු සඳහා සහභාගී විය:

(අ) නියාමන අධිකාරීන් විසින් නියම කර ඇති අවශ්‍යතා සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඒවා සකස් කර ඇති බව සහතික කිරීම සඳහා 2024 වර්ෂය (හෝ 2024 ජූනි 31 දිනට) සඳහා බැංකුවේ මූල්‍ය කාර්ය සාධනය කාර්තුමය වශයෙන් සමාලෝචනය කර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී.

(ආ) 2022 පෙබරවාරි 28 සහ 2023 මාර්තු 31 දිනට පැවැත් වූ ඔවුන්ගේ ව්‍යවස්ථාපිත විභාග මත පදනම්ව නිකුත් කරන ලද ඔවුන්ගේ ව්‍යවස්ථාපිත විභාග වාර්තාවේ සහ කෙටුම්පත් වාර්තාව මඟින් මතු කරන ලද ගැටළු සමාලෝචනය කිරීම.

(ඇ) අභ්‍යාන්තර විගණන අංශයේ කාර්ය සාධනය වසර සඳහා අනුමත අභ්‍යන්තර විගණන සැලැස්මේ කාලීන ජයග්‍රහනයන් සහතික කිරීමට නිරන්තර සමාලෝචනය කරන ලදී.

(ඈ) තොරතුරු පද්ධති ක්‍රියා පටිපාටින් සමාලෝචනය කර සුදුසු වෙනස්කම් නිර්දේශ කර ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නියාමනය කරන ලදී

(ඉ) ශාඛා මෙහෙයුම්වල හඳුනාගත් අඩුපාඩු පිළිබඳ මූලික හේතු විශ්ලේෂණය වැනි විශේෂ විගණන වාර්තා සමාලෝචනය කරන ලදී.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් දහ හතරක් (14) පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා සලකා බැලූ අතර, හඳුනාගත් ප්‍රධාන නිවැරදි කිරීම සඳහා අදාළ නිලධාරීන් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග ඇගයීමට ලක් කරන අතරම, ක්‍රියාවලීන්හි අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය ඇගයීමට ලක් කරන ලදී. ගැටළුව මඟහැරවීම සඳහා ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ගයන් නියාමනය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ රැස්වීම්වල වාර්තා දැනගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා මඟින් මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් 2024 වර්ෂය තුළ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් පසු විපරම් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කිරීම සහ ඒවාට අනුකූල වීම සඳහා විගණකාධිපතිවරයාට අවශ්‍ය සියලුම තොරතුරු සහ ලේඛන සැපයීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සහතික කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අදහස වන්නේ ප්‍රමාණවත් පාලනයන් සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය සියලු වැදගත් කරුණු සහිතව සම්පාදනය කරන ලද බවයි.



ශ්‍යාමා විජේකෝන්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

GRI 2-19, 20

සංයුතිය

කමිටුව වසර අවසානයේදී විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් 2කට නොඅඩු සහ 3කට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වන අතර සෑම රැස්වීමකදීම ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා පැමිණ සිටීම අවශ්‍ය වේ.

සභාපති

සුජීව රාජපක්ෂ මහතා (ස්වාධීන) 2024 ඔක්තෝබර් 3 දිනට

මහාචාර්ය නාරද ප්‍රනාන්දු මහතා (ස්වාධීන) 2024 ඔක්තෝබර් 4 දින සිට

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරු)

ඉසුරු බාලපටබැඳි මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 3 දිනට

මංජුල වෙල්ලාලගේ මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 3 දිනට

බ්‍රැඩ්ලි එමර්ෂන් මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 4 දින සිට

ආචාර්ය අයිලාන් කදිර්ගාමර් මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 4 දින සිට

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

ආරාධනය අනුව නිතිපතා සහභාගිවන්නන්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වන අතර, බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධනාව මත රැස්වීම්වලට සහභාගී විය හැකිය

කමිටු ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පරිශ්‍රමික කමිටුවෙහි හි ලේකම්වරයා ලෙස ක්‍රියා කරයි.

රැස්වීම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් දහයක් (10) පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පරිශ්‍රමික කමිටුවෙහි රැස්වීමක් සඳහා ගණපූරණය වන්නේ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාය.

කමිටුවේ කාර්යභාරය

- මානව සම්පත් සහ පාරිශ්‍රමික ප්‍රතිපත්ති සැකසීම සහ මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් උපාය මාර්ග ආරම්භ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පරිශ්‍රමික කමිටුවෙහි වගකීම දරයි.
- බඳවා ගැනීම් සහ වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ තීරණය කිරීමේදී කමිටුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.
- කමිටුව විසින් ආයතනික සහ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයින්ගේ රැකියා ගිවිසුම් සමාලෝචනය කරන අතර ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සඳහා අරමුණු සහ ඉලක්ක සැකසීම.
- වරින් වර සකස් කළ අරමුණු සහ ඉලක්කවලට අනුව ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමණාකරණ කාර්යය මණ්ඩලය කාර්ය සාධනය වරින් වර ඇගයීම සහ පාරිශ්‍රමික සහ ප්‍රතිලාභ සංශෝධනය සඳහා පදනම තීරණය කිරීම

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් බැංකුවේ උපායමාර්ගික අරමුණු සඳහා සියලු මානව සම්පත් සහ පාරිශ්‍රමික විධිවිධානවලට සහාය වීම සහතික කරනු ඇත.



ශ්‍යාමා විජේකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

සංයුතිය

මෙම කමිටුව විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන්, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමණාකරණය) සහ බැංකුවේ වෙනත් නිලධාරීන් ආරාධනය අනුව සහභාගි විය හැකිය.

සභාපති

විශාකා අමරසේකර මහත්මිය (ස්වාධීන නොවන)

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරු)

දුෂ්මන්ත තොටවත්ත මහතා (ස්වාධීන)

ඉසුරු බාලපටබැඳි මහතා (ස්වාධීන නොවන)

ක්ලයිව් ෆොන්සේකා මහතා

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

අනුර පෙරේරා මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමණාකරණය)

ආරාධනය අනුව නිතිපතා සහභාගිවන්නන්

බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධනාව මත රැස්වීම්වලට සහභාගි විය හැක.

කමිටු ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුවෙහි ලේකම් ලෙස කටයුතු කරයි

රැස්වීම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් හයක් (06) පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුවේ රැස්වීමක් සඳහා ගණපූරණය වන්නේ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයායි.

කමිටුවේ කාර්යභාරය

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවදානම් පරාමිති තුළ බැංකුවේ අවදානම් පැතිකඩ සමාලෝචනය කිරීම කමිටුවේ වගකීම වේ.
- සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු භාවිතා කරමින් ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, තොරතුරු තාක්ෂණය සහ උපායමාර්ගික අවදානම් වලට අදාළ සියලුම අවදානම් තක්සේරු කිරීම සඳහා කමිටුව වගකිව යුතුය.
- අවදානම් කළමනාකරණයට අදාළ අනෙකුත් වගකීම් අතර, කමිටුව විසින් ණය, මූල්‍ය, මෙහෙයුම් සහ නෛතික/අනුකූලතාවය සම්බන්ධයෙන් අවදානම් අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම සහ අවදානම් කළමනාකරණය නියාමනය කරයි.
- විශේෂිත අවදානම් විසඳීමට සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීමට ණය කමිටුව සහ වත්කම්-වගකීම් කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණතාව සහ ඵලදායිතාව සමාලෝචනය කිරීම.

අනාගත අවධානය

බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණවත් බව සහ සඵලතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවධානය යොමු කරනු ඇත.



ශ්‍යාමා විජේකෝන්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු වාර්තාව

සංයුතිය

වසර අවසානයේදී කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාගෙන් සමන්විත වේ.

සභාපති

උදේනි සමරරත්න මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 4 දින සිට

බ්‍රැඩ්ලි එමර්සන් මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 4 දින සිට

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරු)

ඉසුරු බාලපටබැඳි මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 3 දිනට

මංජුල වෙල්ලාලගේ මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 3 දිනට

ආචාර්ය අයිලාන් කදිර්ගාමර් මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 4 දින සිට

වසන්ත තිලකරත්න මයා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 4 දින සිට

ක්ලයිව් ෆොන්සේකා මහතා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

ආරාධනය අනුව නිතිපතා සහභාගිවන්නන්

බැංකුවේ වෙනත් ඕනෑම ණය සේවා නිලධාරියෙක් ආරාධනාව මත අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි රැස්වීම්වලට සහභාගී වේ.

කමිටු ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මුල්‍ය වර්ෂය තුළ රැස්වීම් විසි එකක් (21) පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි රැස්වීමක් සඳහා ගණපූරණය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ඇතුළු සාමාජිකයින් තිදෙනෙකි.

කමිටුවේ කාර්යභාරය

- බැංකුවේ ණය කළමනාකරණ ව්‍යුහය අනුමත කිරීම සහ පැවැරුම් මට්ටම ඇතුළුව ණය අනුමත කිරීමේ බලතල ස්ථාපිත කිරීම.
- ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත පවරා ඇති සීමාවන්ට වඩා සියලුම ණය අනුමත කිරීම සහ සුදුසු යැයි සලකන විට අමතර ගිවිසුම්, කොන්දේසි පැනවීම.
- ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත ලබා දී ඇති අධිකාරියට වැඩි එකවර නිරවුල් කිරීම පොළී සහන යෝජනා අනුමත කිරීම.
- ණය සම්බන්ධ පද්ධති ඒවා ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම සහ නියාමනය කිරීම සහ කළඹේ තත්ත්වය ඉහළ නැංවීමට කළඹේ අවදානම් මට්ටම් කළමණාකරණය කිරීම.
- ණය අවදානම පාලනය කිරීමේ විචක්ෂණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව බැංකුවේ ඵලදායී ණය අවදානම් කළමනාකරණය සහතික කිරීමට බැඳී සිටී



ශ්‍යාමා විජේකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

GRI 2-10

සංයුතිය

මෙම කමිටුව 2024 ඔක්තෝම්බර් 3 දිනට විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

සභාපති

සුජීව රාජපක්ෂ මහතා (ස්වාධීන)

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරු)

ඒ එම් පී එම් බී අතපත්තු මහතා (ස්වාධීන නොවන)
2024 ඔක්තෝබර් 3 දිනට

මංජුල වෙල්ලාලගේ මහතා (ස්වාධීන නොවන)
2024 ඔක්තෝබර් 3 දිනට

ආරාධනය අනුව නිතිපතා සහභාගිවන්නන්

ආරාධනය මත ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී රැස්වීම්වලට සහභාගී වේ.

කමිටු ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

රැස්වීම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් දොළහක් (12) පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකු (3) වේ.

කමිටුවේ කාර්යභාරය

- ප්‍රධාන වගකීම වනුයේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමණාකරණ පිරිස් තෝරා ගැනීම/පත්කිරීමේ ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීමයි. ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී තනතුර සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා පත්වීම් හෝ උසස්වීම් සඳහා සුදුසුකම් නිර්ණායක කමිටුව විසින් නියම කරයි
- අමතර/නව ප්‍රවීනයන් සඳහා වන අවශ්‍යතාවය සහ විශ්‍රාම යන ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අනුප්‍රාප්තික විධිවිධාන සලකා බැලීම සඳහා කමිටුව වගකීම දරයි.
- ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු සඳහා උසස්වීම් පත්කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක සැකසීම.

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව බැංකුවේ සම්මත නියෝගයට අනුකූලව ආයතන සහ විධායක කළමණාකාරිත්වයේ සම්මත පත්වීම් සහතික කිරීමට බැඳී සිටී.



ශ්‍යාමා විජේකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු වාර්තාව

සංයුතිය

කමිටුව අවම වශයෙන් මණ්ඩලයේ අධ්‍යක්ෂවරු දෙදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, භාණ්ඩාගාර ප්‍රධානී, සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමණාකරණය) සහ ආරාධනය මත වෙනත් ඕනෑම නිලධාරියෙකුගෙන් සමන්විත වේ.

සභාපති

ඒ එම් පී එම් බී අතපත්තු මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 3 දිනට.

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරු)

විශාකා අමරසේකර මහත්මිය (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 3 දිනට

ඉසුරු බාලපටබැඳි මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 3 දිනට

ක්ලයිව් ෆොන්සේකා මහතා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

අනුර පෙරේරා මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමණාකරණය)

ශමීලා ලොකු කළුගේ මහත්මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාරය, ආයෝජන බැංකුකරණය සහ මූල්‍ය ආයතන)

ආරාධනය අනුව නිතිපතා සහභාගිවන්නන්

බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධනාව මත රැස්වීම්වලට සහභාගි විය හැක.

කමිටු ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුවෙහි ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් තුනක් (03) පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුවෙහි රැස්වීමක් සඳහා ගණපූරණය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ඇතුළු සාමාජිකයින් තිදෙනෙකි.

කමිටුවේ කාර්යභාරය

- බැංකුවේ ආයෝජන බැංකුකරණ ආදර්ශය නිරන්තර සමාලෝචනය.
- IBU හි මෙහෙයුම් පිලිබඳ සමාලෝචනය.
- අනාගත සේවාදායකයින්ගේ නම් නිෂ්කාශනය.
- හවුල් කළමනාකරණ ගැටළු සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම.
- කළමනාකරණ ගාස්තු/ තැරැව්කාර හුවමාරු පදනම අනුමැතිය.
- නව ආයෝජන සහ බැංකු නිෂ්පාදන ඇතුළත් කිරීම් සහ හඳුන්වාදීම් පිලිබඳ සමාලෝචනය.

අනාගත අවධානය

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව බැංකුව සඳහා ඵලදායී ආයෝජන සහතික කිරීමට අවදානය යොමු කරනු ඇත.



ශ්‍යාමා විජේකෝන්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටු වාර්තාව

සංයුතිය

කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන්, ප්‍රධාන තොරතුරු නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ දෙපාර්තමේන්තුව) ගෙන් සමන්විත වේ.

කමිටු සාමාජිකයන් පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

සභාපති

දුෂාන් සෝසා මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 4 දිනට.

මහාචාර්ය නාරද ප්‍රනාන්දු මහතා (ස්වාධීන)
2024 ඔක්තෝබර් 4 දින සිට.

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරු)

ඉසුරු බාලපටබැඳි මහතා (ස්වාධීන නොවන)
2024 ඔක්තෝබර් 3 දිනට

උදේනි සමරරත්න මහතා (ස්වාධීන නොවන)
2024 ඔක්තෝබර් 3 දිනට

ආචාර්ය අයිලාන් කදිර්ගාමර් මහතා (ස්වාධීන නොවන)
2024 ඔක්තෝබර් 4 දින සිට

ධම්මික දසා මහතා – ප්‍රධාන තොරතුරු නිලධාරී

එන් ඩී පතිරණගේ මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ශාඛා කළමනාකරණ දෙපාර්තමේන්තුව)

ආරාධනය අනුව නිතිපතා සහභාගිවන්නන්

වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධනය මත රැස්වීමට සහභාගී විය හැකිය.

කමිටු ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුවෙහි ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් හයක් (06) පැවැත්විණි.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුවෙහි රැස්වීමක් සඳහා ගණපූරණය ප්‍රධාන තොරතුරු නිලධාරී ඇතුළු සාමාජිකයන් තිදෙනෙකු වේ.

කමිටුවේ කාර්යභාරය

කමිටුව පහත කාර්යයන් ඉටුකිරීමට සවිගන්වා ඇත.

- තොරතුරු තාක්ෂණයේ සමස්ත ප්‍රගතිය සමාලෝචනය
- අරමුදල්, කාර්යමණ්ඩල සහ උපකරණ අනුව තොරතුරු තාක්ෂණ සම්පත්වල ප්‍රමාණාත්මක සහ වෙන් කිරීම් නිර්දේශ කිරීම.
- බැංකු අතර තොරතුරු තාක්ෂණ උපාය මාර්ග, ආයෝජන සහ ව්‍යාපෘති සඳහා තොරතුරු තාක්ෂණ මගින් ගනු ලබන මූලපිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.
- තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති සහ තොරතුරු තාක්ෂණය විසින් ආරම්භ කළ අරමුදල් ප්‍රමුඛතා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.

අනාගත අවධානය

තොරතුරු තාක්ෂණ සේවා සහ මෙහෙයුම් බැංකුවේ උපාය මාර්ග සමග පෙළගැසී ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව සහතික කරනු ඇත.



ශ්‍යාමා විජේකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ගික සැලසුම් සමාලෝචන කමිටු වාර්තාව

සංයුතිය

මෙම කමිටුව වසර අවසානයේදී සභාපති, විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරුන්ගෙන් සමන්විත වේ.

සභාපති

සුජීව රාජපක්ෂ මහතා (ස්වාධීන) 2024 ඔක්තෝබර් 3 දිනට.

මහාචාර්ය නාරද ප්‍රනාන්දු මහතා (ස්වාධීන) 2024 ඔක්තෝබර් 4 දින සිට.

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරු)

දුෂාන් සෝසා මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 4 දිනට.

විශාකා අමරසේකර මහත්මිය (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 3 දිනට.

බ්‍රැඩ්ලි එමර්සන් මහතා (ස්වාධීන නොවන) 2024 ඔක්තෝබර් 4 දින සිට.

ක්ලයිව් ෆොන්සේකා මහතා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී.

ආරාධනය අනුව නිතිපතා සහභාගිවන්නන්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උපායමාර්ගික සැලසුම්, කාර්ය සාධන කළමනාකරණය සහ පර්යේෂණ) සහ බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධනාවකින් රැස්වීම්වලට සහභාගී විය හැක.

කමිටු ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුවෙහි හි ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් හතරක් (04) පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මාණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුවෙහි රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකු (03) වේ.

කමිටුවේ කාර්යභාරය

- උපාය මාර්ගික සැලසුම් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී මතු කරන ලද සහ සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු සමාලෝචනය කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- නිර්දේශ මත පදනම්ව ප්‍රතිපත්ති සකස් කිරීම.
- උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය සඳහා මගපෙන්වීම සහ මෙහෙය වීම ලබා දීම.

අනාගත අවධානය

බැංකුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසනීය වගකීම ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමට අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව අවධානය යොමු කරනු ඇත.



ශ්‍යාමා විජේකෝන්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2024 දෙසැම්බර් 31

මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

වගකීම

2007 අංක 11 දරන බැංකු පනතේ උපදෙස් අනුව, 3(8) (ii) (b) වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහජන බැංකුවේ ("බැංකුව") මූල්‍ය වාර්තාකරණය ආශ්‍රිත අභ්‍යන්තර පාලනයන් පිළිබඳ මෙම වාර්තාව ඉදිරිපත් කරයි. තවද, 2025 ජනවාරි 1 දින සිට බලාත්මක 2024 අංක 05 දරන බැංකු පනත් නියෝගයේ 9.2 (b) වගන්තියෙහි සමාන ප්‍රතිපාදන ස්ථාපිත කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") බැංකුවේ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත් බව සහ සඵලතාවය පිළිබඳ වගකීම දරයි. එවැනි ප්‍රමාණාත්මකභාවය සහ සඵලතාවය සලකා බැලීමේ දී, බැංකු ව්‍යාපාරයේදී කළමනාකරණය කරන ලද පදනමක් මත ප්‍රතිලාභ හා අවදානම සමඟ සමතුලිත වීම අවශ්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලය හඳුනාගෙන ඇති අතර, එම නිසා ප්‍රතිලාභ සහ අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් සැලසුම් කර ඇත්තේ බැංකුවේ අවදානම් රුචිය ඇතුළත් සීමාවන් සහ දර්ශකවලින් යම් අපගමනයක් ඉස්මතු කිරීමේ අරමුණින්ය.

ඉහත සඳහන් කරුණු අනුව, අභ්‍යන්තර පාලන පද්ධතියට සැපයිය හැක්කේ මූල්‍ය තොරතුරු සහ වාර්තාවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයට අනුව හෝ මූල්‍ය අලාභ හෝ වංචාවලට එරෙහිව සාධාරණ සහතිකයක් මිස පූර්ණ සහතිකයක් නොවේ.

බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති අතර, මෙම ක්‍රියාවලියට ව්‍යාපාරික පරිසරයේ හෝ නියාමන මාර්ගෝපදේශවල වෙනස්කම් ඇති විට සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශය" අනුව මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතිපතා සමාලෝචනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම මාර්ගෝපදේශයෙහි දක්වා ඇති පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීමේ මූලධර්ම සැලකිල්ලට ගනිමින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය තක්සේරු කර ඇති අතර, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා දීමට ප්‍රමාණවත් වන අතර බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

මුහුණ දෙන අවදානම් හඳුනාගෙන තක්සේරු කිරීමෙන් අවදානම් සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමේදී සහ මෙම අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම සඳහා කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකසුම සහ කාර්යක්ෂමතාවය සමාලෝචනය කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය සහ අඛණ්ඩතාව සමාලෝචනය කිරීමේදී ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රියාවලීන් අතරට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල සඵලතාවය සහතික කිරීමට සහ බැංකුවේ මෙහෙයුම් ආයතනික අරමුණු, උපාය මාර්ග සහ වාර්ෂික අයවැය මෙන්ම අනුමත කර ඇති ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික උපදෙස්වලට අනුකූල වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවීම.
- බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව නියැදි සහ භ්‍රමණයවන ක්‍රියාපටිපාටි භාවිතයෙන් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය අඛණ්ඩ පදනමක් මත පරීක්ෂා කරන අතර, කිසියම් නොගැලපීම් සම්බන්ධයෙන් සැලකිය යුතු සොයාගැනීම් ඉස්මතු කරයි. ස්වාධීන හා විෂයමූලික වාර්තාවක් සැපයීම සඳහා ඇගයීමට ලක්වන අවදානමෙහි මට්ටම අනුව වාර ගණන තීරණය කරමින් සියලුම චකකයන් සහ ශාඛාවන් ආශ්‍රිතව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකරේ. වාර්ෂික විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලැබේ. අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විවිධ ක්‍රමවේද යොදා ගනිමින් අභ්‍යන්තර මෙන්ම බාහිර විගණනය සිදු කරනු ලබයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සොයාගැනීම් ඔවුන්ගේ වාරික රැස්වීම්වලදී සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත ඉදිරිපත් කරනු ලැබේ.

- බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, බාහිර විගණකවරුන්, නියාමන අධිකාරීන් සහ කළමනාකාරිත්වය විසින් හඳුනාගත් අභ්‍යන්තර පාලන ගැටළු සමාලෝචනය කරන අතර, අවදානම් කළමනාකරණයේ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සහ සඵලතාවය ඇගයීමට ලක් කරයි. ඔවුන් විගණන විෂය පථය සහ ඒවායේ ගුණාත්මකභාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අභ්‍යන්තර විගණන කාර්යයන් ද සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව රැස්වීම්වල කාලීන පදනමක් මත බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වලට සභාගත කෙරේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදු කරන ලද කටයුතු පිළිබඳ විස්තර 243 පිටුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත.
- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය තක්සේරු කිරීමේදී, බැංකුවේ හඳුනාගත් නිලධාරීන් විසින් සැලකිය යුතු ගිණුම් සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සමඟ සම්බන්ධ වූ සියලුම ක්‍රියා පටිපාටි සහ පාලනයන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රියා පටිපාටි සහ පාලනයන්හි සැලසුම්වල යෝග්‍යතාවය සහ සඵලතාවය ඉදිරියට යන පදනමක් මත අඛණ්ඩව තහවුරු කරන ලදී.
- LKAS සහ SLFRS අතුළත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීමේදී, ණය සහ අත්තිකාරම්, ක්‍රෙඩිට් කාඩ් මෙහෙයුම්, කළමනාකරණය පිළිබඳ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කරන අතරම, හදුනාගැනීම මිණුම්කරණය, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වන ක්‍රියාවලීන්හි ප්‍රගතිශීලී වැඩිදියුණු කිරීම් සිදු කෙරේ. අවදානම් කළමනාකරණය සහ සම්බන්ධිත පාර්ශ්වයන් සම්බන්ධ තොරතුරු පද්ධතිය සහ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්. සම්බන්ධ ක්‍රියාවලින් තවදුරට ශක්තිමත් කිරීම සිදුකරේ. මෙම ඇගයුම් සඳහා බැංකුවේ පරිපාලනයන් ඇතුලත් නොකරන ලදී.
- 2018 වසරේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - SLFRS 9 (මූල්‍ය උපකරණ) හි අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය පියවර ගන්නා ලදී. අවශ්‍ය ආකෘති ක්‍රියාත්මක කර ඇති අතර ක්‍රියාවලි සහ පාලන සැලසුම් කරන ලදි. අවශ්‍ය මාදිලි ක්‍රියාත්මක කරන ලද අතර, ක්‍රියාවලි හා පාලනයන් සැලසම් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකරණ තොරතුරු පද්ධතිය මත ක්‍රියාවලි හා පාලනයන් සහ SLFRS 9 ට අනුකූළ වලංගුතාව සහ අනුකූලතාව සඳහා අවශ්‍ය වාර්තා අඛණ්ඩව ශක්තිමත් කරනු ලැබේ.
- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සමස්ත ශාඛා ජාලයම ආවරණය වන පරිදි පරිගණක ආශ්‍රිත විගණන ශිල්පීය ක්‍රම/මෙවලම් භාවිතයෙන් බැංකුවේ තෝරාගත් ඇතැම් ක්‍රියාවලීන් පිළිබඳ දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් සියලුම වැදගත් සොයාගැනීම් ඔවුන්ගේ කාලීන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

2024 මූල්‍ය වර්ෂය තුළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් සැලකිල්ලට ගත් අතර ඒවා සුදුසු ස්ථානවලට ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත.

තහවුරු කිරීම

ඉහත දක්වන ලද ක්‍රියාවලින් මත පදනම්ව, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය ක්‍රමය තුළින් මූල්‍ය වාර්තාකරණය පිලිබඳ විශ්වාසනියත්වය සහ බාහිර අරමුණු වෙනුවෙන් පිලියෙල කරුණු ලබන මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනය අවශ්‍යතාවලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ලබාදීමට සැලසුම් කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනුවෙන්.



ජයන්ත තිලකරත්න
අධ්‍යක්ෂ



නාරද ප්‍රනාන්දු
සභාපති

2025 මාර්තු 5

අභ්‍යන්තර පාලන පිළිබඳ විගණකාධිපතිගේ සහතික වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/D/PB/IC/2024
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 19 March 2025

සභාපති

මහජන බැංකුව

මහජන බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදෙන සහතික කිරීමේ වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ ඇතුළත් මහජන බැංකුවේ (“බැංකුව”) අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශයේ (“ප්‍රකාශය”) ඇතුළත් මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය පිළිබඳ තහවුරුවකි.

කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් 2007 අංක 11 දරන බැංකු පනත් විධානයේ 3 (8) (ii) (b) වගන්තියට අනුකූලව නිකුත් කරන ලද “අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශ” ප්‍රකාරව ප්‍රකාශනය පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය වගකීමට බැඳී සිටී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 3050 ට (සංශෝධිත) මාගේ වගකීම සහ අනුකූලතාව

මාගේ වගකීම් වන්නේ අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් සඳහා පිළියෙල කරන ලද ලේඛනගත කිරීම මගින් ප්‍රකාශනය සනාථ වන්නේ ද සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් උපයෝගී කරගෙන ඇති ක්‍රියාවලිය එමගින් උචිත පරිදි පිළිබිඹු වන්නේ ද යන කරුණු තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධයෙන් බැංකුව සඳහා වන තහවුරු වාර්තාව තහවුරු කිරීමේ කාර්යයන් පිළිබඳ සහතික කිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතියට (SLSAE) 3050 (සංශෝධිත) අනුකූලව මම මගේ කාර්යය සිදු කළෙමි. කලමනාකාරිත්වය සියලුම වැදගත් අංශයන් හි අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය සකස් කර ඇතිද යන්න පිළිබඳ සීමිත සහතිකයක් ලබාගැනීමට මා විසින් ක්‍රියාපටිපාටි සැලසුම්කර ඉටුකළයුතු බව මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය වේ. මෙම සහභාගිත්වයේ අරමුණ සඳහා, යම් වාර්තා යාවත් කිරීම හෝ නැවත නිකුත් කිරීම මෙන්ම මෙම සහභාගිත්වය තුළ, මූල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සඳහා මා වගකීමට බැඳී නොමැත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඉටු කරන ලද කාර්යයේ සාරාංශය

මාගේ කාර්යය සිදුකරනු ලැබ ඇත්තේ අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් සඳහා පිළියෙල කරන ලද ලේඛනගත කිරීම මගින් ප්‍රකාශනය සනාථ වන්නේ ද සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් උපයෝගී කරගෙන ඇති ක්‍රියාවලිය එමගින් උචිත පරිදි පිළිබිඹු වන්නේ ද යන කරුණු තක්සේරු කිරීම සඳහාය.

ඉටු කරන ලද ක්‍රියාපටිපාටීන්, නියැඳි පදනම මත ලබාගත් බැංකු කාර්ය මණ්ඩල විමසීම් හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගනු ලැබූ ක්‍රියාවලීන් සඳහා උපකාරී වන ලිපි ලේඛනවල පැවත්ම මත මූලික වශයෙන් සීමා වේ.

ප්‍රකාශනයෙන් සියළුම අවදානම් හා පාලනයන් අනාවරණය වන්නේදැයි මවිසින් සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් සහ පාලන ක්‍රියාපටිපාටිය පිළිබඳ මතයක් පළකිරීම හෝ SLSAE 3050(සංශෝධිත) අනුව අවශ්‍ය නොවේ. එසේම වාර්ෂික වාර්තාවේ අනාවරණය වන කිසියම් සැලකිය යුතු ගැටළුවල වැදගත් අභ්‍යන්තර පාලන පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විස්තර කරනු ලබන ක්‍රියාවලීන්ගෙන් සත්‍ය වශයෙන්ම ගැටළුවලට පිළියම් යෙදෙන්නේ ද යන්න මා විසින් සලකා බැලීමත් SLSAE 3050 (සංශෝධිත) අනුව අවශ්‍ය නොවේ.

ප්‍රකාශනය සකස් කර ඇති සිදුවීම් හෝ ගනුදෙනුව සම්බන්ධයෙන් බංකුවේ ස්වභාවය පිළිබඳ මගේ අවබෝධය සම්බන්ධයෙන් මගේ විනිශ්චය තෝරාගත් ක්‍රියාපටිපාටිය මත රැඳී පවතී. මම ලබාගත් සාක්ෂි මාගේ නිගමනය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

නිගමනය

අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටි පදනම් කරගෙන, වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශනය, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා ඵලදායීත්වය සමාලෝචනයෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය අනුගමනය කර ඇති ක්‍රියාවලිය සම්බන්ධයෙන් මගේ අවබෝධයට අනුකූල නොවන බවට විශ්වාස කිරීමට හේතු කිසිවක් අපගේ අවධානයට ලක් වී නොමැත.



ඩබ් පී සී වික්‍රමරත්න
විගණකාධිපති



මූල්‍ය වාර්තා

256 මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

257 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

260 ආදායම් ප්‍රකාශය

261 විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

262 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

264 ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය – බැංකුව

266 ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය – සමූහය

268 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

269 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

අධ්‍යක්ෂවරුන්ගේ සහ විගණකවරුන්ගේ වගකීම් පැහැදිලි කිරීම සඳහා මහජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පහත සඳහන් ප්‍රකාශ තුළ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශ

බැංකුව මගින් එහි සියලු ගනුදෙනු සම්බන්ධයෙන් විධිමත්ව ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ අදාළ වර්ෂය තුළ බැංකුවේ ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ ලාභ/අලාභ පිළිබඳ සත්‍ය වූද සාධාරණ වූද අදහසක් ලබාගත හැකි ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කෙරෙන බවට තහවුරු කිරීමේ වගකීම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් පවත්වනු ලබන සමාලෝචන රැස්වීම් සහ විගණන කමිටුව ඔස්සේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ කළමනාකාරිත්වයෙහි වගකීම් අධීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 243 පිටුවෙහි ඉදිරිපත් කොට ඇත. 2024 වර්ෂය වෙනුවෙන් පිටු අංක 260 සිට 394 දක්වා ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී තමන් සාධාරණ වූද විචක්ෂණශීලී වූද විනිශ්චයන් සහ ඇස්තමේන්තු මූලික කර ගනිමින් නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් වීකමිතික පදනමක් මත යොදා ගනු ලැබූ බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසය පළ කරයි.

අඛණ්ඩතා පැවැත්ම

බැංකුවට දැකියහැකි අනාගතයක් සඳහා එහි ව්‍යාපාර කරගෙන යාමට ප්‍රමාණවත් තරම් සම්පත් ඇතැයි යන අදහස සමඟ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අධ්‍යක්ෂවරු අඛණ්ඩතා පැවැත්ම පදනම යොදාගෙන ඇත.

අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කර ඇත. මෙය අභ්‍යන්තර පරීක්ෂාවන්, අභ්‍යන්තර විගණනය සහ නිසි ආකාරයෙන් බැංකු ව්‍යාපාරය කරගෙන යාමට සහ වත්කම් ආරක්ෂා කිරීමට සහ වාර්තාවල නිරවද්‍යතාව සහ විශ්වාසය ආරක්ෂා කිරීමට අවශ්‍ය මූල්‍ය සහ වෙනත් පාලනයන්ගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් පාලනය, අවදානම් රුචි මට්ටම් තීරණය කිරීම, අවදානම් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල ඵලදායිත්වය සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩල වීකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) අවදානම් ආශ්‍රිත රාජකාරි ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවන අතර අවදානම් පාලන ව්‍යූහය, ප්‍රතිපත්ති රාමුව, ප්‍රමිති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම ප්‍රමාණාත්මතාව සහ ඵලදායිතාව සහතික කරමින් අවදානමට අදාළ සියලුම අංශවලට ස්වාධීනව පාලනය ලබා දේ. අධ්‍යක්ෂ මණ්ඩල වීකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව 245 පිටුවේ දැක්වේ. විචක්ෂණ අවශ්‍යතාවයන්, රෙගුලාසි, නීති රීති හා අභ්‍යන්තර පාලන වලට අනුකූලව කටයුතු කරන ලද බවටත් ඕනෑම කරුණක පවතින අනනුකූලතාවය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

විගණන වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව විගණකාධිපති බැංකුවේ විගණකවරයා වන අතර, ඔහු විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සහ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ අවසන් මතය නිකුත් කරන අතර, එය පිළිවෙලින් 251 සහ 252 යන පිටුවල ප්‍රකාශ කර ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකු පනත් නියෝගය සමඟ අනුකූලතා මට්ටම් සහතික කරයි.

අනුකූලතාව

මෙම වාර්තාවේ පිළියෙල කොට ඉදිරිපත් කොට ඇති 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ ඊට අදාළ සංශෝධන සමඟ අනුකූල වේ. බාහිර විගණකවරයාගේ වාර්තාව අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් මගින් විදිනට බැංකුවේ කටයුතුවල තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු කරයි. ඒ අනුව, මෙම ප්‍රකාශය තුළ දක්වා ඇති පරිදි සිය වගකීම් මුදාහැර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.



ශ්‍යාමා විජේකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2025 මාර්තු 25

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAN/B/PB/FA/2024
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 28 February 2025

මහජන බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මහජන බැංකුවේ (“බැංකුව”) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුව සහ එහි පරිපාලිත සමාගම්වල (“සමූහය”) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ සිදු කරන ලදී.

1971 අංක 38 දරන මුදල් පනතේ 5(1) වගන්තිය අනුව මුදල් අමාත්‍යවරයාට පැවරෙන බලතල අනුව 1992 මැයි 14 දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත්කරන ලද නියෝග යක් මගින් එකී පනතේ 11 කොටසේ විධිවිධානවලින් බැංකුව නිදහස් කරනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය කරගෙන යාමට, පොදු ව්‍යවහාරයේ වරලත් ගණකාධිකාරී ආයතනයක් මාහට සහය විය.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත් සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3 බැංකුවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරු, බැංකුවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් සමන්විත වේ. නමුත් මූල්‍ය ප්‍රකාශන සහ මෙම විගණන වාර්තාවේ දිනයට පසු මා වෙත ලබාගැනීමට සැලැස්වීම අපේක්ෂා කරන එහි ඇති මාගේ විගණන වාර්තාව ඇතුළත් නොවේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික කරන අදහසක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබාගැනීමට හැකි අවස්ථාවේදී හඳුනාගනු ලබන තොරතුරු කියවීම වන අතර, එසේ කරමින් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකියයුතු ලෙස නොගැලපේද යන්න සහ විගණනය තුළ හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම සැලකියයුතු ලෙස වැරදියට සඳහන් කර ඇති බව පෙන්නුම් කරන්නේද යන්න සලකා බැලීමයි.

බැංකුවේ 2024 වාර්ෂික වාර්තාව මම කියවීමේදී. එහි වැදගත් අවප්‍රකාශ ඇති බව මම පවසන්නේනම්, නිවැරදි කිරීම සඳහා පාලනය සඳහා වගකියන පුද්ගලයින්ට එම කරුණු දැනුම් දීම අවශ්‍ය වේ. තවදුරටත් වැදගත් නිවැරදි නොකළ අවප්‍රකාශ පවතීනම්, යථා කාලයේදී සභාගත කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථා තුළ විධිවිධානවලට අනුව මගේ වාර්තාවට ඒවා ඇතුළත් කරනු ලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමූහයේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 16 (1) වගන්තිය ප්‍රකාරව, බැංකුව සහ සමූහය විසින් බැංකුවේ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, මා විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තීය සැක මුසු බව පවත්වා ගනු ලැබිය. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන හා තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කර ඉටු කරමින් මගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගතිමි. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, වේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරමි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීමට ලක් කළෙමි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමනයන් මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

- හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර එයට පාදක වූ සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට සමූහය තුළ ආයතන හෝ ව්‍යාපාර කටයුතුවල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණත් සුදුසු සාක්ෂිය ලබා ගතිමි. සමූහ විගණනයේ උපදේශය, අධීක්ෂණය හා කාර්යසාධනය සඳහා මම වගකියමි. මාගේ විගණන මතය සඳහා මම වගකීම තනිවම දරමි.

මාගේ විගණනය තුළදී වෙනත් කරුණු අතර, මා හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ සැලකියයුතු දුර්වලතා ඇතුළුව වැදගත් විගණන සොයාගැනීම් පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂිත විධිවිධාන ඇතුළත්ය.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ විගණන පනතෙහි 6 (1) (අෑ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 1988 අංක 30 දරණ බැංකු පනතේ 39 වගන්තියට (2024 අංක 24 බැංකු පනතින් සංශෝධනය කළ පරිදි) පහත අවශ්‍යතා සඳහා විශේෂ විධිවිධාන ඇතුළත්ය.

2.2.1 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සිදුකරන ලද අනාවරණ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ 2024 අංක 05 දරණ චක්‍රලේඛයේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

2.3 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.3.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව, බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට බැංකුව සම්බන්ධ වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව සඳහන් කිරීම.

2.3.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව සඳහන් කිරීම.

2.3.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව සඳහන් කිරීම.

2.3.4 2018 අංක 19 දරණ විගණන පනතෙහි 12 (උෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, බැංකුවේ සම්පත්, සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව සඳහන් කිරීම.

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව 2024 රු. '000	බැංකුව 2023 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2024 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය වෙනස %
දළ ආදායම	6	367,977,989	422,242,143	-12.9	399,968,041	454,512,039	-12.0
පොලී ආදායම		349,292,146	394,794,898	-11.5	376,974,975	424,517,915	-11.2
පොලී වියදම්		(242,050,205)	(340,473,452)	-28.9	(254,089,257)	(356,735,043)	-28.8
ශුද්ධ පොලී ආදායම	7	107,241,941	54,321,446	97.4	122,885,718	67,782,872	81.3
ගාස්තු හා කොමිස් ආදායම්		14,923,343	13,806,168	8.1	16,074,007	14,822,549	8.4
ගාස්තු හා කොමිස් වියදම්		(757,783)	(964,366)	-21.4%	(757,783)	(964,366)	-21.4
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	8	14,165,560	12,841,802	10.3	15,316,224	13,858,183	10.5
වෙළෙඳ කටයුතුවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	9	853,690	9,430,542	-90.9	1,076,990	9,543,338	-88.7
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	10	2,908,810	4,210,535	-30.9	5,842,069	5,628,237	3.8
මුළු මෙහෙයුම් ආදායම		125,170,001	80,804,325	54.9	145,121,001	96,812,630	49.9
හානිකරණ අලාභයන්	11	(5,450,173)	(7,437,572)	-26.7	(4,426,337)	(6,075,564)	-27.1
ශුද්ධ මෙහෙයුම් ආදායම		119,719,828	73,366,753	63.2	140,694,664	90,737,066	55.1
සේවක මණ්ඩල වියදම්	12	(35,834,826)	(24,493,737)	46.3	(41,787,374)	(30,216,333)	38.3
වෙනත් වියදම්	13	(27,102,997)	(26,209,488)	3.4	(33,940,949)	(32,006,574)	6.0
මූල්‍ය සේවා මත බදු වලට පෙර මෙහෙයුම් ලාභයි		56,782,005	22,663,528	150.5	64,966,341	28,514,159	127.8
මූල්‍ය සේවා මත බදු		(15,198,298)	(7,318,088)	107.7	(17,356,567)	(9,243,859)	87.8
බදු වලට පෙර ලාභය		41,583,707	15,345,440	171.0	47,609,774	19,270,300	147.1
ආදායම් බදු වියදම්	14	(16,495,347)	(5,262,634)	213.4	(18,833,907)	(7,884,639)	138.9
වසර සඳහා ලාභය		25,088,360	10,082,806	148.8	28,775,867	11,385,661	152.7
ලාභය බෙදියන අකාරයෙන්:							
බැංකුවේ කොටස් හිමියන්		25,088,360	10,082,806	148.8	27,558,538	10,513,288	162.1
පාලනයට යටත් නොවන හිමිකම්		-	-		1,217,329	872,373	39.5
		25,088,360	10,082,806	148.8	28,775,867	11,385,661	152.7
ලාභය මත කොටසකට ඉපැයීම්	15						
සාමාන්‍ය කොටසකට මූලික ඉපැයුම් (රු.)	15.1	25,088	10,083	148.8	27,559	10,513	162.1
සාමාන්‍ය කොටසකට තනුක ඉපැයුම් (රු.)	15.2	103	41	148.8	113	43	162.1

පිටු අංක 269 සිට 394 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2024 රු. '000	2023 රු. '000	2024 රු. '000	2023 රු. '000
වසර සඳහා ලාභය	25,088,360	10,082,806	28,775,867	11,385,661
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්)				
ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය නොකරන වෙනත් විස්තීර්ණ ආදායම				
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	268,521	232,367	378,138	278,570
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභ)	(7,693,746)	1,447,423	(7,841,796)	1,441,157
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ලාභ/(අලාභ)වල විලම්බිත බදු බලපෑම	2,308,124	(434,227)	2,351,888	(433,438)
ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණන ලාභය	2,897,780	4,817,014	3,284,652	5,472,322
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය මත විලම්බිත බදු බලපෑම	(869,334)	(1,445,104)	(984,264)	(1,641,696)
	(3,088,655)	4,617,473	(2,811,382)	5,116,915
ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කරනු ලබන වෙනත් විස්තීර්ණ ආදායම				
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ණය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ) (අපේක්ෂිත ණය අලාභ (ECL) ඇතුළුව)	(60,740)	82,477	(134)	425,862
ඉහත කරුණු මත විලම්බිත බදු බලපෑම	-	-	(50,079)	(129,211)
විදේශ මෙහෙයුම් සම්බන්ධ මූල්‍ය ප්‍රකාශ පරිවර්තනය මත ශුද්ධ ලාභ/(අලාභ)	-	-	(512,493)	(695,964)
	(60,740)	82,477	(562,706)	(399,313)
වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු)	(3,149,395)	4,699,950	(3,374,088)	4,717,602
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	21,938,965	14,782,756	25,401,779	16,103,263
ලාභය බෙදියන ආකාරය:				
බැංකුවේ කොටස් හිමියන්	21,938,965	14,782,756	24,433,391	15,476,470
පාලනයට යටත් නොවන හිමිකම්	-	-	968,388	626,793
	21,938,965	14,782,756	25,401,779	16,103,263

පිටු අංක 269 සිට 394 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන්	බැංකුව 2024 රු. '000	බැංකුව 2023 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2024 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය වෙනස %
වත්කම්							
මුදල් හා මුදල් සමාන දෑ	17	71,694,016	61,889,582	15.8	72,398,306	63,307,106	14.4
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවතින ශේෂය	18	33,798,107	31,003,219	9.0	33,798,107	31,003,219	9.0
බැංකුවල ඇති තැන්පතු	19	59,831,807	66,227,025	-9.7	62,005,136	76,872,574	-19.3
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	20	5,842,194	11,259,451	-48.1	5,842,194	11,259,451	-48.1
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට	21	329,810,350	144,184,748	128.7	330,597,382	145,622,457	127.0
මූල්‍ය වත්කම් – ක්‍රමක්ෂය පිරිවැයට							
බැංකුවලට ණය හා අත්තිකාරම්	22	31,994,539	54,022,123	-40.8	37,047,879	54,422,338	-31.9
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	23	1,521,965,020	1,709,457,735	-11.0	1,665,027,784	1,823,770,212	-8.7
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ	24	1,123,490,537	831,747,923	35.1	1,138,634,981	866,704,970	31.4
මූල්‍ය වත්කම් – වෙනත් විස්තීර්ණ ආදායම (OCI) ඔස්සේ සාධාරණ වටිනාකමට							
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	25	2,313,187	1,894,023	22.1	2,668,358	2,123,143	25.7
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ණය උපකරණ	26	7,110,671	8,286,626	-14.2	8,576,912	9,686,213	-11.5
පරිපාලිතයන්හි ආයෝජන	27	5,191,712	4,280,522	21.3	-	-	-
දේපළ, පිරියත හා උපකරණ සහ වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම්	28	61,079,218	56,174,042	8.7	73,034,985	67,280,968	8.6
අස්පෘශ්‍ය වත්කම් සහ කීර්තිනාමය	29	2,586,671	1,763,287	46.7	2,760,806	1,930,788	43.0
වෙනත් වත්කම්	30	41,091,078	56,004,712	-26.6	39,313,104	54,216,717	-27.5
මුළු වත්කම්		3,297,799,107	3,038,195,018	8.5	3,471,705,934	3,208,200,156	8.2

දෙසැම්බර් 31 දිනට	සටහන්	බැංකුව 2024 රු. '000	බැංකුව 2023 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2024 රු. '000	සමූහය 2023 රු. '000	සමූහය වෙනස %
වගකීම්							
බැංකුවලට ගෙවිය යුතු	31	36,840,228	77,224,139	-52.3	46,871,380	85,646,267	-45.3
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	20	168,266	36,049	366.8	168,266	36,049	366.8
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	32	2,854,704,194	2,653,105,546	7.6	2,947,904,673	2,745,161,610	7.4
වෙනත් ණය ගැනීම්	33	75,545,595	64,278,443	17.5	75,482,595	64,223,443	17.5
ප්‍රවර්තන බදු බැරකම්		12,201,098	1,184,853	929.8	12,977,145	2,382,870	444.6
ශුද්ධ විලම්බිත බදු බැරකම්	34	5,627,973	5,029,929	11.9	7,591,958	6,081,598	24.8
වෙනත් බැරකම්	35	76,557,500	30,280,189	152.8	91,692,859	41,877,447	119.0
යටත් කරන ලද කාල ණය	36	54,156,709	46,997,291	15.2	59,065,269	57,806,483	2.2
මුළු වගකීම්		3,115,801,563	2,878,136,439	8.3	3,241,754,145	3,003,215,767	7.9
ස්කන්ධය							
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	37	12,201,998	12,201,998	0.0	12,201,998	12,201,998	0.0
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	38	11,828,689	10,574,271	11.9	11,828,689	10,574,271	11.9
වෙනත් සංචිත	39	68,981,258	42,084,584	63.9	72,407,209	45,407,554	59.5
රඳවාගත් ඉපැයුම්	40	88,985,599	95,197,726	-6.5	118,455,452	122,276,138	-3.1
කොටස්හිමියන්ගේ මුළු හිමිකම්		181,997,544	160,058,579	13.7	214,893,348	190,459,961	12.8
පාලනයට යටත් නොවන හිමිකම්		-	-		15,058,441	14,524,428	3.7
මුළු හිමිකම්		181,997,544	160,058,579	13.7	229,951,789	204,984,389	12.2
මුළු හිමිකම් සහ වගකීම්		3,297,799,107	3,038,195,018	8.5	3,471,705,934	3,208,200,156	8.2
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	41	233,829,736	221,405,708	5.6	250,318,916	228,813,708	9.4
සංදේශ තොරතුරු							
සේවකයින් ගණන		7,633	7,656		10,994	10,528	
ශාඛා ගණන		751	747		862	857	

පිටු අංක 269 සිට 394 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

සහතික කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශ 2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදේ.

අසාමි ඒ අහමත්
මූල්‍ය ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් පහත අත්සන් යොදා ඇත.

නාරද ප්‍රනාන්දු
සභාපති

ජයන්ත තිලකරත්න
අධ්‍යක්ෂ

ක්ලයිව් ෆොන්සේකා
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

2025 පෙබරවාරි 25
කොළඹ

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - බැංකුව

බැංකුව	ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	
	සාමාන්‍ය කොටස් රු. '000	පැවරූ ප්‍රාග්ධනය රු. '000
2023 ජනවාරි1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ)		
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	-	-
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්	-	-
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බදු/ලාභාංශ	-	-
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	-	-
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000
2024 ජනවාරි1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා සම්පූර්ණ විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ)		
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	-	-
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්	-	-
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	-	-
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000

	සංචිත						
	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිත රු. '000	වෙනත් සංචිත රු. '000	FVOCI සංචිතයේ මූල්‍ය වත්කම් රු. '000	විශේෂ සංචිත – ණය ප්‍රතිව්‍යුහගතකරණය රු. '000	රඳවාගත් ඉපයීම් රු. '000	එකතුව රු. '000
	10,070,131	23,995,328	14,141,373	261,129	–	84,624,172	145,294,131
	–	–	–	–	–	10,082,806	10,082,806
		3,371,910		314,844	–	1,013,196	4,699,950
	–	3,371,910	–	314,844	–	11,096,002	14,782,756
	504,140	–	–	–	–	(504,140)	–
	–	–	–	–	–	(18,308)	(18,308)
	504,140	–	–	–		(522,448)	(18,308)
	10,574,271	27,367,238	14,141,373	575,973	–	95,197,726	160,058,579
	10,574,271	27,367,238	14,141,373	575,973	–	95,197,726	160,058,579
	–	–	–	–	–	25,088,360	25,088,360
		2,028,446		207,781	–	(5,385,622)	(3,149,395)
	–	2,028,446	–	207,781	–	19,702,738	21,938,965
	1,254,418	–	–	–	24,660,447	(25,914,865)	–
	1,254,418	–	–	–	24,660,447	(25,914,865)	–
	11,828,689	29,395,684	14,141,373	783,754	24,660,447	88,985,599	181,997,544

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - සමූහය

සමූහය	ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	
	සාමාන්‍ය කොටස් රු. '000	පැවරූ ප්‍රාග්ධනය රු. '000
2023 ජනවාරි1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ)		
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	-	-
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්	-	-
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බදු/ලාභාංශ	-	-
ගෙවූ ලාභාංශ	-	-
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	-	-
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000
2024 ජනවාරි1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා සම්පූර්ණ විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ)		
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	-	-
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්	-	-
ගෙවූ ලාභාංශ	-	-
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	-	-
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000

	සංචිත								
	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිත රු. '000	වෙනත් සංචිත රු. '000	FVOCI මූල්‍ය වත්කම් සඳහා ඇති සංචිත රු. '000	විශේෂ සංචි-ණය ප්‍රතිව්‍යුහගතකරණය රු. '000	රඳවාගත් ඉපයීම් රු. '000	එකතුව රු. '000	පාලනය නොවන අයිතිය රු. '000	මුළු ස්කන්ධය රු. '000
	10,070,131	26,394,593	15,105,588	(47,675)	–	111,277,165	175,001,800	14,329,826	189,331,626
	–	–	–	–	–	10,513,288	10,513,288	872,373	11,385,661
		3,715,947	(271,026)	510,127	–	1,008,133	4,963,181	(245,580)	4,717,601
	–	3,715,947	(271,026)	510,127	–	11,521,421	15,476,469	626,793	16,103,262
	504,140	–	–	–	–	(504,140)	–	–	–
	–	–	–	–	–	(18,308)	(18,308)	–	(18,308)
	–	–	–	–	–	–	–	(432,191)	(432,191)
	504,140	–	–	–	–	(522,448)	(18,308)	(432,191)	(450,499)
	10,574,271	30,110,540	14,834,562	462,452	–	122,276,138	190,459,961	14,524,428	204,984,389
	10,574,271	30,110,540	14,834,562	462,452	–	122,276,138	190,459,961	14,524,428	204,984,389
	–	–	–	–	–	27,558,538	27,558,538	1,217,329	28,775,867
		2,232,403	(191,084)	297,889	–	(5,464,359)	(3,125,151)	(248,940)	(3,374,091)
	–	2,232,403	(191,084)	297,889	–	22,094,179	24,433,387	968,389	25,401,776
	1,254,418	–	–	–	24,660,447	(25,914,865)	–	–	–
	–	–	–	–	–		–	(434,375)	(434,375)
	1,254,418	–	–	–	24,660,447	(25,914,865)	–	(434,375)	(434,375)
	11,828,689	32,342,943	14,643,478	760,341	24,660,447	118,455,452	214,893,348	15,058,441	229,951,789

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2024 රු. '000	2023 රු. '000	2024 රු. '000	2023 රු. '000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්				
බදු පෙර ලාභය	41,583,707	15,345,440	47,609,774	19,270,300
ගැලපීම්				
බදු පෙර ලාභවල ඇතුළත් මුදල් නොවන අයිතම	17,342,187	15,633,544	17,079,218	16,105,045
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	(224,884,629)	(154,797,956)	(247,218,482)	(142,957,207)
මෙහෙයුම් බැරකම්වල වෙනස්වීම්	211,065,897	42,791,955	216,396,257	55,060,162
පරිපාලිත හා වෙනත් ව්‍යාපාර වෙතින් ලද ලාභාංශ ආදායම	(1,360,579)	(2,344,049)	(235,652)	(208,744)
යටත් කරන ලද ණය මත පොලී වියදම	6,115,011	4,520,329	6,827,434	5,602,097
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්/පාරිතෝෂික වෙනුවෙන් දායක මුදල් ගෙවීම	1,243,790	1,642,475	1,437,776	1,816,992
ගෙවන ලද බදු	(3,442,268)	(7,905,547)	(5,411,727)	(10,492,125)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්	47,663,116	(85,113,809)	36,484,598	(55,803,480)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්				
දේපළ පිරියත සහ උපකරණ මිළදී ගැනීම	(5,687,192)	(3,451,107)	(6,741,229)	(4,054,877)
දේපළ පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්	109,926	329,216	162,475	421,071
මූල්‍ය ආයෝජන මිළදී ගැනීම්	(30,788,643)	78,187,817	(10,976,040)	59,016,361
අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිළදී ගැනීම්	(1,559,769)	(681,025)	(1,591,263)	(725,467)
පරිපාලිත සහ වෙනත් ව්‍යාපාරවල ආයෝජන තුළින් ලද ලාභාංශ	1,360,579	2,344,049	235,652	208,744
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතාකළ) ලද ශුද්ධ මුදල	(36,565,099)	76,728,950	(18,910,405)	54,865,832
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ				
යටත් කරන ලද ණය මගින් ලද මුදල	13,515,000	10,000,000	13,515,000	10,000,000
යටත් කරන ලද ණය ආපසු ගෙවීම	(6,563,000)	–	(6,563,000)	(5,295,400)
යටත් කරන ලද ණය මත පොලී ගෙවීම්	(5,907,592)	(4,126,505)	(12,520,648)	(5,281,777)
කල්බදු වගකීම් ආපසු ගෙවීම	(2,337,991)	(2,422,917)	(2,479,970)	(2,804,597)
පාලනයට යටත් නොවන හිමිකම් වෙත ලාභාංශ ගෙවීම්	–	–	(434,375)	(432,191)
වෙනත් ස්කන්ධ හිමියන් වෙත ගෙවන ලද ලාභාංශ/බදු	–	(18,308)	–	(18,308)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්	(1,293,583)	3,432,270	(8,482,993)	(3,832,273)
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	9,804,434	(4,952,589)	9,091,200	(4,769,921)
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ	61,889,582	66,842,171	63,307,106	68,077,027
වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	71,694,016	61,889,582	72,398,306	63,307,106

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. වාර්තාකරණ ආයතනය

GRI 2-1

1.1 ආයතනික තොරතුරු

මහජන බැංකුව ("බැංකුව") යනු 1961 අංක 29 දරණ බැංකු පනත යටතේ 1961 ජූලි මස 01 වැනි දින පිහිටුවන ලද රජය සතු බැංකුවක් වන අතර, එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බැංකුවකි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් වී ගාඩිනර් මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටා ඇත. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ වීකාබද්ධ මූල්‍ය ප්‍රකාශ බැංකුවේ හා එහි පරිපාලිතයන්හි ("සමූහය" ලෙස හැඳින්වෙන) මූල්‍ය තොරතුරුවලින් සමන්විත වේ.

මහජන බැංකුව සමූහයේ අවසාන මව් සමාගම වේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

GRI 2-6

බැංකුව

අනෙකුත් කරුණු අතර, තැන්පතු භාරගැනීම්, ණය පහසුකම් ලබාදීම, පුද්ගලික බැංකුකරණය, සංවර්ධන බැංකුකරණය, උකස් ගැනීම, ජාත්‍යන්තර වෙළෙඳාම, රජයේ සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු, ණය කාඩ්පත් මෙහෙයුම්, ආයෝජන බැංකුකරණය සහ විදේශ විනිමය බැංකුකරණය වෙනුවෙන් අක් වෙරළ බැංකුකරණ ඒකකය යනාදියෙන් බැංකුවේ ව්‍යාපාර සමන්විත වේ.

පරිපාලිත ආයතන

බැංකුවේ පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
පීපල්ස් ලීසිං එන්ටී ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්	මූල්‍ය කල්බදු, කුලීපිට ගැනීමේ වත්කම් මූල්‍යකරණය, වාර ණය, ඉස්ලාමීය මූල්‍ය, ආන්තික වෙළඳාම, කොටස් වෙළඳාම, ණය උපකරණ නිකුත් කිරීම, සාධ්‍යකරණය, රන් ණය, සහ පොදු තැන්පතු බලමුලු ගැන්වීම ලබාදීම ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වේ.
පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සංචාර සහ ගුවන් ටිකට්පත් සැකසීම (සංචාර නියෝජිතයා)

උප පරිපාලිත සමාගම්

බැංකුවේ උප පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්	රථවාහන කළමනාකරණය, රථවාහන තක්සේරු කිරීම, රථවාහන විකිණීම, රක්ෂණ තක්සේරුකරණය සහ රථවාහන අළුත්වැඩියා කිරීම.
පීපල්ස් ඉන්සුරන්ස් පීඑල්සී	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන් පවත්වාගෙන යාම සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම්.
පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම.
පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම	අඩු ආදායම්ලාභීන් සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙත බැංකු නොවන මූල්‍ය සේවාවන් සැපයීම.
	කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම හා පවත්වාගෙන යාම.
ලංකන් ඒලායන්ස් ෆයිනෑන්ස් සමාගම	නිශ්චල හා චංචල දේපළ සඳහා කල්බදු සැපයීම සහ ණය සැපයීම.

2. ගිණුම්කරණයේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ වීකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ වෙනම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS iy SLFRS) අනුව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අවශ්‍යතාවලට අනුකූල වේ. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතාවලට ද අනුකූල වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා භාවිතාකළ ආකෘති සහ එහි සිදුකළ අනාවරණ ද 2024 අංක 05 දරණ චක්‍රලේඛයෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති "බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශය සහ වෙනත් අනාවරණ ප්‍රකාශයට පත් කිරීම" පිළිබඳ ආකෘතියට අනුකූල වේ. එමෙන්ම බැංකුව ඉහත සඳහන් චක්‍රලේඛයට අනුකූලව පුවත්පත් සහ වෙබ් අඩවියේ වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය තොරතුරු සහ වෙනත් අනාවරණ ප්‍රකාශයට පත් කෙරේ.

2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරයාගේ වගකීම

1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ අවශ්‍යතාවයන්ට ද 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන් හී අවශ්‍යතාවන්ටද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS සහ SLFRS) ද අනුකූලව සකස් කිරීකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. මෙම SLFRSs සහ LKASs ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වෙබ් අඩවිය වන www.casrilanka.com ලබාගත හැකිය.

මෙම මූල්‍ය ප්‍රකාශවල පහත සඳහන් සංරචක ඇතුළත්ය.

ආදායම් ප්‍රකාශය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	සමාලෝචිත වසර සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ලබාදීම
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	වසර අවසානයට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ලබාදීම
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය	සමාලෝචිත වසර තුළ "කොටස්හිමියන්ගේ සියලුම වෙනස්වීම් පෙන්නුම් කිරීම"
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	මුදල් හා මුදලට සමාන දෑ ජනනය කිරීමට සහ එම මුදල් ප්‍රවාහ භාවිතා කිරීමට බැංකුවේ සහ සමූහයේ හැකියාව පිළිබඳ පරිශීලකයින්ට තොරතුරු ලබාදීම
මුදල් ප්‍රකාශනවලට සටහන්	සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් පැහැදිළි කිරීමේ තොරතුරුවලින් සමන්විත වේ

2.3 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 මාර්තු 25 දින බලය ලබා දෙන ලදී.

3. මිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ චෛතිහාසික පදනම යොදා ගනිමින් සකස් කොට ඇති අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමන සාධක වෙනුවෙන් ගැලපීම් කිසිවකින් තොරව එය ඒකාකාර ලෙස ආදේශ කර ගනු ලැබ ඇත.

අයිතමය	මිණුම්කරණ පදනම	සටහන්
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	සාධාරණ අගයට	20
ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගයක් ගන්නා මූල්‍ය උපකරණ	සාධාරණ අගයට	21
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයක් ගන්නා ණය උපකරණ	සාධාරණ අගයට	25 සහ 26
ඉඩම් හා ගොඩනැගිලි	අත්පත් කරගනු ලබන අවස්ථාවේ පිරිවැයට මිනුම් කොට පසුකාලීනව ප්‍රත්‍යාගණන දිනයේ සාධාරණ වටිනාකම් වන ප්‍රත්‍යාගණිත අගයට මිනුම්කරණය කෙරේ	28
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	බැරකම ආයුගණක පදනමින් අගය කොට සැලසුම් වත්කම්වල මුළු සාධාරණ අගය අඩුකළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ප්‍රවර්තන අගයට හඳුනාගැනේ.	35

3.1 ව්‍යවහාරික හා ඉදිරිපත් කරන මුදල් ඒකකය

ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශ බැංකුවේ ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් හැර ආසන්නතම දහසට වටයනු ලැබ ඇත

3.2 ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 1 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අනුව, සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හෝ කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර, වෙන් වෙන්ව ඉදිරිපත් කොට ඇත.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුකූලව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ "වක්‍ර ක්‍රමය" උපයෝගී කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කොට ඇත. මුදල් හා මුදල් සමාන දෑ දැනුවත් මුදලකට පහසුවෙන් හැරවිය හැකි කෙටි කාලීන අධිද්‍රවශීලතා ආයෝජනවලින් සමන්විත වන අතර, වටිනාකමේ නොසැලකියයුතු වෙනස්වීම්වලට යටත් වේ. අතැති මුදල්, බැංකු ශේෂ, ඇමතුම් සහ කෙටි දැන්වීම් මුදල්වලින් මුදල් හා සමාන දෑ සමන්විත වේ.

3.4 සංසන්දනාත්මක තොරතුරු

වඩා යහපත් ඉදිරිපත් කිරීමක් ලබාදීමේ අරමුණින් වර්තමාන වසරේ ඉදිරිපත් කිරීම සමඟ අනුකූලවීමට අවශ්‍ය අවස්ථාවේදී සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කෙරේ.

4. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලැබ ඇති අගයයන් නිශ්චය කිරීම සඳහා කළමනාකාරිත්වය විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගෙන ඇත. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස්විය හැක.

ඇස්තමේන්තු හා ඒවාට පාදක වූ උපකල්පන නිරන්තර පදනමක් මත සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්මේන්තුවලට අදාළ ප්‍රතිශෝධන ඇස්තමේන්තු ප්‍රතිශෝධිත කාලසීමාව තුළදී හා බලපෑමට ලක් වන කවර හෝ ඉදිරි කාලසීමාවන්හිදී හඳුනා ගනී.

ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් තුළ හඳුනාගනු ලැබ ඇති අගයන් මත වඩාත්ම සැළකිය යුතු බලපෑම ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේදී යොදා ගත් විනිශ්චයන්, උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

4.1 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමූහය සතු හැකියාව සම්බන්ධයෙන් තක්සේරුවක් අධ්‍යක්ෂ මණ්ඩලය සිදුකොට ඇති අතර, දැකිය හැකි අනාගතය සඳහා ව්‍යාපාරය අඛණ්ඩව පැවතීමට අවශ්‍ය සම්පත් එය සතු වන බවට සෑහීමකට පත්වේ. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට බැංකුව සතු හැකියාව සම්බන්ධයෙන් සැළකිය යුතු සැකයක් ඉපදවිය හැකි ආකාරයේ කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් නැත. එමනිසා මූල්‍ය ප්‍රකාශ සැකසීම අඛණ්ඩ පැවැත්ම යන පදනම මත සිදු කෙරේ.

4.2 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල අගය ආයුගණක ඇගයීම් ශිල්ප ක්‍රමය භාවිත කරමින් නිර්ණය කරනු ලැබේ. වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත ප්‍රමාණය, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාතික පිළිබඳ උපකල්පන සිදු කිරීම ආයුගණක ඇගයීම හා සම්බන්ධ වේ. සියළු උපකල්පන සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරේ. මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් මෙබඳු ඇස්තමේන්තු සැලකියයුතු අවිනිශ්චිතතාවන්ට භාජනය වේ. මෙහිදී භාවිත කෙරෙන උපකල්පන සඳහා 35.1.5 සහ 35.2.5 සටහන් බලන්න.

4.3 දේපල, පිරියත සහ උපකරණවල සාධාරණ වටිනාකම

සමූහයේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සහ බදු ඉඩම්වල පවතින ගොඩනැගිලි කවර හෝ සමුච්චිත ක්ෂය සහ හාණිකරණ අලාභයන් අඩු කිරීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණිත දිනයට සාධාරණ අගයට පිළිබිඹු කොට ඇත. එබඳු දේපළවල සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා සමූහය මගින් ස්වාධීන ඇගයීම් විශේෂඥයන් යොදවන ලදී. සමාන වත්කම්වල ප්‍රවර්තන අගය පවතින විට මෙවැනි වත්කම්වල අගය තක්සේරු කිරීමේදී එබඳු සාක්ෂි සළකා බලනු ලැබේ.

4.4 දේපල, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය

සමූහය සෑම වාර්තාකරණ දිනයකදීම දේපළ, පිරියත සහ උපකරණවල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ජීවිත කාලය සහ ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙම වටිනාකම්, අනුපාතික හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වයෙහි විනිශ්චය යොදා ගනු ලබන බැවින් ඒවා අවිනිශ්චිතතාවන්ට යටත් වේ.

4.5 බදු

සමූහය ආදායම් බදුවලට යටත් වන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ සකසනු ලබන අවස්ථාවේදී අදාළ කරගත හැකි බදු නීති අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතා හේතුවෙන් වර්තන, විලම්බිත හා වෙනත් බදු සහ මුළු ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා විනිශ්චය අවශ්‍ය වේ.

4.6 බැඳීම් හා අසම්භව්‍යතා

සියලුම දැනුවත් වගකීම් ප්‍රමාණය නිගමනය කිරීමේදී ප්‍රත්‍යක්ෂ වශයෙන් පවත්නා අවදානම් ගණනය කෙරේ. අසම්භව්‍ය බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ මාරුකිරීමේ සම්භාවිතාවක් නොපවතින හෝ විශ්වසනීය ආකාරයට මිනුම්කරණය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් වලින් පමණක් පැවැත්ම තහවුරු වන උද්ගත විය හැකි වගකීම් වේ. අසම්භව්‍ය බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේදී හඳුනා නොගැනෙන නමුත් ඒවා දුරස්ථ වන්නේ නම් හැර හෙළිදරව් කරනු ලැබේ. බැඳීම් සහ අසම්භව්‍යතා පිළිබඳ විස්තර 41 සටහනෙහි දැක්වේ.

4.7 ආයෝජන දේපල වර්ගීකරණය

කිසියම් දේපළක් ආයෝජන දේපළක් වශයෙන් සුදුසුකම් ලබන්නේද යන්න තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සිය විනිශ්චය භාවිත කිරීම අවශ්‍යය. සිය විනිශ්චය නිත්‍ය ලෙස ක්‍රියාත්මක කළ හැකි වන පරිදි සමූහය මිනුම් දඩු සකස් කොට ඇත. එහිදී බදු කුලී උපයන හෝ ප්‍රාග්ධන අගය ඉහළ යාමෙන් ඉපැයීම් දරන හෝ දෙයාකාරයෙන්ම ඉපැයීම් දරන දේපළ ද, සමූහයේ වෙනත් වත්කම්වලින් විශාල වශයෙන් ස්වාධීනව මුදල් ගලන උත්පාදන ද ආයෝජන දේපළ ලෙස සලකනු ලබයි. වෙනත් ආකාරයකින් කිවහොත්, මෙහෙයුම් සඳහා හෝ සේවා සැපයුම් ක්‍රියාවලියේදී හෝ පරිපාලනමය කාර්යයන් සඳහා භාවිතා කළ හැකි දේපළක් ද, තනි වත්කමක් ලෙස සෘජු මුදල් ගලනයක් සිදුනොකරන දේපළක් ද දේපළක්, පිරියතක් සහ උපකරණයක් වශයෙන් සැළකේ. මෙවැනි දේපළවල වර්තමාන භාවිතය සැළකිල්ලට ගනිමින් වාර්ෂික පදනමක් මත සමූහය විසින් එහි දේපළවල ගිණුම්කරණ වර්ගීකරණය තක්සේරු කෙරේ.

4.8 වැදගත් ගිණුම්කරණ උපකල්පන සහ ඇස්තමේන්තු

සෑම වාර්තාකරණ දිනයකදීම සිදුකරනු ලබන උපකල්පනයන් එදිනට පවතින විශිෂ්ටතම ඇස්තමේන්තු මත පදනම් වේ. ඇස්තමේන්තු විශ්වසනීය ආකාරයෙන් මිනුම් ගත කරන බවට තහවුරු කිරීම සඳහා බැංකුවට අභ්‍යන්තර පාලන ක්‍රම අයත් වුවද, සැබෑ අගයයන් එකී ඇස්තමේන්තුවල අගයන්ගෙන් වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ එයට පාදක වූ උපකල්පනයන් නිරන්තර පදනමක් මත සමාලෝචනයට ලක් කෙරේ.

ගිණුම්කරණ ඇස්මේන්තු වෙත ප්‍රතිශෝධනයන් අදාළ ඇස්තමේන්තු ප්‍රතිශෝධනයට ලක් වන කාලසීමාව තුළ සහ බලපෑමට ලක්වන කවර හෝ අනාගත කාලසීමාවකදී හඳුනාගනී.

විනිශ්චය, ඇස්තමේන්තු සහ උපකල්පන කෙරෙහි වඩාත්ම සංවේදී ගිණුම්කරණ ප්‍රමිතීන් පහත විශේෂ කොට දක්වා ඇත.

(i) සාධාරණ අගය මිනුම්කරණය

මූල්‍යමය උපකරණවලින් සැළකිය යුතු ප්‍රමාණයක් මූල්‍යමය වාර්තාකරණ දිනයේ සාධාරණ අගය අනුව දක්වනු ලැබේ.

සාධාරණ අගය යනු අදාළ මිනුම්කරණ දිනයේදී වෙළෙඳපොල සහභාගී වන්නන් අතර නිශ්චිත ගනුදෙනුවකදී වත්කමක් විකිණීමේදී හිමි වන හෝ බැරකමක් මාරු කිරීමේදී ගෙවීමට සිදු වන මිළ වේ.

කිසියම් වත්කමක හෝ බැරකමක වර්ගීකරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් එය සාධාරණ අගය අනුව මිනුම්කරණයට ලක් වන අවස්ථාවකදී හැකි සෑමවිටම සාධාරණ අගය තීරණය කරනු ලබන්නේ බැංකුවට ආසන්නතම ප්‍රවේශය සහිත වඩාත්ම වාසිදායක ක්‍රියාකාරී වෙළෙඳපොලක තබන ලද ලංසුව හෝ ඉදිරිපත් කරන ලද මිළ සැළකිල්ලට ගනිමිනි. සුදුසු පරිදි සාධාරණ අගය වෙත ණය අවදානම සඳහා වන ගැළපුමක්ද ඇතුළත් කෙරේ.

ක්‍රියාකාරී වෙළෙඳපොලක් තුළ ලංසුගත මූල්‍ය බැරකමක ශුද්ධ විවෘත තත්ත්වයක් සඳහා සාධාරණ අගය ඉදිරිපත් කෙරෙන වර්තමාන මිළ වන අතර, මූල්‍ය වත්කමක් සඳහා සාධාරණ අගය ලංසුගත මිළ රඳවාගත් හෝ නිකුත් කරන ලද උපකරණයෙහි ඒකක සංඛ්‍යාවෙන් ගුණ කරන ලද අගය වේ.

කිසියම් වත්කමකට හෝ බැරකමකට සක්‍රීය වෙළෙඳපොලෙක් නොමැති අවස්ථාවක, බැංකුව මගින් සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා යෝග්‍ය තක්සේරුකරණ ශිල්පීය ක්‍රම භාවිත කරනු ලබන අතර, එහිදී වාර්තාකරණ දිනයේ වෙළෙඳපොල තත්ත්වයන් සහ අවදානම් මත පදනම්ව, ආසන්න නුදුරු කාලයකදී සිදුකරන ලද ගනුදෙනු වලින් ලබාගන්නා ලද මිළ ගණන් භාවිතය, වට්ටම්ගත මුදල් ප්‍රවාහ විමර්ශනයන්, වරණීය මිළකරණ ආකෘතීන් සහ වෙනත් තක්සේරුකරණ තාක්ෂණයන් ඇතුළත් කරගනී. එසේ කිරීමෙන්, නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල යෙදවුම් උපරිම වශයෙන් යොදාගැනෙන සහ ආයතන විශේෂිත යෙදවුම් කෙරෙහි අවම විශ්වාසයක් තබනු ලබන තක්සේරුකරණ ක්‍රමවේදයක් භාවිතා කෙරේ.

ආරම්භක හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණයක සාධාරණ අගය පිළිබඳ වඩාත් හොඳ සාක්ෂිය වන්නේ එම උපකරණයේ සාධාරණය අගය එම උපකරණය තුළ නිරීක්ෂණය කළ හැකි වෙනත් වර්තමාන වෙළෙඳපොල ගනුදෙනු මගින් සන්සන්දනාත්මකව ඔප්පු කරන්නේනම් (උදා: නවීකරණය හෝ ප්‍රති ඇසුරුම්ගත කිරීමකින් තොරව), හෝ නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොලක දත්ත පමණක් විචල්‍යයන් වශයෙන් ඇතුළත් වන තක්සේරුකරණ ක්‍රමවේදයක් මත පදනම් වන්නේනම් මිස ගනුදෙනු මිලය. එවැනි සාක්ෂි පවතින විටකදී බැංකුව මූලික හඳුනාගැනීමේදී ලාභ අලාභ සම්බන්ධයෙන් ගනුදෙනු මිළ සහ සාධාරණ අගය අතර වෙනස හඳුනාගනී.
(උදා: පළමු දිනයේ සිට)

(ii) ණය සහ අත්තිකාරම් මත හානිකරණ අයකිරීම්

ණය හා අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ තීරණය කිරීමේදී කළමනාකාරිත්වය විසින් අනාගත මුදල් ප්‍රවාහවල ප්‍රමාණය සහ කාල ගණනය ඇස්තමේන්තු ගත කිරීමේදී විනිශ්චය වැදගත් වේ. මෙම මුදල් ප්‍රවාහ පිළිබඳව ඇස්තමේන්තු සිදුකිරීමේදී, බැංකුව ප්‍රධාන වශයෙන් ණයගැතියාගේ මූල්‍ය තත්ත්වය සහ එම ඇපවල උපලබ්ධි වටිනාකම පිළිබඳ විනිශ්චයන් සිදුකරයි. මෙම ඇස්තමේන්තු සාධක ගණනාවක් පිළිබඳ උපකල්පන මත පදනම්වන අතර, හානිකරණ දීමනාව වෙත අනාගත වෙනස්කම් ඇති කරමින් සැබෑ ප්‍රතිඵල එකිනෙකට වෙනස් විය හැකිය.

හානිකරණය සම්බන්ධ සාමූහික තක්සේරුකරණයකදී ණය සැලසුම් පෙළ ආශ්‍රිත දත්ත (ණය තත්ත්වය/හිඟ මුදල් මට්ටම්, ණය භාවිත කිරීම වැනි) සහ අවදානම පිළිබඳ අවධානය සහ ආර්ථික දත්ත (සේවා වියුක්ති මට්ටම්, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදිත අනුපාතය ඇතුළුව) සැළකිල්ලට ගනී.

5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කරන සියලුම කාලසීමාවන් සඳහා සටහන 5.1 සිට සටහන 5.23 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහය සමූහය ස්ථිරවම යොදා ගෙන ඇත.

5.1 ඒකාබද්ධකරණ පදනම

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශවලින් සමන්විත වේ. ඒකාබද්ධකරණ කාර්යය සඳහා බැංකුවේ පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ ඒකාකාර ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිත කරමින්, මහජන බැංකුවේ වාර්තාකරණ වර්ෂයන් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබේ.

5.1.1 ව්‍යාපාර සංයෝජන

අත්පත් කරගත් දිනට උදා: පාලනය සමූහය වෙත මාරුකරනු ලැබූ දිනට, අත්පත් කරගැනීමේ ක්‍රමය භාවිත කරමින් ව්‍යාපාර සංයෝජන සඳහා ගණන් දෙනු ලැබේ. අත්පත් කරගැනීමේදී මාරු කරන ලද ප්‍රතිශ්ධාව මෙන්ම අත්පත් කරගත් හඳුනාගත හැකි ශුද්ධ වත්කම් ද සාමාන්‍යයෙන් සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ. පැන නගින ඕනෑම කීර්තිනාමයක් හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂාවට ලක් කෙරේ. මිලදී ගැනීම මත පැන නගින ලාභය වහාම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ගනුදෙනු පිරිවැය ණය හෝ ස්කන්ධ සුරැකුම් නිකුත් කිරීම හා සම්බන්ධව ඇත්නම් හැර, දරන ලද වියදමක් ලෙස සලකනු ලබයි.

පෙර සිට පවතින සබඳතා පියවීමට අදාළ මුදල් ප්‍රමාණ මාරු කරන ලද ප්‍රතිශ්ධාවට ඇතුළත් නොවේ. එබඳු මුදල් ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනී.

ගෙවිය යුතු කවර හෝ අසම්භව්‍ය ප්‍රතිශ්ධාවක් අත්පත් කරගත් දිනට සාධාරණ අගය අනුව මිනුම්කරණය සිදු කෙරේ. අසම්භව්‍ය ප්‍රතිශ්ධාව ස්කන්ධ ලෙස වර්ග කෙරේ නම්, එය නැවත මිනුම්කරණය සිදු නොකරන අතර, ස්කන්ධ තුළ පියවීමට ගණන් දෙනු ලැබේ. නැතිනම් අසම්භව්‍ය ප්‍රතිශ්ධාවෙහි සාධාරණ අගයෙහි පසුකාලීන වෙනස්කම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනී.

5.1.2 පාලනය යටත් නොවන හිමිකම් (“NCI”)

පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කරගැනීමේ දිනට අත්පත් කරන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සමානුපාතික කොටසට මිනුම්කරණය කෙරේ. පාලනය අහිමිවීමට හේතු නොවන ආකාරයෙන් පරිපාලිත සමාගමක සමූහය සතු හිමිකම් වෙනස්වීම් ස්කන්ධ ගනුදෙනු ලෙස ගණන් දෙනු ලැබේ.

5.1.3 පරිපාලිත සමාගම්

“පරිපාලිත” සමාගම් යනු සමූහය විසින් පාලනය වනු ලබන ආයෝජිතයන් වේ. සමූහයට ආයෝජිතයා සමග මැදිහත් වීම හේතුවෙන් එය විචල්‍ය ප්‍රතිලාභවලට නිරාවරණය වේ නම් හෝ විචල්‍ය ප්‍රතිලාභවලට හිමිකම් ලැබේ නම් සහ ආයෝජිතයා මත සමූහය සතු බලතල හරහා බලපෑමක් කිරීමේ හැකියාව සමූහය සතු වේ නම්, එවිට සමූහය ආයෝජිතයා පාලනය කරයි. පාලනය ආරම්භ වන දින සිට අවසාන වන දින තෙක් පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කරනු ලබයි.

5.1.4 පාලනය අහිමි වීම

සමූහයට පරිපාලිත සමාගමක පාලනය අහිමි වූ විට, පරිපාලිත සමාගමෙහි වත්කම් හා බැරකම් සහ ස්කන්ධ හා සබැඳි කවර හෝ පාලනයට මැදිහත් නොවන හිමිකම් සහ වෙනත් සංරචකයන් හඳුනා නොගනී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන ලාභය හෝ අලාභය, ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනී. පාලනය අහිමි වූ විට, පෙර පැවති පරිපාලිත සමාගමෙහි රඳවාගනු ලැබූ කවර හෝ හිමිකමක් සාධාරණ අගයට මිනුම්කරණය කරනු ලබයි.

5.1.5 ඒකාබද්ධකරණයේදී ඉවත් කෙරෙන ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අන්තර් සමූහ ශේෂ සහ ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු තුළින් පැන නගින උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් (විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ලාභ සහ අලාභ හැර) ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ ද උපලබ්ධි නොවූ ලාභ ඉවත් කෙරෙන ආකාරයටම ඉවත් කෙරෙන නමුත් හානිකරණය පිළිබඳ සාක්ෂි කිසිවක් නොපවතින තාක් දුරට එසේ කරනු ලැබේ.

5.2 විදේශ මුදල් පරිවර්තනය

විදේශ මුදල්වලින් සිදු වන ගනුදෙනු එම ගනුදෙනුව සිදු වූ දිනට බලපැවැත්වූ විනිමය තත්කාලීන අනුපාතිකය මත මූලිකව වාර්තා කෙරේ. විදේශ ව්‍යවහාර මුදලින් දක්වා ඇති මූල්‍යමය වත්කම් හා බැරකම් වාර්තාකරණ දිනට විනිමය තත්කාලීන අනුපාතිකය අනුව නැවත පරිවර්තනය කරනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදලකින් වෙතිහාසික පිරිවැය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතම, ඒවා හඳුනාගැනීමේ දිනට තත්කාලීන අනුපාතික භාවිත කරමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදලකින් සාධාරණ අගයට මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතම, සාධාරණ අගය නිශ්චය කෙරෙන දිනයට පවතින තත්කාලීන විනිමය අනුපාතික භාවිතා කරමින් පරිවර්තනය කෙරේ.

5.3 මූල්‍ය උපකරණ – මූල් වරට හඳුනාගැනීම

5.3.1 හඳුනාගැනීමේ දිනය

මූල්‍යමය වත්කම් හෝ බැරකම් බැංකුව සාධන පත්‍රයෙහි ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශ්වයක් බවට පත් වූ දින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගන්නා අතර එය සාමාන්‍යයෙන් වෙළෙඳාම් දිනය වේ. ණය සහ අත්තිකාරම් ණයගැතියන් වෙත මුදල් අත්තිකාරම් (හෝ බේරුම් කල) දිනයට හඳුනාගනී.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගය අනුව හඳුනාගනී. අනෙකුත් සියළු මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගය සහ සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනා ගනී.

මූල්‍ය වත්කම් සහ බැරකම් සම්බන්ධ විධිමත් නොවන මිළදී ගැනීම් වෙළෙඳාම් දිනට එනම් බැංකුව සාධන පත්‍රයෙහි ගිවිසුම් විධිවිධානවලට පාර්ශ්වයක් බවට පත්වන දිනයේදී හඳුනා ගනී.

විධිමත් මිලදී ගැනීමක් යනු අදාළ වෙළෙඳපොලෙහි නියමයක් හෝ ප්‍රඥප්තියක් මගින් පොදුවේ ස්ථාපනය කරන ලද කාලරාමුව තුළ වත්කම් භාරදීම අවශ්‍ය වන නියමයන් සහිත ගිවිසුමක් යටතේ මූල්‍ය වත්කමක් මිලදී ගැනීමකි.

5.3.2 කාර්ය මණ්ඩල ණය සඳහා සංක්‍රමණික "දින 1" වෙනස

සියළු කාර්ය මණ්ඩල ණය වෙළෙඳපොල පොලී අනුපාතවලට පහළ අගයකට පිරිනමන අතර, ඒවා සාධාරණ අගයට හඳුනාග නී. සාධාරණ අගය සහ මුදල් වියදම් කළ ප්‍රමාණය අතර වෙනස දින එක වෙනස ලෙස සළකා සථල පොලී අනුපාතිකය යොදාග නිමින් ණය මුදලේ ඉතිරි කාලය තුළ ආදායම් ප්‍රකාශයෙහි සේවක පිරිවැය ලෙස ක්‍රමක්ෂය කෙරේ. මෙම ප්‍රමාණය පොලී ආදායමක් ලෙස ද පෙන්වනු ලැබේ. එමනිසා අදායම් ප්‍රකාශයෙහි ශුද්ධ ප්‍රතිඵලය ශූන්‍ය වේ.

5.4 මූල්‍ය උපකරණවල මුල් අවස්ථාවේදී මිනුම්කරණය

පහත සටහන් 5.4.1. සහ 5.4.2. හි දක්වා ඇති පරිදි මුල් අවස්ථා හඳුනාගැනීමේදී මූල්‍ය උපකරණ වර්ගීකරණය ඒවායේ කොන්දේසි සහ අදාළ උපකරණ කළමනාකරණය සඳහා වන ආකෘතිය මත රඳා පවතී. ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගයට වාර්තා කෙරෙන මූල්‍ය වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් හැරුණුවිට මූල්‍ය උපකරණ මුල් අවස්ථාවේදී ඒවායේ සාධාරණ අගයට එකතු කර මිනුම්කරණය කෙරේ.

5.4.1 ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම

නිශ්චිත ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මූල්‍ය වත්කම් සමූහය කළමනාකරණය කරන ආකාරය පිළිබිඹු කෙරෙන මට්ටමකින් සමූහයේ ව්‍යාපාර ආකෘතිය තීරණය කරයි. තනි තනි උපකරණයක් කළමනාකාරිත්වයේ අභිමතය මත සමූහයේ ව්‍යාපාර අකෘතිය රඳා නොපවතී. ඒ අනුව සමූහයේ ව්‍යාපාර ආකෘතිය වර්ගීකරණය සඳහා උපකරණයෙන් උපකරණයට වීළඹුමක් නොවූවද ඉහළ මට්ටමේ එකතුකළ කළඹක් වන අතර පහත දැක්වෙන ආකාරයේ නිරීක්ෂණය කළ හැකි සාධක මත පදනම් වේ.

- අදාළ ව්‍යාපාර රටාව තුළ දරා සිටින ව්‍යාපාර අකෘතිය සහ මූල්‍ය වත්කම්වල කාර්යසාධනය තක්සේරු කරනු ලබන සහ සමූහයේ ප්‍රධාන කළමනාකාරීත්වය වෙත වාර්තා කරනු ලබන ආකාරය,
- ව්‍යාපාර ආකෘතියෙහි (සහ ව්‍යාපාර ආකෘතිය තුළ දරා සිටින මූල්‍ය වත්කම්වල) කාර්යසාධනය සඳහා බලපෑ හැකි අවදානම් සහ විශේෂයෙන් අදාළ අවදානම් කළමනාකරණය කර ගනු ලබන ආකාරය,
- ව්‍යාපාරයේ කළමනාකරුවන් වෙත වැටුප් ගෙවනු ලබන ආකාරය. (කළමනාකරණය කරනු ලබන වත්කම්වල සාධාරණ අගය හෝ එකරැස් කරගත් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය මත වැටුප් ගෙවීම පදනම් වනවාද යන්න)

"නරකම සිද්ධිය" හෝ "පීඩිතම සිද්ධිය" වශයෙන් සිද්ධීන් සැළකිල්ලට නොගෙන සැළකිය යුතු අපේක්ෂිත සිද්ධීන් මත ව්‍යාපාර ආකෘති තක්සේරුකරණය පදනම් වේ. සමූහයේ මුල් අපේක්ෂාවන්ට වෙනස් ආකාරයකින් මුදල් ප්‍රවාහ උපලබ්ධිවේනම්, එම ව්‍යාපාර ආකෘතිය තුළ දරන ලද ඉතිරි මූල්‍ය වත්කම් වර්ගීකරණය පූර්ව කාලසීමාවක ඇති නොවන අතර වෙනස්විමක්ද සිදු නොවේ. කෙසේවුවද, අලුතින් උත්පාදනය වූ හෝ අලුතින් මිලදී ගත් මූල්‍ය වත්කම් සඳහා සමූහය විසින් ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීමේදී, සමූහය මගින් අනෙකුත් අදාළ තොරතුරු සමඟ අතීතයේදී මුදල් ප්‍රවාහ උපලබ්ධි වූ ආකාරය පිළිබඳ තොරතුරු සැළකිල්ලට ගනු ලැබේ.

5.4.2 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂණය – මුල් මුදල හා පොළිය පමණක් ගෙවීම (SPPI පරීක්ෂණය)

සමූහය මගින් මුල් මුදල හා පොළිය පමණක් ගෙවීමේ පරීක්ෂණය සපුරාලන්නේද යන්න හඳුනා ගැනීමට මූලික ණය වැඩපිළිවෙලෙහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තක්සේරු කරයි. මෙහිදී ඒවා හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොළී ගෙවීම් ලෙස සැලකේ.

මෙම කාර්යය සඳහා "මුල් මුදල" යනුවෙන් මූලික හඳුනාග ැනීමේදී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ලෙස අර්ථකතනය කෙරේ. කෙසේවුවද, එම මුල් මුදල මූල්‍ය වත්කමේ ජීව කාලය තුළ වෙනස් විය හැක.

මෙම කාර්යය සඳහා "පොළිය" යන්න මුදලේ කාල අගය, නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ හිඟ මුල් මුදල ආශ්‍රිත බැර අවදානම සහ වෙනත් මූලික ණය දිමේ අවදානම් හා පිරිවැය මෙන්ම ලාභ ආන්තිකය සඳහා ප්‍රතිෂ්ඨාව සමන්විත වේ. සමූහය විනිශ්චයන් යොදා ගන්නා අතර මූල්‍ය වත්කම නම්කළ ව්‍යවහාර මුදල සහ පොළී අනුපාතය පිහිටුවන ලද කාලසීමාව ආදී අදාළ කරුණු සළකා බලනු ලැබේ.

5.5 මූල්‍ය වත්කම් හා බැරකම්වල මිනුම්කරණ කාණ්ඩ

වත්කම් සහ උපකරණවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ කළමනාකරණය සඳහා ආයතනයේ ව්‍යාපාර ආදර්ශයේ සංයෝජනයක් මත පදනම් වී තක්සේරු කරන ස්කන්ධ උපකරණ සහ ව්‍යුත්පන්නයන් හැර, සියළුම මූල්‍ය වත්කම් පහත මිනුම්කරණ කාණ්ඩ මගින් මනිනු ලැබේ.

- ක්‍රමක්ෂය පිරිවැය (සටහන 5.5.1)
- වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව (සටහන 5.5.2)
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (සටහන 5.5.3)

5.5.1 ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය උපකරණ

ණය උපකරණ

පහත දැක්වෙන තත්ත්වයෙන් පවතින විට ණය උපකරණයන්හි ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ:

- හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොළී පමණක් ගෙවීම් නියෝජනය කරන විශේෂ දිනවල මුදල් ප්‍රවාහ ඇතිකරන ගිවිසුම්ගත නියමයන්, සහ
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීමට රඳවා ගැනීම මගින් අරමුණ සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටින විට.

මෙම ණය උපකරණ මූලිකව සාධාරණ අගය සහ සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනාගෙන ඇති අතර පසුව ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ. ණය හානිකරණ මිනුම්කරණය පහත සටහන 5.6 මූල්‍ය වත්කම් හානිකරණය තුළ දක්වා ඇති ණය අලාභ ආදර්ශය හැර පියවර තුනක් මත පදනම් වේ.

බැංකු වෙත ණය හා අත්තිකාරම්ල, වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය හා අත්තිකාරම්

පහත දැක්වෙන කොන්දේසි ද්විත්වයම සපුරාලන බැවින් සමූහය මගින් කල්බදු සහ කුලිපිට ගැනිමේ ගිවිසුම් ඇතුළුව බැංකු වෙත ණය හා අත්තිකාරම් සහ වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කරනු ලබයි:

- මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීමට මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටීම.
- හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොළී පමණක් ගෙවන මුදල් ප්‍රවාහවලට විශේෂ දිනවල ඇතිකරන මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන්.

5.5.2 අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය උපකරණ

ණය උපකරණ

පහත දැක්වෙන තත්ත්වයෙන් පවතින විට ණය උපකරණයන්හි ආයෝජන අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ:

- හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොළී පමණක් ගෙවීම් නියෝජනය කරන විශේෂ දිනවල මුදල් ප්‍රවාහ ඇතිකරන ගිවිසුම්ගත නියමයන්, සහ
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සහ මූල්‍ය වත්කම් විකිණීම මගින් අරමුණ සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටින විට.

මෙම ණය උපකරණ මූලිකව සාධාරණ අගය සහ සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනාගෙන, පසුව ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ. සාධාරණ අගය වෙනස්වීමෙන් පැන නගින ලාභ හෝ අලාභ වෙන් වූ ස්කන්ධ සංරචකයක් ඇතුළත වෙනත් විස්තීර්ණ ආදායම තුළ ඇතුළත් කෙරේ. හානිකරණ අලාභයන් හෝ ප්‍රතිවර්තනයන්, පොළී ආදායම සහ විදේශ ව්‍යවහාර මුදල් ලාභ හෝ අලාභයන් ලාභ හා අලාභ තුළ හඳුනාගනී. බැහැර කිරීම මත, අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ මෙයට පෙර හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධයේ සිට ආදායම් ප්‍රකාශනයට ප්‍රතිවර්ගීකරණය කෙරේ.

ක්‍රමක්ෂය පිරිවැයේදී මූල්‍ය වත්කම්වලට යොදා ගත් පරිදි ණය හානිකරණය මැනීම අදියර තුනේ අපේක්ෂිත ණය අලාභවල ආකෘති මත පදනම් වේ. අපේක්ෂිත ණය අලාභ ආකෘතිය පහත සටහන 5.6 මූල්‍ය වත්කම් හානිකරණය හි දක්වා ඇත.

ස්කන්ධ උපකරණ

SLFRS 3 "ව්‍යාපාර සංයෝජන" ප්‍රමිතිය අදාළ වන ව්‍යාපාර සංයෝජනයක් තුළ බැංකුව විසින් හඳුනාගන්නා විකිණීම සඳහා දරා නොගන්නා හෝ අසම්භාව්‍ය ප්‍රතිශ්ඨාවක් නොවන ස්කන්ධ උපකරණවල ආයෝජනය වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන අතර එහිදි වෙනස් නොකලැකි තේරීමක් කළමනාකරණය විසින් සිදුකර ඇත. පැහැර හැරීමකින් අනෙතුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය යොදා ගැනීමට කළමනාකරණය විසින් වෙනස් නොකලැකි තේරීමක් නොකරන කළඹ සඳහා, එවැනි ආයෝජන ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ.

අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ ඉදිරිපත් කෙරෙන මුදල් ප්‍රමාණයන් පසුව ලාභ හෝ අලාභ වෙත මාරු නොකෙරේ. එවැනි ආයෝජනයන්හි ලාභාංශ ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනී.

5.5.3 ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ මත සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් අනුව වන අයිතමයන් පහත දැක්වෙන කරුණුවලින් සමන්විත වේ:

(අ) වෙළෙඳාම පිණිස දරා සිටින,

(ආ) මුල් වරට හඳුනාගැනීම මත ලාභ හෝ අලාභ මත සාධාරණ අගය වශයෙන් විශේෂයෙන් නම් කරන ලද අයිතම,

(ඇ) හුදෙක් මුල් මුදල හෝ පොලී ගෙවීම් නියෝජනය නොකරන ගිවිසුම්ගත කොන්දේසි සහිත ණය උපකරණ.

ලාභ හෝ අලාභ මත සාධාරණ අගය අනුව දරා සිටින මූල්‍ය උපකරණ දරා ඇති බවට ආදායම් ප්‍රකාශය තුල හඳුනාගත් ගනුදෙනු පිරිවැය සමඟ මූලිකව සාධාරණ අගය අනුව හඳුනාගනී. පසුව, ඒවා සාධාරණ අගය අනුව මිනුම්කරණය කොට කවර හෝ ලාභ හෝ අලාභ ඒවා පැන නගින අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

මූල්‍ය වත්කමක් සාධාරණ අගය අනුව මිනුම්කරණය කරනු ලබන අවස්ථාවේදී, ණය අවදානමෙහි වෙනස්වීම් වෙත ආරෝපනය කළ යුතු සාධාරණ අගයෙහි වෙනස්වීම නියෝජනය වන පරිදි, ප්‍රතිපාර්ශ්වයේ ණය වටිනාකම පිළිබිඹු වන අයුරින් ණය තක්සේරු ගැළපුමක් ඇතුළත් කෙරේ.

(අ) වෙළෙඳාම පිණිස දරා සිටින මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයක් වෙළෙඳාම පිණිස දරා සිටින බවට වර්ගීකරණයට ලක් වනුයේ එය නුදුරු කාලයේදී විකිණීම හෝ ප්‍රතිමිලදී ගැනීමේ මූලික අරමුණින් යුතුව අත්පත් කරගැනීම හෝ දරනු ලැබීම සිදුවූයේ නම්, හෝ එක්ව කළමනාකරණය කරනු ලබන මූල්‍ය උපකරණ කළඹක කොටසක් නිර්මාණය කරනු ලබයි නම්, එමගින් කෙටි කාලීන ලාභ ලැබීමේ සාක්ෂි සහිතනම් හෝ එය සුදුසුකම් ලබන ඉදිරි රැකුම් සබඳතාවයක නොවන ව්‍යුත්පන්නයක් වන්නේ නම් පමණි.

වෙළෙඳ ව්‍යුත්පන්නයන් සහ වෙළෙඳ සුරැකුම් වෙළෙඳාම පිණිස දරා සිටින වශයෙන් වර්ගීකරණය කෙරෙන අතර සාධාරණ අගය අනුව හඳුනා ගනී.

(ආ) ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන වශයෙන් නම් කරන ලද මූල්‍ය උපකරණ

මුල් වරට හඳුනාගැනීම මත, මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන වශයෙන් නම් කෙරේ. කිසියම් මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරනු ලබන්නේ, එසේ කිරීම තුළින් වත්කම් හෝ බැරකම් වෙනස් වූ පදනම් මත මිනුම්කරණය ඔස්සේ පැන නැගිය හැකි මිනුම්කරණ සහ හඳුනාගැනීමේ අනනුකූලතාවයන් සම්පූර්ණයෙන් ඉවත් කරයිනම් හෝ සැළකිය යුතු මට්ටමින් අවප්‍රමාණය කෙරේ නම් පමණි. (එනම් ගිණුම්කරණ නොගැලපීම් ඉවත්කිරීම)

කිසියම් මූල්‍ය බැරකමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරනු ලබන්නේ එමගින් ගිණුම්කරණ නොගැළපීම ඉවත් කෙරේ නම් හෝ සැළකිය යුතු මට්ටමින් අවප්‍රමාණය කෙරේ නම් හෝ:

- ධාරක ගිවිසුමක් අන්තර්ගත ව්‍යුත්පන්න එකක් හෝ වැඩි ගණනකින් සමන්විත වන්නේ නම්: හෝ
- මූල්‍ය වත්කම් හා බැරකම් ද්විත්වයම කළමනාකරණය සහ ඒවායේ කාර්යසාධනය ලේඛණගත අවදානම් කළමනාකරණ හෝ ආයෝජන ක්‍රමෝපායකට අනුකූලව සාධාරණ අගය පදනමක් මත තක්සේරු කෙරෙන්නේ නම් පමණි.

මූල්‍ය බැරකමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය නම් කරනු ලබන අවස්ථාවකදී, බැංකුවේ ස්වකීය බැරකම් තත්ත්වය තුළ ආරෝපනය කළ යුතු සාධාරණ අගයෙහි වෙනස්වීම නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල පොලී අනුපාතිකයන්ට ඉහළින් බැරකම පැතිරීමේ වෙනස්වීම් නිර්ණය කිරීමෙන් ගණනය කරනු ලබන අතර, වෙනත් විස්තීර්ණ ආදායම තුළ වෙන වෙනම ඉදිරිපත් කෙරේ

5.5.4 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සහ ඉදිරි රැකුම් ගිණුම්කරණය

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ යනු ගිවිසුම් වන අතර ඒවායේ වටිනාකම එයට පාදක වූ මිල, දර්ශක හෝ වෙනත් විචල්‍යන් එකක් හෝ කිහිපයකින් ව්‍යුපත්පන්න වන අතර, සාමාන්‍යයෙන් මේවා හුවමාරු, ඉදිරිගාමී අනුපාතික ගිවිසුම්, අනාගතයන් සහ වරණයන්ගෙන් සමන්විත වේ.

ව්‍යුත්පන්නයන් බලාත්මක ඉදිරි රැකුම් සබඳතාවයක කොටස් වූ සහ ඉදිරි රැකුම් ව්‍යුත්පන්නයන් වශයෙන් නම් කරන ලද අවස්ථාවක හැරුනු විට, සියළු ව්‍යුත්පන්නයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේදී සාධාරණ අගය අනුව හඳුනාගැනෙන අතර වෙළෙඳ කටයුතු වශයෙන් වර්ගීකරණය කෙරේ. ව්‍යුත්පන්නයක ධාරක අගය ගිවිසුමෙහි ජීව කාලය පුරා සාධාරණ අගයට ප්‍රතිමිනුම්කරණය කෙරේ. ව්‍යුත්පන්නයන් ඒවායේ සාධාරණ අගට ධනාත්මක වන විට වත්කම් වශයෙන්ද සාධාරණ අගය සෘණාත්මක වන විට බැරකම් වශයෙන්ද ඉදිරියට ගෙන යනු ලබයි.

5.5.5 මූල්‍ය වත්කම් හා බැරකම් ප්‍රතිවර්ගීකරණය

SLFRS 9 ප්‍රමිතිය යොදා ගැනීමත් සමග, බැංකුව මගින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු එහි මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණ කරන ලද්දේ එබඳු මූල්‍ය වත්කමක් කළමනාකරණය සඳහා වන ව්‍යාපාර ආකෘතියෙහි වෙනසක් සිදුවුවහොත් පමණි. එබඳු ප්‍රතිවර්ගීකරණය ප්‍රතිවර්ගීකරණ දිනයේ සිට අනාගතයේ භාවිත කළ හැකි වශයෙන් යොදා ගැනේ. මූල්‍ය වගකීම් ප්‍රතිවර්ගීකරණය නොකරනු ලැබේ.

5.6 මූල්‍ය වත්කම් හානිකරණය

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය නොකෙරෙන පහත දැක්වෙන මූල්‍ය වත්කම් කාණ්ඩයන් සඳහා අපේක්ෂිත ණය අලාභය මැන බැලීම සඳහා බැංකුව/සමූහය විසින් අදියර තුනක ප්‍රවේශයක් යොදා ගනු ලබයි:

- ක්‍රමක්ෂය පිරිවැයට සහ අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන ණය සාධන පත්‍රත
- ණය බැඳීම්ත සහ
- මූල්‍ය ඇප ගිවිසුම්.

ස්කන්ධ ආයෝජනයන් මත කිසිදු අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගනු නොලැබේ.

මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානම වෙනස්වීම මත පදනම්ව මූල්‍ය වත්කම් පහත දැක්වෙන අදියර තුන හරහා සංක්‍රමණය වේ:

අදියර 1: මාස 12 අපේක්ෂිත ණය අලාභය

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් නොමැති වූ සහ ආරම්භයේ පටන් ණය හානිකරණය වී නොමැති නිරාවරණ සඳහා, ඊළඟ මාස 12 තුළ ඇති විය හැකි පැහැර හැරීමේ සිදුවීමේ සම්භාවිතාව ආශ්‍රිත ජීවකාල අපේක්ෂිත ණය අලාභ කොටස හඳුනාගනී.

බැංකුව සැළකිය යුතු ණය පිරිහීමක් නොමැති ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 අපේක්ෂිත ණය අලාභය තීරණය කරයි. (එනම් පසුගිය හිඟ දින 30ට අඩු)

අදියර 2: ජීව කාල අපේක්ෂිත ණය අලාභය – ණය හානිකරණයට ලක් නොකළ

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් සහිත වුහෙත් ණය හානිකරණයක් නොමැති නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත ණය අලාභයක් (එනම් මූල්‍ය වත්කමෙහි ඉතිරි වූ ජීව කාලය පිළිබිඹු කරන) හඳුනා ගනී.

බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව, අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය පහසුකම් හැරුනු විට, ප්‍රමිතියෙහි අවශ්‍යතාවන්ට අනුව සැළකිය යුතු හානිකරණය නියමිත දිනයෙන් පසු දින 30 ක් ගතවූ යන නිශ්ප්‍රභාත්මක උපකල්පනය ඔස්සේ මිනුම්ගත කෙරේ.

බැංකුව ණය පහසුකම්/නිරාවරණ, ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත ණය පහසුකම් අධිශ්‍රේණිගත කළ අවස්ථාවකදී හැරුනු විට, වාර දෙකක් දක්වා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළුම ප්‍රතිව්‍යුහගත ණය, මහ බැංකුව (CBSL) මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශය අනුව අදියර 2 යටතේ සළකා බැලීම කෙරෙහිද බැංකුවේ අවධානය යොමුව ඇත.

අදියර 3: ජීව කාල අපේක්ෂිත ණය අලාභය – ණය හානිකරණයට ලක් වූ

කිසියම් වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වෙත අහිතකර බලපෑමක් ඇති කරන ආකාරයේ සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදු වී ඇති විට ණය හානිකරණයට ලක් වූ වශයෙන් නිරාවරණ තක්සේරු කෙරේ. ණය හානිකරණයට ලක් වූ නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත ණය අලාභය හඳුනාගන්නා අතර, පොළි ආදායම දළ ධාරණ වටිනාකමට වඩා ක්‍රමක්ෂය පිරිවැය අනුව සවිල පොලී අනුපාතිකය (දළ ප්‍රතිපාදන වලින් ශුද්ධව) යොදා ගනිමින් ගණනය කෙරේ.

SLFRS 9 ප්‍රමිතියෙහි දක්වා ඇති පරිදි සහ අක්‍රීය ණයවලට අදාළ ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයන්ට යටත්ව බැංකුව, ගනුදෙනුකරුවකුගේ ගිවිසුම්ගත ගෙවීම් නියමිත දිනට වඩා දින 90 කට වැඩි සංඛ්‍යාවක් කල් ගතව ඇති විට අදාළ ණය පහසුකම පිළිබඳව තීරණයකට එළඹේ. ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත ණය පහසුකම්/වත්කම් අධිශ්‍රේණිගත කළ අවස්ථාවකදී හැරුනු විට, වාර දෙකකට වඩා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළුම ප්‍රතිව්‍යුහගත කළ ණය සහ ප්‍රතිසැකසුම්ගත ණය අදියර 3 යටතේ වන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන් අනුව අදාළ සියළුම ණය පහසුකම්/ගනුදෙනුකරුවන් අක්‍රීය වශයෙන් වර්ගීකරණයට ලක් කෙරේ.

මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය වූ (POCI) මූල්‍ය වත්කම්: මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම් අදියර 3 තුළ වර්ගීකරණය කෙරේ. වාර්තාකරණ දිනයේදී සමූහයට POCI ණය නොමැත.

5.6.1 හානිකරණයේ අදියර නිශ්චය කිරීම

එක් එක් වාර්තාකරණ දිනයේදී, වාර්තාකරණ දිනය හා මූලික හඳුනාගැනීමේ දිනය අතර අපේක්ෂිත ජීව කාලය මුළුල්ලේ ගෙවීම් පැහැරහැරීමක් සිදුවීමේ අවදානම හා සසඳමින්, බැංකුව මූලික හඳුනාගැනීමේ වත්කම් සම්බන්ධ සැළකිය යුතු ණය අවදානමෙහි වැඩිවීමක් පවතීද යන්න තක්සේරු කරයි. බැංකුව මගින් මෙම අරමුණ උදෙසා අනවශ්‍ය පිරිවැයක් හෝ ප්‍රයත්නයක් නොමැතිව ලබාගත හැකි අදාළ වන සාධාරණ සහ සහයෝගී තොරතුරු මෙහිදී සළකා බලනු ලබයි. මෙයට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු මෙන්ම අනාගතය දකින විශ්ලේෂණ ඇතුළත්ය.

වත්කම් තත්ත්වය පිරිහීමට ලක්වන බැවින් නිරාවරණයක් අපේක්ෂිත ණය අලාභයෙහි අදියර ඔස්සේ සංක්‍රමණය වේ. පසු කාලපරිච්ඡේදයකදී වත්කමෙහි තත්ත්වය වැඩිදියුණු වුවහොත් සහ කවර හෝ පෙර හඳුනාගත් ණය අවදානම් වැඩිවීමක් ප්‍රතිවර්තනය වුවහොත්, එවිට අඩමාන ණය සඳහා වෙන්කිරීම ජීව කාල අපේක්ෂිත ණය අලාභයෙහි සිට මාස 12 අපේක්ෂිත ණය අලාභය වෙත ප්‍රතිවර්තනය වේ. මූලික හඳුනාගැනීමේ සිට සැළකිය යුතු අන්දමින් පිරිහීමට ලක් නොවූ, හෝ පිරිහීම බැංකුවේ ආයෝජන ශ්‍රේණිගත කිරීමේ නිර්ණායක තුළ පවතින, හෝ පසුගිය හිඟ දින 30 කට අඩු නිරාවරණ පහළ ණය අවදානමක් සහිත ඒවා බවට සැළකේ. මෙවැනි මූල්‍ය වත්කම් සඳහා අඩමාන ණය වෙන්කිරීම මාස 12 අපේක්ෂිත ණය අලාභය මත පදනම් වේ. වත්කමක් එක්රැස් කරගත නොහැකි විටකදී, එය අදාළ වෙන් කිරීමෙන් කපා හරිනු ලබයි. එබඳු වත්කම් කපා හැරෙනුයේ, සියළුම අවශ්‍ය ක්‍රියාපටිපාටීන් සම්පූර්ණ කිරීමෙන් සහ අලාභ ප්‍රමාණය තීරණය කිරීමෙන් අනතුරුවය. පෙර කපාහරිනලද ප්‍රමාණවල පසුකාලීන අයකිරීම් ආදායම් ප්‍රකාශයේ වියදම් ප්‍රමාණය අඩු කරයි.

බැංකුව යම් නිරාවරණයක ණය අවදානම කේවල හෝ සාමූහික පදනමක් මත සැළකිය යුතු මට්ටමින් ඉහළ ගොස් ඇතිද යන්න තක්සේරු කරයි. හානිකරණයේ සාමූහික තක්සේරුකරණ අරමුණු උදෙසා, මූල්‍ය සාධන පත්‍ර ගිණුම් සාධන පත්‍ර වර්ගය, ණය අවදානම් ශ්‍රේණිගත කිරීම්, මූලික හඳුනාගැනීමේ දිනය, කල්පිරීම දක්වා ඉතිරි කාලසීමාව, ක්ෂේත්‍රය සහ වෙනත් කරුණු සැළකිල්ලට ගනිමින්, පොදු ණය අවදානම් ලක්ෂණ අනුව කාණ්ඩගත කෙරේ.

5.6.2 මූල්‍ය වත්කම් කපා හැරීම

ණය සහ ණය සුරැකුම්පත් අයකරගැනීමේ යථාර්තවාදී අපේක්ෂාවක් නොමැති විට වාර්ෂිකව (අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන්) කපා හරිනු ලබයි. මෙය පොදු අවස්ථාවක් වන්නේ කපාහැරීමට යටත් මුදල ආපසු ගෙවීමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ උත්පාදනය කළ හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර ණයකරුට නොමැති බව බැංකුව තීරණය කරන අවස්ථාවේදීය.

එසේ වුවත්, එම විශේෂ පහසුකම් කපාහැරීමට වසර දෙකකට එනම් කිසිදු මුදලක් ආපසු නොගෙවන ලද වසර දෙකකට පෙර (එනම් බැංකුව පොදුවේ සෑම වසරකම ජූනි 30 ලෙස සලකා බලමින් කපා හැරීමට පෙර වසර දෙක) අක්‍රීය ණය වර්ගීකරණයට මාරු කරනු ලබයි. කෙසේවෙතත්, කපාහරින මූල්‍ය වත්කම් හිඟ මුදල අයකර ගැනීම සඳහා බැංකුවේ ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම සඳහා බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගවලට යටත් වේ.

5.6.3 අපේක්ෂිත ණය අලාභ මිණුම්කරණය

අපේක්ෂිත ණය අලාභ අපක්ෂපාතී සහ සම්භාවිතාව මත බර තබන ලද අපේක්ෂිත අලාභවල ඇස්තමේන්තුවලින් ව්‍යුත්පන්න වන අතර, පහත දැක්වෙන පරිදි මිනුම්කරණය කෙරේ:

- වාර්තාකරණ දිනය වන විට ණය හානිකරණය නොවූ මූල්‍ය වත්කම්: සියළුම මුදල් හිඟයන්හි වර්තමාන වටිනාකම, මූල්‍ය වත්කමෙහි ජීව කාලය මුළුල්ලේ සළුල පොලී අනුපාතිකය අනුව වට්ටම් කෙරේ. මුදල් හිඟය යනු, ගිවිසුම අනුව බැංකුවට අය විය යුතු මුදල් ප්‍රවාහ සහ බැංකුව ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසය.
- වාර්තාකරණ දින වන විට ණය හානිකරණය නොවූ වත්කම්: දළ ධාරණ මුදල් ප්‍රමාණය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස සළුල පොලී අනුපාතිකය අනුව වට්ටම් කෙරේ.
- ඉටුකරන ලද ණය බැඳීම්: බැඳීම ඉටු කළහොත් බැංකුව වෙත අය විය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ බැංකුව ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසෙහි වර්තමාන වටිනාකම වේ.
- මූල්‍යමය ඇප ගිවිසුම්: බැංකුව මගින් අය කර ගැනීමට අපේක්ෂා කරනු ලබන කවර හෝ මුදලක් අඩුකොට, දරන්නා වෙත ප්‍රතිපූර්ණය කිරීමට අපේක්ෂිත ගෙවීම් වශයෙන් වේ.

අපේක්ෂිත ණය අලාභයන් අදායම් ප්‍රකාශය තුළ අඩමාන ණය සඳහා වෙන්කිරීමක් යොදාගනිමින් හඳුනාගැනේ. අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය සාධන පත්‍ර මිනුම්කරණය කෙරෙන අවස්ථාවන් හිදී, අපේක්ෂිත ණය අලාභයන් මිනුම්කරණය ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් සඳහා යොදාගත් තුන් අදියර ප්‍රවේශය මත පදනම් වේ. බැංකුව මගින් ප්‍රතිපාදන ගාස්තුව ආදායම් ප්‍රකාශය තුළද, අනුරූප මුදල අනෙකුත් විස්තීර්ණ ආදායම තුළද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ වත්කමෙහි ධාරණ වටිනාකමෙහි කිසිදු අඩුකිරීමක් නොකර ද හඳුනා ගනී.

5.7 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනාගැනීම බැහැර කිරීම

5.7.1 මූල්‍ය වත්කම්

වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය අවසන් වූ විට හෝ වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය බැංකුව වත්කමෙහි සියළු අවදානම් සහ ප්‍රතිලාභයන් නිත්‍ය වශයෙන් අන් අයට පවරා තිබීම යන අවස්ථාවන්හිදී බැංකුව විසින් මූල්‍ය වත්කමක් හඳුනාගැනීම බැහැර කරනු ලැබේ. බැංකුව විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳවාගෙන සිටින මාරු කරන ලද මූල්‍ය වත්කම කවර හෝ හිමිකමක් වෙනම වත්කමක් හෝ බැරකමක් වශයෙන් හඳුනාගනී.

5.7.2 මූල්‍ය වගකීම්

බැරකම යටතේ පවතින බැඳීම අත්හළ විට හෝ අදාළ ගිවිසුම අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට බැංකුව මඟින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් මූල්‍ය බැරකම හඳුනාගැනීම බැහැර කරනු ලැබේ.

5.7.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම්

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරන්නේ, වටිනාකම් හිලව් කිරීමට බැංකුවට නීතිමය අයිතියක් ඇති සහ ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් වත්කම උපලබ්ධි කර ඒ සමඟම බැරකම් නිරවුල් කිරීමට අභිප්‍රායක් ඇති අවස්ථාවලදී පමණි.

5.8 කල්බදු

5.8.1 මූල්‍ය කල්බදු ආදායම

නෛතික හිමිකම හැර හිමිකාරිත්වය හා සබැඳි සියළුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැළකිය යුතු ලෙස ගනුදෙනුකරුවන් වෙත මාරුකරමින් ගනුදෙනුකරුවන් වෙත කල්බදු මත ලබාදෙන ලද වත්කම් මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණය කෙරේ. මූල්‍ය කල්බදු යටතේ ලැබිය යුතු මුදල් ලැබිය යුතු කල්බදු කුලිය යටතේ ඇතුළත් කරනු ලබයි. ලැබුනු මූලික කුලිය අඩු කිරීමෙන් පසුව, කල්බදු ශේෂයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කොට ඇත.

කල්බදු මත ලබාදී ඇති වත්කම්වල පිරිවැය ඉක්මවා ලැබිය යුතු සමුච්චිත කුලිවල අතිරික්තයෙන් මුළු නොපියවූ ආදායම සැදුම් ලබයි. කල්බදු දීම ක්‍රියාත්මක වූ මාසයෙන් ආරම්භ වූ බදු කාලසීමාව පුරා නොඉපයූ ආදායම, බද්දේ ඉතිරිව පවතින ලැබිය යුතු ශේෂයට සමානුපාතිකව ආදායමට ඇතුළත් කෙරේ.

5.8.2 SLFRS 16 – කල්බදු

SLFRS 16 – (කල්බදු) මඟින් කල්බදු හඳුනාගැනීම, අගයකිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම පිළිබඳ මූලධර්ම නියම කරයි.

සමූහය කල්බදු ආරම්භ කරන දිනයට භාවිතයට අයිතිය ඇති වත්කම් සහ කල්බදු වගකීම් හඳුනාගනී. භාවිතයට අයිතිය ඇති වත්කම් මූලිකව ආරම්භක දිනයට හෝ ඊට පෙර සිදුකළ යම් කල්බදු ගෙවීම් සඳහා ගලපන ලද කල්බදු වගකීමේ මුල් මුදල ඇතුළත් පිරිවැයට මනිනු ලැබේ. භාවිතයට අයිතිය ඇති වත්කම් පසුව ආරම්භක දිනයේ සිට කල්බදු කාලය අවසන් වන දිනය දක්වා සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් ක්ෂය කරනු ලැබේ. ඊට අමතරව, භාවිතයට අයිතිය ඇති වත්කම් හානිකරන අලාභ ඇත්නම් කලින් කල අඩුකරන අතර, කල්බදු වගකීමේ සමහර නැවත මැනීම් සඳහා ගලපනු ලැබේ.

කල්බදු වගකීම් මූලිකවම ආරම්භක දිනය ගෙවා නොමැති වර්තමාන වටිනාකමට අගය කරන අතර කල්බද්දේ ගම්‍ය පොළී අනුපාතය හෝ එම අනුපාතය පහසුවෙන් තීරණය කර නොහැකිනම් සමූහයේ වර්ධක ණය අනුපාතය භාවිතයෙන් වට්ටම් කෙරේ. පොදුවේ, සමූහය එහි වර්ධක ණය අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි. කල්බදු වගකීම පසුව ඵලදායී පොළී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් ඇති අවස්ථාවේදී එය නැවත මනිනු ලැබේ.

ඊට අමතරව, බැංකුව/සමූහය විසින් LKAS 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස මෙයට පෙර වර්ගීකරණය කළ කල්බදුවල SLFRS 16 විසින් අවසර දෙන ලද පහත සඳහන් ප්‍රායෝගික ක්‍රියාමාර්ග යොදා ගනු ලැබිය.

- සාධාරණ සමාන ගතිලක්ෂණ සහිත කල්බදු කළඹකට තනි වට්ටම් අනුපාතයක් යොදා ගැනීම.
- මූලික යොදා ගැනීමේ දිනයට භාවිතයට අයිතිය ඇති වත්කම් අගය කිරීමේ මූලික සෘජු පිරිවැය ඉවත් කිරීම

සමූහය මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 28 යටතේ භාවිතයට අයිතිය ඇති වත්කම් ඉදිරිපත් කරන අතර අනුරූප කල්බදු වගකීම සටහන 35 "වෙනත් වගකීම්" හි ඉදිරිපත් කෙරේ.

5.9 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් හා කෙටිකාලීන අරමුදල්වලට අතැති මුදල්, බැංකුවල පවතින ශේෂයන්, වීක්ෂණ මුදල් සහ කෙටිකාලීන දැන්වීම් මුදල් ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 17 හි මුදල් සහ කෙටිකාලීන අරමුදල පිළිබඳ විස්තර දක්වා ඇත.

5.10 අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්න

අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්නවලට වෙළෙඳ වත්කම් සහ බැරකම් වශයෙන් වර්ගීකරණය නොකරන ලද සියළුම ව්‍යුත්පන්න වත්කම් සහ බැරකම් ඇතුළත් වේ. අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්න මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට මිනුම් කෙරේ.

5.11 ආයෝජන දේපල

කුලී ආදායම ඉපැයීම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ මෙම කරුණු දෙකම වෙනුවෙන් දරා සිටින ඉනමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම සඳහා නොපවතින දේපළ ආයෝජන දේපළ වේ. මේවා භාණ්ඩ හා සේවා නිපැයුම හෝ සැපයුම හෝ පරිපාලන කාර්යයන් වෙනුවෙන් භාවිතා කෙරේ.

5.11.1 හඳුනාගැනීමේ පදනම

ආයෝජන දේපළ හා සබැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමේ සම්භාවිතාවක් පවතී නම් සහ ආයෝජන දේපලෙහි පිරිවැය විශ්වසනීය ලෙස මිනුම්කරණය කළ හැකි වේ නම් ආයෝජන දේපළ හඳුනාගැනීම සිදුවේ.

5.11.2 මිනුම්කරණය

ආයෝජන දේපළක් මූලිකමව එහි පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. මිලට ගත් ආයෝජන දේපළක පිරිවැය, එය මිලදීගත් මිල සහ සෘජුවම ආරෝපනය වන වියදම් වලින් සැදුම් ලබයි. ස්වයං නිර්මිත ආයෝජන දේපළක පිරිවැය, ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීම අවසන් කරන ලද දිනට එහි පිරිවැය වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – LKAS – 40 "අයෝජන දේපළ" අනුකූලව සමූහය ආයෝජන දේපළ සඳහා පිරිවැය ආකෘතිය යොදා ගනී. ඒ අනුව, ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරන ලද ඉඩම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට සඳහන් කරන අතර, ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරන ලද ගොඩනැගිලි සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කර පිරිවැයට සඳහන් කරනු ලැබේ.

5.12 අස්පෘශ්‍ය වත්කම් හා කීර්තිනාමය

5.12.1 කීර්තිනාමය

අත්පත් කරගැනීමේ දිනට අත්පත් කරගත් පරිපාලිත සමාගමෙහි ශුද්ධ හඳුනාගත හැකි වත්කම්වල සමූහයේ කොටස සතු සාධාරණ අගය ඉක්මවන අත්පත් කරගැනීමේ පිරිවැයෙහි අතිරික්තය කීර්තිනාමය නියෝජනය කරයි. ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය හානිකරණය සම්බන්ධයෙන් වාර්ෂිකව හෝ සිදුවීම් හෝ පවතින තත්ත්වයන් වෙනස්වීම් එය හානි වී ඇති බව හඟවයි නම්, එයටත් වඩා අඩු කාල රාමු තුළ පරීක්ෂා කර සමුච්චිත හානිකරණ අලාභ අඩු කර පිරිවැයට ධාරණය කෙරේ. කීර්තිනාමය මත හානිකරණ අලාභ ප්‍රතිවර්තනය නොකෙරේ.

5.12.2 මෘදුකාංග

සමූහය විසින් අත්පත් කරගන්නා ලද මෘදුකාංග, සමුච්චිත ක්‍රමක්ෂය සහ හානිකරණ අලාභ අඩු කර පිරිවැයට මිනුම්කරණය කරන ලැබේ.

සමූහය විසින් අදාළ සංවර්ධනය සම්පූර්ණ කිරීමේ සිය අභිප්‍රාය සහ හැකියාව විදහා දැක්වීමට, අනාගත ආර්ථික ප්‍රතිලාභ උපදවන ආකාරයෙන් මෘදුකාංගය භාවිතා කිරීමට සහ අදාළ සංවර්ධනය සම්පූර්ණ කිරීමේ පිරිවැය විශ්වසනීය අයුරින් මැනිය හැකි වූ විට, අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංග මත වියදම් වත්කමක් ලෙස හඳුනා ගනී. අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංගවල ප්‍රාග්ධනිත පිරිවැයට එම මෘදුකාංගය සකස් කිරීම වෙනුවෙන් සෘජුවම පැවරිය හැකි සියළු පිරිවැය සහ ප්‍රාග්ධනිත ණය ගැනීම් පිරිවැය ඇතුළත් වන අතර, එම ප්‍රාග්ධනිත පිරිවැය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කෙරේ. සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් හානිකරණය අඩු කළ ප්‍රාග්ධනිත පිරිවැයට අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංග සඳහන් කරන ලැබේ.

මෘදුකාංග වත්කම් වෙනුවෙන් පසුකාලීනව කෙරෙන වියදම් ප්‍රාග්ධනීයකරණය කරනු ලබන්නේ එය සම්බන්ධව ඇති නිශ්චිත වත්කමෙහි ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ වී මගින් වැඩි වන විට පමණි. අනෙකුත් සියළුම වියදම් වීවා දරන ලද ආකාරයට වියදම් කෙරේ.

5.12.3 ක්‍රමක්ෂය

මෘදුකාංග භාවිතයට ලබාගත හැකි දින සිට එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මුළුල්ලේ ආදායම් ප්‍රකාශය තුළ සරල මාර්ගික පදනමක් මත ක්‍රමක්ෂය කෙරේ. වර්තන හා සාපේක්ෂ කාලසීමාවන් සඳහා මෘදුකාංගයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය වසර පහකි.

ක්‍රමක්ෂය ක්‍රම, ඵලදායී ජීව කාල සහ අවශේෂ අගයන් සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කර යෝග්‍ය පරිදි ගැලපීම් කරනු ලැබේ.

5.13 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

5.13.1 හඳුනාගැනීමේ පදනම

වත්කමක් හානිකරණය පිළිබඳ හැඟවීමක් තිබේද යන්න බැංකුව සෑම වාර්තාකරණ දිනටම තක්සේරු කරයි. කිසියම් හැඟවීමක් ඇති නම්, හෝ වත්කමක් වෙනුවෙන් වාර්ෂික හානිකරණ පරීක්ෂාව අවශ්‍ය වන්නේ නම්, බැංකුව වත්කමෙහි නැවත අයකර ගත හැකි වටිනාකම ඇස්මේන්තු කරයි. වත්කමේ නැවත අයකර ගත හැකි වටිනාකම යනු වත්කමක හෝ මුදල් ජනන ඒකකයක විකිණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගය සහ එහි භාවිත අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය වේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක ධාරණ අගය එහි නැවත අය කර ගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවක වත්කම හානිකරණ වූ ලෙස සලකනු ලබන අතර, එහි නැවත අය කරගත හැකි අගයට සටහන් කරනු ලැබේ. භාවිත අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාල අගය සහ වත්කමට සුවිශේෂී වූ අවදානම්වල ප්‍රවර්තන වෙළෙඳපොල තක්සේරු පිළිබිඹු කරන බදු වලට පෙර වට්ටම් අනුපාතිකයක් භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකිණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගය නිශ්චය කිරීමේදී, සුදුසු තක්සේරු ක්‍රමයක් භාවිතා කෙරේ. තක්සේරු ගුණිත, ප්‍රසිද්ධියේ වෙළෙඳාම් කරන පරිපාලිත සමාගම්වල මිල ප්‍රකාශිත කොටස් මිල ගණන් හෝ වෙනත් පවතින සාධාරණ අගය දර්ශක මගින් මෙම ගණනය කිරීම් තහවුරු කරනු ලබයි.

5.13.2 මිණුම්කරණය

කීර්තිනාමය හැර වෙනත් වත්කම් සඳහා, පෙර හඳුනාගන්නා ලද හානිකරණ අලාභ තවදුරටත් නොපවතීද නැතහොත් අඩුවීද යන්න පිළිබඳ හැඟවීමක් තිබේද යන්න සම්බන්ධයෙන් සෑම වාර්තාකරන දිනටම තක්සේරුවක් කරනු ලැබේ. එවැනි හැඟවීමක් පවතී නම්, බැංකුව වත්කමෙහි හෝ මුදල් ජනන ඒකකයෙහි නැවත අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරයි. අවසන් වරට හානිකරණ අලාභය හඳුනාගැනීමේ සිට වත්කමෙහි නැවත අය කර ගත හැකි වටිනාකම නිශ්චය කිරීම පිණිස භාවිත කරන ලද උපකල්පනවල වෙනසක් සිදුවී තිබේ නම් පමණක් පූර්වයෙන් හඳුනාගනු ලැබූ හානිකරණයක් ප්‍රතිවර්තනය කෙරේ. පෙර වර්ෂයේදී වත්කම් වෙනුවෙන් කිසිදු හානිකරණයක් හඳුනාගෙන නොතිබිණි නම්, වත්කමෙහි ධාරණ අගය එහි නැවත අය කර ගත හැකි වටිනාකම නොඉක්මවන පරිදි ක්ෂය අඩු කළ නිශ්චය කළ හැකිව තිබූ ධාරණ අගය නොඉක්මවන පරිදි ප්‍රතිවර්තනය සීමා කරනු ලැබේ. එවැනි ප්‍රතිවර්තන ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

කීර්තිනාමය සම්බන්ධ හානිකරණ අලාභ, අනාගත කාලපරිච්ඡේදයන් තුළ ප්‍රතිවර්තනය නොකෙරේ.

හානිකරණය වීම සම්බන්ධයෙන් කීර්තිනාමය වාර්ෂිකව හෝ සිදුවීම් හෝ තත්ත්වයන්හි වෙනස්වීම් මගින් ධාරණ අගය හානිකරණය වී ඇති බව හැඟවේ නම් එයට වැඩි වාරගණනක් සමලෝචනය සිදු කෙරේ. හානිකරණ පරීක්ෂා කිරීමේ කාර්යය වෙනුවෙන් ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය, එම අත්පත් කරගැනීමේ දිනයේ සිට අත්පත් කරගනු ලැබූ සමාගමෙහි අනෙකුත් වත්කම් හා බැරකම් බැංකුවේ මුදල් ජනන ඒකක හෝ සමූහයේ මුදල් ජනන ඒකක කාණ්ඩ වලට පවරා තිබේද යන්න නොසළකා, එම සංයෝජනය සහ ක්‍රියාවන් වෙතින් ප්‍රතිලාභ ලැබීම අපේක්ෂිත එම එක් එක් ඒකකය වෙත පවරනු ලැබේ. කීර්තිනාමය පවරනු ලැබූ එක් එක් ඒකකය, අභ්‍යන්තර කළමනාකරණ කාර්යයන් වෙනුවෙන් කීර්තිනාමය අධීක්ෂණය කරනු ලබන අවම මට්ටම නියෝජනය කරන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 "මෙහෙයුම් බණ්ඩ" සමග අනුකූලව මෙහෙයුම් බණ්ඩයකට වඩා විශාල නොවේ.

කීර්තිනාමය මුදල් ජනන ඒකකයක (හෝ මුදල් ජනන ඒකක සමූහයක) කොටසක් සහ එම ඒකකය තුළ උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුම්වල කොටසක් නිර්මාණය කරන විට, එම මෙහෙයුම උපයෝජ්‍ය කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කිරීමේදී උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුම හා සබැඳි කීර්තිනාමය මෙහෙයුමෙහි ධාරණ අගයට ඇතුළත් කරනු ලැබේ. මෙම තත්ත්වය තුළ උපයෝජ්‍ය කරනු ලබන කීර්තිනාමය, උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුමෙහි සහ රඳවාගත් මුදල් ජනන ඒකකවල කොටසෙහි සාපේක්ෂ අගයන් මත පදනම්ව මිනුම්කරණය කෙරේ.

පරිපාලිත සමාගම් විකිණීම සිදුකෙරෙන විට, විකිණුම් මිල සහ ශුද්ධ වත්කම් අතර වෙනස සහ සමුච්චිත පරිවර්තන වෙනස්කම් හා කීර්තිනාමය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

5.14 විශ්‍රාම ප්‍රතිලාභ GRI 201-3

5.14.1 නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

5.14.1.1 1996 පෙර – විශ්‍රාම භාර අරමුදල

1996 ජනවාරි 1 දිනට පෙර බැංකුවේ සේවයට බඳවා ගත් ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුමක් බැංකුව ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා වෙනමම පරිපාලනය කෙරෙන අරමුදලක් වෙත දායකත්වය ලබාදීම අවශ්‍ය වේ. මෙම විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ වියදම, ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වෙනමම තීරණය කරනු ලැබේ.

අඩු කිරීම් නොමැතිව මෙතෙක් හඳුනාගෙන නොමැති අතීත සේවා පිරිවැය, බැඳීම් සෘජුවම පියවීමට ඇති සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මෙතෙක් හඳුනාගෙන නොමැති ආයුගණක අලාභ අඩු කළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගයෙන් නිශ්චිත ප්‍රතිලාභ වත්කම් හෝ බැරකම් සමන්විත වේ. යම් වත්කමක අගය මෙතෙක් හඳුනාගෙන නොමැති ආයුගණක අලාභ සහ අතීත සේවා පිරිවැය චිකතුව, සැලසුමෙන් ආපසු ගෙවීම් ආකාරයෙන් පවතින කවර හෝ ආර්ථික ප්‍රතිලාභ හෝ සැලසුම වෙත අනාගත දායකත්වයන්ගේ අඩු කිරීම් වලට සීමා කෙරේ.

නවතම ආයුගණක තක්සේරුව ඇමරිකානු ආයුගණක ඇකඩමියේ සාමාජික හා අයුගණනය පිළිබඳ උපදේශක පියල් විස් ගුණතිලක මහතා F.S.A (USA) විසින් 2024 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලදී.

විශ්‍රාම ගන්නා සේවකයින් වෙත බැංකුව පහත දැක්වෙන පදනම මත විශ්‍රාම වැටුපක් ලබා දේ. සේවකයකු වසර 10 සම්පූර්ණ කළ පසු හා සාමාන්‍ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 සම්පූර්ණ කල පසු විශ්‍රාම වැටුප් ලැබීමේ සුදුසුකම් ලබයි. ගෙවනු ලබන විශ්‍රාම වැටුපේ ප්‍රමාණය පහත පරිදි සේවා කාලය මත රඳා පවතී:

සේවා කාලය	විශ්‍රාම වැටුපේ ප්‍රමාණය
i. වසර 10 සිට 20 දක්වා	අවසන් වරට ලද දළ වැටුපෙන් 80%කි
ii. වසර 21 සිට 29 දක්වා	අවසන් වරට ලබාගත් දළ වැටුපෙන් 80% සහ වසර 20කට වැඩි එක් එක් අමතර වසර සඳහා 1%.
iii. වසර 30 සහ ඉහළ	අවසන් වරට ලබාගත් දළ වැටුපෙන් 90%

විශ්‍රාම වැටුප් භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වෙනම පවත්වා ගෙන යනු ලබන අතර, එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට යටත් වේ. මූල්‍ය ප්‍රකාශ මෙන්ම විගණකගේ වාර්තාවද ඉදිරිපත් කරනු ලබන අතර භාරකාර මණ්ඩලය විසින් ඒවා සමාලෝචනය කරනු ලබයි. අරමුදල අවශ්‍ය මට්ටම්වල සිදුකරන බව සහතික කිරීමේ බැඳීමක් බැංකුවට ඇති බැවින් මෙම මූල්‍ය ප්‍රකාශ හා විගණකගේ වාර්තාව බැංකුවේ නිරාවරණ පිළිබඳ සමාලෝචනය සඳහා ද ඉදිරිපත් කරනු ලැබේ. විශ්‍රාමිකයා ජීවත් වන තාක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවීමට නියමිතය.

5.14.1.2 පශ්චාත් – 1996 – විශ්‍රාම වැටුප් අරමුදල

මුදල් අමාත්‍යාංශය මගින් අනුමත කළ පරිදි, 1996 ජනවාරි 1 දිනෙන් පසුව බැංකුවේ සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා නව විශ්‍රාම අරමුදලක් හඳුන්වාදීමේ කටයුතු බැංකුව විසින් අවසන් කොට ඇත. බැංකුව විසින් මෙය නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් වශයෙන් නිගමනය කර තිබෙන බැවින්, අතිරික්තය/හිඟය LKAS 19 අනුව වාර්තා කොට ඇත.

නවතම ආයුගණක තක්සේරුව ඇමරිකානු ආයුගණක ඇකඩමියේ සාමාජික හා අයුගණනය පිළිබඳ උපදේශක පියල් චිස් ගුණතිලක මහතා F.S.A (USA) විසින් 2024 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලදී.

5.14.1.3 පාරිතෝෂිතය

1996 ජනවාරි 1 දින හෝ පසුව බැංකුවේ සේවයට බැඳුනු සේවකයින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික ලැබීමට සුදුසුකම් ලබන අතර, එසේ නැතහොත් යෝජිත පශ්චාත් 1996 නව විශ්‍රාම වැටුප් වැටුප් අරමුදලට එක්වීමට මනාපය පළ කළ හැකි අතර, එවිට පාරිතෝෂිකයට ඇති අයිතිය අහෝසි වේ.

විශ්‍රාම ගැනීම හැරුනු විට, අන් ආකාරයකින් සේවය අවසන් කරන ලද සෙසු සේවකයින්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ වසර 5 කට වැඩි කාලයක් සේවය කර ඇති සේවකයින් සඳහා අබණ්ඩව සේවය කළ සෑම වසරක් වෙනුවෙන් සේවය නතර කරන ලද මූල්‍ය වසරේ අවසන් මාසයට අදාළ දළ වැටුපෙන් එක් අර්ධයක අනුපාතයට සමාප්තික පාරිතෝෂිකය ලැබීමේ සුදුසුකම් ලබයි.

වසර පහකට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කොට ඇති සාමාජිකයෙක් පූර්ණ හා සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වුවහොත්, ඔහු ආබාධිත පාරිතෝෂික ලබාගැනීමට සුදුසුකම් ලබයි. තවද, වසර පහක අවම සේවා කාලයක් සහිත ක්‍රියාකාරී සාමාජිකයකු, සේවයේ නියුතුව සිටියදී වියෝ වුවහොත්, ඔහුගේ උරුමකරුවන් හට පාරිතෝෂික ප්‍රතිලාභයක් ගෙවනු ලැබේ.

බැංකුව එවැනි පාරිතෝෂික ගෙවීමේ බැරකම් වෙනුවෙන් මාසික වෙන්කිරීමක් සිදුකරන අතර මෙම වටිනාකම බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිබිඹු කෙරේ. බැංකුව මගින් ආයුගණක තක්සේරුව මත පදනම්ව වෙන් කිරීමක් සිදුකරන ලදී. කෙසේවුවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව බැංකුව විසින් ආයුගණක තක්සේරුව මත පදනම් වී පාරිතෝෂික බැරකම් වෙනුවෙන් වෙන්කිරීම් සිදු කරනු ලැබ ඇත.

බැංකුවේ පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් ද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික ලබා දේ. එම සමාගම්වල වසරක සේවයක් සම්පූර්ණ කර ඇති සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදු කරනු ලැබ ඇත. මෙම බැරකම් වෙනුවෙන් බාහිරව මුදල් යෙදවීමක් සිදු නොවේ.

5.14.2 නිශ්චිත දායකත්ව සැලසුම්

බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක්ද ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායකත්ව සැලසුමක් වෙත ගෙවියයුතු දායකත්වය සේවකයින් විසින් බැංකුවට ඉටු කරනු ලබන සේවාවන්ට අනුව සිදුකෙරෙන අතර, එය කාර්යමණ්ඩල වියදම් යටතේ වියදමක් ලෙස ගිණුම්ගත කෙරේ. නොගෙවූ දායක මුදල් බැරකමක් ලෙස වාර්තා කෙරේ.

බැංකුව පහත සඳහන් සැලසුම් සඳහා දායකත්වය ලබා දේ:

5.14.2.1 සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ සේවකයින් සේවකයින්ගේ මාසික දළ වැටුපෙන් (අතිකාල දීමනා හැර) 12% ක් සහ 8% ක් ලෙස පිළිවෙලින් අර්ථසාධක අරමුදලට දායක වේ. බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලක් වන අතර එය අභ්‍යන්තර වශයෙන් පවත්වාගෙන යනු ලැබේ.

5.14.2.2 සේවක භාර අරමුදල

සේවක භාරකාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සේවක භාරකාර අරමුදල වෙත බැංකුව සේවකයාගේ අතීකාල නොමැති දළ වැටුපෙන් 3% ක් දායක වේ.

5.15 වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් සැලසුම (1996 ට පෙර/1996 ට පසු)

සුදුසුකම් ලත් ආයුගණකවරයකුගේ උපදෙස් මත පදනම් වී, මෙම යෝජනා ක්‍රමය යටතේ අනාගත බැඳීම් සපුරාගැනීම සඳහා බැංකුව වෙනම අරමුදලක් පවත්වා ගෙන යයි. තවද. මෙම අරමුදලට සහභාගිවන්නන්/සේවකයින්ගේ දායකත්වය තුළින් පමණක් අරමුදල් ලබාගනී.

5.16 වෙන්කිරීම

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විට, එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගැබ් වූ සම්පත් බැහැරට ගලා යාමේ ඉඩකඩ පවතින විට හා බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි විට, වෙන් කිරීම් හඳුනාගනී. යම් වෙන් කිරීමකට අදාළ වියදම ප්‍රතිපූර්ණයක් වේ නම් එය අඩු කොට ආදායම් ප්‍රකාශය තුළ ඉදිරිපත් කෙරේ.

5.17 බැඳීම් සහ අසම්භාවතා

සියලුම දැනුවත් වගකීම් ප්‍රමාණය නිගමනය කිරීමේදී සියලුම ප්‍රත්‍යක්ෂ අවදානම් ගණනය කෙරේ. වෙන් වශයෙන් හෝ අන් ආකාරයකින් බැංකුව වගකීම් සහිත පරිපාලිත හෝ ආශ්‍රිත සමාගමක යම් අසම්භාව්‍යතා සහ ප්‍රාග්ධන බැඳීම්වල බැංකුවේ කොටස යෝග්‍ය අනාවරණයන් සමඟ ඇතුළත් කෙරේ.

5.17.1 හඳුනාගැනීමේ පදනම

සාමාන්‍ය ව්‍යාපාර ව්‍යවහාරය තුළ, බැංකුව විසින් ණයවර ලිපි, ඇප සුරැකුම් සහ ප්‍රතිග්‍රහනයන් අඩංගු මූල්‍ය ඇප ලබා දේ. මුදල් ඇප පහසුකමේ වටිනාකමට ඇති බැඳීම් යටතේ මුදල් තුළ මූලිකව හඳුනා ගනී.

අසම්භාව්‍ය බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ මාරුකිරීමේ සම්භාවිතාවක් නොපවතින හෝ විශ්වසනීය අයුරින් මිනුම් කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම්වලින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන විය හැකි වගකීම් වේ. අසම්භාව්‍ය බැරකම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගනු නොලබන අතර ඒවා දුරස්ථ වන්නේ නම් මිස හෙළිදරව් කරනු ලැබේ.

5.17.2 අගයකිරීම

මුදල් ඇපවලට අදාළ බැඳීම තුළ යම් වැඩිවීමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කෙරේ. ලැබෙන වාර්ෂික ඇපයේ ජීවකාලය පුරා සරල මාර්ගික පදනමක් මත "ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම" තුළ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනී.

5.18 බදු

5.18.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම්වලට ඇතුළත් වනුයේ අදාළ මූල්‍ය වර්ෂය සහ පෙර වර්ෂ වෙනුවෙන් ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයා වෙතින් ලැබිය යුතු හෝ එම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන්ය. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගන්නා බදු අනුපාත සහ බදු නීති මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනට පනවනු ලබන හෝ පසුකාලීනව පනවනු ලබන ඒවාය. ඒ අනුව, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත අනුකූලව මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 14 හි දක්වා ඇති අනුපාතයකට බදු අරමුණ ගලපා ඇති වර්ෂයේ ලාභ පදනම මත බදුකරණ සඳහා වෙන්කිරීම සිදු කෙරේ.

5.18.2 විලම්බිත බදුකරණය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් හා මූල්‍ය වර්තාකරණ කාර්යයන් වෙනුවෙන් ඒවායේ ධාරණ අගයන් අතර තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමය භාවිත කරමින් විලම්බිත බදු වෙන් කෙරේ.

5.18.2.1 විලම්බිත බදු බැරකම

පහත සඳහන් අවස්ථාවලදී හැර සියළු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැරකම් හඳුනා ගනී:

- ව්‍යාපාර සංයෝජනයක් නොවන හා ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයටද බදු අයකර ගත හැකි ලාභයට හෝ අලාභයටද බලපෑමක් නොකරන ගනුදෙනුවක කීර්තිනාමය හෝ වත්කමක් හෝ බැරකමක් මූලික හඳුනාගැනීම තුළින් විලම්බිත බදු බැරකම පැනනගින විට, සහ
- පරිපාලිත සමාගම්වල ආයෝජන හා සබැඳි බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය සඳහා කාලය නියම කිරීම පාලනය කළ හැකි හා දැකියහැකි අනාගතයේදී එම තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය නොවීමේ සම්භාවිතාවක් පවතින විට.

5.18.2.2 විලම්බිත බදු වත්කම්

සියළු අඩු කළ හැකි වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ. පහත සඳහන් අවස්ථාවන්හිදී හැරුනු විට භාවිත නොකළ බදු ණය සහ භාවිත නොකළ බදු අලාභ වල අඩු කළ හැකි තාවකාලික වෙනස සහ ඉරිදියට ගෙනයාම උපයෝජනය කිරීම සඳහා යොදාගැනීමට බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාව පවතින තාක් දුරට භාවිත නොකළ බදු ණය හා භාවිත නොකළ බදු අලාභ ඉදිරියට ගෙන යාමට හැකියාව ඇත:

- ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදි ගිණුම්කරණ ලාභයට හෝ බදුකළහැකි ලාභය හෝ අලාභයට බලපෑමක් නොවන ගනුදෙනුවක් තුළ වත්කමක් හෝ වගකීමක් මූලිකව හඳුනාගැනීමෙන් බදුකළහැකි තාවකාලික වෙනස්විම්වලට අදාළ විලම්භීත බදු වත්කම් උද්ගත වන විට සහ,
- පරිපාලිත සමාගම්වල ආයෝජන හා සබැඳි අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්විම් දැකියහැකි අනාගතයේදී ප්‍රතිවර්තනය වීමේ සහ තාවකාලික වෙනස උපයෝජනය කිරීම පිණිස බදු අය කළ හැකි ලාභ ලබාගැනීමේ හැකියාව පවතින තාක් දුරට විලම්බිත බදු වත්කම් හඳුනා ගනී.

සෑම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනකටම විලම්බිත බදු වත්කමක ධාරණ අගය සමාලෝචනය කර, විලම්බිත බදු වත්කමෙන් කොටසක් හෝ වීම වත්කම සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට අවස්ථාව සැලසීම පිණිස ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභ පැවතීමේ හැකියාවක් නොමැති තාක් දුරට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනකටම යළි තක්සේරු කර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම ආපසු අය කර ගැනීමට අවස්ථාව සැලසීමට හැකියාව පවතින තාක් දුරට හඳුනාගනු ලැබේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනට පනවනු ලැබ ඇති හෝ පසුකාලීනව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි වීමට හෝ බැරකම් බේරුම් කිරීමට නියමිත වර්ෂයට අදාළ වනු ඇතැයි අපේක්ෂිත බදු අනුපාතිකවලට විලම්බිත බදු වත්කම් හා බැරකම් මිනුම්කරණය කරනු ලැබේ.

5.18.3 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (FSVAT)

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25 අ වගන්තිය හා 2022 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වීහි සංශෝධනයන්ට අනුකූලව බැංකුවේ මුළු වටිනාකම එකතුව 18%ක එකතු කළ අගය මත බද්දකට යටත් කරන ලදී.

5.18.4 එකතු කළ අගය මත බද්ද (VAT)

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හා එහි පසුකාලීන සංශෝධනයන්ට අනුකූලව එකතු කළ අගය මත බද්ද ගණනය කෙරේ. එකතු කළ අගය මත බදු 18%ක අනුපාතයකට ගෙවිය යුතුය.

5.18.5 ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT)

දේශීය පරිපාලිත සමාගම්වල බදුකළහැකි ලාභයෙන් බෙදාහැරී ලාභාංශ මූලාශ්‍රයේ දී 15%ක අඩුකිරීමක් සිදු කරන අතර එය බැංකුවේ අවසාන බදු වගකීම වේ.

5.18.6 බෝග රක්ෂණ බදු (CIL)

2013 අංක 12 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව, 2013 අප්‍රේල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බෝග රක්ෂණ බද්ද හඳුන්වා දෙන ලදී. වී අනුව එක් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් බැංකුව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත බදුවලට පසු ලාභයෙන් 1% ක් ගෙවීම අවශ්‍ය වේ.

5.18.7 සමාජ ආරක්ෂණ දායක බදු (SSCL)

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායක බදු පනත යටතේ, වාර්ෂික බදුකළහැකි පිරිවැටුම රුපියල් මිලියන 120 ඉක්මවන පුද්ගලයින් මත 2.5%ක සමාජ ආරක්ෂණ බද්දක් පනවා ඇත.

5.19 ආදායම් සහ වියදම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලාඒන සහ ආදායම විශ්වසනීය ලෙස මිනුම්කරණය කළ හැකි තාක් දුරට ආදායම් හඳුනාගනු ලැබේ. එක් එක් වර්ගයේ ආදායම් සඳහා වන විශේෂිත හඳුනාගැනීමේ නිර්ණායක සටහන් 6 සිට 10 දක්වා ඉදිරිපත් කෙරේ.

5.19.1 රජයේ සුරුකුම්පත් හා ප්‍රතිවිකිණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරුකුම්පත් වෙතින් ආදායම

ස්ථීර ආවර්තක ලාභ අනුපාතයක් පිළිබිඹු කිරීම උදෙසා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම්/ආධික්‍යය අදාළ කාලපරිච්ඡේදය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. භාණ්ඩාගාර බැඳුම්කර මත කූපන් පොලිය උපචිත පදනමක් මත හඳුනාගනී. ප්‍රතිවිකිණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරුකුම්පත් මත පොලී ආදායම ගිවිසුමෙහි කාලපරිච්ඡේදය මුළුල්ලේ සවිල පොලී අනුපාතිකය මත ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනී.

5.19.2 කුලී ආදායම

මෙහෙයුම් කල්බදු මත ඇතිවන කුලී ආදායම ඉදිරියට යන කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත ගණනය කරන අතර, එය ආදායම් ප්‍රකාශයෙහි "වෙනත් මෙහෙයුම් ආදායම" යටතේ වාර්තා කෙරේ.

5.20 බණ්ඩ වාර්තාකරණය

බැංකුවේ බණ්ඩ වාර්තාකරණ පහත සඳහන් මෙහෙයුම් කාණ්ඩ වේ: පුද්ගල බැංකුකරණය, ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාරය සහ ප්‍රාථමික වෙළෙඳ චක්‍රකය, කල්බදු, රක්ෂණ, මූල්‍ය සහ සංචාර මත පදනම් වේ. ඉහත කරුණු සම්බන්ධ තොරතුරු සටහන 45හි අනාවරණය කෙරේ.

5.21 තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය

2010 සැප්තැම්බර් 27 වැනි දින නිකුත් කරන ලද 2010 අංක 5 දරන බැංකුකරණ පනත් නියමය "තැන්පතු බැරකම් රක්ෂණය" සහ පසුකාලීනව මෙයට සිදුකරන ලද සංශෝධන වලට අනුකූලව, 2010 ඔක්තෝබර් මස 1 දින සිට බල පැවැත්වෙන පරිදි, මුදල් නීති පනතේ 32අ සිට 32ඉ වගන්ති යටතේ නිකුත් කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා සහය යෝජනා ක්‍රම රෙගුලාසිවලට අනුකූලව, මුදල් මණ්ඩලය මගින් මෙහෙයවනු ලබන තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක සියළු බලපත්‍රලාභී බැංකු සිය තැන්පතු බැරකම් රක්ෂණය කිරීම අවශ්‍ය වේ. රක්ෂණය කළ යුතු තැන්පතුවලට පහත සඳහන් දෑ හැර ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු බැරකම් ඇතුළත් වේ.

- සාමාජික ආයතන වෙත තැන්පතු බැරකම්
- ශ්‍රී ලංකා රජය වෙත තැන්පතු බැරකම්
- බලපත්‍රලාභී බැංකුවල ආයතන පාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකුකරණ පනත් නියෝගයෙහි දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකාරිත්වය සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන් වෙත ප්‍රදානය කරන ලද තැන්පතු බැරකම්
- කවර හෝ ලබාදෙන ලද පහසුකම වෙනුවෙන් අතිරේක ඇප ලෙස රඳවාගත් තැන්පතු බැරකම්
- බැංකුකරණ පනත අනුව අත්හැර දමන ලද දේපළ යන අර්ථය යටතට ගැනෙන තැන්පතු බැරකම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරු කරනු ලැබ ඇති මූල්‍ය සමාගම් පනත අරමුදල් අනුව අක්‍රීය ගිණුම්

ආසන්නතම පූර්ව මූල්‍ය වර්ෂය අවසානයේදී බලපත්‍රලාභී වාණිජ බැංකු 14% හෝ එයට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් පවත්වා ගන්නේ නම්, බැංකුව සුදුසුකම්ලත් තැන්පතු බැරකම් මත 0.10% ක ආධික්‍යයක් ගෙවීම අවශ්‍ය වන අතර, අනෙකුත් සියළු වාණිජ බැංකු සඳහා (14% ට අඩු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් සහිත) කාර්තුව අවසානයට පවතින සුදුසුකම් ලත් තැන්පතුවල මුළු අගය මත ගණනය කෙරෙන හා කාර්තුව අවසාන වීමේ සිට දින 15 ක කාලපරිච්ඡේදයක් තුළ ගෙවිය යුතු 0.125% ක ආධික්‍යයක් ගෙවීම අවශ්‍ය වේ.

5.22 පසුකාලීන සිදුවීම්

වාර්තාකරණ දිනයට පසුව සිදුවන සිදුවීම් යනු වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අනුමැතිය ලබාදීමේ දිනය අතර, සිදුවන වාසිදායක හා අවාසිදායක සිදුවීම්ය.

වාර්තාකරණ දිනට පසුව සිදුවන සියළුම ප්‍රමාණාත්මක හා වැදගත් සිදුවීම් සළකා බලා අදාළ වන පරිදි ගැලපුම් කර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 42 හි අනාවරණය කෙරේ.

5.23 රක්ෂණ ක්ෂේත්‍රයට විශේෂිත ප්‍රතිපත්ති

5.23.1 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පන

ජීවිත රක්ෂණ නොවන ගිවිසුම් බැරකම්

ජීවිත රක්ෂණ නොවන ගිවිසුම් සඳහා, වාර්තාකරණ දිනට වාර්තා වී ඇති හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය සහ හිමිකම්පෑම් සිදුකර ඇති නමුත් වාර්තාකරණ දිනට වාර්තා වී නොමැති හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය යන දෙකටම ඇස්තමේන්තු සකස් කළ යුතුව ඇත. අවසාන හිමිකම් පිරිවැය නිශ්චිතව තහවුරු කළ හැකිවීමට පෙර සැළකිය යුතු කාලපරිච්ඡේදයක් ගතවීමට ඉඩ ඇති අතර, ඇතැම් වර්ගවල ඔප්පු වෙනුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි බැරකම් වලින් වැඩි කොටස සිදුවූ නමුත් වාර්තා නොවූ හිමිකම්වලින් සැදුම් ලබයි.

චේන් ලැඩර් සහ බෝන්හෙවුටර් – ෆර්ගසන් ක්‍රම සහ සංඛ්‍යාත/තීව්‍රතා ක්‍රම වැනි සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපන ශිල්පීය ක්‍රම රාශියක් භාවිත කරමින් නොගෙවූ හිමිකම්පෑම්වල අවසාන පිරිවැය ඇස්තමේන්තු කරනු ලබයි.

මෙම ශිල්පීය ක්‍රමවලට පාදක වන ප්‍රධාන උපකල්පන වනුයේ, සමාගමක අතීත හිමිකම්පෑම් විකාශන අත්දැකීම්, අනාගත හිමිකම්පෑම් විකාශනය ප්‍රක්ෂේපණය කර භාවිත කළ හැකි අතර, එබැවින් අවසාන හිමිකම් පිරිවැය ප්‍රක්ෂේපනයට භාවිත කළ හැකි බවයි. එබැවින්, මෙම ක්‍රම පෙර වර්ෂවල නිරීක්ෂණය කරන ලද විකාශනය හා අපේක්ෂිත අලාභ අනුපාතික මත පදනම්ව ගෙවූ හා සිදුවූ අලාභ, එක් හිමිකම්පෑමකට සාමාන්‍ය පිරිවැය හා හිමිකම්පෑම් සංඛ්‍යාව බහිර්නිර්වේෂණය කරයි. චෛතිහාසික හිමිකම්පෑම් විකාශනය ප්‍රධාන වශයෙන්ම අහඹු වර්ෂ මගින් විශ්ලේෂණය කෙරෙන නමුත්, භූගෝලීය ප්‍රදේශය මෙන්ම වැදගත් ව්‍යාපාර මාර්ග සහ හිමිකම් වර්ග අනුව තවදුරටත් විශ්ලේෂණය කරනු ලැබිය හැකිය. අලාභ ගැලපුම් ඇස්තමේන්තුවල මුහුණත් අගයට වෙන් කිරීමෙන් හෝ ඒවායේ අනාගත තත්ත්වය පිළිබිඹු කිරීම පිණිස වෙනම ප්‍රක්ෂේපණය කිරීමෙන් විශාල හිමිකම්පෑම් සාමාන්‍යයෙන් වෙනම ආමන්ත්‍රණය කරනු ලබයි. බොහෝ අවස්ථාවලදී, අනාගත හිමිකම්පෑම් උද්ධමන අනුපාතික හෝ අලාභ අනුපාතික සම්බන්ධයෙන් ප්‍රත්‍යක්ෂ උපකල්පන සිදු නොකෙරේ. ඒ වෙනුවට භාවිත කෙරෙන උපකල්පන වන්නේ ප්‍රක්ෂේපන පදනම් වන චෛතිහාසික හිමිකම් විකාශන දත්ත තුළ ගම්‍යවන ඒවාය.

සම්බන්ධ වී ඇති සියළු අවිනිශ්චිතතා සැළකිල්ලට ගනිමින් ඇති විය හැකි පුළුල් පරාසයක ප්‍රතිඵලය ඉදිරිපත් කෙරෙන හිමිකම්පෑමේ ඇස්තමේන්තුගත අවසාන පිරිවැය තීරණය කිරීම සඳහා අතීත ප්‍රවණතා අනාගතයේදී අදාළ නොවිය හැකි ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා අතිරේක ගුණාත්මක විනිශ්චය භාවිතා කරනු ලැබේ. (උදාහරණයක් ලෙස එක්වරක් පමණක් සිදුවන සිදුවීම්, හිමිකම්පැමි සම්බන්ධයෙන් ජනතා ආකල්පවල වෙනස්වීම් වැනි වෙළෙඳපොල සාධකවල වෙනස්වීම්, ආර්ථික තත්ත්වයන්, උද්ධමන මට්ටම්, අධිකරණ තීන්දු හා නීති වැනි බාහිර හෝ වෙළෙඳපොල සාධකවල වෙනස්වීම් මෙන්ම කළඹ මිශ්‍රණය ඔප්පු ලක්ෂණ හා හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටි)

නොඉපැයූ වාරිකය වෙනුවෙන් වෙන්කිරීම්වල ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේදී සමාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදාගනු ලැබේ. ගිවිසුමක් මගින් සැපයෙන රක්ෂණ සේවා රටාවට, කාල බෙදා වෙන්කිරීම හැර වෙනත් පදනමකින් නොඉපැයූ වාරිකය ක්‍රමක්ෂය කිරීම අවශ්‍ය වන්නේද යන්න තීරණය කිරීමේදී ද විනිශ්චය අවශ්‍ය වේ.

5.23.2 ආදායම් හඳුනාගැනීම

දළ ලිඛිත රක්ෂණ වාරිකය

ගිණුම්කරණ කාලසීමාව තුළදී එළඹී ගිවිසුම් සමගින් සැපයෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව වෙනුවෙන් ලැබිය යුතු මුළු රක්ෂණ වාරිකයෙන් ජීවිත රක්ෂණ නොවන දළ ලිඛිත වාරිකය සමන්විත වන අතර, ඔප්පුව ආරම්භ වන දිනට ඒවා හඳුනාගනු ලබයි.

ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරිකය

ගිණුම්කරණ කාලසීමාව තුළදී එළඹී ගිවිසුම් සමගින් සැපයෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව වෙනුවෙන් ගෙවිය යුතු මුළු රක්ෂණ වාරිකයෙන් ජීවිත රක්ෂණ නොවන දළ ප්‍රතිරක්ෂණ වාරිකය සමන්විත වන අතර, ඔප්පුව ආරම්භ වන දිනට ඒවා හඳුනාගනු ලැබේ. පූර්ව ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් තුළ ආරම්භ වන ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ පැනනගින කවර හෝ ගැලපුම් රක්ෂණ වාරිකයට ඇතුළත් වේ.

නොඉපැයූ ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරිකය යනු වර්ෂයක වාර්තාකරණ දිනට පසුව අවදානම් කාලපරිච්ඡේද හා සබැඳි ලිඛිත රක්ෂණ වාරික කොටස වේ. නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය එයට පාදක වන සෘජු රක්ෂණ ඔප්පු වල කාලසීමාව පුරා විලම්බනය කරනු ලැබේ.

5.24 නිකුත්කළ නමුත් මෙතෙක් බලාත්මක නොවූ ප්‍රමිති

මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමේ දිනයට නිකුත් කළ නමුත් එතෙක් බලාත්මක නොවූ නව සහ සංශෝධිත ප්‍රමිති පහත අනාවරණය කෙරේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – SLFRS 17 – රක්ෂණ ගිවිසුම්

	(8,816,475)	(7,223,196)	(5,919,009)	(5,694,312)	(66,908)	(40,637)	-	-	877,460	874,701	(97,511,227)	(77,542,330)
											-	-
	(2,055,554)	(2,359,107)	(272,229)	(262,898)	(10,777)	-			-	-	(18,833,907)	(7,884,639)
	4,384,323	2,888,254	429,386	521,578	5,835	37,002	-	-	(1,132,037)	(2,143,977)	28,775,867	11,385,663
											1,217,329	872,373
											27,558,540	10,513,290
											(3,374,088)	4,717,602
											25,401,780	16,103,264
											968,388	626,793
											24,433,392	15,476,471
	177,069,906	173,167,073	12,689,455	12,144,229	149,019	136,217			(16,001,551)	(15,442,383)	3,471,705,934	3,208,200,156
	177,069,906	173,167,073	12,689,455	12,144,229	149,019	136,217	-	-	(16,001,551)	(15,442,383)	3,471,705,934	3,208,200,156
	129,669,065	128,241,858	7,051,544	6,895,677	41,790	31,652			(10,809,821)	(10,089,874)	3,241,754,145	3,003,215,767
	129,669,065	128,241,858	7,051,544	6,895,677	41,790	31,652	-	-	(10,809,821)	(10,089,874)	3,241,754,145	3,003,215,767
	177,069,906	173,167,073	12,689,455	12,144,229	149,019	136,217			(16,001,551)	(15,442,383)	3,471,705,934	3,208,200,156

46. බදු පෙර ලාභයෙහි ඇතුළත් මූල්‍ය නොවන අයිතම

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2024 රු. '000	2023 රු. '000	2024 රු. '000	2023 රු. '000
දේපල, පිරියත හා උපකරණවල ක්ෂයවීම	2,196,844	1,916,687	2,459,150	2,182,351
භාවිතයට අයිතිය ඇති වත්කම්වල ක්‍රමක්ෂය	1,843,513	1,900,248	2,173,275	2,236,787
අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය	736,385	636,915	761,245	654,154
ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනය මත සාධාරණ අගයේ ලාභය	-	(78,902)	-	(78,902)
මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභ	5,450,173	7,437,572	4,204,573	5,821,772
අනෙකුත් හානිකරණ	-	-	221,765	253,793
ස්ථාවර වත්කම් විකිණීම මත ලාභය	(109,927)	(329,216)	(162,481)	(421,071)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල වෙනස්වීම්	5,549,474	1,770,703	5,549,474	1,770,703
වෙළෙඳ සුරැකුම්පත්වල සාධාරණ අගයේදී වෙනස්වීම	(730,503)	(480,955)	(730,503)	(480,955)
කොටස් ලාභාංශ ආදායම	-	(1,071,989)	-	-
කල්පිරෙන තෙක් රඳවාගන්නා ආයෝජනවල වාරික ක්‍රමක්ෂය	1,628,892	3,164,187	1,628,892	3,164,187
කල්බදු වගකීම්වල පොලී වියදම	777,336	768,293	973,828	1,002,226
එකතුව	17,342,187	15,633,544	17,079,218	16,105,045

47. මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2024 රු. '000	2023 රු. '000	2024 රු. '000	2023 රු. '000
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව රඳවාගත්	(184,895,099)	(138,147,039)	(184,244,422)	(139,225,576)
මහ බැංකුව සමග ශේෂයෙහි ශුද්ධ වැඩිවීම	(2,794,888)	36,599,094	(2,794,888)	36,599,094
බැංකුව සමග ස්ථාපනවල ශුද්ධ වැඩිවීම	6,395,218	(66,227,025)	14,867,438	(73,844,024)
බැංකු වෙතින් ණය සහ ලැබිය යුතු දෑ වල ශුද්ධ වැඩිවීම	22,027,584	(46,332,973)	17,374,459	(46,733,188)
ගනුදෙනුකරුවන්ට වෙතින් ණය සහ ලැබිය යුතු දෑවල ශුද්ධ වැඩිවීම	(80,540,321)	66,211,386	(108,045,008)	86,179,700
අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මූල්‍ය ආයෝජනවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	964,572	2,174,221	942,090	2,168,482
වෙනත් වත්කම්වල වෙනස	13,958,305	(9,075,620)	14,681,848	(8,101,695)
එකතුව	(224,884,629)	(154,797,956)	(247,218,483)	(142,957,207)

48. මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2024 රු. '000	2023 රු. '000	2024 රු. '000	2023 රු. '000
බැංකු වෙත ගෙවිය යුතු දෑ වෙනස්වීම	(40,383,911)	(34,228,352)	(38,774,887)	(37,050,711)
බැංකුවල තැන්පතු ගනුදෙනුකරුවන් සහ නිකුත්කළ ණය සුරුකුම්පත්වල වෙනස	201,598,648	281,586,648	202,743,063	295,082,573
වෙනත් ණය ගැනීම් වෙනස්වීම	11,267,152	(127,249,130)	11,259,152	(127,304,130)
වෙනත් බැරකම් වෙනස්වීම	38,584,008	(77,317,211)	41,168,929	(75,667,570)
එකතුව	211,065,897	42,791,955	216,396,257	55,060,162

49. මූල්‍ය අවදානම් කළමනාකරණ

හැඳින්වීම

මූල්‍යමය අතරමැදියකු වශයෙන්, සිය දෛනික මෙහෙයුම් තුළින් අවදානම් රැසකට බැංකුව නිරාවරණය වේ. බැංකුවේ ප්‍රධාන අවදානම් නිරාවරණයන්ට ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම්, නෛතික හා නියාමන, සහ තොරතුරු ආරක්ෂක අවදානම ඇතුළත් වේ. බැංකුවේ තිරසාරත්වය සහ ලාභදායීතාවය සහතික කරනු වස් එවැනි අවදානම් නිරාවරණ සක්‍රීයව හඳුනාගැනීමද අතිශය වැදගත් වේ. වැඩිවන වේගවත් සහ තරඟකාරී මෙහෙයුම් පරිසරයකට මෙන්ම වෙනස්වන අවදානම් සහ වැදගත් නියාමන සංවර්ධනයන්ට ප්‍රතිචාර වශයෙන්, බැංකුව තුළ අඛණ්ඩව අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට ඉදිරියට යන වැඩ පිළිවෙලක් ඇත. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් මඟින් එකී අවදානම් නිරාවරණය කාර්යක්ෂමව කළමනාකරණය කර ගනිමින් අවම කර ගැනීමට සහය වේ.

අවදානම් කළමනාකරණ රාමුව

සමූහය පුරාවටම බලපැවැත්වෙන අවදානම් කළමනාකරණ රාමුවෙහි කොටසක් වශයෙන් අවදානම් හඳුනාගෙන කළමනාකරණය කෙරේ. මෙලෙස අවදානම් අධීක්ෂණය කිරීම, අවදානම් අභිරුචි මට්ටම් තීරණය කිරීම, අවදානම් ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක වෙමින් පවතින අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් හා ක්‍රමවේදයන්හි ඵලදායිකත්වය තහවුරු කිරීම ආදීයේ අවසාන වගකීම් සමූහය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අවදානම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහාය දක්වන අතර අවදානම් පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්ති රාමු, ප්‍රමිතීන් හා ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණවත්බව සහ ඵලදායිකත්වය සහතික කිරීම තුළින් අවදානම්වලට අදාළ සෑම අංගයක් සම්බන්ධයෙන් ස්වාධීන අධීක්ෂණයක් ලබා දේ. මෙයට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව(BECC), අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) සහ අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC) විසින්ද අවදානම් සබැඳි වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වනු ලැබේ.

බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සාර්ථක ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීමේදී විධායක කමිටු වනම් වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC) සහ ණය අවදානම් කළමනාකරණ කමිටුව (CRMC) විසින්ද ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරයි.

මහජන බැංකු සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව විසින් අවදානම් කළමනාකරණය සඳහා පදනම සකස් කර සමූහයේ අවදානම් කළමනාකරණ පරාසය, අවදානම් පරාමිති නියම කරන අතර, අවදානම් කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා වගකීම විධායකය සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා වර්ධන සහ අවදානම් ප්‍රතිඵලවන් සුදුසු පරිදි තුලනය කෙරෙන බව සහතික කරයි. වෙළෙඳපොල තත්ත්වයන්හි අහිතකරතාවන් සහ සමූහයේ කාර්යභාරයන් හි වෙනස්කම් සඳහා හේතු සොයා බැලීම සඳහා බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව හා සබැඳි ප්‍රතිපත්ති හා පද්ධතීන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලබයි.

මෙම රාමුව විශේෂයෙන්ම ව්‍යාපාරික මාර්ගය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර විගණනය යන ත්‍රිත්ව ආරක්ෂණ මාර්ගය මත පදනම් වේ.

අවදානම් අභිරුචිය

"අවදානම් අභිරුචිය" යන්නෙන් අදහස් වන්නේ සිය ව්‍යාපාරික උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී මහජන බැංකු සමූහය භාරගැනීමට කැමැත්තක් දක්වන අවදානම් වර්ග සහ අවදානම් සීමාවයි. විවිධ්‍යයන් රැසක් මත අවදානම් දරා සිටීමේ සීමාවන් සහ අවදානම් ප්‍රේරක ලක්ෂ්‍ය ඇසුරින් එය ප්‍රකාශයට පත් කෙරේ. සමූහයේ අවදානම් අභිරුචිය ස්ථාපනය කිරීමේ අවසන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර එකී අනුමත මට්ටම් ඇතුළත නිරාවරණ සහ අවදානම පවත්වාගෙන යනු ලබන බවට විමඟින් සහතික කරයි.

අවදානම අවම කිරීම

බැංකුව පරීක්ෂාකාරීව අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග විශ්ලේෂණය කර නියම කරයි. විමෙන්ම අඛණ්ඩ නියාමනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට/කළමනාකරණ කමිටුවලට වාර්තා කරයි. තවද, විවිධ වර්ගයේ ඇප ලබාගෙන විවිධ අවදානම් අවම කිරීම සඳහා උපරිම විවක්ෂණ සීමා තීරණය කරයි.

අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුව

අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුව බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයන් සඳහා සමස්ථ විධායක වගකීම දරයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් කළමනාකරණ විසින් මෙම අංශය මෙහෙයවනු ලබන වන අතර, ඔහු අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වාර්තා කර බැංකුවේ ව්‍යාපාරික ඒකක සහ ලාභ ඉලක්කවලින් ස්වාධීනව ක්‍රියාත්මක වේ. ණය, වෙළෙඳපොල, මෙහෙයුම් අවදානම් සහ තාක්ෂණික අවදානම් පාලනය කිරීම සඳහා විශේෂ වගකීම් සහිතව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (අවදානම් කළමනාකරණ) මඟපෙන්වීම යටතේ ණය පූර්ව සමාලෝචන ඒකකය, ණය පශ්චාත් සමාලෝචනය ඒකකය, භාණ්ඩාගාර මැදි කාර්යාලය සහ මෙහෙයුම් අවදානම්,තාක්ෂණික අවදානම් ඒකකය වෙන වෙනම පිහිටුවා ඇත.

ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය උපකරණයකට අදාළ ණයකරුවෙක් හෝ ප්‍රතිපාර්ශ්වයක් විසින් සිය මූල්‍ය හෝ ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වන්නේනම් බැංකුවට ඇතිවිය හැකි අවදානම වන අතර, ගනුදෙනුකරුවන්/වෙනත් බැංකුවලට බැංකුවේ ණය සහ අත්තිකාරම්, සහ ණය සුරැකුම්පත්වල ආයෝජනවලින් මෙම අවධානම මූලිකවම ඇති වේ. සෘජු අරමුදල් නිරාවරණවලින් ඇතිවන ණය අවදානමට අමතරව, බැංකුව ණය අවදානම දරනු ලබන ණයවර ලිපි සහ ඇප වැනි වක්‍ර වගකීම්වලට බැංකුව නිරාවරණය විය හැකි අතර මෙය ණය අවදානම පැහැරහැරීමේ අවදානම/ණය පියවීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ ප්‍රතිපාර්ශ්ව අවදානම යනාදියෙන් සමන්විත වේ.

බැංකුවේ ණය අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීමේ සමස්ත වගකීම සහිත මෙහෙයුම් කමිටුව වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව ක්‍රියා කරයි. ණය පාලන ඒකකය ව්‍යාපාරික මාර්ගවලින් ස්වාධීනව කටයුතු කරමින් සියළුම ණය අවදානම් ප්‍රයත්න ක්‍රියාත්මක කරනු ලබයි. ණය අවදානම් කළමනාකරණ කිරීමේ මූලික වගකීම ඒ ඒ ව්‍යාපාරික ඒකක සතු වන අතර ණය පාලන ඒකකය විසින් සිදුකරනු ලබන ස්වාධීන සමාලෝචනයක් ඇසුරින් විය සිදු කරයි.

සමුහයේ ණය ප්‍රතිපත්තිවල ප්‍රධාන අංගයන්ට අනෙකුත් කරුණු අතර විවිධ මට්ටම්වලදී පවරන ලද අනුමත කිරීමේ බලතල, නිශ්චිත අවදානම් අභිරුචියට සමගාමීව ඉතා හොඳින් නිශ්චය කොට ඇති ණය නිර්ණායක සහ විවක්ෂණ සීමාවන් ඇතුළත් වන විස්තීර්ණ ණය අනුමත කිරීමේ යාන්ත්‍රණයක් ඇතුළත් වේ. ණයකරුවන් මූලිකවම ආපසු ගෙවීමේ හැකියාව සහ අභ්‍යන්තරව සංවර්ධිත අවදානම් ශ්‍රේණිගතකරණ ලකුණු කාඩ් අනුව අගය කරනු ලබන අතර ලකුණු 9 ශ්‍රේණිකරණ පරිමාණය ණයවල යෝග්‍යතාව තක්සේරු කිරීම සඳහා භාවිතා කෙරේ.

පිළිවෙලට සකස්කළ ලකුණු කාඩ් ආයතනික, සුළු හා මධ්‍ය පරිමාණ ණය ගන්නන්, මූල්‍ය ආයතන මෙන්ම පාරිභෝගික ණයගන්නන් තක්සේරු කිරීම සඳහා සංවර්ධනය කර ඇත. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අභ්‍යන්තර ණය ශ්‍රේණිකරණ ආකෘති මඟින් විවිධ අවදානම් සාධක නියෝජනය වීමක් සිදුවන අතර, පැහැර හැරීමේ සම්භාවිතාව සහ අලාභ දෙන පැහැර හැරීම පුරෝකථනය කිරීමට එයට හැකියාව ඇත.

හානිකරණ තක්සේරුව

පැහැර හැරීම සහ පිළියම පිළිබඳ නිර්වචනය

ණයගැතියා ගිවිසුම්ගත ගෙවීම් මත දින 90 ක් පැහැර හැරියොත් හෝ වාරික තුනක් හිඟ වුවහොත් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් නිකුත් කරන ලද නියමයන් අනුව අක්‍රීය ණය වශයෙන් වර්ගීකරණය වුවහොත් බැංකුව මඟින් මූල්‍ය උපකරණයක ගෙවීම පැහැර හරින ලද බවට සැළකෙන අතර, එම නිසා සියළුම කාණ්ඩයන් තුළ අපේක්ෂිත බැරකම් අලාභ සඳහා මට්ටම 3 (ණය හානිකරණය වූ) ගණනය කිරීම් සිදුකෙරේ. පුද්ගල ගිවිසුම්වල දක්වා ඇති පරිදි ව්‍යාපාරය අවසානය වන විට අවශ්‍ය අභ්‍යන්තර දින ගෙවීම් පියවනු ලැබ නොමැති නම් බැංකුව මඟින් අදාළ භාණ්ඩාගාර සහ අන්තර්බැංකු ශේෂයන් පැහැර හරින ලද බවට සැළකෙන අතර ඒ පිළිබඳ වහාම අදාළ පියවර ගනු ලැබේ.

තනි තනිව තක්සේරු කෙරෙන දීමනා

අනාගත අලාභයක් සම්බන්ධ විෂය මූලික සාක්ෂියක් ඇති නම්, බැංකුව මඟින් තනි තනි වශයෙන් සැළකිය යුතු ණය හෝ අත්තිකාරම් තනි පුද්ගල පදනමක් මත යෝග්‍ය දීමනා තීරණය කෙරේ. බැංකුව මඟින් වර්තමානය වන විට තනි තනි වශයෙන් සැළකිය යුතු සීමාව රුපියල් මිලියන 25 වශයෙන් නියම කර ඇති අතර, එම සීමාවට ඉහළ සමස්ත නිරාවරණයක් සහිත සෑම ගනුදෙනුකරුවකුම දරන ලද අලාභවල විෂය මූලික සාක්ෂි වෙනුවෙන් තනි තනිව ඇගයීමට ලක් කෙරේ. දීමනා ප්‍රමාණයන් තීරණය කිරීමේදී සළකා බැලෙන අයිතම ප්‍රතිපාර්ශ්වයෙහි ව්‍යාපාර සැලසුමෙහි තිරසාරබව, මූල්‍යමය අසීරුතාවයකදී එහි කාර්යසාධනය වර්ධනය කරගැනීමේ හැකියාව, නුබුන්භාවය උද්ගත වුවහොත් ප්‍රක්ෂේපිත ලැබීම් සහ අපේක්ෂිත ගෙවීම්, වෙනත් මූල්‍යමය සහාය ලබාගතහැකිවීම, ඇපවල උපලබ්ධි කරගත හැකි වටිනාකම සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්හි කාලය යන අංග වලින් සමන්විත වේ.

සාමූහිකව තක්සේරු කෙරෙන දීමනා

තනි තනි වශයෙන් තක්සේරු කරන ලද සහ හානිකරණය ලක්වී නොමැති බව සොයාගත් ගනුදෙනුකරුවන් සමාන අවදානම් ලක්ෂණ සහිත ණය කාණ්ඩ තුළ තනි පුද්ගල සීමාවට පහළ ණය සමඟ එකට සාමූහිකව තක්සේරු කරනු ලැබේ. සීමාවට ඉහළ වුවත් තත්ත්වය විෂයමූලික සාක්ෂි යටතේ නොමැති ගනුදෙනුකාර නිරාවරණ සාමූහික හානිකරණ තක්සේරුකරණය යටතේ සලකනු ලැබේ. ප්‍රම්තියේ අවශ්‍යතාවයට අනුව, පොදු ප්‍රවේශය යටතේ අපේක්ෂිත ණය අලාභ තීරණය කිරීමේදී කළමනාකරණය විසින් තක්සේරු කිහිපයක් සාධකකරගෙන ඇත.

අදියර 1: මාස 12 අපේක්ෂිත ණය අලාභ

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් නොමැති වූ සහ ආරම්භයේ පටන් ණය පිරිහීමක් නොමැති නිරාවරණ සඳහා, ඊළඟ මාස 12 තුළ ඇති විය හැකි පැහැර හැරීමේ සිදුවීමේ සම්භාවිතාව ආශ්‍රිත ජීවකාල අපේක්ෂිත ණය අලාභ කොටස හඳුනා ගනී. බැංකුව සැළකිය යුතු ණය පිරිහීමක් නොමැති ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 අපේක්ෂිත බැරකම් අලාභය තීරණය කරයි. (හිඟ කාලය දවස් 30ට අඩු හෝ සමාන)

අදියර 2: ජීවකාල අපේක්ෂිත ණය අලාභ – ණය හානිකරණය නොකළ

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් සහිත නමුත් ණය හානිකරණයක් නොමැති නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත ණය අලාභයක් (උදා: මූල්‍ය වත්කමෙහි ඉතිරි වූ ජීව කාලය පාදක කර ගනිමින්) හඳුනාගනී. බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව, අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය පහසුකම් හැරුනු විට, සැළකිය යුතු පිරිහීමක් නියමිත දිනයෙන් පසු දින 30 ක් ගතවූ යන නිශ්ප්‍රභාත්මක උපකල්පනය සමඟ මිනුම්ගත කෙරේ. බැංකුව විසින් අදියර 2 යටතේ ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත යාවත්කළ ණය පහසුකම්/නිරාවරණ හැරුනු විට වාර දෙකක් දක්වා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළුම ප්‍රතිව්‍යුහගත ණය සලකනු ලැබ ඇත. මෙය කරනු ලබන්නේ 2021 අංක 13 දරන බැංකු පනත් නියෝගය - බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ මැනීම අනුවයි.

අදියර 3: ජීවකාල අපේක්ෂිත ණය අලාභ - ණය හානිකරණය කළ

ණය හානිකරණයට ලක් වූ කිසියම් වත්කමක ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් වෙත අහිතකර බලපෑමක් ඇති කරන ආකාරයේ සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් පවතින විට නිරාවරණ ණය හානිකරණයට ලක් වූ වශයෙන් තක්සේරු කෙරේ. ණය හානිකරණයට ලක් වූ නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත බැරකම් අලාභයන් හඳුනා ගන්නා අතර දළ ධාරණ වටිනාකමට නොව ක්‍රමක්ෂය පිරිවැය අනුව සඵල පොලී අනුපාතිකය (දළ ප්‍රතිපාදන වලින් ශුද්ධව) යොදා ගනිමින් පොලී ආදායම ගණනය කෙරේ. බැංකුව ගනුදෙනුකරුවකුගේ ගිවිසුම්ගත ගෙවීම් SLFRS 9 ප්‍රමිතියෙහි දක්වා ඇති පරිදි නියමත දිනට වඩා දින 90කට වැඩි සංඛ්‍යාවක් කල් ගතව ඇති අවස්ථාවක මහ බැංකුවේ වර්ගීකරණය පරිදි සියලුම අක්‍රීය ණය වර්ගීකරණ, වාර දෙකකට වඩා ප්‍රතිව්‍යුහගත කරන සියළුම ප්‍රතිව්‍යුහගත කළ ණය සහ ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත යාවත්කළ ණය පහසුකම්/නිරාවරණ හැරුනු විට, සියලුම ප්‍රතිඵලදායී ණය සමඟ එකට බැංකුව ණය පහසුකම් තීරණය කරයි.

පැහැර හැරීමේ සම්භාවිතාවය (ජෘ) ඇස්තමේන්තු ක්‍රියාවලිය

ගෙවීමේ පැහැර හැරීමේ සම්භාවිතාව යනු බැඳීමෙන් මාස 12ක කාලයක් (එනම් මාස 12ක පැහැර හැරීමේ සම්භාවිතාව) හෝ පවත්නා ඉතිරිකාලය පුරා (එනම් ජීවකාල පැහැර හැරීමේ අවදානම) ණයකරුවෙක් ඔහුගේ මූල්‍ය බැඳීම් පැහැර හැරීමේ සම්භාවිතාවයයි. පැහැර හැරීමේ සම්භාවිතාව පිළිබඳ ඇස්තමේන්තු යනු නිශ්චිත දිනයක ඇස්තමේන්තු වන අතර දියමින දින පසුවූ දින (එනම් නියමිත දිනයේ සිට පසු වූ දින ගණන) යනු පැහැර හැරීමේ සම්භාවිතාව පිළිබඳ ඇස්තමේන්තු ක්‍රියාවලියේ ප්‍රධාන නිර්ණායකය වේ. මෙම ක්‍රියාවලිය තුළ, වසර පහකට අදාළ වෙතිහාසික තොරතුරු නිෂ්පාදනයේ ස්වභාවය මත පදනම් වෙමින් භාවිතා කර ඇත. ඒ අනුව, නිරාවරණ පැහැර හැරීමේ සම්භාවිතාව මත පදනම් වී කාණ්ඩ පහක් අතර පහත පරිදි වර්ග

- නියමිත දින පසුවී දින ශූන්‍ය
- නියමිත දින පසුවී දින 1 - 30
- නියමිත දින පසුවී දින 31 - 60
- නියමිත දින පසුවී දින 61 - 90
- නියමිත දින පසුවී දින 90 ට වැඩි

පැහැර හැරීමේදී නිරාවරණය (EAD)

පැහැර හැරීමේදී නිරාවරණය යන්නෙන් පැහැර හැරීමේ අවස්ථාවක දී අපේක්ෂිත නිරාවරණය නියෝජනය වේ. මෙහිදී බැංකුව ණය පරිවර්තන සාධක භාවිත කරන අතර ඒ මඟින්, ගනුදෙනුකරුට සිය නිරාවරණය වැඩි කිරීමට හැකියාව ඇති චක්‍රීය ණය පහසුකම්වල පැහැර හැරීමේදී නිරාවරණය ගණනය කිරීමට පැහැරහැරි අවස්ථාවේදී පැහැරහැරි පහසුකමේ වෙතිහාසික භාවිතය පැහැදිලි කරයි. චක්‍රීය නොවන ණය පහසුකම් සඳහා, දැනටමත් භාවිතාකළ ප්‍රමාණය සහ යම් බෙදා නොදුන් ප්‍රමාණය සහ ඒ මත උපචිත පොළී ගෙවීම පැහැර හැරීමේදී නිරාවරණය ලෙස සලකනු ලැබේ.

දෙසැම්බර් 31 දිනට	2024 රු. '000	2023 රු. '000
තනි තනිව සැළකිය යුතු හානිකරණය වූ ණය		
ක්‍රමක්ෂය පිරිවැය	253,897,913	250,715,569
හානිකරණය සඳහා දීමනා	(112,723,895)	(101,978,763)
දෙසැම්බර් 31 දිනට ධාරණ අගය	141,174,018	148,736,805
සාමූහිකව තක්සේරු කළ ණය		
ක්‍රමක්ෂය පිරිවැය	1,417,281,927	1,595,673,941
හානිකරණය සඳහා දීමනා	(36,490,925)	(34,953,011)
දෙසැම්බර් 31 දිනට ධාරණ අගය	1,380,791,002	1,560,720,930

පැහැර හැරීමෙන් වන අලාභය (LGD)

ගෙවීම් පැහැර හැරීමෙන් අලාභය යනු නිරාවරණය මත සිදුවිය හැකි අලාභයෙහි විශාලනය වන අතර, එය නිරාවරණයේ ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ කෙරේ. මෙම ගෙවීම් පැහැර හැරීමෙන් අලාභ අනුපාත මඟින් රඳවාගත් කවර හෝ ඇපයක් මඟින් අයකර ගැනීමට හෝ උපලබ්ධි කර ගැනීමට අපේක්ෂිත මුදලට සාපේක්ෂව අපේක්ෂිත ගෙවීම් පැහැර හැරීමේදී නිරාවරණය සැළකිල්ලට ගනු ලබයි. අනාගත මුදල් ප්‍රවාහ පිළිබඳ ඇස්තමේන්තුවලට අදාළ වන ප්‍රධාන ගති ලක්ෂණ මත පදනම්ව, බැංකුව ස්වකීය පාරිභෝගික ණය නිෂ්පාදන වඩාත් කුඩා සමජාතීය කළඹ වශයෙන් කාණ්ඩ ගත කරයි. යොදාගත් දත්ත වෙතිහාසිකව විකරුස් කරගත් අලාභ දත්ත මත පදනම් වන අතර, එයට වඩාත් පුළුල් පරාසයක පැතිරුණු ගනුදෙනු ගති ලක්ෂණ (උදා: නිෂ්පාදන වර්ගය, වඩාත් පුළුල් පරාසයක ඇප වර්ග) මෙන්ම ණයගැතියන්ගේ ගතිලක්ෂණ සමුහයක් හා සම්බන්ධ වේ.

එක් එක් වසර සඳහා, සිය ජීව කාලය තුළ අවම වශයෙන් එක් වරක් හෝ දින 90න් ඉහළ සීමාව ඉක්මවා ගිය අවසන් කරන ලද ගිවිසුම් සළකා බලයි. ණය මුදලෙහි සම්පූර්ණ පියවීම් දක්වා ගෙවීම් පැහැර හැරීමේ අවස්ථාවට පසු සියළු මුදල් ප්‍රවාහ ගෙවීම්, පැහැර හැරීමේ අලාභය මඟින් සාධනය කෙරේ. මුළුමනින්ම පාහේ අවසන් කරන ලද ගිවිසුම්ද පැහැර හැරීමෙන් අලාභය ගණනය කිරීම තුළ සලකනු ලබයි. මුළුමනින්ම පාහේ අවසන් කරන ලද ණය යනු දිගු කලක් තිස්සේ හිඟව පවතින සක්‍රීය ණය වේ. මුදල් ප්‍රවාහ අවසන්ව ඇති බවට බැංකුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවේදී ගිවිසුමක් මුළුමනින්ම පාහේ අවසන් කරන ලද ගිවිසුමක් බවට තීරණය කෙරේ.

අපේක්ෂිත ණය අලාභ සඳහා මුළු හානිකරණ පිළිබඳ විශ්ලේෂණය

2024 දෙසැම්බර් 31 දිනට	සටහන්	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් සහ මුදල් සමාන දෑ	17.4	460	14,796	–	15,256
බැංකුවල පවතින ශේෂ	19.2	40,954	–	–	40,954
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	22.2	12,581	–		12,581
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය සහ ලැබිය යුතු දෑ	23.2	15,406,686	5,119,482	128,688,652	149,214,820
ක්‍රමක්ෂය පිරිවැයට ණය උපකරණ	24.2	–	3,547,398	–	3,547,398
අනාගත විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ණය උපකරණ	26.2	8,068	–	296,009	304,077
අපේක්ෂිත ණය අලාභය සඳහා මුළු හානිකරණය		15,468,749	8,681,676	128,984,661	153,135,086

2023 දෙසැම්බර් 31 දිනට	සටහන්	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් සහ මුදල් සමාන දෑ	17.4	732	22,513	–	23,246
බැංකුවල පවතින ශේෂ	19.2	60,823	–	–	60,823
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	22.2	34,330	–		34,330
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය සහ ලැබිය යුතු දෑ	23.2.1	9,635,625	9,115,910	118,180,240	136,931,775
ක්‍රමක්ෂය පිරිවැයට ණය උපකරණ	24.2	–	8,399,460	–	8,399,460
අනාගත විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ණය උපකරණ	26.2	608	361,503	–	362,111
අපේක්ෂිත ණය අලාභය සඳහා මුළු හානිකරණය		9,732,118	17,899,386	118,180,240	145,811,744

බහුවිධ ආර්ථික තත්ත්වයන් යටතේ අපේක්ෂිත ණය අලාභ ආකෘතියේ තොරතුරු පිළිබඳ ඉදිරි දැක්ම

බැංකුව විසින් අපේක්ෂිත ණය අලාභවල මිණුම්කරණය හොඳම තත්ත්වය, පදනම් තත්ත්වය සහ නරක තත්ත්වය යන ප්‍රධාන ක්‍රියාදාමයන් යටතේ ඉදිරිය දකින තොරතුරු ඇතුළත් වේ.

ක්‍රියාදාමයන් සඳහා සම්භාවිතාව බර තැබීම

දෙසැම්බර් 31 දිනට	2024 %	2023 %
හොඳම තත්ත්වය	20	20
පදනම් තත්ත්වය	20	20
නරක තත්ත්වය	60	60

පදනම් තත්ත්වය යන්නෙන් බොහෝ විට ප්‍රතිඵලය සඳහන් වන අතර, බැංකුව විසින් එහි මෙහෙයුම් අරමුණ සඳහා භාවිතා කරන තොරතුරු සමඟ සම්බන්ධ වේ. එහි හානිකරණ තක්සේරුව තුළ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ණය අවදානම්වල ප්‍රධාන ධාවකයින් පහත පරිදි වේ. ප්‍රමාණාත්මක ආර්ථික සාධක මහ බැංකුව විසින් ප්‍රකාශිත ආර්ථික දත්ත සහ පුරෝකථන සහ ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව යනාදී වෙනත් විශ්වාසී මූලාශ්‍ර මත පදනම් වේ.

ණය අවදානමේ ප්‍රමාණාත්මක ධාවකයන්	ණය අවදානමේ ගුණාත්මක ධාවකයින්
දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය	ක්ෂේත්‍රයේ ව්‍යාපාරවල තත්ත්වය
උද්ධමනය	නියාමන බලපෑම
පොලි අනුපාතය (AWPLR)	රජයේ ප්‍රතිපත්ති
විනිමය අනුපාතිකය	සාමාන්‍ය වටිනාකමට ණය අනුපාතය
විරැකියා අනුපාතය	

වෙනත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම් මත හානිකරණ වෙන් කිරීමේ සංවේදිතාව

බැංකුව විවිධ උපකල්පන මත පදනම් වී 2024 දෙසැම්බර් 31 දිනට වෙනත් ගනුදෙනුකරුවන්ට අපේක්ෂිත ණය අලාභ මත එහි වෙන් කිරීම තක්සේරු කර ඇත. එකී උපකල්පනවල වෙනස්වීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තාකළ හානිකරණ වෙන්කිරීම තුළ වෙනස්වීම්වලට හේතු විය හැකිය.

පැහැර හැරීමේ අවදානම්, පැහැර හැරීමෙන් අලාභ සහ ඉදිරිය දකින සාර්ව ආර්ථික තොරතුරුවල වියහැකි වෙනස්වීම්වලට 2024 දෙසැම්බර් 31 දිනට වෙනත් ගනුදෙනුකරුවන් වෙත අපේක්ෂිත ණය අලාභ මත වෙන් කිරීමේ සංවේදිතාව පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

	මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මත සංවේදිතා බලපෑම [හානිකරණ වෙන්කිරීමේ වැඩිවීම/(අඩුවීම)]				ආදායමේ ප්‍රකාශය මත සංවේදිතා බලපෑම
	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	අදියර 4 රු. '000	රු. '000
පැහැර හැරීමේ අවදානම (PD)					
සියලු වයස් කාණ්ඩ අතර PD 1% වැඩිවීම	2,166,961	192,809	-	2,359,770	(2,359,770)
සියලු වයස් කාණ්ඩ අතර PD 1% අඩුවීම	(2,629,878)	(192,809)	-	(2,822,686)	2,822,686
පැහැර හැරීමෙන් අලාභය					
LGD 5% වැඩිවීම	1,060,615	1,013,384	1,047,728	3,121,727	(3,121,727)
LGD 5% අඩුවීම	(1,060,615)	(1,013,384)	(1,047,728)	(3,121,727)	3,121,727
සම්භාවිතාව බරතබනලද ඉදිරිය දකින සාර්ව ආර්ථික දර්ශක					
නරකම තත්ත්වය 10% වැඩිවීම, පදනම් තත්ත්වය 5% අඩුවීම සහ හොඳම තත්ත්වය 5% අඩුවීම	123,686	119,318	-	243,004	(243,004)
නරකම තත්ත්වය 10% අඩුවීම, පදනම් තත්ත්වය 5% වැඩිවීම සහ හොඳම තත්ත්වය 5% වැඩිවීම	(123,686)	(119,318)	-	(243,004)	243,004

ණය හානිකරණය වූ (අදියර 3) ණය සහ අත්තිකාරම්වල වෙනස්වීම් සැසඳීම

	2024 රු. '000
ජනවාරි 1 දිනට වෙනත් ගනුදෙනුකරුවන්ට අදියර 3 ණය හා අත්තිකාරම්	283,761,791
වසර තුළ අලුතින් හාරකරණය වූ ලෙස වර්ගීකරණය කළ ණය හා අත්තිකාරම්	40,845,073
වසර තුළ දැනට හානිකරණය වූ ණය හා අත්තිකාරම්වල ශුද්ධ වෙනස	(1,262,490)
වසර තුළ යාවත් කිරීම් ඇතුළුව ශුද්ධ ගෙවීම, කපාහැරීම සහ අයකිරීම් සහ වෙනත් වෙනස්වීම්	(16,343,112)
දෙසැම්බර් 31 දිනට ගනුදෙනුකරුවන්ට හානිකරණය වූ ණය හා අත්තිකාරම්	307,001,261

හානිකරණ වෙනස්වීම් වෙන්කිරීම

වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය හා අත්තිකරම්වල හානිකරණයේ ආරම්භක අවස්ථාවේ සිට සහ අවසාන ශේෂය දක්වා සැසඳීම පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

	මාස 12 අපේක්ෂිත ණය අලාභ (අදියර 1) රු. '000	ජීව කාල ණය අලාභ (අදියර 1) රු. '000	ජීව කාල මාස 12 අපේක්ෂිත ණය හානිකරණය වූ (අදියර 1) රු. '000	එකතුව රු. '000
2024 ජනවාරි 1 දිනට හානිකරණය සඳහා වෙන් කිරීම	9,635,625	9,115,910	118,180,239	136,931,774
අදියර 1 වෙත මාරු කිරීම	2,876,603	(2,798,414)	(78,189)	-
අදියර 2 වෙත මාරු කිරීම	(43,368)	125,876	(82,508)	-
අදියර 3 වෙත මාරු කිරීම	(42,624)	(2,105,650)	2,148,274	-
හානිකරණයේ ශුද්ධ නැවත මැනීම	473,641	384,278	10,274,620	11,132,539
උත්පාදිත හෝ මිලදීගත් නව වත්කම්	4,040,307	1,165,454	1,629,656	6,835,416
හඳුනා නොගත් හෝ නැවත ගෙවූ මූල්‍ය වත්කම් (කපාහැරීම් නොමැතිව)	(1,533,498)	(767,971)	(2,864,467)	(5,165,936)
විදේශ විනිමය ගැලපීම්	(518,973)	(518,973)		
2024 දෙසැම්බර් 31 දිනට හානිකරණය සඳහා වෙන් කිරීම	15,406,686	5,119,482	128,688,652	149,214,820

ඇපකර සහ වෙනත් ණය වැඩිදියුණු කිරීම්

ණය අවදානමට ශුද්ධ නිරාවරණය

අවශ්‍ය වන ඇප වර්ගය සහ ප්‍රමාණය ඇපකරුගේ ණය අවදානම් පිළිබඳ තක්සේරුව මත රඳා පවතී. එක් එක් ඇප වර්ගය ප්‍රතිග්‍රහණය සහ තක්සේරුව ආවරණය කරමින් බැංකුවේ ණය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ ණය ක්‍රියාපටිපාටි අත්පොතේ මාර්ගෝපදේශ ස්ථාපනය කෙරේ. ඇප තක්සේරුකරණය සඳහා දැඩි ප්‍රවේශයක් අපි අනුගමනය කරන අතර, තක්සේරුකරණ මඟින් වෙළෙඳපොල තත්ත්වයන් පිළිබිඹු වන බවට තහවුරු කිරීම සඳහා ඒවා නිරන්තරයෙන් සමාලෝචනය සහ යාවත්කාලීන කෙරේ. බැංකුවේ සාපේක්ෂව විවිධාංගීකරණය කළ ඇප කළඹ මඟින් නිශ්චිත වත්කම් පන්තියක් තුළ අනාගත මිල පහත වැටීම්වල බලපෑම අවම කරයි.

ලබා ගනු ලබන ප්‍රධාන ඇප වර්ග පහත පරිදි වේ.

- වාණිජමය ණය ලබාදීම් සඳහා – නිශ්චල දේපළ, පංගම, වෙළෙඳ ලැබිය යුතු දෑ, ණය සුරැකුම්, තොග, මුදල් තැන්පතු ආයතනික සහ පුද්ගලික ඇප මත අය කිරීම්.
- පාරිභෝගික ණය ලබාදීම් සඳහා – නේවාසික දේපළ, මෝටර් රථ, රත්‍රන්, මුදල් තැන්පතු සහ පුද්ගල ඇප මත උකස්
- රජය සහ රජයට අයත් ව්‍යවසාය – රජයේ භාණ්ඩාගාර ඇප

පහත දැක්වෙන වගුව මඟින් මූල්‍ය වත්කම් පංතිය අනුව ණය අවදානම කෙරෙහි උපරිම නිරාවරණය හා ශුද්ධ නිරාවරණය (රඳවා ගත් කවර හෝ ඇප වල සාධාරණ අගයෙන් ශුද්ධව) පෙන්නුම් කෙරේ.

2024 දෙසැම්බර් 31 දිනට	ණය අවදානම කෙරෙහි උපරිම නිරාවරණය රු '000	ශුද්ධ නිරාවරණය රු '000
මුදල් හා මුදල් සමාන දෑ	71,694,016	10,701,718
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,842,194	5,842,194
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	329,810,350	329,810,350
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	31,994,539	31,994,539
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	1,521,965,020	431,316,258
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	2,313,187	2,313,187
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	7,110,671	7,110,671
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	1,123,490,537	1,123,490,537
එකතුව	3,094,220,514	1,942,579,454

2023 දෙසැම්බර් 31 දිනට	ණය අවදානම කෙරෙහි උපරිම නිරාවරණය රු. '000	ශුද්ධ නිරාවරණය රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	61,889,582	8,572,529
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	11,259,451	11,259,451
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	144,184,748	144,184,748
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	54,022,123	54,022,123
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	1,709,457,735	400,146,333
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	1,894,023	1,894,023
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	8,286,626	8,286,626
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	831,747,923	831,747,923
එකතුව	2,822,742,211	1,460,113,756

ණය අවදානම් සංකේන්ද්‍රණය

සංකේන්ද්‍රණ අවදානම කිසියම් නිශ්චිත අංශයක්, නිෂ්පාදනයක්, ප්‍රදේශයක්, ගනුදෙනුකරුවකු/සමූහයක් වෙත අධික ලෙස ණය ලබාදීමෙන් ඉස්මතු වේ. බැංකුවේ අවදානම් අභිරුචිය මඟින් වී වී අංශ සහ නිෂ්පාදන සඳහා නිරාවරණය විය හැකි සීමාවන් පැහැදිලිව දක්වන අතර, මෙහෙයුම් පරිසරය මඟින් ඇති කරන අවදානම් සහ අවස්ථා ඉස්මතු කිරීමේ සන්දර්භය තුළ එකී සීමාවන් සමාලෝචනය කර සංශෝධනය කෙරේ. තනි ණයකරු සීමාවට අනුකූල වීමට අමතරව, ණය සංකේන්ද්‍රණය නියාමනය කොට පාලනය කිරීම සඳහා බැංකුව Herfindahl – Hirschman (HHI) දර්ශකයද යොදාගනී. මෙකී සීමාවන් අඛණ්ඩ පදනමක් මත අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමනය කරනු ලබයි. රජයට අයත් ව්‍යවසාය (SOE) නිරාවරණය තුළ සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කිරීමේ අරමුණ ඇතිව රජයට අයත් ව්‍යවසාය සඳහා පුද්ගල සහ අංශ අනුව උපරිම ණය සීමා බැංකුව පනවා ඇත.

ක්ෂේත්‍රය අනුව මූල්‍ය වත්කම් සඳහා අවදානම් සංකේන්ද්‍රණය පිළිබඳ සමාලෝචනයක් (රුපියල්වලින් '000) පහත පහත දැක්වේ.

2024 දෙසැම්බර් 31 දිනට	රජය	වාණිජ	මූල්‍ය	කෘෂිකර්ම
මූල්‍ය වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ			71,709,272	
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ශේෂ	33,798,107			
බැංකුවවල පවතින ශේෂ			59,872,761	
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ			5,842,194	
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	329,502,756	87,274		6,473
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	32,007,120		-	
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	457,839,117	191,868,143	25,194,139	17,825,803
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	1,127,037,935			
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ		748,186	733,736	
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	2,959,325	296,009	3,306,885	
එකතුව	1,983,144,360	192,999,612	166,658,987	17,832,276

2024 දෙසැම්බර් 31 දිනට	රජය	වාණිජ	මූල්‍ය	කෘෂිකර්ම
මූල්‍ය වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ			61,912,828	
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ශේෂ	31,003,219			
බැංකුවල පවතින ශේෂ			66,287,848	
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ			11,259,451	
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	143,944,863	65,326		13,867
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	54,056,453		-	
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	762,199,149	164,736,057	30,484,592	13,746,689
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	840,147,383			
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ		458,073	528,783	
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	2,959,191	1,472,316	3,306,741	
එකතුව	1,834,310,258	166,731,772	173,780,243	13,760,556

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යන්නෙන් අදහස් වන්නේ බැංකුවේ ගිවිසුම්ගත මූල්‍ය බැඳීම් ගෙවිය යුතු වන විට සහ අවස්ථාවේදී එය ඉටු කිරීමට අපොහොසත් වීම තුළ ඇතිවන ඉපැයීම් ආශ්‍රිත අලාභ/ප්‍රාග්ධන අලාභ ඇතිවීමේ ඉඩකඩයි. වත්කම් හා වගකීම් අතර නොගැලපීම්වලින් ඇතිවන ද්‍රවශීලතාව සහ නුබුන්වත් ගැටළුවලට බැංකුවලට මුහුණ දීමට සිදුවේ. මේ නිසා ද්‍රවශීලතාව අවදානම් පිළිබඳ ඵලදායී කළමනාකරණය බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවේ තීරණාත්මක අංගයකි.

බැංකුව සතු ගිවිසුම්ගත බැඳීම් නිසි කලට ඉටු කිරීම සඳහා අවශ්‍ය අරමුදල් තක්සේරු කිරීම/ප්‍රමාණනය කිරීම සහ ලබාගැනීමේ හැකියාව සහතික කිරීම බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව මගින් අරමුණු කෙරේ. බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව කාලීන ආකාරයෙන් බැංකුවේ ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීම සඳහා අරමුදල් තක්සේරු කිරීම/ප්‍රමාණනය කිරීම සහ ලබාගැනීමේ හැකියාව සහතික කිරීම පිණිස නිර්මාණය කෙරේ. මෙය සාමාන්‍ය මෙන්ම පීඩන තත්ත්වයන් යටතේ සාක්ෂාත් කර ගනී. ද්‍රවශීලතා අවදානම කළමනාකරණය සඳහා බැංකුවේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව මූලිකවම වගකීමට බැඳී ඇති අතර, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත සීමා,

	කාර්මික	සංචාරක	නිවාස හා දේපල සංවර්ධනය	පරිභෝජනය	සේවා	වෙනත්	ECL	එකතුව
							(15,256)	71,694,016
								33,798,107
							(40,954)	59,831,807
								5,842,194
	147,547			15,710	50,590			329,810,350
							(12,581)	31,994,539
	57,387,031	26,312,350	379,692,889	417,944,273	30,589,563	66,526,534	(149,214,820)	1,521,965,020
							(3,547,398)	1,123,490,537
					831,265			2,313,187
					548,452			7,110,671
	57,534,578	26,312,350	379,692,889	417,959,983	31,471,418	66,526,534	(152,831,009)	3,187,850,428

	කාර්මික	සංචාරක	නිවාස හා දේපල සංවර්ධනය	පරිභෝජනය	සේවා	වෙනත්	ECL	එකතුව
							(23,246)	61,889,582
								31,003,219
							(60,823)	66,227,025
								11,259,451
	99,422			10,883	50,387			144,184,748
							(34,330)	54,022,123
	48,117,596	29,106,894	379,814,464	359,615,811	18,603,837	39,964,420	(136,931,773)	1,709,457,735
							(8,399,460)	831,747,923
					907,167			1,894,023
					548,378			8,286,626
	48,217,018	29,106,894	379,814,464	359,626,694	20,109,768	39,964,420	(145,449,631)	2,919,972,455

නියාමන අනුපාත සහ වෙනත් අදාළ විශ්ලේෂණ සමඟ අනුකූලතාවය දක්වන්නේද සහතික කරයි. ඊට අමතරව. අභ්‍යන්තර ඉලක්කවලට මෙන්ම නියාමන අවශ්‍යතාවන්ට අනුකූලතාව සහතික කිරීම සඳහා වත්කම් හා වගකීම් කමිටුවද බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය අඛණ්ඩව නියාමනය කරමින් එහි කළමනාකරණය පාලනය කරයි.

බැංකුව, නියාමන මාර්ගෝපදේශ සහ ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූලව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරන අතර, ප්‍රවාහ සහ ව්‍යාපාර වස්තු යන ද්විත්ව ප්‍රවේශ හරහා ද්‍රවශීලතාව මිනුම්ගත කරයි. ප්‍රවාහ ක්‍රමවේදය මගින් වත්කම් හා වගකීම්වල කල්පිරීම මත පදනම් වෙමින් විවිධ කාල පරාශයන් හී අභ්‍යන්තර මුදල් ප්‍රවාහයන් හා බාහිර මුදල් ප්‍රවාහයන් අතර පවතින නොගැලපීම් විශ්ලේෂණය කිරීම මගින් ද්‍රවශීලතාව මිනුම්ගත කරනු ලබයි. ව්‍යාපාර වස්තු ක්‍රමවේදය මගින් තැන්පතුවලට ණය අනුපාතය, වගකීම් අනුපාතය (භාවිතයට නොගත් අයිරාවන්/භාවිතයට නොගත් අන්තර් බැංකු ව්‍යාපාර), ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය, ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ සමුච්චිත නොගැලපීම් ආදි ප්‍රධාන අනුපාත ඇසුරින් ද්‍රවශීලතාව මිනුම්ගත කෙරේ. මෙවැනි ප්‍රවේශයන් ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයක් පවත්වා ගැනීමට බැංකුවට සහයවන අතර, අහිතකර තත්ත්වයන් යටතේ වුවද සිය බැඳීම් ඉටු කිරීමට බැංකුවට හැකි බව සහතික කරයි.

2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම්වල (රු. '000) කල්පිරීම් පැතිකඩ

	මාස 3 දක්වා රු. '000	මාස 3-12 රු. '000	අවුරුදු 1-3 රු. '000	
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	71,694,016			
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ශේෂ	13,862,497	16,295,293	2,438,060	
බැංකුවවල පවතින ශේෂ	59,831,807			
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,842,194			
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	329,810,350			
ක්‍රමක්ෂය පිරිවැයට ණය උපකරණ				
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ		31,994,539		
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	189,999,325	404,793,521	139,926,099	
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	306,622,868	342,074,652	253,644,564	
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	2,313,187			
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	7,110,671			
පරිපාලිත සමාගම්වල ආයෝජන				
දේපල, පිරියත හා උපකරණ				
අස්පෘශ්‍ය වත්කම් සහ කීර්තිනාමය				
පෙර ගෙවන ලද කල්බදු				
ශුද්ධ විලම්බිත බදු වත්කම්				
වෙනත් වත්කම්	40,467,526	156,474	14,259	
මුළු වත්කම් 2024	1,027,554,441	795,314,478	396,022,982	
මුළු වත්කම් 2023	722,476,158	1,037,939,019	491,331,983	
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	13,928,487	22,911,742		
බැංකුවල ව්‍යුත්පන්න	168,266			
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	1,555,827,126	991,403,385	205,926,914	
වෙනත් ණය ගැනීම්	37,966,388	22,911,742	-	
ණිකුත්කළ ණය සුරැකුම්පත්				
ප්‍රවර්තන බදු වගකීම්	12,651,620			
ශුද්ධ විලම්බිත බදු වගකීම්				
වෙනත් වෙන්කිරීම්				
අනෙකුත් වගකීම්	13,667,169	37,039,416	25,390,646	
පරිපාලිත සමාගම්වලට ගෙවිය යුතු				
යටත් කරන ලද කාලීන ණය				
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය				
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල				
වෙනත් සංචිත				
රඳවාගත් ඉපැයුම්				
මුළු වගකීම් 2024	1,634,209,055	1,074,266,284	231,317,560	
මුළු වගකීම් 2023	1,475,520,125	1,032,291,922	127,967,884	
ශුද්ධ පරතරය 2024	(606,654,614)	(278,951,806)	164,705,422	
ශුද්ධ පරතරය 2023	(753,043,967)	5,647,097	363,364,099	
මුළු ස්කන්ධය හා වගකීම 2024	1,027,554,441	795,314,478	396,022,982	
මුළු ස්කන්ධය හා වගකීම 2023	722,476,158	1,037,939,019	491,331,983	

			එකතුව	
	අවුරුදු 3-5 රු. '000	අවුරුදු 5ට වැඩි රු. '000	2024 රු. '000	2023 රු. '000
			71,694,016	61,889,582
	1,161,197	41,060	33,798,107	31,003,219
			59,831,807	66,227,025
			5,842,194	11,259,451
			329,810,350	144,184,748
			31,994,539	54,022,123
	132,571,120	654,674,955	1,521,965,020	1,709,457,735
	86,024,202	135,124,252	1,123,490,537	831,747,923
			2,313,187	1,894,023
			7,110,671	8,286,626
		5,191,712	5,191,712	4,280,522
		61,079,218	61,079,218	56,174,042
		2,586,671	2,586,671	1,763,287
	15,560	437,259	41,091,078	56,004,712
	219,772,079	859,135,127	3,297,799,107	3,297,799,107
	204,090,346	582,357,511	-	3,038,195,018
			36,840,228	77,224,139
			168,266	36,049
	98,078,703	3,468,066	2,854,704,194	2,653,105,546
	14,667,466		75,545,595	64,278,443
			12,651,620	1,184,853
		5,207,184	5,207,184	5,029,929
	460,025		76,557,256	30,280,189
		54,156,709	54,156,709	46,997,291
		12,201,998	12,201,998	12,201,998
		11,827,215	11,827,215	10,574,271
		68,981,258	68,981,258	42,084,584
		88,957,584	88,957,584	95,197,726
	113,206,194	244,800,014	3,297,799,107	
	187,119,872	215,295,215		3,038,195,018
	106,565,885	614,335,113	0	
	16,970,474	367,062,296		0
	219,772,079	859,135,127	3,297,799,107	
	204,090,346	582,357,511		3,038,195,018

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වගකීම්වල වට්ටම් නොකළ මුදල් ප්‍රවාහයේ කල්පිරීමේ පැතිකඩ (රු.'000)

මූල්‍ය වගකීම්	ඉල්ලුම අනුව	මාස 3ට අඩු	මාස 3-12	අවුරුදු 1-5	අවුරුදු 5ට වැඩි	එකතුව
බැංකුවලට ගෙවිය යුතු	3,085,069	–	–	15,993,855	–	19,078,924
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	27,958,426	3,960,742	7,957,193	–	39,876,362
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	990,097,016	594,072,354	1,044,806,451	421,905,560	3,846,467	3,054,727,849
වෙනත් ණය ගැනීම්	–	46,946,783	24,938,770		8,468,382	80,353,936
යටත් කරන ලද කාලීන ණය	–	499,212	3,627,293	34,485,490	17,097,100	55,709,095
මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්	993,182,085	669,476,776	1,077,333,256	480,342,098	29,411,949	3,249,746,165

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වගකීම්වල වට්ටම් නොකළ මුදල් ප්‍රවාහයේ කල්පිරීමේ පැතිකඩ (රු.'000)

මූල්‍ය වගකීම්	ඉල්ලුම අනුව	මාස 3ට අඩු	මාස 3-12	අවුරුදු 1-5	අවුරුදු 5ට වැඩි	එකතුව
බැංකුවලට ගෙවිය යුතු	3,563,375	–	8,071,518	103,235,990	–	114,870,883
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	1,639,606	–	–	–	1,639,606
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	829,989,112	568,690,207	1,082,388,195	427,901,684	5,245,111	2,914,214,309
වෙනත් ණය ගැනීම්	–	46,950,313	3,631,951		6,302,603	56,884,867
යටත් කරන ලද කාලීන ණය	–	499,212	3,627,293	34,485,490	17,097,100	55,709,095
මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්	833,552,487	617,779,338	1,097,718,956	565,623,164	28,644,814	3,143,318,759

වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානම යනුවෙන් අදහස් වන්නේ පොලී අනුපාත, කොටස් මිළ ගණන්, විදේශ විනිමය අනුපාත, බැඳුම්කර හා වෙළෙඳ ද්‍රව්‍ය මිල ගණන් ආදී වෙළෙඳපොළ විචල්‍යයන් ආශ්‍රිත අහිතකර වෙනස්වීම් හේතුවෙන් ඉපයීම්, වෙළෙඳපොළ හෝ මූල්‍ය උපකරණ කළඹ ආශ්‍රිත අනාගත මුදල් ප්‍රවාහ ආදියට සිදුවිය හැකි වෙනස්කම් හේතුවෙන් අලාභ සිදුවීමට ඇති ඉඩකඩයි. බැංකුවේ මෙහෙයුම්වලින් අති බහුතරය වෙළෙඳපොළ අවදානමේ කොටස් එකක් හෝ වැඩි ගණනක් වෙත නිරාවරණය වෙයි. මූලික වශයෙන්ම වෙළෙඳපොළ අවදානම වෙළෙඳ හා වෙළෙඳ නොවන කළඹවල පොලී අනුපාත අවදානම තුළින් සහ උකස් කළඹ හේතුවෙන් රත්‍රං මිල වෙනස්වීමට නිරාවරණ තුළින් ඉස්මතු වේ.

වෙළෙඳපොළ අවදානම් වෙත බැංකුව නිරාවරණය වීම, අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදුකෙරෙන අතර, බැංකුවේ වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ රාමුව, ප්‍රතිපත්ති හා අවදානම් අභිරුචි සීමාවන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ද මෙම කමිටුව වගකීමට බැඳී සිටී. වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ රාමුව විධායක මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම වත්කම් හා වගකීම් කමිටුව වෙත පැවරෙන අතර, එම කමිටුව බැංකුවේ වෙළෙඳපොළ අවදානම් නිරාවරණ නිශ්චිත අවදානම අභිරුචිය තුළ පවත්නා බවට සහතික වේ. බැංකුවේ වෙළෙඳපොළ අවදානම පාලනය කරනු ලබන ප්‍රතිපත්තිවලට භාණ්ඩාගාර කළමනාකරණ ප්‍රතිපත්තිය සහ පීඩන පරීක්ෂා ප්‍රතිපත්තිය ඇතුළත් වේ. සියළුම ආකාරයේ වෙළෙඳපොළ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අවම කිරීම, නියාමනය කිරීම හා වාර්තාකරණය සඳහා අවශ්‍ය පද්ධති, ක්‍රමවේද, මෙවලම් සහ ශිල්ප ක්‍රම සම්බන්ධයෙන් මගපෙන්වීම් සාමූහිකව සපයනු ලැබේ. උද්ගත වන වෙළෙඳපොළ අවදානම් පෙරදැරි කොට ගෙන මෙකී ප්‍රතිපත්ති නිරන්තරයෙන් සමාලෝචනය කොට යාවත්කාලීන කරනු ලබයි. වෙළෙඳපොළ අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම බැංකුවේ භාණ්ඩාගාරය වෙත පැවරෙන අතර, එහි නියමානයන් හා විශ්ලේෂණයන් හරහා අවදානම් කළමනාකරණය සහතික කරයි.

බැංකුවේ වෙළෙඳපොළ අවදානම් නිරාවරණය වෙළෙඳ හා බැංකුකරණ කළඹ තුළ වර්ගීකරණය කර වෙන වෙනම කළමනාකරණය කෙරේ. කළඹේ සංවේදිතාව සහ ක්‍රියාදාම විශ්ලේෂණ වෙළෙඳපොළ විචල්‍යතා සහ වෙළෙඳපොළ වෙනස්වීමට

කළඹේ සංවේදිතාව පිළිබිඹු කරන කාල විශ්ලේෂණය සමඟ එකට පවත්වනු ලැබේ. බැංකුවේ වෙළෙඳ කළඹ තුළ අවදානම මිනුම්ගත කරමින් පාලනය කිරීම සඳහා යොදා ගනු ලබන මූලික උපකරණය වන්නේ අවදානමේදී වටිනාකමයි. (VaR) වෙළෙඳ කළඹක අවදානමේදී වටිනාකම යනුවෙන් අදහස් වන්නේ නිශ්චිත විභවතාවයක් (විශ්වාස මට්ටම) සහිතව අහිතකර වෙළෙඳපොල වෙනස්වීමකින් නිශ්චිත කාලසීමාවක් (දරනු ලබන කාලය) තුළ කළඹ මත උද්ගත වන තක්සේරු කරන ලද අලාභයකි. බැංකුව විසින් යොදා ගනු ලබන අවදානමේදී වටිනාකම ආකෘතිය 99% ක විශ්වසනීයත්ව මට්ටමක් මත පදනම් වන අතර දින එකක රඳාසිටීමේ කාලසීමාවක් උපකල්පනය කරයි. භාවිතා කරන VaR ආදර්ශය ප්‍රධාන වශයෙන් විවිධ විචල්‍ය ක්‍රමය මත පදනම් වේ.

බැංකුව ප්‍රධාන වශයෙන්ම විශේෂයෙන් විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාත නියාමනය කර කළමනාකරණය කිරීමට වටිනාකමේදී අවදානම් සීමා භාවිතා කරයි. අවදානමේදී වටිනාකමේ සීමාවන් හි සමස්ත ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සමාලෝචනයට සහ අනුමැතියට යටත් වේ. අවදානමේදී වටිනාකම් සීමාවන් වෙළෙඳ කළඹ සඳහා වෙන් කෙරේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය විසින් අවම වශයෙන් දිනකට වරක්වත් එහි සීමා අනුව අවදානමේදී වටිනාකම මිනුම්ගත කොට නිරීක්ෂණය කරනු ලැබේ.

පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනුවෙන් අදහස් වන්නේ පොලී අනුපාත සංවේදී වත්කම් වෙත බැංකුව නිරාවරණය වීම නිසා ඉපැයීම් සහ ප්‍රාග්ධනය ආශ්‍රිතව ඇතිවියහැකි අලාභයයි. පොලී අනුපාත සහ ණය විස්තාරණයන් ආශ්‍රිත වෙනස්කම් මත එකී වත්කම්වල වෙළෙඳපොල වටිනාකම උච්චාවචනය වෙයි. පොලී අනුපාත අවදානම් වෙත බැංකුව නිරාවරණය වීම එහි ණය කළඹ, වෙළෙඳ සුරුකුම්පත් හා තැන්පතු වගකීම්වලින් ඇති වේ.

පොලී අනුපාත අවදානම මිනුම්ගත කිරීම සඳහා භාවිතා කරන ශිල්ප ක්‍රමවලට කාලසීමා පරතර විශ්ලේෂණය, අවදානමේදී වටිනාකම සහ අවදානමේදී ඉපයීම් ඇතුළත් වේ. කාලසීමා පරතරය සහ පොලී අනුපාත අවදානම වෙත ඇති සමස්ථ නිරාවරණය නිශ්චය කිරීම සඳහා අනුපාත සංවේදී වත්කම් සහ වගකීම් ඒවායේ කල්පිරීමේ කාලසීමාවන් මත පදනම් වී කාල කාණ්ඩයන්ට ඇතුළත් වේ.

විදේශ විනිමය අවදානම

විනිමය අනුපාතවල අහිතකර උච්චාවචන හේතුවෙන් ඉපයීම් සහ/හෝ ප්‍රාග්ධනය වෙත වියහැකි බලපෑම විදේශ විනිමය අවදානම ලෙස හැඳින්වේ. බැංකුවේ එවැනි නිරාවරණ හිමිකම් අලෙවි කිරීම, ආනයන/අපනයන ගනුදෙනු හා විදේශ මුදල් ප්‍රේෂණ යනාදී විදේශ විනිමයෙන් නම්කරනු ලබන ගනුදෙනු භාර ගැනීමෙන් ඉස්මතු වේ. මහ බැංකුවේ නියාමන සීමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සීමා විනිමය තත්ත්වයන් මත ක්‍රියාවට නංවා ඇති අතර දෛනික පදනමක් මත නියාමනයට කෙරේ. ස්ථාපිත සීමාවන් තුළ තත්ත්වයන් පවත්වා ගන්නා බව සහතික කිරීමට වැටයීම් උපායමාර්ග භාවිතා කෙරේ.

විදේශ විනිමය අවදානමට යටත් වන කළඹ මත අවදානමේදී වටිනාකම් ගණනය කිරීම් සහ පීඩන පරීක්ෂාව බැංකුව පවත්වනු ලබයි. බැංකුවේ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (මූල්‍ය මත පදනම්ව) සහ බ්ලූම්බර්ග් පද්ධතිය ඇසුරින්ද සමාන්තර අවදානමේදී වටිනාකම් ගණනය කිරීම් සිදුකරනු ලැබේ. බැංකුවේ ලාභදායීතාව සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මට්ටම් කෙරෙහි විල්ල විය හැකි බලපෑම මිනුම්ගත කිරීම සඳහා අනුපාත කම්පන යොදා ගනිමින් පීඩන පරීක්ෂාව සිදු කෙරේ.

ස්කන්ධ අවදානම

බැංකුව විසින් දරන ස්කන්ධ ආයෝජනවල වටිනාකම තුළ උච්ඡාවචනයන්හී වෙනස්වීම්වලට නිරාවරණය වීමෙන් ස්කන්ධ අවදානම ඇතිවේ. ලාභය හෝ අලාභය තුළින් එහි සාධාරණ අගයෙන් සහ අනෙකුත් විස්තීරණ ආදායම ආයෝජන කළඹ තුළින් සාධාරණ අගයෙන් මෙය මූලිකවම ඇති වන අතර, බැංකුව විසින් පරිපාලිත සමාගම්වල ක්‍රමෝපායික ආයෝජන ඉවත් කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC) ආයෝජනයට අදාළ සියලුම ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සහ බැංකුවේ ආයෝජන අවදානම් නිශ්චිත අවදානම් අභිරුචියට අනුව කළමනාකරණය කරන බව සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ආයෝජන බැංකුකරණ ප්‍රතිපත්ති සංග්‍රහය ස්කන්ධ අවදානම කළමනාකරණය සඳහා මෙන්ම පරිමාව සහ අවසන් අලාභ සීමා සඳහා ක්‍රියාපටිපාටිය, මෙවලම් සහ ශිල්ප පැහැදිලිව දක්වා ඇත.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු අසමත් අභ්‍යන්තර ක්‍රියාවලීන්, පද්ධති දෝෂ, පුද්ගල දෝෂ, වංචා හෝ බාහිර සිදුවීම්වලින් ඉස්මතු විය හැකි අලාභයන් පිළිබඳ අවදානමයි. මෙහෙයුම් අවදානම ව්‍යාපාරික කටයුතු, නිෂ්පාදන සහ ක්‍රියාවලි හේතුවෙන් ඇති වේ. පාලනයන් ක්‍රියාත්මක වීමට අසමත් වන අවස්ථාවන්හිදී, මෙහෙයුම් අවදානම මගින් කීර්තිනාමයට හානි සිදුවීම, නෛතික හෝ නියාමන ගැටළු හෝ මූල්‍යමය අලාභයන්ට හේතු විය හැක. මෙහෙයුම් අවදානම සම්පූර්ණයෙන්ම ඉවත් කළ නොහැකිය. කෙසේවෙතත්, බැංකුවේ පරමාර්ථය වන්නේ මූල්‍ය අලාභ සහ සමස්ථ පිරිවැය ඵලදායීත්වය, නවෝත්පාදනය සමඟ බැංකුවේ කීර්තිනාමය ඇතිවන හානි වලක්වා ගැනීම පිණිස මෙහෙයුම් අවදානම කළමනාකරණය කර බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන පරිදි පිළිගතහැකි මට්ටම්වල පවත්වා ගැනීමයි.

විවිධ ආකාරයේ මෙහෙයුම් අවදානම් නිරාවරණය කළමනාකරණ කිරීම ක්‍රියාත්මක ප්‍රතිපත්ති, පාලන ව්‍යුහයන් හා ක්‍රියාවලින් බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව තුළ පැහැදිලිව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කමිටුවේ සහාය ලබා ගනිමින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවෙහි කාර්යක්ෂමතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. අවදානම් කළමනාකරණ ඒකකය විසින් අලාභ සිදුවීම් සටහන් කරගෙන කලින් කල මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි. ඒ අතරම, අභ්‍යන්තර විගණනය විසින් බැංකුව තුළ ක්‍රියාත්මක වන මෙහෙයුම් අවදානම් ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහතික කිරීම ලබා දේ.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP)

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය

ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවය යනු බැංකුවේ අවදානම බර තබන ලද වත්කම්වල ප්‍රතිශතයක් ලෙස බැංකුවක පවතින ප්‍රාග්ධනය මැනීමකි. ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය අවදානමට බර තබන ලද වත්කම්වලට ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ. යහපත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතර, බැංකුවේ ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාව සහතික කරයි. තැන්පත්කරුවන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පාඩු අවශෝෂණය කර ගත හැකි ස්ථර-1 ප්‍රාග්ධන සහ ස්ථර-2 ප්‍රාග්ධන අවශ්‍යතා වන බාසල් මාර්ගෝපදේශ යටතේ ප්‍රාග්ධන මිනුම් වර්ග දෙකක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලබයි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP)

ICAAP යටතේ, බැංකුව එහි සියලුම වැදගත් අවදානම් ආවරණය කිරීම සඳහා දිගු කාලීනව ප්‍රමාණවත් ප්‍රාග්ධන සම්පත් ඇති බව සහතික කිරීම සඳහා අභ්‍යන්තර ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලීන් ක්‍රියාත්මක කර ඇත. මෙම ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) ලෙස හැඳින්වේ. ICAAP වාර්තාව මූල්‍ය හා අනුකූලතා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණයෙන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන අතර බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනයට ලක් කරමින් BIRMC විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කර ඇත. ICAAP සියලු අවදානම් වලට වඩාහිව පවත්වා ගත යුතු ප්‍රාග්ධන මට්ටම තීරණය කරන අතර, සියලුම අවදානම් සඳහා සහය වීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් බැංකු සතුව ඇති බවට සහතික කර බැංකුව වඩාත් සාමාන්‍ය ව්‍යාපාරික තීරණ සහ අයවැය වලදී, ව්‍යාපාර වීකක සඳහා ප්‍රාග්ධනය වෙන් කිරීම සහ පුද්ගල ණය තීරණ ක්‍රියාවලිය ඇගයීම වැනි වඩාත් නිශ්චිත තීරණ වලදී ICAAP භාවිතා කරන බව සහතික කරයි. එමෙන්ම අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලිය ඉදිරි වසර පහ සඳහා ප්‍රාග්ධන සැලසුම් කිරීම ආවරණය කරයි.

අයකිරීමේ සැලසුම් (RCP)

2021 අංක 13 දරන මහ බැංකු නියෝගය පරිදි, බැංකුව 2022 සිට ආරම්භ වී අයකිරීමේ සැලසුම් ක්‍රියාත්මක කරයි. අයකිරීමේ සැලසුම්වල විෂයපථය බැංකුවේ විශේෂ පීඩනයන්, වෙළෙඳපොල පුළුල් පීඩනයන් හෝ දෙකේ එකතුවකින් ඇතිවිය හැකි ප්‍රාග්ධනයට කම්පන, ද්‍රවශීලතාව සහ වෙනත් අංග සමඟ කටයුතු කිරීමට බලපත්‍රලාභී බැංකුවකට ලබාගත හැකි සම්පූර්ණ අයකිරීමේ විකල්ප පරාශයක් හඳුනා ගනී.

අයකිරීමේ සැලසුම්වලට තිරණාත්මක කාර්යයන් සහ තීරණාත්මක හුවමාරු සේවාවන් හි ස්වභාවය, පරිමාවන්,

සංකීර්ණතාවන් සහ අන්තර් සම්බන්ධතාවයන් ඇතුළත් වන අතර විධිමත්ව ආමන්ත්‍රණය කරයි.

- අයකිරීමේ වැඩසටහන් සහ දර්ශක
- අයකිරීමේ විකල්ප
- බැංකුව තුළ පාලන රාමු
- ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

බැංකුව අයකිරීමේ සැලසුම් ක්‍රියාවලිය පාලනය කිරීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් කළමනාකරණ පත්කර ඇත. තවද, අයකිරීමේ සැලසුම ගතික ක්‍රියාවලියක් වන අතර, වාර්ෂිකව සහ අවශ්‍යතාව පරිදි යාවත් කරනු ලැබේ.

අයකිරීමේ සැලසුම් BIRMC හි නිර්දේශ සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර අයකිරීමේ සැලසුම් මගින් අවශ්‍ය ක්‍රියාවලීන් සකස් කිරීම, පවත්වා ගැනීම, සමාලෝචනය, ක්‍රියාවට නැංවීම සහ සක්‍රීයකරණය සඳහා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට පැහැදිලි වගකීම් පවරනු ලබයි.

ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනයට අදාළ නියාමන අවශ්‍යතා මෙන්ම අනාගත වර්ධන අභිලාෂයන් හා බැංකුව තුළ ඇති අරමුදල් විකල්ප සැළකිල්ලට ගනිමින් බැංකුවේ ප්‍රාග්ධන කළමනාකරණ රාමුව සැලසුම් කොට ඇත. මෙම රාමුවෙන් බැංකුව සිය මෙහෙයුම් පවත්වා ගැනීමට, විභව අලාභ අවශෝෂණය කර ගැනීමට සහ නියාමන ප්‍රමිති සපුරාලීමට කටයුතු කරන බව සහතික කරයි.

බාසල් ප්‍රමිතීන් මත පදනම් වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය ගණනය කරනු ලබයි. 2017 ජූලි 1 දින සිට, බැංකුව බාසල් III මාර්ගෝපදේශය සමඟ අනුකූලතාවය දැක්වීම අවශ්‍ය වේ. බාසල් III කාර්යරාමුවට අනුව, බැංකුව විසින් 2024 දෙසැම්බර් 31 දිනට මූලික ප්‍රාග්ධනය (1 ස්ථරය) සමඟ 9.5% කට නොඅඩු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක්ද, මුළු ප්‍රාග්ධනය සමඟ 13.5% ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයක්ද පවත්වා ගැනීම අවශ්‍ය වේ.

බැංකුව සහ සමූහය සඳහා 2024 දෙසැම්බර් 31 සහ 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනය සහ අනුපාත ගණනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

ප්‍රාග්ධන ප්‍රමාණාත්වය – බැංකුව

අවදානම් බරැති වත්කම් ගණනය කිරීම

දෙසැම්බර් 31 දිනට	ශේෂය		අවදානමේ බර	අවදානමේ බර තබන ශේෂය	
	2024 රු. '000	2023 රු. '000	%	2024 රු. '000	2023 රු. '000
වත්කම්					
ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව මත හිමිකම්	1,421,157,807	1,193,812,736	0-20	36,497,932	47,995,325
විදේශීය රන්පවුම් සහ ඒවායේ මහ බැංකු මත හිමිකම්	-	-	0-150	-	-
රාජ්‍ය අංශයේ ආයතන (PSEs) මත හිමිකම්	64,754,600	113,289,213	20-150	64,609,075	155,041,167
නිල ආයතන සහ බහුපාර්ශ්වික සංවර්ධන බැංකු (MDBs) මත හිමිකම්	-	-	0-150	-	-
බැංකු මත හිමිකම්	65,917,369	74,776,309	20-150	20,019,537	41,111,205
මූල්‍ය ආයතන මත හිමිකම්	10,517,672	4,874,079	20-150	5,825,516	2,586,989
ආයතන මත හිමිකම්	149,700,692	88,321,523	20-150	144,667,081	85,966,654
පාරිභෝගික හිමිකම්	447,580,364	487,159,525	75-100	350,826,762	394,447,443
රන් මඟින් සුරැකි හිමිකම්	310,846,767	260,366,719	20-100	18,934,719	3,607,839
නේවාසික දේපල විසින් සුරැකි හිමිකම්	54,778,386	56,187,375	50-100	19,172,435	19,665,581
වාණිජමය නිශ්චල දේපලවලින් සුරැකි හිමිකම්	-	-	100	-	-
අක්‍රිය (NPAs) වත්කම්	178,312,609	55,272,290	50-150	252,349,553	76,047,711
ඉහළ අවදානම් වර්ගීකරණ	1,214,062	1,253,821	150-250	3,035,155	3,134,552
මුදල් අයිතම	61,732,570	54,336,057	0-20	145,003	199,152
දේපල, පිරියත හා උපකරණ	52,908,059	46,870,490	100	52,908,059	46,870,490
වෙනත් වත්කම්	14,031,069	24,972,583	100	14,031,069	24,972,583
එකතුව	2,833,452,027	2,461,492,720		983,021,898	901,646,691

ඉහත අවදානම් බරතබන ලද වත්කම්වලට පහත විස්තර කරන ශේෂ පත්‍රයෙන් පිට නිරාවරණවල ණයට සමාන දෑ ඇතුළත්ය.

ශේෂ පත්‍රයෙන් බැහැර නිරාවරණ

	ශේෂය		ණය පරිවර්තනීය සාධකය %	ණයට සමාන දෑ	
	2024 රු. '000	2023 රු. '000		2024 රු. '000	2023 රු. '000
උපකරණ					
සෘජු ණය ආදේශකයන්	20,086,959	18,587,513	100	20,086,959	18,587,513
ගනුදෙනු සම්බන්ධ අසම්භාව්‍යතාවන්	29,376,127	26,405,984	50	14,688,064	13,202,992
කෙටි කාලීන ස්වයං ද්‍රවශීලතාවක් සහිත වෙළඳාම් ආශ්‍රිත අසම්භාව්‍යතාවන්	31,868,809	23,742,292	20	6,373,762	4,748,458
විකුණුම් හා ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් සහ ණය අවදානම බැංකුව තුළ ඉතිරි වී ඇති වත්කම් විකිණීම්			100	-	-
නොනිමි ප්‍රාරක්ෂණ ගිවිසුම් යටතේ ඇති බැඳීම්			50	-	-
වසරක් දක්වා වන මූලික කල්පිරීමක් සහිත වෙනත් බැඳීම් හෝ ඕනෑම අවස්ථාවක කොන්දේසි විරහිතව අවලංගුකළ හැකි බැඳීම්			0-20	0	0
වසර 1ක් දක්වා වන මූලික කල්පිරීමක් සහිත බැඳීම්	77,041,146	65,479,645	20	15,408,229	13,095,929
වසරකට අධික මූලික කල්පිරීමක් සහිත වෙනත් බැඳීම්			50	-	-
විදේශ විනිමය ගිවිසුම්	49,410,113	46,039,737	0-5	988,202	920,795
පොලී අනුපාත ගිවිසුම්			0-3		
එකතුව	207,783,155	180,255,171		57,545,216	50,555,687

ප්‍රාග්ධනය ගණනය කිරීම

	2024 රු. '000	2023 රු. '000
පොදු ස්කන්ධ 1 ස්ථරයෙහි (CET 1) ප්‍රාග්ධනය	117,433,508	155,947,874
මුළු 1 ස්ථරයෙහි (Tier) ප්‍රාග්ධනය	122,433,508	160,947,874
මුළු ප්‍රාග්ධනය	186,055,559	226,208,990
අනුපාත ගණනය කිරීම		
ණය අවදානම වෙනුවෙන් අවදානම මත බර තබන ලද මුළු වත්කම්	983,021,898	901,646,691
වෙළෙඳපොල අවදානම වෙනුවෙන් අවදානම මත බර තබන ලද මුළු වත්කම්	24,745,126	23,050,845
මෙහෙයුම් අවදානම වෙනුවෙන් අවදානම මත බර තබන ලද මුළු වත්කම්	117,389,896	104,857,270
අවදානම මත බර තබන ලද මුළු වත්කම්	1,125,156,920	1,029,554,806
පොදු ස්කන්ධ 1 ස්ථරයෙහි (CET 1) ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය 8.0% - 2022 7.0% - 2021)	10.43%	11.88
මුළු 1 ස්ථරයෙහි (Tier I) ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය 9.5% - 2022, 8.5% - 2021)	10.88%	12.37
මුළු ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය: 13.5% - 2022, 12.5% - 2021)	16.53%	17.37

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව – සමූහය

අවදානම බර තබනලද වත්කම් ගණනය කිරීම

	ශේෂය		අවදානමේ	අවදානම් බරතබන ලද ශේෂය	
